
හංස
ගිගිරුම්
HANSA GIGIRUM
WATHSA LA KARUNARATHNA
වත්සලා
කරුණාරත්න

# 01

"ඒයි කෙල්ල..." සස්වින්දි ආපසු හැරුණේ වේගයෙනි. දෑස් විදා තමන් දෙස බලා සිටින දඩබ්බරයාගේ ඇමතීමට ඇයට දැනුනේ කේන්තියකි.

"මට තිබහයි... බොන්න වතුර ටිකක් ගේනවා" තුහංස ඇයගේ කෝපය බිඳක් හෝ මායිම් නොකර උඩඟු ලෙස පැවසුවේය. ඇයගේ කෝපය තවත් වැඩි විය.

"මෙතන ඉදලා තව මීටර් සීයක් විතර දකුණට ගියාම ඇළක් හම්බ වෙනවා... එතෙන්ට එහායින් බොන ළිඳක් තියෙනවා... එතනින් නම් ඔය කොල්ලට වතුර බොන්න පුළුවන් වෙයි " සස්වින්දි ඔහුට නොදෙවෙනි ලෙසින් පැවසුවාය.

"ඇයි මේ ගෙදර බොන්න වතුර පොදක්වත් නැද්ද"

"ඇති... ඒත් මම තියන තැන දන්නේ නැහැ"

"ඇයි මේක තමුසෙගේ ගෙදර නෙවෙයිද"

"මේක මගේ ගෙදර තමා... මම ඉන්න ගෙදරට අල්ලපු ගෙදර නෙවෙයි... තමුසේ වැරදියට හිතන්න එපා හරිද කොල්ලා "

සස්වින්දි ඒ මොහොතේ ඔවුන් වෙත පැමිණෙන තම පියා හා තුහංසගේ පියා දෙසට හැරෙමින් ඔවුන්ට නොඇසෙන ලෙසින් කීවාය.

"මනෝජ් අංකල්... මේ ඔයාගේ දුව නේද" තුහංස සස්වින්දිගේ පියාගෙන් ඇසුවේ හික්මීමකින් නොවේ.

"අනේ ඔව් හංස මහත්තයා... හංස මහත්තයා පූංචිම කාලෙනේ මෙහෙ ආවේ... දුවව දකින්න නැතුව ඇති"

සස්වින්දිගේ පියා වූ මනෝජ් පළිඟුආරච්චි පැවසුවේ තුහංසගේ පියා වූ රජීව බක්මීමල්දෙණිය දෙස බලමිනි. ඔහු මනෝජ්ට සිනහවක් නැඟුවේය. දකින්නම වැඩේ... තමාටම කියාගත් තුහංස

"දෙන්නේ නැද්ද මම ඉල්ලුව දේ" සස්වින්දිගෙන් ඇසුවේය.

"නැහැ... මම කිව්වේ... කිව්ව තැනින් අරගන්න" සස්වින්දි හිතුවක්කාර ලෙස කීවේ ඉවත බලා ගනිමිනි.

"මොනවද කිව්ව තැනින් අර ගන්නේ... මොකද දෙන්නම තරහා වෙලා වගේ... මොකද්ද දෙන්නගේ ආරෝව" රජීව දෙදෙනා දෙස මාරුවෙන් මාරුවට බලමින් ඇසුවේය.

"බලන්න රජී අංකල්... මෙයාට තිබහයි කියලා මගෙන් තැඹිලි ඉල්ලනවා... වතුර දෙන්නද ඇහුවම එපා කියනවා"

සස්වින්දි කිසිසේත්ම අපේක්ෂා නොකළ දෙයක් පවසද්දී තුහංස අදහාගත නොහැකිව ඇය දෙස බලා සිටියේ පුදුමයෙනි.

"අනේ... ගෙදර කඩපු තැඹිලි ඉවරයි හංස මහත්තයා... අපරාදේ... නැත්නම් දෙන්න තිබ්බා" මනෝජ් ශෝකයෙන් පැවසීය.

"කමක් නැහැ අංකල්... මෙයා මට තැඹිලි තියන තැනක් කිව්වා" තුහංස කීවේය.

"ආ... ඇළ ළඟ තියන කඩේ වෙන්න ඇති... එතනද දෝණි" මනෝජ් අසද්දී සස්වින්දි හිස සෙලවූවාය.

"එනවා යන්න එතෙන්ට මගේ එක්ක... මම එතන දන්නේ නැහැ" කියූ තුහංස සස්වින්දිගේ සුරතින් අල්ලා ඔහු වෙතට ඇදගත්තේය.

"එහෙනම් දෙන්නත් එක්ක ගිහින් තැඹිලි බීලා එන්නකෝ... අපි අපේ වැඩේට යමු මනෝ" රජීව මනෝජ්ගේ කරට අත දමා ගනිමින් කීවේය.

තුහංස බක්මීමල්දෙණිය... හංස මහත්තයා... එදා තිබ්බ නොසණ්ඩාලකම අදටත් අත ඇරගෙන නැහැ වගේ... බලමුකෝ එන්නේ මොකාටද කියලා....

තමාට පැමිණි දුරකථන පණිවිඩය නිසාවෙන් වසර ගනනාවක අතීතයේ සිදුවීමක් සිහි ගන්වා ගනිමින් සස්වින්දි තම පියාට තේ කෝප්පය ලබා දී ඔහු ඉදිරියෙන් වාඩි වුවාය.

ඒ වන විට මනෝජ්ද සිටියේ අතීතයේ එදිනම වූ ඒ සිදුවීම

මෙන්ම තම සොහොයුරෙකුට සමව සිට නොසිතූ මොහොතක සදාතනිකව සියල්ලන්ගෙන් සමුගත් තම හාම්පුතු වූ විශ්වාසවන්තම ළබැඳි මිතුරා වූ රජීව බක්මීමල්දෙණිය සිහිකරමින්ය.

එදා මනෝජ් රජීව සමඟ නිවස තුලට යාමට සූදානම් වුවද ආපසු හැරී තම දියණිය දෙස බැලුවේය.

සස්වින්දි තම ප්‍රාණය හා සමය. මවත් නැතිව තමා ඇයව හදා වඩා ගත්තේ බොහෝ වෙහෙසින් පරිස්සමටය. වැඩිවියට නොපැමිණ සිටියද ඇය තරුණියකගේ පිරිපුන් බවින් අනූන ළදැරියකි. ඇයට වසර තුනකින් වැඩි තුහංස දඩබ්බර යෞවනයෙකි.

"සසිර ඉන්නවනේ මනෝ... එයත් යයි... බය වෙන්න එපා"

ඔහුව වටහාගත් රජීව කීවේ රියදුරුද ඔවුන් සමඟ යාමට සූදානමෙන් සිටින නිසයි.

"වැඩි සෙනෙහේ දබරෙට නම් වැඩි දබරේ සෙනෙහසට වෙන්න පුළුවන් නේද මනෝ"

සස්වින්දි තුහංසගෙන් සුරත මුදවා ගැනීමට දඟලනුද ඔහු එයට ඉඩ නොදී ඇයව ඇදගෙන යනුද දුටු රජීව සිනාසෙමින් කීවේය.

"එහෙම වෙන්නත් පුළුවන් තමයි" මනෝජ්ද එදෙස බලමින් සිනහවක් නැගුවේය.

"වෙන්නත් පුළුවන් නෙවෙයි මනෝ... එහෙම වෙන්නම ඕනි... මගේ කොල්ලට උඹේ කෙල්ල ඇර වෙන කෙල්ලක් අර ගන්න මම ඉඩ තියන්නේ නැහැ"

"රජී මහත්තයට වුණ දේ දවසක හංස මහත්තයටත් වෙන්න පුළුවන් නේද"

"හංසගේ තාත්තා මම කියලා මනෝට අමතක වුණාද"

"ඒ වුණාට... සජීවා මිස් කවදාවත් ඒ දේට කැමැත්ත දෙන එකක් නැහැ"

"එයාට දවසක අකමැත්තෙන් හරි කැමැත්ත දෙන්න වෙයි මනෝ... අපූ මට මගේ කරගන්න බැරි වුණා... ඒත් අපූගේ දෝණි... එයාව කවදා හරි මම මගේ ලේලි කර ගන්නවා" රජීව ඈත බලාගෙන ශෝකයෙන් එහෙත් ස්ථිර හඬින් කීවේය.

මනෝජ් රජීවගේ කරට අත තබා ඔහුව ඔහු වෙතට හරවා ගත්තේය.

"මනෝ... ඔයා මට හැමදාමත් ස්තුති කළා... මගේ ජීවිතේම වුණ අපූව ඔයාට දුන්නා කියලා"

"ඔව් රජී මහත්තයා... අද අපූ අපි හැමෝම දාලා ගිහින් හිටියත් අදත් මම ඔයාට ස්තුති කරනවා ගරු කරනවා ඒ වගේ රන් කඳක් මට දුන්නට... මගේම කර ගන්න දුන්නට" මනෝජ් දෑසට වුණන කඳුළු වළකාගැනීමට උත්සහ දරමින් කීවේය.

රජීව ඔහුගේ පිටට තට්ටුවක් දමා ඉවත බලා ගත්තේ ඒ වන විට ඔහුගේ දෑසේද ඇය වෙනුවෙන් කඳුළු වුණමින් තිබුණු නිසාය.

රජීවගේ පෙම්වතිය වූ අපූර්වාව විවාහ කර ගැනීමට රජීවගේ දෙමාපියන් ඉඩ ලබා නොදුන්නෝය. එවකට හදවත් රෝගියෙකු වූ සිය පියාගේ ජීවිත අවදානම තමා සතු වූ නිසා රජීවට හිතුවක්කාරයෙකු විය නොහැකි විය. එනිසාවෙන් ඔහු අපූර්වාගෙන් සුහදව වෙන් වූවේය.

එහෙත් ඇයගේ අනාගතය සැපත ගැන සිතූ රජීව එවකට තමාගේ සේවකයෙකු වුවත් සහෝදරයෙකු මිතුරෙකු මෙන් විශ්වාසවන්තව තමා සමඟම සිටි මනෝජ්ගෙන් ඇයව විවාහ කර ගන්නා ලෙසට ඉල්ලීමක් කළේය.

ඔහුගේත් ඇයගේ සබඳකමේ ගැඹුර වටහාගෙන සිටි ඔහුට ඇය ගැන විශ්වාසයක් නොතිබුණද ඔහුගේ ඉල්ලීමට පිටු පාන්නට වූ නොහැකියාව නිසාම මනෝජ් එයට එකඟවිය.

"අපූයි මමයි ඒ දවස්වල ගිය ගමන් වල හැටියට මනෝගේ හිතේ අපූ ගැන විශ්වාසයක් තිබුණේ නැහැ... ඒත්... මගේ කීම අහක දාන්න බැරිකමට මනෝ අපූව බැන්දා... එහෙම කරපු මනෝ එයාගේ දෝණිව දවසක මට නොදෙයි කියලා මම හිතන්නේ නැහැ"

"අනූ කියන්නේ රජී මහත්තයාගේ ජීවිතේ... ආදරේ... එයාගෙත් එහෙමයි... එහෙම කියලා එයා මට වචනයකින්වත් වරදක් කරලා නැහැ... පිවිතුරුව මගේ ළඟට ඇවිල්ලා බොහොම නම්බුකාර බිරිඳක් විදිහට මැරෙනකල්ම මගේ එක්ක සතුටින් ආදරෙන් හොඳින් ජීවත් වුණා... රජී මහත්තයාට වගේම මටත් ආදරේ කළා... ගෞරව කළා"

"අනූ කියන්නේ අපූර්වා කියන නමටම ගැලපෙන අපූරු ගෑනියක් මනෝ... හදවත මට දුන්නා... හිතයි ගතයි දෙකම මනෝට දුන්නා... මම එයාව අත ඇරියා කියලා කවදාවත් දොසක් කිව්වේ නැහැ... අපි දෙන්නගෙන් එක්කෙනෙක්ගෙවත් හිත බිඳුවක්වත් රිදවන්නේ නැතුව අපි දෙන්නටම එයා එක වගේම ආදරේ කළා"

"ඔව් රජී මහත්තයා... එයා රජී මහත්තයාට ආදරේ කළා කියලා මට කවදාවත් වරදක් කළේ නැහැ... එයා මටම විතරක් උරුම වුණ වස්තුවක්"

"ඔව් මනෝ... ඔයාටම විතරක් උරුම වුණ වස්තුවක්... මතකද... මම ඔයා හොයාගෙන ඔයා ගෙදර නැති වෙලාවක ඇවිල්ලා මට කරපු දේ"

"එයා දොර වහගෙන එළියට ඇවිල්ලා එළියෙන්ම ඔයාව ආපහු හරවලා යවලා තිබුණා" මනෝජ් සිනහ වෙමින් කීවේය.

"ඒ විතරක් නම් මදැයි... ආය මනෝ එක්ක මිසක් මනෝ ඇති කියලා හිතලා තනියම එන්න එපා කියලා මට නීති දාපු හැටි" දෙදෙනාම සිනහාවෙමින් සිහි කළෝය.

"එදා එයා මගෙන් බැනුමුත් ඇහැව්වා... තර්ක කළා කළ දේ වැරදි නැහැ කියලා... මට එයාව විශ්වාසයි කියන කොට එයා කිව්වේ මනෝට මාව විශ්වාස වුණාට ලෝකෙට එයා ගැන විශ්වාසයක් නැති වෙයි කියලා "

"අපි දෙන්නගේ එඟයා එක හැමෝම දැනන් හිටිය නිසා අනූ ජීවත් වුණේ බොහොම පරිස්සමට... අපි දෙන්නගේ නම්බුව ගැන එයා හිතුවා වගේම එයාට කාගෙන්වත් චෝදනාවක් එල්ල නොවන විදිහට එයා බොහොම පරිස්සමට ජීවත් වුණා"

"ඒක ඇත්ත රජී මහත්තයා... එයා ...
සැමියා වෙන්න මම කොච්චර වාසනාවන්ත මිනිහෙක
මහත්තයා තමයි මට ඒ වාසනාව උදා කරලා දුන්නේ"

"අපූ කියන්නේ මට උරුම වුණත් මට ලබා ගන්න
නැති වුණ වස්තුවක්... ඒ වාසනාව ලැබුණේ මනෝට...
මට ගොඩාක් සතුටුයි... මොකද මම වගේම මනෝ අපූ
ගත්තා... රැක ගත්තා... එයාට ආදරේ කළා... මටත් වඩා
අපූට ආදරේ කරන්න ඇති" මනෝජ් හිස සැලුවේය.

"කවදා හරි දවසක මගේ දෝණිත් තවත් අපූර්වා
කරන්න තමයි මම මේ වෙහෙසෙන්නේ"

"ඒක කරන්න ඔයාට වෙහෙසෙන්න ඕනි නැහැ
දැනටත් රූපෙන් දෝණි අපූ වගේමයි... අනික් දේවල්
එයා දවසක අපූ වගේම වෙයි"

"හ්ම්... ඒක තමයි මගේ එකම බලාපොරො
සැනසීම"

"අපූ වගේ වටිනා අම්මා කෙනෙක්ගේ මනෝ වගේ
තාත්තා කෙනෙකගේ වටිනා දෝණියෙක්ව පිටට අයිති
දෙන්න මට බැහැ මනෝ... එදා මාව විශ්වාස කරලා
බැන්දා වගේ අදත් මාව විශ්වාස කරලා ඔයාගේ දෝ
ගෙදරට ලේලි කරලා එවන්න මනෝ" රජීව බැගෑප
කීවේය.

"අර තරම් වටිනා ගෑනියක් මට දුන්න රජී ළ
දෙන්න බැරි තරම් දෙයක් මගේ ළඟ නැහැ"

"මගේ පණ වගේ මම එයාව බලා ගන්නම්"

"රජී මහත්තයා මගේ දෝණිට කොච්චර ආදරේ
මම දන්නවා... හංස මහත්තයාට ආදරේ කරනවා වගේ
මගේ දෝණිටත් ආදරේ කරන්නේ... සමහර වෙලා
මහත්තයාට වඩා රජී මහත්තයා මගේ දෝණිට ආදරේ
කියලාත් මට හිතෙන වෙලාවල් තියෙනවා"

"ඔයාගේ ලේ එයාගේ ඇගේ තිබුණට ඒකි මගේ
මනෝ"

"අප්පූත් මට දවසක් කිව්වා අපේ දෝණිව හංස මහත්තයාට දෙමු කියලා"

"මේක මගේ යෝජනාවක් නෙවෙයි... මගේ ඉල්ලීමක් මනෝ" තව දුරටත් මනෝජ්ගේ පැකිලීම වටහාගත් රජීව කීවේය.

"රජී මහත්තයාගේ ඉල්ලීමක් මම කවදාවත් අහක දාන්නේ නැහැ... මට තියන ප්‍රශ්නේ සජී මිස්... සජී මිස් මේකට ප්‍රශ්නයක් ඇති කරයි කියලා මට හිතෙනවා"

"නැහැ මනෝ... එයාට එහෙම කරන්න බැරි වෙයි"

"හංස මහත්තයා සජීවා මිස් කියන දේ ටිකක් අහනවා... හංස මහත්තයා මේකට අකමැති වුණොත්... එයා දඩබ්බරයි... හිතුවක්කාරයි... වසයි... අපට කරන්න දෙයක් නැති වෙයි"

"නැහැ... එහෙම වෙන්නේ නැහැ... මම සජී එක්කම ඇවිල්ලා මනෝගෙන් මනෝගේ දෝණිව ඉල්ලන්නම්කෝ"

"එදාට මම එක හිතින් දෝතින්ම මගේ දෝණිව හංස මහත්තයාට දෙනවා"

"තැන්ක්ස් මනෝ... දන්නවනේ... මම වගේ නෙවෙයි මගේ කොල්ලා දඩබ්බරයා... මම හිතනවා හංසිට තමයි දවසක ඒකා හදන්න වුණොත් හදන්න වෙන්නේ" රජීව සිනාසෙමින් කීවේය.

අන් අය සස්වින්දිව ' සස්වි... ලෙසින් අමතද්දී රජීව ඇයව අමතනු ලැබුවේ ' හංසි... ලෙසිනි.

"එයත් අප්පූ වගේ නෙවෙයි... ටිකක් හිතුවක්කාරයි... දඟලනවත් වැඩියි"

"තකට තක දෙන්නා... අපිට තියෙන්නේ වැඩි කාලයක් ගන්නේ නැතුව තව අවුරුදු හය හතකින් දෙන්නව ගැට ගහලා දාන එක" රජීව සිනාසෙමින් කීවේය.

ඔක්කොම කියලා කරලා ඔයාත් නොහිතුව විදිහට නොහිතපු මොහොතක අප්පූ වගේම අපි හැමෝවම දාලා ගියා රජී මහත්තයා... එහෙම නොවෙන්න අද මෙහෙම දෙයක් සිද්ධ නොවෙන්න තිබුණා... මනෝජ් බොහෝ ශෝකයෙන් සිතුවේය.

"තාත්තී..." සස්වින්දිගේ හඬින් මනෝජ් අතීත සිතුවිලි වලින් මිදුනේය.

"මයෙ දෝණි... ඔයා යන්න කාමරේට... අර වසවර්තියා මගේ පස්සෙන් එන්න බැරි නැහැ"

"ආවදෙන්කෝ... මමත් මේ එයා හම්බවෙන්න තමයි බලන් ඉන්නේ" සස්වින්දි කෝපයෙන් කීවාය.

"සුමන සමන් දෙවියනේ... මේ මොන වින්නැහියක්ද වෙන්න යන්නේ... අනේ රත්තරනේ... මාව නොමරා ගෙට පලයන් මයෙ අම්මා" මනෝජ් බැගෑපත්ව කීවේය.

"මම කොහොමද ගෙට ගිහින් ඉන්නේ තාත්තී... එයා නාවත් මම එයාව හම්බ වෙන්න යනවා"

"මයෙ දෝණි... හිතුවක්කාර වෙන්න එපා"

"මම හිතුවක්කාර වෙන්නේ නැහැ තාත්තී... හිතුවක්කාර වෙලත් නැහැ... මතක් කරන්න... ඔයාගේ කීමට මම රජී අංකල්ගේ මරණෙටවත් ආවේ නැහැ... ඔයාගේ ඔෆිස් එකට එන්නෙත් නැහැ"

"ඒක හරි දෝණි... එහෙම කරන්න එපා කියලා මම කිව්වේ හේතුවක් ඇතුව... අදත් මම ඒක කියන්නේ හේතුවක් ඇතුව"

"මොන හේතුවකටවත් මම මේ දේට නිහඬව ඉන්නේ නැහැ... තාත්ති... ඔයා කියන්නේ මට ඒ මිනිහගෙන් ඔයාට එහෙම කළේ ඇයි කියලා අහන්න එපා කියලද"

"ඔව්... එපා කියලා තමයි... හංස මහත්තයා වසවර්තියෙක්... අළුගෝසුවෙක් වගේ මිනිහෙක්"

"එහෙම වෙන්න එපැයි... එහෙම නැතුව තාත්තිගේ වයස ගැනවත් නොහිතා තාත්ති වගේ කෙනෙකුට ගහන්න හිතයිද" සස්වින්දි ඉවසුම් නොදෙන කෝපයකින් කීවාය.

"දෝණි... ඔයා කේන්ති අරන් තියෙන්නේ දිනුජගේ කෝල් එකෙන් පස්සේ නේද... ඔය දිනුජ ඔයාට කියන්න ඇත්තේ බාගයක්ම මුසා... හංස මහත්තයා කවදාවත් මට ගහන්නේ නැහැ"

"අනෙ තාත්ති මේ..." සස්වින්දි සුරත දිගු කොට ඔහුව නිහඬ කළාය.

පියාගේ කාර්යාල සේවකයෙකු වූ දිනුජ දැන් හෝරාවකට පෙර තමාට ඇමතුමක්දී පවසා සිටියේ මනෝජ් හා තුහංස අතර කාර්යාලයේදී බහින්බස් වීමක් සිදුවූ බවත් එහිදී තුහංස මනෝජ්ට පහර දීමට සූදානම් වූ බවත්ය.

"හංස මහත්තයා මට ගැහුව්වේ නැහැ දෝණී"

"ගැහැහුව්වේ නැති වුණාට ගහන්න ගියානේ... ගැහුව්වත් එකයි... ගහන්න ගියත් එකයි"

"හංස මහත්තයා රජී මහත්තයා වගේ ඉවසීම තියන කෙනෙක් නෙවෙයිනේ දෝණී... එයාට කේන්ති ගියාම වාව ගන්න බැහැ... තැනක් නොතැනක් බලන්නේ නැහැ... කවුද කින්ද මන්ද කියලා හිතන්නේ නැහැ"

"ඉතින් ඒකට මේ අහක ඉන්න අපි පළි නැහැනේ"

"ඇත්ත... ඒ වුණාට දෝණී අපට රජී අංකල් ගැන නොහිතා ඉන්න බැහැනේ" මනොජ්ගේ කීමට සස්වින්දි නිහඬවිය.

කවදත් පියෙකු ලෙසින් තමාට සැලකූ තම පියාට නොදෙවෙනි ලෙස තමාට ඉතා ආදරය කළ රජී අංකල් වෙනුවෙන් සස්වින්දිට කළ නොහැකි දෙයක් නැත්තේය. සස්වින්දි තම පියාට ආදරය කරන තරමටම රජීව බක්මීමල්දෙණියටද ආදරය කළාය.

මිය යන දිනය වනතුරුම නොවැරදීම මසකට වතාවක් රජීව සස්වින්දිව බැලීමට එවකට ඇය නතරව සිටි කෑගල්ලේ නැන්දාගේ නිවසට පැමිණ ගියේය.

රජීවගේ හදිසි මරණයට සස්වින්දි බොහෝ කම්පා වූවාය. මනෝජ් ඇයව රජීව බක්මීමල්දෙණියගේ ආදාහනයට කැඳවාගෙන නාවේ ඇයව හසුරුවා ගැනීමට නොහැකි තරමට ඇය කම්පාවී සිටි නිසයි.

"හංස මහත්තයා ආවොත් මම එයා එක්ක ඒ ගනුදෙණුව බේර ගන්නම්... ඔයා සද්ද නැතුව කාමරේට වෙලා ඉන්න දෝණී"

තාත්ති එක්ක රණ්ඩු වුණේ"

"අළුතෙන් එකවුන්ට්ස් වලට මම කෙල්ලක් ගත්තා... මගේ වුවමනාවටයි කීමටයි තමා මම එයාව ගත්තේ... ඒත් ඒකි හංස මහත්තයාට වහ වැටිලද කොහෙදෝ"

"අපෝ... වහ වෙටෙන්න වෙන කවුරුවත් ඉදලා නැද්ද එයාට"

"දෝණී... අපහාස කරන්න එපා එයාට... ඔයත් දැක්කම එයාට වහ වැටෙයිද කවුද දන්නේ"

"අනේ මේ... තාත්තී..." සස්වින්දි ලැජ්ජාවෙන් මිමිනුවාය.

"ඒ කෙල්ල වුවමනාදේයි එපාදේයි හැමදේම හංස මහත්තයාගේ කනේ තියනවා... අද රජී මහත්තයයි මමයි කාටත් රහසින් කරගෙන ගිය එකවුන්ට් එකක් ගැන කියලා"

"ඉතින් තාත්තිගේ දැන් බොස් මිස්ටර් තුහංස බක්මීමල්දෙණිය ඒකෙන් සල්ලි ඉල්ලනවා"

තුහංසගේ විදිහ පිළිබඳව මේ වනවිට දැන සිටි සස්වින්දි අනුමානයෙන් කීවාය.

"ඔව්... එයා මේ දවස්වල ෂිප්මන්ට් එකක් කරන්න සල්ලි නැතුව ඉන්නේ... මට කියනවා ඒක ගැන විස්තර දෙන්න කියලා"

"ඉතින් තාත්ති විස්තර දෙන්න බැහැ කිව්වා"

"ඔව් දෝණී... ඒක මායි රජී මහත්තයයි අනාගතේ ගැන හිතලා තැම්පත් කරන මුදලක්... සජී මිස්ටවත් ඒ ගැන කියලා නැහැ"

"තාත්ති අනාගතයක් ගැන හිතලා තියන ඒවා පරිස්සම් කරනවා... එයා රස්තියාදු ගගහා තියන ඒවා විනාශ වෙනකල් බලන් ඉන්නවා"

"ඒක නම් එහෙම තමයි... හංස මහත්තයා මේ රස්තියාදු

නවත්තලා කම්පැනියගැන හිතලා වැඩ කළා නම් මේ තත්වේ උදා වෙන්නේ නැහැ"

"කියනදේ නාහන්නෙකුට දෙයක් කියලා වැඩක් නැහැ"

"ගසන්න පුළුවන් හැම එකාම හැමදේකින්ම ගසා කනවා... මේ මාසේ පඩි ගෙවා ගන්න තරම්වත් ආදායමක් නැහැ... මටම තනියෙන් හැම දෙයක්ම කරන්න බලන්න බැහැනේ දෝණි" මනෝජ් පැවසුවේ තැවුලෙනි.

රජීව බකමීමල්දෙණිය නොසිතූ මොහොතක නොසිතූ විලසින් මිය ගියේ හර්දයාබාධයකිනි. එය මනෝජ්ට දරාගත නොහැකි කම්පනයක් වුවද ඔහු හිතට දිරිගෙන තම හාම්පුතා මිතුරා වෙනුවෙන් ඔහුගේ කටයුතු සියල්ල ඉදිරියට ගෙන යාමට උත්සහ කළේය.

මනෝජ් පළිඟුආරච්චි උසස් පෙළ නිම වූ විගසම රැකියාවකට අයදුම් කළේ රත්නපුරේ තේ සමාගමකටයි.

රජීව බක්මීමල්දෙණිය සිය පියා විසින් පවත්වාගෙන ගිය තේ සමාගමේ පාලනය භාරගෙන අළුතින් සේවක පිරිසක් යොදවා ගැනීමට සිතුවේ ඔහු සමඟ මිතුරුව සුහදව කටයුතු කළ හැකි තරුණ තරුණියන් පිරිසක් සිටිය හොත් කටයුතු කරගෙන යාම පහසු වන බව දැන සිටි නිසයි.

එසේම එවකට පාසැල් කාලයේ සිට තම පෙම්වතිවය වූ අපූර්වා ලෙව්කේ හමුවීමට සමීප කර ගැනීමට වෙනත් මගක් තමාට නොවූ නිසායි.

නව සේවක ලැයිස්තුවට අපූර්වා මෙන්ම මනෝජ්ද අයත්ව තිබිණි.

රජීව මනෝජ් අපූර්වා සම වයස්වල වීම ඔවුන් අතර සේවක බැඳීමට වඩා බොහෝ තද බල වූ බැඳීමකට හේතුවක් විය. මනෝජ් හා රජීව අතර සහෝදරයත්වයකට නොදෙවෙනි අපූරු මිතුදමක් ගොඩනැගුනේ ඒ අයුරිනි.

සමාගමේ දියුණුව අනාගතය ගැන සිතා ගත් සෑම තීරණයක්ම ඔවුන් දෙදෙනාගේම අදහස් වූ අතර රජීව බක්මීමල්දෙණිය ගන්නා හැම තීරණයක්ම ඔහු ගනු ලැබුවේ මනෝජ් පළිඟුආරච්චි දැනුවත්ව ඔහුගේ අනුමැතියද ඇතිවයි.

මේ ගිණුමද ඔවුන්ගේ අදහස් මත ආරම්භ කළ ගිණුමකි. කෝටි ගණනක මුදලක් එහි ඇති අතර අද වන විටද සමාගමේ ලාභයෙන් සියයට ගණනක් මේ ගිණුමට බැරවේ.

"තාත්ති බොරුවට බැණුම් අහ අහා ගුටි කකා දඟලන්න ඕනි නැහැ... ඒ බූරුවට ඒකත් කාලා දාලා නැති කර ගන්න කියලා ඒ එකවුන්ට් එකේ ඩීටෙල්ස් දුන්නනම් ඉවරයිනේ"

සස්වින්දි පැවසුවේ මනෝජ් බී අවසන් කළ තේ කෝප්පය අතට ගනිමින්ය.

හංස මහත්තයා මට මොනව කළත් මම ඒක නම් කරන්නේ නැහැ... මනෝජ් පළිඟුආරච්චි කීවා නොව සිතින් පවසා ගත්තේය.

වසර ගනනකට පෙර සිදුවූ රජීව බකමීමල්දෙණියගේ හදිසි අභාවයෙන් පසු තුහංස බක්මීමල්දෙණිය උසස් පෙළට දෙවන වතාවට සූදානම්ව සිටි මොහොතක එය අතහැර දමා සමාගමේ කටයුතු බාරගනු ලැබුවේ සිය මව වූ සජීවා බක්මීමල්දෙණියගේ බලකිරීමටයි.

"හංස මහත්තයාට නම් මේක කරන්න බැහැ... අපරාදේ හැමදේම විනාශ වෙලා යයි... තුහංසගේ චර්යාවන් දුටු සැමගේ අදහස එසේ විය.

මුදල් නිසාවෙන්ද හිතුවක්කාරකම දඩබ්බරකම නිසාවෙන්දෝ මැරයෙකු මදාවියෙකු වී සිටි තුහංසගේ චර්යාවන් සජීවා සිය සැමියා වූ රජීවගෙන් වසන් කර ගත්තාය.

එනිසාවෙන් රජීව ජීවත්ව සිටියදී තුහංස නියමාකාරයෙන් හදා ගැනීමට වූ අවස්ථාව මඟ හැරිණි. ඔහු මත් පැනට මෙන්ම රස්තියාදුවට යොමු වෙද්දී රජීව ඒවා නොදත්තේය.

සිය එකම දරුවා වූ තුහංසට දැක් වූ දැඩි සෙනෙහේ නිසාවෙන් එසේ කළද මතු දිනෙක එය වරදක් වේ යැයි මේ තරම් විනාශයක් වේ යැයි සජීවා නොසිතුවාය. සිය පුතුට එයින් අවැඩක් සිදුවේ යැයි ඇය සිතුවේ නම් කිසිදා එසේ නොකරනු ඇත.

සැමියාගේ හදිසි වියෝව නිසාවෙන් ඇය අසරණ වූවාය. තුහංස පියාට රහසින් කළ ජඩකම් සියල්ල එළිපිටම සිදුකළේ

පාලනයකින් තොරවයි.

"මගේ රත්තරන්... තාත්ති දැන් ජීවතුන් අතර නැහැ... මට ඉන්නේ ඔයා විතරයිනෙ පුතේ... ඔහොම කරන්න එපා" සජීවා නිතරම කීවද ඔහු ඒ ගැන තැකීමක් නොකළේය.

"අම්මා... තාත්ති ඉන්න කොටත් මම හිටියේ මෙහෙමනේ... ඉතින් ඇයි දැන් ඔයා බය වෙලා"

"අනේ පුතේ... තාත්ති මේ කිසි දෙයක් දැනන් හිටියේ නැහැනේ... මම හැමදේම තාත්තිට හැංගුවා... ඔයා හොරෙන් නේද මේවා කළේ"

"ඉතින් දැන් තාත්ති නැහැනේ අම්මා... කාට අහුවෙන්නද"

"මම හැමදේම කළේ තාත්තිගේ හයිය අරගෙන... එයා ලොකු ගහක් වගේ අපිව වාහෙලාගෙන හිටියා... දඬුවම් කරලා හරි ඔයාව බේර ගන්න තාත්ති ඔයා ළඟ ඉන්නවා කියලා මම දැනගෙන හිටියා... ඒත් අද ඔයාව බේර ගන්න මට බැරි වුණොත් කවුද ඉන්නේ" සජීවා කඳුළු සලමින් කීවාය.

"ඔයා බය නැතුව ඉන්න... මට මොනවා වෙන්නද... පොලිසි උසාවි බොහොමයක් සල්ලි වලට යටයි අම්මා" තුහංස කීවේය.

තමාගේ වරදින් පුතු මේ අයුරින් නාස්තිවීම ගැන තමාටම දොස් පවරා ගැනීම හැර සජීවාට වෙන කළ හැකි දෙයක් නොවීය.

"මට නම් හිතෙන්නෙම හංස මහත්තයා මෙහෙට එයි කියලා... දෝණී... ඔයා යන්න පුංචිලාගේ දිහාටවත්" තමා ඉදිරියෙන් පොතක් පෙරලාගෙන වාඩි වූ සස්වින්දිට මනෝජ් කීවේය.

"ආ... මේ කොහෙවත් ඉන්න එකෙක් එයි කියලා බයට මම යන්න ඕනිද මගේ ගේ අත ඇරලා... තාත්ති එහෙමද මට කියන්නේ"

"කෙල්ලේ... කියන දේ අහපන්කෝ හිතුවක්කාර නොවී"

"ඒ මිනිහා ඇවිත් ආයෙත් තාත්තිට ගැහුව්වොත්"

"කියන එක අහන්න දෝණි...
ගැහුව්වේ නැහැ... එයා හැදුවේ මාව බය කර ගන්න"

"හා... හා... බය කර ගන්න... බොරු කියන්න එපා තාත්ති... එයා හැදුවේ ඔයාට ගහන්නලු"

"නැහැ ළමයා... මගේ ෂර්ට් කොලර් එකෙන් අල්ලගෙන කෑගැහැව්වා ඔෆිස් එක දෙක වෙන්න... ගහන්න ගියා නම් ගහලා... කාට බයේ කාගේ කීමට මාව අත අරින්නද එයා"

එය නම් සත්‍යක් බව සස්වින්දිට විශ්වාසය. වසර ගනනාවකින් නොදුටුවද තුහංස ගැන ඔහු කියන කරන දේ ගැන ඇය හොඳින් දැන සිටියාය.

ඔහු කිසිවෙකුට ගහන්නට සූදානම් වූයේ නම් පහර නොදී අත හැර දමන්නෙකු නොවේ. ඔහු කාගේ කීමකටවත් අවනතව කටයුතු කරන්නේ නැති හිතුවක්කාර දඩබ්බරයෙකි.

ඔහුගෙන් පහර කන්නෝ මෙන්ම එනිසාවෙන් ඔහු පොලිස් කූඩුවේ ළඟින අවස්ථාද එමටය.

නිවස ඉදිරිපිට වාහනයක් නවතන හඬ ඇසෙද්දී සස්වින්දි මනෝජ් දෙස බැලුවාය. මනෝජ් වහා නැඟිට ගත්තේය.

"දෝණි යන්න කාමරේට"

"මට බැහැ"

"එහෙනම් මෙතෙන්ටම වෙලා ඉන්න... ඉස්සරහට එන්න එපා" කියූ මනෝජ් සාලයට ගියේය.

මනෝජ් දුටු තුහංස ඔහුගෙන් අවසර නොගෙනම ඔහු වෙතට ආවේය. සාලයට නුදුරු කොටසේ සිටි සස්වින්දි රහසින් ඔහු දෙස බලා සිටියාය.

කඩා හැලෙන කෙටි කුරු කොණ්ඩය ජෙල් ගා සකසාගෙන සිටි ඔහුගේ කඩවසම් බවේ නම් කිසිදු අඩුවක් නොවීය. දකුණත පුරවා පැළඳ සිටි බෑන්ඩ් ඇට වලලු මෙන්ම ගෙල පැළඳ සිටි මාල නිසාවෙන් වූ රස්තියාදු පෙණුම නොවන්නට උසට සරිලන මහතින් යුතු වූ නාරි දේහයේ වැදගත්කම ඉස්මතු කර ගන්නට නොහැකියාවක් නැත.

ඔහු දුටු සස්වින්දිට සිහි වූයේ මනොජ් මොහොතකට පෙර

පැවසූ වදන්ය.

"දෝණී... අපහාස කරන්න එපා එයාට... ඔයත් දැක්කම එයාට වහ වැටෙයිද කවුද දන්නේ...

ඔහු විසින්ම මතුකරගෙන සිටින රස්තියාදුකාර පෙණුම නොවන්නට පියා පැවසූ වදන් වල අසත්‍යක් නැතැයි සස්වින්දිට වැටහිණි.

කොච්චර හැන්සම් වුණත් මේ වගේ රස්තියාදුකාරයෙක් එක්ක පැටලිලා දුක් විඳින්න දඟලන කෙල්ල කවුද... සස්වින්දි මුමුණා ගත්තාය.

ඒ මොහොතේ ඇයට සිහි වූයේ රහල්ගේ වතයි. අහිංසක ආදරණීය ඔහුගේ පෙම්වතිය වූ සස්වින්දි තව දින හතරකින් ඔහු හමුවී ඔහුගේ මහ මෙරක් තරම් වූ ආදරයේ සුව විඳින්නට ඇඟිලි ගනිමින් බලා සිටියාය.

"මනෝජ් අංකල් ප්ලීස්... මාව කේන්ති කරන්න එපා... මම මේ බොහොම ඉවසීමෙන් ඉන්නේ" තුහංස කීවේය.

"හංස මහත්තයා... මේ අහන්න"

"මනෝජ් අංකල්... ඔයා මට මගේ තාත්ති වගේ... වෙන කෙනෙක් වුණා නම් මේ වෙනකොට කෑලි නැහැ"

"හංස මහත්තයා... ඔයත් මට මගේ පුතා වගේ... ඒ නිසයි මම මේ කියන්නේ... ඒ එකවුන්ට් එක අමතක කරලා දාන්න"

"අංකල් දන්නවා කම්පැනියේ සල්ලි නැහැ කියලා... ඒක වහන තත්වෙක තියෙන්නේ කියලා"

"ඒ සල්ලි අරගෙන ඒවත් ඉවර වුණාම කම්පැනියත් නැහැ... සල්ලිත් නැහැ... ඔයාගේ අනාගතේ තව එහෙමම"

"අනාගතේ ගැන පස්සේ බලා ගමු... දැන් කරන්න තියන දේ කරමු... කම්පැනියවහලා දාන්න බැහැනේ" තුහංස මදක් ආවේගයෙන් කීවේය.

"ඒ සල්ලි ගන්නවට වැඩිය කම්පැනියවහලා දාන එක හොඳයි... ඒ සල්ලි අමතක කරන්න... කර ගන්න බැරි නම් කම්පැනියවහලා දාන්න"

දෙසට දිව ගියාය.

"හලෝ... මේ..." සස්වින්දිගේ හඬට නැවතුණු තුහංස හැරී බැලුවේය.

වසර ගනනාවකින් දුටු ඒ වතේ පෙරදා දුටු ළඳරු බව මැකී ගොස් තිබිණි. තුහංස ඒ සුන්දර උවන දෙස මොහොතක් ඇසපිය නොසලා බලා සිටියේය.

තාත්ති හිටියනම් මේකිට පණත් දෙයි... පෙරදා රජී සස්වින්දිට දැක් වූ ආදරය සිහි ගන්වා ගනිමින් තුහංස සිතුවේය.

"දෝණී... යන්න කාමරේට" මනෝජ් සැර කළේය.

තුහංස සමච්චල් සිනහවක් නංවා ගෙන ඉවත බලා ගත්තේය.

"දෝණී... මම කිව්වා" සස්වින්දි තවත් එතැන රැඳී සිටි නිසාවෙන් මනෝජ් හඬ වේගවත් කළේය.

"මනෝජ් අංකල්... ඇයි එයාට යන්න කියලා කෑගහන්නේ එයත් හිටපුදෙන් කමක් නැහැ" තුහංස ඒ සිනහවෙන්ම කීවේය.

"එයාට මෙතන වැඩක් නැහැ... ඒ නිසා ගියාට කමක් නැහැ"

"මනෝජ් අංකල්... මම දන්න තරමට මනෝජ් අංකල්ගේ දුව එහෙම ලේසියකට තමන්ට හිතෙන දෙයක් නොකර ඉන්න කෙනෙක් නෙවෙයි... මම හිතන්නේ එයා මෙතන දාලා යන්නේ නැතිවෙයි"

"හංස මහත්තයා... ගණුදෙණුව තියෙන්නේ මගේ එක්ක එයා මෙතනට ඕනි නැහැ... සස්වින්දි... යනවා ගෙට" මනෝජ් කෝපයෙන් කෑගැසුවේය.

"සස්වින්දි... සස්වින්දි... මෙයා සස්වින්දිද... මම සස්වින්දි එකම නම්... නරකම නැහැ... අපේ තාත්ති හැමදේම වගේ නමත් එකම විදිහට දීලනේ මෙයාට" තුහංස පැවසුවේ උපහාසයෙනි.

සස්වින්දි සිය පියා දෙස බලද්දී මනෝජ්ද ඇය දෙස

බැලුවේය.

"තාත්ති කිව්වට යන්න එපා... ඔයා ඔහොම ඉන්න... මාව කේන්ති කළාම එයාට වෙන දේ ඔයාගේ තාත්ති තවම දන්නේ නැහැ" තුහංස මනෝජ් දෙස බලා කීවේය. මනෝජ් ඔහු දෙසම බලාගෙන නොසැලී සිටියේය.

"මේ කරුණාකරලා යනවා මෙතනින් අපට වද නොදී... මගේ තාත්තිට මොනවා වෙන්නද" සස්වින්දි පැවසුවේ හඬිනි.

තුහංස කෑගසන ඇයගේ උවන දෙස මොහොතක් නොසෙල්වී බලා සිටියේය. ඔහුට සිහි වූයේ මීට වසර ගනනාවකට පෙර ඇය මෙලෙසින්ම තමාට කෝපයෙන් කෑගැසූ දිනයයි.

එදා තමා ඇය මට්ටු කිරීමට සිතා රතු වූ ඒ කේන්තිකාර උවන ඇති තරමට සිප අත හැරියේ බලහත්කාරයෙනි. එය සිහි වූ තුහංසට සිනහා නැගුණේය.

"හංස මහත්තයා අපි යමු ඔෆිස් එකට... ගිහින් මේක බේරුමක් කරගමු"

"නැහැ මනෝජ් අංකල්... අපි මෙතනින්ම ප්‍රශ්නේ විසඳගමු... මට මේක ඉක්මනටම බේරුමක් කර ගන්න ඕන... ඇයි මනෝජ් අංකල්... දුව මගේ ළඟ ඉන්න කොට මනෝජ් අංකල්ට බය හිතෙනවද" තුහංස ඒ සිනහාවෙන්ම ඇසුවේය.

මනෝජ් සස්වින්දි දෙස බැලුවේය. ඇය සිටියේ තුහංසට රවාගෙනයි.

පෙරදා තැඹිලි තිබෙන කඩය පෙන්වන්න යැයි පවසා තුහංස තමා රථයට නංවා ගත්තේ රජී අංකල් හා පියා ඉදිරියේය.

රියදුරු ලවා ඇළ අසල රථය නවතා ගත් තුහංස ඉන් බැස ගත්තේ සස්වින්දිගේ සුරතින් අල්වාගෙනයි. බලහත්කාරයෙන් ඇයව ඇළ අසලට ඇදගෙන ගිය ඔහු ඇය ඉදිරියේම ඇළෙන් වතුර බිව්වේ රියදුරු කෑගසද්දී දඩබ්බර කමයි.

"චීයා... ඒ..."

තමා ඔහුව පිළිකුල් කරද්දී තවත් වතාවක් මුහුණ දොවා

වතුර උගුරක් කටට ගත් තුහංස එය මුවින් ඇයගේ මූණට දැමුවේ බලහත්කාරයෙනි.

ඔහුගේ දඩබ්බරකමටත් ඔහුගේ දෙතොල නිසාවෙත් දෙතොලට දැනුණු තුහුරු වූ ස්පර්ශය නිසාත් කේන්තිගත් සස්වින්දි දැතින්ම තුහංසට පහර දුන්නාය.

නොසිතූ ලෙස ඇයගෙන් ලත් පහර කෑම නිසාවෙන් කෝපගත් තුහංසව නවතා ගැනීමට වියදුරුට හැකියාවක් නොවීය.

තමාට පහර දෙන සස්වින්දිගේ දැත් තම දැතින් අල්ලාගත් තුහංස ඇයව බිම පෙරලා යටකරගෙන ඇයගේ තොල් මුළු ඇඟ කලේ සපා කෑමටයි.

"ඒයි කොල්ලා... ඉඹින්න එහෙම නැහැ මෙහෙ... ඉඹින්න තිබුණොත් බලාගෙනයි... අනේ... මට ඇඬෙන්න හිතෙයි" තුහංසගේ ක්‍රියාව වරදවා වටහාගත් සස්වින්දි කෑගැසුවාය.

ඇති වූ සිතුවිල්ල ඉවතලූ තුහංස ඇය නැගිට්ටවූ, ඇයව ඇඟ පදමට සිප ගෙන ඇයගෙන් ඉවත් වූයේ දෙතොල මතක් කරගෙන ඇයගේ වතම දෙතොලින් තෙත් කරමිනි.

"මට තිබහයි... තැඹිලි නැත්නම් හෝ, වතුර එකක්" තම දෙස රවාගෙන බලා සිටින සස්වින්දිගෙන් තුහංස ඇසුවේ සිනහව වියකාගෙනයි.

සමච්චල් සහගත සිනහවෙන් ඔහු පෙරදා සිදුවීම තමාව සිහිගන්වන බව සස්වින්දි වටහා ගත්තාය.

"හංස මහත්තයා මේ ගෙදර වතුර බිබී නවතින්න ඕනි නැහැ... යමු... ඔන ප්‍රශ්නයක් අපි ඔෆිස් එකට ගිහින් විසඳගමු" මනෝජ් කීවේය.

"ඇයි මනෝජ් අංකල්ට බය හිතෙනවද මම මේ කෙල්ලව උස්සයි කියලා... ආ... බය වෙන්න එපා... දන්නවනේ... මම මොන විෂය හදාරලා තිබුණත් තවම ගෑනු විෂය හදාරලා නැහැ කියලා" මනෝජ්ට කීවූ තුහංස

"මේ රැවිල්ල ගෙරවිල්ල දිහා බලද්දී නම් ඒ විෂය

හැදෑරුවත් කමක් නැහැ කියලා හිතෙනවා "

සස්වින්දි වෙතට හැරී ඇයට පමණක් ඇසෙන සේ රහසින් කීවේය.

කේන්තියෙන් ඔහුට රවා බැලූ සස්වින්දි මනෝජ් වෙතට ගියාය.

"අංකල් මොකද කියන්නේ... මට ඒ එකවුන්ට් එකේ විස්තර දෙනවද... නැද්ද"

"යමු හංස මහත්තයා... අපි ඔෆිස් එකට ගිහින් විසදගමු"

"මනෝජ් අංකල්... බොහොම කරුණාවෙන් බැගෑපත් වෙලා මම මේ කියන්නේ"

" හංස මහත්තයා... ඒවා රජී මහත්තයා අනාගතේ වෙනුවෙන් ඉතිරි කළ දේවල්"

"මම මේවා ඉල්ලන්නේ අනාගතේ හදා ගන්න තමයි... වුවමනා වෙලාවට ඒවා නැත්තනම් වැඩක් නැහැ"

"මේ වෙලාව ඒවා ගන්න වෙලාව නෙවෙයි හංස මහත්තයා... තව ඉස්සරහට ඒවා ඔයිට වඩා ප්‍රයෝජනවත් වෙයි"

"මනෝජ් අංකල්... මේවා මගේ තාත්තිගේ සල්ලි" තුහංස කෝපයෙන් කෑගැසුවේය.

"ඔව්... ඒවා මගේ නෙවෙයි... රජී මහත්තයාගේ තමයි"

"එහෙනම්... මට ඒවා දෙනවා"

"දෙන්නම්... රජී මහත්තයා ඒවා දෙන්න බලාපොරොත්තු වුණ කාලෙට"

"මට කාලයක් වැඩක් නැහැ... ඒවා මට දැන් ඕනි... තාත්ති හිටිය නම් මට ඒවා දෙයි"

"නැහැ හංස මහත්තයා... රජී මහත්තයා හිටිය වුණත් එයා ඒවා දෙන්නේ නැහැ... අනික ඒවා තව අවුරුදු ගානක් යනකල් ගන්නත් බැහැ"

"කෙපර ගහන්න එපා මනෝජ් අංකල්... මම බබෙක්

නෙවෙයි රවටෙන්න... දාපු සල්ලියක් එහෙම කොහොමද ඉන්නේ"

ඒ මුදලේ ඇත්ත මට ඔයාට කියන්න බැහැ හං මහත්තයා... සිතට මුමුණාගත් මනෝජ්

"යන්න හංස මහත්තයා... මම ඒවා දෙන්නම්... ඒවා දෙන් බලාපොරොත්තු වුණ කාලෙට... මෙතන කොච්චර කැගැහුවව වැඩක් නැති වෙයි" යැයි කීවේය.

"අංකල් මම මේ අන්තිම සැරේට කියන්නේ කරුණාකරලා මට ඒකේ විස්තර දෙන්න... තාත්තගේ නම එහෙම එකවුන්ට් එකක් නැහැ... මට සැක ඒකයි "

"රජී මහත්තයාගේ නමට නැති වුණත් හංස මහත්තයට සල්ලි දවසක ලැබෙනවා... නැති වෙන්නේ නැති වෙයි"

"එහෙම කියලා බැහැ... මම කොහොමද ඔය කියන ඒව විශ්වාස කරන්නේ"

"හංස මහත්තයට විශ්වාස කරන්න වෙනවා"

"එහෙම කියලා බැහැ... අන්තිම සැරේට මම අහන්නේ..."

"කීවෙනි සැරේට ඇහුව්වත් මට කියන්න වෙන්නේ කිව් ඒවම තමයි"

"මැරුම් කන්න වෙයි මගෙන්"

"මැරුවත් මට කියන්න වෙන්නේ ඒ ටිකම තමයි... ම වෙනස් වෙන්නේ නැහැ... මම ඒවා දෙන්නම්... දැන් හං මහත්තයා යන්න" මනෝජ් සස්වින්දි අල්ලාගෙන ඉවත යාමට සැරසුණේය.

"ෂයි..." තුහංස සිය සගයා ඇමතුවේය.

"බොස්..."

ඔහු පැමිණ තුහංස ඉදිරියේ සිට ගත්තේ පිස්තෝලයක අතැතිවයි. අසා දැන ඇති අන්දමට කිසිවෙකුටත් ඔහුගෙන සමාවක් නැත්තේය. ෂයි අත වූ පිස්තෝලය දුටු සස්වින්දි බි වූවාය.

"තාත්තී... අනේ... කියන්න..." සස්වින්දි කෑගැසුවාය.

"මනෝජ් අංකල් "

"මට කියන්න වෙන දෙයක් නැහැ "

"අනේ... එයාට මොනවත් කරන්න එපා... මගේ තාත්තී" ඇය මනෝජ් පිටුපසට කර ගනිමින් කෑගැසුවාය. මනෝජ් ඇයව පසෙකට කර ඉදිරියට ආවේය.

"මනෝජ් අංකල්... මේ අවසන් වතාව"

"වෙනසක් නැහැ... උත්තරේ ඒකමයි" මනෝජ් පැවසුවේය.

"එහෙමද... ෂයි..."

තුහංස හිස සොලවා අණ දුන් සැනින් ෂයි නම් වූ ඔහුගේ සඟයා මනෝජ්ගේ හිසට පිස්තෝලය තැබුවේය.

"සොරි මනෝජ් අංකල්... මම බොහොම ඉවසුවා"

"මම කිව්වේ... මට ඒ ගැන කියන්න වෙන දෙයක් නැහැ... මැරුවත්"

"උඹට මම... " කියූ තුහංස මනෝජ්ගේ කොලරයෙන් අල්ලා ඔහුව ඔහු වෙතට ඇද ගත්තේය. සස්වින්දි තුහංසගේ සුරතේ එල්ලී කෑගැසුවාය.

"ඉවසන නිසානේ මේ හැමදේම... දාගනින් මූව වාහනේට... හවසට පාවෙයි මිනිය ඇළේ "

"තාත්තී..." කෑගැසූ සස්වින්දි මනෝජ් ඉවතට ගන්නට සැරසුනාය. තුහංස වහා සස්වින්දිව ඔහු වෙතට ඇද ගත්තේය.

"මගේ දෝණිව අත ඇරපන් හංස"

"ඒකිගෙන් මට වැඩක් නැහැ මනෝජ් අංකල්... මම අත අරින්නම්... ඊට කලින් කියනවා මට විස්තර" තුහංස සස්වින්දිව සුරතින් තම ගතට තෙරපා ගනිමින් කීවේය.

"අත ඇරපන් මිනිහෝ මගේ කෙල්ලව හොඳ හිතින්" මනෝජ් ඔහු වෙතට කඩා පැන්නේය.

"අයියෝ මනෝජ් අංකල්... ඔයා හිතුවද මම මේකිව

බෝණික්කියක් වගේ නලව නලව ළඟ තියාගයි කියලා" තුහංස මහ හඬින් සිනාසෙමින් ඇසුවේය.

"හැබැයි මෙකි හොඳයි විකුණන්න නම් " ඔහු සස්වින්දිගේ කම්මුල අත ගාමින් පැවසුවේ මනොජ්ගේ ඉවසීමේ සීමා බිඳ දමමිනි.

මනෝජ් ඔහුට පහර දීමට සූදානම් වෙද්දී ඔහුගේ පහර වළකාගත් තුහංස පහසුවෙන්ම ඔහුව සිය ග්‍රහණයට ගත්තේ සස්වින්දිගේ කෑගැසීම නොතකමින්ය.

ඔහුට දැඟලීමටවත් නොහැකිවිය. හැකි වූයේ කෑගැසීමට පමණි. ඔහු කෑගැසුවේ සස්වින්දිට ඉවත යන ලෙස පවසායි. නොසෙල්වුණු සස්වින්දි විලාප තැබුවාය.

"ගෙනියපන් මේකව " තුහංස ෂයි වෙතට මනෝජ් තල්ලුකර දැමුවේය

"දෝණි... දුවන්න... ඉන්න එපා මෙතන "

තුහංසගේ සගයා මනෝජ් ඇදගෙන යන විට ඔහු නැවත නැවත කීවේය. ඔහුට අවනත වන්නට සිහියක් නොතිබුණු සස්වින්දි සූදානම් වූයේ ඔහු පසු පස දිව යන්නයි. තුහංස ඇය වළකා ගත්තේය. සස්වින්දි තුහංසගේ සුරතේ එල්ලුනාය.

"අනේ සමන් දෙයියනේ... මගේ අහිංසක තාත්තී... අනේ... එයාව අත අරින්න" සස්වින්දි තුහංසගේ සුරත සොලවමින් කෑගැසුවාය. තුහංස ඒවා නෑසුණු කනින් නිහඬව සිටියේය.

"මගේ තාත්තිව මරලා ඔයා නිදහසේ ඉන්නද... කියනවා... හංස මහත්තයා... කියනවා " එවර ඇය ඇසුවේ ආවේගයෙනි.

කෝපයෙන් රතු වූ වත කඳුළු පිරුණු කම්මුල් ඇයගේ සුන්දර බව දෙගුණ කර පෙන්වන්නේ යැයි තුහංසට සිතිණි. ඔහුට පෙරදා ඇයව සිප ගත් මොහොත සිහි විය.

කාලය ඉදිරියට කොතරම් ගත වී තිබුණද තුහංස අද වන තෙක් ඒ වත හැරෙන්නට වෙන වතක් සිප නොතිබුණේය. එනිසාවෙන්දෝ ඒ වත සිප ගන්නට හැඟිමක් මෙන්ම එයින් ඇය කෝප කර සතුටක් ලබන්නටද ඔහු සිතුවේය.

"කියනවා... තමුසේ මගේ තාත්ති මරලා නිදහසේ ඉන්නද" සස්වින්දි ඔහුව අතහැර දමා ඔහු ළඟින් ඉවත් වෙමින් ඇසුවාය. තුහංස ඇයගේ සුරතින් අල්ලා ගත්තේය.

"කොහොමද මගේ නිදහස නැති වෙන්නේ... ආ... එහෙමද හිතාගෙන ඉන්නේ" ඔහු ඇයව තමා වෙතට ඇද ගනිමින් ඇසුවේය.

"මිනී මරලා නිදහස් වෙන්න හිතේ ඇති... ඒවා කොහෙද" ඇය මිදීමට දඟලමින් කීවාය.

"මරන්නේ මම වුණාට හිරේ යන්නේ වෙන කෙනෙක්නේ... මේ කෙල්ල තවම ඒකවත් දන්නේ නැද්ද... මට තියෙන්නේ මම වෙනුවෙන් හිරබත් කන කෙනාගේ පවුල් රකින්න විතරයි" ඔහු ඇයව තෙරපා ගත්තේය. සස්වින්දිට දැනුනේ අප්‍රලකි.

"අත අරිනවා මාව... චී..." සස්වින්දි ඔහුව තල්ලු කර දැමීමට උත්සහ කළද එය නිශ්ඵල විය. ඔහුව සෙලවවීමටවත් නොහැකි වෙද්දී ඇය ඒ දෑත් අතර තව තවත් තෙරපී ගියාය.

" අත අරිනවා... "

ඔහුගේ දෙතොල් පහස වතට දැනෙද්දී සස්වින්දි කේන්තියෙන් කෑගැසුවාය. ඔහු තව තවත් ඇයව තෙරපා ගත්තේය. මොහොතකින් සිදුවිය හැකි යමක් සිහියට නැගෙද්දී ඇය බිය වූවාය.

"අනේ... හංස මහත්තයා..." එය කෙඳිරීමක් විය.

සිතේ කේන්තිය පුපුරා හැලෙන තරමට වෙද්දී සස්වින්දි ඉවසීමෙන් කෙඳිරුවේ ඔහුගේ කේන්තිය තවත් වියසනයක ආරම්භයක් බව සිතට දැනුනු නිසාවෙනි.

"අනේ... මොකද්ද ඒ පාර කෙඳිරිය... ආ..." කඳුළු කම්මුල් දෙතොලින් තෙරපමින් තුහංස ඇසුවේය.

"අත අරින්න... අනේ... අත අරින්නකෝ..." ඇයගේ බියට හා අසරණකමට තුහංසට දැනුනේ සතුටකි.

"අත අරින්නම්... හැබැයි තාත්ති නොකියන විස්තර දුව හොයලා දෙනව නම් විතරක්"

"හොයලා දෙන්නම්... ඇත්තටම... තාත්තිගෙන් කොහොම හරි අහලා කියන්නම්"

"මනෝජ් අංකල් ඔයාටවත් ඒක කියන එකක් නැහැ"

"කිව්වේ නැත්නම් හොරෙන් හරි හොයලා කියන්නම්" තුහංස ඇයව අත හැර දැම්මේය.

නරුමයා... සස්වින්දි ඔහුට තෙරපී රිදුම් දුන් ගත පිරිමැද ගත්තාය. තුහංසට නැඟුණේ සිනහවකි.

"අයියෝ... තුරුල් කර ගත්ත ටිකට ඔච්චර රිදෙනවද "

" දඬු අඬුවකට අහු වුණා වගේ" ඇය ඔහු දෙස බලා කීවාය. තුහංස සිනාසුණේය.

"හරි... හෙට දවස විතරයි... අනිද්දට උත්තරේ ඕනේ... තේරුණාද"

"හ්ම්..." සස්වින්දි හිස සෙලවූවාය. තුහංස ඇය දෙස මොහොතක් බලා සිටියේය.

පැහැය මදක් තළෙලු වුවද බොහෝ පැහැපත් තරුණියන්ට වඩා ඇය බොහෝ සුන්දර වූවාය. සණ කළු පැහැ ඇස් පිහාටු නිසාවෙන් දිගු සිහින් දෑස කැපී පෙනිණි. දිගු හැඩ නාසයේ පළුද්දක් නොමැත්තේය. පිරුණු කම්මුල් සිහින් වුවත් ඇයගේ පරිපුන් දෙතොලට මනාව ගැලපෙන්නට පිහිටා තිබුණාය.

තුහංසගේ දෑස් ඇයගේ ලා රත් පැහැ දෙතොලට යොමු වෙද්දී සස්වින්දි බිම බලා ගත්තාය.

කොතරම් ජඩකම් මැරකම් කළද තුහංස ගැහැනු විෂයේ කෝඩුකාරයෙකු වූවේය. දක්ෂ නමගිය රගර් ක්‍රීඩකයෙකු වූ තුහංසගේ විනෝදය රස්තියාදුව බීමත්කම හා දඛර කරගැනීම මෙන්ම කාට හෝ පහරදීමයි.

යොවුන් වියේ සිටියදී තමාට හසු වූ නිසාවෙන් දඩබ්බරකමට සස්වින්දිව සිපගෙන තිබුණද ඉන් පසු ඔහුට දඛරකරන්නට හෝ ළංව තරුණියක් මුණ ගැසුණේ නැත.

මොහොතකට පෙර සස්වින්දි සිප ලද ආශ්වාදය සිහිවීමෙන් මෙන්ම මෘදුව දැනෙන ඇයගෙන් විහිදුණු ඔඩිකලෝන් සුවඳ

තුහංසව නොසන්සුන් කළේය. ඔහු නැවතත් ඇයට ළං වූවේය.

"තාත්තිව එවන්න" සස්වින්දි මදක් පසු පසට වෙමින් කීවාය.

"ඇයි හදිස්සි... ඔය ටිකක් හිටපුදෙන් මට්ටුවෙන්න" කියූ තුහංස ඇයව තමා වෙතට තෙරපාගෙන ඇයගේ දෙතොලට එබුණේය.

පෙරදා තම වත මේ දෙතොලින් කුළුදුලේ ඉඳුල් වෙද්දී එය දරාගත නොහැකිව කෑගසමින් දබර කර ඔහුට පහර දුන් සස්වින්දි මේ මොහොතේ සිය දෙතොල් කුළුදුලේ ඉඳුල් වෙද්දී නිහඬව දරා ගත්තාය. කලබල කිරීම ඵල රහිත බව වටහාගත් ඇය ආයාසයෙන් ඔහුගේ දෙතොල් පහස විඳගත්තාය.

"රජී අංකල් හිටිය නම් අපට මෙහෙම වෙන එකක් නැහැ" ඇය ඔහුගෙන් දෙතොල මිදී යද්දී මිමිණුවාය.

"මම කවදාවත් මෙච්චර ඉවසලා නැහැ... ඒ තරමට ඉවසුවේ මනෝජ් අංකල් නිසා... නැත්නම් දන්නවනේ... වෙන කෙනෙක් වුණා නම් කුඩුවෙන්න තියන්න කියලා කියන්න මට තත්පරයක්වත් වැය වෙන්නේ නැහැ"

එයනම් සත්‍යකි. එනිසාවෙන් සස්වින්දි ඒ මොහොතේ නිහඬව සිටියාය.

"මට සල්ලි ඕනේ කරන වෙලාවක් මේක... මනෝජ් අංකල් ඒක දන්නවා... එයා හිතන්න ඕනේ කම්පැනියගැන "

"අපේ තාත්ති ඕනිවටත් වඩා කම්පැනියගැන හිතනවා... ඔයයි ඒ ගැන හිතන්නේ නැත්තේ... ඒක යන්නත් වාලේ කරගෙන යන්නේ නැතුව ඔය රස්තියාදු ගහන එක නවත්තලා කම්පැනියට ඇවිත් ඒක ගැන බලන්න"

"කෙල්ල මේ..." තුහංස ඇය වෙතට හැරුණේ දබරඟිල්ල ලෙලවා කෝපයකිනි.

තමා තමාට අනවශ්‍ය යමක් පැවසූ නිසාවෙන් ඔහු කෝපගත් වග වටහාගත් සස්වින්දිට බියක් නොදැනුනා නොවේ. එහෙත් ඇය ඔහුගෙන් දෑස් ඉවතට නොගත්තාය.

කෙල්ල... මතක කාලයේ සිට තමා ඇයව ඇමතුවේ

එලෙසිනි. ඒ තරම් ඇයට කෝපය ගෙන එන අන් කාරණයක් ඒ දිනවල නොවීය. දෑස් රතුකරගෙන දෑසට කඳුළු පුරවා ගන්නා ඇය ඒ මොහොතට කෑගසන්නේ ආවේගයෙනි.

ඒයි නොසණ්ඩාල කොල්ලා... මට ලස්සන නමක් තියනවා... කෙල්ල කෙල්ල කියාගෙන එන්න එපා හරිද...

කෑගසා පවසන ඇය බිමට නැමී ගල් කැබැල්ලක් අහුලාගෙන දමා ගසයි. ගල් කැටයක් නොතිබේනම් ඇය පස් මිටකින් හෝ දමා ගසන්නට පසු බට නොවන්නීය.

"දමලා ගහන්න මොනවත් හොයන්න ඕනේ නැහැ දැන්... මම අද නම දැනගත්තා සස්වින්දි පළිඟුආරච්චි... එහෙනම් පොරොන්දු වුණ විදිහට වැඩේ කෙරෙන්න ඕනේ " සස්වින්දි හිස සෙලවූවාය.

"තව එකක්..." ඉදිරියට ගත් පය වළකාගත් තුහංස නැවත සස්වින්දිගේ වතට එබුණේය.

"මට කාගෙවත් උපදෙස් එපා... මම කාගෙවත් උපදෙස් වලට වැඩ කරන මිනිහෙක් නෙවෙයි"

ඒක තමයි මේ හැම විනාසෙකටම හේතුව... ඇය මිමිනුවා මිසක පැවසුවේ නැත.

"ඒ නිසා... මට කාගෙවත් උපදෙස් අනුශාසනා වැඩක් නැහැ... පොරොන්දු වුණ විදිහට වැඩේ තියෙන්න ඕනේ... කාලය දවසයි... අනිද්දට මට පණිවිඩය ලැබෙන්න ඕනේ... නැත්නම්..." තුහංස මදකට නවතා ඇයගේ කම්මුලට තට්ටුවක් දැම්මේ දබරඟිල්ලෙනි.

"තාත්තගේ පෙට්ටියට සල්ලි හදාගෙන තියාගන්න"

ඔහු නිවසින් එළියට බැස්සේය. සස්වින්දි ඔහු පසු පසම දිව ගියේ මනෝජ් වෙතටයි. තුහංස හිසෙන් කළ ඉඟියට නිදහස් වුණ මනෝජ් සස්වින්දි වෙතට දිව විත් ඇයව තරයේ වැළඳගත්තේ ඉකි ගසමිනි.

"යන්න කිව්වා මම... ඇහුවේ නැතුව කර ගත්ත විනාසයක්... සමන් දෙවියනේ... උඹට කරදරයක්වත් වුණාද මයෙ රත්තරන්" මනෝජ් ඇසුවේ සැකයෙනි.

"නැහැ තාත්ති... බය වෙන්න එපා" ඇය පැවසුවේ දෙතොල ඔහුගෙන් සඟවන්නට සපාගෙනයි.

ඒ වන විටත් රත් පැහැ දෙතොල මදක් රිදුම් දෙමින් තිබිණ. සස්වින්දි කෙසේ පැවසුවද මනෝජ් තුල වූ සැකය නැති වූයේ නැත. සස්වින්දි එය වටහා ගත්තාය.

නරුමයා... මාව විනාශ නොකළට තවත් වතාවකට මාව ඉඳුල් කළා... තාත්ති මොනවා හිතුවද දන්නේ නැහැ... එයාට සැකයි වගේ... මාව ඉඳුල් කළා කියලා කියන්නද මම... සස්වින්දි තුහංස ගැන හිතේ තිබූ කේන්තිය දෙගුණ තෙගුණ වෙද්දී සිතුවාය.

"අනේ සමන් දෙයියනේ මම වැටුණු අමාරුවක්..." මනෝජ් පැවසුවේ දිග හුස්මක් ගෙන ශෝකයෙනි. සස්වින්දි ඔහුගේ හිස අත ගෑවාය.

"උණු හින්දා බොන්නත් බැහැ... කිරි හින්දා විසික් කරන්නත් බැහැ"

"ඇයි තාත්ති"

"ඒ එකවුන්ට් එක ගැන හංස මහත්තයට කියන්නත් බැහැ... සල්ලි අරගෙන දෙන්නත් බැහැ... රජී මහත්තයගේ වුවමනාවටයි හැමදේම කළේ... මගේ දරුවා තමයි අද මේ නිසා අමාරුවේ වැටිලා ඉන්නේ"

"ඒ සල්ලි අරන් දීලා නිදහස් වෙන්න තාත්ති... එයා ඕන දෙයක් කර ගත්තු දෙන්... ඔයා රජී අංකල්ගේ පුතානේ කියලා ඔය කියන නාහන මදාවියෝ ගැන හිතන්න යන්න එපා" මනෝජ් සස්වින්දි දෙස අසරණව බැලුවේය.

"ඔය වසවර්තියා සල්ලි වලට ඕනි දෙයක් කරයි... තාත්තිව මරලා දාන්න වුණත් බැරි නැහැ... දැක්කද පිස්තෝලේ තියලා වාහනේට දාගත්ත හැටි... මම පින්සෙණ්ඩු වෙලා අදහස වෙනස් කර ගත්තේ"

'කොල්ලා දඩබ්බරකම් කරනවා කියලා මට ආරංචි කීපයක් ආවා... ඔය කාලෙට ඕවා නොකර උපාසකයෝ වගේ ඉඳීවියෑ... මට බයක් නැහැ මනෝ... කොල්ලා වැරැද්දක් කළොත් හංසි

ඒවා හදාගයි... ඒක හංසිට කරන්න පුළුවන් කියලා මට විශ්වාසයි... තුහංසගේ දඩබ්බරකමක් පිළිබඳව කත වැටුණු දිනෙක රජීව තමා හා පැවසූ අයුරු මනෝජ්ට සිහි විය.

"තාත්ති නැති දවසක මට කවුද ඉන්නේ... ඒ ගැන හිතන්න... රජී අංකල්ට වෙච්චි පොරොන්දු අමතක කරන්න තාත්තී... ප්ලීස්"

"පොරොන්දුව නෙවෙයි දෝණී ප්‍රශ්නේ... ඒ සල්ලි ගන්න බැරි එක"

"එතකොට තාත්ති ඒ සල්ලි ගන්න බැහැ කිව්වේ ඇත්තටමද"

"ඔව්... ඒ සල්ලි තියෙන්නේ දෝණීගේ නමින්... රජී අංකල් ඒ එකවුන්ට් එක ඇරියේ දෝණීගේ නමට"

"මො... න... වා..." මුව අයාගත් සස්වින්දි මොහොතක් එලෙසින්ම සිටියාය.

"දෝණීට අවුරුදු විසි හතර සම්පූර්ණ වුණාම තමයි ඒ මුදල ගන්න පුළුවන්නේ"

"මොකද්ද ඒ... රජී අංකල් ඇයි ඒවා මගේ නමට දැම්මේ හංස මහත්තයා නමට නොදා"

"එයාට හිතක් තිබ්බා දෝණීව ලේලි කර ගන්න... හංස ඒවා නාස්ති කරයි කියලා බයකුත් තිබ්බා"

"එතකොට... මම.. ඒ මිනිහව බඳින්න ඕනිද"

"ඔයා ඒ වගේ කෙනෙක් බැඳලා කාලකන්නි වෙන්න ඕනි නැහැ... දැන් රජී අංකල් නැහැනේ... සජී මිසුත් දෝණීට කැමති නැහැ... අපි එයාලට සල්ලි අරන් දෙමු... එතකොට ප්‍රශ්නයක් නැහැ"

"ඕ... ගෝඩ්... දැම්ම සල්ලි අරන් දෙන්න ක්‍රමයක් නැද්ද දන්නේ නැහැ"

"දැන් මොකද අපි කරන්නේ"

"ඒ යකාට මේ විස්තරයක් කියන්නේ කොහොමද... ඒකයි මම නොකීවේ... එකවුන්ට් එක දෝණි නමින් නොතිබ්බ නම් මම මේ ගැන කියනවා"

"මේ ගැන නොකියා මේ යකා මෙල්ල කර ගන්නවා නම් බොරු "

"මේ යකා මෙච්චරම දරුණු වෙයි කියලා නම් මම හීනෙන්වත් හිතුවේ නැහැ දෝණි... ඔයා මේකාව ෂේප් කර ගත්තා කියන්නෙත් පුදුමයක්"

"හ්ම්... ඒක ඇත්ත... මතකද තාත්තිට ඉස්සර රෙජී අංකල් නිතරම කියනවා හංසව ෂේප් කර ගන්න පුළුවන් එකම කෙනා හංසි තමා කියලා මට හිතෙනවා කියලා"

"රෙජී අංකල්ගේ හිතේ ඔයා ගැන ගොඩාක් දේවල් තිබුණා දෝණි ඔයා දන්නේ නැති වුණාට... දැන් ඒ ගැන කතා කරලා වැඩක් නැහැ... ඒවා ඔක්කොම රජී අංකල් එක්කම නැතිවෙලා ගියා"

"දැන් අපි මොකද්ද තාත්ති මේකට කරන්නේ"

"ඇත්ත කියන්න නම් බැහැ... දෝණිට කරදරයක් වෙයි"

"හිඃ... ඇත්තමයි... මට විසිහතර වෙලා තිබුණනම් මම ගිහින් මේක අරගෙන දෙනවා... ඕනි මගුලක් කර ගන්න කියලා"

"මයෙ දෝණි හෙට ආපහු නුවර බෝඩිමට යන්න... ඒ බෝඩිම ගැන මේ ගමේ කවුරුවත් දන්නේ නැහැනේ"

"මාව හැංගුවා කියලා ප්‍රශ්න විසඳෙන්නේ නැහැ... එතකොට තාත්තිට මොකද වෙන්නේ... එයා ඇවිත් තාත්තිව මරලා දාලා යයි"

"මම මොනාම හරි කියලා බේර ගන්න බලන්නම්... මගේ නමින් නම් එකවුන්ට් එක තියෙන්නේ මාව මරලා බැහැනේ" මනෝජ් මදක් සිනාසෙමින් කීවේය.

තම පියා කෙසේ සිතුවද පැවසුවද තුහංසගෙන් ඔහුට

සැනසීමක් නොවන බව සස්වින්දි දැන සිටියාය. ඇයට තුහංසගේ සඟයා වූ මයි පියාගේ හිසට පිස්තොලය තැබූ ඇයුරු සිහිවිය. තමා නොසිටින්නට ඔහු හිසට තැබූ පිස්තෝලය පත්තු කිරීමට මයිට අණ ලබා දෙන්නටද තිබිණි. සස්වින්දි හිරිවැටී ගියාය.

කුමක් සිදු වූවත් තමා හෙට දිනයේ ඔහු හමුවිය යුතුය. රජී අංකල් තමාව ලේලිය කර ගන්න සිටි බව පමණක් නොකියා ඔහුට සත්‍ය පැවසිය යුතුය. තම පියා නිදහස් කළ යුතුය. කෙසේ හෝ ඔහුගේ මුදල් ලබා දීමට හැකිනම් එවිට ඔහු පියාට වද කිරීම නවතනු ඇත.

එහි තමාට දිය හැකි මුදලක් තිබේ නම් ගැටළුවක් නැත.... සස්වින්දිට සිතිණි.

ඇය පසු දිනයේ තුහංස හමුවීමට සිතුවාය. ඒ පිළිබඳ කිසිවක් පියාට නොකියා සිටීමට සස්වින්දි අදහස් කළාය.

නිදි යහනට පිවිසි මොහොතේ සිට තුහංසට සස්වින්දිගේ සුන්දර වත සිහිවන්නට විය. ඇයව සිපගෙන ලත් මිහිර දැනෙන්නට විය. ඔහු යහනේ වාඩි වූවේය.

එදා මම ඉඹිනකොට හැපින්න වගේ පැන පැන මට ගැහුව්ව කෙල්ල අද කොහොමද... අහිංසක මුව පැටික්කියක් වගේ බය වෙලා එපා කිව්ව හැටි... මට ඉඹින්න දීලා බලන් හිටිය හැටි...

අද මම තාත්තට පිස්තෝලේ තිබ්බා විතරයි කෙල්ලේ... හෙට නාවොත් වෙනදේ හිතාගන්නවත් බැරි වෙයි... තුහංස මුමුණා ගත්තේය.

පෙරදා සිටම රජීව සස්වින්දිට ඔහු හා සමව සැලකීම තුහංසට කෝපය ගෙන දෙන කාරණයක් විය. සිය මවද ඒ පිළිබඳව සතුටකින් නොසිටි බව තුහංසට මතකය. එහෙත් සිය පියා කිසිවිටෙකත් ඒ පිළිබඳව නොතකා කටයුතු කළ අතර පසුව පසුව සිය මව නිහඬ වෙද්දී තුහංස සස්වින්දි කෙරෙහි වූ කෝපය විසල් කර ගත්තේය.

අපේ තාත්ති මට වගේම උඹටත් ආදරේ කළා... සමහර විට මටත් වඩා... අද තමා මම උඹේ නම දැන ගත්තේ... සස්වින්දි... මම සස්වින්ද... ආය දෙකක් නැහැ... අපේ තාත්තිම තමා නම

තියන්න ඇත්තේ... අපේ තාත්ති ඒ තරමටම උඹට ආදරේ කළේ ඇයි... තුහංස සිතුවේය.

මනෝජ් අංකල්ව මම මරයි කියලා බයට හෙට කොහොම හරි එයාව සල්ලි අරන් දෙන්න කැමති කරවගෙන එයි... හෙට මාව හම්බ වෙන්න වරෙන්කෝ කෙල්ලේ... ඒ සල්ලි විතරක් නෙවෙයි මට උඹත් එක්ක ගණුදෙනු ගොඩාක් තියනවා...

හිතේ දෙගිඩියාවකින් යහනට ගිය සස්වින්දිටද නින්දක් නොවීය. ඇයට මොහොතක් මොහොතක් ගානේ පියාගේ හිසට තුහංස පිස්තෝලය තැබූ අයුරු සිහි විය. එය පත්තු වූයේ නම්... ඇය සිහිතලවී ගියාය.

මට මොනවා වුණත් කමක් නැහැ... මගේ තාත්තිගේ ජීවිතේ බේරිලා... හෙට දිනයේ තුහංස හමුවී ඔහුට සත්‍ය පැවසීමට තමා ගත් තීරණය නිවැරදි වේ යැයි සස්වින්දි සිතුවාය.

හෙටත් ඒ මිනිහට අහු වුණොත්... සස්වින්දි සිතුවේ තම දෙතොල මතට සුරත ගෙන යමින්ය. ඔහු තමා සිප ගනිද්දී කෝපය සඟවාගෙන ඔහුට අවනතව තමාට සිටින්නට සිදුවිය. තමා ඔහුගේ කෝපය තවත් දුරකට ගෙන ගියේ නම් ඔහු නොනවතිණු ඇත. තීන්දුවක් ගෙන තිබියදීත් තවත් වතාවකට ඔහු තම දෙතොල් සිප ගනිද්දීද තමා ඉවසා සිටියාය.

පුළුවන් කමකට නෙවෙයි මම ඉවගෙන හිටියේ... අවස්ථාවක් ආවනම් මට ඒකව මරලා දාන්න වුණත් පුළුවන් වෙයි...

ඒත්... යකඩයා වගේ තියන හයිය... තාත්තිව එක අතට ගත්තනම් මම කවුද... තුරුල් කර ගත්ත පාර තවත් ඇඟ රිදෙනවා... නොසණ්ඩාලයා... මාව ඉම්බ හැටි... ඒකගේ තොලත් යකඩද මන්දා... සස්වින්දි තරහෙන් සිතුවාය.

දෑස යාන්තමට පිය වෙද්දී සස්වින්දිගේ දුරකථනය හැඬවුණාය. අංකය දුටු සස්වින්දි සිහිතලවී ගියාය. තමාගෙන් ඔහුට වරදක් සිදුවී යැයි යන හැඟීම ඇයගේ සිතේ විය.

"ර..හ..ල්" ඇය මිමිණුවේ කෙඳිරිල්ලක් විලසිනි.

ඔහුගේ පෙම්වතිය වී සිටි ඇය පළමු වතාවට ඔහු හමුවීමට යන්නට දින ගනිමින් සිටියාය. පළමු පෙම්වතාට කුළුඳුලේ තුරුළු

වන්නට ඔහුගෙන් සිපුමක් ගන්නට ඇය බලා සිටියාය. නොයිඳුල් දෙතොල් රහල්ගෙන් ඉඳුල් කරගන්නට ඇය සිතා සිටියාය.

වතාවක් නොසිතූ විලසකට තුහංස තමාව සිප ගත්තේ අද ළඳැරියක්ව සිටියදීය. තමා යොවුන් වියට පා තැබූ දා සිට අද වන තුරු රහල්ගේ පෙම්වතිය වී සිටියද ඇය තරුණයෙකුගේ සුසුමක් විඳ නොතිබිණි. ඇය රහල් වෙතට යන්නට සිතුවේ තුඩු සිතින් අභිමානයකිනි.

එහෙත්... අද නොසිතූ විලසට ඒ සියල්ල බිඳී ගියාය. තුහංස තමා තුරුලට ගෙන සිප ගත්තේ වතේ හිදැස් නොතබාය. දෙතොල ඉඳුල් කළේ වතාවකට නොවේ.

නරුමයා...

සස්වින්දි දුරකථනයට සම්බන්ධ වූයේ සිතේ දු ලතැවිල්ලෙන් මෙන්ම වරදකාරී හැඟීමකිනි.

"සස්වි... මොනාද කෙල්ලේ ෆෝන් එක නොගෙන කරන්නේ"

"මට නින්ද ගිහින් හිටියේ රහල්"

"කලින්ම... කෙල්ලේ... අනිද්දට එනවා නේද"

"හ්ම්... හිතාගෙන ඉන්නවා"

"සස්වී..." එය ඉතාම ආදරණීය හැඟුම්බර හඬක් විය.

" ඔයා මාව මුල්ම වතාවට තනියම හම්බ වෙන්න එන දවස... මගේ පෙම්වතිය විදිහට... මම කොච්චර කාලයක් ඒ දවස එනකල් බලාගෙන හිටියද" සස්වින්දි කිසිවක් නොකීවාය.

සස්වින්දිගේ බෝඩිම පිහිටා තිබුණේ රහල්ගේ නිවසට මද දුරකනි. එසේම එහි හිමිකාරිණිය රහල්ගේ නැන්දනියකි.

අවිවාහක ඇය ගමන් බිමන් සඳහා නිවසට ගෙන්වා ගත්තේ රහල්ගේ පියාගේ ත්‍රීරෝද රථයයි. හදිසියකදී කථා කළේ රහල්ගේ නිවැසියන්ටයි. එනිසාවෙන් බෝඩිමේ සිටින්නියන් රහල්ගේ පවුලේ උදවිය සමඟ කථා බස් කළෝය. සස්වින් පාසැල් යද්දී රහල්ව නිතරම මුණ ගැසුණේ ඇයගේ බෝඩිමේ මිතුරියක් රහල්ගේ මිතුරෙකුගේ පෙම්වතිය වී සිටි නිසායි.

පෙම්වතිය ලෙසින්ම වෙන්කරගෙන සිටියේ හිතුමතේටය. එයට කිසිත් නොකී සස්වින්දි ඔහුගේ පෙම්වතිය ලෙසින්ම නිහඬව සිටියාය.

"සස්වී... ඇයි ඔයා නිහඬ වුණේ"

"ඉදිරිය අවිනිශ්චිතයි රහල්... ඕනි දෙයක් ගැන පමණට වඩා බලාපොරොත්තු තියා ගන්න නරකයි"

"ඇයි සස්වි ඔයා ඔය විදිහට අසුභවාදීව කතා කරන්නේ" රහල් ඇසුවේ මදක් අමනාපයෙන්ය.

"ගහක් ගලක් වගේ හිටිය මගේ අම්මා අවුරුදු තිස් ගානට මාවයි තාත්තිවයි දාලා ගියා... එදා ඉඳලා මම ජීවිතේ ගැන සුභවාදීව බලන්නේ නැහැ රහල්" සස්වින්දි දෑසට කඳුළු පුරවා ගනිමින් කීවාය.

"ඔන්න අඬනවා... ඔයා ඔහොම ඇස් වලට කඳුළු ගන්නවා මට බලන්න බැහැ"

"අම්මා මතක් වෙන කොට ඇස් වලට එන කඳුළු වළකා ගන්න මට විතරක් නෙවෙයි තාම මගේ තාත්තිටවත් බැහැ රහල්"

"ඔයාලා ඔහොම කී දවසක් අඬ අඬා ඉන්නද සස්වී... දැන් ඔයාලාගේ අම්මා නැති වෙලා අවුරුදු දහයකටත් වැඩියි නේද"

"අවුරුදු කීයක් ගියත් ජීවිත කාලය පුරාවටම ඒ දුක තියෙයි රහල්... අම්මෙක් නැතිවුණ දුක කාටවත් කවදාවත්ම නැති වෙන්නේ නැහැ"

"ඔව්... ඒක නම් ඇත්ත තමා සස්වී... ඒත්... ඒ දුක අඩුවෙලා යනවා කෙල්ලේ... හරි අපි කතා කරමුකෝ වෙන දෙයක් ගැන"

රහල් සමඟ බොහෝ වේලා විවිධ දේවල් කතා කරමින් සිටියද සස්වින්දිට සැහැල්ලුවක් නම් නොදැනිණි.

ඇය නින්දට ගියේ හෙට දිනය ගැන බර වූ සිතුවිලි ගොන්නකින් හිත පුරවාගෙන තුහංස කෙරෙහි වූ කෝපය බිඳක් හෝ අඩු නොකරගෙනයි.

තුහංස නිවසට හොඳ සිහියෙන් පැමිණ මෙලෙසින් යහනට වී සිටින්නේ බොහෝ කලාතුරකිනි. සජීවා කලකින් පුතාට කතා කරන්න ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට සිතා ඔහුගේ කාමරයට පැමිණියාය.

"පුතා... " ඇය තුහංස අමතමින් යහනේ වාඩි වූවාය.

"මොකද නිකන්... ප්‍රශ්නද" නැගී සිටින තුහංස දෙස බලමින් සජීවා ඇසුවාය.

"හ්ම්... හැමදේම අවුල් අම්මා... මට නම් මේවා දැන් ඇති වෙලා තියෙන්නේ"

"පුතා... තාත්ති මේවා ලස්සනට පිළිවෙලට කළා... මුලදී දුක් වින්දට පස්සේ ලැබුවේ ලාභ විතරයි... පාඩුවක් වුණේ එහෙමත් වෙලාවකට විතරයි"

"ඉන්නේ ඒ සේවකයෝමයි... කරන්නේ තේ කොළ පිටරට යවන එකමයි... ඒත් කෝ ලාභ... මට දැන් මේක වහලා දාන්න හිතිලා තියෙන්නේ"

"වහලා කොහොමද... තාත්ති අමාරුවෙන් ගොඩ නඟාගත් බිස්නස් එක"

"ඉතින් මම මොනවා කරන්නද"

"පුතා... හිතන්න පොඩ්ඩක්... ඔයා ඔෆිස් එකේ ඉන්නේ පැය කීයද... සයින් කරන්න තියන ඒවා සයින් කළා ආවා" සජීවා පවසද්දී තුහංසට සස්වින්දිද මෙසේ කියූ බව සිහි විය.

"තාත්ති දවසම ඔෆිස් ඉඳලත් වැඩ ඉවර කරන්න බැහැ කියලා කියනවා මතකයි මට ඒ දවස් වල"

"තාත්ති ඒකේ අස්සේ රිංගන් හිටියට මට එහෙම කරන්න බැහැ"

"ඔව්... ඔයාට ඒක කරන්න බැහැ... ජීප් එකට කොල්ලෝ පටවගෙන බිබී රස්තියාදු ගහන්න පුළුවන්"

"අයියෝ අම්මා... යනවද මෙතනින් වාත නොවී... මේ ගෙදර කොයි කතාව වුණත් අවසානය මම... මගේ ගමන් බිමන්"

"ඔය ගමන් බිමන් අඩු කර ගන්න... රස්තියාදු ගහන කාලය ඔෆිස් එකට වැය කරන්න... බිස්නස් වැටෙන්නේ නැහැ එතකොට"

"මම ඔෆිස් එකේ හිටියා කියලා බිස්නස් හරි යන්නේ නැහැ අම්මා... බිස්නස් කරන නම් සල්ලි ඕනේ... සල්ලි... සල්ලි... කෝ මට සල්ලි... ඇවිල්ලා තියනවා ඉරාක් ඕඩර් එකක්... ඒක යවන්නවත් සල්ලි නැහැ මට"

"ඔයා නාස්ති කරන සල්ලි කන්දරාවට සල්ලි ඉතුරුවෙයිද පුතා... බොරු අනවශ්‍ය ප්‍රශ්න දාගන්නවා... ගුටි අනිනවා... ඒ කරලා සල්ලි කුට්ටි ගනන් පුදලා බේරෙනවා" සජීවා පැවසුවේ මහත් වේදනාවකින්ය.

"මේ ඔක්කොම මගේ වැරදි... තාත්තට ඔයාව හදා ගන්න මම ඔයාගේ වැරදි එයාට කිව්වේ නැහැ හැංගුවා"

"අනේ අම්මා... ඔය හැමදාම වාදනය කරන තැටියනේ... මට කටපාඩම්... අහලම ඇති වෙලා තියෙන්නේ"

"ඒ වුණාට වැඩක් නැහැනේ... මම නිකන් කියනවා විතරයි"

"නැද්ද අම්මා ළඟ සල්ලි එහෙම"

"කොහෙන්ද... තාත්තිගේ එකවුන්ට් ඔක්කොම ඔයා හූරලා අරගෙන ඉවරයිනේ"

"අම්මා..."

"හ්ම්..."

"තාත්තිගේ එකවුන්ට් එකක් තියනවා... ඒකට කම්පැනි

...ක් ලාභයෙන් කොටසක් යනවා... මට ඒක චිතු නිසා අහුවුණේ"

"කවුද චිතු කියන්නේ"

"ඔෆිස් එකට අළුතෙන් ආව ගර්ල් කෙනෙක්... මනෝජ් අංකල් එයාට ඕනේ කියලා ගත්තේ... ඒ වුණාට ඒකි මට මාර සපෝට්..."

"පුතා... මතක තියා ගන්න හොඳින්... මනෝජ් අංකල් නිසයි

කම්පැනියදුවන්නේ... තාත්ති නැති අඩුව වහගෙන ඒක ඇදගෙන යන්නේ මනෝජ් අංකල්"

"ඒ එයාගේ වාසියට... මිනිහා මාර විදිහට මේකෙන් ගසනවා"

"මම නම් හිතන්නේ නැහැ පුතා... තාත්තිට අපට වඩා විශ්වාස කළා මනෝජ් අංකල්ව"

"ඒ විශ්වාසය තමා එයා වාසියට අරන් මට කොකා පෙන්නලා නටන්න හදන්නේ... කොහොමද බලමුකෝ නටන්නේ එයා" තුහංස පැවසුවේ කෝපයෙනි.

ඔහුගේ කෝපයත් සමඟ සජීවා වටහාගත්තේ නොබෝ දිනකින්ම ඔහු මනෝජ් සමඟ ආරවුලක් ඇති කර ගන්නා බවයි.

"මොකද්ද දැන් ඔය නැටුම් කතාව"

"මම අර කිව්ව එකවුන්ට් එක... ඒක තාත්ති නමින්ද තියෙන්නේ කියලා මට සැකයි"

"සල්ලි යන්නේ කොහොමද ඒකට"

"කම්පැනි එකේ ලාබෙන් සියයට ගානක් තමා යන්නේ... එකවුන්ට් එක තියෙන්නේ කම්පැනි එක නමින්... ඒත් ඒකේ හිමිකාරිත්වය තාත්තිට නැහැ කියලා මට හිතෙනවා"

"මනෝජ්ගෙන් ඇහුවද පුතා ඒ ගැන"

"ඔව්... මනෝජ් අංකල් කියනවා ඒකේ සල්ලි දැම්ම දෙන්නේ නැහැ... තාත්ති අරන් දෙන්න කියලා කිව්ව කාලේ

වෙනකල් ඉන්න කියලා... මට හිතෙන්නේ ඒක තාත්ති මනෝජ් අංකල් එක්ක දාපු ජොයින්ට් එකවුන්ට් එකක් වෙන්න ඇති කියලා"

"එහෙනම් ඒක අරන් දෙන්න කියන්න... දැන් තාත්ති නැහැනේ"

"මම කිව්වා... බැහැමයි කියන්නේ... බලමුකෝ... කෙල්ල හෙට මොනවා හරි කරයි... මම ඒකිට කියලා ආවේ"

"කෙල්ල හිටියද... ඔයා එයාව දැක්කද"

"හ්ම්..."

"ලස්සන ඇති දැන්... අපූර්වා වගේ"

එයට තුහංස කිසිත් නොකීවද තම සිත සිප ගන්නට බල කළ ඒ සුන්දර වත හද පුරාවට මැවී ගියේය.

"ඔය කෙල්ල තාත්තිගේ පණ"

"ඔව්... ඔය කෙල්ල නිසා තාත්ති මට හැමදාම දුන්නේ දෙවෙනි තැන"

"එහෙම කියන්න එපා පුතා... තාත්ති කවදාවත් ඔයාට අඩුවක් කළේ නැහැ... ඔයාට වගේම හංසිටත් ආදරේ කළා... ඒකයි වරද"

"හංසිට... ඒකිට හංසි කියලා කැල්ලකුත් තියනවද... සස්වින්දි කියලා කැල්ලකුත් තියෙනවනේ"

"ඔව්... එයා තුහංසි සස්වින්දි පළිගුආරච්චි... ඔයාගේ නමේ ගැනු නම"

"ඒ කෙල්ලට නම දැම්මේ තාත්තිද"

"ඔව්... තාත්ති හරි ආසාවෙන් හිටියේ කෙල්ලෙකුට... ආය මට ළමයි නැහැ කියන කොට තාත්ති ඉකි ගහලා ඇඬුවා" තුහංස සමච්චල් සිනහවක් පෑවේය.

"අපි කෙල්ලක් අරන් හදා ගමු කියලා කතා වෙලා හිටියේ"

"ඊට පස්සෙද අපූර්වා ආන්ටිට ඒකිව හම්බ වුණේ"

"ඔව්... අපූර්වා ආන්ටිට දුවෙක් ලැබෙන්න ඉන්නේ කියල
ආරංචිය එන කොට උඩ පැන්නේ මනෝ නෙවෙයි... තාත්ති...
ආය අපි කෙල්ලක් අරන් හදා ගන්න ඕනේ නැහැ සජී... අප
කෙල්ලක් හම්බ වුණා කියලා තාත්ති මට කිව්වා"

"මගේ සහොදරියක්ද ඒ" තුහංස උපහාසයෙන් ඇසුවේය.

"පුතා..." සජීවා කෑගැසුවාය.

"පව් පුරවා ගන්න එපා... ඔයාගේ තාත්ති ගොඩාක් හො
කෙනෙක්... රත්තරන් මනුස්සයෙක්... එයාගේ වයිෆ් මම... ම
විතරයි... ඒක මට ඉර හඳ වගේ විශ්වාසයි"

"ඒකිට පුදුම ආදරයක් සැලකිල්ලක්නේ තියෙන්නේ... ඒක
මම කිව්වේ"

"ඒකටත් හේතුවක් තියනවා පුතා... අපූර්වා කියන්
ඔයාගේ තාත්ති පණ වගේ ආදරේ කරපු කෙල්ල... එයාට එය
බඳින්න ගෙදරින් ඉඩ දුන්නේ නැහැ... ඒත්... තාත්ති එය
ආදරේ කළා මැරෙනකල්ම... මම දැනුවත්වම"

"ඉතින් ඔයා බලාගෙන හිටියද"

"බලාගෙන ඉන්න වුණා... මොකද... එහෙම කියලා තා
මට දක්වපු ආදරේ සැලකිල්ලේ කිසිම අඩුවක් තිබුණේ නැහ
ඒ නිසා මට දැනුනු ඊෂ්‍යාව මට යටපත් කර ගන්න සිද්ධ වුණ
එයා අපූට ආදරේ කළා වගේම අපූත් එයාට ආදරේ කළා..
දෙන්නා කවදාවත් මටවත් මනෝටවත් ඉඟියකින්වත් ව
කළේ නැහැ"

"කවුද දන්නේ... අම්මි රැවටිලාද කියලා"

"නැහැ පුතා... කවදාවත් තාත්ති ගැන එහෙම වැර
හිතන්න එපා... පව් පිරෙයි... එයා අපූර්වාට මනෝජ්ට සැල
තමන්ගේ සහෝදරයින්ට වගේ... පුදුම බැඳීමක් ඒ බැඳීම" ද
පෙර කාලය සිහිගන්වා ගනිමින් කීවාය.

"ඒක නම් ඇත්ත... පුදුම බැඳීමක් තමයි... නම්ගම් එක
නෙවෙයි තියන ඒවත් දීලද කියලා මට සැකයි"

"හංසිට නම නම් දැම්මේ මගෙන් අහලා... මම තමයි

කිව්වේ කැමති නම් ඒ නම දාන්න කියලා"

"අපරාදේ... බක්මීමල්දෙණිය කියලත් දාන්න තිබුණේ" තුහංස කෝපයෙන් කීවේය.

"දැන් පලිඟුආරච්චි වුණාට මෙයාට අනාගතේ බක්මීමල්දෙණිය කියන නම එකතුවෙයි කියලා තාත්ති එදා කිව්වා"

"මොකක්... ඒ කියන්නේ... ඒකිව මට කසාද බන්දවන්න අදහසකුත් තිබ්බද තාත්තිගේ හිතේ"

"ඔව්... ඒ අදහසින් තමයි එයා ඒක කිව්වේ... ඒත් මම ගෙදර ඇවිත් බැන්නා... ඔයා ඒ කෙල්ලටයි පවුලටයි ඕනි දෙයක් කරන්න මට කමක් නැහැ... මගේ කොල්ලට විතරක් ඒ කෙල්ල කතා කරන්න එපා කියලා... ඊට පස්සේ තාත්ති ඒ ගැන කථා කළේ නැහැ"

"මේ... මට දැන් නිදිමතයි... යනවද හොඳ හිතින් මට නිදාගන්න ඇරලා" කියූ තුහංස ඇඳේ දිගා වුණේය.

"කන්නේ නැද්ද පුතා"

"දැන් බැහැ අම්මා... ලයිට් එක ඕෆ් කරලා දොර වහගෙනම යන්න"

සජීවා නැගී සිටියාය. තුහංසට සිගරට් පැකටය සිහි වූයේ ඒ මොහොතේයි.

"අම්මා... අම්මා... ඔය සිගරට් පෙට්ටිය මට දීගෙනම යන්න" තුහංස කීවේය.

සජීවා අමනාපයෙන් වුවත් ඔහුට එය ලබා දුන්නාය. ඒ වන විට ඔහු පවසන කුමක් හෝ යමක් ඉටු කර දෙන තරමට තුහංස සිය මව්ව පොළඹවාගෙන සිටියේය.

පසුදා මනෝජ් සුපුරුදු ලෙස කාර්යාලයට ගියේය. ඔහු එහිදී ගිණුමේ හිමිකාරිය දියණිය බව තුහංසට නොපවසා ගිණුමේ හිමිකරු තමා බව පවසන්නට සිතා ගත්තේය.

අදාල කාල වකවානුවට පසු තමාට ඒ මුදල් ලබා ගත හැකි බවත් අදාල මුදල දිනෙක ලබා දීමට කටයුතු කරන බවත්

තුහංසට පවසන්නට ඔහු අදහස් කළේය.

දියණියය අදාල වයස සම්පූර්ණ කරන තුරු මේ ගැටළුවෙන් ඇය බේරා රැක ගැනීම මනෝජ්ගේ අදහස විය.

දෝණි නමට එකවුන්ට් එක තියෙන්නේ කියලා දැන ගත්තොත් ඔයා යකා වියරු වෙයි... කෙල්ලට කරදර කරයි...

ඒ නිසා මේක තියෙන්නේ මගේ නමට කියලා නොකියාම බැරි වුණොත් විතරක් කියනවා... මනෝජ් සිතා ගත්තේය.

සස්වින්දි තමා හමුවීමට පැමිණෙන බව කියූ නිසාවෙන් තුහංස කාර්යාලයට යාමට නොසිතුවේය.

කුඩා කල සිටම සස්වින්දි වෙනුවෙන් සිතේ වූ ඊර්ෂ්‍යාව පෙර දින මව පැවසූ වදන් සමඟ දෙගුණ තෙගුණ වූවේය.

ඇය සිය පියාගේ ආදරවන්තියගේ දියණියවීම සිය පියා කෙල්ලෙකුට දැක් වූ ඇඩි ආදරය මේ කෙල්ලට හිමි වීම මෙන්ම දිනෙක ඇය තමාට විවාහ කර දීමට සිතා සිටිම තුහංසට කෝපය ගෙන දෙන කාරණා විය.

ඔහුගේ දැඩි කෝපයට හේතු වූ අනෙක් කරුණ වූයේ ගිණුමයි.

පිස්තෝලය හිසේ තැබුවද මනොජ් ඒ පිළිබඳව තමාට නියම තතු හෙළි නොකළේය.

එය පියා නමින් ඇත්නම් ඔහුගේ අභාවයෙන් පසු ඒවා තමාට හා මවට හිමි බව නීතිඥවරයා දැණුම් දෙණු ඇත. අනෙක් දේපල වස්තුව ගැන පැවසුවද නීතිඥවරයා එවැන්නක් පවසා තිබුණේ නැත.

ඔහු එසේ නොකළේ පියා නමින් කිසිවක් නොමැති නිසාද... මෙය හවුල් ගිණුමක්ද... නොඑසේ නම් ඒ මුදල් මනෝජ් අංකල් භාරයේ තබා ඇති ඒවාද... තුහංසට සිතා ගත නොහැකි විය.

දැන ගත් මොහොතේ සිට තුහංස ඒ ගිණුම පිළිබඳ කොතරම් සෙවීමට උත්සහ කළද ඔහුට ඒ පිළිබඳ සොයා ගත නොහැකි විය. ඔහු මනෝජ්ගෙන් ඒ පිළිබඳව විමසුවේ ද නිසාය.

මනෝජ් ඒ ගැන දන්නා බව තුහංසට සහතිකය. මන්ද රජ

දැන සිටියේය.

සමන් දෙයියනේ... කෝටි ගානක්... මනෝජ් අංකල් මේක ගැන වෙන කතා කියලා මග අරින්නේ ඒකද... තාත්තිට කොච්චර විශ්වාස වුණත් සල්ලි වලට මොනවද මිනිස්සු නොකරන්නේ... මනෝජ් අංකල් රහසෙම සල්ලි ටික අරන් පැනලා ගියොත්... ඔහුට සිතිණි.

බලමු කෙල්ලේ... හෙට මාව හොයාගෙන නාවොත්... මොන මොන දඬුවම් විඳින්න වෙයිද කියලා... තුහංස මුමුණා ගත්තේය.

හෙට දිනයේ තමා හමුවීම සස්වින්දිට අභියෝගයක් කළ තුහංස තමා හමුවන අයුරු ඇයට පැවසුවේ නැත. හමුවීමට නාවොත් කළ වරදට දඬුවම් ලෙස නිවසට ගොස් නැවත මනෝජ්ගේ හිසට පිස්තෝලය තැබීම ඔහුගේ අරමුණ විය.

හෙට නම් පිස්තෝලේ විතරක් තියලා එන්නේ නැහැ... බය කරලා ගෙදරම කුඩු කරලා කෙල්ලවත් ඇදගෙන තමයි එන්නේ... තුහංස සිතුවේය.

ඇඳ පැළඳ සැරසී සමග නගරයට පැමිණි තුහංස මත්පැන් පොදක් තොල ගෑවේ කාර්යාලයට යාමට සිතා නොසිටි නිසයි. විනෝදය දඩබ්බරකම කෙසේ වුවත් කාර්යාලයට යන විට එතැනට සරිලන ලෙසින් ඇඳගෙන යාමට මත්පැන් නොගෙන එහි යාමට තරම් තුහංස සැලකිලිමත් වූවේය.

දුරකථනයේ දුටු නුපුරුදු අංකය නොතැකූ ඔහු එය තෙවරක්ම නාද වන තුරු එයට සම්බන්ධ නොවීය. ඔහු එයට සම්බන්ධ වූයේ නොනවත්වා තෙවන වරටත් එය නාද වෙද්දීය.

තුහංස කාර්යාලයට පැමිණෙන වේලාව පිළිබඳව පියාගෙන් දැනුවත්ව සිටි සස්වින්දි එම වේලාව අලලා තුහංසට ඇමතුමක් ලබා ගත්තාය.

කිහිපවරක් ඇමතුවද ඔහු කාර්යාලයට නොපැමිණ සිටියේය. සස්වින්දි සේවිකාවකගෙන් ඔහුගේ ජංගම දුරකථන අංකය ලබා ගත්තේ ඉන් අනතුරුවයි.

"හලෝව්..."

"කථා කරන්නේ හංස මහත්තයද" තුහංසට ඇසුනේ ළයාන්විත හඬකි.

ඔව්... තුහංස බක්මීමල්දෙණිය නාම...

"මම සස්වින්දි... මනෝජ් අංකල්ගේ දුව"

" ආ... කොහොමද කෙල්ල... වැඩේ ගොඩ දාගත්තා..."

" මම මේ ඒක කියන්න තමා ගත්තේ... රජී අංකල්..."

"හෝ හෝ හෝ... ඔය විස්තර හම්බ වුණාම... ඇතුළත කලවාන හංදියට ඇවිත් කෝල් එකක් දෙන්න"

"හංස ම..හ..." සස්වින්දිට තවත් යමක් අවස්ථාවක් ඔහු නොතිබ්බේය.

කමක් නැහැ... කලවාන හංදිය නොදන්න තැනක... ගිහින් හම්බ වෙලාම විස්තරේ කියනවා... සස්වින්දි සිතුව...

මෙය විසඳුමක් නැති ගැටළුවකි. පියා උදේ පැවසුවේ... රහසින් නුවර බෝඩිමට ගොස් ගිය බවට පණිවිඩය... ලෙස පමණි. නිවසට පැමිණීම කෙසේවත් නොකර... මෙන්ම හදිසිම අවස්ථාවකදී හැර තමා ඇමතීමවත් ... ලෙස ඔහු පවසා සිටියේය.

පියා තම ආරක්ෂාව සැලසුවේ ඔහුගේ ආරක්ෂා... නොසිතාය.

තුහංසවන් සල්ලි මත්තේ නැහෙන්නෙකුට අනඝ... නැත්තෙකුට පියා කෙසේ පැවසුවද ඔහු හසුකර තබා... කළ නොහැකිය.

ඔහු පියාට අනතුරක් කළහොත් තමා ජීවත්වී එල... මවත් නැති තමාට සිටින්නේ පියා පමණි. කුමන අභියෝ... හෝ මුහුණදී ඔහුව රැක ගත යුතුය.

රජී අංකල් තමා වෙනුවෙන් මෙවැනි දෙයක් කළේ... සස්වින්දි සිතුවාය.

ඔයා දුන්න ලොකු ආදරේ විතරක් මට නොදී... අංකල් මට මෙච්චර දෙයක් දුන්නේ... මට ඒ ආදරේ... තිබුණ නම් හොඳටම ඇති... ඔයාගේ පුතාට මේවා ... මට මේවා දුන්න එක අද වැරැද්දක් වෙලා... ඒ නිසා ම... තාත්තියි අසරණ වෙලා... සස්වින්දි මුමුණා ගත්තාය.

සස්වින්දි කලවාන හන්දියට ගොස් ගත වූයේ විනාඩි ගනනාවකි. තුහංසගේ රථය සස්වින්දි අසල නැවතීය.

"හ්ම්..." රියදුරු අසුනේ සිටි තුහංස හිසින් අණ කළද සස්වින්දි එය නොතැකුවාය.

"හංස මහත්තයා... මට කියන්න තියෙන්නේ ටිකයි... ඒක මම මෙතන ඉඳලම කියන්නම්" කියූ ඇය සූදානම් වූයේ ඔහු හා කථා කිරීමටයි.

ජීප් රථයෙන් බැස ගත් තුහංස රථය පිටු පසට ගොස් එහි දොරට හේත්තු වී සස්වින්දි දෙස බැලුවේය. සස්වින්දි පැමිණ ඔහු ඉදිරියෙන් සිට ගත්තාය.

"හංස මහත්තයා... ඒ එකවුන්ට් එකේ සල්ලි..." ඇයට කියා ගත හැකි වූයේ එපමණකි.

තුහංස දෑසින් දුන් ඉඟිය වටහාගත් තුහංසගේ සඟයින් වටපිට බලා ළඟ සිටිය වුන් මදක් ඈතට යද්දී සස්වින්දිව ඔසවා ජීප් රථයට දමා ගත්තෝය. නොසිතූ මොහොතක නොසිතූ සිදුවීමක් නිසාවෙන් සස්වින්දි කළ හැකි දෙයක් නොවීය.

සමන් දෙවියනේ... අනේ මාව බේර ගන්න..."

ළඟ එක් අයෙක් සිටියා වුවද වටකර ගෙන තිදෙනෙක් ළඟ සිටියදී කෑගසා දඟලා ඵලක් නොවන බව වටහාගත් සස්වින්දි හිතින් විලාප තැබුවාය.

මේ මදාවියෝ ගොඩක් මැද්දේ මට මොනවා වෙයිද දෙයි හාමුදුරුවනේ... ඇයට ක්ලාන්ත ගතියක් දැනිණි.

ජීප් රිය ගැස්සුණු වේගයට වාරු නැති වූ සස්වින්දි වැටුනේ ළඟ සිටි තුහංසගේ සඟයෙක් වූ පැටෝගේ ඇකයටයි.

සුකුමාල තරුණියගෙන් ලද නොසිතූ ස්පර්ශයට පැටෝ හිරි වැටී ගියේය. ඔහු හඬින් සිනහවක් නඟා මතුවන හැඟීම් ආයාසයෙන් වළකා ගත්තේය.

ඔහුගේ සිනහා හඬට පිටුපස බැලූ තුහංස සස්වින්දි ඔහුගේ ඇකයෙන් නැඟිටිනු දුටුවේය.

"ඇයි" ඔහු රථයේ වේගය මදක් බාලකර අසන ඇසිල්ලේ දිරි ගත් සස්වින්දි රථයෙන් පැන ගත්තාය.

"බොස්... කෙල්ල පැන්නා" කෑ ගැසූ තිදෙන ඇ
රථයෙන් පැන්නෝය.

සස්වින්දිට මද දුරක් හෝ දිව ගත නොහැකි විය.
නපුරු වේලාවට දෝ ස්ථානය පාලු ස්ථානයක් විය.

"මැරෙන්ටද බැල්ලී උඹට ඕනේ" තුහංස කෝ
ඇසුවේය.

"මැරෙන එක හොඳයි" සස්වින්දිද නොදෙවෙනි හ
කීවාය.

"මගෙන් බේරිලා ගිය කා ගැන හරි මීට කලින්
තියනවද" තුහංස ඇසුවේ හඬිනි. සස්වින්දි ඉවත බලා ගත්

"තාත්තිගේ පෙට්ටියට දැන් තමුසේ අතේ සල්ලි තියන

"තාත්ති එක්ක ගණුදෙනු ඉවරයි... ඒ වෙනුවට තම
ආවේ"

"ඒ වෙනුවට ආව නම් ගණුදෙනු බේර ගන්නේ නැතු
පැනලා දුවන්න ගියේ"

"මම ගණුදෙනු බේරගන්න ආවේ තමුසේ එක්ක
තමුසෙගේ මේ හිවල්ලු එක්ක නෙවෙයි" තුහංස පිටවන්න
සිනහාව වළකා ගත්තේය.

"මේ හිවල්ලු එක්ක එකට වාඩි වෙලා උන්ගේ වඳුරු
බල බල යන්න මම එයි කියලා තමුසේ හිතුවද... ආ... ගණු
බේර ගන්න වුවමනාවක් තියනවනම් මෙවුන්ව යවප
නැත්නම් මම යනවා" සස්වින්දි කෝපයෙන් පවසද්දී තු
ඇය දෙසම බලා සිටියේය.

"මොකද බලාගෙන ඉන්නේ"

"නැහැ... මම මේ කල්පනා කළේ හිවල්ලුන්ට කො
වඳුරු මූණු තියෙන්නේ කියලා... කමක් නැහැ... මුන්
මකරා වගේ සංකලනය වුණ සත්තු ටිකක් වගේ ඔයාට පෙ
ඇති"

"ඔව්... සංකලනය වුණ එවුන් තමයි... පෙණුම
හැඩරුව ගත්තට ගති තිරිසන්නුන්ගේ"

"ඒක මට වෙන්න ඇති නේද කියන්න ඇත්තේ... මොකද මෙවුන් වඳුරු මූණු තියන හිවල්ලුනේ" සස්වින්දි ඉවත බලා ගත්තාය.

"හා... හා... පලයල්ලා... මේ කුමාරිහාමිට බැහැලුනේ උඹලා එක්ක යන්න" තුහංස සිය සගයින්ට කීවේය.

ඔවුන්ට මුදල් දී ඔවුන් පිටත් කළ තුහංස සස්වින්දි වෙතට හැරුණේය.

"හ්ම්... දැන් නගිමු වාහනේට"

"කොහේ යන්නද"

"මෙතන මහපාර... ගණුදෙනු බේරන තැනක් නෙවෙයි... තනි මටත් බැරිකමක් නැහැ ඇදලා අරන් වාහනේට දාගන්න... ප්‍රශ්න දුර දිග ගියොත් පාඩුව ජීවිතයක්... එක දේකට වැඩි කාලයක් දෙන්න මට පුරුද්දක් නැහැ" සස්වින්දි නිහඬව තුහංස ඇර දුන් ඉදිරි දොරෙන් වාහනයට නැගුණාය.

"ඒ එකවුන්ට් එක රජී අංකල්..."

සස්වින්දි කථාව ආරම්භ කිරීමට සූදානම් වූයේ රථය ඉදිරියට ඇදෙද්දීය. තුහංස ඇයව නැවතුවේය.

"තවම මහපාර" ඔහු කීවේය.

සස්වින්දි නිහඬ විය. තුහංස හඬින් කැසට් යන්ත්‍රය ක්‍රියාත්මක කළේය.

මේ යකා මාව කොහේ ගෙනියයිද... මට මොනවා කරයිද දන්නේ නැහැ... මගෙන් ප්‍රයෝජන ගයි... ඒත් කමක් නැහැ... දැන් මේකා විතරයිනේ... මගේ තාත්ති බේරනවනම් ඕනි දේකට මම ලෑස්තියි... සස්වින්දි සිතුවාය.

ඒත් දෙයියනේ... රහල්...

"මොනවද හිතන්නේ" තුහංස කැසට් යන්ත්‍රය වසා දමමින් ඇසුවේය.

"තවම මහපාර" සස්වින්දි කීවාය.

"ඉතින් තමුසේ තමුසෙට ඕනි විදිහට වැඩ කර ගන්නවා... මට අලද"

"එහෙනම් අහන දේට උත්තර දෙනවා"

"මගේ කට වැඩ... මට ඕනේ විදිහට... දන්නවද" තුහංස වාහනය නතර කළේය.

"හරි... හරි... කතා කරමු... මට ඉක්මනට යන්න ඕනි" තුහංස රථය නැවත පාරට ගත්තේය.

"මොනවද හිතන්නේ කියලා නේද ඇහුව්වේ"

"හ්ම්..."

"ඇයි අහන්නේ"

"දැන ගන්න"

"මම බැඳීලා ඉන්නේ ගණුදෙනුවට විතරයි... ඕනි නම් ඒ ගැන කියන්නම්"

"මේකිගෙ ලොකුකම බලපන්කෝ" තුහංස පැවසුවේ කෝපයෙනි.

"ඕනි කෙනෙකුට තමන්ට උරුම ලොකු කමක් තියනවා හංස මහත්තයා... ඒක මේ මම ඇතුළු හැමෝටම පොදු දෙයක්"

"මොකද තමුසෙගේ තාත්ති කිව්වේ... සල්ලි අරගන්න විදිහ ගැන කිව්වද"

"තාත්ති බොරු නෙවෙයි කියලා තියෙන්නේ... ඒකේ සල්ලි දැම්ම ගන්න බැහැ"

තුහංස අතින් තිරිංගය පෑගුනේ නොසිතාය. මුදල කෝටි ගානක්... ඔහුට සිහි විය.

"නාකියා... මැරෙන්නමයි හදන්නේ... මරනවා මම ඕකව" තුහංස කෑගැසුවේය.

"මගේ තාත්ති මැරුවා කියලා ඔයාට සල්ලි ලැබෙන්නෙ නැහැනේ"

"ඒ සල්ලි තියෙන්නේ අපේ තාත්ති නමින් නෙවෙයිනේ"

"නැහැ... ඒක අරන් දෙන්නම්... ඒත්... දැම්ම නෙවෙයි"

"ඕනි නැහැ... මම ඒක ගන්නම්... අදම... මේ දැන්මම" කියූ තුහංස රථයේ වේගය වැඩි කළේය.

කලවාන වතු බංගලාවේ තුහංසගේ රථය නවතන විට ඔහු වෙතට දිව ආවේ සීතායි.

සීතා වසර ගනනාකව සිට රජීව බක්මීමල්දෙණියට හිමිව තිබූ අක්කර ගනනාවක තේ වත්තේ බංගලාවේ කටයුතු කළ සේවිකාවකි. ඇය ඇයගේ සැමියා සමඟ එහි නැවතී සිටියාය.

සිය හාම්පුතා මිය ගිය පසු වත්තට ආවේ ගියේ පුංචි මහත්තයා සිය සඟයින් කැඳවාගෙනයි. ඒ වත්ත බැලීමට පමණක්ම නොවේ. වඩාත්ම විනෝදයටයි.

"පුංචි මහත්තයා... නොකියම... මට පණිවිඩයක් දුන්නෙත් නැහැනේ... මොනවත් නැද්ද මන්දා බංගලාවේ"

සීතා තුහංසට යටහත් පහත්ව කීවේ අන් දින වලදී ඔහු ඇයට දන්වා මෙහි පැමිණෙන නිසාය.

තුහංස මේ වතු යායට පැමිණ යන්නේ ඇති වන තුරු මත් පැන් බොන්නටයි. මත් පැන් බීමට මෙය නිදහස් ස්ථානයක් විය. මෙහි පැමිණීමට පෙර සීතාට දන්වා ඇය ලවා බයිට් සාදා ගැනීම තුහංසගේ පුරුද්දයි.

"තියන දෙයක් හදලා ගනින්" තුහංස කීවේය.

"එහෙමයි" කියූ සීතා ආපසු හැරුණේ

"අද සඟයෝ ඇවිත් නැහැ වගේ... පුදුමයි... යැයි මුමුණා ගනිමිනි.

"ආ... සීතා... අපි දෙන්නෙකුට දවල් කෑම හරිද"

තුහංස පවසද්දී නැවතුණු සීතා රථයට එබුනාය. සස්වින්දි දුටු ඇය තිගැස්සිණි.

කවදාවත් නැතුව පුංචි මහත්තයා කෙල්ලක් ගෙනල්ලා... මේ කෙල්ල කවුද... සීතා රහසින් සස්වින්දි දෙස බලමින් සිතුවාය.

"පලයන් ඉතින්" තුහංස කෑගැසුවේය. ගැහැණිය තව මොහොතක්වත් එතැන රැඳුනේ නැත.

සීතා දුටු සස්වින්දිට මද සහනයක් දැනිණි. මට ...
කරන්න ආවොත් මම කෑගහනවා... මේ මනුස්සයා ...
ඉන්න එකක් නැහැ... ඇය සිතුවාය.

"හ්ම්... එනවා"

සස්වින්දි තුහංස පසු පසම නිවසට ගියාය. තුහංස
සැටි පුටුවේ වාඩි වෙද්දී ඇය ඔහු ඉදිරියෙන් වූ පුටුවේ ...
වුවාය. තුහංස සස්වින්දි දෙස මොහොතක් බලා සිටියේය ...
ඔහු දෙස බැලූ ඇය වහා ඉවත බලා ගත්තාය.

අණ දෙන හැටි අළුගෝසුවා වගේ... මටත් ඒවා පිළි...
වුණානේ... සත පහකට විශ්වාස කරන්න බැහැ...
කිව්වොත් මරන ජාතියේ එකෙක් නිසා බයයි... තාත්ති ...
ගියේ නැත්නම් දනී... සස්වින්දි කෝපයෙන් සිතුවාය.

"දැන් මොකද්ද මනෝජ් අංකල් කිව්වේ... කවද්ද ඒ...
එක කැන්සල් කරනවා කිව්වේ"

"ඒක කැන්සල් කරන්න බැහැ"

"කන්සල් කරන්න බැහැ... ඇයි... කැන්සල් කරන්...
එකවුන්ට් එකක් ගැන මම මේ ඇහුවමයි... කෙල්ල මේ...
දාන සල්ලි අපට ඕනි වෙලාවට ගන්න පුළුවන්...
ඩිපෝසිට් එකක් හරි කැන්සල් කරන්න පුළුවන්... ...
කියනවා බයිලා ගහන එක නවත්තන්න කියලා" තුහංස
කීවේය.

"ඒ වුණාට මේක එහෙම ගන්න බැහැ"

"ගන්න බැරි ඒවා මම ගන්න දන්නවා... හොඳ...
දැන්මම තමුසෙගේ තාත්තිට කතා කරලා කියනවා අ...
සල්ලි මට අරන් දෙන්න කියලා"

"ඒ සල්ලි තාත්තිට අර ගන්න බැහැ හංස මහත්තයා"

"එහෙමද... මේ... මාව මිනීමරුවෙක් කරන්න එප...
සල්ලි අර ගන්න මනෝජ් අංකල්ට පුළුවන්... ඒක
නොදන්නවා කියලද හිත"

"කියන දේ තේරුම් ගන්න බැරි නම් නිකා ඉන්න"

"කෝටි ගානක් අරගෙන කෙල්ලත් එක්ක රටෙන් පනින්න මිනිහා හිතේ තියාගෙන ඇති... ඒවා කොහෙද මගේ එක්ක"

"කෝටි ගානක්..." සස්වින්දි පුදුමයෙන් ඇසුවාය.

"ඔව්... කෝටි ගානක් තමා... නැත්නම් තමුසේ හිතුවද මම මේ ලක්ෂ ගානකට දඟලනවා කියලා"

සස්වින්දි ඉහළට ගත් හුස්ම පහතට හෙලුවේ සංයමයකිනි. රජී අංකල් තමාට ආදරය කළද මේ තරමක දෙයක් කළේ යැයි අදහන්නේ කෙසේද...

කෝටි ගානක්... තමන්ගේ දරුවාට නොදී පිට කෙල්ලෙක් වුණ තමන් නමට තැම්පත් කර ඇත්තේය.

"තමුසෙට කියන්නනේ බැරි... මම කියන්නම්" තුහංස මනෝජ්ට ඇමතුමක් ගත්තේය.

"අනේ හංස මහත්තයා... අපේ තාත්තිට මොනවත් කියන්න එපා... ඉන්නකෝ" සස්වින්දි තුහංසගේ සුරතේ එල්ලුනාය.

ඇයව තල්ලු කොට දැමූ තුහංස නැවත මනෝජ්ට ඇමතුමක් ගත්තේය. සස්වින්දි ඔහුගෙන් දුරකථනය උදුරා ගත්තාය. තුහංස කෝපයෙන් සස්වින්දිගේ කොණ්ඩයෙන් අල්ලා ගත්තේය.

"ඒක තියෙන්නේ මගේ නමට... තාත්තිව අල්ල ගන්න එපා" සස්වින්දි කෑගැසුවාය.

දෑස් විසල් කළ තුහංස අයා ගත් මුවින් සස්වින්දි දෙස මොහොතක් බලා සිටියේය. ඔහුගේ අත ලිහිල් වෙද්දී කොණ්ඩය මුදවා ගත් සස්වින්දි ඔහුගෙන් ඉවත් වූවාය.

තමා ඔහුගේ ලේ උරුමයයි. මෙලොව සිටින ඔහුගේ සජාත පුත්‍රයා තමායි. බක්මීමල්දෙණිය... ඒ නම ඔහු දී ඇත්තේ තමාටයි.

එහෙත්... ඔහු සතු කෝටි ගනනක මුදල... ලේ උරුමයක් නැති වෙනත් කෙල්ලෙකුට දීමට තරම් තම පියා කටයුතු කර ඇත.

තුහංසට රජීව ගැන මෙන්ම මනෝජ් අපූර්වා ගැනද දැනුනේ ඉවසුම් නොදෙන කෝපයකි.

මනෝජ් අංකල්... එයා සල්ලි ...

ඇති... මෙයාලගේ පුදුම බැඳීම ඒකයි එහෙනම්...

තුහංසි සස්වින්දි මගේ නමින්ම වෙන වාසය... මගේ සහෝදරී... බක්මීමල්දෙණියේ ලේ... බැල්ලී... ම... ගන්න ආව හැතිරී... තුහංස කෝපයෙන් සිතුවේය.

ලෝකෙටම රහසක්... අපේ අම්මාටත් එ... ...හගන්න... අපිව රවටන්න... අම්මා අකමැති වෙන ...නිසාම කියන්න ඇත්තේ මේකිව ලේලි කර ගන්න... අම්මා අකමැතියි කිව්වම ඒ අදහස අත් ඇර ග... එහෙනම්... අම්මා කිව්වේ ඊට පස්සේ ආය ඒ ගැන නැහැ කියලා... කපටියි තාත්ති.... තුහංස මුමුණා ගත්...

"මම ඒ සල්ලි අරගෙන දෙන්නම්... එත... තාත්තිටයි පාඩුවේ ඉන්න දෙන්න ප්ලීස්" සස්වින්දි කී...

ඒක නම් වෙන්නේ නැහැ... උඹ ඕක අරන් කිව්වට... මනෝජ්... උඹේ තාත්තා... ඕක අරන් දෙන්න... නැති වෙයි... තුහංස පවසා ගත්තේ සිතිණි.

"මට අවුරුදු විසි හතර වෙනකල් ඒක බැරිලු" සස්වින්දි තුහංසගේ නිහඬ බව නොතකා කීවා...

ඒකද එහෙනම් කථාව... හොඳයි... විසි හතර වෙන... මම කරන දේවල් හිතා ගන්නවත් බැරි වෙයි... මගෙ... ගත්ත උඹව මම මරන්නේ නැහැ...

ඒත්... උඹට බොහොම විඳවන්න වෙයි... අදට... නෙවෙයි මුළු ජීවිත කාලෙටම... ඔව්... ජීවිත කාලෙටම. උඹේ තාත්තටයි මම කවදාවත් සැනසීමක් දෙන්නේ... තුහංස සස්වින්දි දෙස බලාගෙනම සිතුවේය.

"මට අවුරුදු විසි හතර වුණාම මොන ලෝකේ හිටි... ඇවිත් ඒ සල්ලි අරන් දෙන්නම්... රජී අංකල් ඇයි කළේ කියලා මට හිතා ගන්න බැහැ" සස්වින්දි කීවාය.

ඒ ඇයි කියලා මම දන්නවා... ඒත්... උඹ මගේ නංගී කියලා මම දන්න බව උඹවත් උඹේ තාත්තවත් කවදාවත් දැන ගන්නේ නැති වෙයි... තුහංස හිත පැසවන වෛරයෙන් මුමුණා ගත්තේය.

මෙතෙක් වේලා කියූ කිසිවකට උත්තර නොදුන් ඔහු සිටියේ බර කල්පනාවකය. තවත් සිටියත් මෙසේය. සස්වින්දි සිතුවාය.

"එහෙනම් මම ගිහින් එන්නම්" සස්වින්දි වාඩි වී සිටි පුටුවෙන් නැඟී සිටිමින් කීවාය.

"මගේ කෝටි ගානකට අයිතිවාසිකම් කියන ඔයාව එහෙම නිකම්ම මම යවයි කියලා හිතුවද... ආ... එහෙම රැවටෙන්න එපා... අපි ඔයාගේ තාත්ති එක්කත් කතා කරලා බලමුකෝ නේද" තුහංස මනෝජ්ට ඇමතුමක් ගත්තේය.

"අනේ... ප්ලීස්... එයාට කියන්න එපා" සස්වින්දි පින්සෙණ්ඩු වූවාය. තුහංස ඇයගේ කට මිරිකා ගත්තේය.

"හංස මහත්තයා... මම මේ හංස මහත්තයා ඔෆිස් එකට එනකල් බලාගෙන හිටියේ" මනෝජ් කීවේය.

"එකවුන්ට් එක කැන්සල් කරලා මට සල්ලි අරන් දෙන්න හිතාගෙනද" තුහංස සස්වින්දි දෙස බලාගෙන ඇසුවේය.

"හංස මහත්තයා... මම කිව්වේ... ඒක දැම්ම අරගන්න බැහැ"

"මනොජ් අංකල්... මට තමුසෙගේ දෙඩවිල්ලෙන් වැඩක් නැහැ... තමුසෙගේ දුව යහතින් ඉන්න ඕනේ කියලා හිතනවනම් හෙට වෙන කොට මගේ අතට සල්ලි එන්න ඕනේ" තුහංස සස්වින්දිගේ කරට අත දමා ගනිමින් කීවේය.

"සමන් දෙයියනේ... හංස මහත්තයා... මගේ කෙල්ලටනම් මොනවත් කරන්න එපා" සස්වින්දිට ඇසුනේ මනෝජ්ගේ විලාපයයි.

සස්වින්දිගේ හදවතම පිච්චී ගියාය. තමා පියාගේ පණ වැනිය. තමාට අකටයුත්තක් වේ යැයි ඔහු කෑගසන්නේ කොතරම් බියකින් වේදනාවකින්ද... සස්වින්දිගේ ඉකිය පිට

පතිද්දී ඇය ආයාසයෙන් එය වළකා ගත්තේ පියාට ද
සිතාය.

"එහෙනම් මට ඒ සල්ලි දෙන්න... මොකද මම සල්ලි තියෙන්නේ පළිඟුආරච්චි කියන නමට කියලා"

මනෝජ් තවත් ඇවිලී ගියේය. ඔහු සත්‍ය දැන එසේ නම් දියණිය... ඔහු ඇයව අත නොහරිණු ඇත.

"හංස මහත්තයා... ඒක තියෙන්නේ මගේ නමට ත

තුහංස සස්වින්දි දෙස බැලුවේය. සස්වින්දි ඔහු ෙ සිටියේ නැවත දෑසට කඳුළු පුරවා ගනිමිනි. තම ළ වෙනුවෙන් සත්‍ය වසන් කරයි.

"ඒ සල්ලි මගේ තාත්තිගේ... අදටත් ඒකට සල්ලි දැන් මගේ කම්පැනියෙන්... කෝටි ගානක සල්ලි පැත්ත ගන්න උඹලා කවුද" තුහංස කෑගැසුවේය.

"අපට කාගෙවත් සල්ලි ඕනේ නැහැ හංස මහ ඒවාට රජී මහත්තයා අපිව සම්බන්ධ කළේ ඇයි කිය දන්නේ නැහැ... මම ඒක අරන් දෙන්නම්"

"එහෙනම් තවත් බලන් ඉන්නේ ඇයි මිනිහෙ ආදරයක් තියනවනම් මට සල්ලි දීපන්... දුව ඉන්නේ..." වහා තුහංස්සගේ කට අතින් වැසුවාය.

"එපා" ඇය අභිනයෙන් කීවාය.

"දෝණී... මගේ දෝණී..." මනෝජ් කලබ දැඟලුවේය.

"දැන් ඉන්නවා ඇත්තේ ගෙදරනේ... ඒකයි මම මම දන්නවා ගෙදරට යන පාර... දැන් පුළුවන් මට වුණත් යන්න" තුහංස කතාව වෙනතකට හැර වූවේය.

මනෝජ්ට දැනුනේ සැනසීමකි. මේ වන විට ද නිවසින් පිටව ගොස් ඇති බව මනෝජ් දැන සිටියේය.

"තමුසෙගේ දුව ඉස්සුව නම් ඒකි විකුණලා මට හොයා ගන්න පුළුවන් වෙයි... තමුසේ මට සල්ලි දෙනකල්" කියූ තුහංස දුරකථනය විසන්ධි කර දැමුවේ

මනෝජ්ට තවත් වදනක් හෝ පැවසීමට ඉඩක් නොතබාය.

"තාත්තා කියනවා එකවුන්ට් එක තියෙන්නේ එයා නමට කියලා... දුව කියනවා ඒක තියෙන්නේ එයාගේ නමට කියලා... දැන් කවුද ඇත්ත කියන්නේ" තුහංස සස්වින්දිගේ දෑසට එඹෙමින් ඇසුවේය.

"මම... මම තමයි ඇත්ත කියන්නේ... තාත්ති බයට බොරු කියන්නේ... එයා බයයි ඔයා මට කරදරයක් කරයි කියලා"

"තාත්තයි දුවයි තරගෙට බොරු කියන්නේ ඉස්සෙල්ලා මැරුම් කන්න ආසාවෙන්ද"

"තාත්තිවවත් මමවත් මැරුවා කියලා ඔයාට සල්ලි හම්බ වෙන්නේ නැහැනේ"

"තාත්තිව මැරුවොත් සල්ලි වල අයිතිය දුවට එනවා... එතකොට දුවගෙන් ඒවා ගන්න හැටි මම දන්නවා... සල්ලි වල අයිතිය තියෙන්නේ දුවට නම්... ඒවා මගේ කර ගන්න මට ලේසියි" තුහංස සස්වින්දිගේ දෙවුරේ දෑත් තබමින් කීවේය.

"ඔය කෝක කරන්නත් මට අවුරුදු විසි හතර වෙනකල් ඉන්න ඕනි" ඔහුගේ දෑත් ඉවත් කරමින් සස්වින්දි කීවාය.

"එතකල් මට උඩ බලාගෙන ඉන්න කියලද කියන්නේ" තුහංස ගිගිරුවේ ඇයව ඔහු වෙතට ඇද ගනිමිනි.

මනෝජ්ගෙන් සස්වින්දිට ඇමතුමක් පැමිණියේ ඒ මොහොතේදීය. තුහංසගෙන් ඈත් වී ඔහු දෙස බැලූ සස්වින්දි එය කණ තබා ගත්තාය.

"මගේ දෝණී... ඔයා හොඳින් බෝඩිමට ගියාද"

"බෝඩිම ළඟ ඉන්නේ තාත්තී... ඔයා බය වෙන්න එපා" සස්වින්දි පැවසුවේ යටි ඇසින් තුහංස දෙස බලාගෙනයි. තුහංස සමච්චල් සිනහවක් පෑවේය.

"තාත්තී... මම ඔයාට ය් වෙලා ගත්තම... බුදු සරණයි" කියූ සස්වින්දි ඇමතුම විසන්ධි කළාය.

"තාත්තා ගැන හරි දුකයි වගේ නේද"

"ඔව්... දුකයි තමයි... තමුසෙට තමුසෙගේ තාත්ති
හැඟීමක් නැති වුණාට මට එහෙම නැහැ"

"මට දෙන්න ඕනේ දේවල් ලෝකේ එවුන්ට දීලා
කොට හැඟීමක් එයිද"

"රජී අංකල් හැමදෙයක්ම කළේ හොඳට හිතලා බ
එහෙම කරන්නත් හේතුවක් ඇති"

"බම්බුව... තමුසෙලා වගේ එවුන්ට රැවටිලා විශ්වාස
එයා මගේ අනාගතේ විනාශ කළා... තමුසෙගේ තා
කපටියෙක්... වංචාකාරයෙක්"

"නැහැ... එහෙම නැහැ... කවදාවත් නැහැ" සස්
කෑගැසුවාය.

"කෑගැහුව්වට ඇත්ත ඒකයි"

"තමුසෙගේ අම්මව විකුණලා එහෙම කළේ... දන්න
මගේ තාත්තිගේ ඒ කාලේ ගර්ල් තමයි තමුසෙගේ අම්මා"

"ඔව්... මම ඒක දන්නවා"

"ඇත්තද... එහෙනම් ලේත් එකයි කියලා දන්නවා අ
ඒකනේ කෝටි ගානක් දුන්නේ"

"සමන් දෙයියනේ... අපරාද කථා කියන්න එපා... පව් දු
ගන්න එපා..." සස්වින්දි කෑගැසුවාය.

"එහෙනම් ඇයි කොහෙවත් ඉන්න තමුසෙට ඒවා දුන
මටවත් නොදී... මගෙ ලේ තමුසෙට ඇත්තේ... ඒකයි ඒ" තු
කෝපයෙන් කීවේය.

"තමුසේ ඕවා මට කිව්වට මගේ තාත්තිට ඇහෙන්න එ
කියන්න එපා... ඒ මනුස්සයා දුක උහුලන්න බැරුව මැ
යයි... තමුසේ වගේ මිනිහෙක් හින්දා මට ඒ මනුස්සයා
ගන්න බැහැ... මම අද තමුසේ හම්බවෙන්න ආවෙත් ඒකයි"

"එහෙම මැරිලා යන එකක් නැහැ මම ඕක ඇහෙ
කිව්වා කියලා... මොකද එයා දන්නවා ඇතිනේ එයාගේ යා
ගැන.. ඒ වගේම තමන්ගේ ගැනි ගැන"

"මහ පොළව නුහුලන අපරාධ කතා කියන්න එපා... මගේ අම්මා පැත්තක දාන්න... අර තරම් වටින තමන්ගේ තාත්තට ඔහොම කියන්න තමුසේ කොච්චර නරක මිනිහෙක්ද"

"ඔ... හෝ... ඇත්ත කියන මම ඒ තරම් නරක මිනිහෙක්"

"ඔව්... තමුසේ වගේ අළුගෝසු තිරිසන් මිනිහෙක්ගේ හුළඟක්වත් වදින තැනක ජීවත් වෙන්න තිරිසනෙකුටවත් හිතෙන්නේ නැතුව ඇති" සස්වින්දි කෝපයෙන් රතු වූ වතින් පැවසුවාය.

ඇයගේ කේන්තිකාර මුහුණ රතු වූ වතට නොසන්සුන් වූ ඔහු වහා ඇය වෙතට ළං විය. සස්වින්දි පසු පසට වූවාය.

ඇයගේ වත දෙස බලා සිටි ඔහු ඇය තමාගේ සහෝදරියක්වත්දෝ යන සැකය නිසාවෙන් ඇති වූ හැඟීම් අමතක කළේය.

"ඒ ගැන හිතලා තමයි මගේ තාත්ති රජී අංකල්ට පොරොන්දු වුණත් කමක් නැහැ සජී ආන්ටිත් මට අකමැති නිසා තමුසෙව කසාද බඳින්න එපා කිව්වේ... මට ගන්න පුළුවන් දවසට සල්ලි අරන් දීලා නිදහස් වෙමු කිව්වේ"

සස්වින්දි පැවසුවේ කිසිසේත්ම  අපේක්ෂා කළ දෙයක් නොවේ. තුහංස ගල් ගැසී ගියේය.

එසේ නම් තාත්තිගේ බලාපොරොත්තුව ඔහු මනෝජ් අංකල්ට පවසා ඇත. ඔවුන් මේ විවාහය ගැන කතිකා කරගෙන ඇත.

එය මව නොදන්නවා ඇත්තේ මේ විවාහයට ඇය අකමැති වූ නිසා වන්නට ඇත. තමාට නොදී මුදල් සස්වින්දිට ලබා දී ඇත්තේ මේ විවාහය සිදු කිරීමටම සිතා වන්නට ඇත. එසේ නම් ඇය කිසිසේත්ම තමාගේ සොයුරියක් නොවේ.

ඇයගේ වදනත් සමඟ තුහංසගේ නැති වූ හැඟීම් මතුවන්නට මොහොතක්වත් ගත නොවීය. ඇය ලබා ගැනීමේ ආසාවක් ඇති විය. එසේම මනෝජ්ගේ තීරණය ගැන කෝපයක්ද ඇති විය.

ඔහු තමාගේ බිරිඳටත් වඩා ඔහුව විශ්වාස කළ පුද්ගලයාට වූ පොරොන්දුව බිඳ දැම්මේය. එසේම කෝටි ගණන දී දුව නිදහස්

දමා ඇත්තේය. තුහංසට දැනුනේ කෝපයකි.

ඔහුගේ සිතේ වූ හැඟීමත් සමග පළි ගැනීමේ ඇතිවිය. ඔහු නැවතත් ඇයට ළංවිය.

"දැන් ආය මගේ ළඟට ළං වෙන්න එපා... අප කතා කරලා ඉවරයි" සස්වින්දි පසු පසට වූවාය.

"මොනවද දැන් ඉවර ගණුදෙනු... මට හම්බවුණාද"

"මගේ ළඟට ආවොත් ඉදිරියට ලැමෙන්න තියෙ වෙයි... මම මැරෙන්න බය නැහැ"

"එහෙමද... බලමුද එහෙනම්"

තුහංස සිය ඉණතිම් කලිසම් සාක්කුවේ ද පිස්තෝලය ගෙන සස්වින්දිගේ හිසට එල්ල කළේ සූදානම් වූයේ කෑගැසීමටයි. එහෙත් තුහංස එහා එසා ඇඹුවේය.

"කෑගැහුවවට වැඩක් නැහැ... මම උඹව මර සිනා මම කතා කරනකල් මෙතෙන්ට එන්නෙ නැහ ඉකි බින්දාය.

"මට දෙන්න තියන අකමැත්තට මහ එකා ලැ නාන මට දෙන්නෙත්... එහෙම ආරක්ෂා කරන කෙ මැරුණට පස්සේ කොහොමද උඹේ මහ එකා අඬ නැත හිතලා අඬපන්... තව හයියෙන් අඬපන්... උහුල ගන්න බැරිව ඒකා මැරෙන්න කලින් මම උඹව මරනවා" තුහංස අත ඉවතට ගනිමින් කීවේය.

"අනේ..." සස්වින්දි හඬින් ඉකි බින්දාය.

යම් හෙයකින් මොහු තමා මරා දැමුවහොත් මොහොතක්වත් ජීවත් නොවනු ඇත. ඒ තරමට මගෙ ආදරය කරන බව සස්වින්දි දනී.

"අවුරුදු විසි හතරක් වෙනකල් මට උඩ බැ බැහැ... මමත් මොකක් හරි ප්‍රයෝජනයක් ගන්න සස්වින්දිගේ වතට එබී කීවේය.

කර ගැනීමට සිතුවේය. ඔහු ඒ තරම් පහත් තත්වය
දමා ඇත්තේය. තුහංසට දැනුනේ කෝපයකි.

ඔහුගේ සිතේ වූ හැඟීමත් සමඟ පළි ගැනීමේ ෙ
ඇතිවිය. ඔහු නැවතත් ඇයට ළංවිය.

"දැන් ආය මගේ ළඟට ළං වෙන්න එපා... අපෙ
කතා කරලා ඉවරයි" සස්වින්දි පසු පසට වූවාය.

"මොනවද දැන් ඉවර ගණුදෙනු... මට
හම්බවුණාද"

"මගේ ළඟට ආවොත් ඉදිරියට ලැබෙන්න තියනා
වෙයි... මම මැරෙන්න බය නැහැ"

"එහෙමද... බලමුද එහෙනම්"

තුහංස සිය ඩෙනිම් කලිසම් සාක්කුවේ දමා
පිස්තෝලය ගෙන සස්වින්දිගේ හිසට එල්ල කළේය.
සූදානම් වූයේ කෑගැසීමටයි. එහෙත් තුහංස වහා ඇ
වසා දැමුවේය.

"කෑගැහුව්වට වැඩක් නැහැ... මම උඹව මරල
සීතා මම කතා කරනකල් මෙතෙන්ට එන්නේ නැහැ
ඉකි බින්දාය.

"මට දෙන්න තියන අකමැත්තට මහ එකා ලැස්
ගාන මට දෙන්නතේ... එහෙම ආරක්ෂා කරන කෙල්ල
මැරුණට පස්සේ කොහොමද උඹේ මහ එකා අඬන
ගැන හිතලා අඬපන්... තව හයියෙන් අඬපන්... හ
උහුල ගන්න බැරිව ඒකා මැරෙන්න කලින් මම මෙ
උඹව මරනවා" තුහංස අත ඉවතට ගනිමින් කීවේය.

"අනේ..." සස්වින්දි හඬින් ඉකි බින්දාය.

යම් හෙයකින් මොහු තමා මරා දැමුවහොත්
මොහොතක්වත් ජීවත් නොවනු ඇත. ඒ තරමට මනෙ
ආදරය කරන බව සස්වින්දි දනී.

"අවුරුදු විසි හතරක් වෙනකල් මට උඩ බලා
බැහැ... මමත් මොකක් හරි ප්‍රයෝජනයක් ගන්න ඕ
සස්වින්දිගේ වතට එබී කීවේය.

රතු වූ වත දෑසේ දිළිසෙන කඳුළු ඇයගේ සුන්දර බව වැඩි කර පෙන්වන බව තුහංසට සිතුණේය. එලෙසින්ම පෙරදා ඇය සිප ලද ආශ්වාදය දැනුනේය. හිතේ වූ කෝපය නිසාවෙන් වූ පළිගැනීමේ චේතනාවද දැඩි විය.

"හ්ම්... කාමරේට" ඔහු ඇයගේ හිසට පිස්තෝලය තබාගෙනම ඇයව කාමරයට ගෙන ගියේය.

"නගිනවා ඇඳට"

බෙල්ල තිබුණොත්නේ තැල්ල බඳින්නේ... සස්වින්දිට සිතිණි. ඇය නිහඬව යහනට නැගුණාය.

දොර වසා පැමිණ ටීෂර්ටය ගලවා දැමූ තුහංස විස්කි බෝතලයක් ගෙන කට තබා බීවේය. සිදුවන්නට යන දේ හොඳින් වටහාගෙන සිටි සස්වින්දි කිසිවක් නොපෙනෙන ලෙසින් දෑස් පියා ගත්තාය.

උහුලා ගත නොහැකි ගතේ බරත් නාසයට දැනෙන මත්පැන් සැරත් නුපුරුදු ස්පර්ෂයත් ආයාසයෙන් දරාගෙන සිටි සස්වින්දිට සිය වටිනාකම අහිමිව යද්දී දැනුණු වේදනාවනම් දරා ගත නොහැකිවිය. ඇය විලාපයක් නැගුවාය.

ඇයගේ විලාපයට සැනින් ඇයගෙන් ඉවත් වුණද නොසන්සිදුවාගත් හැඟීම් නිසාවෙන් තුහංසට දැනුනේ කෝපයකි. එනිසාවෙන් ඇයගේ ඉකිබිඳුම නොතැකූ ඔහු සූදානම් වූයේ නැවත ඇය නතුකර ගැනීමටයි.

එළා තිබූ ඇඳ ඇතිරිල්ල දිගේ ගලාවිත් බිඳුවෙන් බිඳුව බිමට වැටෙන ලේ දහරාව දුටු තුහංසට සියල්ල අමතක විය.

"කෙල්ලේ... ඇයි මේ" ඔහු සස්වින්දි ළයේ හොවා ගත්තේ බියෙනි. ඇය කෙඳිරියක් නැගුවාය.

සස්වින්දිගේ ගතට පොරවනය දැමූ තුහංස සීතා සොයා ගියේය.

වාහනයේ ලස්සන කෙල්ලක් දුටු මොහොතේ සීතා තිගැස්සුණාය. පුංචි මහත්තයා නිතර නිතර මෙහි පැමිණියද මත්පැන් බී අසිහියෙන් වැටී සිටියද කෙදිනකවත් කෙල්ලක් මේ බංගලාවට රැගෙන ආවේ නැත. ඒ පුංචි මහත්තයාගේ යාළු කෙල්ලද... සීතාට සිතිණි.

සස්වින්දි දැක තුහංසගේ කීමට එතැනින් ආ සීතා සිය සැමියා සොයා ගියාය.

"මොකද බං" ඇයගේ කලබලය දුටු පියසෝම ඇසුවේය.

"පුංචි මහත්තයා ඇවිල්ලා"

"ඉතින්... වෙනදත් එන්නේ... කණමදයා වගේ බීලා බුදියලා යන්න... "

"අද... කෙල්ලක් ගෙනල්ලා"

"මොකක් බං" ඔහු ඇසුවේ පුදුමයෙනි.

"ඒකනේ පුදුමේ කියන්නේ... මොන ජඩකම් කළත් පුංචි මහත්තයා මෙතුවක් කාලෙකට මේ ගෙදරට කෙල්ලක් ගෙනල්ලා නැහැනේ"

"ලොකු නෝනට කියන්න වෙයිද"

"කියනව නම් පරිස්සමට... අපි කිව්වා කියලා ආරංචි වුණොත් වසලා හාමාරයි"

"ඒක තමයි"

"බලෙන් ගෙනත් වගේද... රවට්ටන් ඇවිල්ලද"

"අනේ මන්දා... ලස්සන හැඩකාර කෙල්ලක්... හරිම සීදේවි පාටයි... දැක්කම ලෝභ කමේ බැහැ... සමහර විට පුංචි මහත්තයගේ යාළු කෙල්ල වෙන්න ඇති"

"හ්ම්... වෙන්න ඇති"

"ඒත්... අඩලා වගේ ඒ ළමයා හිටියේ... මම යන්තමට දැක්කේ"

"යාළු කෙල්ලක් වුණත් මේ වගේ තැනකට ගේන එක වැරදියි... පාලු හුදුකලාවේ මොන මොනවා සිද්ධ වෙන්න බැරිද... ඒත් ඉතින් අපි අවවාද අනුශාසනා දෙන්න කියලද"

"ලොකු නෝනටවත් මේව්වල් කරන්න බැරි කොට අපි කවුද... අපේ අවවාද අනුශාසනා පුංචි මහත්තයා පිළිගයිද"

"හැබැයි සීතෝ... උඹ අද මේකත් මතක තියා ගනින් මම

කියලා... ඔය සල්ලාලකම අනික් ඒවා වගේ නෙවෙයි... ඛනවා හොඳා... ඕකට පුරුදු වුණොත් නම්... අත අරිනවා

ාැහැ... යාළු කෙල්ල වෙන්න ඇති... රස්තියාදු පාටට හොඳට ඇන්දම කළාම පුංචි මහත්තයා පරද්දන්න ාරි මේ රටේ නැතුව ඇති"

ාචි ඉතින් ඔය තේජසට කෙල්ලෝ මුලා වෙනවා" සීතා ත් ගෙට ගියාය.

වේලාවකින් ඇසුණු තුහංසගේ කෝපාකාරී හඬටත් දිගේ ඉකිබිඳුමටත් ඔවුන් දබර කර ගන්නා වග සීතා ගත්තාය. සස්වින්දිගේ විලාපයට බියක් දැනුනද ඇය ඒමට නොහැකි නිසාවෙන් අසරණ වූවාය.

සිරි සීතා සොයා මුල්තැන් ගෙට පැමිණියේ සස්වින්දිගේ ාටයි. බියවී සිටි සීතා විසල් කර ගත් දෑසින් සිය සැමියා ැලුවාය.

ාළු කමට ගෙනාව කෙල්ල වුණාත් මේවා අපරාද ."

පි මොනවා කරන්නද දූලගේ තාත්තේ... කට වහගෙන ාදයක් බලාගෙන ඉන්නවා ඇරෙන්නට"

තා..." තුහංසගේ වේගවත් හඬට සීතා සිය සැමියා දෙස ය. ඔහු හිස සොලවා දුන් අවසරයෙන් සීතා තුහංස ගියාය.

ර කෙල්ලව චුට්ටක් බලන්න" තුහංස පැවසුවේ සීතා නාබලාය.

ා සස්වින්දි සිටි කාමරයට ගියාය. දියණියක් සිටින මවක් ා දකින දසුන උහුලාගත නොහැකි විය. සස්වින්දි ළඟින් වාඩි වූ සීතා ඇය ඇමතුවේ බිඳුණු හඬිණි.

රුවෝ..."

ාන් නැත්දේ..."

කට පමණක් යාත්තමට දුටු තන්නාඳුනනා ගැහැණියගේ

තැනකට එන කොට හිතන්න තිබුණා නේද නොවෙ...

"කිසි දෙයක් ගැන මම හිතුවේ නැහැ නැත්දේ... වුණේ හංස එක්ක කතා කරන්න විතරයි"

"සමන් දෙයියොම මේවා බලා ගන්න ඕනි"

"සීතා..." තුහංස කාමරයට ඇතුළු වූවේය.

"පුංචි මහත්තයා"

"දොස්තර එක්ක එන්නද සීතා"

"ඕනේ නැහැ පුංචි මහත්තයා... බොන්න මොz දෙයක් දීලා පැනඩෝල් පෙති දෙකක් දෙමු"

"පැනඩෝල් විතරක් ඇද්ද... වෙන බෙහෙත් ඕනෙද

"නැති වෙයි"

"හ්ම්... කන්නත් මොනවා හරිත් දෙන්න"

ඉවත බලාගෙනම පැවසූ තුහංස වාහනයේ යතු පිටවී ගියේය.

හෝරාවක දෙකක දිගු නින්දකින් අවදි වුණු සස්වින් වන්නට සූදානම් වූවාය.

"මම නම් කැමති නැහැ ඔය දරුවා මේ හැන්දෑක වෙලා යනවට" සීතා ඒ නොක්කඩුව කීවේ කීවෙනි වත ඇයටම නොදැනිණි.

"නොගියොත් ප්‍රශ්නයක් නැත්දේ... මාව හොයලා වෙයි"

"යාළු මිත්‍ර සම්බන්ධකම් තියෙන්න ඕනේ තමයි... ඒ ළමයෙක් වුණාම තමන්ගේ පරිස්සම ගැන හිතන්න ගෑනු ළමයෙක් හරියට වීදුරු බඩුවක් වගේ... වටිනාකමක් නැහැ" සස්වින්දි නිහඬව සීතාගේ නැමදූවාය. ඒ ලෙංගතුකමට සීතාගේ දෑසට කඳුළු නැගුණ

"බුදු සරණයි නෝනේ... පරිස්සමට" ඇය බිඳුණු හඬින් කීවාය.

සීතාගේ සැමියා සමඟ කලවාන හන්දියට පැමිණි සස්වින්දි මහනුවර බස් රථයකට ගොඩ වූවාය.

ජීප් රථය ගෙන රත්නපුරයට ගිය තුහංස ආපසු ඒමට සූදානම්ව වත්තේ බංගලාවට ඇමතුමක් ගත්තේය. සස්වින්දි නිවසට ඇරලවීම ඔහුගේ අරමුණ විය.

"සීතා... කෙල්ලට කොහොමද"

"නිදියලා නැගිටලා ගියා පුංචි මහත්තයා"

"ගියා... කොහෙද"

"දන්නේ නැහැ පුංචි මහත්තයා... හොයලා කලබලවෙයි කියලා ගියා"

"උඹට බැරි වුණාද ගෑණියේ කෙල්ලව නවත්ත ගන්න... කෙල්ලට මොනවා හරි වුණොත්" තුහංස සස්වින්දිගෙන් ගැලූ ලේ ප්‍රමාණය කොතෙක්දැයි සිහිකරමින් කෑගැසුවේය.

"පුංචි මහත්තයා ඒ දරුවව තියා ගන්න කියලා මට කියලා ගියා නම් මම බලෙන් හරි තියා ගන්නවා"

"මෝඩ ගෑනි" ඔහු දුරකථනය විසන්ධි කළේය.

නොනවත්වා දෑසට පිරෙන කඳුළු වළකා ගන්නට සස්වින්දි බොහෝ වෙහසක් ගත්තාය.

මෙවැන්නක් තමාට සිදුවිය හැකි යැයි යන අනුමානය සිතෙහි තිබුණද එයින් කෙසේ හෝ වැළකෙන්නෙමියි යන සිතුවිල්ල සස්වින්දිගේ හිතේ විය.

එහෙත් නොසිතූ විලසට මෙලෙසින් ඔහුට මෙතරම් ඉක්මනටම හසු වේ යැයි ඇය නොසිතුවාය.

අසත්පුරුෂයා... තිරිසනා... අහිංසක මාව විනාශ කළා... රජී අංකල්... ඔයා මට කොච්චර ආදරේ කළාද... ඒ වුණාට ඔයාගේ පුතා... එයා මාව විනාශ කරලා දැම්මා...

සමන් දෙයියනේ... මගේ මුළු ජීවිතේම ඉවරයි නේද... මගේ

දැන් මොන වටිනා කමක්ද... මම දැන් අවලංගු කාසියක් වගේ
රහල්... මට ඔයත් නැති වුණා... සස්වින්දි ශෝකයේ සිතුවාය.

කමක් නැහැ... මගෙන් ප්‍රයෝජන ගත්තනේ... දැන් අ
බැහැ එයාට මගේ තාත්තිව මරන්න... අසත්පුරුෂයා... ම
විනාශ කළා මදිවට අමාරුවෙන් හිටිය මාව දාලා ගියත් එක්ක
ඇය මුමුණා ගත්තේ කෝපයෙනි.

බොහෝ වේලා හඬ තැලූ දුරකථනයට ඇය සම්බන්ධ වූ
හැඟිමකින් නොවේ.

"සස්වී... මොකද ළමයේ පරක්කු... මම දැන් පැය තුන
පාරේ... මෙච්චර වෙලා ෆෝන් එකත් වැඩ නැහැ" රහල්ගෙ
නොයිවසිලිමත් හඬට පිළිතුරක් ගොණු කර ගැනීමට සස්වින්දි
මද වේලාවක් ගත විය.

"කොච්චර කොල් ගන්න හැදුවද... ෆෝන් එකට මොනා
වෙලාද"

"ඒක ඕෆ් වෙලා රහල්... සොරි... මම පස්සෙ
දැක්කේ" සස්වින්දි පැවසුවේ මුසාවකි.

පියාගේ ඇමතුම නිමා කළ තමා දුරකථනය වසා ගත්තා
ඇය එය විවෘත කළේ මොහොතකට පෙරයි.

"සොරි තමයි" ඔහු අමනාපයෙන් කීවේය.

"වෙන මොනවා කියන්නද ම..ම.. වු..ණාදේ...ට" ඇයගෙ
හඬ බිඳිණි.

"සස්වී... ඔයාට ප්‍රශ්නයක්ද"

"නෑ... නැහැ"

"ඔයා අඬනවද බබා"

"ම්... නැ.. නැහැ.. ර..හල්" අමාරුවෙන් කියාගත් සස්වින
දුරකථනය පසෙකට කර හඬ නොනැගෙන්නට හඬා වැටුණාය

"මොන තරම් බය හිතෙනවද වෙලාවට නාවම... ඔයා ඒ
දන්නවා... ඔයා දැන ගන්න ඕනේ කොහොම හරි ම
පණිවිඩයක් දෙන්න... බය වෙලා ඉන්නේ කියලා හිතලා... ඔ
අමනාපයෙන් නෝක්කඩු කීවේය. සස්වින්දි ආපසු දුරකථනය

කන තබා ගනිද්දීද රහල් සිටියේ ඇයට දොස් කියමිනි.

සස්වින්දි සිතේ වූ නොසන්සුන්කම මඟ හැරෙනතෙක් නිහඬව සියල්ල අසා සිටියාය.

"දැන් ඇති නැද්ද" ඇය ඇසුවේ සිතේ පීඩනය මදකට මකා සිනහවක් නගා ගන්නට උත්සහ කරමිනි.

"මොනවද"

"ඔය බැනිල්ල"

"ඔයාට මොකද... ඔයා ගැන හිතලා බය වුණේ මමනේ... පැය ගානක් පාරේ ඉදලා කකුල් දෙකත් රිදෙනවා" සස්වින්දිගේ හදවතම දවාලමින් රහල් කීවේය.

ඔහු රිදුම් ගත්තේ ආදරේ නාමයෙනි. විදවන්නේ ආදරවන්තිය රැක ගන්නයි... එහෙත්... සස්වින්දිට දැනුනේ වේදනාවකි.

"රහල්... ඔයා ඔහොම එන්න එපා... එන්න ඕනි වෙලාවට මම ඔයාට එන්න කියනවනේ"

"ඒ වුණාට මට එහෙම ගෙදරට වෙලා ඉන්න බැහැ සස්වී... ඇහැට දකිනකල් ඇගේ ලේ නැහැ"

"කිසිම දෙයක් ගැන පමණට වඩා බලාපොරොත්තු තියා ගන්න එපා කියලා මම හැමදාම ඔයාට කියනවා... එතකොට අපට විදින්න වෙන දුක් වැඩියි... ඒ වගේම තමයි ආදරෙත්... වෙන කෙනෙක්ට නෙවෙයි තමන්ටවත් ඕනිවට වඩා ආදරේ කරන්න එපා... වේදනාව වැඩියි"

"ආ... බණ දේසනාව... සස්වී... මම කිව්වට හිතන්න බබා ඔයාට පුලුවන්ද එහෙම කරන්න කියලා... ඔයා එහෙනම් ඇයි අවුරුදු ගානක් ගිහිල්ලත් නැති වුණ අම්මා වෙනුවෙන් තාමත් අඬන්නේ... තාත්තා ගැන ඔච්චර හිතන්නේ" සස්වින්දි නිහඬ විය.

මට අද මෙහෙම අපරාදයක් නොවුණ නම් මම ඔයාට කියන්නේ මීටත් වඩා ඔයාට පුළුවන් නම් මට ආදරේ කරන්න කියලා රහල්... ඒත්... ඒ ආදරේ ලබන්න තිබුණ වාසනාව අද නැති වෙලා රත්තරන්...

කියලා හිතලා ඉටි රෙදි කෑල්ලක් පාරේ එළාගෙන
හතරක් විතර ඔතන බලාගෙන ඉන්න... මම එනකල්"

"තව පැය හතරක්... කොහෙද දැන් ඉන්නේ"

"රුවන්වැල්ලෙ"

"පිස්සුද මැට්ටී... මෙච්චර රෑ වෙලා එන්න...
වුණානම් හෙට එන්න තිබුණනේ... තනියම... එනවා මෙ

"තනියම නෙවෙයි අනේ එන්නේ... මේක ආසන 54
එකක්... තව හිටගෙනත් මිනිස්සු ඉන්නවා"

"වරෙන්කෝ හිතුවක්කාරී... දෙන්නම් ආවම"

"ටොක්කක් කන්න වෙන බව නම් මම ඉතින් ද
හිත හදාගෙන මම එන්නේ" ඇය රහල්ට සිනහවක්
කීවාය.

මේ සබඳකම ස්ථිර කර ගන්නට... දිනෙක ඔහුගෙ
වන්නට සිහින මැවිය යුත්තේ ඔහුට ගැලපෙන ලෙසි
ජීවිතේ පසු බිමක් සකසාගෙන බවට සස්වින්දි
එනිසාවෙන් ඇය උසස් පෙළ විභාග ප්‍රතිඵල ලැබෙ
රහල් තනිව හමුවීම ප්‍රමාද කළාය.

සස්වින්දිට වඩා වසර තුනක් වැඩි මහල් තරුණය
රහල් විශ්ව විද්‍යාල සුදුසුකම් ලද්දෙකි.

"රහල්... ඔන්න මම කැම්පස් සිලෙක්ට් වුණොත්
ඔයාව කසාද බඳින්න වෙන්නේ" රහල් විවාහය ගැ
කරන සෑම දිනෙකම සස්වින්දි එලෙසින් කීවාය.

"ඔයාට පිස්සු සස්වී... මම කැම්පස් ගියා කියල
කැම්පස් යන්නම ඕනේ කියලා දෙයක් නැහැ"

"මම බිරිඳක් වෙන්න යන්නේ ඉංජිනේරු මහත්තය
ඒ කෙනාට සරිලන විදිහට මගේ උගත්කමක් තියෙන්න
ඒක වෙනස් කරන්නේ නැහැ මම"

"හරි... හරි... ඒකත් හොඳයි... කැම්පස් එකේදිවත් හරියට ලව් කරන්න බැරියෑ තුරුල් කරගෙන"

"යන්න රහල්... හරි නරකයි ඔයා... හරියට ලව් කරනවා කියන්නේ තුරුල් කර ගන්න එකට නෙවෙයි"

"මම දන්නවා ළමයෝ... තුරුල් කරගෙන නැති වුණාට... කිස් එකක්වත් ඔය මූණට දීලා නැති වුණාට මම ඔයාට කොච්චර ආදරේද... ඔයාට ඒ ආදරේ තේරෙන්නේ නැද්ද"

"තේරෙනවා රහල්... තේරෙනවා... මාත් ඔයාට ආදරෙයි... ඒ ආදරේ නිසාම තමයි ඔයා ගැන හිතන්නේ... ඔයාට ගැළපෙන කෙනෙක් වෙලා ඔයා ළඟට එන්න හදන්නේ... එතකොට ඔයාට කවුරුවත් වචනයක්වත් කියන එකක් නැහැ... ගැළපෙනම කෙනා ළඟට ගත්තේ කියයි... ඔයත් කවදාවත් පසු තැවෙන එකක් නැහැ"

"අනේ මන්දා... අති පණ්ඩිත... චක්‍රවර්තී... කැම්පස් ආවොත් මට ඔහොම හිතන්න වෙයිද දන්නේ නැහැ"

"කොහොමද"

"මගේ නෝනාට ගැළපෙන විදිහට පී. එච්. ඩී. එකක් ගන්න"

"ආ... තාම ඒ ලෙවල් පාස් විතරයි... මේ පාර තමා කැම්පස්
ට්‍රයි කරන්නේ... මෙයා මට පී. එච්. ඩී. එකත් දීලා"

"නැහැ කෙල්ලේ... ඔයා මේ යන ගමන නවතින්නේ ඊටත් ඉහළින්... මම ඒක දන්නවා" රහල් එදින කීවේය.

"ඔයා කැම්පස් ආවත් නැතත් මගේ තීරණේ වෙනසක් නැහැ සසවී... ඔයා මගේ විතරයි... මම ඔයාව වෙන් කර ගෙන ඉවරයි"

"අප්පෝ... එහෙම වෙන්කර ගන්න එක අසාධාරණයි"

"ඇයි"

"ඇයි කියන්නේ... ඒ වෙන්කරගෙන තියාගෙන ඉන්න

කාලේ මට ඔයාට වඩා හොඳ කොල්ලෙක් හම්බවුණොත්... අපරාදේ"

"අනේ පලයන් බං යන්න... උඹට හම්බ වෙයි මට වඩා හොඳ කොල්ලෙක්"

"ආ... මෙයාද මේ ලෝකේ ඉන්න හොඳම කොල්ලා... එහෙමද හිතාගෙන ඉන්නේ"

"නැතුව... මේ වගේ එළ කොල්ලෙක් මේ කාලේ හොයනවා කියන්නේ හරියට කළු නික හොයනවා වගේ... අමාරුම වැඩක්" එදා ඔහු කොලරය ඔසවා සිනාසෙමින් කී අයුරු සස්වින්දිට සිහිවිය.

"ඔයාගේ කැමැත්ත නිසා මම තව අවුරුද්දක් බලාගෙන ඉන්නම් ඔයා කැම්පස් එයි කියලා... ඒත්... ඔයා දැන් ඉස්කෝලේ යන්නේ නැති නිසා... දැන් පුළුවන් අපට තනියම හම්බවෙන්න" තමා මෙවර නිවසට එද්දී රහල් ඉල්ලීමක් කළේය.

පළමුවර උසස් පෙළ අවසන් කළ සස්වින්දි නිවසට පැමිණ නිවසේ රැඳී සිටියාය. ඇය ප්‍රතිඵල පැමිණියද ඇයට නුවර යාමට නොහැකි විය. ඇය ප්‍රතිඵල දැන ගත්තේ උඩවලවේ තම නිවසේ සිටයි. සමත්වී තිබුණද විශ්ව විද්‍යාල වරම් අහිමිවී තිබුණෙන් ඇය දෙවන වර විභාගයට සූදානම් වන්නට සිතුවේ නිවසේ සිටයි. බෝඩිමේ නොනැවතී පන්ති දින වලට පමණක් නුවර යාමට සිතා සිටියද එය ඇය බෝඩිමේ හිමිකාරියට දැනුම් දුන්නේ නැත.

බෝඩිමට ගොස් එය දන්වා රහල්ගේ ඉල්ලීමට ඔහු හමුවී ආපසු නිවසට පැමිණීමට සිතා සිටි සස්වින්දිට සිදුවූයේ නොසිතුවකි.

තුහංස නිසාවෙන් මනෝජ් පෙර දින හදිසියේ තීරණය කළේ සස්වින්දි නැවත බෝඩිමට යැවීමටයි.

ඔහුගේ තීරණයට අකමැතිව ඔහු තලන්නට පෙලන්නට සස්වින්දි නොසිතුවාය. තමා නිවසේ සිටියේ නම් පියා රැකියාවෙන් ඉවත් වෙනු ඇත. තුහංස තමාට කරදරයක් කරාවි යැයි ඔහු බියෙන් පසු වනු ඇත. සස්වින්දි ඔහුගේ තීරණයට එකඟ වූයේ ඒ නිසාය.

ඒ මිනිහා මාව විනාශ කරලා ඉවරයි තාත්තී... ඒත් ඔයා ඒවා නොදන්නා නිසා සැනසීමෙන් ඉදියි... මට මොනවා වුණත් කමක් නැහැ මගේ රත්තරන් තාත්තී... මට ඕනි ඔයාගේ සැනසීම විතරයි... ඒ නිසා මම බෝඩිමේ නවතින්නම්... සස්වින්දි මුමුණා ගත්තාය.

සස්වින්දි සමඟ වූ සිදුවීම තුහංසගේ ජීවිතයේ කුළුදුල් අත් දැකීමයි. කොතරම් ජඩකම් මැරකම් කළද නීතියට හසුවී දඬුවම් විද තිබුණද ගැහැණියක් සම්බන්ධයෙන් ඔහු කෝඩුකාරයෙකු වූ නිසා සස්වින්දි සම්බන්ධයෙන් ඔහු බොහෝ බිය වූවේය.

ඇයගෙන් ගැලූ රුධිරය සිහිවන මොහොතක් මොහොතක් පාසා ඔහු නොසන්සුන් වූවේය. සීතාට ගත් ඇමතුමට පසුව තුහංසගේ හිතේ තිබූ නොසන්සුන්කමට සීමා නොවීය.

ඇය පිළිබඳව තමා සිතනවා සොයා බලනවා යන්න ඇයට හැඟවීමට අකමැති වුවද සිතේ වූ බියට ඒ සියල්ල අමතක කළ තුහංස සිය සඟයින් සිවු දෙනාද දමාගෙන ඉතා වේගයෙන් සස්වින්දිගේ නිවසට ගියේ ඇයව දැක ගැනීමේ අරමුණෙනි.

සිය හාම්පුතාගේ නොසන්සුන්කම සඟයින්ට ගැටළුවක් වුවත් මෙවෙනි මොහොතක ඔහුගේ කෝපය හඳුනන ඔවුන් පහර කෑමට සිදුවේ යැයි වූ බිය නිසාම ඔහුගෙන් යමක් ඇසුවේ නැත.

සස්වින්දි නිවසේ නැති බව දැන ගත් තුහංස ආඩම්බරකම පසෙකලා ඇයට ඇමතුමක් ගත්තේය.

"කොහෙද ඉන්නේ" තුහංසගේ නොයිවසිලිමත් හඬ ඇසෙද්දී සස්වින්දිට කෝපයක් නැඟුණාය.

"මොකටද අහන්නේ" ඇය කෝපයෙන් ඇසුවාය.

"ඇයි ගැනියේ ගියේ..." ඔහු ඇසුවේ ඊට නොදෙවෙනි හඬකිනි.

"ළඟින්න නෙවෙයිනේ මම ආවේ... හංස මේ..."

"හංස... ඇඳට ගත්තා කියලා මිනිහා වුණා කියලා හිතුවද"

"අපෝ නැහැ... ජාති ජාතිවත් තමුසේ වගේ කෙනෙක්ගේ ගෙදරක බල්ලෙක්වත් වෙන්න මගේ අදහසක් නැහැ"

"බැල්ලී..." කුහංස කෝපයෙන් කෑගැසුවේය.

"මහත්තයා කියන්න මිනිහෙකුට මහත්මා ගති තියෙන්න ඕනි... එහෙම කෙනෙකුට කට ඇරලා ලෝභ නැතුව මහත්තයා කියන්න පුළුවන්... හංස... දැන් ඔයා මගෙන් ගන්න තියන දේ ගත්තනේ... පින් සිද්ධවෙයි මට මගේ පාඩුවේ ඉන්න දෙනවා"

"මොහොතකට ඇඳට ගත්තම කෝටියක් අය වුණා කියලා හිතුවද... තමුසේ රත්තරන්ද"

"ඇඳට ගත්තේ මොහොතකට බව හරි... ඒත්... අයකර ගත්තේ මගේ ජීවිතේම" සස්වින්දිගේ හඬ බිඳිණි.

"ගෙදරත් නැතුව කොහෙද ඉන්නේ"

"කොහේ හිටියම තමුසෙට මොකද... ගෑනි කර ගත්තා කියලද විස්තර හොයන්නේ"

"විස්තර හොයන්නේ දැන ගන්න ඕනි නිසා... මේ කතා කළේත් ජීවත් වෙනවද බලන්න... ගලාගෙන ගිය ලේ මතක් වෙලා"

"බය වෙන්න එපා... මම එහෙම මරන්න පුළුවන් කෙනෙක් නෙවෙයි... අවුරුදු විසි හතර වෙනකල් කොහොම හරි ජීවත් වෙන්නම්"

"කොහෙද ඉන්නේ කියනවා"

"ඒකෙන් තමුසෙට වැඩක් නැහැ"

"අයිසේ... මාව යකෙක් කරන්න එපා... නාකියාගේ මිනිය බලන්නද ඕනේ" තුහංස රථයට පා පහරක් ගසමින් ඇසුවේය.

"හංස..." සස්වින්දි කෑගැසුවාය.

"මතක තියා ගන්නවා... තාත්ති මරනවා මරනවා කියලා බය කරලා මගේ ජීවිතේ මැරුවා... තවත් දේවල් කරන්න මම ඉඩ තියන්නේ නැහැ... තාත්තිට මොනවා හරි වුණොත් මම ජීවත් වෙන්නේ ඒක දැන ගන්නකල් විතරයි... එතකොට කෝටිය තමුසෙට නෙවෙයි රජයට"

"ඒ ගැන මම බලා ගන්නම්... දැන් හොඳ හිතින් කියනවා

කොහෙද ඉන්නේ කියලා" එයට පිළිතුරක් නොදුන් සස්වින්දි දුරකථනය විසන්ධි කළාය.

ඔහු කෝප ගෙන සිටින්නේ පෙරදා ගෙන ගිය කෙල්ල නිසාවෙන් බව තුහංසගේ සගයෝ වටහා ගත්තෝය.

"පර බැල්ලී... නටනවා වැඩියි... ඉන්න තැන කියන්නේ නැහැ... දුරකථනය දෙස බැලූ තුහංස කෝපයෙන් කෑගසා නැවත වාහනයට පා හරවල් කිහිපයක් ගැසුවේය.

හාම්පුතාට කෙල්ලගේ අත්‍යාවශ්‍ය තාවයක් දැනෙන්නේද... ඔහු ප්‍රයෝජන ගෙන අවසන් වූයේ නම්... තමාට... සස්වින්දි ඇකයට වැටුණු මොහොතේ ඇය ගැන ආසාවෙන් කෑදරකමින් සිටි පැටෝ සිතුවේය.

"බොස්... මොකද්ද කේස් එක... කෙල්ල පස්ස ගහනවද" පැටෝ ඇසුවේය.

"ඒකි නටන්නේ මම ගැන නොදැන" තුහංස මත් පැන් බෝතලය කට තබා ගනිමින් කීවේය.

"බය වෙන්න එපා බොස්... පවරන්න අපට වැඩේ... ලංකාවේ කොතනද ඉන්නේ... අපි ගේන්නම් බොස්ගේ කකුල් දෙක ළඟට... ලස්සනට කීකරු කරලා පූසියක් වගේ"

අඩ හොරාවකට වැඩි කාලයක් සස්වින්දිගේ නිවස අසල වාහනයේ මත් පැන් බොමින් ගත කළ තුහංසට පදමට වෙරි වී තිබිණි. සස්වින්දි සමඟ වූ තරහව මිසක පැටෝ පවසන්නේ කුමක්දැයි හැඟීමක් ඔහුට නොවීය.

"අපට ඕනේ බොස්ගේ ඕඩර් එක විතරයි" පැටෝ කීවේය.

"මො..කටද..."

"කෙල්ලව ගේන්න"

"පරට්ටී... බැල්ලී... ඉන්න තැන මට කිව්වේ නැහැ..." තුහංස වෙරි මතින් මිමිණුවේය.

"ගේන්නද බොස්"

"කවුද..."

"ගෙනෙන්... ගෙනෙන්... උඹලට ඕනේ දවසක ගෙ
උඹලාට ඕනේ දෙයක් කර ගනිල්ලා... මට ඕනේ
පරට්ටී... උඹලා... ඕනේ දෙයක්... කර ගනිල්ලා..
මත්පැන් බෝතලය නැවත කට තබාගෙන හිස් කළේය.

මනෝජ්ට ලබා දුන් ඇමතුමෙන් තුහංස නිවස ඇ
හොරාවක සිට සිටින බව දැන ගත් සස්වින්ඳි බිය වූ
ඔහුව කෝප කිරීම සම්බන්ධයෙනි. පියා මරණ බව පෙ
එය ගනන් නොගෙන කළේ වරදක් දැයි ඇය බිය වූවාය.

තුහංස යම් හෙයකින් තමා සමඟ වූ රණ්ඩුවට සෙ
පියාට යම් කරදරයක් කළ හොත්... සස්වින්ඳිගේ ගතම
ගියාය. ඇය ඒ මොහොතේම තුහංසට ඇමතුමක්
සිතුවද ඔහු තමව කෝපයෙන් සිටිනු ඇතැයි සිත
පණිවිඩයක් තැබුවාය.

ඔහුගේ වාහනය නැති බවට මනෝජ්ගෙන් ලද ඇ
පසුව ඇය බස් රියේ ජනේලයට හිස තබා ගත්තේ සැනසි

දිගු නින්දකින් අවදිවුණු සස්වින්ඳි බස් රියෙන් බැස
විට මධ්‍යම රාත්‍රියට ආසන්න වී තිබිණි.

සිතේ පොදි බැඳ තිබූ දහසක් පැතුම් එක් නිමේෂයක
වැටුණේ තමාගේ අවාසනාවට ඉරණමට යැයි සිතූ
මොහොතක් මොහොතක් ගානේ හිත හදා ගැනීම
උත්සහය රහල්ගේ රුව දකින විට නැත්තටම නැතිවී ගියා

රහල් සමඟ සාමාන්‍ය ලෙස දුරකථනයෙන් කතා ක
හා සිනාසෙමින් විහිලු කළද ඔහු තමා වෙතට එද්දී සැ
දරා ගත නොහැකි තරමේ වේදනාවක් දැනිණි. ඇයගෙ
බොඳ වෙද්දී ඇය රහසින් කඳුළු පිසදා ගත්තාය.

"මැට්ටී... මම කියලා තියනවා මෙච්චර රෑ වෙලා
එපා කියලා"

රහල් සස්වින්ඳි දුටු මොහොතේම කෑගසා ගෙ
ඇන්නේය. ඇයගේ සුරතින් අල්ලාගෙන ඇය දෙස බැලු
ඇයගේ කඳුළු දුටුවේ ඒ මොහොතේදීයි.

"අඬන්න එපා කෙල්ලේ... සොරි... මට ටිකක් තරහා ගියා... වොක්ක ඇන්නේ රිදෙන්න නෙවෙයිනේ කෙල්ලේ... ආදරේටනේ බනින්නේ... තරහා එන්නේ" රහල් පසුතැවීමෙන් කීවේය.

"ම්... හරි..." සස්වින්දි සිනහවක් ආයාසයෙන් නගා ගත්තාය.

ඔයාගේ ආදරේ විඳින්න අයිතියක් මට දැන් නැහැ රහල්... මදාවියෙකුට බිලිවුණු මම කොහොමද ඔයාගේ ආදරේ පිළිගන්නේ... රහල්ගේ සුරතේ උණුසුම විඳගනිමින් ඔහු හා පෙළට වැටුණු සස්වින්දි මුමුණා ගත්තාය.

පොරොන්දු වුණ නිසා මම හෙට ඔයාව හම්බ වෙන්නම් රහල්... ඒක තමයි අපේ මුල්ම හා අන්තිම හමුවීම... මම ඔයාගේ නෙවෙයි මම ඔයාට සුදුසු නැහැ කියන එක ඔයාට පිළිගන්නම වෙයි...

බීමතින් සඟයන්ගේ කරෙන් නිවසට පැමිණි තුහංස පිබිදුනේ පසුදා උදේය. ඔහුට සස්වින්දි සිහිවිය. පියාගේ කෝටි ගානක මුදල ඇත්තේ ඇය නමින් බව ඇය පැවසූ අයුරු සිහිවිය. කෝපය ඉවවහා ගිය තමා ඇයගෙන් පළිගැනීමට ඇයව බිය වද්දා නතු කර ගත් අයුරු සිහිවිය.

කමක් නැහැ... ඒකි විද වන්න ඕනි... මට ඒකි ඕනේ නැහැ... මට ඕනේ වුණේ ඒකිව විනාශ කරන්න... විදවනවා බලන්න... තාත්තයි දුවයි දෙන්නම... තුහංස කෝපයෙන් සිතුවේය.

ඒකිගෙන් කොච්චර ලේ ගියාද... තුහංසට දැනුනේ අපහසුවකි.

කෙල්ලට කොහොමද දන්නේ නැහැ... මම යන කොටත් ගෙදර ඇවිත් හිටියේ නැහැ... මම කෝල් කළා... ඒකි ඉන්න තැන කිව්වේ නැහැ... ඊට පසු තුහංසට මතක තිබුණේ තමා ඇය හා දබර කරගත් බව පමණි.

තුහංස දුරකථනය ගත්තේ සස්වින්දි ඇමතීමටයි. ඒ මොහොතේ ඔහු පැමිණ තිබුණු පණිවිඩය දුටුවේය.

හංස මම මගේ බෝඩිමට යන ගමන්... බස් එකේ ඉන්නේ... සස්වින්දිගේ පණිවිඩය දුටු තුහංසට සිනහා නැඟුණේය.

කියන්න ඇති මම ගේ ළඟ ඉන්නවා...
කිව්වට බය වෙන්න ඇති... මම මනෝජ් අංක
ඔව් කෙල්ලේ... උඹ මට බය වෙන්න ඕනේ තා
ඕනේ... තුහංස මිමිණුවේය.

හොඳ වුණත් අමාරුවක් නැති වුණත්
ඩොක්ටර් කෙනෙක් හම්බ වෙලා විස්තරේ
ගන්නවා... මොකද සල්ලි ගන්නකල් මට
වැදගත්... තමුසෙට මොනවා හරි වුණොත්
වෙන්නේ තමුසෙගේ තාත්තවනේ... තමුසේ
නැහැනේ... ඔහු ඇයට පිළිතුරක් යැව්වේය.

රහල් හමුවීමට යාමට සූදානම් වෙමින්
දුරකථනයට පැමිණි ඇමතුම විවෘත කළාය.

තිරිසනා... ඇය මිමිණුවේ කෝපයෙනි.

සස්වින්දි බෝඩිමෙන් පිටත්ව හන්දියට එ
තුරු බලා සිටියේය. වසර ගනනාවක් මේ
පෙම්වතුන් ලෙසින් නිතර හමුවී තිබුණද
සස්වින්දි නොවුණත් රහල්ට නම් විශේෂයක්
තමාගේ බිරිඳ කර ගන්නා බවට රහල් ඒ
හදවතට දිවුරුම් දී ගෙන තිබුණේය.

සස්වින්දි රහල් හමුවීමට පැමිණියේ ඔහුගෙ
ඔහුට සමුදීමට සිතාගෙනයි. තවත් වතාවකට
හමුවීමට ඇයට කිසිම බලාපොරොත්තුවක් නැ

එහෙත් රහල් ලැසි ගමනින් පැමිණෙන
සිටියේ බලාපොරොත්තු ගොන්නක් හදේ රඳව
ඇය දකින්නේ තමාගේ පෙම්වතිය ලෙසින්
අනාගත බිරිඳ... දිනෙක තම දරුවන්ගේ මව
දුරටයි.

ඔයා කැම්පස් ආවත් නැතත් මගේ අදහස
ගන්නේ නැහැ සස්වී... ඔයා තමයි කවදා හරි ම
දරුවන්ගේ අම්මා... රහල් මුමුණා ගත්තේය.

"පරක්කු නම් නැහැ... ඒත් නොයිවසිලිමත්කමට එහෙම දැනෙනවා" රහල් ඇයට පෙරලා සිනහවක් පුද දෙමින් කීවේය.

"ඔය නොයිවසිල්ල හොඳ දෙයක් නෙවෙයි"

"ඇයි සස්වි එහෙම කියන්නේ... හිතන්න ටිකක්... ඔයා රිසාල්ට් එනකල් කියලා මාස ගානක් ගෙදර ගිහින් හිටියා... ආවේ නැහැ... පස්සේ රිසාල්ට් බලන්නවත් එයි කියලා මම බලාගෙන හිටියා... රිසාල්ට් බලන්නවත් ඔයා ආවේ නැහැ"

"එන්න විදිහක් තිබුණහ නැහැ රහල්"

"නැහැ සස්වී... එන්න ඕනේ කමක් තිබුණේ නැහැ... නැත්නම් ඔයාට නුවර එන එක මහ දෙයක් නෙවෙයි"

"තාත්ති කිව්වා ගෙදර ඉන්න කියලා... එක්ස්ටනල් ඩිග්‍රිය කරන්න කිව්වා... දාපු කම්පියුටර් කෝස් එක නිසයි මම ආවේ... ඒක ඉවර වුණාම මම ආය යනවා රහල්"

සස්වින්දි පැවසුවේ මුසාවකි. තමා රහල් හා ගැටෙන විට ඔහු හමුවන විට දැනෙන වේදනාව දරා ගැනීමට තමාට අපහසුය. එසේම රහල් තමාට තව තවත් ළංවීම වළක්වාගත නොහැකිවණු ඇත.

"ඔයාට මේ පාර කැම්පස් යන්න පුළුවන් සස්වී... විශ්ව විද්‍යාලය හැමෝටම යන්න පුළුවන් තැනක් නෙවෙයි... ඔයා එතෙන්ට එනවනම් ඒක මට ලොකු සතුටක්"

"තාත්ති ළඟ මම ඉන්න ඕනි රහල්"

"කමක් නැහැ... පස්සේ හැමදාටම මගේ ළඟ ඉදියිනේ" සස්වින්දි නතරවිය.

"සස්වී" රහල් ඇයගේ සුරත සෙමින් අල්ලා ගත්තේය.

මේ සුරතේ උණුසුම ඇයට ආගන්තුක නොවේ. එහෙත් රාත්‍රියේ මෙන්ම දැන් මේ මොහොතේත් ඒ උණුහුම සස්වින්දිගේ හිතට එක් කළේ උසුලා ගත නොහැකි බරකි.

තුහංසගේ රළු දැඩි සුරත් පහස ඇයගේ ගතට දැනෙනවාක් මෙන් විය. ඇය අත මුදවා ගත්තාය.

"මොකද මේ... දැන් ඔයා ඉස්කෝලේ යන ළම
නෙවෙයිනේ... ඉතින් මොකටද අත දෙන්න
වෙන්නේ" රහල් නැවත ඇයගේ අත අල්ලා ගනිමින් කීවේ

සස්වින්දි අත මුදා ගැනීමට තැත් කළද ඔහු එයට
තැබුවේ නැත.

"මම ඔයාට කියලා තියෙන්නේ මම කැම්පස් සිං
නොවුණොත් ඔයාගේ ඉල්ලීමට එකඟ වෙන්නේ නැහැ කිය
අපි මේ සම්බන්දේ නවත්වමු රහල් "

"මට ඔයා කැම්පස් යවන්න ඕනේ නැහැ... ඔයා ඒ
ලෙවල් නොකළත් මට කමක් නැහැ... මම ඔයා බඳින්න තීර
අරන් ඉවරයි සස්වී... ඔයා මගේ තීරණේට එකඟ වුණත් නැ

"එහෙම කොහොමද ඔයා තනි තීරණයක් ගන්නේ"

"ගන්න පුළුවන් නිසා කියන්නේ... නඟින්න
එකට" රහල් බස් රථයකට අත දමමින් කීවේය.

බස් රථයේ ආසන දෙකක වාඩිවී යාමට සිදුවූයෙන් ක
එතැනින් හමාර විය. රජවාසල උද්‍යානයට ඇතුළු වී
වනතුරු රහල් ඒ සම්බන්ධයෙන් කතා කළේ නැත.

"ඔයා ඇහුව්වා නේද මම කොහොමද බඳින්න තීරණ
ගන්නේ කියලා"

සස්වින්දි සමඟ සිමෙන්ති බංකුවේ වාඩි වුණු රහල් ඇය
උරවටා සුරත දමා ගනිමින් ඇසුවේය. ඇය ඔහු දෙස බැලුව

"අහන්න... ඔයා මගේ ගර්ල් කියලා මම වෙන් කරගෙ
ඉන්නේ අද ඊයෙක ඉඳලා නෙවෙයි... ඒ බව ඔයා දන්නවා"

"ඒත් රහල්... මම ඔයාට..."

"ඉන්න සස්වී මම කියනකල්" රහල් ඇයව වැළකුවේය.

"ඔයාට මට අකමැති වෙන්න කිසිම හේතුවක් නැහැ කිය
මම දන්නවා... අනික ඔයා මට කැමැත්තෙන් ඉන්නේ
හම්බනොවුණේ ඉස්කෝලේ යන නිසා කියලා මම දන්නවා"

"රහල්..."

"පොඩ්ඩක් ඉන්න" රහල් නැවතත් සස්වින්දිව නවතා දැමුවේය.

"අපි හම්බ වුණා... කතා කළා... අදහස් හුවමාරු කළා... නොකළේ මේ වගේ තනිවෙලා හම්බනොවුණ එක විතරයි... ඔයා මට අකමැත්තෙන් හිටියනම් ඔයා මාව මඟ අරයි" සස්වින්දි නිහඬ වූවේ ඔහු පවසන්නේ සත්‍යක් නිසාවෙනි.

සස්වින්දිගේ දෑසට කඳුළු නැගුණේ නිතැතිණි. ඇයට ඒවා වසන් කර ගැනීමට අවස්ථාවක් නොවීය.

"ආදරෙයි රත්තරන්... ආදරෙයි මම" රහල් ඇයගේ පැහැපත් කම්මුලේ දෙතොල් තබමින් කීවේය.

රහල්ගේ ප්‍රථම හාදුවෙන් සස්වින්දි හිරි වැටී ගියාය. එසේම තුහංසවද ඇය ඉදිරියේ මැවී ගියාය.

ආදර වදන් නොව සරදම් වදන් මෙන්ම බහින් බස්වීම් දෙදෙනා අතර හුවමාරු වුවද හැඟිමකට නොව කෝපයකට පළිගැනීමකට සිප ගත්තා වුවද තුහංස මේ කම්මුල් රතු වන තුරු රිදෙන තුරු දෙතොලින් තෙරපුවේ විවේකයක් නොතබාය.

දැනුණු මෘදු පහසට වඩා වින්ද රළු පහස හිතට දැනුනේ හදවතට කුමක්දෝ නොතේරෙන යමක් එක්කරමිනි.

"රහල්..."

"මොකුත් කියන්න එපා සස්වී" ඔහු කෙඳුරුවේ සස්වින්දිගේ වතම දෙතොලට හසුකර ගනිමිනි.

"හිතුවක්කාර වෙන්න එපා රහල්... ඔයාට මාව ගැලපෙන්නේ නැති වෙයි" ඇය දෑසට කඳුළු පුරවා ගනිමින් ඔහුගෙන් මිදෙමින් කීවාය.

"ඔයාට කතා කරන්න දෙයක් නැහැ සස්වී... ඔයා ආය ඒ ගැන කතා කළාට වැඩකුත් නැහැ... මගේ තීරණේ වෙනසකුත් නැහැ... මෙහෙට වරෙන් කෙල්ලේ... උඹ මගේ... මගේ විතරයි" රහල් ඇයව තුරුලු කර ගත්තේ දෙතොලේ පහසත් විඳ ගැනීමටයි.

සත්‍ය ඔහු දනී නම්... මේ හැඟීම් මොහොතකින් ඉවතට ය
ඇත. එහෙත් ඔහුට තමා සත්‍ය පවසන්නේ කෙසේද... ඔහු ත
වෙනුවෙන් තුහංස හා පැටලෙනු ඇත. තමා වෙනුවෙ
අහිංසකයෙක් මදාවියෙකු වෙතට යැවිය නොහැක. හොඳම
සියල්ල විඳ දරාගෙන නිහඬව සිටීමයි. සස්වින්දි නිහඬ වූවාය.

"දන්නවද... මම දැන් ඔයාව හැම අතින්ම මගේ කරගෙ
ඉවරයි... තියෙන්නේ නීතියෙන් මගේ කර ගන්නයි...
පස්සේ ලැබෙන අයිතිය ගන්නයි විතරයි" රහල් ඇයව අත ප
දමමින් කීවේය.

"හිතුවක්කාරකමට ඔක්කොම කරගෙන තීරණ අරන් දව
මොනවා හරි හේතුවකට මාව නැති වුණොත් ඔයා මට ෙ
කියන්න එපා රහල්"

"ඔයාට මාව දාලා යන්න හේතුවක් නැහැ සස්වී...
අවුරුදු හතරට මම ඔයාව හොඳට අඳුරගෙන ඉන්නේ... "
එහෙම නරක වංක කෙල්ලක් නෙවෙයි කියලා මම දන්න
ඔයාගෙ තාත්ති මට අකමැති වුණොත් දවසක ඔ
තාත්තිගෙන් ඉල්ලා ගන්නත් මට බැරිකමක් නැහැ"

"ඔයාට මට වඩා හොඳ කෙනෙක් කැම්පස් එ
හම්බවෙයි රහල්... මේ යාළුකම විතරක් අපි ඒ විදඑ
තියාගමු"

"ආවේ ඒක කියන්නද... විකාරද ඔයාට" රහල් ඇ
සැරෙනි.

"ඔයාට අපේ නොගැළපීම දවසක දැනෙයි"

"හරි... ඒක මම ඒ දවසට බලාගන්නම්"

"ඔයා හොඳටම හිතුවක්කාර වෙලා රහල්"

"එහෙම වෙනවා මිනිස්සු ඉවසලා ඉවසලා තවත් ඉවස
බැරිම වෙනකොට... ඒ වගේම එයාගේ කෙල්ල හිතුවක
වෙනකොටත් එහෙම වෙනවා"

තමා අපිරිසිදු නොවන්නට... ඔහු අතින් ගැහැණි
නොවන්නට අද දිනය තමාගේ ජීවිතයේ ලස්සනම
වන්නට තිබිණි. සස්වින්දි සිතුවාය.

"සස්වී..." ඇයට රහල්ගේ හඬ ඇසුණේ ඉතා ආදරණීයවයි. තවත් ඉවසා දරාගත නොහැකි වූ සස්වින්දි රහල්ගේ උරයට බරවී ඉකිගැසුවාය.

"මේ මොකද බබා... ඇයි මේ... ආ... අඬන්නේ සතුටටද දුකටද"

"දෙකටම... හරි... මම පුළුවන් තරම් කාලයක් ඔයාගේ වෙලා ඔයාගේ ළඟින් ඉන්නම්... ඒත් ඔයාගේ වයිෆ් වෙනවාමයි කියලා නම් මට පොරොන්දු වෙන්න බැහැ"

"ඇයි ඒ"

"ජීවිතේ ඉදිරිය ගැන අපට කියන්න බැහැ රහල්... ඔයා ඉංජිනේරුවෙක් වුණාම ඔයාගේ ගෙදරින් මට කැමති වෙයිද දන්නේ නැහැ... අපේ තාත්ති කොච්චර කාලයක් මාව ගෙදර තියා ගයිද දන්නේ නැහැ... ඔයා කැම්පස් ගිහින් එනකල් ඉන්න බැහැ කියලා කසාද බන්දලා දෙයිද දන්නෙත් නැහැ"

"හරි හරි... ඔයා මේ ඉන්න විදිහට ඉන්නකෝ... අපි වෙන දෙයක් බලාගමු" කියූ රහල්

ඕනිම ප්‍රශ්නයකට මූණ දීලා ඔයාව දවසක මගේ වයිෆ් කරගන්න මම දන්නවා... යි සිතින් මුමුණා ගත්තේය.

"ඒ කාලයේ ඔයාට හොඳ ගෑනු ළමයෙක් හම්බ වුණොත් ඔයා එයාව යාළු කර ගෙන කසාද බඳින්න... කිසි ප්‍රශ්නයක් නැහැ" සස්වින්දි පවසද්දී රහල් රවා ඇය දෙස බැලුවේය. සස්වින්දි සිනාසුනාය.

"සස්වි මේ... ඔයාට මාව කසාද බඳින්න බැරි නම් කට වහගෙන පාඩුවේ ඉන්න... මගේ කසාද ගැන කතා කරන්න එන්න එපා ඔයා" රහල් පැවසුවේ කේන්තියෙනි.

"අපෝ... කේන්ති යන තරමක්... ළඟම යාළුවා වුණාම ඒවා ගැනත් හොයන්න අයිතියක් තියනවා"

"යාළුවා... කවදා ඉඳන්ද මගේ යාළුවා වුණේ... ආදරවන්තිය දිහා යාළුවා කියලා හිතාගෙන බලන්න මට වුවමනාවක් නැහැ සස්වී... ආදරේ කියන්නේ ආදරේ... ඒක යාළුකමට වඩා වෙනස් හැඟීමක්... ඔයා කොහොමද සස්වී එහෙම කතා කරන්නේ"

"ඒක යාළුකමට වඩා වෙනස් හැඟීමක් කියන රහල්... ඒත් නියම ආදරේ කියන්නේ එකිනෙකාගේ ස පරිත්‍යාගයක් වෙන්නත් පුළුවන්"

"දැන් ඔය කතාව අපි නතර කර ගමුද... අද ඉස්ස මේ විදහට හම්බ වුණේ... රණ්ඩුවෙලා නැහැනේ" රහල් ඇයගේ උර වටා අත දමා ගනි ළංකර ගත්තේය.

සස්වින්දිව සොයා ගෙන ඒමට තුහංසගෙ ලැබුණු දින සිටම පැටෝ් අනෙක් සඟයින් උනන්දු සෙවීමට පටන් ගත්තේය. තුහංසගෙන් ලත් වදන ඉවසුම් නොදෙන සතුටක් වූයේ ඔහු දුටු දා සිටම ගැන අසීමිත ආසාවකින් පසු වූ නිසාය.

කුඩා කල සිට මනෝජ්ගේ නැගෙණියට ස සස්වින්දි පාසැල් ගියේ නැන්දාගේ නිවසේ සිටයි.

ශිෂ්‍යත්වය සමත්ව මහනුවර ඉහළම පාසලට ඇ සාමාන්‍ය පෙළ දක්වා සිටියේ පාසැල් නේවාසිකාගාර බෝඩිමට පැමිණියේ උසස් පෙළට පුද්ගලික පන්ති ව වූ අවශ්‍යතාව මතයි.

ගමේ උදවිය මෙන්ම මනෝජ්ගේ කාර්යාල ෙ දැන සිටියේ සස්වින්දි ඇයගේ නැන්දණියගේ කැගල්ල වෙසෙන බව පමණි. ඇය නුවර බෝඩිමක සිටින බ හෝ දැන සිටියේ නැත.

සස්වින්දිගේ කැගල්ලේ නැන්දණියගේ නිවස පැටෝ් අනෙක් සඟයින් සමඟ කතා කොට ඇය ගැනීමේ කටයුත්ත ආරම්භ කළේය. ඔහු සස්වින්දිගෙ ලෙසින් වෙනත් තරුණියක් නැන්දාගේ නිවසට යැව්ෙ

"උඹට ෂුවර්ද පැටෝ් කෙල්ල ගෙදර නැහැ ක පැටෝ්ගෙන් ඇසුවේය.

"ෂුවර්ම ෂුවර් මචං... පොඩි එකා කිව්වා අක්කා ක්ලාස් ගියා කියලා"

"ඒ ඒකිමද කියලා දන්නවද"

"බය වෙන්න එපා මචං... ඒකි හිටියත් යැව්ව එකී ලස්සනට වැඩේ ගොඩ දාගයි"

නිවසට ගිය තැනැත්තිය සස්වින්දිගේ නැන්දාට පැවසූ මුසාව හේතුවෙන් සස්වින්දිගේ නැන්දා ඇය ගිය පසු සස්වින්දිට ඇමතුමක් ලබා ගත්තාය.

"දෝණී... කලබල නැතුව මම මේ කියනදේ අහගන්න පුතේ" සස්වින්දිගේ නැන්දා පැවසුවද සස්වින්දි ඒ මොහොතේම කලබල වූවාය. ඇයගේ අත පය වෙව්ලන්ට විය.

"ඇ.. ඇ. යි.. නැන්දා" ඇය වචන පටලවමින් ඇසුවාය.

තුහංස ඔහුට යම් කරදරයක් කළේද... ඇයට නොසිතුණා නොවේ.

"ඔය ඉතින්... කියන්න කලින්ම ඔයා කලබල වෙලානේ"

"නැහැ නැන්දේ... කියන්න"

"අද ඔයාලගේ ගමේ ළමයෙක් ඔයා හොයාගෙන මෙහෙ ආවා... පාරමී කියලා"

"ආ... අපේ ගෙවල් ළඟ... තිස්ස මාමගේ දුව"

" දෝණී.... ඔයා හෙට පාන්දරම ගෙදර යන්න පුතේ"

"ඇයි නැන්දා" ඇය ඇසුවේ බියෙනි.

"බය වෙන්න එපා... තාත්තිට චුට්ටක් සනීප මදිලු... ගිහින් බෙහෙත් අරන් දෙන්න කියලා කියන්නයි ඒ ළමයා ආවේ"

"ඔයා දන්නවනේ ඔයාගේ මල්ලී ගැන... කවදාවත් මම එක්ක නොගියොත් අසනීපෙකට බෙහෙතක් ගන්නේ නැහැ"

"ඔව්... ඒක ඉතින් අපූර්වා නංගිත් හැමදාම කියන කතාවනේ"

"පාරමී ඇයි මට කතා කළේ නැත්තේ"

"ආ... ඒ ළමයා කිව්වා ඒ ළමයා මෙහෙ ආව බවක් කියන්න එපා කියලා... තාත්තටත් කතා නොකර ගෙදර එන්න කියන්න කිව්වා... ඔයාට කොල් ... හේතුවක් නිසා කිව්වා... ඒ දරුවට කතා කරන්නත් එපා ඇයි මන්දා"

"ගමේ පොඩි ප්‍රශ්නයක් තියනවා නැන්දා... ම... කියන්නම්කෝ"

"එහෙනම් රහසින්ම යන්න පරිස්සමට... ඔයාට නැහැනේ"

"නැහැ නැන්දේ" නැන්දා බිය වේ යැයි සිතූ කීවාය.

"තාත්තිට නොදන්වා මම යන්නේ... තාත්තිට ... එන්න එපා කියයි" කියූ සස්වින්දි ඇයට බුදු සර... ඇයගෙන් සමු ගත්තාය.

තුහංස පෙරදා නිවසට පැමිණ මනෝජ්ට තර්ජය... පාරමී දැන සිටියෙන් ඇය මෙලෙසින් තමාට දෙන්නට ඇතැයි සස්වින්දි සිතුවාය.

"ආන්ටී... මම හෙට පාන්දර බස් එකේ ගෙදර යන...

සස්වින්දි බෝඩිමේ හිමිකාරියට දැන් වූයේ ඇය කරමින් සිටි මොහොතකය.

"ඇයි හදිස්සියේ"

"තාත්තිට පොඩ්ඩක් සනීප නැතිලු... ගිහින් එන්න

"රහල්ලගේ ත්‍රීවීල් එකට කියන්න වෙයි නේද"

"මම රහල්ට කියන්නම් ආන්ටි"

සස්වින්දි එසේ පැවසුවද රහල්ට නොකියා පා... රියේ යන්නට ඇය සිතා ගත්තාය. මින් පසුවට රහල්... නොගෙන සිටීමට මෙන්ම ඔහුගෙන් හැකි තරම් ඈත... සස්වින්දි සිතා ගත්තාය.

සිතා නොබියව රහල්ගෙන් උදව් ගත්තද තමා දිනෙක ඔහුගේ බිරිඳ විය නොහැකි පෙම්වතියක් වූ නිසාවෙන් උදව් ගැනීම වරදක් බව ඇය සිතුවාය.

කිසිදා සැබෑ නොවන සිහිනයක් පසු පස ඔහුට දිව යාමට සැලැස්සවීම තමා ඔහුට කරන අකටයුත්තක් ලෙසින් ඇය සැලකුවාය.

රහල් හේතුවක් මවාගෙන පණිවිඩයක් අසා ගැනීමට ආවේ යැයි පවසා රාත්‍රියේ බෝඩිමට පැමිණියේ සස්වින්දි බලා ගැනීමේ අරමුණෙනි.

"උදේට ඔයාද අප්පච්චිද එන්නේ" බෝඩිමේ හිමිකාරිය රහල්ගෙන් ඇසුවේ රහල් ඇය ඉදිරියේ වාඩි වෙද්දීය.

"ඇයි"

"හයර් එකක් යන්න... ඇයි කිව්වේ නැද්ද"

"කවුද... කොහෙ යන්නද... මට කිව්වේ නැහැ"

රහල් එසේ පැවසුවේ ඒ සස්වින්දි යැයි නොසිතාය. බෝඩිමේ අනෙක් තරුණියන්ද ගමන්යාම සඳහා ගෙන්වා ගත්තේ රහල් හෝ ඔහුගේ පියාවයි.

"සස්වින්දි ගමේ යන්න" කියූ බෝඩිමේ හිමිකාරිය සස්වින්දි ඇමතුවාය. සස්වින්දි රහල් වෙත එද්දී රහල් ඇය වෙතට තද බැල්මක් හෙලුවේය.

"ඇයි අමතක වුණාද පණිවිඩේ කියන්න"

"නැහැ... මම කියන්න හිටියේ ආන්ටි" සස්වින්දි රහල්ගේ දෑස් මඟ හරිමින් කීවාය.

"නැන්දා හෙට ටවුන් යනවද කියලා දැනගෙන යන්න මම ආවේ... මම එහෙනම් ගිහින් එන්නම් නැන්දේ" කියූ රහල් නැඟිට්ටේ

"යනවා සස්වින්දි" යැයි සස්වින්දිටත් පවසායි.

නිවසින් පිටවූ රහල් සස්වින්දිට ඇමතුමක් දී රහසින් ඇයව මිදුලට කැඳවා ගත්තේ සිය නැන්දණිය පසු පසට යන තුරු බලා සිටයි. සස්වින්දි මිතුරියන්ට රහසින් මිදුලට ආවාය.

"ඇයි මට නොකීවේ" රහල් සස්වින්දිට ටොක්කක් අනිමි
ඇසුවේය.

"කියන්න අනේ හිටියේ"

"කවද්ද... කීයටද... ආ..." ඒ හඬ නම් ටිකක් දැඩි විය.

"රට... ඔයා එක්ක නැතුව මම කා එක්
යන්නද" එනිසාවෙන් සස්වින්දි මුසාවක් කීවාය.

"කියන්න බැහැනේ... මාව ගලවලා දාන්න හිතාගෙ
ඉන්න කොට" ඔහු පැවසුවේ අමනාපයෙනි.

"විකාර කියවනවා... අනික රහල් ගියත් යන්න තියෙන්
මෙතන හන්දියටනේ"

"ළඟටවත් එහෙම යන්න බැහැ සස්වී... වෙනදටත් ළ
ඔයාව එහෙම යවනවද"

"නැහැ තමයි"

"ඒකනේ... දැන් නම් කොහොමටවත් බැහැ... තේරුණ
ඔයාට"

අනේ මහත්තයෝ... ඔයා මේ ආරක්ෂා කරන්නේ... ර
ගන්න දඟලන්නේ... පර මලක් නේද... සස්වින්දි හදවතින් ඉ
ගැසුවාය. ඇයට දැනුනේ ශෝකයකි.

"ඔයාව කසාද බඳින්න ඉන්න මහත්තයා විදහට වගකීම්
තියනවා මට"

"ඔව්... බලෙන් හදා ගත්ත" හිතේ දුක නිසාම සස්වි
අමනාපයෙන් කීවාය.

"බලෙන් හරි මම හදාගෙන තියෙනවා... ඔයාට බැ
ඒකෙන් දැන් ගැලවෙන්න" රහල් ඇයගේ අත අල්ලා ගත්තෙ
ඔහුගෙන් අත මුදවාගත් සස්වින්දි බැලුවේ නිවස දෙසයි.

"කවුරුත් නැහැ බං" කියූ රහල් සස්වින්දි තමා වෙ
ඇදගෙන සැනින් සිපුමක් දී අඳුරේම නොපෙනී ගියේය.

ඔයාට මාව ගැලපෙන්නේ නැහැ රහල්... අත අරින
දෙයියනේ මාව... ඇය ශෝකයෙන් මුමුණා ගත්තාය.

ඇයි හංස ඔයා මට මෙහෙම කළේ... මම සල්ලි අරන් දෙන්නම් කියද්දීත් මගේ ජීවිතේම විනාශ කළේ... ඇයි මගෙන් පළිගත්තේ... මට ලැබුණු ආදරේ විඳින්න මට ඉඩ නොතිබ්බේ...

සුපුරුදු පරිදි රාත්‍රියේ සස්වින්දි සිය පියාව ඇමතුවාය. ඔහුගේ කටහඬේ වෙනසක් ඇයට දැනිණි. ඔහු අසනීපෙන් බව පාරමී පවසා තමාට එන්නට යැයි කීම ගැන සස්වින්දි පාරමීට සිතින් ස්තුති කළාය.

"තාත්ති... ඔයාට සනීප නැද්ද"

"නැහැ දෝණි... අසනීපයක් නැහැ"

"කටහඬ අමුතුයි... මට බොරු කියන්න එපා"

"ම්... නැහැ දරුවෝ... ලොකු දෙයක් නෙවෙයි... පොඩි ඇම්මක්... සුදු ලූණුයි ගම්මිරිසුයි ටිකක් තම්බලා බොන්නම්... ඇරිලා යයි

ආ... අදට බොන්නකෝ... හෙට මම ඇවිත් බෙහෙත් අරන් දෙනකල්... සස්වින්දි ඔහුට කීවා නොව තමාට මුමුණා ගත්තාය.

"ඔෆිස් එකේ තත්වේ කොහොමද"

"ඔය ඉන්නේ ගානක් නැතුව"

"අර ඉරාක් ඕඩර් එකකට සල්ලි නැහැ කියලා නේද මැරෙන්න හැදුවේ"

"සජී මිස් සල්ලි දීලා"

"ඇති යන්තම්"

"සජී මිස්ට මම කිව්වා... හංස මහත්තයා ඒක ගැන දැන ගත්ත එකේ ආය හංගන්න දෙයක් නැහැනේ"

"ඉතින්"

"මම කිව්වා මේක රජී මහත්තයා හංස මහත්තයා ගැන හිතලා රහසින් කළ දෙයක් කියලා... රජී මහත්තයා නමට තිබුණොත් ඉල්ලලා කරදර කරයි කියලා හිතලා එකවුන්ට් එක මගේ නමට දැම්මා කිව්වා... සල්ලි ගන්න පුළුවන්නේ තව අවුරුදු තුනකට පස්සේ කියලා කිව්වා..."

"පව්... රජී අංකල්ගේ පලු ගලවනවා ඇති... ඒත් ඇයි තාත්ති එහෙම කිව්වේ"

"මම දැන් ඔයාව හංසට දෙන්න කැමති නැහැ දෝණී... සල්ලි නිසයි හංස මහත්තයාගේ විදිහ නිසයි සජී මිස් කිව්වොත් මේ කසාදේ කරමු කියලා මම ඒකට බැහැ කියන්නේ කොහොමද... ඒ නිසා මේ ගැන නොදන්න එක හොඳයි"

මම හංසට මේ ගැන කිව්වා නේද... එයා ඒක අම්මට කියයිවත්ද... නැහැ... කියන එකක් නැහැ... මොකද එයාට මට මෙහෙම කළේ මගෙන් පළිගන්න ඊෂ්‍යාවට... එයාගේ තාත්තා එයාට වඩා මාව විශ්වාස කළා කියලා... සස්වින්දි සිතුවාය.

"විශ්වාස කළාද"

"රජී තියපු විශ්වාසේ මනෝ කඩන්නේ නැතිවෙයි කියලා හිතනවා කිව්වා... විශ්වාසේ බිඳලා තිබුණොත් හංස මහත්තයාගෙන් බේරෙන්න බැරිවෙයි කිව්වා"

බේරෙන්න බැරි වෙයි නෙවෙයි තාත්ති... මට බේරෙන්න බැරි වුණා... සස්වින්දි ශෝකයෙන් තමාටම කියා ගත්තාය.

"එයාලා අපිව විශ්වාස කළත් එකයි නොකළත් එකයි... අපි නියම කාලෙට සල්ලි අරන් දෙමු... එච්චරයි"

ඒ කළ අපරාදෙට මම කවදාවත් එයාට ඒ සල්ලි අරගෙන දෙන්නේ නැහැ.... මට කළ විනාශෙට මම සතයක්වත් දෙන්නේ නැහැ... සස්වින්දි කෝපයෙන් මුමුණා ගත්තාය.

"කොහොමත් සජී මිස් ඒකාලේ ඉඳලම අපිට ඒ තරම් කැමැත්තකින් හිටියේ නැහැනේ තාත්ති... එයා කොහොමත් එහෙම දේකට කැමති වෙන්නේ නැහැ... ඒ ගැන බය වෙන්න එපා"

"ඒක මම දන්නවා දෝණී... ඒත් මට බයක් හිතුණා බැරි වෙලාවත් එහෙම වෙයි කියලා"

"ඒ අය කවුද අපි කවුද... දුප්පත් අපිව රජී අංකල්ට ඕනි වුණාට සජී ආන්ටිටවත් හංස මහත්තයාටවත් ඕනි වෙන්නේ නැහැ තාත්ති"

මුල් දින ඇති වූ බිය නිසාම සස්වින්දිට පණිවිඩයක් තැබුවද ඉන් පසු දාම සුපුරුදු දිවියට බට තුහංස සස්වින්දිව අමතක කර දැමුවේය.

එදින සස්වින්දි සමඟ තරෙහෙන් බීමතින් ඔහු කුමක් දෙඩවූයේද යන්න ගැන එතරම් මතකයක් තුහංස සතු නොවීය. ඔහුගේ විධානය වෙනස් වේ යැයි වූ බිය නිසාම ඒ පිළිබඳව කිසිවක් තුහංස හා නොදෙඩීමට පැටෝ ෂයි ඇතුළු සඟයෝ සිවු දෙන වගබලා ගත්තේ සස්වින්දිට වූ දැඩි ආසාව නිසාමය.

"හෙට මට දවසම ඔෆිස් එකේ ළඟින්න වෙයි බංලා... උඹලා නිවාඩුවක් අරගෙන උඹලාගේ වැඩක් කර ගනිල්ලා"

තුහංස පැවසුවේ මත් පැනින් සප්පායම් වෙමින් සඟයින්ටය. පසුදා දිනය පුරාවටම කාර්යාල කටයුතු සඳහා තමාට කාර්යාලයේම සිටීමට සිදුවන බව තුහංස දැන සිටියේය.

"හරි බොස්... හවසට අවශ්‍ය වුණොත් අපට කතා කරන්න... අපි එන්නම්" සඟයින් කීවෝය.

"රා ටිකක්වත් බීලා ආතල් ගන්න හවසට වෙලාවක් හදා ගන්න මම බලන්නම්කෝ... එහෙම වුණොත් මම උඹලට කියන්නම්" තුහංස කීවේය.

පාන්දර සස්වින්දි කැඳවාගෙන පැමිණි රහල් ඇයව ඇඹිලිපිටිය බස් රථයකට නංවූවේය. බස් රථය පිටත්වන තුරු ඔහු ඇය අසල රැඳී සිටියේය. ඔහුගේ මේ ලැදියාව සස්වින්දිගේ හදවතට එක් කළේ විශාල බරකි.

"පරිස්සමට කෙල්ලේ... රත්නපුරේ ළං වෙන කොට මට කෝල් එකක් දෙන්න... සමහර විට මට අද දවසම ෆෝන් එක ඕෆ් කරලා තියන්න වෙයි... බය වෙන්න එපා" සස්වින්දි හිස සෙලවූවාය.

"බුදුසරණයි... පරිස්සමට ගිහින් එන්න බබා" බස් රථය පිටත් වන මොහොතේ සස්වින්දිගේ හිස අතගෑ රහල් කීවේය.

"බුදු සරණයි... පරිස්සමට මහත්තයෝ" සස්වින්දි පැවසුවේ දෑසට කඳුළු පුරවාගෙනයි.

ඇය බස් රථයේ කවුළුවෙන් ඔහු නොපෙණී යන තුරු බල සිටියාය. හිස දමා තමා දෙස බලා සිටින සස්වින්දි නොපෙණී යන තුර යන තුරු නොව ඇය යන බස් රථයද නොපෙණී යන තුර රහල් බලා සිටියේය.

මම හරිම අවාසනාවන්ත කෙල්ලක්... ඒ ආදරය දරා ග නොහැකිව සස්වින්දි බොහෝ දුරක් යන තුරු කඳුළු සලමි ගියාය.

බස් රථය රත්නපුරය පසු කරද්දී සස්වින්දි රහල් පණිවිඩයක් තැබුවේ ඒ වන විට ඔහුගේ දුරකථනය විසන්ධි ක ඇති නිසාය. දේශන වලදී දුරකථනය විසන්ධිකර තබන රහ අද තම පණිවිඩය ලැබෙන තුරු එය මොහොතින් මොහො සක්‍රීය කරන බව ඇය දැන සිටියාය.

මමත් ඔයාට ගොඩාක් ආදරෙයි රහල්... ඒත් ඒ ආද ආත්මාර්ථකාමී කරගන්නේ නැහැ මම... ඇය සිතුවාය.

සස්වින්දි පැමිණෙන වේලාව අනුමාන කළ පැටෝ ඇ සඟයින් ඇය එන තුරු රැකවල්ලා සිටියෝය.

උඩවලවේදී බසයෙන් බැස ගත් සස්වින්දි නිවසට යාම ව බැම්ම පසුකර වැලි පාරට ආවාය. ඇයට යා හැකි වූයේ දුරක් පමණී.

නොසිතුව ලෙස ඇය ඉදිරියට පැමිණි තුහංසගේ සඟ ඇයගේ කට වසා ඇයව ගැට ගසාගෙන වෑන් රථයකට ගත්තේ හඬක් හෝ නිකුත් කිරීමට ඉඩක් නොතබායි.

තුහංසගේ සඟයින් විසින් අතපය ගැට ගසාගෙන පැ තරුණියක් වෑන් රථයෙන් ඔසවාගෙන විත් නිවසේ තබද්දී ගල් ගැසී බලා සිටියාය. ඇය සස්වින්දිව හඳුනාගත්තේ ඇ කට බැඳී පටිය ලිහා දමද්දීය.

"පොඩ්ඩියේ..." ඇය අතින් කට වසා ගත්තාය.

"නැන්දේ... අනේ නැන්දේ... හංසට කතා කරන්න නැ මම ගැන කියන්න" සස්වින්දි කෑගැසුවාය.

"හංස මහත්තයාට කියන්නකෝ නැන්දේ... මේ ගෑනු කියන්න කියනවනේ... නොකියා බෑනේ" පැටෝ මහ සිනාසෙමින් ඔච්චම් කළේය.

"බොස් තමයි අපට කිව්වේ උඹව උස්සලා කැමති දෙයක් කරපල්ලා... බොස්ට එපා කියලා... නැත්නම් අපි බොස් අත ගහපු එකක් මෙහෙම බය නැතුව මෙතෙන්ටම ගේනවද" සස්වින්දිව ගොලු කරවමින් ෂයි කීවේය. සස්වින්දි වෙව්ලා ගියාය. සීතා කම්මුලේ අත තියා ගත්තාය.

මේකි හොඳයි විකුණන්න... පෙරදා තුහංස පැවසූ වදන් සස්වින්දිගේ දෙසවනට දෝංකාර දුන්නාය.

"තිරිසනා... අපරාධකාරයා... උඹ නම් හොඳක් වෙන්නේ නැහැ..." සස්වින්දි කෑගැසුවාය.

දෙයියනේ... පුංචි මහත්තයා මදාවියෙක් වුණාට මෙහෙම අපරාධකාරයෙක් කියලා නම් මම හිතුවේ නැහැ... ඇය මුමුණා ගත්තාය.

"කමක් නැහැ නැන්දේ... මුන් මොනවා කිව්වත් කියන්න... මම කියන නිසා ඔයා කියන්න" සස්වින්දි තමා අල්ලගෙන සිටි සඟයින් දෙදෙනාගෙන් මිදීමට දඟලමින් කීවාය.

"කියන්න නැන්දේ... මෙයාගේ ආසාවනේ... ඇයි කෙල්ලේ උඹට අමතකද බොස් උඹව විකුණනවා කියපු බව... ඉතින්... ඉස්සරොම උඹව විකුණුවේ අපට" පැටෝ කීවේය.

අනෙකුන් සිනාසුනෝය. සීතා දෑසේ කඳුළු වගුරුවමින් බලා සිටියේ සස්වින්දි දෙසයි.

ඇයව බේරා ගැනීමට ක්‍රමයක් ඇය සතුව නොතිබිණි. ඇරත් පුංචි මහත්තයාගේ අණක් නම්... ඇයට නොසිතුණා නොවේ.

එහෙත්... පුංචි මහත්තයාගේ අණක් වුවද හැකියාවක් ඇත්නම් ඇයව බේරා ගැනීමට සීතා පසු බැස්සේ නැත. හැඩි දැඩි පිරිමින් සිව් දෙනෙකු සමඟ තනි ගැහැණියක් වූ තමා පොරබදින්නේ කෙසේද... සීතා සස්වින්දිට වඩා හඬින් හැඬුවේ සස්වින්දි වෙනුවෙන්මය.

"ෂයි... වරෙන් අරන් යමු... මම මුලින්ම" පැටෝ කීවේය.

"හරි බං හරි... උඹනේ කෙල හැලුවේ බොස් ගන්නත් කලින්" ෂයි සස්වින්දි වෙතට එමින් කීවේය.

සිය සැමියා සොයායි.

"අනේ... දූලගේ තාත්තේ... අර තිරිසන්නු අ
ගෙනල්ලා" ඇය කෑගැසුවාය. උදුළු ගාමින් සිටි
නවතා ඇය දෙස බැලුවේය.

"අර පුංචි මහත්තයා එදා ගෙනාව කෙල
හතරදෙනා අරන් ඇවිල්ලා... දෙයියනේ... ද
යයි" පියසෝම උදැල්ල කරට ගත්තේය.

"බලමු... ඒත් අපි හැප්පෙන්නේ කොහොමද
හතරේ උන් හතරක් එක්ක"

"පෝච්චියේ... මෙහෙමත් මහ පොළව නුහුල
අර පුංචි කෙල්ල ඉතුරු වෙයිද... දරුවෝ ඉන්න
බලාගෙන ඉන්න පුළුවන්ද" සීතා විලාප තබමින්
ආවාය.

සස්වින්දි ඔසවාගෙන පැමිණි පැටෝ ඇය
දැමුවේය. ආවේස වූ ලෙසින් හපා කමින් දඟලන
පණ කර ගැනීමට පැටෝට අපහසු වන තරමට ඈ
දෙමින් දැඟලුවාය. ෂයි දොරකඩට වී සිටියේ අව
උදව්වක් දීමටයි.

පැටෝ සිය පිස්තෝලය අතට ගෙන ඇය
කළේ ඇයව බිය වද්දවා ගන්නටයි.

"මරපන් මිනිහෝ මරපන්... මම මැරෙන්න
තොපි වගේ තිරිසනුන්ට අහු වෙන්න ජීවත් වෙ
මැරෙන එක හොඳයි මට" කියූ සස්වින්දි යෑ
සිටියාය.

නොසිතූ ලෙස පැටෝ වෙතට පැන්න සස්වින
පිස්තෝලය තිබුණු අතේ එල්ලී එය තමා වෙත
ගත්තාය. වූයේ නොසිතුවක් බැවින් පැටෝ කලබ
අතින් කොකා ගැස්සුනේය. ඒ වන විට කාමරෙ
පැමිණ සිටි සීතා යටිගිරියෙන් කෑගසමින් සස්වින
ආවාය.

උදෑසන කාර්යාලයට පැමිණි තුහංස පළමුව විධායක නිලධාරීන් සියලු දෙනා කැඳවා රැස්වීම ආරම්භ කළේය. එය කළේ නොකළ බැරි දෙයක් වූ නිසාවෙනි.

සමාගමේ රැඳී සිටින්නට මෙන්ම එහි කටයුතු ඉටු කරන්නටද ඔහු පෙළඹුනේ කැමැත්තකින් නොවේ. මවගේ කීමත් මනෝජ්ගේ අණත් ඉවතලන්නට වූ බැරිකමටයි.

සමාගමේ කටයුතු සියල්ලම සාකච්ජා කොට අවසන් කර ඉතිරිව තිබුණේ තුහංසගේ තීරණ සභාවට දැන්වීමේ අවස්ථාවයි. ඔහු ඉදිරි කටයුතු ගැන සියල්ල දැනුවත් කිරීම සඳහා කතාව ආරම්භ කළේය.

සීතා නොනවත්වාම තම ජංගම දුරකථනයට අමතනු දුටු තුහංසට දැනුනේ පුදුමයකි. ඇය කිසිදා තම ජංගම අංකයට කතා කර නැත්තේය. එම අංකය ඇය දැන සිටි බවක් හෝ ඔහු නොදත්තේය. ඇය අමතන්නේ හදිස්සියකටම විය යුතුයැයි සිතූ තුහංස රැස්වීම මදකට නවත්වා ඇමතුමට සම්බන්ධ වූවේය.

කාට නැතද මනෝජ්ට ඒ මොහොතේ දැනුනේ කෝපයකි. ඔහු අමනාපයෙන් ඉවත බලා ගත්තේය.

"පුංචි මහත්තයා... අනේ... මෙහෙ මහා විනාසයක් අනේ..." සීතා විලාප තැබුවාය.

"ඇයි සීතා මොකද" තුහංස ඇසුවේ මදක් ආවේගයෙනි.

"අනේ පුංචි මහත්තයා..."

"සීතා... කෙපරබාන්නේ නැතුව කියපන් මම මේ රැස්වීමක ඉන්නේ"

"දෙයියනේ... අර කෙල්ලව ගෙනාවා... අර තිරිසන්නු... අනේ... උහුලන්නේ කොහොමද කෙනෙක්" තුහංසට උතුර දකුණ මාරු විය.

"මොන කෙල්ලද... කවුද"

"පුංචි මහත්තයා... අනේ... ඒ කියන්නේ පුංචි මහත්තයා දන්නේ නැද්ද... ඒ දරුවා ඒක කිව්වා... පුංචි මහත්තයට කියන්න කිව්වා... අනේ... මමයි කිව්වේ නැත්තේ"

කෙල්ලක් ගැනද කියන්නේ" තුහංස කෝපයෙ

"අර පුංචි මහත්තයා එදා ගෙනාව ගෑනු ළම
මෙහාට ගෙනාවා... පුංචි මහත්තයා ගේ
කියලා" තුහංස කෙලින් වූවේය.

"මම කිව්වා... කවද්ද... මොකටද... තුහ
නොවීය.

"ඒ දරුවා මරන්න කියලා පැටෝ අතේ තිබුණ
එල්ලුනා... අනේ... කලබල්ලේට ඒක පත්තු වුණා"

සීතාගේ හඬත් සමඟම තුහංසගේ දෙසවන්
ඔහුට සස්වින්දිගේ රතුවූ වත කඳුළු පිරුණු
පෙනෙන්නට විය. මොහොතක් ගල් ගැසී සිටි
රැස්වීම් ශලාවට දිව ගියේ මනෝජ් අමතමින්ය.

"මනෝජ් අංකල්... මේ වැඩේ ඉවර ක
හදිස්සියක්" කියූ ඔහු පමාවට හැරුනේය. ම
කිසිවක් ඇසීමට ඔහු එතන රැඳුනේ නැත.

වාහනයට නැගී තුහංසට කළවානේ වතු බංග
ගත වුණේ ඉතාම සුළු කාලයකි. ඔහු රථයෙන්
පැන්නේය.

"පුංචි මහත්තයා එහෙම කියලා නැහැ දෙයි
වැරැද්ද... මේ තිරිසන්නු... අනේ... මුන්ට හොඳක්
සස්වින්දි මුරකරමින් සිටි සඟයා දෙස බලා විලාප

දැඩි කම්පනයකින් ගල් ගැසී අසිහියෙන්
සස්වින්දිට සීතාගේ විලාපය ඇසුනේ විටින් විටයි.

තුහංස ගෙට ඇතුළුවනු දුටු සීතා නැගී
තවරාගෙන සිටි සස්වින්දි වෙත ගිය තුහංස
ළඳැරියක් ලෙසින් ළයට තබා තද කර ගත්තේ
සිටීමටවත් කාලයක් නොතබමින්ය. ඇය හොඳින්
තුහංසට දැනුනේ සැනසීමකි.

"මොකද වුණේ" ඔහු ඇසුවේ රැඳී සිටි සඟයාට

"ෂයි අයියට වෙඩි වැදුනා බොස්... පැටෝ සුදා එක්ක අරගෙන ගියා"

"මේ කෙල්ලට කරන්න ගිය අපරාදෙට ඔවුන්ට ඔහොම වෙලා මදි... අප්පෝ... එහෙම නොවුණා නම්" සීතා අවලාද කීවාය.

තුහංසගේ ළයට තුරුළුවී ඔහුගේ දැඩි ග්‍රහණයට හසුවී සස්වින්දි නොසෙල්වීම සිටියාය.

තමා රැකිය යුතු වූ එකම රැකවලා ආරක්ෂකයා මෙන්ම තමාට හිමිකමක් පැවසිය හැකි වූ එකම පුද්ගලයා තුහංස බව මිසක ඔහු තමාගෙන් පළිගත්ත වග තමාට වෛර කරන දුෂ්ඨයෙක් වග හෝ වෙනත් කිසිදු හැඟීමක් ඇය තුල ඒ මොහොතේ නොවීය.

ඇයගෙන් පිටවූ කෙඳිරියත් දිග සුසුමත් නිසාවෙන් තුහංස ඇය දෙස බැලුවේ ඇයව එලෙසින්ම තුරුලේම තබා ගෙනයි.

"උන් මේ දරුවගේ අත පය ගැට ගහලා සතෙක් වගේ මෙහාට අරගෙන ආවේ පුංචි මහත්තයෝ..."

සීතා පවසද්දී සස්වින්දි දැතින් තරයේ තමාව තෙරපා ගන්නා බව තුහංසට දැනිණි. තුහංස දෑසින් කළ ඉඟියට ළඟ සිටි සඟයා ඉවත ගියේය.

"ඔළුවට පිස්තෝලේ තියාගෙන කොකා ගස්ස ගන්න තමා මේ දැරිවි දඟලව්වේ... දැඟලිල්ල නිසාම පැටෝ අතින් කොකා ගැස්සුනා" සීතාගේ වදනත් සමඟම තුහංස සැනින් සස්වින්දි දෙස බැලුවේය.

"මොකද්දෝ වෙලාවට ඉලක්කය තිබුණේ නෝනා පැත්තට නෙවෙයි... උණ්ඩය පිට වුණේ ෂයි හිටිය පැත්තට"

"කොහෙටද වෙඩි වැදුනේ" තුහංස ඇසුවේය.

" බාහුවේ පැත්තකට... කලබලේට මමත් වැටුනනේ... මේ..." සීතා සිය පාදය පෙන් වූවාය.

"උඹ කොහෙද වැටුණේ ඔය විදිහට කැපිලා යන්න"

"දූලාගේ තාත්තාගේ උදැල්ල උඩට... මට සිහියක් තිබුණේ

නැහැ පුංචි මහත්තයා... වෙන දේ බලාගෙන ඉන්නා"

"කෝ උඹේ මිනිහා"

"එළියේ ඇති"

"ආ... වාහනේ යතුර" තුහංස සිය ජීප් රථයේ අතට දුන්නේය.

"අර එළියේ ඉන්න එකාට අඬ ගහගෙන අඬගහගෙන ඉස්පිරිතාලෙට පලයන්"

"පුංචි නෝනා..." සීතා සස්වින්දි දෙස බැලුවාය. විටත් සිටියේ සිටි ඉරියව්ව වෙනස් නොකරයි.

"මම ඉන්නවනේ... උඹේ ඇඳුම් අරන් පලයන්... උඹව නවත්ත ගයි ඉස්පිරිතාලේ... එනකොට නෝන එකක් එවපන් මිනිහා අතේ... මේකේ ලේ ගෑවිලා සස්වින්දිගේ බ්ලවුසයේ ලේ තැවරී තිබෙන නිසා කී

"අනේ පුංචි මහත්තයා... පුංචි නෝනා විස් ඉන්නේ... අනේ... ආය... කරදරයක් එහෙම..."

"සීතා..." තුහංස අතර මග ඇයගේ කත දැමුවේය.

"කට වහගෙන පල... උපදෙස් ඕනේ නැහැ මට විතරනේ මෙතන ඉන්නේ" තුහංස ගුගුලේය.

"පුංචි මහත්තයා කිව්වා කියලනේ මුන් දෙ කරන්න ගියේ... ඒකයි මම කිව්වේ... මට සමා මහත්තයා"

"මම එහෙම දෙයක් කිව්වේ නැහැ බං... උඹ එහෙනම් මම නැවිත් ඉන්නවද"

"ගිහින් එන්නම් පුංචි මහත්තයා... පුංචි නෝ ගිහින් එන්නම්"

"කො.. කො.. හෙද නැන්දා යන්නේ" තුහංස හිස එසවූ සස්වින්දි අසිහියෙන් මෙන් ඇසුවාය.

නැහැ පුංචි මහත්තයා... වෙන දේ බලාගෙන ඉන්න"

"කෝ උඹේ මිනිහා"

"එළියේ ඇති"

"ආ... වාහනේ යතුර" තුහංස සිය ජීප් රථයේ යතුර සීතා අතට දුන්නේය.

"අර එළියේ ඉන්න එකාව අඬ ගහගෙන මිනිහත් අඬගහගෙන ඉස්පිරිතාලෙට පලයන්"

"පුංචි නෝනා..." සීතා සස්වින්දි දෙස බැලුවාය. ඇය ඒවන විටත් සිටියේ සිටි ඉරියව්ව වෙනස් නොකරයි.

"මම ඉන්නවනේ... උඹේ ඇඳුම් අරන් පලයන්... සමහරවිට උඹව නවත්ත ගයි ඉස්පිරිතාලේ... එනකොට නෝනට බ්ලවුස් එකක් එවපන් මිනිහා අතේ... මේකේ ලේ ගෑවිලානේ" තුහංස සස්වින්දිගේ බ්ලවුසයේ ලේ තැවරී තිබෙන නිසා කීවේය.

"අනේ පුංචි මහත්තයා... පුංචි නෝනා විස්සෝප වෙලා ඉන්නේ... අනේ... ආය... කරදරයක් එහෙම..."

"සීතා..." තුහංස අතර මඟ ඇයගේ කතාව නවතා දැමුවේය.

"කට වහගෙන පල... උපදෙස් ඕනේ නැහැ මට උඹේ... මම විතරනේ මෙතන ඉන්නේ" තුහංස ගුගුලේය.

"පුංචි මහත්තයා කිව්වා කියලනේ මුත් මේ අපරාදේ කරන්න ගියේ... ඒකයි මම කිව්වේ... මට සමාවෙන්න පුංචි මහත්තයා"

"මම එහෙම දෙයක් කිව්වේ නැහැ බං... උඹට විකාරද... එහෙනම් මම නැවිත් ඉන්නවද"

"ගිහින් එන්නම් පුංචි මහත්තයා... පුංචි නෝනේ... මම ගිහින් එන්නම්"

"කො.. කො.. හෙද නැන්දා යන්නේ" තුහංසගේ ළයෙන් හිස එසවූ සස්වින්දි අසිහියෙන් මෙන් ඇසුවාය.

"මම තුවාලෙට බෙහෙත් දාගන්න යනවා පුංචි නෝනා... පරිස්සමට ඉන්න... පුංචි මහත්තයා ඉන්නවනේ" සීතා යන තුරු බලා සිටි සස්වින්දි මොහොතක් තුහංස දෙස බලා සිටියාය.

"ඇයි... ආ..." තුහංස ඇයගේ දෑසට එබී ඇසුවේය. කිසිවක් නොකී සස්වින්දි නැවත තුහංසගේ ළය මතට කඩා වැටුනාය.

"යස හපන්කමක්නේ මෙයා කර ගන්න ගිහින් තියෙන්නේ... මටයි දැන් මරලා දාන්න හිතිලා තියෙන්නේ... එහාට යනවා තුරුල් වෙන්න එන්නේ නැතුව"

තුහංස ඇය ඉවතට තල්ලු කළේය. විසිවී ගිය සස්වින්දි වැටෙන්නට ගියේ එය ඇය නොසිතුවක් වූ නිසාය. එහෙත් තුහංස ඒ හාම ඇයව අල්ලා ගත්තේය. දෑසට කඳුළු පුරවා ගත් සස්වින්දි තුහංස දෙස බැලුවාය.

"ෂයිට වුණ දේ ඔයාට වුණා නම්... මොකද වෙන්නේ... එහෙනම් ඔක්කොම ඉවරයි" ඔහු ඇයව අත හැර දමමින් කීවේය. සස්වින්දි නිහඬව අලස වූ පුටුව මතට කඩා වැටුනාය.

අන් මොහොතක නම් එකට දහයක් ආවේගයෙන් පවසන ඇයගේ මේ නිහඬ බවින් ඇය තවම සිටින්නේ කම්පනයෙන් වග තුහංස වටහා ගත්තේය.

තුහංස ඇය අසලින් වාඩි වූයේ සිය කමිසයේ බොත්තම් ගලවා ගනිමිනි. එය ගලවා දැමූ ඔහු සස්වින්දිගේ බ්ලවුසයේ බොත්තම් ගැලවීමට පටන් ගත්තේය. සස්වින්දි ඔහු දෙස බැලුවාය.

"බ්ලවුස් එකේ ලේ"

"කමක් නැහැ..." ඇය මිමිණුවේ ඔහුව වළකමිනි.

"ඉන්නවා..." හඬින් කියූ ඔහු එය ගලවා ඉවත් කළේ බලෙනි. සස්වින්දි ළය වැසෙනසේ දෑත් පොරවා ගත්තාය. තුහංස සිනාසුණේය.

"දැකලා තියනවා කියලා අමතක වුණාද... ආ... මේ ෂර්ට් එක ඇඳ ගන්න... යන කොට අඳින්න මම බ්ලවුස් එකක් ගේන්න කිව්වා" ඔහු සිය කමිසය ඇයගේ උරට දමමින් කීවේය. සස්වින්දි එය සෙමින් ඇඳ ගත්තාය.

ඇය ඉතා සෙමින් බොත්තම් පියවා ගනු දුටු තුහංස ඇයට ළං වී ඇය ඇඳි කමිසයේ බොත්තම් පියවුවේය. දෑස් ගැටී ගත වන මොහොතට සස්වින්දිගේ දෑසට වුණත කඳුළු වැඩි විය. සස්වින්දි තුහංසගේ ළයේ වැතිරුනේ හඬින් ඉකි ගසාගෙනයි. ඔහු ඇයව තුරුළු කර ගත්තේය.

"මොන එහෙකට එවුන් කුදලගෙන එනකල් බලන් හිටියද" තුහංස ඇසුවේ කෝපයෙනි.

"මම ගියේ ගෙදර යන්න... හිතා ගන්නවත් බැරි වුණා මොකද වුණේ කියලා... එයාලා කිව්වේ ඔයා මාව ගේන්න කිව්වා කියලා" සස්වින්දි පැවසුවේ සෙමින්ය.

"මම එහෙම කිව්වේ නැහැ" යි තුහංස පැවසුවද

ඇය හා කෝපයෙන් සිටි එදින තමා වෛරී මතින් කුමක් හෝ පවසන්නට ඇතැයි තුහංසට සිතිණි. නොඑසේ නම් සිය සගයින් මෙවැන්නක් තමාට නොදන්වා සිදු කරන්නේ නැත.... තුහංස සිතුවේය.

"ඇයි හංස මට මෙහෙම කළේ... මාව මරලා දාන්නනේ තිබුණේ එදාම... මට මෙහෙම කරන්නේ නැතුව" ඇය ඉකි බිඳිමින් ඇසුවාය.

"මරන්න හිතුවනම් මම එදාම මරණවා... නලවන්නේ නැහැ... තමුසෙනේ මැරෙන්න ගියේ... මට විරුද්දකම් කරන්න හිතාගෙන" ඔහු කෑගැසුවේය. සස්වින්දි ඔහුගෙන් මිදුනාය.

"මම ඔයාට විරුද්දකම් කරන්න හිතාගෙන මැරෙන්න ගියේ නැහැ... එදා ඔයා මගේ ඔලුවට පිස්තෝලේ තියන කොට මට මැරෙන්න බය හිතුනා... මැරෙනවට වඩා ඔයාට බිලි වෙන එක හොඳයි කියලා හිත කිව්වා" තුහංස ඉවත බලා ගත්තේය.

"ඒත් හංස... ඒ මිනිහා මගේ ඔලුවට පිස්තෝලේ තියද්දී මට මැරෙන්න බය හිතුනේ නැහැ... ඒ මිනිහට බිලි නොවී මැරෙන එක හොඳයි කියලා හිතුණා"

"අමතක වුණාද ලොකු වගකීමක් තියනවා කියලා තමුන්ට ජීවත් වෙන්න... ඒක අමතක කරලා තනි තීරණ ගන්න බැහැ

"මාව හතර දෙනෙකුට විකුණන කොට හිතුනේ නැද්ද මාව මැරෙයි කියලා" දෑස් විසල් කොට සස්වින්දි දෙස බැලුවේය.

තමා එදා ඇත්තෙම්ම එවැන්නක් කියන්නට ඇත. නොඑසේ නම් මේ විකුණුම් කතාවක් පැන නඟින්නේ නැත. තමා සෑම මොහොතකම ඇයට හා මනෝජ්ට පවසන්නේ තමා ඇයව විකුණන බවයි. තුහංසට සිතුනේය.

"වලස්සු වගේ උන් හතර දෙනෙකුට අහු වුණා නම්... සමන් දෙයියනේ... මාව ඉතුරු වෙයිද"

පෙරදා තමා ඇය නතු කර ගත් මොහොතේ ගැලූ ලේ දහරාව... ඇය වේදනාවෙන් නැඟි විලාපය... තුහංස සීතල වී ගියේය.

තමාගේ කෝපය නිසාවෙන් පිටවූ වචනයට ක්‍රියාත්මක වූ ඔවුන් අතින් සිදුවෙන්නට ගිය වරද සුළු වරදක් නොවේ. ඇයගේ ජීවිතයට යම් අනතුරක් සිදුවිණි නම්...

"ඔයා මාව විනාශ කළා... ඒකට කමක් නැහැ හංස... මම ජීවත් වෙනවා... මැරුනේ නැහැ... ඒත් දෙයියනේ... පළිගන්න හිත තිබ්බට මාව විකුණලා මාව විනාශ කරන්න හිතුවේ ඇයි... මට නෙවෙයි හංස හතුරෙකුටවත් එහෙම කරන්න එපා"

"මම කිව්වට ඔයාව එහෙම විකුණුවේ නැහැ... කියන එක අහනවා" තුහංස කෝපයෙන් කීවේය.

"එහෙම නොකළනම් උන් බය නැතුව මාව උස්සයිද... මමවත් මගේ තාත්තිවත් ඔයාට වරදක් කරලා නැහැ හංස"

"මගේ තාත්ති රවටගෙන වාසි ගත්ත එක වරදක් නෙවෙයිද" තුහංස ඇසුවේ හඬිණි.

"කවදාවත් නැහැ හංස... රෙජී අංකල් මට ගොඩාක් ආදරේ කළා... එයා මාව එයාගේ ලේලි කර ගන්න තීරණේ කළා... ඒක මගේ වරදක්ද"

"කියවිල්ල නවත්වනවා... මම පිස්සු බල්ලා වගේ දුවගෙන ආවේ රැස්වීමක ඉඳලා... මිස් කෝල් විස්සයි" දුරකථනය දෙස බලමින් කී තුහංස ඇමතුමක් ගත්තේය. සස්වින්දි නැඟී සිටියේ ඉවත යන්නයි.

"මනෝජ් අංකල්" සස්වින්දි නතර වූවාය.

"හංස මහත්තයා... මීටින් එකට වඩා වැදගත් වෙන්න බැහැ මොනවත්... මට දැන් මේවා ඇති වෙලා" මනෝජ් අමනාපයෙන් කීවේය.

"මට පොඩි කරදරක් වෙලා මනෝජ් අංකල් ඒකයි දුවගෙන ආවේ... මීටින් එකට වඩා ඒක වැදගත් මට... ඒක දැන් හරි... ඒත් ආය එන්න බැහැ... ඔතන සෙට්ල් කරන්න... සයින් කරන්න තියන ෆයිල් ගෙදරට එවන්න" දුරකථනය විසන්ධි කළ තුහංස සස්වින්දි දෙස බැලුවේය.

තමාගේ කමිසය ඇයට ඉතා ලොකුය. දණිහිසට ආසන්න වෙන්නට දිගය. අත් නමා පිරි මහන්නට බැරිය. උරහිස වැලමිටේය. ඇයට වෙනත් ඇඳුමක් අවශ්‍ය නැත.

අපරාදේ... සායත් ගලවලා දාන්න තිබුණේ... සායෙන් වැඩක් නැහැ... නැගුණු සිනහව නොපෙනෙන්නට ඔහු වගබලා ගත්තේ සිතින් මුමුණමින්ය.

සස්වින්දි තුහංස තමා දෙස ඇසපිය නොහෙලා බලා සිටිනු දුටුවේය. හිතේ ව්‍යාකුල බව නිසා නොසිතුණද ඔහු කමිසය ගැලවීමට සූදානම් වෙද්දී තමා ඔහු දෙස හොඳින් බැලුවාය. ඔහුගේ වෙනදා තිබෙන රස්තියාදු පෙණුමේ ඡායාවක් වත් නොතිබුණේය.

මනා කඩවසම් ඔහුගේ වැදගත් පෙණුම සමාගමක හිමිකරුවෙකුටම ඔබින්නේය. ඔහු බලා සිටින්නේ තමාගේ ඇඳුම දෙස වන්නට ඇත. එය අන්දවන්නට පෙර ඔහු බලහත්කාරයෙන් තමාගේ ලේ තැවරුණු බ්ලව්සය ගලවා තමා දෙස බලා සිටි අයුරු ඇයට සිහිවිය. සස්වින්දි ගේ වත ලැජ්ජාවට ලා රත් පැහැයක් ගත්තාය.

ඇයගේ සුන්දර වුවන කෝප වූ විට රතු වන තරමට රතුවී නොතිබුණද ලා රත් පැහැයක් ගෙන ඇත්තේය. ඇයගේ රුව විඳිමින් තුහංස සිතුවේය.

"මොකද" ඔහු ඇසුවේය.

"තාත්ති වැඩට ආවද... එයා ඊයේ අසනීපයෙන් හිටියේ"

"අද නම් ඉහෙන් බහින රෝගයක් තිබුණේ නැහැ... හොඳ වෙන්න ඇති... ඔය යසට ආවේ"

හිතේ වූ සැකය නිසාම කාමරයට ගිය සස්වින්දි පාරමීට ඇමතුමක් ගත්තාය. වූ කිසිවක් නොකියා ඇය ඇයගෙන් විස්තර ඇසුවාය. පෙර දින ඇය නිවසේම පසු වූ බව සස්වින්දිට ඇයගේ කතාවේදී කියවිනි.

සමන් දෙයියනේ... මම මුන්ගේ ප්ලෑනට අහුවුණා... උෟට වෙඩි නොවැදුනානම්... සස්වින්දි හිරිවැටී ගියේ හඬින් පිටවූ ඉකියකුත් සමගයි. ඒ හාම ඇයට ඒ සිදුවීම මැවී පෙනෙන්නට විය.

පිස්තෝලය පත්තු වූ ඇයුරු... වෙඩිල්ල පිටව ගොස් ෂයිගේ බාහුවෙන් කොටසක් වෙන්වී ගිය ඇයුරු ෂයිට පෙර තමා බිම වැටෙද්දී ෂයි තමාගේ ඇඟ මතට කඩා වැටුණු ඇයුරු සිහිවිය. ඇයගේ සිහිය මදකට නැවතිණි. ඇය පෙර ලෙසින්ම කම්පනයට පත් වූවාය.

තුහංස කාමරයට පැමිණියේ සස්වින්දිගෙන් පිට වූ ඉකියේ හඬටයි. ඇය බියෙන් ගැහෙනු දුටු තුහංස ඇයව තුරුලුකර ගත්තේය.

"තාත්තිට සනීප නැහැ කියලා නැන්දගේ ගෙදරට කවුද යවලා රවට්ටලා උන් මාව ගෙදරට ගෙන්නා ගත්තේ... වැලි පාරෙදි අල්ලා ගත්තේ... මේ කාමරේට මාව උස්සගෙන ඇවිල්ලා... ඒ කරලා... ඒකරලා... ලෑස්ති වුණේ..." ඇය අසිහියෙන් මෙන් මිමිණුවාය.

ඇය දොඩවද්දී අනුරාගී හැඟීමකට හෝ ඇති වූ සිතුවිල්ලකට තුහංස මෘදුව ඇයගේ හිසේ දෙතොල් තැබුවේය. අසරණකම පරදවා ඇති වූ ආරක්ෂාකාරී හැඟීමට සස්වින්දි තව තවත් ඔහුට තුරුලු වූවාය.

කමිසය නැති ළයට බැනියම අතරින් දැනුණු උණුසුමට තුහංස නොසන්සුන් වූවේය. ඔහු ඇයව දෝතට ගත්තේය.

"හංස..." ඇය කෙඳිරුවාය.

"ඔයාට මොනවත් කරන්න වුන්ට බැරි වුණානේ හංසි... ආය ඒ ගැන හිතලා බය වෙන්න එපා"

රජී අංකල් ආදරයෙන් තමා ඇමතූ නම හංසගේ මු

වෙද්දී සස්වින්දි පුදුමයෙන් ඔහු දෙස බලා සිටියාය.

"හං... සී... සස්වින්දිට සියල්ල අමතක විය.

"මොකද පුදුම වෙලා මගේ දිහා බලාගෙන ඉන්
නොදන්න කෙනෙක් බලහත්කාරකමක් කරන්න නෙවෙයි
ගත්තේ... මම හංස" තුහංස කීවේය.

"දන්නවා" සස්වින්දි කීවාය.

"එහෙනම්... මොනවද මූණ දිහා බලාගෙන හිතන්
ආ... මැරෙන්නද මරන්නද අදහස" සස්වින්දි වතට නැගුණෙ
සිනහවකි.

"මට හංසි කියලා කතා කළේ රජී අංකල් විතරමයි...
තාත්තිට හා සමානව මම එයාට ආදරේ කළා... ඒ නිසා
තරහක් තිබුණත් මට ඔයාව මරන්න බැරි වෙයි" තුහංස අ
යහනේ තබද්දී ඇය ඔහුගේ ගෙල වටා දෑත් ඔතා ගත්තාය.

"මම හිතුවා පිස්තොලේ ළඟ නැහැ කිව්වට පස්සේ දුව
හදයි කියලා" ඔහු ඇයව සිප ගනිමින් කීවේය.

"දුවලා ගිහින් මම මොනවා පරිස්සම් කර ගන්නද හංස

"ඒකත් ඇත්ත" ඔහු ඇයගේ වතට වත තැබුවේය.

දුටු මොහොතේ සිට තුහංසගේ පෙණුමේ වෙනස මෙ
හැසිරීමද ඔහු ගැන හිතේ තිබූ තරහව සස්වින්දිගේ සි
ඈත්කර තැබුවාය. ඔහු තමාගේ යම් අයිතියක් ලෙසින් දැ
ඔහුට අවනත නොවන්නට සස්වින්දිට නොසිතුනාය.

වරදක් සිදුවුණාය යන හැඟීමත් සස්වින්දිගේ තිගැ
නිසාවෙන් තුහංසගේද සිතුවිලි වෙනස්වී තිබිණි. සිය පියා
තමාගේ බූදලය දුන් බවක් ඔහුට සිහි නොවුණේ සස්වින්දි
අවනතව කීකරුව සිටි නිසා වන්නට ඇත.

"හං... ස... අනේ... මට බය හිතෙනවා" සස්
කෙඳිරුවාය.

"බය වෙන්න එපා කෙල්ලේ... හැමදාම බය වෙ
ඉන්නත් බැහැනේ"

"ආයෙත් එහෙම වුණොත්"

"එහෙම වෙනවද කියලත් බලන්න ඕනෙනේ... කට වහගෙන ඉන්නවා" එවර තුහංස කෝප ගත්තේය.

"මට බැහැ... අයින් වෙනවා" ඔහුගේ කෝපයට කෝපගත් සස්වින්දි ඔහුව තල්ලු කළද ඔහු සෙල වුණේවත් නැත.

"මගේ ෂර්ට් එක ඇන්දම ආයේ ඇඳුමක් ඕනි නැහැ... ඒකට මොකද එනවා මෙතන මාව තල්ලු කරන්න" තුහංස ඇයව යට කර ගනිමින් කීවේය.

"එච්චර පොඩි මාව යටකර ගන්නේ... මදාවියා... හුස්ම ගන්න බැහැ මට... අයින් වෙනවා... මැරෙයි මාව" සස්වින්දි කෝපයෙන් කෑගැසුවාය.

ඔහොම කේන්තියෙන් රතු වුණාම අයින් කරන්න හිතෙන්නෙම නැහැ... මරන්න හිතක් නම් නැහැ මට... ඒත් බාගෙට මරනවා මම..."

ඇයගෙන් ඉවත්ව අනෙක් පස හැරුණු තුහංස ඇයව තමා මතට ගත්තේය.

කෝපයෙන් ආවේගයෙන් වදන් වලින් පහර ගසා ගනිමින් ඔහුව තල්ලු කරමින් තුහංසගෙන් ඈත්වන්ට දැඟලුවද තුහංස ඇයව වෙනත් මිහිරි වූ ලොවකට ගෙන යද්දී සස්වින්දි සියල්ල අමතක කළාය.

හිතේ වූ ඊෂ්‍යාව වෛරය නිසාවෙන් පළිගැනීමේ චේතනාවෙන් බලහත්කාරයෙන් මුල් වතාවට ඇයව නතු කරගත්තද තමා ඇයගෙන් සතුටක් වින්දේ නැත.

එහෙත් අද අහඹු ලෙස තමාට නතු වූ ඇයගෙන් ජීවිතයේ කෙදිනකවත් අත් නොවිදි මිහිරක් අත් විදින බව නුහුරු වූ හැඟීම් සතපවා ගනිමින් තුහංස සිතුවේය. ඔහු මෘදුව ඇයගේ නලල සිප ගෙන ඇයව ඉවත් කළේය.

ඒ සිදුම නිසාවෙන්ම දෝ ඒ මොහොතේ සස්වින්දිට රහල් සිහි විය. ඔහු හද පුරවා තමාට ආදරය කරන බව ඇය දන්නීය. ඔහු තමාව බලහත්කාරයෙන් පෙම්වතිය කරගත්තේ ඒ ආදරය නිසාමය. ඔහු තමාව ආරක්ෂා කරන්නේ රැකලා සිටින්නේ ඒ

ආදරය නිසාමය.

තම පියා මරන්නට ගිය මුදලක් නිසාවෙන් තමාව කෙලසා දැමූ නම ඇසූ පමණින් හදවත කෝපයෙන් පුරවන තුහංස අද තමා වෙනුවෙන් පැමිණ බියෙන් ගැහෙමින් සිටි තමාට රැකවලා වෙද්දී සස්වින්දිට දැනුනේ පුදුමයකි.

ඔහු ඇයව අමුතු ලොවකට ගෙන යද්දී පොරය නවතා දමා ඔහුට නතු වී වින්දේ කිසිදා නොවිඳි මිහිරකි.

එනිසාවෙන්දෝ රහල්ගේ සිපුමකින් නොලත් මිහිරි වූ හැඟීමක් ඇය තුහංසගේ සිපුමෙන් වින්දාය. තුහංස ඇයව ළං කර ගනිද්දී සස්වින්දි ඔහුගේ ළයේ හිස තබා ගෙල යට හිස සඟවා ගත්තාය. එලෙසින් ඔවුන් බොහෝ වේලාවක් නිහඬව ගත කළෝය.

"හංස..." සස්වින්දි තුහංසගේ ළයෙන් හිස ඔසවා ගත්තීය.

"හ්ම්..." තුහංස දෑස් වසාගෙනම කෙඳිරුවේ ලද මිහිර ඒ මොහොත වෙද්දීත් තෘප්තියෙන් විඳ ගනිමිනි.

"මම ආය ඔයා කියන ඕනි වෙලාවක එන්නම්... හැබැයි... ඔයා විතරයි හරිද" ඇය තුහංසගේ ළයේ රටා අඳිමින් කීවාය. තුහංස දෑස් විවර කර ඇය දෙස බලා සිටියේය.

"මතක තියාගන්න හොඳින් මේක... මාව කාටවත් දෙන්න ඔයාට බැහැ... අයිතියකුත් නැහැ" ඇය පැවසුවේ අණක් ලෙසිනි.

"බැරිකමක් නැහැ මට... අනික අයිතියක් නැත්තෙත් නැහැ"

"ඒ කොහොමද" සස්වින්දි නැඟී සිටියාය.

"එකවුන්ට් එකේ තියෙන්නේ ලක්ෂ ගානක් නෙවෙයි කෝටි ගානක්නේ... අමතක වුණාද"

"ඉතින්..."

"අනික මට තමුසෙව කසාද බන්දවන්නනේ තමුසෙගේ තාත්තා ඔය සෙල්ලම් ඔක්කොම දාන්න ඇත්තේ"

"මොකක්... හංස මේ" සස්වින්දි කෝප වූවාය.

"නීතියෙන් නැති වුණත් තමුසේ දැන් මගේ කසාද ගෑනි වගේ තමයි"

"ඉතින්... ඕනි දෙයක් කරන්න පුළුවන් කියලා හිතුවද"

"හිතුවේ නැහැ... දන්නවා... මෙන්න මෙහාට එනවා... තව ටිකක් මගේ ළඟට වෙලා තුරුල් වෙලා ඉන්නවා" තුහංස ඇයව ඇද ගත්තේය.

"මට බැහැ" කියූ සස්වින්දි ඔහුගෙන් මිදී නැගී සිටියාය.

"හරි හරි... වටිනාකම කෝටි ගානයි... මගේ විතරයි... කසාද ගෑනිත් වෙයි දවසක" තුහංස නැවත ඇයව ඇදගෙන තුරුල් කර ගත්තේ සිනහවක් නංවමිනි.

"මතක තියා ගන්න... ආය එහෙම දෙයක් වුණොත් මම මොහොතකටවත් ජීවත් වෙන්නේ නැහැ" ඇය දබරඟිල්ල ලෙලවා කීවේ අභියෝග කරන්නාක් මෙනි.

ඇයගේ ඇඟිල්ල සමඟ සුරත අල්වාගත් තුහංස එය තම පපුවේ රඳවා ගනිමින් නැවත වතාවක් ඇයගේ වතට එඹුණේය. සස්වින්දි තරහෙන් මුහුණ ඉවතට ගත්තද තුහංස බලහත්කාරයෙන් ඇයගේ දෙතොල දෙතොලින් අල්ලා ගත්තේය.

"කේන්තියෙන් පුපුර පුපුරා ගැස්සිලි පිම්බිලි බල බල තුරුල් කර ගන්නකොට අවනත වෙලා තුරුල් වෙනවට වඩා අමුතුම ෆන් එකක් තියනවා " සිනාසෙමින් පවසා තුහංස ඇයව අතහැර දැමුවේ තවත් වතාවකට ඇයව සිපගෙනයි.

"නපුරා... " ඇය මිමිණුවාය.

"ෂඃ... මට ප්‍රමෝෂන් ලැබිලා... අසත්පුරුෂයා... මදාවියා... තිරිසනා... බල්ලා... ඒ නාමපද ලොප් වෙලා"

"අහන්න හංස... ඔයා මම වෙනුවෙන් අර ඔයාගේ කුපාඩි සඟයෝ ටිකට මතක හිටින්න දඬුවමක් දෙන්න ඕනි... ඇයි මෙහෙම කළේ කියලා අහන්න ඕනි"

"අනෙ මේ... යන්න ලැස්ති වෙනවා... දැන් ඇරූ සීතා දාලා එනවා ඇති"

"ඔයා ඒ දේ නොකළොත් ආය මම නැහැ"

"ඉතින්... ඉන්නේ තමුසේ විතරද... සල්ලි තිබේ නම් ඕනේ ආකාරයකට"

"ඔව්... ලෙඩත් ලැබෙයි එක එක ආකාරයට"

"ඉතින්... මටනේ... තමුසෙට මොකද"

"අනේ මට මොකද... ආය මම ළඟට එයි කියලද"

"නාවොත් වෙනදේ දන්නවනේ"

"වෙන ගෑනියක් ළඟට ගිහින් නම් මගේ ළඟට එන්න හිතන්න එපා... ඔයත් එක්කම මටත් විඳවන්න වෙයි... ලෙඩ බෝවුණාම"

"ඉතින්... මේ දැන් වින්ද වගේ ලෙඩත් විඳ ගමු"

"හිතාගෙන ඇති"

"තාත්ති සනීපෙට නිදියන්න ඕනේ නම් ගෙදර ඇදේ... ඔය ලොකුව බස්ස ගන්න වෙයි... නැත්නම් ඉතින් සොහොනේ... ආතල් එකේ හුළං වැදි වැදි... පිස්තෝලේ තිබ්බා මතකයිනේ මම ඔලුවේ"

"මගේ තාත්තිට මොනවා හරි වුණොත් මම ජීවත් වෙන්නේ ඒක අහනකල් විතරයි හංස... ඒක හොඳට මතක තියා ගන්න ඔයා... කෝටි ගාන ලැබෙයි එතකොට... බලාගෙන ඉන්න"

"බ්ලැක්මේල් කරනවද මාව... ආ... මොනවත් කරන්න ඕනේ නැහැ... දුවට මේ වෙලා තියන දේ මනෝජ් අංකල්ට කිව්ව නම් ඇති... මට උණ්ඩෙකුත් ඉතුරුවෙයි" සස්වින්දි සිහිතල වී ගියාය.

ඔහු පැවසුවේ සත්‍යකි. මේ සියල්ල ඔහු දනී නම් ළය පැලී මිය යනු ඇත.

"අනේ හංස" සස්වින්දි ඔහුගේ බාහුවේ වෙලුනාය.

"එහාට යනවා... තමුසෙගේ ඔය ලොකු කතා තමයි මට පේන්න බැරි" තුහංස ඇයගේ අත අතහැර දමමින් කීවේය.

සස්වින්දි නිහඬව නාන කාමරය වෙතට ගියාය. තුහංසගේ දුරකථනය හැඬ වූයේ සස්වින්දි ආපසු එද්දීය. ඔහු එයට සම්බන්ධ වූවේ සස්වින්දි දෙස බලාගෙනයි.

"පැටෝ... මෙච්චර වෙලා යනකල් උඹට කෝල් එකක්වත් දෙන්න බැරි වුණාද මිනිහෝ" පැටෝගේ අංකය දුටු ඔහු කෑගැසුවේය.

"අනේ බොස්... කලබලේට ෆෝන් එක වාහනේ දාලා ගිහින්... ගත්ත ගමන් තමයි බොස්ට ගත්තේ"

"කොහොමද ෂයිගේ තත්වේ"

තමාට මෙවැනි කරදරයක් කිරීමට තැත් කළ අය පිළිබඳව මෙතරම් ලෙංගතුව සොයා බැලීම ගැන සස්වින්දිට තුහංස කෙරෙහි අපුලක් මෙන්ම කෝපයක්ද දැනිණි.

මොනවා වුණත් ඒ අපරාධකාරයාගේ තත්වේ මෙයා දැන ගන්න ඕනි ඇතිනේ... ඒක වෙන්න ඇති අහලා බලන්නේ... සස්වින්දි කෝපය නැති කර ගැනීමට උත්සහ කළාය.

"අනේ මස් ඔක්කොම ගැලවිලා... ඇටෙත් කුඩු වෙලා"

"ගෙනියච්චේ ජෙනරල් හොස්පිට්ල් එකකට නෙවෙයිනේ"

"නැහැ බොස්... පොලිසියට උත්තර දෙන්න වෙයි කියලා අපි ප්‍රයිවට් ඩොක්ටර් කෙනෙක් ගාවට ගෙනියච්චේ... බැඳපු තුවක්කුවක් පත්තු වුණා කියලා තමයි කිව්වේ"

"ඒක හොඳයි... ඒත් උඹලා මේක මට කියන්න තිබුණා නේද... මට නොකියා මේ කළ දේ වැරැද්දක්" තුහංස කේන්තියෙන් කීවේය.

"බොස් කිව්වේ බොස්ට කෙල්ල එපා... අපිට කෙල්ල ගෙනියලා ඕනේ දෙයක් කර ගන්න කියලා... ඒකයි නොකීවේ"

සංවාදයට කන්දෙමින් සිටි සස්වින්දි පැටෝගේ කීමත් සමඟ වෙව්ලා ගියාය. ඇය වහා තුහංස දෙස බැලුවේ දාර ගත නොහැකි කෝපයකිනි.

"තිරිසනා... අසත්පුරුෂයා... මට බොරු කිව්වා... මාව විකුණුවා... සමන් දෙයියනේ තමුසෙට නම් හොඳක් වෙන්න

දුරකථනය අක්‍රිය කළේය.

"මේ අහනවා... මම සමහරවිට එහෙම කි
තමුසේ එක්ක කේන්තියෙන් බීලා ඉන්න වෙලාව
කිව්වා කියලා මට මතක තිබුණේ නැහැ" ඔහු
බාහුවෙන් අල්ලාගෙන කීවේය.

"අත අරිනවා මාව... කිසිම විශ්වාසයක් නැහැ
ගැන" සස්වින්දි මහා හඬින් හඬමින් කීවාය.

"නාඩා ඉන්නවා... උන්ට එහෙම කිව්ව බවක
තිබුණේ නැහැ"

"එහෙම නම් ඔයා අත අරින්න උන්ව... ආ
තමන්ට ගැලපෙන අයව"

"මේ... තමුසේ මට උපදෙස් දෙන්න එන්න
හින්දවත් මට උන්ව අත අරින්න බැහැ"

"එහෙනම් මතක තියා ගන්න... මම නැහැ මින්

"තමුසේ කවුද මට... ආ... කවුද මට තමුසේ...
ඇඳට ගත්තේ කසාද බඳින්න හිතාගෙන කියලා හි
තාත්තා නෙවෙයි කවුරු කිව්වත් මම තමුසෙව බ
ගෙනියයි කියලා හිතුවද" තුහංසගේ කීමට සස්වි
දැවී ගියාය.

ඔව්... එයාට මම කවුද... මම ගැන මොන
මොන කැක්කුමක්ද... මම එයා ඇඳට ගත්ත තවත් ඒ
විතරක් වෙන්න ඇති... තමාටම මුමුණාගත
මොහොතක් තුහංස දෙස බලා සිට කාමරයෙන්
ගියාය.

"ඉන්නවා... මම ගිහින් දාන්නම්" තුහංස කීවද
නොතැකුවාය.

"පැටෝ... මම කේන්තියට නෙවෙයි කොහෙ

මම පවරණ වගකීමක්... ඒක ආය මට මතක් කරන්න ඉඩ තියන්න එපා" පැටෝට ඇමතුමක් ගත් තුහංස තදින් කීවේය.

කකුලට බෙහෙත් දමා ගත් සීතා රෝහලේ නොනැවතී නිවසට පැමිණියේ සස්වින්දි නිසාමය. ඇය බියෙන් හඬා වැටෙමින් තමාට තුරුල්වී සිටිය අයුරු ඇයට අමතක කළ නොහැකි විය.

ආපසු නිවසට පැමිණි සීතාට සස්වින්දි නැවතත් තුරුළු වූයේ සිත පෙලූ දුක දරාගත නොහැකිවයි. තුහංස තමා අත හැර දැමුව හොත් සිත හදා ගත හැකිය.

එහෙත් ඔහු කොතරම් නැහැ කීවද නැවත කාට හෝ තමාව විකිණීමට උත්සහ කළොත්... සස්වින්දිට දරා ගත නොහැකි විය. ඇය සීතාගේ ළයේ හිස තබා හඬා වැටුණාය.

"සීතා... ආ... මේ ඇඳුම ඇඳගෙන යනවනම් යන්න එන්න කියනවා" තුහංස පැවසුවේ සස්වින්දිට අළුත් ඇඳුමක් ලබා දෙමිනි. එය අතට ගත් ඇය එය විසිකර දැමුවාය.

"එළියේ තව පිරිමියෙක් ඉන්න නිසා ඉවසනවා... නැත්නම් මම දන්නවා ඔය ආපහු හිතුවක්කාරකමට ඇඳ ගත්ත බ්ලවුස් එක ගලවලා දාලා අන්දවන්න "

"මට ඕනි නැහැ... සීතා නැන්දේ... මට බ්ලවුස් එකක් දෙන්න ඇඳගෙන යන්න"

"ඕක ගෙනාවේ මම පුංචි නෝනා... පුංචි මහත්තයා නෙවෙයි... ඒ නිසා ඇඳ ගන්න"

"සල්ලි කාගෙද"

"මගේ"

ඔවුන් අතර ගැටීම වළකන්නට සීතා තුහංස එයට මුදල් දුන් බවක් නොකීවාය. එය ගත් සස්වින්දි කාමරයට ගියාය. තුහංස ඇය එන තුරු සාලයේ වාඩි වුණේය.

"සීතා... මට වෙලා යනවා... යනවා නම් නගින්න කියනවා වාහනේට" තුහංස පැවසුවේ සාලයට එන සස්වින්දි දෙස බලමින්ය.

මුදල් නෝට්ටු කිහිපයක් සස්වින්දි අසලින් ස්ටූලය මතට ද...
ඉවත ගියේය.

සස්වින්දි දැනුනේ වාවාගත නොහැකි කෝපයකි. මුදල ගැ...
ඇය සූදානම් වූයේ තුහංස වෙතට දිව යන්නයි.

"ඔහොම ඉන්න දරුවෝ"

සීතා ඇයගේ සුරතින් අල්ලාගෙන ඇයව වළකා ගත්...
ඇයගේ කෝපය වටහාගෙනයි.

"ඉවසීමෙන් වැඩ කරන්න මගේ රත්තරන් නෝනේ... පුංචි...
මහත්තයා කේන්ති කර ගන්න එපා"

"මට මොනවා වුණාම මොකද නැන්දේ දැන්... මම විනාශ...
වෙලා ඉවරයිනේ"

"ඒ බව හරි දරුවෝ... එහෙම කියලා දමලා ගහලා යන්න...
ලෑස්ති වෙන්න එපා... පුංචි මහත්තයා මත්තෙම ඉන්නව...
මිසක්..."

"ඒ මොකටද එයා මත්තෙම ඉන්නේ... මාව කැන්දන් යරි...
කියලද"

"ඒක මම දන්නේ නැහැ නෝනේ... ඒත්... ළිඳේ වැටුණු...
මිනිහා ළිං කටෙන්ම තමා ගොඩ එන්න ඕනේ... අනික... පුංචි...
මහත්තයා කවදාවත් මේ වගේ දෙයක් කරලා නැහැ"

"කවුද නැන්දේ දන්නේ"

"ඒක මට විශ්වාසයි දරුවෝ... මම දන්නවා... කෑවට බිව්වට...
ගොරි දා ගත්තට සල්ලාලකමක් නම් කළේ නැහැ...
පැටලිල්ලක්වත් හදාගෙන නැහැ කා එක්කවත් මම දන්න...
තරමට... ඔය දරුවා එක්ක පැටලෙනකල්"

"මට ඕවා වැඩක් නැහැ නැන්දේ"

"වැඩක් නැහැ කියලා පැත්තකට වෙලා ඉන්න එපා

නෝනේ... ඕකට රහ වැටුනම කොතනින් කෙලවර වෙයිද දන්නේ නැහැ... අයාලේ යන්න නොදී රැක ගන්න ඕනේ දැන් පුංචි නෝනම තමයි"

"අනේ... ඕනි තැනකට ගියදෙන් තිරිසනා... මට ඕනි නැහැ" කියූ සස්වින්දි තුහංසගේ රථය වෙතට දිව ගියාය.

"සල්ලි... බල්ලොත් නොකන සල්ලි... සල්ලි වලට ඕනි ජහජරා වැඩ කරන තමුසෙවගේ එවුන් ඉන්නවා තමයි... ඒත් හැමෝම එහෙම නැහැ" තුහංස ඇයගේ කෝපයෙන් රතු වූ වත දෙස බලා සිටියේය.

"තමුසේ මේක මට දුන්නේ මේක මගේ රස්සාව කියලා හිතලද"

සල්ලි ටික මිටට පොඩි කළ ඇය එයින් තුහංසට දමා ගැසුවාය. සුක්කානමේ දැත් තබා ගත් තුහංස නිහඬකමෙන්ම ඒ බැල්මේම සිටියේය.

"දෙයියනේ... මම කෙල්ලක්... පිරිසිදුකමට හිටිය කෙල්ලක්... අයාලේ ගිය ගෑනියක් නෙවෙයි..." සස්වින්දි කෑගැසුවාය.

"තමුන් ගත්තේ මාව නෙවෙයි මගේ ජීවිතේම... මගේ අනාගතේ... මගේ බලාපොරොත්තු... මගේ ආදරේ... ඒ සේරම... ඒ සේරම තමුසේ විනාශ කළා... විනාශ කළා..." ඇය හති ඇරියාය.

"ඒ කරලා මට සල්ලි දෙනවා..." ඇය ඉකි ගැසුවාය.

"ඇයි සල්ලි දුන්නේ... ඇයි... තමුසේ හිතුවද සල්ලිවලට මම තමුසෙව සනසවන්න ඇඳට නැග්ගා කියලා... එහෙම හිතුවද... එහෙම හිතුවද... ඇයි එහෙම හිතුවේ..." ඇයි පිස්සියක් මෙන් කෑගැසුවේ ඉකිගසන අතරේය.

තමාගෙන් විඳි මිහිර ඒ මොහොතට සීමා කොට ඉන් පසුව හැඟීමකින් තොරව ඔහු පැවසූ කටුක වදන් ඇයගේ සවනට දෝංකාර දුන්නාය.

තුහංස කෙරෙහි දැනුණු කලකිරීම කෝපය වාවා ගත නොහැකි පීඩනයෙන් ඇය තව තවත් දෙඩවූවාය. හඬ බාල කළ

නෙවෙයි" සස්වින්දි නැවත හඬ වැඩි කළාය.

"ඒත් ඒ සල්ලි වලට නෙවෙයි... මාව එ
තත්වෙකට දාන්න එපා... හොඳක් වෙන්නේ නැහැ
සස්වින්දි තවත් තුහංස වෙතට ළං වූවාය.

"තිරිසනා... මතක තියා ගන්නවා... මේ මම ආ
තර්ජන කළත් තමුසේ ළඟට එන්නේ නැහැ...
මරනවා තාත්තියි මමයි දෙන්නවම"

ජීවිතේ කවරදාවකවත් මෙතෙක් වෙලා කියව
බලා නොසිටි තුහංස තම සිතුවිලි ගැනම වූ
රළයෙන් බැස්සේ සස්වින්දිගේ ඇගේ වදින සේ ර
ඇර දමමිනි.

දොර ඇගේ වැදුනද සස්වින්දි නොසෙල්වී සිටි
සිටියාය. තුහංසගේ නිහඬබව ඇයට පන්නරයක් විය.

තුහංස ඇය ඉදිරියේ ඇයගේ ඇගේ ගෑවෙන
තරමට ළංව සිට ගත්තේය. දබරඟිල්ල මදක් ලෙලව
වතට නැඹුරු වුණේය.

"මොන තර්ජන මට දැම්මත් මට තමුසෙව ඕ
වෙලාවෙම තමුසෙව මගේ ළඟට ගන්න හැටි මම
ඒත්... මම හිතන්නේ නැහැ ආයේ වතාවකට මට
ඕනේ වෙයි කියලා"

"ලොකු දෙයක්... ලොකු උදවුවක්... මිස්ටර්..
බක්මීමල්දෙණිය" සස්වින්දි රතු වූ වතින් කෝපයෙන්

"ඔය රතු මූණ පේන කොට නම්... වෙලා තිබ්බ
වතාවකට... අද දවසට තුන් වෙනි වතාවට..." ස
දෑසින් ගිණි පිට වෙද්දී ඇය ඔහුව මඟ හැර ඉවත බලා

"දැන්වත් නැගිනවද වාහනේට"

"මට කාගෙවත් වාහන ඕනි නැහැ... මම දැන් වත

කිව්වා... මම පාර දන්නවා"

ඇය නහර ඉලිප්පී යන තරමක වේගයෙන් කෑගැසුවාය. ඇයගේ හඬට සීතාද රහසින් ඔවුන් දෙස බැලුවාය.

පුදුමයි... පුංචි මහත්තයා එහෙම දාලා යන්නේ නැහැ පුංචි නෝනව... සීතා මුමුණා ගත්තාය.

"නහර පතිනකම් කෑගගහා ඉන්නවා එහෙනම්... තුන් වෙනි වතාවට නෙවෙයි තව වතා කීයකට ඉවසන්න වෙයිද මන්දා පැටෝලා ආවම... ෂයි නැති වුණාට තව තුන්දෙනෙක් ඉන්නවනේ එතන" කට කොණකට සිනහවක් නගා ගනිමින් කියූ තුහංස වාහනයට නැගුණේය.

දෑස් විසල් කොට මොහොතක් ගත කළ සස්වින්දි බිඳක් හෝ පමා නොවී තුහංසගේ රථයට ගොඩවූවාය. නැගුණු සිනහව ආයාසයෙන් වළකාගත් තුහංස රථය පණගන්වා ගත්තේය.

"මාව මෙතනින් දාලා යන්න"

එතෙක් නිහඬව පැමිණි සස්වින්දි පැවසුවේ කැටැන්දොලදීය. එහෙත් තුහංස රථය නැවැත් වූයේ නැත.

ඔහු ඇයව උඩවලවේ වෙතටම රැගෙන ආවේය. ඇයගේ නිවසට යන වැලිපාර අසල ජීප් රථය නවතද්දී සස්වින්දි සමු නොදීම රථයෙන් බැස ගැනීමට සූදානම් වූවාය.

ඇයව වැළකූ ඔහු ඇයව ඔහු වෙතට ඇදගෙන දෙකම්මුල් මෙන්ම දෙතොලද සිප ගෙන අත හැර දැම්මේය.

"කිස් කළේ මට දුන්න සතුටට... මෙතෙන්ට ගෙනත් දැම්මේ තමුන්ගේ ආරක්ෂාවට... නැතුව ඉදිරියට තමුන්ගේ අවශ්‍යතාවයක් දැනෙයි කියලා හිතලා නෙවෙයි... දැන් යන්න පුළුවන් ගෙදරට"

තුහංසට තපුරුම තපුරු බැල්මක් හෙලූ සස්වින්දි ගස්සා ඉවත්ව ගියේ ඔහු සමු නොදීය.

තුහංස හඬින් සිනාසුනේ ඇයට ඇසෙන්නටමය. ඇය කෝපයෙන් දත්මිටිකා තදින් අත මිට මොලවා ගත්තාය.

දියණිය දුටු මනෝජ්ට දැනුනේ සතුටක්ද දුකක්ද ව
ඔහුටම වටහා ගත නොහැකි විය.

"දෝණී... මගේ රත්තරන්" මනෝජ් ඇයව ගත්තේය.

"මගෙ තාත්තී... ඔයා හොඳින් නේද" සස්වි
සිනහවකින් ඇසුවාය.

"ඔව් රත්තරන්... මම හොඳින්... ඇයි"

"නැහැ... ඊයේ ඇම්මක් හැඳුනා කිව්වට"

"ආ... ඒක ඊයෙම ඇරිලා ගියා... මගෙ දෝණි
හින්දමද ආවේ"

"නැහැ... ඒක නිසාම නෙවෙයි... ක්ලාසුත්
ඒකයි ආවේ" ඇය මුසාවක් කීවාය.

"ඒ වුණාට කමක් නැහැ... ගෙදර එන්න දඟල
මහන්සි පාටයි හොඳටම... වොෂ් එකක් දාගෙන ඒ
තේ එකක් හදන්නම්"

ගත දොවාගෙන පැමිණි සස්වින්දි මනෝජ් සා
කෝප්පය ගෙන ඔහු ඉදිරියෙන් වාඩි වූවාය.

"අර වසවර්තියා දැන්නම් සල්ලි අමතක ක
නැතුව ඉන්නවා ඉස්සර වගේම" මනෝජ්
මුලපිරුවේය.

"කී කාලෙකටද දන්නේ නැහැ" සස්වින්දි කීවාය.

"කියන්න බැහැ... ඔෆිස් එකේ ඉන්නකල් මනෙ
මනෝජ් අංකල්... කිය කියා... පව් කියලත්
වෙලාවකට"

"තාත්ති මේ..." සස්වින්දි ඔහුව නැවතුවේ ඉවසුල්
කෝපයකිනි.

"රණී මහත්තයා හිටියනම් ඔයා කොල්ලාව

වූවාය.

"රජී මහත්තයාට වුවමනාව තිබ්බේ හංස මහත්තයාව කැම්පස් යවන්න... උපාධිය අර ගත්තට පස්සේ කම්පැනියදෙන්න... අනේ... නොහිතුව විදිහටනේ හැමදේම දාලා ගියේ... අපූ වගේ... දෙන්නම හොරු අරන් ගියා වගේ" මනෝජ් ශෝකයෙන් කීවේය.

තමා හා රජී මහත්තයා අතර වූ බැඳීම ලේ බැඳීමකටත් වඩා ඔබ්බට ගිය දැඩි විශ්වාසවන්ත වූ බැඳීමකි. ඔහුට තමාත් තමාට ඔහුත් තරම් විශ්වාස වූ කිසිවෙක් මෙලොව සිටියේ නැත.

ඔහු තම දියණියගේ නමින් සිය පුතාට උරුම මුදල සුරක්ෂිත කළේ ඒ විශ්වාසයේ ප්‍රතිඵලයකටයි.

"උපාධිය කෙසේ වෙතත් අපරාධ නොකර රටේ ලොකේ වැදගත් විදිහට ජීවත් වෙන්නවත් කවුරු හරි උගන්වනවනම් හොඳයි"

"ඒවා සජී මිස්ගේ වැරදි... එයා තමයි හුරතල් කරලා ඔය කොල්ලව නරක් කළේ... හැමදේම රජී මහත්තයාගෙන් වැහුව්වා... එයා කිසි දෙයක් දන්නේ නැහැ"

"දැනගෙන හිටිය නම් කවදාවත් මාව ලේලි කර ගන්න හදන එකක් නැහැ"

"ඔව් දෝණී... ඒ තරමට අදහන්න වටින කෙනෙක් එයා... එයා නිතරම කිව්වේ දන්න තරමට හංස වැරදි කරන්නේ නැහැ... එයා වරදක් කළොත් ඔයා එයාව හදා ගයි කියලා... දැනට වුණත් හරි පාරක් තියනවනම් එයාට හැදෙන්න බැරි කමක් නැහැ"

"මොන පිස්සුද... ඒ යකාව කෝවේ දාලා රත් කරලවත් හදන්න බැරි වෙයි"

"හොඳ ගෑනු ළමයෙක් එයාට ළං වුණොත් එයා හැදෙයි දෝණී"

"ඔහොම මිනිහෙක් එක්ක හොඳ කෙල්ලක් එයිද තාත්ති" සස්වින්දි ඇසුවේ ආවේගයෙනි.

පැටලෙන්නම යන්න එපා... ...
තරාතිරමක කෙල්ලක් හංස මහත්තයා එක්...
නැහැ"

කුමක් හෝ නොදන්නා රිදුමක් හදවත...
සස්වින්දි දැනිණි.

"අර ඔෆිස් එකේ එකියෙකුත් මැරෙන්...
මහත්තයට... හංස මහත්තයා ගනන් ගන්නේ...

කවුද දන්නේ... සස්වින්දි මුමුණා ගත්තේ...

"ඔය සෙල්ලක්කාරකම ලොකු පවුල්...
තියනවා... අඩුපාඩුවක් නැහැනේ කිසිම දෙයක...
හැමදේම ලැබෙනවානේ"

ඇයි සල්ලාලකම... සස්වින්දි එයත් පවසා...

"රජී අංකලුත් ඉස්සර එහෙමයි කියලා...
තියනවා" එයට නම් සස්වින්දිගේ වතට නැගුණ...

ඇයට අද තමා තුහංස දුටු අයුරු සිහිවිය...
තුහංසව කෙදිනකවත් දැක නොතිබිණි. රජී අං...
සිටින්නට ඇතැයි සස්වින්දිට සිතිණි.

රජී අංකල්ගේ පෙණුම නම් පුතාට කිව්...
ඇවිල්ලා තියනවා... ඒකගේ පර්සනල්ටි එක...
ගති නම් චීප්...

"දෝණි ගැන ලොකු බලාපොරොත්තුවක...
තිබුණා... මාවත් ඒකට පොරොන්දු කර ගත්...
කැමැත්ත ලැබුණොත් මම දෝණිව දෙන්නම්...
මහත්තයාට පොරොන්දු වෙලා හිටියේ"

"සජී ආන්ටි මට කවදාවත් කැමති වෙ...
තාත්ති"

"ඔව්... රජී මහත්තයටත් එයා කිව්වලු දව...
රජී මහත්තයා ඒ ගැන එයා එක්ක කතා කළේ...

"ඉතින් එහෙම තියෙද්දී ඇයි මගේ එකවුන...

ගානක් දාලා තියෙන්නේ"

"කසාදේ වුණත් නොවුණත් ඒක මම අරන් දෙයි කියලා රජී මහත්තයාට විශ්වාසයක් තිබුණා... ඒක කසාදෙකට හේතුවක් නෙවෙයිනේ"

"හ්ම්..."

"රජී මහත්තයා නැති වුණාට පස්සේ සජී මිස් මට එන්න කියලා මගෙන් ඇහුව්වා... රජීගේ හිතේ මනෝගේ දෝණි ගැන අදහසක් තිබුණා ඒක ඔයාට කියලා තියනවද කියලා"

"ඉතින්"

"මම කිව්වා... ඔව්... සජී මිස් කැමති වුණොත් විතරක් මම මගේ දෝණිව දෙන්නේ කියලා... මම රජී මහත්තයාට කියලා තියෙන්නේ කියලා"

"එයා අකමැතියි කියන්න ඇති"

"ඔව්... පරණ කතා පරණ දේවල් ඔක්කොම අමතක කරමු කිව්වා... එහෙම යෝජනාවක් ගෙනාවා කියලා හිතන්නවත් එපා කිව්වා... මම දෝණිව ඊට පස්සේ එහෙ එක්ක නොගියේ ඒකයි"

පුතා අම්මා වගේමයි... අසත්පුරුෂකම... සස්වින්දි සිතුවාය.

"මොන සක්කරයා කිව්වත් මම ඔයාව නම් හංස මහත්තයාට දෙන්නේ නැහැ දෝණි... එයා ඉන්න ඉසව්වකවත් ඔයා ඉන්න එපා... තරුණ හිත්... අපට කියන්න බැහැ ඕවා"

තමුසේ කවුද මට... ආ... කවුද මට තමුසේ... දවස් දෙකක් ඇඳට ගත්තේ කසාද බඳින්න හිතාගෙන කියලා හිතුවද... මගේ තාත්තා නෙවෙයි කවුරු කිව්වත් මම තමුසෙව බඳියි... ගෙදර ගෙනියයි කියලා හිතුවද... අද හොරා ගනනකට පෙර පැවසූ තුහංසගේ වදන් සස්වින්දිගේ සවනතට දෝංකාර දෙන්න විය.

"උංත් එක්ක යන්න මේ මම... තාත්තිට පිස්සුද... රජී අංකල් නැතිවුණ එකම හොඳයි" වේගයෙන් කියූ සස්වින්දි නැඟී සිටියාය.

ඇයට පියා හා පවසන්නට තුහංස නම් අපරාධකාරයා මැරයා ගැන බොහෝ දේ තිබුණද ඒවා පවසන්නට ඇයට

හැකියාවක් නැති බව දැන සිටි සස්වින්දිට හිති
ඇරෙන්ට වෙන කළ හැක්කක් තිබුණේ නැත.

සැමියෙක් දරුවෙක් මගේ ජීවිතේට අකැප ඇති
කාලෙම තනියෙන් ඉන්නවා... යහනට වැටුණු සස්
ගත්තාය.

ඇඟ දොවා ගත් තුහංස යහනට වැටුනේ නිවෙ
යන්නට නොසිතුණු නිසයි.

"අම්මා... තේ එකක් එවනවද" තුහංස හඬින් ප

පුතාගේ වෙනස අදහාගත නොහැකි වුවද ඒ
ඔහුගෙන් අසන්නට නොසිතුවේ ඔහුට පිටතට ගෙ
ගන්නට සිතක් පහළවේයැයි වූ බිය නිසාමය.

සජීවා රැගෙන ආ තේ කෝප්පය බී අවසන්
නැවත යහනට පෙරලුණේය. විදි මිහිරි අත්දැකීම් නි
සිටියේ ප්‍රබෝධමත් වූ සිතිණි. ඔහුට නිතැතින් සස්වි

බියව රතුවී ගිය වත... කඳුළු වලට දිලෙසන
උණුසුමේ ගුලිවී සිටි අහිංසක විලාසය...
පෙනෙන්නට විය. ඇයගෙන් විදි මිහිර නැවතත්
විය.

එසැනින් පැටෝගේ ඇමතුමෙන් පසුවත් තමා
දුන් පසුවත් ඇය රුදුරු වූ ඇයුරුත් ඔහුට සිහි විය.

හා පැටික්කියක් වගේ තුරුල් වුණාට මොකද ෙ
හරියට කොටි දෙනක් වගේ... ඔහු මුමුණා ගත්තේ
සිනහාවකින්ය.

හිතාගෙන ඇති මට වෙන ලස්සන කෙල්ලෙ
කියලා... මම එයාව හොයාගෙන පස්සෙන් එයි කිය

දින දෙකක් නිවසට වී ගත කළ සස්වින්දි
ගියේ පරිඝණක පන්තියට පසුදා සහභාගී වීමට ඝ
බැවිණි. රහල් නිසාම නවාතැනේ දිගටම නවතින්
සස්වින්දි කෑගල්ලේ නැන්දාගේ නිවසේ නැවතී
පන්තිය දවසට පමණක් නවාතැනට යන්නට සිතුවා

"හංස මහත්තයා සද්ද නැතිව හිටියට දෝ
ඇවිස්සෙන්න බැරි නැහැ... ඒ නිසා ගෙදර නොඑන

කැමතියි"

"කරන්න දෙයක් නැතුව බෝඩිමට වෙලා ඉන්නත් බැහැ තාත්ති... මම හිතුවේ කෑගල්ලේ නැන්දලාගේ ගෙදර ඉන්න"

"එතකොට ඒ ලෙවල් ක්ලාස් යන්නේ නැද්ද දෝණි"

"රිවිෂන් ක්ලාස්වලට විතරක් යනවා තාත්ති... ඒවාට කෑගල්ලේ ඉඳලා යන්න පුළුවන්"

රහල්ට උසස් පෙළ නැවත නොකරන බව පවසා රහසින් කණ්ඩායම් පන්ති කිහිපයකට සහභාගී වීමට සස්වින්දි සිතා ගත්තාය. හේතුවක් නැතිව රහල්ගෙන් බේරීමට අපහසු බව සස්වින්දි දැන සිටියාය.

යම් හෙයකින් රහල් පියා මුණ ගැසුණ හොත් පියා කෙදිනකවත් රහල් වැනි තරුණයෙකුට අකමැති නොවන බව සස්වින්දි දනී. එසේ වුවහොත් තමාට බොහෝ අසරණ වන්නට සිදුවනු ඇත.

තරුණියක් නොවන තමාට ගැහැණියක ලෙසින් කිසිදා රහල්ගේ පතිණිය විය නොහැකි බව සස්වින්දි වටහාගෙන සිටියාය.

මම රහල් ළඟ ඉඳගෙනම ටිකෙන් ටික එයා මගෙන් ඈත් වෙන විදිහට වැඩ කරනවා... මට සමාවෙන්න රහල්... මට වෙන කරන්න දෙයක් නැහැ...

සස්වින්දි නුවර එන බව දැන සිටි රහල් ඇය බසයෙන් බසින විට ඇය හමුවට පැමිණියේය. එනිසාවෙන් ඔහුව මඟ හැරීමට සස්වින්දි නොහැකි විය.

ඇය ඔහු සමඟ පේරාදෙණිය උද්භිද උද්‍යානයට ගියේ වෙන කළ හැක්කක් නොවූ නිසාය. රහල් සිමෙන්ති බංකුවක වාඩි වෙද්දී සස්වින්දි ඔහුට ඈත්ව බංකුව කෙලවරින් වාඩි වූවාය.

"ඔයා මම කවුරු කියලා හිතාගෙනද ඉන්නේ සස්වී"

"ඇයි ඔයා එහෙම අහන්නේ"

"අපි ආදරෙන් ළං වෙන්න ඕනේ... ඒත් ඔයා මගෙන් ඈතට යනවා... මෙහාට එන්න" රහල් සස්වින්දි ඔහු ළඟට ඇද ගත්තේය.

"අපි ආදරෙන් ළංවෙන්න ඕනේ තමයි රහල්... අද
ඒත්... ඒ හිතින් නේද... ගතින් ළං වෙන්න අද
එනවා" සස්වින්දි මදක් එහාට වෙමින් කීවාය.

"ඔයා මට එහෙම කිව්වේ මම ඔයාව වැරදි
ගන්නවා කියලා හිතලද"

"අනේ නැහැ රහල්... මම ඔයාව හොඳට දැ
තරම් මට විශ්වාස කෙනෙක් ඇති කියලා මම හිත
ඔයා එක්ක මම කී දවසක් රෑ දවල් තනි වෙලා හි
මට වරදක් කරලා නැහැ... මගේ තාත්ති ඇරුණු
කරනවනම් විශ්වාස කරන එකම පුද්ගලයා ඔයා"

"තැන්ක්ස් කෙල්ලේ... ඒත්... ඒ අපි යාළුවෙ
කාලෙනේ... දැන් එහෙම නැහැ... ආදරෙන් හිත
තුරුල් කර ගන්න ඉඟින්න හිතෙනවා කෙල්ලේ
නෙවෙයි"

"ඉස්සරත් මම ඔයාගේ පෙම්වතිය... ඉති
වෙනසක්"

"ඉස්සරත් මට ඔයාව තුරුල් කර ගන
නොහිතුනා නෙවෙයි... මම එහෙම නොකළේ
යන ළමයෙක් නිසා... ඒත් දැන් ඔයා එහෙම න
ඔයා ඕනේ... සීමාව මම දන්නවා"

රහල් ඇයට ළංව ඇයගේ කරවාටා ඇ
නලලත සිප ගත්තේය. සස්වින්දි තිහඬ වූ
නොමැති නිසාය.

රහල්ගේ හැසිරීමෙන් සස්වින්දිගේ
අපහසුවකි. ඔහු ඇය සිප ගන්නා මොහොත
පාසා ඇයට සිහි වූයේ තුහංසවයි.

ඔහුගේ සිපුමන් රහල්ගේ සිපුමන් මෙන් ළ
රළුය. ආවේගකාරීය. මිහිරි වුවත් වේදන

ඔහු හා ගත කළ ඒ මොහොතේ දැනුණු හැඟීම රහල්ගේ ආදරණීය උණුසුමට නොදැනෙන්නේය. සිතට ගෙන එන්නේ වරදකාරී හැඟීමක් මිස වෙනත් හැඟීමක් නොවේ. ඒ පහසින් තම සිතට විශාල බරක් දැනේ...

අනේ... මේ වරද මට තව කරන්න බැහැ රහල්... ප්ලීස්... මාව අත අරින්න... ඔයාට ගැළපෙන හොඳ කෙනෙක් හොයා ගන්න... සස්වින්දිට මුමුණාගත හැකි වූයේ සිතෙන් පමණි.

"සස්වී..."

"හ්ම්..."

"මම ආදරෙයි කෙල්ලේ... ගොඩාක්... ගොඩාක්... ගොඩා...ක්"

"මට ගොඩාක් ආදරේ කරන්න එපා රහල්... මට බයයි" සස්වින්දි පැවසුවේ දෑසට කඳුළු පුරවා ගනිමිනි.

"බය වෙන්නේ ඇයි කෙල්ලේ... අපි අපිට විශ්වාසයිනේ... අනික ඔයාට අයිතියක් නැහැ ආදරේ කරන්න එපා කියන්න... මොකද ආදරේ කරන්නේ මමනේ... ඒක මගේ දෙයක්"

"රහ..ල්..."

"කතා කරන්න එපා තවත්... ඔයා දන්නවා මම මොනතරම් කාලයක් ඔයා වෙනුවෙන් බලන් හිටියද කියලා... ඔයාට කොච්චර ආදරේද කියලා"

"සමන් දෙයියනේ... ඒ නිසා තමයි මම මේ කියන්නේ... හදිස්සියෙවත් මාව නැති වුණොත් ඔයාට දරාගන්න බැරි වෙයි"

"ඔව්... දරාගන්න බැරිවෙයි තමයි... ඒත්... මම ඔයාව නැතිකර ගන්නේ නැහැ... මට මාව විශ්වාසයි"

"තමන්ට තමන්වවත් ඕනිවට වඩා විශ්වාස කරන්න එපා රහල්... මොකද තමන්ට තමන්වත් නැතිවෙන තරමට අසරණ වෙන වෙලාවල් තියනවා... එහෙම වෙලා කෙනෙකුට විශ්වාසේ බිඳින්න සිද්ධ වුණොත්"

"ස..ස්...වී... මොනවද මේ ඔයා කලකිරීමෙන් කියන කතා" රහල් පැවසුවේ නොරිස්සුමෙනි.

මම මේක ඔයාට කියන්නම ඕනි රහල්... මේ...
ගියාම දැන ගත්ත දෙයක්"

"මො..ක..ද්ද" රහල් ඇසුවේ තරමක තිගැස්සීමකින්...

"අපේ තාත්ති පුංචි කාලෙදිම මාව කෙනෙකුට...
පොරොන්දු වෙලා... අපේ අම්මි යාළුවෙලා හිටිය...
පුතාට... ඒ අංකල් මට හරි ආදරෙයි" රහල් තදින් ස...
සුරත අල්ලා ගත්තේය.

"ඉතින්..."

"ඒ කෙනාව මට බඳින්න වෙයි සමහර විට" රහ...
සිටියේය. සස්වින්දිට ඔහුගේ වේදනාව දැනිණි.

"මට සමාවෙන්න රහල්... මම කලින් මේ ගැන...
හිටිය නම් ඔයාට මෙහෙම බලාපොරොත්තු ගොඩ...
ඉඩ තියන්නේ නැහැ"

"ඔයා මගෙන් ගැලවෙන්න බොරුවක්ද කියන්...
එහෙමනම් ඔයාට ගොඩාක් පව්"

"නැහැ රහල්... නැහැ"

"ඔයා එයාව දැකලා තියනවද"

"හ්ම්... අපේ ගෙදර ආවා"

එය සත්‍යක් යැයි පිළිගන්නට රහල්ගේ සිත...
නැත. කිහිප දිනෙක සිට දුටු සස්වින්දිගේ වෙන...
එය පිළිනොගෙනත් බැරිවිය.

"එයාට ඔයා කැමතිද... ආදරේද"

"නැහැ රහල්... ආදරෙත් නැහැ කැමතිත්...
ඇයගේ සුරත සිපගෙන ඇයව තවත් තමා ...
ගත්තේය.

"එහෙනම්... ඒ ගැන හිතන්න එපා... අපි කාල...
බලාගෙන ඉමු... හිතුවක්කාර වෙන්න වුණ...
හිතුවක්කාර වෙමු"

මම උත්සහ කරන්නම්... රහල්... මට එක පොරොන්දුවක් වෙන්න"

"මොකද්ද"

"එහෙම වුණොත් එදාට මට දොස් කියන්නේ වෛරකරන්නේ නැහැ කියලා"

"කවදාවත් නැහැ සස්වී... කවදාවත් මට ඔයාට වෛර කරන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ"

"මේ හැමදේම අවිනිශ්චිතයි රහල්... වෙන දේ බලාගෙන ජීවත් වෙන එක තමයි කරන්න තියෙන්නේ"

"එහෙම කියලා වෙනදේම බලාගෙන අපට ඉන්න බැහැ බබා... ඕනේ දේකට අපි උත්සහ කරන්න ඕනේ... එතකොට සමහර විට ඒ දේ වෙනස් කරන්න පුළුවන්"

"කරුමයක් තියනවතම් ඒක වළකන්න බැහැ රහල්"

"කරුමයක් තියනවා කියලා ඒක සිද්දවෙනකල් බලාගෙන ඉදලා හරියන්නේ නැහැ... වාහනේකට යටවෙලා මැරෙන්න තියනවා කිව්වම පාරේ ගිහින් නිදා ගෙන ඉදලා හරි යනවද"

"හා... මෙහෙම හිතන්න... මට හැදෙනවා පිළිකාවක් වගේ ලෙඩක්... ඔයා මොකද කරන්නේ" සස්වින්දි ඇසුවාය.

"මම කරන්නෙද... පහුවදාම ඔයාව කසාද බඳිනවා" සස්වින්දි ගොළු කරවමින් රහල් කීවේය.

"ඔයා එක්ක ඉන්න පුළුවන් අන්තිම දවස වෙනකල් මම ඉදලා... ඔයා මාව දාලා ගිය දවසට ඔයා වෙනුවෙන් ඔයාගේ මතක එක්ක හැමදාටම ඉන්නවා"

"ර..හ..ල්" සස්වින්දි ඉකිගසමින් රහල්ගේ ළයේ වැතිරුණාය.

"ඔය තරම් මට ආදරේ කරන්න එපා රහල්... දවසක මට ඔයාගෙන් අයින් වෙලා වෙන කෙනෙක් බඳින්න වුණොත් මට මැරෙන්න හිතෙයි රහල්"

"එහෙම හිතන්න එපා සස්වී... ඔයා ජීවත් වෙන්න ඕනේ... මම වෙනුවෙන් මගේ ආදරේ වෙනුවෙන් ජීවත් වෙන්න ඕනේ"

"අනේ රහල් ඔයා ගැන හිතලා ඔයාට දුකක් දී
වෙන්න පුළුවන්ද"

"ඔයා හොඳින් නම් මට දුකක් නැහැ සස්වී... ල
හොඳ කෙනෙක් ළඟ සතුටින් සැපෙන් හොඳින් ඉන
පුළුවන් දුක් නොවී මගේ හිත හදා ගන්න...
ආත්මාර්ථකාමී නැහැ සස්වී... ඒක පරාර්ථකාමීයි"

"ඔව් රහල්... ඔයා කියන්නේ ඇත්ත... ඒකනේ
හැමදාම කියන්නේ මට වඩා හොඳ කෙනෙක් ඔය
කියලා... මම ඒ ගැන සතුටු වෙනවා"

"පිස්සී... ඔයාට වඩා හොඳ කෙනෙක්
කොහෙන්ද... ඔයා තරම් මට ගැලපෙන මට අ
කෙල්ලක් නැහැ වස්තුව.." සස්වින්දි ළං කරගත්
සිප ගත්තාය.

මේ ආදරේට පිටු පාන්න පාර හදපු ඔයාට හෙ
හංස... දෑසේ කඳුළු සඟවා ගනිමින් සස්වින්දි සිතුවා

රජීව බක්මීමල්දෙණිය මිය ගිය පසු සමාගමේ
දරන්නට වූයේ මනෝජ්ටයි. තුහංස වගකීම් ගත්
නිසාවෙන් ඔහුට සමාගම වෙනුවෙන් බොහෝ වෙ
විය.

දිනෙන් දින වගකීම් වැඩි කරමින් යම් යම්
තුහංසට පැවරුවද සමාගමේ ජීවනාලිය බඳු ගිණුම්
තුහංසට පවරන්නට නොසිතුවේ තුහංසගේ වැඩ පි
පැහැදීමක් ඔහුට නොතිබූ නිසාය.

රජීව බක්මීමල්දෙණිය සිටි කාලයේ ගිණුම්
පවරා තිබුණේ මනෝජ්ටයි. මනෝජ් එහි කටයුතු
මොහොතකම රජීව බකමීමල්දෙණිය දැනුවත්
කැමැත්තට යුතුකමට මිසක ඉල්ලීමකට හෝ අණකට

එහි කිසිඳු තීරණයක් තීන්දුවක් රජීව බකමීමල්දෙ
නොගත් අතර ඉද හිට ඔහුට සිතෙන යමක් ඔහු
පවසා එය ක්‍රියාත්මක කළේය.

සස්වින්දි නමින් ගිණුමක් අරඹා ඇයගේ හ
අනාගතය වෙනුවෙන් එහි මුදල් තැම්පත් කරන යෙ

ලෙස ක්‍රියාත්මක කළ යෝජනාවකි. තුහංස සමාගමේ පාලනය ගත් පසුවද මනෝජ් ගිණුම් අංශය ඔහු සතු කර ගත්තේය. ඔහු ජීවට සිදු කළාක් මෙන් එහි තොරතුරු ලබා දීම තුහංසටද සිදු කළේය.

තමාගේ පහසුව වෙනුවෙන් මනෝජ් චිත්‍රා නම් තරුණිය ගිණුම් අංශයට ගෙන ආවේ තුහංසගේ අනු දැණුම මතයි.

"මනෝජ් අංකල් ඕනේ දෙයක් කර ගන්න... තාත්තිගෙන් කිසිම ප්‍රශ්නයක් වුණේ නැහැ වගේම මගෙනුත් කිසිම ප්‍රශ්නයක් නැහැ... අනික මට මේවා ගැන දැණුමකුත් නැහැනේ" ගිණුම් අංශයට අමතර නිළධාරිණියක් ගන්නට මනෝජ් තුහංසගෙන් අවසර ඉල්ලූ දිනයේ තුහංස කීවේය.

මනෝජ් විසින් චිත්‍රාව රැකියාවට ගත්තේ ඒ අයුරින්ය.

"තාත්තිට පුළුවන්ද ඔය හැමදේම කරන්න... අර ආව ඊල්ට කොටසක් දුන්නම් නම් හරිනේ... ඇයි හංස මහත්තයා කැමති නැති වෙයිද"

දිනක් බොහෝ රැවනතුරු ගිණුම් සකසමින් වෙහෙසෙන මනෝජ් දුටු සස්වින්දි කීවාය.

"අනේ නැහැ... හංස මහත්තයාට කිව්වොත් අංකල් ඇයි මගෙන් අහන්නේ ඕනේ දෙයක් කර ගන්න කියයි" එදා මනෝජ් කීවේය.

"ඉතින් එහෙනම් ප්‍රශ්නයක් නැහැනේ"

"අනේ මන්දා... ගෑනුන්ව විශ්වාස කරන්න වෙලාවකට නැහැ"

"කපටි ගෑනුනේ... එයා කෙල්ලක්නේ... ඒ නිසා විශ්වාසේ කියි... අනික ඔය ඔතන වැඩ කරන නාකි පප්පලා විශ්වාසයෙන්ද ඔය වැඩ කරන්නේ"

"ඒ ගැන කවර කතාද... හැමෝම එකයි බලාගෙන ගියාම... හංස මහත්තයා හොයන බලන කෙනෙක් නොවන බව දන්න නිසා හැම එකාම ගහන්න පුළුවන් හැම අතින්ම ගසා කන එක තමයි කරන්නේ... මේ කම්පැනිය වැටෙන්න හේතුව ඒක"

"ඉතින් තාත්ති ඒ ගැන කියන්නේ නැද්ද"

කියන්න යන්න එපා... තාත්ත

ගන්න" එදා සස්වින්දි කීවාය.

සස්වින්දිගේ ඒ කීම නිසාම එදා සිට මනෝජ් චිතු වි
ගෙන ගිණුම් කටයුතු කිහිපයක් ඇය වෙත පැවරුවේය.

රූමත් තරුණියක් වූ චිතුට රැකියාවේ ඉහළ
තිබුණද හැදියාවේ හොඳකමක් තිබුණේ නැත. රාජකාරි
යම් කටයුතු සඳහා තුහංස හමුවට යාමට චිතුට සිදුවිය.

මදාවියෙකු ලෙසින් හංවඩු ගසාගෙන සිටියද හ
විලාසයෙන් එසේ වුවද කඩවසම් දේහධාරී ආඩම්බර
හිමිකරු ලෙසින් කාර්යාලයට පැමිණියේ මහත්මයෙකු

තුහංස දුටු දා පටන් ඔහුගේ කඩවසම් බවට මෙ
දැඩි පෙණුමට ඇය බොහෝ ලොල් වූවාය. ඇය
ඉඟිබිඟි පිළිබඳව තුහංසට හැඟීමක් නොතිබු
සම්බන්ධයෙන් උනන්දුවක් ඔහු තුල නොවූ නිසයි.

පරාජය බාර නොගත් ඇය පවරණ වැඩ වලට
වෙනත් කරුණු සොයමින් ඒවා තුහංසට ඉදිරිප
ඔහුගේ හිත දිනා ගැනීමට නිතරම උත්සහ
ලාභයෙන් කොටසක් වෙනත් ගිණුමකට යන බවත්
රහසිගත බවත් චිතු තුහංසට පැවසුවේ එහෙයිනි.

"චිතු... ඔයා පරණ එකවුන්ට් චෙක් කරන්න
ඉදලම... මට මතක හැටියට අවුරුදු විසිගානක විත
වල කොපි තාත්ති පරිස්සමට තියලා තියනවා"
පැවසුවේ කාර්යාල දිනකදී චිතු ලිපියකට අත්සනක්
සඳහා ඔහු වෙත පැමිණි මොහොතකයි.

"හරි සර්... මම චෙක් කරන්නම්"

තුහංසගේ රාජකාරී මේසය ආසන්නයේ ඔහුට
හිතාමතාම හිටගෙන සිටි චිතු එම රාජකාරිය බො
බාර ගත්තාය.

"හැබැයි මනෝජ් අංකල්ට හොරෙන්" නැඟි සි

ඇය අත අත්සන තැබූ ලිපිය තබමින් පැවසුවේ ඇයගේ වතට නැමී රහස් හඬකින්ය.

"සර් බය වෙන්න එපා... සර් වෙනුවෙන් ඕනිම දෙයක් මම කරනවා" චිතුද එවැනිම රහස් හඬකින් පැවසුවාය.

ඇයගේ සුසුම හා ම තුහංස ඇය දෙස බැලුවේය. දෑස් යාවී ගත වුණේ මොහොතකි.

ඇයගේ අඩවන් දෑස්වල වූ අනුරාගී පෙණුම තුහංසව නොසන්සුන් කළේය. ඔහුට සිහි වූයේ සස්වින්දිවයි. දොරට කවුරුන් හෝ තට්ටු කළෙන් දැහැන බිඳී ගියේය.

"කමින්..." කියූ තුහංස

"කිච්චදේ කරන්න" යි චිතුට පවසා සිය ආසනය වෙත ගියේය.

චිතු හා සමව සස්වින්දි රූමත් වූවත් ඇය චිතු තරමට පැහැපත් වූයේ නැත. එහෙත් චිතුගේ රතක් හෝ රන් පැහැයක් කවලම් නොවූ පැහැයට වඩා සස්වින්දිගේ ලා රත් පැහැය මනබඳිනා සුළුය.

සායම් තවරා පැහැය ඔපවත් කළ රුවට වඩා කේනිතියට හෝ ලැජ්ජාවට රතු වූ ඒ වතේ දිලිසීමක් වන අතර සුන්දරත්වයෙන් අනූනදවේ.

එසේම ඇයගේ දිගු දෑසේ තද නිල් පැහැය කඳුළට තෙත්වී ඇති වූවක් නොව හැබෑවටම වූවක් බව තුහංසට සිහිවූයේ මොහොතකට පෙර තමා නොසන්සුන් කළ චිතුගේ සරාගී දෑස් සිහි වෙද්දීය.

සස්වින්දිගේ කේන්තිකාර වත තමාට බලහත්කාරයෙන් හෝ සිප ගන්නට සිතෙන්නේ ඇයව කෝපකර ඇයව රිදවා ලබන සතුටට වඩා ඇයගේ සුන්දරත්වය නිසාවෙන් වන්නට ඇතැයි තුහංසට සිතිණි.

සස්වින්දිව තවත් වතාවක් ළංකරගෙන ඇයගේ සුව විඳින්නට නොමඳ ආසාවක් තුහංසට දැනිණි.

"මනෝජ් අංකල්... දුවව ගමෙන් පිට කරලා කවදා වෙනකල් තියන්නද බලාපොරොත්තුව" මනෝජ් දුන්

ලපගොණුව දිග හරිමින් තුහංස ඇසුවේය.

"දෝණි කොහොමත් හිටියේ ගමේ නෙවෙයිනේ හංස මහත්තයා" මනෝජ් පැවසුවේ නොරුස්සනා හඬකිනි.

"ඒ වුණාට මේ වෙලා තියන දේවල් එක්ක එයා මගේ ඇස් මානයේ ඉන්නවනම් නේද හොඳ"

"ඒ මොකටද" මනෝජ්ගේ නොරිස්සුම දැඩි විය.

"ඕන්න... ඕන්න... මනෝජ් අංකල්ට තරහා ගියා... මාර අගෙයි වගේනේ අංකල්ට දූ සිඟිත්ත"

"අගෙයි තමයි හංස මහත්තයා... මගේ දෝණි තමා මගේ මුළු ජීවිතේම... ඉතින් මගේ ජීවිතේ මට අගේ නැද්ද"

"බය වෙන්න එපා... මම එයාව කසාද බඳින්න ඉල්ලන්නේ නැහැ"

ඉල්ලුවත් මම දෙන්නෙත් නැහැ... මනෝජ් එය පැවසුවේ වදනින් නොවේ.

"මට එයා ඉන්න තැන දැන ගන්න ඕනේ"

"ඒ මොකටද ඒ..."

"අයියෝ... මම කිව්වේ... මම ඉල්ලන්නේ නැහැ"

"එහෙනම් මොකටද"

"එයා ඉන්නේ මෙහෙ නෙවෙයිනේ... මම දැන ගන්න ඕනේ නේද එයා ඉන්න තැන... කියන්න බැහැනේ එයා විසි හතර වෙන්න කලින් රටෙන්වත් පැන්නොත්" තුහංස නැඟිට පැමිණ මනෝජ්ට ඉතා ළංව කීවේය. මනෝජ්ට ගිණි පත්තු වුණේය.

"හ.. හං.. ස මහත්... තයා"

"ඔයා මට බොරු කිව්වට... මම දන්නවා මනෝජ් අංකල් ඒ එකවුන්ට් එක තියෙන්නේ ඔයා නමට නෙවෙයි ඔයාගේ දූව නමට කියලා" මනෝජ් මොහොතකට ගොළුවිය.

"ඔයා මෙතන මට පේ වෙලා ඉන්න අතරේ දූව පැනලා

ගියොත්... කියන්න බැහැනේ"

"මගේ දෝණි කවදාවත් එහෙම කරන්නේ නැහැ හංස මහත්තයා... අනික මම ඉන්නවනේ... මාව අමාරුවේ දාන්නේ නැහැ කොහොමත් මගේ දරුවා"

"බලමු බලමු... කෝකටත් මේ ගැන හංසිටත් කියලා තියන්න" මනෝජ් දෑස් විසල් කර තුහංස දෙස බැලුවේය.

"ඇයි මනෝජ් අංකල්"

"නැහැ... මේ..."

"ඇයි..."

"ම්... නැහැ... මේ අපේ දෝණිට හංසි කිව්ව නිසා"

"ආ... අපේ තාත්ති ඉතින් එයාට කිව්වේ හංසි කියලනේ... අම්මත් කියන එකේ මමත් ඉතින් කිව්වම මොකද වෙන්නේ"

"රජී මහත්තයා මගේ දෝණිට පණවගේ ආදරෙයි හංස මහත්තයා"

"හ්ම්... ඒ නිසා නේන්නම් එයාගේ පුතා පැත්තක දාලා මේවා මේ විදහට දීලා තියෙන්නේ"

"ඒ දුන්නේ මගේ විශ්වාසෙට හංස මහත්තයා... ඒවා නැති නොකර මම රැකලා දෙන බව රජී මහත්තයා දැනගෙන හිටියා... තාත්තා ඒ තරමට ආදරේ කරපු මගේ දෝණිට කරදරයක් නම් කරන්න එපා හංස මහත්තයා"

"කරදරත් නැහැ විශ්වාසෙත් රැකෙයි හංසිව මෙහාට ගෙනාවොත්... එයාව මෙහාට ගේන්න බැරි නම් කරුණාකරලා එයා ඉන්න තැන මට කියන්න... එහෙම නොවී මම එයා ඉන්න තැන හොයා ගත්තොත්... දන්නවනේ... කරදර වෙයි සමහර විට" තුහංස මනෝජ් දවාලමින් කීවේය. මනෝජ් වෙව්ලන දෑතින් ලිපිගොණුව ගෙන එය තදින්ම අල්ලා ගත්තේය.

සමන් දෙයියනේ... මේකා කෙල්ල හොයාගෙන ගියොත්... තුහංස කිහිප වතාවක්ම උත්සහ කළද ඔහුව කෝප කරවමින් සස්වින්ඳි දුරකථනයට සම්බන්ධ වූයේ නැත.

මම තමුන්ගේ තාත්තිට කිව්වා තමුන්ව ගමට 'ගේන' කියලා... ඒ ඇයි කියලාත් මට මනෝජ් අංකල්ට කියන් බැරිකමක් නැහැ දන්නවද... කාලය දවසයි... තීරණේ තමු අතේ... දුරකථනයට පැමිණි පණිවිඩය වෙත සස්වි මොහොතක් බලා සිටියාය.

ඇය ඇමතුමක් ගත්තේ මනෝජ්ටයි. මනෝජ් බලා සිටි සස්වින්දි තමා අමතන තුරුයි.

"තාත්තී... ඔයා හොඳින් නේද"

"හිත හොඳින් නම් නෙවෙයි රත්තරනේ"

"ඒ ඇයි මගේ තාත්තී" සස්වින්දි ඇසුවේ හද දැවෙ තුහංසගේ පණිවිඩය සිහි වූ ඇයට දැනුනේ බියකි.

සමන් දෙයියනේ... මේ යකා කිව්වවත්ද... නැහැ... නැ පණිවිඩය ආවේ දැන් ටිකකට ඉස්සෙල්ලනේ... කියන්න ත ඇති... කිව්වනම් මගේ තාත්ති මැරෙයි...

"දෝණි... හංස මහත්තයා දැනගෙන ඒ එකවුන්ට් තියෙන්නේ දෝණි නමට කියලා... එයා කියනවා... කියූ මෙ තුහංස තමාට පැවසූ සියල්ල සස්වින්දි සමඟ කීවේය.

"නැන්දලාගේ ගෙදර ගිහින් නවතින්න ඕනේ නැහැ... දෝණි ගෙදර එන්න... ජේන මානයේ ඉන්නවනේ එත මගේ පණ ගියත් මට පුළුවන් වෙයි දෝණි රැකගන්න" ම අසරණව කීවේය.

සස්වින්දි නිහඬව සිටියේ හද දවන ශෝකයටයි. තම දී රැකගත්තද එලක් නැති බව ඇයට කෑගසා කි නොසිතුනා නොවේ.

"දෝණි ඉන්න තැන හොයාගෙන ඔය වස ආවොත්... ඒක හොඳක් නෙවෙයි"

"මම ගෙදර එන්නම් තාත්තී" සස්වින්දි කීවාය.

බොහෝ දේවල් විවිධ අයුරින් සිතා බැලූ සස්වින්දි
ාසානයේ තුහංස ඇමතීමට සිතුවාය.

"කෝල් එකක් එද්දී ගන්න බැරිද... අනතුරු අඟවන්නම
ානද කතා කරන්න" තුහංස කෑගැසුවේය.

"මාව ඕනි වෙන්නේ නැහැ කිව්වා නේද... ඉතින් ඇයි මේ"

"ඕනෙ කමකට කතා කළා නෙවෙයි හලෝ... ජීවත් වෙලා
න්නවද නැද්ද කියලා මට දැන ගන්න හේතුවක් තියනවා"

"බය වෙන්න එපා... පිස්තොලේ ඔළුවට තියා ගත්තත්
ණ්ඩෙ වෙන දිහාවකට යන්නේ... එහෙම ලේසියෙන් හිතේ
ිබත් කාටවත් මරන්න බැරිවෙයි මාව... අනික මම මැරුණත්
ාට ඒවා ලැබෙයි"

"ඒවා ලැබෙනකල් මට බලන් ඉන්න බැහැ කියලා ඔයා
්නවනේ"

"ඒ හිලව්වට මගේ ජීවිතේම ගත්තා මදිද හංස"

"කවදද එන්නේ"

"ඇයි අහන්නේ"

"තියනවා කාර්යක් ඔයාට... බැඳිලා ඉන්නවා ඔයා
ද්ට" සස්වින්දි ඉකිගැසිණි.

"මොකද අඬන්නේ"

"පුංචි කෙල්ලක් වුණු මට මේ වගේ ජීවිතයක් අත්විඳින්න
න්නෙ ඇයි හංස"

"තමුසේ මගේ දේවල් හැමදේම මගේ තාත්තිගෙන් උදුර
්තට" තුහංස කෝපයෙන් කීවේය.

"මම මොනවද දෙයියනේ ඔයාගෙන් උදුර ගත්තේ... එහෙම
වුන්ට් එකක් මගෙ නමින් තියනවා කියලා තාත්ති කිව්වේ
... ඒකේ කෝටි ගානක් තියනවා කියලා කිව්වේ ඔයා"

පුංචි කාලේ මගේ තාත්තිගේ ආදරේ උදුර ගත්තා...
වඩා ආදරේ කළේ තමුසෙට... මට මොනාදේ දුන්නත් ඒ දුන්
තමුසෙගේ වර්ණනා එක්ක... ඒ කාලේ ඉඳලම මට තමුසේ ගැ
තියෙන්නේ තරහක්... වෛරයක්"

"ඒ වෛරය මගෙන් පිරිමහ ගන්න හංස කමක් නැහ
ඒත්... ප්ලීස්... මගේ තාත්තිව රිදවන්න බය කරන්න එපා...
එන්නම් ඉක්මනටම"

"ඕනේ නැහැ... මට වෙන ගෑනු නැතුවටද... හැ
තමුසෙගේ තාත්තා මේවට විඳවයි"

"අනේ එපා හංස" විසන්ධි වූ දුරකථනය පසෙකින්
සස්වින්දි ඉකි බිඳ හැඬුවාය.

ඔයා ඕනි කෙනෙක් හොයා ගන්න හංස මට කමක් නා
මායි මගේ තාත්තිවයි නිදහස් කරන්න... මේ දේවල් මට බර

සස්වින්දි තුහංසව ඇමතුවේ බෝඩිමේ මිදුලේ ත
තැනකට ගොස්ය. ඇමතුමෙන් පසු එතනම රැඳුණු සස
ඉකිය නතරවන තුරු මොහොතක් එතන ගත කළාය.
ඇයව ඇමතුවේ ඒ මොහොතේදීයි.

"නැන්දාට කියලා අපේ ගෙදර එන්න පොඩ්ඩකට"

"ආන්ටී... මම පොතක් ගේන්න රහල් අයියලාගේ
යනවා" එතැන සිටම හඬින් කියූ සස්වින්දි රහල්ගේ
ගියාය.

"එන්න ඇතුළට... ගෙදර කවුරුත් නැහැ" මිදුලට
සස්වින්දි වෙතට ආ රහල් ඇයගේ සුරතින් අල්ලාගෙන

"ඔයාට පිස්සුද රහල්... කවුරුත් ගෙදර නැත්නම්"
අත බලෙන්ම මුදවා ගනිමින් කීවාය.

"විකාර නැතුව එනවා ළමයෝ... මම
නැහැ" රහල් ඇයව බලෙන්ම ඇදගෙන ගියේය.

"එහෙනම් අපි මෙතන නවතිමු" සස්වින්දි ඉස්
වාඩි වූවාය.

පුංචි කාලේ මගේ තාත්තිගේ ආදරේ උදුර ගත්තා... තාත්ති
වඩා ආදරේ කළේ තමුසෙට... මට මොනදේ දුන්නත් ඒ දුන්නේ
තමුසෙගේ වර්ණනා එක්ක... ඒ කාලේ ඉදලම මට තමුසේ ගැන
තියෙන්නේ තරහක්... වෛරයක්"

"ඒ වෛරය මගෙන් පිරිමහ ගන්න හංස කමක් නැහැ...
ඒත්... ප්ලීස්... මගේ තාත්තිව රිදවන්න බය කරන්න එපා... මම
එන්නම් ඉක්මනටම"

"ඕනේ නැහැ... මට වෙන ගෑනු නැතුවටද... හැබැ
තමුසෙගේ තාත්තා මේවට විදවයි"

"අනේ එපා හංස" විසන්ධි වූ දුරකථනය පසෙකින් තැ
සස්වින්දි ඉකි බිඳ හැඬුවාය.

ඔයා ඕනි කෙනෙක් හොයා ගන්න හංස මට කමක් නැහ
මායි මගේ තාත්තිවයි නිදහස් කරන්න... මේ දේවල් මට බරයි.

සස්වින්දි තුහංසව ඇමතුවේ බෝඩිමේ මිදුලේ නිදහ
තැනකට ගොස්ය. ඇමතුමෙන් පසු එතනම රැඳුණු සස්වි
ඉකිය නතරවන තුරු මොහොතක් එතන ගත කළාය. ර
ඇයව ඇමතුවේ ඒ මොහොතේදීයි.

"නැන්දාට කියලා අපේ ගෙදර එන්න පොඩ්ඩකට"

"ආන්ටී... මම පොතක් ගේන්න රහල් අයියලාගේ ගෙ
යනවා" එතැන සිටම හඬින් කියූ සස්වින්දි රහල්ගේ නිව
ගියාය.

"එන්න ඇතුළට... ගෙදර කවුරුත් නැහැ" මිදුලට පැ
සස්වින්දි වෙතට ආ රහල් ඇයගේ සුරතින් අල්ලාගෙන කීවේ

"ඔයාට පිස්සුද රහල්... කවුරුත් ගෙදර නැත්නම්" සස්
අත බලෙන්ම මුදවා ගනිමින් කීවාය.

"විකාර නැතුව එනවා ළමයෝ... මම ගිළ
නැහැ" රහල් ඇයව බලෙන්ම ඇදගෙන ගියේය.

"එහෙනම් අපි මෙතන නවතිමු" සස්වින්දි ඉස්තෝ
වාඩි වූවාය.

"ඇයි මට එන්න කිව්වේ" ඉස්තෝප්පුවේ රහල් අසල වාඩිවෙමින් සස්වින්දි ඇසුවේය. වාඩි ගත් රහල් මොහොතක් ඇය දෙස බලා සිටියේය.

"හංගන්නේ නැතුව මට කියන්න රත්තරන්... ඇයි ඔයා ඇඬුවේ" ඇයගේ හිස අත ගාමින් රහල් ඇසුවේය. සස්වින්දි දෑස් විසල් කොට ඔහු දෙස බැලුවාය.

"ඔයා හිතන්නේ ඔයාගේ දේවල් මට නොදැනෙනවා කියලද... ඔයාගේ පුංචි වෙනසක් හරි මට දැනෙනවා සස්වී... මම කෝල් කරද්දී ඔයා හිටියේ අඬ අඬා... තාම ඔය ඇස්වලින් කඳුළු ගිය බවට සාක්ෂි මට පේනවා"

රහල් ඇයගේ ඇස් පිහාටු අග රැඳී තිබූ කඳුළු බිඳුවක් සෙමින් සුරතට ගෙන පෙන් වූයේය. සස්වින්දිට තවත් වසන් කරන්නට හැකියාවක් තිබුණේ නැත.

"සස්වී... කියන්න මගේ මැණික... ඇයි ඇඬුවේ" රහල් ඇයව ළයේ හොවා ගනිමින් ඇසුවේය. ඇය මහා හඬින් ඔහුගේ ළයට බරවී හැඬුවාය.

මගේ ඇත්ත මම ඔයාට කොහොමද කියන්නේ රහල්... මෙච්චර බරක් ඔළුවේ තියාගෙන මම ඔයාගේ මේ ආදරේ විඳින්නේ කොහොමද... සස්වින්දි හිතින් විලාප තියා ගත්තාය.

"දැන් ඇති කෙල්ලේ... දැන්වත් කියන්නකෝ අඬන්නේ ඇයි කියලා"

"තාත්තිට ටිකක් සනීප මදි රහල්... මට බයයි" වෙලාවේ හැටියට ඇය මුසාවක් කීවාය.

"ඉතින්... යමු තාත්තිව බලන්න... අඬන්න එපා මාත් එන්නම්"

"අනේ... එපා... එපා..." සස්වින්දි කලබලයෙන් කීවාය. රහල් ඇය දෙස බලා සිටියේ කුඩා කරගත් දෑසකිනි.

"නැහැ... මම කිව්වේ... ඔයා දැක්කම තාත්තිගේ හිතට තවත් බරක් එකතුවෙයි"

"බරක් එකතු වෙයිද... බෑනා කර ගන්න කොල්ලට වඩා

මේකා හොඳයි කියලා හිතෙයිද දන්නේ නැහැනේ" සස්වි
කිසිත් නොකීවාය.

"හරි හරි... මම දැම්ම එන්නේ නැහැ ඔයා හෙටද යන්

"ඔව් රහල්... අද රෑවෙලානේ... හෙට තමයි
වෙන්නේ"

"මම උදේ ගිහින් දාන්නම්... ඔයා කැමති නම් මම
එක්ක රත්නපුරේට එන්නම්"

"අනේ එපා රහල්... ඔයා වෙහෙසෙන්න එපා...
තනියෙන් යන්නම්"

"ඔයා වෙනුවෙන් ඒක මට වෙහෙසීමක්
කෙල්ලේ"

"අනවශ්‍ය ප්‍රශ්න දාගෙන කරදර විඳින්න ඕනි නැහැ

"හ්ම්... කැමැත්තක්" කියූ රහල් ඇයව සිප ගන්නට
වතට නැඹුරු වුණේය.

සස්වින්දි හා දුරකථනයෙන් කළ කතාවෙන් පසු තුහං
සමඟ කෝප ගත්තේය. ඇයගේ උද්දච්ච වදන් නිසාවෙන්
වූයේ මදිකමක් යැයි ඔහුට සිතිණි.

ඒකි හිතාගෙන ඇත්තේ ඒකි විතරයි ගෑනි කියලා
කෝපයෙන් මුමුණා ගත්තේය.

වත්සුන් තවරාගෙන නිවසට පැමිණි තරුණිය ගැන
පැහැදීමක් සීතාට තිබුණේ නැත. දුටු මොහොතේම
විලාසයෙන්ම ඇය කවරෙක්ද යන්න සීතා වටහා ගත්තා.

"දූලගේ තාත්තේ" ඇය ගියේ පියසෝම වෙතටයි.

"ඇයි සීතෝ"

"ඔයා කිව්වා හරි"

"මොනවද"

"පුංචි මහත්තයා ඕවට පුරුදු වුණොත් විනාශයක්
විච්චූරණ කාරියක් ඇවිත් ඉන්නවා"

"මම කිව්වේ... සල්ලාලකම ලේසි නැහැ... ගලවන්න අමාරුයි... පුරුද්දට ගියොත් මිදෙන්න බැහැ"

"සමන් දෙයියනේ... මොකද අපි කරන්නේ... මෙච්චර කාලයකට නොවුණ දේවල්"

"දැන් වෙනවනේ... බලන් ඉන්නවා ඇර අපි මොනවා කරන්නද... හාම්පුත්තු වෙච්චි... අවවාදයක් දෙන්න පුළුවන් මිනිහෙක්යැ"

"අප්පෝ... කොහෙන් නවතියිද මන්දා... මහා විනාශයක් වෙයි... චික්... ඔය ගෑනුන්ට ලෙඩත් ඇති"

"ඒත් සීතා... අපි මොනවා කරන්නද"

"මම අර දැරීවිට කියනවා"

"කියලා..."

"බලමුකෝ..."

සීතා පෙරදා සස්වින්දිගෙන් ඉල්ලාගත් දුරකථන අංකයට ඇයට ඇමතුමක් ගත්තාය.

"පුංචි නෝනේ... මම සීතා නැන්දා"

"ඔව් නැන්දේ... ඔයාට කොහොමද"

"වරදක් නැහැ නෝනේ"

"කොහොමද ඔයාගේ පුංචි මහත්තයා"

"ඒකමයි දරුවෝ මම මේ කොල් එකක් ගත්තේ" කියූ සීතා වූ සිදුවීම කීවාය.

"කවුරු කෙනෙක්ද කියලා අහන්න ඕනේ නැහැ නෝනේ... දැක්කම කියන්න පුළුවන්"

"චික්..." සස්වින්දි පිළිකුලෙන් කීවාය.

"අනේ එන්න පුංචි නෝනා... නෝනා ආවොත් හරි"

"මම එයාගේ කවුද නැන්දේ"

"කවුරුවත් නොවෙන්න පුළුවන්... ඒත්... පුංචි මහත්තයාව

බේරා ගන්න පුළුවන් නෝනට විතරයි"

"ඔතනින් අද බේරගත්තට ඔයා ඔය සෙල්ලම නතර නැන්දේ... වෙන කෙනෙක් අරන් වෙන වෙනතැනකට ඉස්සර වගේම ඕවා කරයි"

"නැහැ... නෝනේ නැහැ... පුංචි මහත්තයා මේ ගෙ ඔය දේවල් කළේ නැහැ... පුංචි නෝනාව තමයි එක්ක ඔක පුරුද්දක් කර ගත්තොත් නතර වෙන එකකුත් විනාශවෙයි දෙයියනේ..."

"මටත් බලන්න ඕනි එයාගේ විනාශේ තමයි නැන් කරපු අපරාදෙට"

"එහෙම කියන්න එපා නෝනේ... තමන් ගැන ඒ පුංචි මහත්තයාව වළකගන්න"

"මං ගැන... මං ගැන මොනවා හිතන්නද නැන් කියන්නේ එයාගේ තවත් එක බිල්ලක් විතරයි"

"ඒක නෙවෙයි පුංචි නෝනේ මම කියන්නේ... පුළුවන් වෙයි කියලා හිතනවද පුංචි මහත්තයාගෙන ඉන්න... මම නම් හිතන්නේ නැහැ පුංචි මහත්තයා නිදහසේ ඉන්න දෙයි කියලා"

සීතාගේ කතාවට සස්වින්දිගේ ගතම හිරි වැටී ගිය සිදුවීමක් වූවා වැනි හැඟීමකින් ඇයට පිළිකුලක් දැනි

සමන් දෙවියනේ... නැන්දා කිව්වා වගේ මට බේරෙන්න බැරි වුණොත්... ඒ පව් මටත් ගෙවන්න වෙ

"මම එන්නම් නැන්දේ... මම එනකල් පුළුවන් වළකාගන්න බලන්න"

සස්වින්දි පැවසුවේ ඇය ඒ වන විට රත්නපුර සිටි නිසයි. රහල්ටත් මුසා පවසා සස්වින්දි පැමිණි කුමක් හෝ නොකට යුත්තක් කොට සිය පියා ඇ පත් කරාවි යැයි වූ බිය නිසාමය.

දුක විඳින්නේ තමා පමණක් නිසාවෙන් තුහං කටයුතු කරන්නට සස්වින්දි සිතා ගත්තාය. ඉක්ම සිටින තැනට යන්නට ඇය සිතා ගත්තාය.

තුහංස බංගලාවේ රථය නවතා රථයෙන් බසිද්දී සීතා එතැනට ආවාය.

"කවුරු හරි ආවද සීතා"

"ඔව් පුංචි මහත්තයා... ගැලපෙන කෙනෙක් නම් නෙවෙයි එයා"

"ගැලපීම නොවීම මම බලා ගන්නම්... උඹ වැඩක් බලා ගනින්"

"විහින් විනාශ වෙන්න එපා පුංචි මහත්තයා වැඩකාර ගෑනි වුණත් මට බලා ඉන්න බැරි නිසා කියන්නේ"

තමාට පහර දුන්නද කම් නැතැයි සිතු සීතා කීවාය. ගමන නැවතූ තුහංස ආපසු සීතා වෙතට හැරුනේ කෝපයෙනි.

තරහා හිතෙනවනම් මට ගහන්න පුංචි මහත්තයා මම ගුටි කන්නම්"

"යකෝ... මගේ අම්මටවත් නැති අමාරුවක්නේ උඹට තියෙන්නේ" තුහංස සිනාසුණේය.

"පුංචි මහත්තයා ගැනත් මට හිතට අමාරුයි තමයි... ඒත්... මට ඊට වඩා හිතට අමාරු අර දැරිවි ගැන හිතද්දී"

"මොන දැරිවිද"

"දෙවගනක් වගේ රත්තරන් කෙල්ලක් ඉද්දී පුංචි මහත්තයා මොනවද මේ කරන වැඩ"

"සීතා මේ... උඹ මගේ යකා අවුස්සන්න එන්න එපා... දෙවඟන... රත්තරන්... ඔච්චරටම අමාරු නම් උඹ ඒකිව උඹේ පුතාට ගෙනියපන්" කියමින් තුහංස නිවසට ඇතුළු වූවේය.

"අර දැරිවි මේවා දැක්කොත් ඒ දරුවට මොනවා හිතෙයිද" ඔහු හාම පිටුපසින් පැමිණි සීතා එසේ පවසා ඔහුට පිටුපා කුස්සියට ගියාය.

තමාගේ වෙලුණු තරුණිය සමඟ කාමරයට ඇතුළු වුවද තුහංසගේ හදවතේ දෝංකාර දුන්නේ සීතා අවසානයට පැවසූ වදන් පෙළයි.

අර දැරිවි මේවා දැක්කොත්...

එසේ නම් සස්වින්දි පැමිණේද... තුහංස තරුණිය බැලුවේය.

අනුරාගී දෙනෙතින් අඩවන් බැල්මක් හෙලූ තා සූදානම් වූයේ අනුරාගී ආලිංගනයක් ඇරඹීමටයි. තරුණිය මද වේලාවක් බලා සිටි ඔහුට ඒ හාම සස්වින්දි පැවසූ සිහිවිය.

වෙන ගෑනියක් ළඟට ගිහින් නම් මගේ ළඟට හිතන්න එපා... ඔයත් එක්කම මටත් විඳවන්න වෙයි... බෝවුණාම...

මොහොතකින් ඇයව වැළකූ තුහංස කාමරයෙන් ි ආවේය.

"සීතා..." තුහංස ගැන සොඳිස්සියෙන් සිටි සීතා ඔහුගෙ හඬට ඔහු වෙතට ආවාය.

"මේ සල්ලි අර කෙනාට දීලා යවන්න... තියනවනම් හරි නැත්නම් තේ හරි දීලා යවන්න" සීතාගේ මුවඟට නැ සැනසිලි දායක සිනහවකි.

"පුංචි නෝනා ළඟම එනවා ඇති පුංචි මහත්තයා" පැවසුවද එය නොඇසුණු ලෙසින් තුහංස ජීප් රථයට වූවේය.

සීතාට තුහංස වළකන ලෙසින් කීවද ඔහු කිසිවෙ අවනක වන්නෙකු නොවන නිසාවෙන් සීතාට ඇමතුමක් දී පසුව තමා තුහංස හමුවට යනවාද නැද්ද යන්න තීරණය ක සස්වින්දි සිතුවාය.

තුහංස යම් හෙයකින් ඒ වරද කළේ නම් අද දිනට පළ නොව සඳහටම ඔහු වෙතට නොගොස් සිටින්නට සිතා ග එයට තමාට ඉඩක් නොලැබෙන බව දැන දැනමය.

කළ කරුමයක් තියනවනම් ගෙවන්නම ඕනි... සස සිතුවාය.

සීතා ඇයව ඇමතුවේ ඒ මොහොතේදීය. ඇය වූ සි පැවසුවේ සිනහවකින්ය.

"අනේ... මම නම් හිතුවේ නැහැ කොහෙත්ම පුංචි මහත්තයා මට බැනලා කාමරේට ගිය විදිහට ආපහු එයි කියලා... ගුටි කන්න හරි කමක් නැහැ ' අර දැරිවි මේවා දැක්කොත් මොනවා හිතෙයිද කියලා... කියාගෙන තමයි මම කුස්සියට ගියේ... ගිහින් වාඩි ගන්න හම්බුනේ නැහැ සීතා කියලා කෑගැහුවිවා" සස්වින්දි කිසිවක් කීවේ නැත.

"කාට මෙල්ල නොවුණත් පුංචි නෝනට අපේ පුංචි මහත්තයා මෙල්ලයි නෝනා... මට විශ්වාසයි පුංචි නෝනා නිසාමයි පුංචි මහත්තයා ඔය වැඩේ නැවැත්තුවේ"

"මම තියන්නම් නැන්දා... හංස කෝල් කරනවා" ඇයගේ ඇමතුම විසන්ධි කළ සස්වින්දි තුහංසගේ ඇමතුමට සම්බන්ධ වූවාය.

"හංස මම කැටන්දොල"

"කලවාන හන්දියෙන් බහින්න... මම ටිකක් උඩින් ඉන්නම්" තුහංස ඇමතුම විසන්ධි කළේය.

උඩින් ඉන්න එක හොඳයි... ළඟපාත නිසා තාත්තිට මේවා ආරංචි වෙන්නත් බැරි නැහැ... සස්වින්දි සිතුවාය.

"මනෝජ් අංකල් දන්නවද ඔයා අද එනවා කියලා" රථයට නැඟි සස්වින්දි දෙස මොහොතක් බලා සිට අනතුරුව තුහංස ඇසුවේය.

ඒ ගැහැණියගේ අනුරාගී රංගනයට මොහතක් හසුවී සිටියදී දැනුණු හැඟීමට වඩා තද බල හැඟීමක් මැය ගැන හිතේ කෝපයක් තිබුණද දැනෙන බව ඒ දෑස හා ගැටී සිටි මොහොතට තුහංස වටහා ගත්තේය.

"නැහැ හංස... මම ආවේ ඔයා නිසා... මගේ තාත්තිගේ හිතට ගින්දරක් දෙන්න මට බැරි නිසා" සස්වින්දිගේ හඬ බිඳිණි.

"කැමැත්තෙන් හරි අකමැත්තෙන් හරි ඔයාට මේ දේ කරන්න වෙනවා කෙල්ල..."

"කොහොමත් කැමැත්තක් නැහැ... අකමැත්තෙන් හරි මම මේ දේ කරන්නම් හංස... ඔයා මේ කරන ජරා වැඩ නවත්වන්න"

"ජරා ගෑනු ළඟට නොයා ඕන් විකල්පයක් ...
හංස... මට කමක් නැහැ... මම ඔයා නිසා මේ විඳවි...
ඇති... ඔයා ජරා ගෑනුන්ගෙන් හදා ගන්න ලෙඩ ව...
විඳවන්න බැහැ..."

"මට බලපෑම් කරනවද"

"අපෝ නැහැ... ඒ ගැන මතක් කරලා දුන්නා විත...
කසාද බැන්දත් මට බලපෑම් කරන්න බැහැනේ"

"ඔව්... මේ හංසට බලපෑම් කරන්න කාටවත්
සක්‍රියටවත්... ඒක ඔයත් දැනගෙන ඉන්න එක හොඳයි"

හෝරා කිහිපයක් කුඩා නිවාඩු නිකේතනයක සස්වි...
ගත කළ තුහංස ඇය කෑගල්ල නැන්දාගේ නිවසට ඇ...
සිතුවේය. ඔහු නැන්දාගේ නිවස ආසන්නයේ නො...
ස්ථානයක ජීප් රථය නතර කළේය.

"බුදු සරණයි හංස... පරිස්සමට යන්න" සස්වින්දි
තුහංස හඬින් සිනාසුනේය.

"ඇයි මොකද හිනා වෙන්නේ" සස්වින්දි
අමනාපයෙන්ය.

"කපන්න බැරි අත ඉඹින්න එපා... රඟපෑම අත අරි...

"හිතේ මොන තරහක් තිබුණත් හතුරෙකුට වුණත්
වෙනවා දකින්න මම කැමති නැහැ හංස"

"ඕ...කේ... ඔකේ... හිතේ තරහා තියාගෙන මාත්
කරන්නම්... තැන්ක්ස් හංසී... මට දුන්න සතුටට"
සස්වින්දි සිප ගනිමින් කීවේය.

"මදාවියා යුතුකමුත් දන්නවද"

"දන්න ජාති ඔක්කොම තාම මම තමුසෙට ...
නැහැ හොඳද... හෙට කොහෙද"

"ක්ලාස්... නුවර"

"මාත් එන්නම් හෙට නුවර යන්න... උදේ මෙතෙන්ට එන්න"

"මට ක්ලාස් යන්න ඕනි හංස... ඒ නිසා මම බස් එකේ යන්නම්"

"හංසි මේ... තමුසේ ඉන්න ඕනේ මට ඕනේ විදිහට මිසක් තමුසෙට ඕනේ විදිහට නෙවෙයි... තමුසේ ඉන්නේ කොතනද කියලා විටින් විට මට මතක් කරලා දෙන්න ඉඩ තියන්න එපා... කියනදේ අහනවා"

ඒ හඬින්ම ඒ බැල්ම හඳුනාගත් සස්වින්දි ඒ නෙතු මඟ හැර ජීප් රථයෙන් බැස්සාය.

"මේ පැත්තෙන් එන්න" සස්වින්දි තුහංස වෙත පැමිණියද ඔහු දෙස නොබැලුවාය.

"මම එන්නේ හෙට ඔයාව ඇරලන්න විතරයි... මඟ නවත්ත ගන්නේ නැහැ... බය නැතුව එනවා"

දූවිලි විසුරුවමින් තත්පරයට උපරිම වේගයෙන් රථය ඉදිරියට ගත් තුහංස සස්වින්දි ඇස්පිල්ලම් ගැටෙන ඇසිල්ලේ නොපෙනී ගියේය.

පසුදා තුහංස ඇයව රැගෙන යාමට උදෑසනම ආවේය. ඔහු කියූ සේම මඟ කොතැනක හෝ ඇයව නවතා නොගත්තේය.

"මේකද ක්ලාස් එක" තුහංස ඇසුවේ පන්තිය ඉදිරියේ රථය නවතාය.

"හ්ම්..."

"කම්පියුටර් ක්ලාස් එකක් නේද"

"හ්ම්..."

"ඒවත් පුළුවන්ද" කට කොණට සිනහවක් නංවා ගනිමින් තුහංස ඇසුවේය.

"පුළුවන්... ඇයි බැරි"

"ම්... නැ...හැ... මම හිතුවේ..." සස්වින්දි ඔහු දෙස බැලුවේය.

"අරවා විතරයි පුළුවන් කියලා" සස්වින්දිගෙ
පිරුණාය. ඇයට ඇය ගැනම දැනුනේ ශෝකයකි.

හතරවට තරුණියන් බොහෝය. ඔවුන්
ගෙවන මේ දිවිය කොතරම් සුන්දරද... සැහැ
මෙන්ම තමාද මේ ගෙවන්නේ ජීවිතයේ ලස්සනම

මේ අය අතරින් මේ වගේ ජීවිතයක් ගෙ
විතරක් වෙන්න ඇති... සස්වින්දි සිතද්දී ඇයගේ
කඳුළු පිරුණාය.

"හවසත් මම එනවා" ඇය ඔහු දෙස බ
නොකීවාය.

"ඇහුණා නේද කියපු දේ... හ්ම්..." සස්වින්දි

"ඔය ඇස් දෙකට කඳුළු පිරුණාම මට ඉන්
ඔයා දන්නවා... ඒ නිසා වෙන්න ඇති නේද නිත
පුරවා ගන්නේ... අකමැතියි අකමැතියි කිව්වට මට
වඩා ඕනේකම තියෙන්නේ ඔයාට"

"හවස මෙතෙන්ට එන්න එපා... මම කෝල්
තැන කියන්නම්" කියූ දෙයට කිසිත් නො
පැවසුවේ සවස රහල් පැමිණියොත් යැයි සිතේ වූ

"ඔහොම කීකරුව ඔයා ඉන්නවනම් බේබී...
මොනවා කරන්න බැරිද" කම්මුලට තට්ටුවක් දී
කී තුහංස ජීප් රථය පණ ගන්වා ගත්තේය.

මේ සෙල්ලමේ කෙලවර කොතනද දෙයි
කොහෙන් කෙලවර වෙයිද... නොපෙනීයන
බලමින් සස්වින්දි මුමුණා ගත්තාය.

වැව රවුමේ වළාකුළු බැම්ම මතට වී තුහං
කළේ වසර ගනනාවකින් දකින ඒ රුවේ වූ වෙ
ගනිමිනි.

"අහ්..." පිට හරහා වැදුණු වේගවත් පහර
දරාගනිමින් තුහංස මොහොතක් ඒ සිනාමුසු මු
සිටියේය.

"පිට පලන්න එපා යකෝ"

"පිට පලලා විතරක් මදි යකෝ... තෝව මැරුවත් හිතට මදි" රහල් තුහංසව තදින් වැළඳගත්තේය.

"කොහෙද මචං වෙලාවක් මේ පැත්තට එන්න"

"පල පල ඩෝ යන්න... අපි වගේ පුංචි එවුන් බලන්න වෙලාවක් උඹලට හදාගන්න පුළුවන් වෙයිද... ඉඩම් හිමි වැවිළිකරු සමාගම් හිමි කෝටිපති තුහංස බක්මීමල්දෙණිය"

"කැටයම් එපා යාළුවා... කොහෙද උඹේ පුංචි... මේ ඉන්නේ හයේ හතරේ දඩාර් සයිස් එකට"

"ඉතින් කොහොමද මචං"

"ඉන්නවා රහලා... උඹට කොහොමද... ආන්ටී... අන්කල්..."

"ඔක්කොම හොඳින් මචං"

"එතකොට බෝඩිමේ නැන්දා..."

"නැන්දත් හොඳින්..." රහල්ගේ මුව මතට නැගුනේ සිනහවකි.

"අ.. ආ... කොහොමද ඒක... මූණ මාරුවුණා හදට"

"උඹ නැන්දා ගැන විතරනේ ඇහුව්වේ"

"කාලෙකින් දැක්ක උඹව තරහා කරගෙනත් බැහැනේ... ඒ නිසා කියපන්කෝ උඹ අර දිවා රෑ නොබලා තනි රැක්ක මහා...... මායාවෝ ටික ගැන... විශේෂයෙන් අර හිත ගිය උස්සන්න ප්ලෑන් කරපු නඟා ගැන"

"ඒ නඟාව උස්සන්න ඕනේ නැහැ බං දැන්... ඒ නඟා ගියාට පස්සේ බෝඩිමට ආව වෙන නංගියෙක් ඉන්නවා මගේ ළඟ"

"අඩෝ... මම නොදන්න දේවල්... ආච් ආච්... එහෙනම් උඹත් සත්‍ය ප්‍රේම භෘංගරාජයෙක් වෙලා"

"මුලින් බලෙන්ම මගේ කියලා අල්ල ගත්තා... පස්සේ ඉතින් ඒකි නිකම්ම මගේම වුණා" තුහංසට සැනින් සස්වින්දි සිහිවී සිනහවක් නැඟිණි.

"හැබැයි තාම චුරු චුරුව... අර ප්‍රශ්න... මේ ප්‍රශ්න...

"කෙල්ලෝ කවද්ද රහලා හිත එළියට දාන්නේ
තියෙන්නෙම බෑ... නෑ... පිම්බිලි... ගැස්සිලි... බලෙන්
ගනින්... ඒකේ තමයි ලොකුම ආතල් එක තියෙන්නේ"

"ඒ කියන්නේ මේ දවස්වල උඹත් ආතල් ගන්නවා"

"හ්ම්... හ්ම්... බලෙන්... බලහත්කාරකමෙන්... ලස්
දෙකට කඳුළු පුරවගෙන... මූණ රතු කර ගෙන පුපුර
කරන්න තියන හැමදේම කළත් හිතට මදි... අත
හිතෙන්නෙම නැහැ බං" තුහංස හඬින් සිනාසුණේය.

"කවුද මම දන්න කෙනෙක්ද" රහල් ඇසුවේ අ
මේසයක වාඩි ගනිමිනි.

"මතක ඇති සමහර විට... අර අපේ තාත්තිගේ
මනෝජ් අංකල්ගේ දූව"

"ආ... උඹේ අර වස බෝතලේ... අර උඹට පේන්න
හිටියේ උඹලාගේ තාත්තා ඒකිට උඹට වැඩිය ආදරෙයි කි

"ආ... ඔය මතක තියෙන්නේ"

"ඕ.. හෝ... එහෙනම් වහත් පැණි වෙලා තියෙන්නේ

"උඹට පිස්සුද මචං... වහ කවද්ද පැණි වෙන්නෙ
වහමම තමයි"

"හංසයා... එතකොට..."

"මම ඒකීව ඉස්සුවා මචං... කවුරුත් දන්නේ නැහැ"

"වට්..." රහල් මොහොතක් ගත කළේය.

"ඔව් මචං... ඒ ඊර්ෂ්‍යාව දැන් දෙගුණ තෙගුණ වෙලා
ගැන හිත තිබුණ කේන්තිය දැන් වෛරයක් වෙලා... ඒ
දෙනවා තරම් සතුටක් මට තවත් නැහැ"

"හංසයා... උඹ කළේ හොඳක් නෙවෙයි
කෙල්ලෙක්ගේ ආත්ම ගෞරවය තමයි ඒ කෙලලගේ ජීවි

"ඔව්... මට ඒකිගේ පණ ගන්න බැරි නිසා තමයි මම

ඒකිගේ ජීවිතේ ගත්තේ"

"මහා විනාශයක් වෙයි... ඒකි තවම වසද"

"හ්ම්... දැන් නම් තරමකට... ඒකිගේ තාත්තට කියනවා කිව්ව ගමන් පූස් පැටියා වගේ"

"ඉතින් ඒකිගේ තාත්තා දැන ගත්තොත් නිකා ඉඳියිද"

"ඉන්න වෙනවා මචං... උඹ දන්නවද... අපේ තාත්ති කෝටි ගානක් ඒකිගේ එකවුන්ට් එකට දාලා දීලා තියෙන්නේ මගේ අනාගතේට"

"මොකක්..."

"ඔව් රහලා... බලපන් කොච්චර විශ්වාසයක්ද කියලා... මට... අම්මට... වඩා"

"අංකල් දන්නවා උඹ නාස්තිකාරයා කියලා... අනිත් එක ආන්ටි උඹට බයයි කියලා... අංකල් හරි... ඒකි දැන් සල්ලි දෙන්න බැහැ කියනවද"

නැහැ... සල්ලි ගන්න ඒකිට විසි හතර වෙන්න ඕනේ... ඒකිට දැන් විස්සයිද කොහෙදෝ"

"සල්ලියි විතරද උඹේ අනාගතේ වෙනුවෙන් ඒකි ගාව ඉතිරි කරලා තියෙන්නේ"

"ඇයි උඹ එහෙම ඇහුව්වේ"

"කෙල්ලත් උඹට එහෙමම පන්ගනාතු කරලද... ඒකද උඹ එහෙම කළේ"

"නැහැ මචං ඒ නිසා නෙවෙයි මම එහෙම කළේ... සල්ලි ඉල්ලුවාම ඒකියි මහ එකායි ලොකුකම දැම්මා ඒ නිසයි මම එහෙම කළේ"

"මම හිතුවා ගේන්න තියන එකනේ... පස්සේ මොකද දැන් මොකද කියලා ඉස්සුවා කියලා"

"තාත්තිගේ හිතේ නම් මුල් කාලේ තිබ්ලා... අම්මි කැමති වෙලා නැහැ... ඒ නිසා එහෙම එකක් නැහැ"

"දැනුත් එහෙනම් ආන්ටි බකට් දායි"

"අම්මා බකට් දාන්නේ මම ඒකි ගෙනාවොත්නේ... කවුද බං ඕවා ගේන්නේ"

"උඹට දුක නැද්ද... පව් බං"

"ඒ ඇස්වල කඳුළු පිරුණම තරහට මූණ රතු වුණාම ඒකිගේ තියන ලස්සන මම වෙන කිසිම කෙල්ලෙක්ගෙන් දකින්නේ නැහැ මචං... ඒ මූණ බලන්න මම හරි ආසයි රහලා"

"මට තේරෙන්නේ නැහැ හංසයා... කෙල්ල අත අරින්න එපා මචං... ඒක අපරාධයක්"

"උඹ දන්නවනේ මචං මගේ හැටි... මම හිතුදේ කළා... ඒ ගැන හිතන්නේ නැහැ"

"එහෙම එපා හංසයා... උඹ දන්නවද... මම දැන් මම ගැන ගොඩාක් හිතනවා... ඒ මොකද පපුව පුරවලා තියන ආදරේ හින්දා... ඒ ආදරේ එයාට දෙන්න මම හොඳින් ඉන්න ඕනේ"

"මට තේරෙන්නේ නැහැ රහලා ඕවා... මම දන්න ආදරේකුත් නැහැ"

"එතකොට උඹට ඒ කෙල්ලව ඕනේ නැද්ද... ඒ කෙල්ල තුරුල් කර ගන්නේ ආදරෙන් නෙවෙයිද"

"ඒ කෙල්ල තුරුල් කර ගන්නේ ආදරේ නිසාද වෛරේ නිසාද මම දන්නේ නැහැ... ඒකි මට කැමැත්තෙන් හරි අකමැත්තෙන් හරි ලොකු සතුටක් දෙනවා මචං... ඒකි මට ඕනේ... ඒ සතුට විඳින්නද... වෛරේ පිරිමහන්නද කියලා මම දන්නේ නැහැ... ඒත් ඒ ආදරේ කරන්න නෙවෙයි කියලා නම් දන්නවා"

"මට නම් එයා ඕනේ ආදරේ කරන්න... ආදරේ ලබන්න"

"සමහර කෙල්ලන්ගේ ඔය ආදරේ බොරුවක් මචං... රඟපෑමක්"

"වෙන්න පුළුවන්... ඒත් එයා එහෙම නැහැ... මම ගැන ගොඩාක් හිතනවා... මගේ සතුට තමයි එයාගේ සතුට... මමත්

එහෙමයි..."

"මායි හංසියි ඕකේ අනිත් පැත්ත..."

"හංසිද නම"

"හ්ම්... මම දන්නවා මම වගේම හංසිත් මට වෛර කරනවා ඇති"

"වෛර නොකර ආදරේ කරයිද උඹ වගේ අමනයෙකුට"

"ඒකත් ඇත්ත..." තුහංස හඬින් සිනාසුණේය.

"උඹේ නංගි එනවනම් බලාගෙන යන්න තිබුණා" තුහංස කීවේය.

"සස්විට අද ක්ලාස්" රහල් කීවේය.

"ස...ස්...වි..." තුහංස පුදුමයෙන් මිමිණීය.

"එයා කොහෙද" ඔහු ඇසුවේය.

සමහර විට ඔහුත් රත්නපුරයේ නිසා සස්වින්දිව හඳුනනවා ඇත. තුහංස යම් හෙයකින් සස්වින්දිට කතා කර විස්තර පැවසුවහොත්...

තුහංස පාසැල් කාලයේ සිටම සෙල්ලක්කාරයෙකි. අදද එසේය. සස්වින්දි පෙරදා දඟ විසේකාර කොල්ලන් මට්ටු කළ ඔවුන් සමඟ කතා කරන අයට පවා බැන වදින තැනැත්තියකි.

සස්වින්දිගේ හැටි දන්නා රහල් තුහංස තමාගේ මිතුරෙකු බව පැවසුව හොත් තමා ගැන වරදවා වටහා ගනී යැයි රහල් සිතුවේය. එනිසාවෙන් ඇය ගැන තුහංසට නොකියා සිටින්නට රහල් සිතුවේය.

"බුලත්කොහුපිටියේ" රහල් සස්වින්දිගේ නැන්දාගේ නිවස තිබෙන පාර ගැන පැවසුවේ එනිසාය.

"උඹේ ඔය බෝඩිමේ නංගිලා ටික බලන්න අපි ඒ කාලේ වැව රවුමේ කොච්චර රස්තියාදු වුණාද"

"ඒ කාලේ එයා හිටියේ නැහැ මචං... එයා බෝඩිමට ආවේ පස්සේ... හැබැයි එයත් මහා...මායාවියක් තමයි... ඉඳලා තියෙන්නේ ස්කූල් හොස්ටල් එකේ"

එහෙනම් දැකලා නැතුව ඇති..."

"හොඳයි උඹලා වගේ එවුන් එයාව නොදැක්ක එක"

"හරි හරි... තියා ගනින්කෝ නොපෙන්වා"

තුහංස හා රහල් එක පාසලේය. අංශ දෙකක සිටි මිතුරන් වූයේ රගර් කණ්ඩායමේ සාමාජිකයින් වූ නිසාය.

ආපසු එන ගමනේදී තුහංස සස්වින්දිව අවන්ඃ රැගෙන ගියද එය දිවා ආහාරයට පමණක් විය. පසුව ඔහු කැඳවාගෙන වෛද්‍යවරියක් වෙතට ගියේ ඇයගේ ආ( සඳහාය.

"ඔය පෙති හරියට බොන්න හංසී... මතක තියා( අමතක කරලා කුණු කුණු ගාගෙන ප්‍රශ්න අර ගෙන නම් එපා මගේ ළඟට" තුහංස ඇය අත පෙති කාඩ් පතක් කීවාය. සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"කවදා වෙනකල් මම මේ පව්කාර ජීවිතේ ගෙවන්ඃ හංස" සස්වින්දි දෑසේ කඳුළු විසිරෙද්දී ඇසුවාය.

"මේ ගනුදෙනුව ඉවර වෙනකල්..." තුහංස ඇය බලාගෙන කීවේය.

"හංසී... දන්නවනේ ඔය ඇස් වල කඳුළු දකිද්දී මය දේ... කඳුළු පිහිද ගන්න" ඔහු ඇයගේ උර වටා අත ගතට තෙරපා ගනිමින් රහසින් කීවේය. සස්වින්දි කඳු ගත්තාය.

"රණ්ඩුවක් වෙන්න ඕනේ ආදරේ වෙන්නනම්..." හෙදියක් සිනාසෙමින් ඔවුන් දෙස බ( ඔවුන් විවාහක යුවලක් යැයි සිතාගෙනය.

අඬන්න එපා සස්වී... ඔය ඇස්දෙකේ කඳුළු බල බැහැ කියලා ඔයා දන්නවා... සස්වින්දිට රහල්ගේ හඬ දුන්නේය.

ඒ තමාගේ ආදරයයි... මේ රණ්ඩු ආදරය වෛරය... ආදරය දැනෙන කොට මේ වෛරය වැඩි එක් අයෙකුට තම කඳුළ ආසාව සැනසුම වෙද්දී තවඃ

වේදනාවකි. හෙලන කඳුල සදාකාලික තම ඉරණම වන්නට ඇත. සස්වින්දි සිතුවාය.

ආදරේ දැක දැක එය විදගෙන ආදරේ ළඟ රැඳෙන්න පින නැත්නම් ඒක කොච්චර පවක්ද...

කාලයත් සමඟ චිතුගේ වෙනදාට වඩා වෙනසක් මනෝජ් දුටුවේය. ඇය තමාට රහසින් කුමක් හෝ යමක් කරන බවට ඔහුට ඉව වැටී තිබිණි. ඔහු ඇය ගැන දැඩි අවධානයකින් සිටියේ සමාගමේ පැවැත්ම රැඳී තිබෙන්නේ ඇයගේ රාජකාරිය මත බව දැන සිටි නිසයි. ඇය තුහංසට කුමක් හෝ රහසිගත යමක් පවසන්නට කල් යවන බව මනෝජ්ගේ තියුණු දෑසට වැටහිණි.

බලමුකෝ... මොකද්ද දෙන්න යන ගිනිගෙඩිය කියලා... ඔහු සිතුවේය.

"සර්... මට කියන්න දෙයක් තියනවා" චිතු තුහංසට පැවසුවේ ඔහු අසල ලිපි ගොණුව තබා දොර දෙස බලමිනි.

"වාඩි වෙන්න... මගේ වැඩේ කොහොමද චිතු"

"සොරි සර්... ඒක කරන්න බැරි වුණා" තුහංස ඇය දෙස බැලුවේය.

"කොහෙද මෙතන නිදහසේ වැඩක් කරන්න නැහැනේ... ඒකයි පරක්කු වුණේ"

"ඇයි... කවුද චිතුගේ නිදහසට බාධා කරන්නේ"

"මනෝජ් සර්" තරුණිය පැවසුවේ හිතාමතාමය.

චිතු පෙර රාජකාරී කළ ස්ථාන වලදී සුළු සුළු වංචාවල් කරමින් මුදල් ඉපයූවාය.

මනෝජ්ගේ තීක්ෂණ ඇසට වැලි ගසා ඇයට කිසිවක් කළ නොහැකිවිය. මනෝජ්ගේ අධීක්ෂණයෙන් බැහැරව කටයුතු කිරීම ඇයගේ අරමුණ විය.

එසේම තුහංස සමඟ තමා සමීප සම්බන්ධතා පවත්වනවාට මනෝජ් අකමැති බව චිතු අවබෝධකරගෙන සිටියේ මුල් දිනවලදී මනෝජ් පැවසූ යමක් සිතෙහි තබාගෙනය.

"හංස මහත්තයා තරුණ කෙනෙක්... දඩබ්බර කොල්ලෙක්... ඔයා ගැනූ ළමයෙක් නිසා ඒ ගැන හිතන්න... හැම මොහොතකම හැසිරීම වැදගත්" එදා මනෝජ් කීවේය.

එබැවින් එදා සිටම තමාව රැකියාවට ගත් පුද්ගලයා වුවත් මනෝජ් ඇයට බාධාවක් බව ඇය දැන සිටියාය.

"මනෝජ් අංකල්... එයා මොනවද කරන්නේ"

"සර් ඉතින් දන්නවනේ... එයා මෙතනින් එල ප්‍රයෝජන ගන්න ප්‍රධානම කෙනා බව" තුහංසව කෝප කරමින් චිත්‍රා කීවාය.

"අර එකවුන්ට් එකට කොච්චර නැති වුණත් යවන මුදල නම් කවදාවත් අඩු කරන්නේ නැහැ" තුහංසගේ කෝපය දැඩිම කළ හැකි තැන අල්ලා ගෙන සිටි ඇය කීවාය. තුහංස සුරතින් මේසයට පහරක් ගැසුවේය.

"මුල් කාලයේ ඉඩමක් බේර ගන්න ලක්ෂ ගානක මුදලක් වෙන් කරලා තියනවා... ඒක ගැන විස්තර නම් හොයා ගන්න බැරි වුණා සර්... අහම්බෙන් දැක්ක දෙයක්"

"කොයි කාලෙද"

"අවුරුදු ගානකට කලින් සර්... ඉඩම බේරා දීමට කියලා තමයි ලියලා තිබුණේ"

"කාගෙද..."

"මම හිතන්නේ මනෝජ් සර්ගේ වෙන්න ඇති" චිත්‍රා තුහංසව තවත් කෝප කළේය.

"යන ගමන් එයාට එන්න කියලා යනවා" තුහංස කෑගැසුවේය.

"මෙච්චර දේවල් අරගෙන මදි වෙලාද මේ කම්පැනියේ ඒවත් අර ගන්න හදන්නේ... මම ඉවසනවා වැඩිද මනෝජ් අංකල්" තමා වෙතට පැමිණි මනෝජ්ගෙන් තුහංස ඇසුවේ කෝපයෙනි.

"හංස මහත්තයා... මට මේ මොනවත් තේරෙන්නේ නැහැ... කරුණා කරලා... පැහැදිලිව කියනවද"

"අංකල්ට දැන් ඕනේ මේ කම්පැනි එකද"

"මේ කම්පැනි එක අරන් මම ලක්ෂෙට කොඩි දාන්නද"

"ආය මීට පස්සේ අංකල් චිතුගේ වැඩ බලන්න ඕනේ නැහැ... අනිත් වැඩ විතරක් බැලුවම ඇති"

"ඒ වැඩත් නම් මට ඕනේ නැහැ දැන්"

"අර කිව්ව විදිහේ අදහසක් නැත්නම් අංකල්ට ඔච්චර කේන්ති යන්නේ මොකද... අංකල්... අංකල් අනෙක් වැඩ බලන්න... චිතු ඒ වැඩ ටික කරගෙන යයි"

"නැහැ හංස මහත්තයා අනෙක් වැඩ බලන්නත් නම් මට වුවමානවක් නැහැ... කරන්න කට්ටය ඉන්නවනම් මම අදම මේවා දීලා අයින් වෙන්න ලෑස්තියි... ඇත්තටම මේ මම කරන්න පුළුවන් කමකට කරනවා නෙවෙයි... රජී මහත්තයා නිසා නොකර බැරිකමට කරන්නේ... මට හරි වෙහෙසයි දැන්... දෝණිත් නිතර කියනවා නවතින්න කියලා"

"හ්... ඇත්තද... පිනට ලැබුණු කෝටි ගානක් ළඟ තියෙද්දී වෙහෙසෙන මෝඩයෝ කවුද එක අතකින් බලනකොට"

"අනුන්ගේ සතයක්වත් අපට ඕනේ නැහැ... මම මෙතුවක් කාලෙකට කාගෙන්වත් සතයක්වත් අරගෙනත් නැහැ... අර ගන්නෙත් නැහැ" තුහංස හඬින් සිනාසුණේය.

"මේ හම්බකරන දෙයින් තමයි මමයි මගේ කෙල්ලයි හැමදේම කර ගත්තේ... ඉදිරියටත් එහෙමම තමා"

"අනෙ මේ... වැදි බණ නොකියා ඉන්න අංකල්"

"මම වැදිබණ කියන මිනිහෙක් නෙවෙයි පුතා... රජී මහත්තයා මොකට මාව විශ්වාස කරලා මේ මඟුලක් මගේ දෝණිගේ නමට දැම්මද මන්දා"

"එයාට ඉතින් ඉන්නකල් මට වඩා ලොකු වුණේ ඔයාගේ දූ සිඟිත්තනේ"

"මම මේ වැඩ ටික චිතුට බාර දීලා යන්නම් හංස මහත්තයා... කෙල්ලට විසි හතර වුණාම ඒකත් අරන් දෙන්නම්...

එතකොට අපි නිදහස්"

"ඔන්න ඔන්න... මනෝජ් අංකල් මාව

ගන්නවා වලිගයක් පාගගෙන..." කියූ තුහංස න

සිටි මනෝජ්ව වාඩි කර වූයේය.

"ඔයා දන්නවා ඔයා නැතුව මේවා කිසි

බැහැ කියලා... ඒකද ඔයා මේ ලොකුකම්

තාත්තිටත් ඔයා නැතුව කිසිදෙයක් කර ගන්න

මට කොහොමත් බැහැ"

"හරි... මම කියන විදිහට කරන්නම්... හැබ

ඔහුට දබරඟිල්ල දිගු කළේය.

"මගේ අම්මා තාත්තාවත් මට ඔහොම ඇඟි

නැහැ අංකල්" එය මදිකමක් යැයි සිතූ තුහංස කීෙ

"ඒක තමයි එයාලා කළ ලොකුම වරද...

තමුන්ව විශ්වාස කළා... තමුන්ට පණට

කළා" තුහංස නිහඬ විය.

"සජි මිස් පොඩි එකා හැදෙයි කියලා රජී

හැමදේම හැංගුවා... ඒකයි මේ හැමදේම"

"ඕවා පරණ කතා අංකල්... ඕවා මෙතෙන්ට

කියන්න ගිය දේ කියන්න"

"ඒකට තමා මේ මම පසු බිම සකසා ගත්තෙ

මනුස්සයයි මමයි බොහොම දුක් විඳලා සකසා

මේවා රැක ගන්න ඕනේ කමක් නැති නිසාතෙ

ඉන්න එකියන්ගේ පදේට නටන්නේ"

"මනෝජ් අංකල්..." තුහංස කෑගැසුවේය.

"හරි... ඒවා ඕනේ නැහැ... මුළු සෙක්ෂන් එ

අර කෙල්ලට දෙන එකයි ඇත්තේ... මේවා විනාශ

වගකීමක් නැහැ... ඒක මතක තියා ගන්න"

"මම ඔක්කොම දෙන්න කිව්වේ නැහැ"

"හදවත ගලවලා පැත්තක දාලා ඒ මිනිහව ජීව

කිව්වට මට ඒක කරන්න බැහැ"

"මම කිව්වේ එයාගේ වැඩ වලට ඇඟිලි ගහන්න එපා... එයාගේ වැඩ බලන්න ඕනේ නැහැ කියලා විතරයි"

"හරි... මම කියනදේ කරන්නම්... හැබැයි මට චෝදනා ගේන්න බැහැ" මනෝජ් තදින් කීවේය.

කේන්ති ගියද රාජකාරියේදී බොහෝ වේලාවට තුහංස මනෝජ් ඉදිරියේ නිහඬ වූයේ පියා විශ්වාස කළ මෙන්ම පියා එක්ව කටයුතු කළ පුද්ගලයා ඔහු වූ නිසාය. එසේම මවද නිතර නිතර මනෝජ්ට අවනත වන ලෙස දන්වා සිටින නිසාය.

මනෝජ් නිවසට පැමිණියේ රිදවාගත් සිතිණි. චිතුගේ දැලට හසුවී තුහංස විනාශ වේ යැයි බියක් ඔහුට දැනිණි.

මිනිහෙක් ගෑනියෙකුට අහු වුණාම ගලවා ගන්නවා බොරු... මයෙ කෙල්ලව මේකාගෙන් ගලවා ගන්නවා වගේ මේකාව මේ නැට්ටිච්චිගෙන් ගලවා ගන්න වෙයි... මොන ජඩ කම් කළත් හංස රජී මහත්තයාගේ පුතා... මගේ දරුවා ඒ මනුස්සයාගේ කරගෙන හිටියේ... මටත් හංස මහත්තයාව අත අරින්න බැහැ... එයත් මට මගේ දරුවා වගේ තමයි... මනෝජ් සිතුවේය.

"තාත්තී... ඇයි මේ"

කාර්යාලයේ සිට පැමිණි මොහොතේ සිට ඇඳට වී සිටින මනෝජ්ට තේ කෝප්පය ලබා දෙමින් සස්වින්දි යහනේ පසෙක වාඩි වූවාය.

"කම්පැනියේ ප්‍රශ්නයක් දෝණි... කොහෙද මේ හංස මහත්තයා... කියන දෙයක් තේරෙන්නේ නැහැනේ"

"එයා ඉතින් කවද්ද කවුරුවත් කියන දෙයක් ඇහුව්වේ... ඇයි දැන් මොකද වෙලා තියෙන්නේ"

"අර කෙල්ල කියලා වෙන්න ඇති මම ඒකි ගැන හෝදිස්සියෙන් ඉන්නේ කියලා"

"මොන කෙල්ලද "

"අර චිතු... මම වැඩට ගත්තේ"

"ඉතින්..."

"හංස මහත්තයා කියනවා ඒකිගේ වැඩ බලන්න ඕනේ

නැහැලු... ඒකිට පාඩුවේ වැඩ කර ගන්න දෙන්නලු... මම කිව්වා සෙක්ෂන් එකම දෙන්න කියලා"

"හා කිව්වද"

"නැහැ... මොනවා වුණත් මිනිහා මේ වැඩ වලදී ටිකක් අවනතයි"

"එහෙනම් අර කෙල්ල ගැන බලන්න එපා කිව්වේ"

"ඒ ඉතින් ඒකිගේ මායම් වලට රැවටිලා වෙන්න ඇති... ඒකි දඟලන්නේ හංස මහත්තයාගේ කරේ එල්ලෙන්නනේ" කුමක් හෝ නොදන්නා රිදුමකින් සස්වින්දිගේ ගතම වෙලී ගියාය.

"තාත්තිට තිබ්බේ දමලා ගහලා එන්න"

"ඒකටත් ඉඩ දෙන්නේ නැහැ... මට දුක මායි රජී මහත්තයයි ඕක ඔය තැනට ගේන්න වින්ද දුක් ගැන හිතනකොට" මනෝජ් ශෝකයෙන් කීවේය.

තාත්තිගේ හිත රිද්දන්න හොඳටම රිදිලා... හංස බූරුවා දැන ගන්න ඕනි තාත්ති මේවා කරන්නේ අපට නෙවෙයි එයාට කියලා... කොහෙද ගෑනු දැක්කම ලෝකේ අමතක වෙනවා ඇති... සස්වින්දි තරහෙන් සිතුවාය.

සස්වින්දි සිටියේ තුහංසගේ ළයේ හිස හොවාගෙන කල්පනාවකයි. පෙරදා සිය පියා සමාගම ගැන ශෝකයෙන් පැවසූ දේවල් ඇයට සිහිවිය.

මොහොතකට පෙර තමා මිහිරි ලොවකට කැඳවාගෙන ගිය සුන්දර කෙල්ල දෙස තුහංස බලා සිටියේ ගත පුරාවට වෙලී ගිය පහව නොගිය තෘප්තියත් සමඟිනි. ළයෙන් හිස මුදවා ගත් සස්වින්දි තුහංස දෙස බැලුවාය.

"මොකද අද... අමුතුයි ඔයා" තුහංස කීවේය.

"ඇයි..." ඇය ඇසුවේ ඔහුට රවමිනි.

"කිසිම සපෝට් එකක් නැහැනේ"

"නොකර බැරිකමට ආවට මම මේ කැමැත්තකින් එන ගමනක් නෙවෙයි හංස මේක..."

"ඒ වුණාට රව රවා හරි වෙනදට මට ෆුල් සපෝට් එකක් දෙනවා... අද එහෙම නැහැ වගේ... ඒකයි කිව්වේ" තුහංස ඇයව තවත් වතාවකට සිප ගත්තේය.

"ඇයි තාත්තිට කිව්වේ අර කෙල්ලගේ වැඩ ගැන බලන්න එපා කියලා"

"තාත්තයි දුවයි ගසන ඒවා එතකොට වහන්න බැහැනේ"

"හා... එතකොට තාත්තිට වඩා අර චිත්‍රා කියන කෙල්ල විශ්වාසයි" තුහංස දෑස් වසා ගත්තේය.

"අඟර දඟර දාලා නැලවෙන්න එනකොට නිකන් ඉදියිද තියන විසේට" සස්වින්දි මිමිණුවාය. තුහංස දෑස් විවර කර ඇය දෙස බැලුවාය.

"කාටද... විසේ "

"ඒකිටයි තමුසෙටයි දෙන්නටම... දවසට කීවතාවක් ගෙනියනවද එහෙ මෙහෙ ඒකිව"

"ඒක හොයන්න තමුසේ කවුද"

"රජී අංකල් පව්... එයයි අපේ තාත්තියි ගොඩාක් දුක් විදලා කම්පැනිය ඔය තත්වෙට අරන් තියෙන්නේ"

"ඒකට කෝටිගාන හරි කියන්නද ඔය හදන්නේ"

"අනේ නැහැ... අපට අනුන්ගේ සල්ලි සතයක්වත් එපා"

"එහෙනම් මොනවද කියවන්නේ... ආ..."

"රජී අංකල්ට ඉන්න තැනකවත් සැනසීමක් නැති වෙයි මේවා පේනවනම්"

"මොනවද"

"ගැනියෙකුට රැවටිලා වෙන දේවල්"

තුහංස සස්වින්දි වෙතට හැරුනේය. වරක් දෙතොල සිප ගත්තේය.

"යනවා... අප්පිරියයි මට" ඇය ඔහුව ඉවත් කළේය.

"මම ගැනු ගන්නේ නැහැ... ඔයා මට එපා කිව්ව නිසා... අප්පිරියා හිතන්න එපා... මොකද එයා කෙල්ලක්" ඔහු බලෙන්ම ඇයගේ වත පුරාවට දෙතොල ගෙන යමින් කීවේය. ඔහුව නැවතූ සස්වින්දි ඔහු දෙස බැලුවාය.

"ඔයා මට කිව්වේ ගෑනු ගන්න එපා කියලා... ඉතින් මම හිතුවා කෙල්ලෙක් ගත්තට ප්‍රශ්නයක් නැහැ කියලා... මම වැරදි නැහැනේ" ඔහුට දවා හලුකරන තරමේ රැවුමක් දුන් සස්වින්දි ඔහුව ඉවත් කිරීමට දැඟලුවාය.

"දන්නවද... චිතු කියන්නේ සුපිරි කෙල්ලක්... ඔයා වගේ නෙවෙයි" තුහංස ඇයගේ දෑත් අල්ලා ගනිමින් කීවේය.

"ඉතින්... මට මොකද" ඇය කේන්තියෙන් ඔහුගෙන් දෑත් මුදවා ගැනීමට දඟලමින් කීවේය.

"මොකවත් නැත්නම් මේ කේන්තියෙන් දඟලන්නේ ඇයි ඔයා" ඔහු ඇයගේ දෑත් මුදා හරිමින් කීවේය.

"හංස... මම ඉස්සෙල්ලත් කිව්වේ... මේ මම ඔයා එක්ක සතුටින් එන ගමනක් නෙවෙයි... එන්නේ නොකර බැරිකමට" සස්වින්දි යහනේ වාඩි වෙමින් කීවේ දෑසින් කඳුළු කඩා හැලෙද්දීය.

"ඉගෙන ගන්න පුංචි කෙල්ලක් මම... ගෑනියක් වෙලා කියන කියන වෙලාවට ජරා මිනිහෙක් සනසන්න එන්න වුණාට"

"තමන්ට අදාල නොවන වරප්‍රසාද ගත්තම ඔහොම විඳවන්න වෙනවා"

"මේවා මම ගත්ත ඒවා නෙවෙයි දෙයියනේ... අනේ ඇයි රජී අංකල් මට මේවා දුන්නේ" සස්වින්දි ඉකිගැසුවාය.

"දන්නවද හංසී... මේ ඇස්වලට කඳුළු පිරෙනවට ඔය මූණ කේන්තියෙන් රතු වෙනවට මම හරි ආසයි" තුහංස යහනේ ඇය හාම වාඩි වෙමින් කීවේ ඇය දෙස බලාගෙනයි.

"එතකොට ඔයා තරම් ලස්සන කෙනෙක් මට නැහැ" තුහංස නැවත ඇයව ඔහු වෙතට ඇද ගත්තේය.

"ඒ නිසා ඒ මූණ බලන්න මම ආසයි... ඒ මූණ දකින වාරයක් වාරයක් පාසා මගේ කේන්තිය වෛරය වැඩි වෙනවා ඇති... එතකොට මට කොහොමවත් ඉවසිල්ලක් නැහැ..." ඔහු ඇයගේ වතට එඹුණේ ආවේගයෙනි.

"අසත්පුරුෂයා... මදාවියා..." සස්වින්දි කෙඳිරුවාය.

"මේ තරහව කේන්තිය වැඩි වෙන්න වැඩි වෙන්න මට ඔයාගේ අවශ්‍යතාව දැනෙනවා හංසී..." තුහංසගේ ග්‍රහණය දැඩි විය.

"හං... ස..." සස්වින්දිගේ සිහින් කෙඳිරිය ඔහුට නොඇසුනේය.

නාන කාමරයේ දොර විවර කරගෙන පැමිණ තමාව වේගයෙන් ඔහු වෙතට ඇදගත් තුහංසගේ බිය රැඳි දෙනෙත් දුටු සස්වින්දිට ගෙන ආවේ පුදුමයකි.

"හංස... ඇයි මේ" ඔහුගේ බියට බිය වූ ඇය ඇසුවේ බියෙනි.

"ඔයාට අමාරුද"

"ඇයි එහෙම අහන්නේ"

"ප්‍රශ්නයක් නම් මට කියන්න හංසී... මම තරහාකාරයෙක් බව අමතක කරලා"

"ප්‍රශ්නයක් නැහැ හංස ඇයි"

"ප්‍රශ්නයක් නැත්තේ නැහැනේ හංසි... කියන්න මට... ඇයි කියලා" ඔහුගේ නොඉවසිල්ල සස්වින්දි අන්දමන්ද කළාය.

"කියනවා මට මාව කේන්ති නොකර... මම තමුසෙගේ මිනිහා වගේ නේද දැන්" ඔහු ඇයව අත හැර දමා කෑගැසුවේය.

"හංස... මට තේරෙන්නේ නැහැ ඔයා අහනදේ"

"අර ඇදේ... එතන අදත් ලේ තියනවා"

"ඉතින්..."

"ඉතින් කියන්නේ... සීතට කතා කරන්නද" සස්වි
නැඟුණාය.

"ඒ පාර හිනා වෙනවා... කියනවා හංසී" ඔහු ඇය
සොලවා කීවේය.

"මුළු ලෝකෙටම ලොක්කා මම කියලා හිතාගෙ
මහලොකු චණ්ඩි රජා මොකද මේ ලේ චුට්ටකට බ
ආ... සස්වින්දි ඇසුවේ ඒ සිනහාවෙන්මය.

"පිස්තෝලේ ඔලුවට තියලා කෙල්ලෝ ඇඳට
වචනයක් වරදිනකොට පයින් ගහන්නේ විසි වෙන්
තිහඬව ඇය දෙස බලා සිටියේය.

"ලේ පණිත්ත ගහලා පොලිස් කූඩුවේ නිතර නි
කෙනා ලේ දැකලා නැහැ වගේනේ"

"හංසී... කියවනවා වැඩියි ඔයා" ඔහු ඇයගේ
හැර ඉවතට හැරුණේය.

"ඔය කාටද කතා කරන්නේ" ඔහු දුරකථනය
ගනිද්දී ඇය ඇසුවාය.

"ඩොක්ටර් කෙනෙක් ගාවට යමු... මම එපොයිම
දානවා"

ඔහු ඉදිරියට ආ සස්වින්දි ඔහුගේ දුරකථනය ගෙ
කර දැමුවාය.

"ඔයා මට හැමදාම කියන්නේ මට වෛරකරන
නේද හංස... මම දන්න විදිහට වෛරක්කාරයෙ
වෙලාවෙම ප්‍රාර්ථනා කරන්නේ අනෙකාගේ මරණය"

"ඔව්... ඒත් ඔයාට මැරෙන්න දෙන්න මට බැහැ..
පිරිමහ ගන්න හරි මට ඔයාව ඕනේ හංසි" ඔහු ඇ
හොවා ගනිමින් කීවේය.

"ඒක වෛරයක් කියලද හිතන්නේ"

"ඒක මම දන්නේ නැහැ හංසී... කෙල්ලේ... මම
දෙනවා වැඩිද... ඒකද එහෙම වෙන්නේ" තුහංස ඇ
දැසට එබී ඇසුවේය.

"ඔයාට සතුටක් ලැබෙනවනම් මට ඕනි වදයක් දෙන්න හංස... මට කමක් නැහැ... මගේ හිතට වගේම ගතටත් පුළුවන් ඕනි දෙයක් දරාගන්න... ඒත් මගේ තාත්තිව රිදවන්න එපා... මොනම විදිහකින්වත්"

"එදත් කොච්චර ලේ ගියාද... ඇයි එහෙම වෙන්නේ"

"ඔයා කිව්වා නේද චිතු කෙල්ලක් කියලා... එයාට මෙහෙම වුණේ නැද්ද"

"අදාල නැති මගුල් කියවන එක නවත්වනවා... ඩොක්ටර් කෙනෙක් ළඟට යමු අපි ලෑස්ති වෙන්න" ඇයව සිප අත හැර දැමූ ඔහු කීවේය.

"මට බැහැ" සස්වින්දි හිතුවක්කාර ලෙස කීවාය.

තුහංස ඉහළ සිට පහළටත් පහළ සිට ඉහළටත් ඇය දෙස බැලුවේය.

"ඔයාට කමක් නැත්නම් ඔහොම ගියාට මටත් කමක් නැහැ" ඔහු අඩ සිනහවකින් කීවේය.

සස්වින්දි ලැජ්ජාවට රතු වූවාය. ඇය යහන මත වූ තුවාය ගෙන ගත දවටා ගත්තාය. තුහංස සිනාසුණේය.

"ඔහොමත් බැහැනේ... ඇඳුමම දාගන්න" ඔහු කීවේය.

"කොහෙවත් යන්න ඕනේ නැහැ හංස... අපි ගෙදර යමු" සස්වින්දි තුහංස වෙත ගොස් ඔහුට තුරුලුවී කීවාය.

"ඇයි එහෙම වෙන්නේ" තුහංස ඇයව තුරුල්කර ගනිමින් ඇසුවේය.

"එදා නම් ගලාගෙන ගියේ මගේ නම්බුව හංස... අද මට අසනීප වෙලා" සස්වින්දි කීවාය.

"ලෝකේ නැති දේවල් අරගෙන මගේ එක්ක කියවන්න එන්න එපා හංසී... එක එක ඒවට මට කේන්ති යනවා... ඒ නිසයි මේ හැමදේම"

"ඉතින් අනවශ්‍ය දේවල් මම කියවන්නේ නැහැනේ"

"ඔයාට කම්පැනියක් වැඩක් නැහැ... චිතුගෙන්
නැහැ"

"චිතු ගැන ඇහුව්වේ එයාටත් මෙහෙම වෙ
කියලා හිතුණ නිසා" සස්වින්දි යටි ඇසින් තුහංස
කීවාය.

"අරගෙන ගිහින් බලා ගත්ත දවසට මම කියන්න
මම මේ විදිහට බය නොවී ඉන්නම්" ඔහු ඒ බැල්ම
බැල්මක් හෙලමින් කීවේය. සස්වින්දි වතේ නැගුණ
සිනහවකි.

"කම්පැනිය ගැන හිතලා තාත්ති අප්සට් වෙලා
එයා දුක් විඳිනවා බලන්න මට බැහැ... එයාව
අස්කරලා දාන්න.. එතකොට හරි"

"මනෝජ් අංකල් නැතුව එතන මොනවත් මට
බැහැ හංසි"

"එහෙම කියන්න එපා හංස... අපේ තාත්ති හැමද
ඉන්නේ නැහැනේ... බිබී රස්තියාදුවේ යන කාලේ ඔ
යොදවලා තනියම හැමදේම කරන්න ඉගෙන ගන්න"
තුහංසගේ නිරුවත් ළයේ ඉරි අඳිමින් කීවාය.

"කෙල්ල මේ..." තුහංස ලෙල වූ දබරඟිල්ලට
නවතා සිනාසුණු සස්වින්දිගේ සිනහවට තුහංසද
ඔහුටද අතීතය සිහි වූ නිසයි.

"ඒ කාලේ... නම දන්නේ නැහැනේ මම" ඔහු
දෑසට එබෙමින් කීවේ ඒ සිනහාවෙන්මය.

"දැන් දන්නවනේ... තවත්... කෙල්ල
කියන්නේ..." සස්වින්දි යටි ඇසින් ඔහු දෙස බැලුවේ
සමඟයි.

"එහෙනම් අපි යමුද කෙල්ලේ..." තුහංස ඇයගෙ
සුරත දමා ගත්තේය.

"හ්ම..." සිනාසුණු සස්වින්දි තවත් වතාවකට ඒ
තබා ගත්තාය.

ාව දුරටත් අපි එකිනෙකාට වෛර කරන රක්කාරයෝද... තුහංසගේ දෙතොලේ උණුසුම හිසකෙස් ත් දැනෙද්දී සස්වින්දි තවදුරටත් සිතුවාය.

සුදා කර්යාලයට ගිය සැනින්ම තුහංස මනෝජ් වෙතට ් තමාට කැමති අයුරින් කටයුතු කරන ලෙසට කීවේය. ායන් සිදු කරද්දී මනෝජ්ගේ වෙනසක් නොදුටු චිතූ තුහංස නොසැලකූ බව සිතා සිත් රිදවා ගත්තාය.

නෝජ් සමඟ වූ කේන්තිය දෙගුණ තෙගුණ වෙද්දී චිතූ ස් හෝ තුහංසව පොළඹවා ගන්නෙමියි... දැඩි ධානයකින් පසු වූවාය.

ස්වින්දි රහල් හමුවීමට ගියේ සතියකට වඩා කාලයකින් හමුවීමට නොහැකි වූ නිසා ඔහුගෙන් බේරීමට බැරිම වූ යි.

ජවාසල උද්‍යානයේ සුපුරුදු සිමෙන්ති බංකුවේ ඇය ඔහු ා වාඩි වූවාය.

"මොකද මේ... මම අහන්මයි හිටියේ... දැක්ක වෙලේ ම මූණ බෙරි කරගෙන" සස්වින්දි අසද්දී රහල් අහක බලා ත්ය.

"රහල්... අනේ ඇයි කියන්නකෝ" රහල් ඇය දෙස බැලුවේය.

"එන්න එන්න කියලා බල කරලා... මෙච්චර දුරක් ගෙන්න ත් තරහෙන් අහක බලාගෙන ඉන්නද" සස්වින්දි රහල් ට නැමී ඔහුගේ වතට එබුනාය.

"ඇත්තමයි ඔයාට නම් කිසි ගානක් නැහැ සස්වී" ඇය දෙස හොතක් බලා සිටි රහල් කීවේය.

"ඇයි රහල් එහෙම කියන්නේ"

"බලන්න ඔයා බෝඩිමේ ඉන්නේ දවස් දෙකයි... ඒ දවස් කත් කොහොම හරි මාව මඟ අරිනවා... මගේ ගැන පොඩි ියක් වත් ඔය හිත ඇතුළේ නැද්ද"

"රහල්..." සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

හිත ඇතුළේ ඔයාට තියන ආදරේ කොච්චරද කියල කියන්න මම දන්නේ නැහැ රහල්... ඒත්... ඔයා වෙනුවෙන් කිය ගන්න බැරිතරමක ලෙංගතුකමක් මගේ හිතේ තියනවා කියල මම දන්නවා... සස්වින්දි සිතින් මුමුණා ගත්තාය.

"නාඬා ඉන්න... සතියක් කියන්නේ කල්පයක් වගේ"

"ඇයි රහල්... මම ඔයාට හැමදාම කතා කළානේ" සස්වින කඳුළු පිසදා ගනිමින් කීවාය.

"ඒ වුණාට... ළඟ නැතිකම ලොකු අඩුවක් සස්වී"

"ආදරේ කරන්න ළංවෙන්නම ඕනේ නැහැ රහල්... ආදර දැනෙන්නේ හදවතට නම් අපට පුළුවන් වෙන්න ඕනි ඈති ඉඳලා ආදරේ කරන්න"

"ආදරේ දැනෙන්නේ හදවතට තමයි සස්වී... ඒත්... ආදර නිසා ඇතිවෙන හැඟීම දැනෙන්නේ හිතට නෙවෙයි"

"ඒක අවශ්‍යතාවය රහල්... ආදරය නෙවෙයි"

"අවශ්‍යතාවය ඇති වෙන්නෙත් ආදරේ නිසා තමයි සස්වී"

'හංසට මාව ඕනි කේන්තිය පිරිමහ ගන්න... එයාට මං අවශ්‍යතාවය දැනෙන්නේ වෛරයට මිසක් ආදරේට නෙවෙයි.

"මම පිළිගන්නේ නැහැ රහල්... අවශ්‍යතාව ඇති වෙන් ආදරේ නිසාම නෙවෙයි" සස්වින්දි සිය අත්දැකීම නිසාවෙ රහල්ට එසේ කීවාය.

"අද අපි ඕකට මෙතන තර්ක නොකර ඉමු නෙ කාලෙකින් හම්බ වුණ දවසෙත් මොකක් හරි අල්ලගෙන රිදව ගන්නේ ඇයි අපි... තාත්තිට දැන් කොහොමද"

"දැන් හොඳයි රහල්"

"අනේ මන්දා සස්වී... ඔයා මේ විභාගේ නොකරන එ ඔයා මෙහෙ ඉන්න එක නැති වෙනවා... මට බයයි අපිට අ වෙන්න වෙයි කියලා"

"කාලයට ඉඩ දීලා බලාගෙන ඉමු රහල්... අපි මොනවා කියන්නද" ඈත අහස දෙස බලාගෙන සස්වින්දි කී

රහල්ගේ මුහුණ බලන්නට වූ අපහසුවටයි.

මනෝජ් එහෙ මෙහෙ වන වේලාවක් බලා චිත්‍රා තුහංසගේ කාර්යාල කාමරයට ගියාය. ඇය ගියේ ඔප්පුවක්ද අතැතිවයි.

"මේ මොකද්ද මේ"

"සර්ට මම කිව්වේ... අර ඉඩමක් බේර ගන්න සල්ලි වගයක් අයින් කරලා තියනවා කියලා"

"ඔව්... ඉතින්"

"මේ ඒ බේර ගත්ත ඔප්පුව" ඇය තුහංසට ඉතා ළංවී ඒ ඔප්පුව ඔහුට දුන්නාය.

දැඩි විලවුන් සුවඳ දැනෙද්දී ඇය දෙස මොහොතක් බලා සිටි තුහංසට සිහි වූයේ සස්වින්දිවයි.

පෙරදා චිත්‍රා නිසාවෙන් ඇය කෝප ගත් විලාසය... ඇයගේ දඟකාර හැසිරීම... ඒ කිසිත් නොතකා තමා ඇයව නතු කර ගන්නා ආකාරය... කෝපයෙන් බැන බැන වුවත් තමාට ඇය අත්වැල් සපයනා ආකාරය... ඔහු සිනහාවකින්ම සිහි කර ගත්තේය.

"ඇයි සර්" ඔහුට ගෑවෙන නොගෑවෙන තරමට ළංවුණු චිත්‍රා ඇසුවාය.

"ඇයි" තුහංස ඔප්පුව දිග හරිමින් ඇසුවේය.

"හිනා වුණ නිසා... මට හිතුනා සර් මටද හිනා වුණේ කියලා"

"හිනා යන්න තමුසෙගේ මොනවද තියෙන්නේ"

"අනිත් අයට තියන ඒවා ඉතින් මටත් තියනවා... ඉල්លුවොත් සර් වගේ කෙනෙකුට මම නොදී ඉන්නේ නැහැ"

චිත්‍රා ඉඟියක් දුන්නේ ඒ ආකාරයෙන් හෝ ඔහුව පොළඹවා ගන්නට සිතාගෙනයි. තුහංසගේ සද්දන්ත දේහයට කඩවසම් බවට ඇය පිස්සු වැටී සිටියාය. තුහංස ඇය දෙස බැලුවේය.

චිත්‍රාගේ අනුරාගී බැල්ම අතරින් ඔහුට පෙනුනේ සස්වින්දිගේ කඳුළු පිරුණු දෑසයි.

"කැමැත්තෙන් දෙන කොට ගන්න මට හිතෙන්නේ නැහ... චිතු... ඒ මේ හංසගේ හැටි... මගේ කෙල්ල බලෙන් අල්... ගත්තම ඒකි මට දෙන සතුට වෙන කාටවත් දෙන්න බැ... වෙයි... හරි... බලමු මේ ඔප්පුව" තුහංස නැවත ඔප්පුව දි... හැරියේය.

මගේ කෙල්ල... ඒ කියන්නේ සර්ට කෙල්ලක් ඉන්නවා...

බලෙන් අල්ල ගත්තම ඒකි මට දෙන සතුට... ඒ කියන්... ඒ කෙල්ල සර් ළඟට එන්නේ කැමැත්තෙන් නෙවෙයි...

කවුද ඒ කෙල්ල... එන්නේ අකමැත්තෙන්නම් මට සර්ව ළ... කර ගන්න බැරි වෙන එකක් නැහැ... එක වතාවකට හරි ම... සර්ව ඕනේ... චිතු සිතුවාය.

"අපූර්වා පළිඟුආරච්චි... උගස්කරු... එය උගස් තබා ග... මුදල පොලිය සමඟ ගෙවා නිදහස් කර ගැනීමට එම මුදල වැ... කර තිබිණි.

ආ... අම්මා වෙනුවෙන් කුට්ටිය අයින් කරලා තියෙන්නේ... කාලේ මයි... අම්මලාට දුවලට හොඳ හොද්ද... අපේ තාත්ති... පිස්සුද මන්දා... තුහංස කෝපයෙන් සිතුවේය.

"අපූර්වා පළිඟුආරච්චි කියන්නේ මනෝජ් සර්ගේ කවු... හරිද" චිතු ඇසුවාය.

"හ්ම්... වයිෆ්" තුහංස කෝපය සඟවා ගනිමින් කීවේය.

"ඒ අය කපටි මිනිස්සු සර්... පරිස්සමට... කම්පැනියෙ... වෙන්න ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගන්නේ" අ... තොදොලෙන් පැවසුවාය.

"බලමු" තුහංස සිනාසෙමින් පැවසුවේ හදවත කේන්තියෙ... පිරෙද්දී එය නොපෙන්වායි.

"මම ගිහින් එන්නම් සර්" චිතු පැවසුවේ තුහංස වෙතට... බැල්මක් හෙළායි.

හංසී... උඹලා අපෙන් අර ගත්ත දේවල් හොඳටම වැ... කෙල්ලේ... සස්වින්දි සිහිකරගත් තුහංස මිමිණුවේය.

ඇයගේ රතු වත... කඳුළු දෑස්... ඒ වත සිපගෙන ලබන මිහිර...

"චිතු... තුහංස චිතු නැවතුවේය.

"තරහද මා එක්ක... ඕනේ නැහැ කිව්වට..." ඇයගේ දෑසට එබෙමින් ඔහු ඇසුවේය.

"ම්... නැහැ සර්... මට පුළුවන්ද සර් එක්ක එහෙම තරහා වෙන්න... මම සර්ට කොච්චර ආදරේද කියලා සර්ට හිතා ගන්නවත් බැරි වෙයි" චිතු තුහංසගේ ළය සිප ගනිමින් කීවාය.

ඇය ඉවත් වෙද්දීම තුහංස ඇයව ඔහු වෙතට ඇදගත්තේය. ඒ කාය ශක්තියට ඇය ඇදී ආවේ බොහෝ සැල්ලුවටයි. ඇය කෙඳිරිල්ලක් නැගුවේ ඒ සිපුම දරා ගන්නට ඇයට වූ අපහසුවටයි. තුහංස ඇයගේ දෙතොල මුදවා දමද්දී විසිවී ගිය ඇයව අල්ලා ගන්නට සිදු වූයේත් තුහංසටමයි.

"මොකද මේ... කෑවේ නැද්ද" ඇය සිනාසුනා පමණි.

ඒ සිපුම දරා ගැනීමට තරම් තමාට කාය ශක්තියක් නොමැති වූ වග ඇය ඔහුට නොකීවාය.

එහෙත්... ඔහුගේ ආවේගය දරා ගන්නට වූ ආශාව දෙගුණ තෙගුණ වෙද්දී අඩි තාලම සැකසුණු බව සිතා තුටු සිතින් ඇය කාමරයෙන් පිටතට ආවාය.

"මේ ඉඩම දැන් කාගෙද කියලත් හොයලා බලන්න චිතු" එන විට තුහංස පැවසූ දෙය පසුදාම සොයා බැලීමට ඇය සිතා ගත්තාය.

මනෝජ් කාර්යාලයෙන් පිටතට ගොස් සිටියෙන් ඔහු නැවත කාර්යාලයට නොපැමිණේ යැයි සිතූ තුහංස ඔහු හමුවීමට ඔහුගේ නිවසට ගියේ මනෝජ් සවස නිවසට එන වේලාව අලලාය.

නාගෙන පැමිණි සස්වින්දි සාලය හරහා තම කාමරයට යද්දී දුටු රුවින් එතැනම නැවතිණි.

තමා දෙස ඇසපිය නොහෙලා බලා සිටින ඔහු දෙස ඇයද මොහොතක් බලා සිටියාය. අද සිටින්නේ සැමදා දකින ඒ මදාවියා නොවේ. වතාවක් දුටු ඒ කඩවසම් වැදගත් වූ තුහංස

බක්මීමල්දෙණිය නම් වූ සමාගමක හිමිකරුවායි.

"හංස... ඇයි මෙහෙ"

"මම මනෝජ් අංකල් හම්බ වෙන්න ආවේ... තාම ආවේ නැද්ද"

"නැහැ... වැඩකට කොහදෝ යනවා කිව්වා" සස්වින්දි පැවසුවේ තමා දෙසම බලා සිටින තුහංසටයි.

ඔහුගේ වතේ නැඟීගෙන එන සිනහව ඇයි දැයි යන්න වැටහුනේ තමා සිටින්නේ දිය රෙද්දෙන් බව සිහි වෙද්දීය. ඇය වහා ළය මතට දෑත් පොරාව ගත්තාය. සමච්චල් සිනහවක් නැගූ තුහංස ඉවත බලා ගත්තේය.

"ඉන්න... මම එන්නම්" කියූ සස්වින්දි සිය කාමරයට දිව යද්දී තුහංස ෂයිට ඇමතුමක් ගත්තේය.

"කවුරු හරි එනව නම් මට කියපන්" තුහංස සස්වින්දිගේ කාමරයට ගියේය.

තුහංස දුටු සස්වින්දි තිගැස්සිණි. ඇය වුණා දැමූ චීත්තය යළි සුරතට ගත්තාය.

"පුදුම දසුන්නේ මෙයා දෙන්නේ" ඇයව ළං කර ගත් තුහංස ඇය අත වූ රෙද්ද ඉවතට දැමුවේය.

"හංස... මේ අපේ ගෙදර"

"ඉතින්... මට කොහෙත් එකයි... තැනක් අවශ්‍ය නැහැ මට" තුහංස ඇයව තුරුලු කර ගත්තේය.

නොසැලී තම සිපුම දරා ගන්නා සස්වින්දි තුහංසට චිතුව සිහි කළේය. චිතු කෙඳිරියක් නැගුවේ එය දරා ගැනීමට වූ අපහසුවට බව ඔහුට එදා වැටහුනේ ඇය හති අරිද්දීය. ඔහු සිපුම නවතා මොහොතක් සස්වින්දි දෙස බලා සිටියේය.

"ඇයි මොකද"

"හිතන දේවල් දැන් කරන්න බැහැ... තාත්තිට කියලා බාත් රූම් එකක් මේ කාමරේට කරලා හදා ගන්නවා... නැත්නම් බාත් රූම් එකෙන් එළියට එනකොට ඇඳුම් ඇදගෙන එනවා"

"ඒ මොකටද"

"දැක්කම දකින එකෙකුට ඉන්න බැහැ"

"තමුසේ වගේ හැමෝම කුපාඩියෝ කියලා හිතුවද"

"රහත් වුණ අය ඉන්දියාවෙත් දැන් නැතුව ඇති... එහෙ එවුනුත් ලියතඹරාමලට ඩොග් ගාලා වැටෙනවා කියන්නේ" සස්වින්දිට හඩින් සිනහවක් පිට වූවාය.

"මොකද හිනා වෙන්නේ"

"ආ.... හංස... ඔයා දවසට කීවතාවක් එහෙම ඩොග් ගාලා වැටෙනවද"

"චිතු ඇඳුම් ටික ගලවගෙන ලියතඹරා මල වගේ වුණාම මේසේ උඩට වැටෙනවා... දැන් මේ ලියතඹරා මල අරගෙන ඇඳ උඩට වැටෙනවා" ඇයව දෝතට ගත් හංස ඇයව ඇඳට දමා ඇය මතට වැටුණේය.

"යනවා යන්න... මේස තියෙද්දී ඇඳන් ඕනේ නැහැ" සස්වින්දි ඔහු හා පොර බැඳුවාය.

"දගලන්නේ නැතුව ඉන්නවා... මම කිස් කරලා යන්න හදන්නේ... දගලලා කේන්ති කර ගත්තොත් දන්නවනේ... එක පාරින් නවතින එකක් නැහැ... මනෝජ් අංකල් ආවත් වැඩේ නවත්වන්නේ නැහැ" සස්වින්දි පොරය නැවතුවාය.

"මදාවියා... එහෙමට බැරි නැහැ"

"හ්ම්... අසත්පුරුෂයා කියන්න අමතක වුණාද" තුහංස ඒ වතේ දෙතොල් තැබුවේය.

"හංස..." දිගු සිපුමක කෙලවරදී සස්වින්දි ඔහු ඇමතීය.

"හ්ම්..."

"ඇයි තාත්ති හම්බ වෙන්න ආවේ"

"ඒක මම තාත්ති එක්ක බලා ගන්නම්... ඇඳුමක් දාගන්න දැන්... නැත්නම් මට යන්න හිතෙන්නේ නැහැ"

"ඉතින් යන්න... මෙතන ලැගගෙන ඉන්නේ... මං
බලාගෙන"

"කැවා මදි... හෙට අනිද්දට ගෙන්න ගන්නම්කෝ
යහතින් නැගී සිටියේය.

"ඔහොම ඉන්න" ඔහු වැළකූ සස්වින්දි ඔහුගේ කෝ
ටයි පටිය සකසා ඔහුව සිප ගත්තාය.

"ලස්සනයි... හැන්ඩ්සම්... කාඩ ගතිය චුට්ටක්වත
ඔහොම ඉන්නකෝ"

"අනෙ මේ... පාඩුවේ ඉන්නවා... උපදෙස් නැතුව.
අංකල් ආවම මට කොල් එකක් දෙනවද"

"මට බැහැ" කියූ සස්වින්දි ඉවත බලා ගත්තාය.

සස්වින්දි ඇද ඇයගේ ළය රිදෙන්න සපා කෑ
වූයේ සස්වින්දි කෑගසා බැන වදිද්දී සිනාසෙමින්ය.

"මදාවියා... අසත්පුරුෂයා..."

"උඹට හොඳක් වෙන්නේ නැහැ" තුහංස එය
කරමින් යළිත් ඇයව ඇද සිප දිව ගියේ ඇයව තව
වට්ටවමින්ය.

හදිසි ඇඳුමක් ඇඟලාගත් ඇය තුහංසගේ රථය
මානයට පැමිණියාය. වාහනය අසල සිටින ෂයි හා ඈ
සස්වින්දි දැනුනේ දරාගත නොහැකි කෝපයකි.

"හංස... තමුසේ ආය නාවට කමක් නැහැ
නිසාවෙන් ඔවුන් වෙත යා නොහැකි වෙද්දී සස්වින්දි
ළඟ සිට කෑගැසුවාය.

තුහංස ඇය දෙස බැලුවේ පුදුමයෙනි. ආවේගයට
තිස් දෙකම ඇය විද දරා ගන්නේ අපහසුවකින් බ
තුහංස දනී. තමා ඇයගේ ළය සපා කෑවාට ඇ
නොගන්නා බව ඔහු දැන සිටියේය. ඔහුට පුදුමයක්
නිසාය.

"මට මේ තරම් අපරාධයක් කරන්න ගිය මිනිස්සු
අරින්න බැරි නම් ඔයා මාව අත අරින්න හංස... මැරුණ

ආය ඔයා ළඟට එන්නේ නැහැ" ඇය කෑගැසුවාය.

"මරන්න ඕනේ නැහැ මට... මනෝජ් අංකල්ට ඇත්ත කිව්වනම් හරි" තුහංස පැවසුවේ ඇයව මෙල්ල කිරීමටයි.

"කියනවා... ඉතින් කියනවා... ඊට කලින් මම මැරෙනවා" ඒ කීමට තුහංස කෝප වූවේය.

"ඉතින් මැරෙනවා... මට මොකද... ආ... බය වෙයි කියලා හිතුවද මම... අඩයි... වැළපෙයි... පිස්සුද තමුසෙට" තුහංස රථයට නැඟුණේ සිනාසෙමින් එසේ පවසාය.

සස්වින්දි එලෙසින්ම පඩිය මතට වැටුණාය. ඇය මහා හඬින් ඉකිබින්දාය. එය නෑසෙන තරමට තුහංස ඒ වන විට බොහෝ දුරක් ගොස් තිබිණි.

අපේ කේන්ති දැන් අඩු වෙලා... අපි අපට දැන් වෛර කරන්නේ නැහැ කියලා මට හිතුණා හංස... ඒත් මම වැරදියි... අසත්පුරුෂයා අසත්පුරුෂයාම තමයි...

කැලේ මාරු වුණාට කොටියාගේ පුල්ලි මාරු වෙන්නේ නැහැ කියලා මට අමතක වුණා... අපරාධකාරයා... තමුසේ මහ නරුමයෙක්... සස්වින්දි මුමුණා ගත්තාය.

සස්වින්දි ඇමතුමක් ලබා නොදුන්නද තුහංස මනෝජ්ට ගත් ඇමතුමක් නිසාවෙන් තුහංස සස්වින්දිගේ නිවසට රාත්‍රියේ ආවේය.

ඔහුගේ වාහනය දුටු සැනින් මනොජ් පැවසීමටත් මත්තෙන් සස්වින්දි සිය කාමරයට ගොස් දොර වසා ගත්තාය.

"මනෝජ් අංකල්... මට සල්ලි ටිකක් ඕනේ" දුටු මොහොතේම තුහංස කීවේය.

"සල්ලි.." මනෝජ් පුදුමයෙන් ඇසුවේය.

"ඔව්... ඔයාමනේ කිව්වේ මේ මාසේ සැලරීස් ගෙවන්න අතින් සල්ලි දාන්න වෙයි කියලා"

"ඉතින් ඒකට මගෙන් සල්ලි ඉල්ලන්නේ ඇයි"

"මට ඔයාගෙන් සල්ලි ඕනේ නැහැ... මේ ඔප්පුවට මගේ තාත්ති දුන්න සල්ලි මට දෙන්න"

"මොන ඔප්පුවටද"

තුහංස ඔප්පුව මනෝජ් අතට දුන්නේය. මෙයද චිතුගේ වැඩක් බව මනෝජ්ට පවසන්නට වුවමනා වූයේ නැත.

"මේක දැන් අයිති හංසිට වෙන්න ඇතිනේ" තුහංස අඩමානයට කීවේය.

"ඔව්... අපූ මැරෙන්න ඉස්සෙල්ලා මේක දෝණිට ලිව්වා"

"හෑ... වටෙන් ගිහිනුත් අල්ලලා තියෙන්නේ ඒ නහයමයි"

"හංස මහත්තයා... මේ ඔයාලාගේ දේපොලක්වත් ගෙයක්වත් නෙවෙයි... මම හම්බකරපු එකකුත් නෙවෙයි... මේ අපූගේ මහ ගෙදර"

"ඒක වෙන්නපුළුවන් අංකල්... ඒත්... අපූර්වා ආන්ටී මේක හංසිට ලිව්වේ අපේ තාත්ති මේක බේරලා දුන්න නිසානේ නේද අංකල්"

"හංස මහත්තයා... ඒ සල්ලි..."

"මනෝජ් අංකල් මේ..." තුහංස ඔහු නැවතුවේය.

"පිස්තෝලේ ඕනිද අදත් ඔලුවට" තවත් බලා සිටිය නොහැකි තැන සස්වින්දි එළියට ආවාය.

"වෝ... පුංචි කුමාරිහාමි... ඔයත් ඉන්නවද... ඇයි නාවේ මෙච්චර වෙලා මේවා නාහන්න"

"මම කියනදේ චුට්ටක් අහන්න හංස මහත්තයා"

"මට කිසිදෙයක් අහන්න ඕනේ නැහැ... වචනයක් කතා කරන්න එපා... ඉඩම විකුණලා හරි මට සල්ලි දෙනවා... නැත්නම් මම මේකිව උස්සලා විකුණනවා" තවත් වදනක් හෝ පැවසීමට ඉඩ නොතබා තුහංස පිටවී ගියේය.

"අනේ මන්දා දෝණී... මම මේවා ලිහන්නේ කොහොමද"

"කවුද මේවා හාර හාර දෙන්නේ මෙයාට"

"අර කෙල්ල... වෙන කවුද... ඒකි හංස මහත්තයාව දැලේ දාගෙන ඉන්නේ... කොයි වෙලාවෙත් ඒ කාමරේට

ඊංගනවා" සස්වින්දිගේ කෝපය හාම නැගුනේ ශෝකයකි.

"ඇයි ඒක උගස් කළේ"

"අම්මි ඒක උගස් කළේ රජී අංකල්ට සල්ලි දෙන්න... කම්පැනියේ සල්ලි වුවමනාවකට"

"ඉතින් ඒක ඇයි තාත්ති අර බූරුවට නොකීවේ"

"කියන්න දුන්නද වචනයක්වත්... අනික යමක් කියන්න ඔහේ කියන දෙයක් පිළිගන්න මිනිහෙකුට... සාක්ෂියක් නැතුව එයාට ඒවා කියලා වැඩක් නැහැ දෝණී"

"සජී ආන්ටි දන්නවද මේ ගැන"

"මතකද දන්නේ නැහැ... මාත් හිතුවේ සජී මිස්ටවත් කියන්න"

"කියලා බලන්න එහෙනම්"

"හෙටම කියන්න වෙයි... මට බය කියපු දේට... සමන් දෙයියනේ... මිනිහගේ තරමට එහෙම දෙයක් නොකරන්නත් බැරි නැහැ"

දැනටමත් ඒ දේ කරලා ඉවරයි තාත්තී... සස්වින්දිට කෑගසා කියන්නට සිතිණි.

# 05

හිතේ වේදනාවෙන් බියෙන් මෙන්ම අසහනයෙන් කාලය ගත කළ මනෝජ් පසුදා රාජකාරියට ගියේ දහවලට බොන බෙහෙත් පෙත්තද අමතක කර දමාය. සස්වින්දි කාර්යාලයට ගියේ එය ඔහුට ලබාදීමට සිතාගෙනයි.

"ඇයි... කාව හම්බ වෙන්නද" ඉතා සුන්දර හුරුබුහුටි කෙල්ලගේ රූ සපුවට ඊෂ්‍යාවෙන් චිතු ඇසුවේ සස්වින්දිගෙන්ය.

"මනෝජ් කියන්නේ මගේ තාත්ති" දූටු පමණින් ඒ චිතු යැයි අනුමාන කළ සස්වින්දි පැවසුවේ ප්‍රසන්න හැඟීමකින් නොවේ.

"මනෝජ් සර්ට දුවෙක් ඉන්නවා කියලා මම දන්නේ නැහැනේ"

"ආ... ඇත්තද... ඇයි ඔයාට හංස කියලා නැද්ද"

"හං... ස... ඔයා එහෙම කතා කළේ අපේ බොස්ටද"

"ඔව්... වෙන හංස කෙනෙක් මෙහෙ නැහැනේ... අනික එයාගේ කරේ නැතුව වෙන කෙනෙක්ගේ කරේ එල්ලිලා වාඩි ගත්තට ඔයාට වැඩක් නැතුව ඇතිනේ"

කෝපයෙන් සස්වින්දි දෙස බැලූ චිතු එතැනින් ඉවත්ව ගියේ ඇයට බැන වදිමිනි.

හිතාගෙන ඉන්නේ හංස මහත්තයා කැන්දන් යන්න ඉන්න කෙනා කියලද දන්නේ නැහැ... හංස... බොස්ට නමින් කතා කරන්න තරම් හයියක්... ඇය මුමුණා ගත්තාය.

මේ... සර් එදා කිව්ව කෙල්ලද... චිතු නැවත සස්වින්දි දෙස බැලුවාය.

සස්වින්දි මනෝජ් සිටින තැන අසාගෙන කාර්යාලය තුලටම ගියාය. මනෝජ් ආසනයේ නොසිටියෙන් ඇය ඔහු එන තුරු එතැනින් වාඩි ගත්තාය.

සස්වින්දි කාර්යාලයට එන මොහොතේ සීසී ටීවී කැමරා පද්ධතිය නරඹමින් සිටි තුහංස සස්වින්දි කාර්යාලයට ඇතුළු වනුත් ඇය චිතු හා හරි හරියට කුමක් හෝ පවසා ගනුත් බලා සිටියේය.

ඔහු ඇය දෙස බොහෝ වේලා බලා සිටියේය. ඇයගේ අපූරු සුන්දර බව විරලය. ඇය තමාට ලබා දෙන ආශ්වාදය ගතට දැනෙන්නාක් මෙන් විය.

ඒ සුන්දර මුහුණ රතු කරවා දෑසට කඳුළු පුරවා ඇති වනතුරු සිප ගන්නට ආසාවක් තුහංසට ඇති විය. තුහංස සස්වින්දි වෙතට එද්දී ඇය නැගී සිටියාය. ඇය දෙස බැලූ තුහංස මදක් එහායින් සිටි චිතු දෙස බැලුවේය.

"මේ කම්පැනියට එන ගෙස්ට්ලට විසිටින් රූම් එකක් තියනවා නේද චිතු"

"ඔව් සර්" නැගී සිටි චිතු සස්වින්දි වෙතට ආවාය.

"ඉතින් ඒ තියෙද්දී ඇයි මේ ගර්ල් මෙතන" තුහංස පවසද්දී චිතුට දැනුනේ සැනසීමකි.

ඇය සිටියේ තුහංස පැවසූ තරුණිය ඇය වත්දැයි වූ සැකයෙනි. ඒ ඇය කෙරෙහි වූ දරාගත නොහැකි ඊෂ්‍යාවටයි.

"මනෝජ් සර්ගේ දූවලු සර්"

"ඕ... ඇ..ත්...ත..ද... මනොජ් සර්ගේ දූවලුද..." තුහංස හිස සොලවමින් ඇයව අද දුටුවා සේ හැසිරෙද්දී සස්වින්දි දැනුනේ කෝපයකි. එහෙත් ඇය ඒ කෝපය ආයාසයෙන් දරා ගත්තාය.

"සර්... සර් දන්නවද... සර්ට මෙයා කතා කළේ හංස කියලා... මහත්තයා කිව්වෙත් නැහැ"

"ආ... ඇත්තද චිතු... මහත්තයා කියන්න අමතක වෙලාද... නැත්නම්..." තුහංස ඇය දෙස බලද්දී සස්වින්දි ඔහුට රවා ඉවත බලා ගත්තාය.

"එයාට මගේ කිසිම මහත්මා කමක් පේන්නේ නැතුව ඇති... කමක් නැහැ... මොනවා කරන්නද" තුහංස උපහාසයට මෙන් කීවේය.

"මිස් පළිඟුආරච්චි... මෙතන ඉන්න එක බාධාවක්නේ අනෙක් අයට... ඒ නිසා මගේ රූම් එකට එන්න... කාටවත් පේන්නේ නැහැ එතන" තුහංස ඉවත යමින් කීවේය.

"විසිටින් රූම් එක කොයි පැත්තෙද තියෙන්නේ" සස්වින්දි කාගෙන් හෝ අසනවා තුහංසට ඇසුනද ඔහු කිසිවක් නොඇසුණු ලෙසින් සිය කාමරයට ගියේය.

"විසිටින් රූම් එකට නෙවෙයි මගේ රූම් එකටයි මම එන්න කිව්වේ" සස්වින්දි ආගන්තුකයින් සඳහා වෙන් කළ කාමරයට යන්නට යද්දී නොසිතුව ලෙස තම කාමරයට ඇදගත් තුහංස කීවේය.

"මරන්න හිතෙනවා මට තමුසෙව" තුරුලු කරගත් තමා සිප මුදවා දමද්දී දත් කමින් සස්වින්දි කීවාය. තුහංස හඬින් සිනාසී සිය අසුනට ගියේය.

"වාඩි වෙන්න හංසී... කේන්ති අරන් මූණ රතු කරගෙන ඇස් වලට කඳුළු පුරවා ගත්තොත්... තව තව දේවල් සිද්දවෙයි මේ මේසේ උඩ" සස්වින්දි කුමක් හෝ කෝපයෙන් මුමුණා ගනිමින් තුහංස ඉදිරියේ වාඩි වුණාය.

"මොනවද මුමුණන්නේ ආ... කියන්නකෝ" තුහංස ඇය වෙත නැඹුරු වුණේය.

"මොනවා මුමුණන්නද... අරකද අර කරේ එල්ලගෙන ඉන්න නාඩගම"

"ඇයි... දැක්කම මොකද හිතෙන්නේ... ආ... ඔයා වගේ නෙවෙයි... ලස්සන සුදු කෙල්ලක් එයා"

"ඉතින්... මට අලද... මොකා එල්ලගෙන මොනවා කර ගත්තම මට මොකද" ඇය පැවසුවේ කේන්තියෙනි.

"එහෙනම් මොන එහෙකටද දෙයියනේ මේ කෑගහන්නේ... රිදෙනවද ඔයාට"

"මට... මේ මට... පිස්සුද රිදෙන්න" තමා දෙසම බලා සිටින ඔහුගේ දෑස් මඟ හරවා ඉවත බලා ගනිමින් සස්වින්දි කීවාය.

තුහංස සස්වින්දිව කාමරයට ඇද ගන්නවා වෙන කිසිවෙකුත් නුදුටුවද ඇය පසු පසම පැමිණි චිත්‍රා දුටුවාය.

කාලය ගත වන්නට වන්නට ඇය සිටියේ අපහසුවෙනි. තුහංසගේ ඇමතුමත් සමඟම ඇය ඔහුගේ කාමරයට ගියාය. තමාට ඉතා ළං වූ ඇය ලබා දුන් ලිපිගොණුව තුහංස පරීක්ෂා කළේ රහසින් සස්වින්දි දෙස බලමින්ය. ඇයගේ දෑස් නිතර නිතර ඔවුන් වෙතට යොමුවනු තුහංස දුටුවේය.

"මේ මොකද්ද" ඔහු ඇසුවේ වුවමනා පැණයක් නොවේ.

"මොකද්ද සර්" චිත්‍රා ඔහු වෙතට නැමුණාය.

"මේක වස්තුව... මේක"

තුහංස තමා දෙසට නැමී සිටි චිතුගේ බාහුවෙන් අල්ලා තමා වෙතට නවා ගත්තේ ඇයගේ කොපුලේ තම දෙතොල් වදින තරමට ළංකර ගෙනයි. සස්වින්දි ඉවත බලා ගත්තාය.

"මේක කෙල්ලේ... "

ඔහු ඇයගේ කොපුල සිප ගත්තේ සස්වින්දි රහසින් ඔවුන් දෙස බලන මොහොතක් බලාගෙනයි. තුහංස මෙසේ කරන්නේ තමාට රිදවීමට බව දැන සිටි සස්වින්දි ඉවසා සිටියාය.

සස්වින්දි ඔවුන් දෙස බලන මොහොතක් බලා තුහංස ඇයව දැතට ගත්තේය. එය කළේ තමා ඔහු දෙස බලනු දුටු නිසා බව වටහා ගත් සස්වින්දි ඔවුන් දෙසම බලා සිටියාය.

තුහංස ඇයව දැතට ඔසවා ගනිද්දීත් දැතේ තබාගෙනම ඇයව සිප ගනිද්දීත් ඇය හිතා මතාම බලා සිටියේ තමා මට්ටු නොවන බව තුහංසට පෙන්වීමටයි.

ඇය මේසයට දමද්දීද සස්වින්දි බලා සිටියාය. තුහංස ඇයගේ ළය විවර කරද්දී ඇය දෑස් වසා ගත්තාය. තුහංස ඇයගේ ළය සිප ගනිද්දී ගිළිහුණු කඳුළු වළකා ගැනීමට ඇයට නොහැකි වුවත් ඇය ඉකිය වළකා ගත්තාය.

හංස මගේ කවුරුවත් නෙවෙයි... එයා මගේ හතුරෙක්... වෛරක්කාරයෙක්... හිතට ඇතුළු කර ගැනීමට ඇය වෙහෙසුනාය.

හංසගේ දෙතොල චිතුගේ ආලේප තැවරූ දෙතොලට පැටලෙද්දී සස්වින්දිගේ ඉකිය හඬින් පිටවිය.

"අනේ... සොරි... සොරි... මිස් පළිගුආරච්චි... මට ඔයා මෙතන ඉන්නවා කියලා අමතක වුණානේ... චිතු ඩාලිං... ඇයි ඔයා මට මතක් නොකළේ" තුහංස සිය ලේන්සුව ගෙන එයින් දෙතොල පිස දමා ගනිමින් කීවේය.

"හැමදාම මේ මේසේ උඩ වෙනදේ නිසා මම පුරුද්දට කළේ... ඔයාගේ ඉකිය ඇහුනේ නැත්නම් තව කොච්චර දේවල් බලන්න තිබුණද... මෙයා බය වෙලාද මන්දා" තුහංස සස්වින්දි දෙස බලා කීවේය. සස්වින්දි සුරතින් කඳුළු පිසදා ගත්තාය.

"ආ... කඳුළු මේ ලේන්සුවෙන් පිහිදා ගන්න...
ඔයා" තුහංස ඇය වෙතට ලේන්සුව දැම්මේය. චිතු සිනාසුන
සස්වින්දි ඉවසා සිටියේ අපහසුවෙනි. ඇයට අතට හසු
යමකින් ඔවුන්ට දමා ගසන්නට සිතිණි.

"ඔයා දන්නවද මිස් පළිඟුආරච්චි... මේ චිතු
කෙල්ලෝ වගේ නෙවෙයි... මාර සෙක්සි කෙල්ලක්... මාර
එකක් තියෙන්නේ... දැක්කද" චිතු ළය වසාගෙන නැඟී සි
තුහංස සස්වින්දි වෙතට නැවුණේය.

"මට ආසයි ඔයා කොහොමද බලන්න... නැ
මේසෙට" සස්වින්දිට තවත් ඉවසා සිටිය නොහැකි විය.

සැනින් නැඟී සිටි ඇය තුහංස වෙතට කම්මුල්
කිහිපයක් දෑතින්ම එල්ල කළාය. කම්මුල් පහර කිසිසේ
නොසිතුවක් නිසා තුහංසට ඒවා වළකාගත නොහැකි විය.
ගල් ගැසී බලා සිටියේ වෙන්නට යන සිදුවීම කුමක්
අදහාගත නොහැකිවයි.

"වනචරයා... උඹ වනචරයෙක් බව මම දන්නවා... ඒත්...
තරම් පහත්... කෝපයට ඇයගේ හඬ වෙව්ලුවාය.

කිසිදා කෙනෙක්ගෙන් පහරක් නොකා සැමට පහර දෙ
තමාට අත ඉස්සුවේ කෙල්ලෙකි. ඒ තමාගේ සේවිකාව
ඉදිරියේය. තුහංසට වාවා ගත නොහැකි විය.

සස්වින්දි වෙතට කඩා පැන්න තුහංස ඇයගේ කම්මු
දෙපසට පහර දී ඇයට පා පහරක්ද ගැසුවේය. ළයට වැදුණු
පහර දරා ගත නොහැකිව සස්වින්දි ඇද වැටෙද්දී ඇ
වැටෙන්නට නොදුන් ඔහු ඇයව සුරතේ රඳවා ගත්තේය.

"බැලිලී... මගෙන් මැරුම් කන්න එපා" තුහංස ඇයව පුටුව
තල්ලු කර දමමින් කීවේය.

චිතු තුහංසගේ සුරතේ වෙලුනේ ඔහුගේ කෝප
සන්සිඳුවීමට සිතාගෙනයි. ඔහු ඇයවද තල්ලු කර දැමු
කෝපයෙනි. එය විඳගත නොහැකිව චිතු තුහංස ළඟින්ම
වැටුණත් ඔහු ඇයව සස්වින්දිව මෙන් අල්ලා නොගත්තේය.

"බැල්ලියෝ..." තුහංස අත මිට මොලවා මේසයට ගැසූ පහරට වීදුරුව කුඩුවී ගියේය.

මග දෙපස හමුවන සියල්ලට පයින් ගසමින් කෝපයෙන් පැමිණි තුහංස රථය කාර්යාලයෙන් පිටතට ගෙන නවතා එයින් අර ගත් මත්පැන් බෝතලය මුව තබාගෙනම බීවේය.

ඔහු කුමකට හෝ අසීමතව කෝපගෙන ඇති බව හඳුනාගත් ෂයි ඔහුගේ මුවින් සීරුවට මත් පැන් බෝතලය ඉවත් කළේ මත් වුවහොත් ඔහු කෙසේවත් පාලනය කළ නොහැකි බව දැන සිටි නිසයි.

අසිහියෙන් මෙන් කාර්යාලයෙන් පිටතට පැමිණි සස්වින්දිට සිහියක් තිබුණා යැයි සිතිය නොහැකි විය. ඇය පිස්සියක් මෙන් පාර දිගේ දිව ගියේ කවුරුත් පුදුමයෙන් ඇය දෙස බලද්දීය.

"වාහනේකටවත් හැප්පෙයි අර දරුවා... ඔහොම අසිහියෙන් වැඩි දුරක් දුවන්න බැරි වෙයි..." වැඩිහිටියෙක් පවසද්දී වාහනයට නැගුනේ තුහංසයි.

ඔහු කොතරම් නලාව හැඬ වුවද කෑගැසුවද සස්වින්දිට ඒ කිසිවක් ඇසුනේ නැත. ඇය වාහන අතරින් දිව ගියේ සිහියකින් නොවේ. ඇය පසු කර ඇය ඉදිරියෙන් වාහනය නවතා තුහංස එයින් බැස ගනිද්දී ආ වේගය පාලනය කර ගත නොහැකි වූ සස්වින්දි බොනට්ටුව මතට වැටුණාය.

"පිස්සි වගේ දුවනවා... වාහනයකට යටවුණා නම්..." තුහංස බැන වදිමින් ඇයව දෝතට ගනිද්දී ඇය සිහිසුන් වූවාය.

ඇයව රථයට දාගත් තුහංස සිය ජීප් රථය රෝහලක් වෙතට පැද වූයේ ගිලන් රථයකට වඩා වේගයෙනි. ඔහු ඇයව හදිසි ප්‍රතිකාර ඒකකයට රැගෙන ගියේය,

"හංසි... හංසි... කතා කරන්න කෙල්ලේ..." සිහිසුන්ව සිටි සස්වින්දිට තුහංස තවත් වතාවකට කතා කළේය.

"අනේ කතා කරන්නේ නැහැ ඩොක්ටර්..." ඔහු පැවසුවා නොව මිමිණුවේය.

"එයාට දරා ගන්න බැරි දෙයක් සිදු වෙන්න ඇති... ඒකයි ඔය... බය වෙන්න එපා"

තුහංස සස්වින්දි දෙස බලා සිටියේය. තමාගේ පාලනය කර ගත නොහැකි කෝපය නිසාවෙන් සිදුවන දේවල් යහපත් නොවන බව ඔහු ප්‍රථම වතාවට වටහා ගත්තේය. චිතු ඔවුන් වෙත පැමිණියේ ඒ මොහොතේයි.

"තාත්තී..." කෙඳිරියක් නැගූ සස්වින්දි දෑස් විවර කළාය. තුහංස ඇය වෙතට ළං වෙද්දී ඇයගේ දෑසින් කඳුළු ගලා ගියාය.

"තාත්තී... අනේ තාත්තී... මගේ තාත්ති" සස්වින්දි කෙඳිරිගෑවාය.

"මනෝජ් අංකල් දැන් එයි... කලබල කරන්න එපා" තුහංස පැවසුවේ තිවුණු හඬකිනි. තුහංස දෙස දෑස් විදා මොහොතක් බලා සිටි සස්වින්දි ඉවත බලා ගත්තාය.

තුහංසගේ මේ හැසිරීමත් චිතුට කුතුහලයක් විය. මුලදී ඇය නොදන්නා ලෙසින් හැසිරුණු ඔහු පසුව ඇය සමඟ කෝපයෙන් ඇයට පහර දුන්නේය. දැන් ඇයගේ සුව වෙනුවෙන් කටයුතු කරයි.

අඳුරන්නේ නැහැ කිව්වේ බොරුවට... එතකොට මෙයාද සර්ගේ කෙල්ල... නැහැ... නැහැ... සර්ට දුර යන්න මේ කෙල්ල ඉඩ දෙන්නේ නැහැ... දැක්කනේ කම්මුලට ගැහුව්ව විදිහ... ඒ මේ කෙල්ල නෙවෙයි... චිතු තීරණය කළාය.

"සර්... දැම්ම යනවද" චිතු තුහංසට ළංව ඇසුවාය.

"මනෝජ් අංකල් එනකල් ඉන්නයි බැලුවේ... මෙයාට තාම ඕකේ නැහැනේ"

"ඕනි නැහැ... මට ඉන්න පුළුවන්... තාත්ති එනකල් ඉන්නේ... ඒ මනුස්සයා ආවම රිද්දන්නද තමුසෙට ඕනි" සස්වින්දි කෝපයෙන් ඇසුවාය.

"මේ මේ... මේ තමුසෙගේ තාත්තාගේ බොස්... හරියට කතා කරන්න ඉගෙන ගන්නවා... සර්ට තමුසේ තමුසේ කියන්න එන්නේ නැතුව" චිතු සස්වින්දිට පැවසුවේ අවවාදයක් ලෙසිනි.

"ඔයාට කවුරු හරි ගැහුව්වද" එතනට පැමිණි හෙදියක සස්වින්දි ගෙන් ඇසුවාය.

"නැහැ..." සස්වින්දි පිළිතුරු දුන්නාය. හෙදිය බැලුවේ චිතු හා තුහංස දෙසයි.

"ගහලා තමයි මිසී... මෙයා බොරු කියන්නේ" තුහංස කීවේය. සස්වින්දි තුහංස දෙස බැලුවාය.

" කම්මුලේ ඇඟිලි පාරවල් එහෙමම තියනවා... ඔයාට බොරු කියන්න බැහැ ළමයෝ" හෙදිය සස්වින්දිගේ කම්මුල පිරිමදිමින් කීවාය. සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණි.

"වෙන කොහේ හරි තැලුම් පාරවල් එහෙම තියනවද"

"නැහැ මිසී" සස්වින්දි කීවාය.

"නැහැ කිව්වට බලන්න මිසී... පපුවේ තැලුම් පාරක් ඇති සමහර විට... පයින් පාරකුත් වැදුනා වගේ මතකයි"

"අපි බලමු" තුහංසගේ කීමට හෙදිය කීවාය.

"එහෙම පාරක් නැහැ මිසී"

"මෙයා නැහැ කියයි... දැන් ඉස්සෙල්ලත් කිව්වේ... මෙයාගේ පපුවේ දකුණු පැත්තේ තැලුම් පාරක් වගේ ලපයක් තියනවා... ඒක නෙවෙයි"

හෙදිය තුහංස දෙස බලා සස්වින්දි දෙස බැලුවාය. සස්වින්දි බිම බලා ගත්තාය.

"ඔයාගේ වයිෆ්ද මේ"

"ඔව්... වයිෆ් තමා මම කෑගල්ලේ ඉන්න කාලේ ඩොක්ටර් මයන්ති ගාවට දවසක් මේ දෙන්නා ආවා... ලස්සන කපල් එකක් නිසා මට මතක තිබුණා... එදත් රණ්ඩු වෙලා නේද හිටියේ"

එතැනට පැමිණි හෙදියක් පවසද්දී තුහංසත් සස්වින්දි එකිනෙකා දෙස බලා ගත්තෝය. චිතුගේ පපුව පැලී යන්නට තරම් විය.

රණ්ඩුවක් කෙලවර ආදරය අළුත් වෙනවා යැයි පැවසුවේ මේ හෙදිය බව ඔවුන්ට සිහි විය.

"ඔව් මිසී... අදත් පොඩි ප්‍රශ්නෙකට අපි දෙන්නා රණ්ඩු වුණා... මට කේන්ති ගියා"

"දන්නවද මිස්ටර්... කේන්ති ගියා නෙවෙයි මොනවා වුණ වයිෆ්ට නෙවෙයි හදාගන්න කියලා වුණත් දරුවෙකුට ගහන්න අයිතියක් නැහැ"

"මටත් කියන්න තියෙන්නේ මේ මිසී කිව්ව දේම තම එහෙම කාටවත් ගහන්න අයිතියක් නැහැ"

"මම දන්නවා... ඒත්... කේන්ති ගිය වෙලාවට ඕවා ම වෙන්නේ නැහැ මිසී"

"එහෙම කියන්නන එපා... ඔයාලා තරුණ අය... මේ ජීවි පටන් ගත්තා විතරයි නේද... අවබෝධයෙන් එකිනෙකාට කරගෙන ජීවත් වෙන්න... බාහිරින් විතරක් දෙන්නෙක් ගැළ වැඩක් නැහැ" හෙදිය අවවාද කළේ දෙදෙනාටමයි.

චිතු සිටියේ කිසිවක් අදහාගත නොහැකිවයි. ඇයට සස්වි ගැන දැනුණු ඊර්ෂ්‍යාව දෙගුණ තෙගුණ වී දැනුනාය.

කසාදත් බැඳලා ඉද්දී තමයි නොදන්නවා වගේ හැසිරැ ෂික්... තෝන්ඩි වුණේ මම... කමක් නැහැ... මට ඕනි විතරයි... චිතු මුමුණා ගත්තාය.

"මෙයාට කියන්න කැමතිනම් මට විරුද්දව ඇන් දාන්න කියලා"

සස්වින්දි දෙස බලා කී තුහංස එතැනින් ඉවත ඇයට සමු නොදීමය. චිතුත් ඔහු පසු පසම ගියාය.

"කේන්තිකාරයෙක් වගේ" පිටව යන තුහංස දෙස බ හෙදිය කීවාය.

"ඔව් මිසී... ඉවසන්නේ නැහැ... දඩබ්බරයි... ටිකක් නෙ හොඳටම"

"ඒ වෙලාවට ඔයා ඉවසන්න... එතකොට මේ රණ්ඩු ඇ

"ඉවසන්නේ මම ඔය මදාවියා එක්ක පවුල් කෑ කෝපයෙන් තමාටම මුමුණාගත් සස්වින්දි දෑස් වසා ගත්

"ඇන්ට්‍රියක් දානවද ඔයා"

"ම්... නැහැ මිසී... ඕනේ නැහැ"

මට්ටු කරන්නට එසේ කළ යුතු යැයි සිතුණද තුහංස යම් හෙයකින් තාත්තාට සියල්ල පැවසුවොත්... යැයි බිය වූ සස්වින්දි ඒ අදහස අත හැරියාය.

"වයිෆ්ලා ඔහොම තමයි... ගෑනු අපි කරන්නේ ඉවසන එක"

මම වයිෆ් වුණා නම් ඉවසන්නේ කොහොමද කියලා මම දන්නවා... එහෙනම් ඔය මිනිහාව මම හැමදාම පොලිසියෙම තියනවා... සස්වින්දි මුමුණා ගත්තාය.

තුහංස පසු පසම ගිය චිතු ඔහුගේ අවසරයක් නැතිවම ඔහුගේ වාහනයට ගොඩ වූවාය. ඇය සිටියේ ඉවසා ගත නොහැකි නොසන්සුන්තාවයකිනි.

"ඇත්තටම ඒ සර්ගේ වයිෆ්ද" ඉවසා බැරිම තැන ඇය ඔහුගෙන් ඇසුවාය.

"ඔල්මාදෙද තමුසෙට"

"එහෙනම් කිව්වේ"

"දැන් තමුසේ මගේ වයිෆ් කියලා මට කියන්න බැරිද... ඒ වුණාට වයිෆ්ද... නැහැනේ"

"ඒ වුණාට අර පස්සේ ආව නර්ස් කිව්වේ"

"ඒ... මේ... එයා අපි දෙන්නා කලින් දැකලා තියනවා"

"අඳුරන්නේ නැහැ කිව්වේ එහෙනම්..." තුහංසට සිනහවක් නැගුණේය.

"සර් එයාගේ පපුවේ ලප පවා දන්නවා නේද"

"තමුසෙගෙත් දැන් දන්නවනේ... වතාවක් බැලුවා නේද"

"බලෙන් කිස් කළාද... අද මාව කිස් කළා වගේ" ඇය ඇසුවේ ඊර්ෂ්‍යාව මුසු වේදනාවකිනි.

"මම තමුසෙව කිස් කළේ බලෙන්ද... පැනලා දෙන්න බලාගෙන ඉන්න කොට..." අවසන් ටික ඔහු පැවසුවේ මඳ හඬකිනි.

"නැහැ තමයි... සර්... කොහොම හරි පපුවත් කිස් කරලා" චිතු කියද්දී ඔහු හඬින් සිනාසුනේය.

"පපුව විතරයි කියලද හිතන්නේ" තුහංස ඇය දෙස බැලුවේය. චිතු ඔහු ඉතිරිය කියන තුරු බලා සිටියාය.

"පපුව නෙවෙයි මම හංසිගේ කිස් නොකළ තැනක් නැහැ... ඒ කෙල්ල විතර මම කිසිම කෙල්ලක් කිස් කරලත් නැහැ" චිතුව දවාලමින් තුහංස කීවේය.

"ඒක තමයි එහෙනම් ඒකිගේ ලොකුකම... සර් එයාව බඳින්න ඉන්නේ කියලා"

"බඳින්න... මම එයාව... පිස්සුවක් තියෙනවද මට" තුහංස හඬින් සිනාසුණේය.

"කෙල්ලන්ගේ මායම් වලට කොල්ලෝ අහුවෙනවා සර්"

"මේ කොල්ලා වෙනස් චිතු... ඒක වෙන්නේ නැහැ... හංසියි මමයි අතර තියෙන්නේ කේන්තියක්... අපි එකිනෙකා කරන්නේ වෛරේ පිරිමහ ගන්න එක... එච්චරයි"

"වෛරය නෙවෙයි මොකට වුණත් එයාලා සර් එක්ක ගැටෙනවනේ... ඒක එයාලට වාසියක්" තුහංස නිහඬ විය.

"මනෝජ් සර් හරි කට්ටයා... එයා මේ දේවල් කරන්නේ සර්ගේ කරේ දුවව එල්ලන්න හිතාගෙන වෙන්න ඇති" චිතුගේ වදන් තුහංසගේ පපුව පුරාවට විසිරී ගියේය.

එසේ නම් මේ මුදල් සස්වින්දි ගේ ගිණුමේ තැම්පත් කර ගත්තේ මනෝජ් අංකල්ගේ වුවමනාවටද... මේ හැමදේම මට සස්වින්දි ව බන්දවන්නද... අම්මි අකමැති වුණ නිසා තාත්ති රවට්ටගෙන මේ හැමදේම කරන්න ඇත්තේ ඒ නිසා වෙන්න ඇති... මම අහුවුණාද...

මට මොකද... මම කොල්ලෙක්... දෙතුන් වතාවක් එල ප්‍රයෝජන ගත්තා කියලා එහෙම බලනේ කරේ එල්ලන්න බැහැ මගේ කැමැත්ත නැතුව... තුහංස මුමුණා ගත්තේය.

මම කියන වෙලාවක එන්නම් හංස... ඔයා දෙන ඕනි දුකක් විඳ ගන්නම්... සස්වින්දි නිතර පවසන්නේ ඇයත් මේ සැලසුමේ කොටස්කාරියක් නිසාද... තුහංසට සිතිණි

"සර්... අර ඔප්පුව තියෙන්නේ මනෝජ් සර්ගේ දුවගේ

නමටද කොහෙදෝ"

"මොකද්ද තිබුණ නම"

"සර්ගේ නමේම ගෑනු නම"

"තුහංසි සස්වින්දි පළිඟුආරච්චි... එහෙමද"

"ඔව්... සර්ගේ නම කියලා මම බැලුවේ බලනකොට ඒ නම... මට පුදුම හිතුණා"

"තැන්ක්ස් චිතු... මට විස්තර දුන්නට ඔයා"

"තැන්ක්ස් කරන්න ඕනි නැහැ සර්... මම සර් වෙනුවෙන් ඕනි දෙයක් කරනවා" අනුරාගී බැල්මක් හෙලූ චිතු තුහංසට ළං වී කීවාය.

"ඕනේ දෙයක්..." ඇයගේ දෑසට එබෙමින් කියූ තුහංස හඬින් සිනාසුණේය.

"ඔව් සර්... මම සර්ට ආදරෙයි... ගොඩාක්... ඒ වෙනුවෙන් මට ඕනි දෙයක් කළ හැකියි"

තුහංසට සිහි වූයේ සස්වින්දිවයි. ඒ හාම ඔහුට සස්වින්දි තමාට ගැසූ කම්මුල් පහරවල් සිහිවිය. ඇය ලබා දෙන ඒ සතුට අන් කෙනෙකුට ලබා දිය නොහැකි දැයි තුහංසට සිතුණේය.

මෙච්චර ආදරෙන් කෙල්ලක් ළං වෙන්න හදද්දී මගේ හැමදේම ගත්ත මට වෛර කරන මම වෛර කරන කෙල්ලක් මොකටද මට...

හැකි ඉක්මනින් චිතු හා තනිවන්නට ඔහු සිතුවේය. ඔහු රථයේ වේගය වැඩි කළේය. තුහංසගේ අදහස ගැන කිසිත් නොදත් චිතු ඔහුගේ සිතට මනෝජ්ට විරුද්දව අදහස් වපුරවමින් සිටියාය.

"පරිස්සමෙන් සර්... තියන දේවල් හැමදේම අරන් ඒ කෙල්ලත් සර්ගේ කරේ එල්ලන්න තමයි මනෝජ් සර් ප්ලෑන් ගහනවා ඇත්තේ"

"බලමු..."

එයාගෙන් සතුට ගන්නත් මම දන්නවා... ඒ වගේම ගැල

දරා ගත නොහැකි කෝපයකි. ඔහු නැවතත් මේසයට
පහරක් එල්ල කළේ ' බැල්ලී... යැයි සස්වින්දිට බැන ව

අපහසුවට ඉවත යන්න දොර හැරිය තුහංස කාමරයට ඇතුළු වීමට බලා සිටින චිතුවයි. සස්වින්දි වූ පහව නොගිය කෝපය නිසාවෙන්ද ඔහු චිතු සමඟ ඇයට රිදුණු තරම සිහිගන්වා ගනිමින්ද තුහංස චිතුව ඇද ගත්තේය.

කෝපයත් වියරුවත් ආවේගයත් නිසාවෙන් චිතුට දරා ගැනීමට නොහැකි විය. ඔහුගේ හැඩි දැඩි දෑ වෙද්දී ඇයට කෙඳිරියක් නැඟුනේ පහසට වඩා වෙහෙස

"ස.. ර්... අනේ..." ඇය මලානිකව කෙඳිරුවාය.

ලද ආරංචියට රෝහලට ගිය මනෝජ් සස්වින්දි දුටු වියරු වැටුණේය. ඔහු ගිය පයින්ම ආපසු ආවේ සොයාගෙනයි. හිතේ වූ තරහවට ඔහු තුහංසගේ ඇතුළුවීමට අවසර පැතුවේ නැත.

දොර ඇරෙද්දී චිතුව තම තුරුලෙන් ඉවත් කළ තුහ දෙස බැලුවේ කෝපයෙනි. තුහංස තුරුලේ සිට ඉවත් දුටු මනෝජ්ට දැනුනේ අපුලකි.

"මැනර්ස් දන්නේ නැද්ද... මෙහෙම කාමර වලට සිරිතක් කියනවද" තුහංස ඇසුවේ කෝපයෙනි.

"අවුරුදු තිහ හතළියක් රජී මහත්තයා ඉද්දී කාමරේට ආවේ අවසර අරගෙන නෙවෙයි... තාත්තෙක්ගේ පුතෙක් මෙහෙම ඉදියි කියලා හිතුවෙ මට... සොරි" මනෝජ් පැවසුවේ ඉවත බලාගෙනයි.

"ආවේ..."

"මේ කොහෙවත් යන නැහැදිච්ච එකියක් නි දෝණිට අත උස්සපු එකට මම තමුන්ට සමාවක් නම් නැහැ... තමුන්ට ප්‍රශ්නේ තියෙන්නේ මගේ එක්ක " මගෙ

කෝපයෙන් කීවේය.

"නැහැ... මට ප්‍රශ්නේ තියෙන්නේ මනෝජ් අංකල් එක්ක නෙවෙයි... ඒකිත් එක්ක... අතික මේ කොහෙවත් යන නැහැදිච්ච එකියක් කිව්වේ චිතුටද"

"තොප්පිය හරිනම් වැටෙයි... කොල්ලෙක් අත අරිමු... නාලා ගෙට ගත්තම ඔක්කොම හරි කියලා කියමනට හරි කියනවනේ... ඒත් කෙල්ලක්... ලැජ්ජයි" මනෝජ් චිතු දෙස පිළිකුලෙන් බලා කීවේය.

"ඇයි මනෝජ් සර්ගේ හිතේ තියන දේ කර ගන්න බැරිවුණ නිසාද මට ඊෂ්‍යා කරන්නේ" චිතු ඇසුවාය.

"මගේ හිතේ තියන දේ... ඒ මොකද්ද"

"ඇයි මනෝජ් සර්ගේ දුව ලොකු සර්ට දෙන්න හිතාගෙන ඉන්න එක"

"මගේ දෝණි... මේ මගේ දෝණි..."

"ඔව්... සර්ගේ දෝණි තමා... එයත් දඟ දානවනේ සර්ට"

"දඟ දානවා... චිතු මගේ දෝණි කවුරු කියලා හිතාගෙනද ඉන්නේ"

"කවුරු වුණත් එයා සර් එක්ක එන්න බලාගෙන ඉන්නේ... ඒක සර්රුත් දන්නවා"

"මගේ දෝණි හංස මහත්තයා එක්ක එන්න... ඊට කලින් ඒකි පනියි ගඟට" මනෝජ් පවසද්දී සිනාසුණේ තුහංසයි. මනෝජ් තුහංස දෙස බැලුවේය.

"මනෝජ් අංකල් හිතාගෙන ඉන්නේ එහෙමද... පුදුමයි... මෙච්චර කාලයක් හංසි මගේ එක්ක හිටියට කවදාවත් ගඟට පනින්න ගියේ නැහැනේ" මනෝජ් දෑස් විසල් කොට තුහංස දෙස බැලුවේය.

"පළවෙනි දවසෙවත් එහෙම කරන්න ගියා කියලා මට මතකයක් නැහැ"

"මගේ දෝණි... මගේ දෝණි..." මනෝජ් වෙව්ලුවේය.

"ඔව්... මනෝජ් අංකල්ගේ දෝණි තමා... මගේ තාත්ති
අපූර්වා ආන්ටිගෙයි නෙවෙයිනේ... එයා දුව කියලා හිතා
පන දුන්නට..."

"හං..ස..." මනෝජ් කෑගැසුවේය.

"අපේ තාත්තිගේ හිතේ තිබ්බට හංසිව මට බන්දවන්න... අම්මා කැමති වුණේ නැහැ නේද... පස්සේ මේ හැමදේම තාත්ති රවට්ටලා කර ගන්න ඇත්තේ මට දෙන්න හිතාගෙන වෙන්න ඇති"

ඒ වදන් මනෝජ්ට දරා ගත නොහැකි විය. ගොළු
වෙව්ලුවේය.

"දෙන්න ඉස්සෙල්ලා මම හංසිව ගත්තා අංකල්"

මම ඒකිව උස්සනවා... මනෝජ්ට තුහංසගේ වදන් සිහි

"එ..යා... එයා..." මනෝජ් ගොත ගැසුවේය.

"ඇයි... බය වුණාද... බය වෙන්න එපා... ඇඳට විතරයි... කසාද බඳින්න හිතුවේ නැහැ... ගෙදර
හිතුවෙත් නැහැ..." තුහංස සිනාසෙමින් කීවේය.
සිනාසුනාය.

ගතේ වෙව්ලිල්ල වූ විනාශය සමච්චල් සිනා හඬට ගොස් මනෝජ්ට දැනුනේ කෝපයකි.

"උඹ මගේ කෙල්ලව කසාද බඳින්න හිතුවත් ගෙදර
හිතුවත් මම උඹට ඒකිව දෙන්නේ නැහැ හංස"

"මම ඒකිව ඇඳට අරන් ඉවරයි මනෝජ් අංකල්"

"කමක් නැහැ... මට ජීවත් කරන්න බැරි නම් මම
කපලා ගඟට දානවා... ඇඳට ගත්තා නෙවෙයි ඒකිට ද
දුන්නත් මම උඹට ඒකිව දෙන්නේ නැහැ"
කෑගැසුවේය. තුහංස ගොළු විය.

"උඹ හිතුවද හංස උඹේ තාත්තා හම්බකරපු සල්ලි
ගනන් තිබුණට ඒවට වහල් වෙලා මලක් වගේ හදපු
වගේ ඉන්න ලෝකයක් වටින මගේ කෙල්ලව... තමුන්
රස්තියාදුකාර මදාවි බේබදු සල්ලාලයෙකුට දෙයි කියලා..

නෙන්වත් හිතන්න එපා"

මනෝජ්ගේ වදන් හාම තුහංසට සස්වින්දි පෙරදා පැවසූ ෑන් සිහි විය. එදාද මනෝජ් පවසා තිබුණේ සස්වින්දිට මව කමැති නිසාවෙන් තමට තැම්පත් කළ කෝටි ගානක මුදල් බා දී දියණිය නිදහස් කර ගන්නා බවයි.

තමා එදා එය මුසාවක් බව සිතුවත් මොහු එය පවසන්නට ත්තේ සත්‍ය ලෙසින්ම බව ඔහු අද මනෝජ්ගේ වදන් සමගින් ාහා ගත්තේය. ඔහුට දැනුනේ විශ්මයකි.

"මම මේ කිව්ව දේ හොඳින් මතක ාගන්නවා" දබරගිල්ල දිගු කොට කී මනෝජ් ආපසු රුණේය.

"ඒ පිවිතුරු මල දැන් පොඩි වෙලා පරවෙලා ඉවරයි කියලා ා කිව්වේ බොරුවට නෙවෙයි මනෝජ් අංකල්... සැක නම් සිගෙන් අහන්න"

"කිසිම සැකයක් නැහැ හංස... උඹ වගේ මිනිහෙක් එහෙම යක් නොකළා කිව්ව නම් තමයි සැක... මම විශ්වාස කරනවා ග් දෝණිව උඹ විනාශ කරන්න ඇති කියලා... ආයෙත් නවා... එහෙම වුණත් මගේ දෝණිව මම උඹ වගේ හෙකුට දෙන්නේ නැහැ" තවත් වතාවකට තුහංසගේ මුවට ල් දමා කී මනෝජ් ඉවත ගියේය.

සස්වින්දි ව රෝහලෙන් කඳවාගෙන නිවසට ගිය මනෝජ් වූ වීමත් තුහංස පැවසූ දේවලුත් පවසා ඇයව වැළඳගෙන ාදරුවෙකු මෙන් බොහෝ වේලා ඉකිබිඳ හැඬුවේය.

"මමයි අඬන්න ඕනේ තාත්තී... ඇයි ඔයා අඬන්නේ"

"මාව මරන්න ඉඩ දෙන්නේ නැතුව ඇයි උඹ විනාශ න්න ගියේ මගෙ රත්තරනේ..." මනෝජ් ඇයව නොනවත්වා ගනිමින් ඇසුවේය.

"එයා මාව විනාශ කළා විතරයි තාත්තී... ඔයයි මමයි අපි න්නම ජීවත් වෙනවනේ" සස්වින්දි ඉකිබිඳිමින් කීවාය.

"මගේ දෝණිගේ බලාපොරොත්තු... අනාගතේ... ඔක්කොම යි නේද වස්තුව"

"නැහැ තාත්තී... මට නැති වුණේ කසාදයක් විතරයි... අනිත් හැමදේම මට තියනවා... කසාද බඳින්නේ නැතුව අද කීදෙනෙක් තනියම ඉන්නවද තාත්තී... ඒ ගැන හිතන්න එපා" සස්වින්දි මනෝජ්ගේ දෑසේ කඳුළු පිස දමමින් කීවේ සිනහවක් මවා ගනිමින්ය. මනෝජ් ඇයගේ හිස අත ගෑවේය.

සස්වින්දිට දැනුනේ කිව නොහැකි තරමේ සහනයකි. මෙතෙක් කල් හිස පටවාගෙන සිටි විශාල බරක් බිමින් තිබ්බාක් වැනි හැඟීමක් ඇයට දැනිණි.

ඇය ඔහුට මුල්වරට නතු වූයේ ජීවිතයට තිබූ ආසාවටත් පියා මරයි යන බියටත්ය. දෙවන තෙවන වර ඔහුට අකමැත්තෙන්ම නතු වන්නට වූයේ එය පියාට පවසාවි යැයි වූ බියටය.

එහෙත් පසුව ඔහුට අකමැත්තක් තමා තුල නොවීය. ආදරයෙන් එක් වූවායැයි නොසිතුවද ඔහු හා ගත කළේ මිහිරිවූ හෝරා ගනනකි. එහි වෛරයක් පළිගැනීමක් තිබුණා යැයි කිව නොහැකි තරම්ය.

රහල් අමතක කර ඔහුට අනාගතයක් සකසන්නට සැලසුම් කළ තමා විටෙක තුහංසගේ කඩවසම් බව ඉදිරියේදී විටෙක ඔහු ලබා දුන් මිහිර ඉදිරියේදී ඔහුට අවනත වූයේ සතුටිනි. ඒ පපුතුරට අයිතිවාසිකම් ඇතුවාක් මෙන් තමා ඒ පපුතුර තුල හිස හොවාගෙන සිටියේ සැනසීමෙනි. ඔහුගේ වෙලී ඔහු හා හුරතල් වූයේ සැහැල්ලුවකිනි.

තමා කොතරම් මුලාවක සිටියේ දැයි තමාට පසක් වූයේ වතාවකට දෙකකට නොවේ. එහෙත් එය සිතෙන්නේ ඔහු හමුවට යන තුරු පමණි. ඔහු ඉදිරියේදී තමාට සියල්ල අමතක වන්නීය.

එහෙත්... ඊයේ දින තමා කොතරම් මුලාවක සිටියේ දැයි ඔහු තම ඇස් ඉදිරියේම තමාට පසක් කර දුන්නේය.

කණ්නාඩියෙන් මුහුණ බලන මොහොතක් මොහොතක් පසා පෙනෙන රතු වී ඉදිමුණු කම්මුල කිසි දිනෙක කාගෙන් හෝ ගුටියක් කා නැති තමා පහරකා ලද වේදනාව තමාට එය මොහොතක් මොහොතක් පාසා සිහිකර දෙන්නීය.

වූ විනාශය හිතට එක් කළේ දරා ගත නොහැකි පීඩනයකි. බරකි. එය පියා නිසාවෙන් දෙගුණ තෙගුණ විය. අද මේ සිදුවීමෙන් ඒ සියල්ල නැතිවී ගියාය.

හංස... ඔයාගේ සෙල්ලම් අදින් ඉවරයි... ආය මම කවදාවත් තමුසෙගේ අත කොලුවක් වෙන්නේ නැහැ... තමුසෙට ඕනේ විදිහට නටන්නේ නැහැ... සස්වින්දි මුමුණා ගත්තාය.

මනෝජ් පසුදාම සස්වින්දි කෑගල්ලේ නිවසට යැවීමට තීරණය කළේ නැවත නිවසට නොඑන්න යැයි පවසාය.

නිවසට පැමිණෙන දිනවල නිවසට නොපැමිණ ඇයට සිය පුංචි අම්මාගේ නිවසට යන ලෙස මනෝජ් කීවේය. තුහංසගෙන් ඇයව මුදවා ගැනීමට එසේ කරන බව දැන සිටි සස්වින්දි නිහඬව ඔහුට අවනත වූවාය.

අපූර්වාගේ එකම නැගෙණිය වූ චාතුර්යා පදිංචිව සිටියේ සස්වින්දිට ලියා තිබූ කරවනැල්ලේ වූ මහගෙදරයි. ඇයගේ කුරුණෑගල නිවස කුලියට දී ඇය මේ නිවසේ පදිංචියට පැමිණියේ සිය මව හා පියා නිසායි. ඔවුන් මේ වන විට මිය ගොස් සිටියද සැමියා හා එකම පුතු විදේශයේ සිටියදී එකම දියණිය සමඟ තනිවී සිටින ඇය ළඟ සිටින නෑදෑයින් නිසාවෙන් ආපසු සිය නිවසට යන්නට නොසිතුවාය.

"අනේ චම්මා... ඔයා මෙහෙ ඉන්නකෝ... මට තනියි... ඔයා මේ ගෙදර ඉන්න කොට මට නිතරම මෙහෙ එන්න පුළුවන්" සස්වින්දි නිතරම කීවාය.

එසේම ඇය මසකට වතාවක් හෝ පැමිණ පුංචි අම්මා සමඟින් හුරතල් වී ගියාය.

"අනේ මන්දා... අද නුවර... හෙට කෑගල්ලේ... අනිද්දා උඩවලවේ... නැත්නම් කරවනැල්ලේ... උඹ ඉන්න තැන හොයන්න මොකාටවත් බැහැ දෝණී" චාතුර්යා නිතරම කීවාය.

"ඒක හොඳයිනේ... බලන්න මම කොච්චර නිදහස් කෙල්ලක්ද"

"ඒ නිදහසින් අයුතු ප්‍රයෝජන ගන්න නම් එපා පුතේ"

තමාට තුහංස හමුවන්ට ඔහු සමඟ කොහේ හෝ යන්නට අවස්ථාව ලැබුණේ ඒ නිදහස හේතුවෙන් බව සස්වින්දි කිහිප වරක්ම සිතුවාය.

සස්වින්දිට වඩා මසකට බාල වූ තියුමි චාතුර්යාගේ දියණිය වූවාය. සස්වින්දි ඇය ඇමතුවේ ඇයගේ නමිනි. තියුමි හැඩ රුවින් සිය ලොකු අම්මාගේම රුව ගත් නිසාවෙන් සස්වින්දිත් තියුමිත් නිවුන් සොයුරියන් මෙන් විය.

තියුමිගේ සොයුරු තිමිර ඔවුන්ට වඩා වසර දෙකක් වැඩිමහළු වූවෙකි. ඔහු විදේශයක රැකියාව කළේ තාක්ෂණ නිලධාරියෙක් ලෙසින්ය. වසර දෙකකට වතාවක් ඔහු ලංකාවට පැමිණ මාස දෙකක නිවාඩුකින් පසු ආපසු ගියේය.

"සස්වී... කොහෙද ඔයා" තිමිර සස්වින්දිගෙන් ඇසුවේ නිවාඩුවට මව් රටට පැමිණි දිනයට පසු දිනයේය.

"ගෙදර අනේ... කොහේ යන්නද හදා ගත්ත පැල දාලා"

"හදා ගත්ත පැල කියන්නෙ හරියට උඹ හදා ගත්ත එකක් වගේ... ඒක හැදුවේ උඹද... අපේ ලොකු තාත්තා මහන්සියෙන් හදා ගත්තේ"

"කයිය නවත්තලා ඉන්නේ කොහෙද කියනවකෝ"

"තාම ඉන්නේ ගෙදර"

"ගෙනාව ඒවා අරගෙන ඉක්මනට එනවා හලෝ... මම හෙට නැන්දලාගේ ගෙදර යනවා"

"මේ රෑ මට එන්න කම්මැලියි බං... අනික මම උඹට මොනවත් ගෙනාවේ නැහැ"

"දිවියම කාපිය උඹව... යස අයියලා... නංගිලා බලන්න එන්න හිතාගෙන ඉන්නේ අත් දෙක හොල්ල හොල්ල ඇවිත්ද"

"හිටපන් කෑගහන්නේ නැතුව... උඹව බලන්න එන කොට මම කාඩ් එක සාක්කුවට දාගන්නම්... උඹට බඩු ගෙනල්ලා ඒවට අවලාද අහනවට වඩා හොඳයි උඹව එක්කගෙන ගිහින් කාඩ් එක සීරෝ කර ගන්න එක"

"සෝ ස්වීට්... ඩාලිං ඔයා..."

"කාටද කිව්වේ... උඹේ කොල්ලටද"

සස්වින්දිට සිහි වූයේ රහල්වයි... ඒ හාම ඇයට තුහංස සිහිවිය.

"ඒයි... මොකද... "

"මොකවත් නැහැ බං... අයියලා ඉන්න ඕනි එහෙම තමයි"

"මම හෙට එන්නම් උඹව බලන්න... පස්සේ යමු බඩු ගන්න"

"හරි... එනකොට අර හෝතඹුව්ව දාලා එනවා හරිද"

"ගේන්න හිතුවේ නැහැ කොහොමවත්... මොකද එක වගේ නිසා මාරු වුණාම කරදර වෙයි කියලා" තිමිර සිනාසෙමින් කීවේය.

"ඒ... ගොනා" සස්වින්දිද සිනාසුණාය.

"තියනවා හෝතඹුවිගේ සහෝදරී... බුදු සරණයි... ගුඩ් නයිට්"

"බුදු සරණයි සුදු අයියේ... ගුඩ් නයිට්"

කෙල්ල හිනාවෙලා ඉන්නවානම් මාත් කරන්න ඕනේ හිනාවෙන්න උත්සහ කරන එක... සස්වින්දි දෙස ගින්දරෙන් බලා සිටි මනෝජ් මුමුණා ගත්තේය.

සස්වින්දි කෑගල්ලට යද්දී මනෝජ් කාර්යාලයට ගියේ කිසිදු කැමැත්තකින් හෝ හැඟීමකින් නොවේ. ඔහු වැඩි කාලයක් නොගෙනම සජීවා බක්මීමල්දෙණිය ඇමතුවේය. ඇය අමතා ඔහු කියා සිටියේ හැකි ඉක්මනින්ම තමාට සමාගමෙන් ඉවත්වීමට අවශ්‍ය බවය.

"එහෙම අයින් වෙන්න එපා මනෝ... රජීට හයියක් වුණා වගේ හංසටත් හයියක් වෙන්න... මේ වැටිලා ඉන්න තැනින් ගොඩ එනකල්වත්"

"මමත් මෙච්චර කාලයක් ඉවසගෙන හිටියේ දැඟලුවේ මේක නැත්තටම නැති වෙලා යයි කියලා තමයි සජී මිස්... උත්සහ කළා පුළුවන් තරම්... එයාව හදා ගන්න"

"මේවා මගේ වැරදි මනෝ... රජී ඉන්න දවස
පුතාගේ වැරදි එයාගෙන් හැංගුවා... ඒකයි මට මෙහෙම

"අම්මට හදන්න බැරි දරුවෝ කසාද බැන්දම
හැදෙනවා සජී මිස්"

මනෝ හදන්නේ එයාගේ දුව ගැන යෝජනාව
කරන්නද... සජීවාට දැනුනේ නොමනාපයකි. බලමු...
එන්නේ කියලා... කට ඉස්සර කර ගන්න නරකද
සිතුවාය.

"මනෝ කියන්නේ පුතාට කසාදයක් කරලා දෙන්න

"හංස මහත්තයා කවදා හරි කසාද බඳින්න ඕනෙ

"කොච්චර තක්කඩිකම් කළත් පුතා තවම ඒ පැ
ගිහින් නැහැ මට හිතෙන්නේ" ඇය පැවසුවේ විශ්වාස

මගේ කෙල්ල විනාශ කළේ ඒ පැත්තට නො
වෙන්න ඇති... මනෝජ් කෝපයෙන් මුමුණා ගත්
සමගම චිතු හා සම්බන්ධය ඇය තවම නොදැ
මනෝජ් වටහා ගත්තේය.

"ඔය වයසෙදි කොල්ලෝ වැරදි කරනවා...
නොදැනුවත්කමට හරි අහුවුණොත් ගලවනවා බෙ
පාරක් ඒ දේ කළ මිනිහා ආය ඒ වැරැද්ද කරන්න
හිතන්නේ නැහැ... කෙල්ලන්ට පුළුවන් කොල්ලෝ
ගන්න"

"මනෝ මාව බය කරනවා... මගේ පුතාට එහෙ
වුණොත් මට හයියක් නැති වෙයි එයාව බේරගන්න
පැවසුවේ මදක් තැතිගෙනය.

පුතා නිසා මම විඳවන තරම හොඳටම ඇති... ය
විතරයි නොතිබුණේ... මනෝ මෙහෙම කියන්නේ ම
එක්ක හරි පැටලිලාවත්ද... සජීවා සිතුවාය.

"දෙයක් වෙන්න ඉස්සර පිළියමක් යොදන්න
නියපොත්තෙන් කඩන්න තියන දේ පොරවෙන්
බලන් ඉන්න ඕනේ නැහැ"

"ඇයි මනෝ... පුතා..."

"නැහැ... මම කියනවට සජී මිස් හංස මහත්තයාට හොඳ තැනකින් කටයුත්තක් බලන්න... කම්පැනිය මේ වැටිලා තියන තැනින් ගොඩ ගන්න පුළුවන් හයියක් තියන පවුලක් නම් හොඳයි"

"මම බලන්නම් මනෝ"

"හොඳ ඉගෙන ගත්ත හංස මහත්තයට උදව් දෙන්න පුළුවන් ගෑනු ළමයෙක් හොයා ගන්න බැරි වෙන එකක් නැහැ"

මෙලෙසින් තුහංසට යෝජනාවක් බලන ලෙස පැවසීමට මනෝජ් සිතුවේ සස්වින්දිව තුහංසගෙන් බේරා ගැනීමයි. වරක් ඔහු ඇය ගෙන ගියේ නම් ඔහු ඇයව අත නොහරින බව මනෝජ් දැන සිටියේය.

තුහංස කෙදිනකවත් තමාට නම්මාගත හැකි පුද්ගලයෙකු නො වේ. ඔහු චිතු තුරුලු කරගෙන ඇයව සිපගනිමින් සිටි මොහොත මනෝජ්ට අමතක කළ නොහැකි විය.

මගේ රටක් වටින කෙල්ල විනාශ කරලා තවත් එකියක් තුරුල් කර ගෙන ඉන්න පාහරයෙක් කවදාවත් ගෑනිට සැපක් දෙන්නේ නැහැ... ආදරය කරන්නේ නැහැ... බේබදුකම අත ඇර ගත්තත් මිනිහෙක්ගේ නොසණ්ඩාලකම අත අරින්න ලේසි නැහැ... මනෝජ් සිතුවේය.

මගේ දෝණි තනියම හිටපුදෙන්... ඒ කසාදෙට වඩා ඒක එයාට සැපක් වෙයි... ඔහුගේ තීරණය විය.

තම දියණිය විනාශ කළ පුද්ගලයෙකු පියෙකු විසින් අත හරින්නේ නැත. එහෙත් රජීව නිසාවෙන් මනෝජ් මේ මොහොතේ අසරණය. තම දියණිය ඔහු බලා ගත්තේ සිය පුතාටත් වඩා විශ්වාසයක් ඇය කෙරෙහි රඳවාගෙනයි. එනිසාවෙන් හිතක් තිබුණද ඔහුගේ ලෙයට හානියක් කිරීමට මනෝජ්ට නොහැකිය. මනෝජ් ඉවසා සිටියේ ඒ නිසාය.

හංස කසාදයක් බැඳලා හරි හොඳ වෙනවනම් හොඳට ඉන්නවනම් මම රජී මහත්තයට කළ ගුණ සැලකුවා වෙනවා... ඒ නිසා ඒක කමක් නැහැ... ඔහු සිතා ගත්තේය.

කාලය සති තුනක් ගත වී ගියද [illegible] වරක් නැත. අන් දිනකදී නම් ඔහු සතියකට හෝ දෙසතියකට වරක් සස්වින්දිගේ පහස පතා ඇයව ගෙන්වා ගනී. ඔහුගෙන් ඇමතීමක් නොලැබීම ගැන සස්වින්දි පුදුම වූයේ නැත.

පෙරදා තමා ඔහුට කම්මුල් පහර කිහිපයක් ගැසීමත් ඔහු පෙරලා තමාට පහර ගැසීමත් පියා ඔහුට බැන වැදීමත් නිසාවෙන් මෙන්ම ඔහු චිතු සමඟ සබඳකම් පවත්වන නිසාවෙන්ද ඔහු නිහඬව ඇතැයි සස්වින්දි සිතුවාය.

කාලය ගත වෙද්දී තුහංසට සස්වින්දිගේ අවශ්‍යතාව දැනිණි. ඇයගෙන් ලද පහස නැවත ලබා ගැනීමේ ආශාවක් විය. සස්වින්දි අමතා ඇයට බාල්දුවීමට නොසිතූ තුහංස චිතු කලවානට රැගෙන යාමට සිතුවේය.

චිතු පැමිණෙන තුරු තුහංස බලා සිටියේ රත්නපුර ටවුමේ ජීප් රථය නවතාගෙනයි.

මෝටර් බයිසිකලය තම රථයට ඉදිරියෙන් නවතා බැස ගන්නා යුවල දුටු තුහංසට දැනුනේ කුමන හැඟීමක් දැයි ඔහුටවත් වටහාගත නොහැකිවිය.

තිමිරගේ සුරතේ එල්ලී කුමක්දෝ පවසා සිනාසෙමින් යන සස්වින්දි දෙස තුහංස නොපෙනී යන තුරු බලා සිටියේය. ඇයව ඇද රථයට දමාගෙන යන්නට ඔහුට නොසිතුණා නොවේ. එහෙත් සිය අභිමානය නිසාවෙන් ඔහු ඉවසා සිටියේය.

ඔහු තිමිරගේ මෝටර් බයිසිකලයේ ඡායාරූපයක් දූරකථනයේ සටහන් කර ගත්තේ තිමිරගේ තොරතුරු සොයා ගැනීමට සිතාගෙනයි. තුහංසගේ සවනතේ මනෝජ්ගේ හඬ දෝංකාර දුන්නේය.

මට ජීවත් කරන්න බැරි නම් මම ඒකිව කපලා ගඟට දානවා... ඇඳට ගත්තා නෙවෙයි ඒකිට දරුවෙක් දුන්නත් මම උඹට ඒකිව දෙන්නේ නැහැ...

"මම පරක්කු වුණාද සර්" කලබලයෙන් දිව ආ චිතු ජීප් රථයට ගොඩ වූවාය. එයට පිළිතුරක් නොදුන් තුහංස නිහඬව රථය පණ ගන්වා ගත්තේය.

"අනේ මන්දා පුංචි මහත්තයා... එකම දේ හැමදාම කියන්න බැහැ" චිතු සමඟ නිවසට ඇතුළු වූ තුහංසට සීතා පැවසුවේ බැගෑපත් ලීලාවකිනි.

"පලයන් ගෑනියේ මට බන නොකියා... චිතු... තමුසේ හදනවා මට හොඳ බයිට් එකක්" තුහංස කෝපයෙන් කීවේය.

චිතු සීතා සමඟ කුස්සියට යද්දී තුහංස රථයට ගියේ මත්පැන් බෝතලයක් රැගෙන ඒමටයි.

හිතේ වූ නොසන්සුන්කම අසහනය හා පිළිකුල නිසාම සීතා චිතු සමඟ වචනයක් හෝ කතා නොකළාය. ඇය ඉල්ලූ යමක් පෙන්වූවා හැරෙන්නට ඇයගේ කටයුතු වලට ඇය සම්බන්ධ නොවූවාය.

කරමින් සිටි වැඩය නවතා පියසිරි තමා අසලට පැමිණි සීතා දෙස බැලුවේය. ඇයගේ වතේ වූ ශෝකය කුමක් නිසාදැයි ඔහුට නොවැටහිණි.

"උඹ මොනවද සීතෝ හිතන්නේ"

"පුංචි නෝනටත් පුංචි මහත්තයාගේ වැඩ එපා වෙලාද කොහෙදෝ... ඒ දැරිවි ඕනෙ දෙයක් කියලා ඉන්නවා"

"හැමදාම ඔය මගුල කරන්න පුළුවන්ද... එදා එකියයි... අද එකියයි... ඉවසන්න පුළුවන්යෑ"

"මම කෝල් කළා"

"ඉතින්"

"ඕනි දෙයක් කර ගත්තුදෙන් නැන්දේ... මම එයා එක්ක නැහැ කියලා කිව්වා"

"විනාසේ... විනාසේ... බලන් ඉන්නවා ඇරෙන්න අපි මොනවා කරන්නද සීතෝ"

"මට නම් බලන් ඉන්න බැහැ දූලගේ තාත්තේ... මම යනවා සජී නෝනා හම්බ වෙන්න... ගිහින් කියනවා... පුංචි මහත්තයා මට මගේ දරුවෙක් වගේ"

"හිතෙනෙවනම් කිව්වොත් හොඳයි කියලා... උඹ ගිහින් කියාපන්... ඒත්... මම නම් හිතන්නේ නැහැ සජීවා නෝනට ඕවා

... කියලා

"මාත් හිතන්නේ නම් නැහැ... ඒත් කියලා බලමුකෝ"

සීතාගේ ඇමතුම එද්දී සස්වින්දි සිටියේ තිමිර සමඟ අවහන්හළක සිසිල් බීම පානය කරමිනි.

"කවුද සස්වී"

"දන්න කෙනෙක් සුදූ අයියේ"

"ඒ කෝල් එකට පස්සේ ඔයා අප්සට් මගෙ නංගා"

"අනේ... නැ...හැ... සුදූ අයියේ... මේ මම දන්න නැන්දා කෙනෙක්... එයාගේ පුතාගේ වැඩක් ගැන දුකෙන් කතා කළා ඒකයි" සස්වින්දි මුසාවක් කීවාය.

"පුතාව තමුසේ ලවා හදාගෙන පුතාට තමුසෙව ගෙනියන්න හිතා ගෙන ඉන්නවද දන්නේ නැහැ"

"පිස්සු හලෝ ඔයාට" සස්වින්දි ආයාසයෙන් සිනහවක් මවාගෙන කීවාය.

"තුහංස පෙරදා තමා ඉදිරියේම චිතු සිපගෙන තමාව රිද වූවා පමණක් නොව තමාට අපහාස කර තමාට පහර දුන් අයුරුද සස්වින්දි සිහිකර ගත්තේ දැඩි කෝපයකිනි.

ඒකි එක්ක ඕනි මඟුලක් කර ගත්තුදෙන්... මට මොකද... මදාවියා... අසත්පුරුෂයා... ඒකා මගේ කවුද... වෛරකාරයෙක් මගේ... වෛර කරනවා මමත් ඒකට...

මදක් වෙරිවී සිටි තුහංස චිතු තමා වෙතට ඇද ගනිද්දී පඬරුලක් මෙන් ඔහු වෙතට සැහැල්ලුවෙන් ඇදී ආ චිතු ඔහු ඇයව යහනට දමද්දී කෙඳිරියක් නැගුවාය.

සස්වින්දි තිමිරගේ දෑතේ වෙලී සිනාසෙමින් ගිය අයුරු සිහිවන මොහොතක් මොහොතක් පාසා තුහංස නොසන්සුන් වූවේය. ඇයගේ වතේ වූ සිනහව ඔහුට අමතකර දැමිය නොහැකි විය. චිතුට නැඹුරු වෙද්දී ඔහුගේ සිතේ ඇඳුනේ ඒ සිනහවයි. ගතට දැනුනේ ඇයගේ පහසයි.

ඇයගේ මෘදු බව චිතුගේ දෙතොලේ නොදැනිණි. ඇයගේ උණුසුම චිතුගේ ළයේ නොතිබිණි. සස්වින්දි තමාට

තුරුලු වෙද්දී දැනෙන හැඟීම චිතු තමාට තුරුලු වෙද්දී නොදැනිණි. ඒ වත සිප ගන්නාක් මෙන් මේ වත සිප ගන්නට නොසිතිණි.

ඒ රතුවූ වත කඳුළු දෙනෙත තමාට ලොවම අමතක කරවන්නේය. ඒ මෘදු බව උණුසුම විඳ ගැනීමට එපා නොවන්නේය. ඒ හුරතලය දඟය තමා පිස්සෙකු කරන්නේය.

තමා ඇයව නතු කර ගන්නේ වරකට නොවේ. ඇය තමාට කිහිපවරක් නතු වුවද ඒ මිහිරේ අඩුවක් නැත. සෑම මොහොතකම ඇය පිබිදී සිටියාය.

චිතු තමාගේ එක සිපුමකින් මලානික වෙද්දී ඔහුට එය හොඳින් වැටහිණි. තුහංස චිතුගේ ළය වසා දමා ඇයගෙන් ඉවත් වූවේය.

"ස..ර්..." චිතුගේ කෙඳිරීම තුහංසට නොඇසිණි.

ඔහුගේ හිතේ වූ එකම කෙඳිරීම ' හංසී... යන්න පමණි.

පිබිදෙමින් තිබූ හැඟීම් සතපවා ගත නොහැකි වූ නිසාවෙන් චිතු අසිහියෙන් මෙන් තුහංසව සිප ගන්නට වූවාය. ඇය ඉවත් කළ තුහංස නැඟී සිටියේය.

"අපි යමු චිතු"

"ඇයි සර්"

"එපා චිතු... ඔයා කෙල්ලක්" සත්‍ය පවසා ඇයව පෙලන්නට නොසිතූ ඔහු මුසාවක් කීවේය.

"මම කෙල්ලක් කියලා හිතුවට මම කෙල්ලක් නෙවෙයි සර්"

තුහංසගේ දෑස් යොමු වූයේ යහනේ වූ වේලී ගිය රුධිර පැල්ලම වෙතයි. ඒ හාම සස්වින්දි එදා තමාගෙන් ඇසූ දේවල්ද තමා ඒවාට කියූ දේවල්ද සිහිවිය.

"ඒ කියන්නේ එදා මනෝජ් අංකල් කියපු කතා වල වැරැද්දකුත් නැහැ" තුහංස සමච්චල් සිනහවක් වතේ රඳවාගෙන ඇසුවේය.

"එයා එයගේ දුවගේ කැරැට්ටුව වග ගන්න එහෙම කියන්න ඇත්තේ"

"එහෙම කියන්න එපා චිතු... ඒ කෙල්ල ගැන එයා ආඩම්බර වෙන්න ඕනේ තමයි... හංසි හොඳ කෙල්ලක්"

"සර් රැවටිලා... අද කෙල්ලෝ ගැන දැන ගන්න සර් පැහිලා මදි"

"වෙන්න පුළුවන්... ඒත් ඒක ඇස් බැන්දුමක්වත් රැවටීමක්වත් නෙවෙයි... හංසි මගේ... අදටත් මගේ විතරයි කියලා මම දන්නවා" චිතු කට කොනකට සිනහවක් නගා ගත්තාය.

"හිනා නොවී නැගිටින්න චිතු... ඒ සාක්ෂිය මගේ හිතෙන් මැකෙන එකක් නැහැ වගේම තවම මේ ඇඳෙන් මැකිලා ගිහිනුත් නැහැ" තුහංස දෑසින් ඉඟියක් දෙමින් කීවේය.

ඇඳ ඇතිරිල්ල මදක් ඉවත් කර මෙට්ටයේ කුඩා කොටසක් පුරාවටම පැතිර තිබූ රුධිර පැල්ලම දෙස බැලූ චිතු සස්වින්දි ගැන ඊර්ෂ්‍යාවෙන් පුපුරන්නට වූවාය.

කවදත් කඩවසම් නාරිදේහයක් හිමි හැඩිදැඩි ශක්තිමත් පිරිමින්ට ලොල් පහත් ගැහැණියක් වූ චිතු සිය පිවිතුරු බව හානිකරගෙන තිබුණේ බොහෝ කලකට පෙරයි. රැකියාවට ආ දා සිට ඇය තුහංසගේ දේහයට ආශාවෙන් මේ දිනය එන තුරු බලා සිටියේ නොයිවසිල්ලෙනි. ඒ නොයිවසිල්ල සිපුමකට පමණක් සීමාවෙද්දී ඇය බොහෝ කම්පා වූවාය.

වෛර කරනවා කිව්වට සර් ඒ කෙල්ලට වෛර කරන්නේ නැහැ... සර්ට ඒ කෙල්ල තරම් කෙල්ලක් නැහැ... සර් අද මාව ප්‍රතික්ෂේප කළේ ඒ නිසා... ඇය තරහෙන් මුමුණා ගත්තාය.

කාමරයට ගොස් නොබෝ වේලාවකින් සිටි අයුරින්ම වාහනය වෙත යන තුහංස දුටු සීතාට දැනුනේ පුදුමයකි.

විනාඩි පහකට දහයකටත් ඕවා වෙන්න බැරි නැහැ... ඒත්... මෙතන නම් එහෙම දෙයක් වෙලා නැහැ වගේ... ඇයි... සීතාට දැනුනේ කුහලකි.

ජීප් රිය වෙත ගිය තුහංස කට තබාගෙන අඩක් තිබූ මත් පැන් බෝතලයම බීවේය.

"සීතා..." ඔහු හඬින් කැගැසුවේ සීතා නොදුටු නිසයි.

"පුංචි මහත්තයා" සීතා ඔහු වෙත ආවාය.

"උඹ අද උඹේ අර දැරිවිට කතා කළේ නැද්ද" තුහංස කට කොණට සිනහවක් නගා ගෙන ඇසුවේය.

"නැහැ..." සීතා ඉවත බලාගෙන මුසාවක් කීවාය.

"වෙන්න බැහැ... උඹ කතා කරන්න ඇති" සීතා නිහඬ වූවාය.

"ඒකි කියන්න ඇති නේද එන්න බැහැ කියලා... මම ඕනේ ගෑනියක් ගෙනාවම එයාට මොකද කියලා... ආ සීතෝ... ඒකි එහෙම කිව්වා නේද"

"පුංචි මහත්තයාගේ වැඩ ගැන පුංචි නෝනා කලකිරෙන්න ඇති" තුහංස හඬින් සිනාසුණේය.

"උඹ දන්නවද සීතෝ... උඹේ ඔය පුංචි නෝනට දැන් මාව දුන්න නම් මාව මරාගෙන කයි"

"පුංචි මහත්තයා කරන වැඩ වලට එහෙම නොකළොත් පුදුමයක්" තුහංස තවත් හඬින් සිනාසුණේය.

"මේ එක එක විච්චූරණ ගෑනු ගේන එක නවත්වන්න පුංචි මහත්තයා"

"මට හරියන ගෑනි මට ලොකුකම් දාන කොට... මමත් මට හරියන ගෑනියක් හොයා ගන්න ඕනේ නේද සීතෝ..."

"පුංචි මහත්තයා හොයා ගත්ත එකද ඔය අද අර ගෙනල්ලා තියෙන්නේ"

"ඒකී... ඒකී හොඳයි අපේ ගෙදර බල්ලට ලෙව කකා ඉන්න දෙන්න... පලයන්... ගිහින් ඒකිට කියපන් යන්න එන්න කියලා... මට වෙලා යනවා"

පුංචි මහත්තයා අතින් තවමත් පුංචි නෝනාට වැරැද්දක් වී නැතුව ඇතැයි සීතාට සිතිණි.

ඔහු අද නවතා ගත්තොත්... පුංචි නෝනාව ගෙන්වා ගත්තොත්... ඔහු තවත් මේ වරද නොකර පුංචි නෝනා සමඟින්ම සිටිනු ඇත... සීතා සිතුවාය.

"අර පුංචි නෝනාට පුංචි මහත්තයා කළේ වැරැද්දක්... අදත් කරන්නේ වැරැද්දක්... පුංචි මහත්තයාට හරියන කෙනා පුංචි නෝනා... පෙණුමෙන් විතරක් නෙවෙයි හැමදේකින්ම"

"උඹ බණ කියනවද"

"අනේ නැහැ පුංචි මහත්තයා... මම මේ පුංචි මහත්තයාට අම්මෙක් වගේ කියන්නේ"

"මට අම්මෙක් ඉන්නවා සීතෝ" කියූ තුහංස රථයට ගොඩ වී නලාව හැඬ වූවේය.

"අම්මෙක් ඉන්න බව හරි පුංචි මහත්තයා... ඒ වුණාට කමක් නැහැ... මට බැනලා හරි ගහලා හරි මේ දේත් අහගෙනම යන්න... පුංචි නෝනව කසාද බඳින්න... මේ කරන වැඩ නවත්වන්න"

"සීතෝ... මෙහෙට ළං වෙයන්කෝ" සීතා තුහංස වෙතට නැඹුරු වූවාය.

"උඹට ඔච්චරම අමාරුවක් තියනවනම්... මම එදා කිව්වේ... ගෙනියපන් ඒකිව උඹේ පුතාට"

"මගේ පුතාවත් මමවත් එච්චර වාසනාවන්ත නැහැ පුංචි මහත්තයෝ... ඒ වගේ රන් කඳකට අත තියන්න" චීත්තෙන් කඳුළු පිසදාගත් සීතා ඉවත හැරුණේ සස්වින්දි ගැන ඇති වූ දරාගත නොහැකි ශෝකයකිනි.

අද නොතේරුණාට කවදාහරි පුංචි මහත්තයාට ඒ රත්තරන් නෝනගේ අගය දැනෙයි... එදාට පුංචි මහත්තයාට ගොඩාක් පසු තැවෙන්න වෙයි...

තුහංස සස්වින්දි ඇමතුවේ පසුදා සවසය. ඇය සිටියේ බෝඩිමේය. දුරකථනය අතට ගෙන මිදුලට ආවේ ඔහු සමඟ සුහද කතාවක් නම් ඇති නොවන බව දැන සිටි නිසයි.

"මොකද" සස්වින්දි ඇසුවේ කෝපයෙන්ය.

"හෙට කලවානට ඇවිත් මට කෝල් එකක් දෙනවා"

"ඇයි අරන් ගිය ගෑනි... සෙක්සි... ෆිට්... එහෙම වෙලත් මදි වුණාද"

"අර පුංචි නෝනාට පුංචි මහත්තයා කළේ වැරැද්දක්... අදත් කරන්නේ වැරැද්දක්... පුංචි මහත්තයාට හරියන කෙනා පුංචි නෝනා... පෙණුමෙන් විතරක් නෙවෙයි හැමදේකින්ම"

"උඹ බණ කියනවද"

"අනේ නැහැ පුංචි මහත්තයා... මම මේ පුංචි මහත්තයාට අම්මෙක් වගේ කියන්නේ"

"මට අම්මෙක් ඉන්නවා සීතෝ" කියූ තුහංස රථයට ගොඩ වී නලාව හැඬ වූවේය.

"අම්මෙක් ඉන්න බව හරි පුංචි මහත්තයා... ඒ වුණාට කමක් නැහැ... මට බැනලා හරි ගහලා හරි මේ දේත් අහගෙනම යන්න... පුංචි නෝනව කසාද බඳින්න... මේ කරන වැඩ නවත්වන්න"

"සීතෝ... මෙහෙට ළං වෙයන්කෝ" සීතා තුහංස වෙතට නැඹුරු වූවාය.

"උඹට ඔච්චරම අමාරුවක් තියනවනම්... මම එදා කිව්වේ... ගෙනියපන් ඒකිව උඹේ පුතාට"

"මගේ පුතාවත් මමවත් එච්චර වාසනාවන්ත නැහැ පුංචි මහත්තයෝ... ඒ වගේ රන් කඳකට අත තියන්න" චීත්තෙන් කඳුළු පිසදාගත් සීතා ඉවත හැරුණේ සස්වින්දි ගැන ඇති වූ දරාගත නොහැකි ශෝකයකිනි.

අද නොතේරුණාට කවදාහරි පුංචි මහත්තයාට ඒ රත්තරන් නෝනගේ අගය දැනෙයි... එදාට පුංචි මහත්තයාට ගොඩාක් පසු තැවෙන්න වෙයි...

තුහංස සස්වින්දි ඇමතුවේ පසුදා සවසය. ඇය සිටියේ බෝඩිමේය. දුරකථනය අතට ගෙන මිදුලට ආවේ ඔහු සමඟ සුහද කතාවක් නම් ඇති නොවන බව දැන සිටි නිසයි.

"මොකද" සස්වින්දි ඇසුවේ කෝපයෙන්ය.

"හෙට කලවානට ඇවිත් මට කෝල් එකක් දෙනවා"

"ඇයි අරන් ගිය ගෑනි... සෙක්සි... ෆිට්... එහෙම වෙලත් මදි වුණාද"

සීතා පෙරදා තමා අමතා තුහංස විතුවද ගෙනා ගැහැණිය මෙන් ප්‍රතික්ෂේප කර යැවූ බව පවසා තිබුණු නිසා සස්වින්දි ඇසුවේ උපහාසයටයි.

"ඇති වුණ මදි මුණ එක තමුසෙට වැඩක් නැහැ... මම කිව්වේ තමුසෙට එන්න කියලා... එච්චරයි"

"මම ඔහොම නෙවෙයි තමුසේ ඔළුවෙන් හිටගෙන කිව්වත් එන්නේ නැහැ" සස්වින්දි පැවසුවේ හිතුවක්කාර ලෙසයි.

"කම්මුල් පාර දෙක තුනක් කෑව නිසා හිතුවද කෝටිය හිලව් වුණා කියලා"

"අපෝ නැහැ... මම හිතුවා මගෙන් කාපු කම්මුල් පාරවල් වලට මාව අමතක වුණා කියලා"

"එහෙම අමතක වෙනවද වෛරකාරයෝ... වෛරේ පිරිමහ ගන්න නිතරම මතක් වෙනවා... ළඟට ගන්න හිතෙනවා"

"ආදරේ ළඟ තියන කොට වෛරය මොකටද... අනික සෙක්සි ෆිට් සුපර් කෙල්ලක්නේ ඔයාට ආදරේ කරන්නේ"

"ඒක නම් එහෙම තමා... ඒත්... පඬරලක් වුණත් ඔහේ පැයකට දෙකකට හරි තියාගෙන ඉඳලා කෝටි ගානට පොඩි පොලියක් අය කර ගන්න වෙනවා"

"මම එන්නේ නැහැ... පුළුවන් නම් ගෙන්වා ගන්නවා"

"එහෙමද"

"එහෙමයි"

"අමතක වුණාද නාකියව"

"කොච්චර පවුද මගේ තාත්තිට නාකියා කියන්න... තමුසේ නාකි වෙන්නේ නැති වෙයිද"

"ඒක එදාට බලාගන්නම්... ආපහු ඔළුවට පිස්තෝලේ ඕනේ වෙයි වගේ"

"දැන් මගේ තාත්ති ඇත්ත දන්නවා... තමුසෙමනේ කියලා තියෙන්නේ... ඒ නිසා මම බය නැහැ... මම ආය කොහොමත් තමුසේ එක්ක එන්නේ නැහැ"

"කමක් නැහැ... මරනවා... ජීවත් වුණත් තමුසේ මා
දාලනේ තියෙන්නේ... මට කලින් තාත්තිට මොනා
වුණොත් තමුසෙට උණ්ඩයක් ඉතුරු වෙයි... මොකද... ඒ
මම ජීවත් වෙන්නේ ඒ ආරංචිය එනකල් විතරයි... ඒ
හිතලම තීරණයක් ගන්නවා"

"බැල්ලී... උඹ මට අහු වුණ දවසට ඔය ඔක්කෝට
ගෙවන්න වෙයි" තුහංස ගිගිරුවේය.

"ඒ අහු වුණ දවසටනේ... අහුකර ගන්න බලන
එහෙම වුණොත් ඒක එදාට බලාගමු" සස්වින්දි දු
විසන්ධි කළාය.

"බැ..ල්..ලී..." කෝපයෙන් කෑගැසූ තුහංස දු
පොළවේ ගැසුවේය.

තිමිර පිළිබඳ තොරතුරු සොයා ගිය ෂයි හා පැට
පැමිණියේ ඔහු පිළිබඳ බොහෝ තොරතුරු රැගෙනයි.
ඔහුත් සස්වින්දි අතර වූ නෑකම එම තොරතුරුවල නො

"ඒකිගේ ලොකුකම එහෙනම් ඒකයි... ඒ කොල්ල
වහ වැටිලා ඇති" තොරතුරු රැගෙන පැමිණි පැටෝට
තුහංස කෝපයෙන් කීවේය.

"ඒ කොල්ලා ආය මාසෙකින් ආපහු යනවලු බෙ
කීවේය.

"එහෙනම් ඒ මාසෙට අළුත් එකෙක් පටල ගන්න
නැහැ... ඌට යන්න දෙමු... මාසෙකින් වැඩේට බහිමු"
තීරණය කළේය.

මේ වන විට විශ්ව විද්‍යාල වරම් ලබා සිටි තියුමි ද
හැදෑරීම සඳහා සස්වින්දි සමග ඇයගේ බෝඩිමේ නැව
තීරණය කළෙන් බෝඩිමේ හිමිකාරිණිය හමුවීමට යාම
යොදා ගත්තේ සස්වින්දි බෝඩිමට යන දිනයයි.

තිමිර උදෑසනම සස්වින්දිගේ නිවසට පැමිණියේය.

"පරිස්සමට සුදු පුතා... බයිසිකලයේ නුවරට යනවා

කියන්නේ ලේසි දෙයක් නෙවෙයි" මනෝජ් කීවේය.

"අයියෝ ලොකු තාත්තා... මම කොල්ලෙක්නේ" තිමිර සිනාසෙමින් කීවේය.

"උඹ කොල්ලෙක් නිසා තමයි බය... නැති අපට තියන කල්පනාව හික්මීම උඹලට නැහැ"

"මම පරිස්සමට යන්නම් ලොකු තාත්තා"

තිමිර නැවතත් නලාව හඬවා දොර දෙස බැලුවේය. මනෝජ් ද ඔහු හාම බැලුවේය. සස්වින්දි පේන මානයකවත් නොවීය.

"සස්වී... වරෙන් බං ඉක්මනට... මේකිලාව එළියට ගන්න තියන අමාරුවක්" තිමිර කෑගැසුවේය.

"උඹලට වගේ සැහැල්ලුවෙන් අපට එන්න බැහැ... අපි ගෑනු... නේද තාත්ති" සස්වින්දි මනෝජ්ගේ දෙපා නැමද ඔහුව සිප ගත්තේය.

"ආය ගෙදර එන්න දඟලන්න එපා දෝණී"

ඔහු එසේ පැවසුවේ තුහංස නිසාවෙන් බව සස්වින්දි දැන සිටියාය. ලැජ්ජාව හෝ අපහසු නිසා තුහංස තමා කොටු කර ගත්තේ කෙසේද යන්න මනෝජ් ඇසුවේත් තමා පැවසුවේත් නැත. ඔහු සැක කරනු ඇත්තේ පෙරදා මනෝජ් පිස්තෝලට පෙන්වා වාහනයට දමා තුහංස තමාට අතවර කරන්නට ඇතැයි කියාය.

"සුදු අයියා නිසා මම ගෙදර ආවේ තාත්තී... තියුම් බෝඩිමට ආවම මට ආය එන්න බැරි වෙයි" සස්වින්දි කීවාය.

"ඒක හොඳයි" මනෝජ් කීවේය.

තමාට තුහංසගෙන් බේරී සිටින්නට හැකි වන්නේ කෙටි කාලයක් බව සස්වින්දි දැන සිටියාය. ඔහු කෙසේ හෝ හැකි ඉක්මනින්ම තමාව සොයා ගනු ඇත. එතෙක් පුළුවන් තරම් දිනක් සැඟවී සිටින්නට සස්වින්දි සිතා ගත්තාය.

තියුම් සිටි නිසාවෙන් තමාට රහල්ගෙන් ගැලවිය හැකියැයි සස්වින්දි සිතුවාය. තමාගේ හැඩරුව හිමි ඇය සෑම අතින්ම

තමාට වඩා අහිංසක රහල්ට ගැලපෙන බව ඇය තීරණය කළාය. කෙසේ හෝ ඇයව ඔහුට ළං කර වන්නට ඔහුගේ හිත තමාගෙන් මුදවා ඇය වෙතට යොමු කරවන්නට සස්වින්දි අදහස් කර ගෙන සිටියාය.

මේක අමාරුයි කියලා මම දන්නවා රහල්... ආදරයක් ආදරේ කළ හිතක් වෙනස් කර ගන්න බැහැ... හොඳටම අමාරුයි... ඒත්... එක්කෙනෙකුට සදහටම මේ ලෝකෙන් යන්න වුණොත් ඉන්න කෙනාට කොහොම හරි හිත හදා ගන්න වෙනවා... ඒ වගේ ඔය හිත හදා ගන්න රහල්... සස්වින්දි කියන්නේ ඔයාගේ ලෝකෙන් සදහටම ගිය කෙනෙක් කියලා හිතා ගන්න...

තිමිර සමඟ බයිසිකලයෙන් බසිද්දී බෝඩිම් නිවසේ ඉස්තෝප්පුවේ සිටි රහල්ගේ වත අඳුරු වනු සස්වින්දි දුටුවාය. එහෙත් ඇය ඔහු දුටු බවක් හැඟවූයේ නැත.

මට සමාවෙන්න රහල්... මම අවංක වුණොත් ඔයාට දැනෙන දුක වැඩි වෙයි... මම ඔයාට ආදරෙයි... ඔයාට ලොකු වේදනාවක් දෙන්න මට බැහැ... ඒ නිසා මේ පොඩි වේදනාවල් විදලා මාව එපා කරවා ගන්න... සස්වින්දි මුමුණා ගත්තාය.

"මේ... සුදු අයියේ... ඔයා මම කියන විදිහට ඇට් කරන්න ඕනේ හොදේ" සස්වින්දි රහසින් තිමිරට කීවාය.

"ඇට් කරන්න... මොනවද... මොකටද"

"අප්පෝ... ප්‍රශ්න පත්තරයක්... අහනවා... මම කියන විදිහට ඉන්නවා"

"ඇයි යකෝ හේතුවක් නැතුව මට ගෑනියක් කියන විදිහට ඉන්න පුළුවන්ද... අර එල්ලගෙන ඉන්න එකීවත් මට කවදාවත් එහෙම කියලා නැහැ" සස්වින්දි වත පුරා නැඟී ආ සිනහවට තිමිරට වචන වැරදුන බව වැටහිණි.

"ආ... ඒක ගැන පසුවට... දැන් මම කියන විදිහට සුදූ" සස්වින්දි තිමිරගේ උරයට බර දී බයිසිකලයෙන් බැස්සාය.

"මේ... මගේ කට වැරදුනා... කාටවත් එපා හොදේ... අපේ නංගිටවත්" තිමිර වහා සස්වින්දිගේ අත අල්ලාගෙන කීවේය.

"ඉතින් වයස හරිනේ"

"ඒ වුණාට අම්මලාට හරි නැහැ" තිමිර සස්වින්දිගේ සුරත මුදවා දැමුවේය.

"ඇයි" තිමිර බයිසිකලයෙන් බසිද්දී සස්වින්දි ඇසුවාය.

"කියන්නේ එහෙම නැහැ... ඒකි... පිලිපීන් කෙල්ලක්" සස්වින්දිගේ උරවටා අත දමා ඇය දෙසම බලාගෙන තිමිර පැවසුවේ අපහසුවෙනි. ඇයගේ මුවින් මේ ගැන කියවේ යැයි ඔහුට බියක් දැනිණි.

"ඒයා..." සස්වින්දි මූණ අඳුරු කර ගත්තාය.

"ඇයි බං"

"එයාලා බල්ලොත් කනවා..."

"ඉතින්... ලංකාවේ එවුන් හරක් ඌරෝ කුකුලෝ එළුවෝ කනකොට අනික් අයත් ඒයා කියනවා ඇති"

"ඒකත් ඇත්ත නේ"

"ප්‍රොමිස් වෙයන් කියන්නේ නැහැ කියලා" ඔහු සුරත පෑවේය.

"ප්‍රොමිස්... " සස්වින්දි ඒ සුරත මත අත තිබ්බාය.

"මගේ නංගාව මම විශ්වාස කරනවා" තිමිර සස්වින්දිගේ හිස අත ගෑවේ සෙනෙහස නිසාමය.

"යමං... හැන්ඩි කොල්ලෙක් ඉන්නවා හෝතඹුව් දිහා බලාගෙන" සස්වින්දි ඉස්සර විය.

ඉස්තෝප්පුවට ගොඩ වෙන සස්වින්දි දකිද්දී රහල්ගේ සිතේ මෙතෙක් වෙලා තිබූ නොසන්සුන්කම කෝපයකට පෙරලිණි. ඔහු නැගී සිටියේය.

"ආ... මම කවුද බැලුවා... මේ සස්වින්දිනේ" බෝඩිමේ හිමිකාරිණිය තිමිර දෙස බලමින් කීවාය.

"ආන්ටී... මේ මගේ අයියා... තිමිර... අර උදේ ඔයාට කෝල් කළේ " රහල් ඉදිරියට ගත් පය ආපසු ගත්තේය.

"ගෙදර ඉඳලමද ආවේ"

"නැන්දා මම යනවා" රහල් සූදානම් වූයේ පිටව යන්නට

"රහල් අයියා ගොඩ වෙලාද ඇවිල්ලා" සස්වින්දි ඔහුට ළ
ඇසුවාය.

"අයියා කිව්වේ සහෝදරයෙක්ද... මස්සිනෙක්ද" ඇ
පිළිතුරු නොදුන් රහල් ඇයගෙන් ඇසුවේ රහසින්ය.

"සස්වී..." තිමිර ඔවුන් වෙත ආවේය.

"සුදු අයියේ... මේ රහල්... ආන්ටිගේ මල්ලි කෙනෙක්
පුතෙක්... අපේ ආරක්ෂකයා... මගේ හොඳ....ම යාළුවෙක්" තිමි
රහල්ට සුරත දිගු කළේය.

"මේ මගේ මස්සිනා රහල් අයියේ... මාමාගේ පුතා" ඇය
කීමට තිමිර ඇය පැවසූ රඟපෑම කුමක්ද යන්න වටහා ගත්තේ
රහල්ට දැනුනේ නොපහන් හැඟීමකි.

ඔහුගේ නිවසට ගිය රහල් තිමිරගේ බයිසිකලය පිටව ය
තුරු නොඉවසිල්ලෙන් බලා සිටියේය. ඔහු පිටව ගි
මොහොතේම ඔහු සස්වින්දි ඇමතුවේය.

"සස්වී... මොනවද මේ වෙන දේවල්"

"රහල්... "

"එයා ඔයාගේ අයියා කෙනෙක් වුණාට නෑකමට මස්සිනා
නේද... ඔයාට වටින්නේ නැහැ එයා එක්ක බයිසිකලේ එන්න"

"රහල්... සුදු අයියා අපේ ගෙදර ඇවිත් ගෙදරින්ම තමා මා
අර ගත්තේ... තාත්ති තමා මාව එයා එක්ක එව්වේ"

"එතකොට තාත්ති කිව්වොත් එයාව කසාද බඳින්න කියලා
හා මම බඳිනම් කියලා කසාද බඳිනවා... එහෙමද"

"එහෙම කරන්න වුණොත් එහෙම කරන්න වෙයි"

"එතකොට මම කවුද... ආ... මම මොකාද ඔයාගේ"

"රහල්... අනේ කේන්ති ගන්න එපා"

"සස්වි මේ... මම ගැන තමුසෙට තාත්ති එක්ක කියන්න බැරි නම් මම ඒක කරන්නම්"

"අයියෝ රහල්..." එහෙත් රහල් ඇමතුම විසන්ධි කළේය.

එක ප්‍රශ්නයක් විසඳ ගන්න කියලා මම හිතුවේ... ඒත් දෙයියනේ මේ මොකද වුණේ... රහල් ගෙදර ආවොත්... සස්වින්දිට දැනුනේ බියකි.

සස්වී... මම ඔයාව මට කියලා වෙන් කර ගත්තේ දැක්ක වසෙමයි... එදා ඉඳලා අද වෙනකල් මම ඔයාව බලාගෙන හිටියා... ඉස්සරහටත් බලාගෙන ඉන්නවා... කවදා හරි ඔයා මගේ බිරිඳ වෙන දවස එනකල්... මගේ හිත රිදෙන දේවල් කරන්න එපා කෙල්ලේ... මම ඔයාට ආදරෙයි... මගේ ජීවිතේ තරමටම... රහල්ගෙන් පැමිණි පණිවිඩය කිය වූ සස්වින්දි ඉකිබින්දාය.

මේ පව්කාරිට ආදරේ කළාට තේරුමක් නැහැ මහත්තයෝ...

අලුතින් ආරම්භ කළ පරිඝණක පන්තියට සහභාගී වීම සඳහා තියුමි සස්වින්දිගේ බෝඩිමට ආවාය.

"මේ සුදු අයියගේ නංගි... මේ රහල් අයියා... මගේ යාළුවෙක්" තියුමි රහල්ට හඳුන්වා දෙමින් සස්වින්දි කීවාය. රහල් නන්නතමට තියුමිට සිනාසුණේය. ඔහුගේ සිතේ සස්වින්දි ගැන කහට මේ වන විටත් මැකී නොතිබිණි.

"අක්කා විතරක් නෙවෙයි දැන් නංගිවත් රකින්න වෙන්නේ ඔයාට තමයි" තියුමි ඉදිරියට වෙද්දී රහල් සමඟ පසු බැස්ස සස්වින්දි කීවාය.

"නෑනා වුණාට තියුමි නංගි පෙනුමට ඔයා වගේමයි" රහල් කිවේය.

"ඇයි... වෙන්න බැරිද"

"පුළුවන්... දැන් ඔය වෙලා තියෙන්නේ"

"දන්නවද රහල්... මට වඩා ඔයාට ගැලපෙන්නේ තියුමිව... ඇම අතින්ම... එයා කැම්පස් සිලෙක්ට් වෙලා ඉන්නේ" රහල්

නැවතුමෝ රවාගෙනය.

"අයියෝ රවන්න එපා... අනේ මන්දා රහල්... ඔයා පුදුම විදිහටනේ නපුරු වෙලා ඉන්නේ" රහල් නිහඬවම සිටියේය.

"යමු... බොරුවක් නෙවෙයි මම කිව්වේ... මම කැමතියි ඔයයි තියුමියි බඳිනවට"

"විකාර කියවනවද... ඔයාට ඕනි මගෙන් ගැලවිලා මස්සිනා බැඳගන්නද" රහල් කෝපයෙන් ඇසුවේය.

"මට කාවවත් බඳින්න ඕනි කමක් නැහැ රහල්... ඒත් මට ඔයාව බඳින්න බැරි වෙයි"

"කමක් නැහැ... මට ඕනැති කසාදයක් නැහැ"

"ඒ.. ත.. කො.. ට"

"මට ඕනේ ඔයාව විතරයි" රහල් සස්වින්දිගේ සුරතින් අල්ලා ගත්තේය. සස්වින්දි බැලූවේ ඉදිරියෙන් යන තියුමි දෙසයි.

"හංගන්න දෙයක් නැහැ... තියුමි දැන ගන්න ඕනේ මේවා... එයා විතරක් නෙවෙයි... ඔයාගේ තාත්තිත්... මම එනවා ඉක්මනටම එයාව හම්බ වෙන්න"

"එන්න... ඇවිත් හම්බ වෙන්න... වැඩක් වෙයි කියලා මම හිතන්නේ නැහැ" සස්වින්දි කෙඳිරියක් මෙන් කීවාය.

"මොකද වෙලා තියෙන්නේ... තමුසෙට ඕනි මගෙන් ගැලවෙන්නද... අර මස්සිනා බැඳගන්නද" රහල් හඬින් ඇසුවේ තියුමිවද හඬට නතර කරවමින්ය. සස්වින්දි හඬින් ඉකිබින්දාය.

"නංගි යමු" තියුමිට කියූ රහල් නැවත සස්වින්දිගේ අත අල්ලා ගත්තේය.

"සොරි සස්වී... මාව කේන්ති කරන්න එපා බබා... ඇත්තටම ඔයාට ඕනේ ඔයාගේ පුංචි අයියවද... මාව අත ඇරලා එයාව බැඳ ගන්නද"

සස්වින්දි තවත් ඉවසා සිටිය නොහැකිවිය. හිතේ කොතනකවත් නැති දෙයක් පවසද්දී උහුලාගත නොහැකිය.

"එයා මගේ මස්සිනා නෙවෙයි රහල්... මගේ අයියා... තියුමි

මගේ නංගී... එයාලා මගේ පුංචිගේ ළමයි" රහල් නැවතුණේය. ඇයගෙන් පිට වූ වචන අදහාගත නොහැකිය.

"ඔව් රහල්... බොරු කිව්වට සොරි" රහල් ඇයට රිදෙන්නම ටොක්කක් ඇන්නේය.

"ආහ්... ආ...යි... ඔලුව..." සස්වින්දි කෑගැසුවාය. තියුමි පිටුපස බාල සිනාසෙමින් ඉදිරිය බලා ගත්තාය.

"මස්සිනාවද බඳින්න ඕනි කියලා අහනවා... මේ වගේ ටොකු අනින කොට නැති මස්සිනාලා මවාගෙන හරි බඳින්න හිතෙනවා... නපුරා..."

"ඔයාට ඔය රිදුම මොහොතකට විතරයි සස්වී... ඒයේ ඉඳන් මේ දැන් වෙනකල් මට රිදුන රිදුම... කියලා වැඩක් නැහැ"

අනේ සමන් දෙවියනේ... මම මොකද කරන්නේ... මම කොහොමද තවත් රහල්ට වංක වෙලා මේ විදිහට ඉන්නේ... ඒත්... මම කොහොමද එයාට ඇත්ත කියන්නේ... සස්වින්දි සිය දහස් වාරයක් හිතින් තැවුණාය.

"ඇයි සස්වි ඔයා මට ඒ වගේ බොරුවක් කළේ" රහල් සස්වින්දිගෙන් ඇසුවේ රාත්‍රියේ ඇය අමතන මොහොතේදීය.

"මම වැරැද්දක් කළොත් ඔයාට කොච්චර කේන්ති යනවද බලන්න... ඔයාට මාව නැති වෙන බව දැනුනොත් ඔයා කොහොම හැසිරෙයිද බලන්න"

"ඉතින්... බලා ගත්තද... ඔයා නම් සස්වි මහ නපුරු කෙල්ලක්... ඔයා හිතුවේ නැද්ද මට කොච්චර රිදෙයිද කියලා"

"හිතුවා රහල්... හිතුවා... ඒත්... ඇත්තටම අපිට වෙන් වෙන්න වුණොත්"

"මම ඔයාගේ තාත්තිව හම්බ වෙන්නම්"

"වැඩක් වෙන එකක් නැහැ රහල්"

"ඒ ඔයා හිතන විදිහ"

"නැහැ රහල්... අපේ තාත්තා කවදාවත් පොරොන්දු කඩන කෙනෙක් නෙවෙයි... ඒ කසාදෙට තාත්ති පොරොන්දු දීලා

ගන්නා අදහසිනි.

රහල් පියා මුණ ගැසුණ හොත් පියා කිසිවිටෙකත් ඔහු
තමාව සත්‍ය වහන්කොට ලබා නොදෙනු ඇත. එසේම තමා
අකමැත්තෙන් කිසිත් නොකරනු ඇත. එහෙත්... මගේ ඉරණ
ගැන ඔහු වැලපෙනු ඇත. ඔහුට දුකක් දෙන්නේ කෙසේද... අ
මුසා පැවසුවේ එනිසාවෙනි.

"හරි... එහෙනම් අපි මේ ඉන්න විදිහට ඉමු... අන්තිම දවි
වෙනකල් ආදරේ කරමු... ඔයා මාව දාලා යන දවස
යන්න" රහල් අමනාප හඬින් පැවසුවේය.

"එතකොට..."

"එතකොට ප්‍රශ්නයක් නැහැ"

"රහල්... මේ අහන්න... මෙතන සම්පූර්ණ වැරැද්ද මගෙ
මමයි එහෙම දෙයක් නොදැන ඔයාට ළං වුණේ"

"නැහැ සස්වී... මමයි ඔයාව බලෙන් මගේ කර ගත්තේ"

"ඔයා කොහෙත්ම මම නිසා විඳවන්න ඕනි නැහැ... ඔ
ඔයාට ලෝකයක් හදා ගන්න... මම සතුටින් මගේ නංගිව ඔයා
ළං කරන්නේ" රහල් දුරකථනය විසන්ධි කර දැමුවේය.

සස්වින්දි නැවත ඔහු ඇමතීමට උත්සහ කළද ඔ
දුරකථනය විසන්ධි කර තිබිණි.

මම ඔයාට ආදරෙයි රහල්... ගොඩාක්... මට ඔයාට ආදරෙ
කරන්න පුළුවන් සදහටම... උපරිමයෙන්ම... ඒත්... මට බැ
කවදාවත් ඔයාගේ බිරිඳ වෙන්න... දරුවන්ගේ අම්මා වෙන්න...

ආදරය කියන්නේ පරිත්‍යාගයක්... මට දෙන්න බැරි දේ ම
ඔයාට ලබා දෙන්න උත්සහ කරන එක වරදක් නෙවෙ
රත්තරන්... තේරුම් ගන්න මාව... සස්වින්දි දුරකථන පණිවිඩය
තැබුවේ ඔහුගේ කෝපයට එතරම් ආයුෂ නැති බව දැන ස
නිසයි.

ඔයා මගේ බිරිඳ වෙන්න ඕනේ නැහැ සස්වී... දරුවන්ගෙ
අම්මා වෙන්න ඕනෙත් නැහැ... මාව දාලා යන කල් මට ආදරේ

කරන්න... ඒ හොඳටම ඇති... ආදරේ පරිත්‍යාගයක් නම් මම මගේ ජීවිතේම ආදරේ වෙනුවෙන් පරිත්‍යාග කරනවා... දුරකථනයට පැමිණි පණිවිඩය කියවා සුසුමක් හෙලූ සස්වින්දි දෑස් පියා ගත්තේ නින්දටයි.

ඔයාගේ ජීවිතේ මගේ ආදරේ වෙනුවෙන් පරිත්‍යග කරන්න මම ඉඩ දෙන්නේ නැහැ රහල්... ඒ ජීවිතේට තියුණිව මම කොහොම හරි එකතු කරනවා... සස්වින්දි තම සිතට පොරොන්දු කර ගත්තාය.

මනෝජ් දකින මොහොතක් මොහොතක් පාසා ඔහු පැවසූ වදන් තුහංසගේ හිත පුරාවට දෝංකාර දුන්නේය. ඒ හාම සස්වින්දි කෙරෙහි වූ කෝපයද උත්සන්න වුණේය.

අගේ කරන්නම වටින රැජිණ වගේ දූ සිඟිත්ත... හඃ... මම මොකාද... එහෙමනේ හිතාගෙන ඉන්නේ... හංසී... උඹත් එහෙමයි... උඹ මට දාපු ආඩම්බරකම්... මට කියපු කතා... මට අමතක නැහැ... තුහංස කෝපයෙන් මුමුණා ගත්තේය.

රතුවත කඳුළු දෙනෙත බලන්නට විඳින්නට වූ ආසාව තවත් ඔහුට දරා සිටිය නොහැකි විය. ඔහු කිහිප වරක්ම සස්වින්දි ඇමතුවේය. ඒවාට ප්‍රතිචාර නොලැබෙද්දී ඔහු ඇයට දුරකථන පණිවිඩ යැව්වේය.

දිනෙන් දින මොහොතින් මොහොත පැමිණෙන ඇමතුම් වලට මෙන්ම දුරකථන පණිවිඩ වලට ප්‍රතිචාර නොදැක් වූ සස්වින්දි ඔහුගේ අංකය තම දුරකථනයෙන් හිර කළේය. තුහංස ඉන් පසුව වෙනත් අංක භාවිත කළේය.

සස්වින්දි නොදන්නා අංක කිසිවකට ප්‍රතිචාර නොදැක්වූවාය. තුහංස එයින් වඩාත් කෝපවන බව සස්වින්දි දැන සිටියද ඇය එය මායිම් නොකළාය.

කේන්ති ගත්තුදෙන්... එයා මට මොනවා කරන්නද... එයා මාව මරන්නේ නැහැ කියලා මම හොඳටම දන්නවා...

පන්ති නිමවා සස්වින්දි නැන්දාගේ නිවසට පැමිණියේ තිමිර සමඟ බයිසිකලයෙනි. සස්වින්දි හමුවීමට සිතා නැන්දාගේ නිවස අසලට ගිය තුහංස තිමිරගේ බයිසිකලට හඳුනාගත්තේය. තුහංසගේ රථය නොදුටු සස්වින්දි තිමිරගේ බයිසිකලයෙන් බැස ගත්තේ පාරෙදීය.

"බැල්ලී... අලුත් මනමාලයාගේ රස්නේ වෙන්න ඇති පෙන්වන්නේ" කෝපයෙන් දත් කෑ තුහංස වාහනයේ බොනට්ටුවට පා පහරක් ගසා කීවේය.

"බෝස්... දෙමුද වැඩක්" පැටෝ ඇසුවේය.

"දෙන්න ඕනේ... හැබැයි දැන් නෙවෙයි... මේකිව මට විශ්වාස නැහැ... ජීවිතේට අනතුරක් කර ගන්න පුළුවන්"

"ඒක ඇත්ත බොස්"

බයිසිකලයෙන් බැස ගිය සස්වින්දි නැවත තිමිර වෙත පැමිණියේ තියුමිද සමඟයි.

"ෂිඃ... කොහොමද බඩුව... අරකිට දෙවනි නැහැ" පැටෝ කීවේය.

"හ්ම්... අරකිගේම සාම්පල් එකක්"

"ඒකිගේ නංගිද බොස්"

"ඒකිට නංගිලා නැහැ... හොයා පල්ලා මේ කෙල්ල කවුද කියලා... සමහර විට මේ නැන්දාගේ දුව වෙන්න ඇති" තුහංස කීවේය.

"එහෙනම් පරිස්සමට දෙන්නා... මම ගිහින් එන්නම්" බයිසිකලයට නැගී තිමිර පැවසුවේ තියුමි හා සස්වින්දි දෙස මාරුවෙන් මාරුවට බලමිනි.

"ඔයත් පරිස්සමට යන්න අයියේ" තියුමි කීවාය.

"ඔව් සුදු අයියේ... හීමීට යන්න... ගිය ගමන් මට කෝල් එකක් දෙන්න" සස්වින්දි ඔහුගේ බාහුවේ අත තබමින් කීවාය.

"ආ... තව එකක්" හිස් වැස්ම පැළඳීමට ගිය තිමිර එය වළකාගෙන සස්වින්දි දෙස බැලුවේය.

"මේ... රැවුල් කොට... ඇනෙනවත් එක්ක... මතක් කරලා රැවුල කපා ගන්න... කෙල්ලෙක්වත් බලන එකක් නැහැ" සස්වින්දි තිමිරගේ කම්මුල පිරිමදිමින් කීවේය.

"පිස්සුද හලෝ... කෙල්ලෝ කැමතියි රැවුලට" කියූ තිමිර තියුමි දෙස බලා සස්වින්දි වෙතට නැඹුරු වූවේය.

"රවුල් කොට තියාගෙන කෙල්ල කිස් කරද්දී ඒකිට කිච්... එතකොට ඇගේ එල්ලෙනවා දඟලනවා වැඩියි... එතකොට තද කරගෙන අල්ල ගන්න පුළුවන්" ඔහු සස්වින්දිගේ කනට කර කීවේය.

"කිච්චොත්... කතාවක්... යනවා යන්න" සස්වින්දි ඔහුට පහරක් ගැසුවේ හඬින් සිනාසෙමින්ය. ඔහුත් ඇය සමඟ හඬින් සිනාසුණේය.

තව දුරටත් මේ දසුන් ඉවසා සිටිය නොහැකි වූ නිසාවෙන් තුහංස සිය සගයා සමඟ වාහනයට නැගුණේය.

පිටව ගිය මොහොතේ සිට තුහංස නොනවත්වා සස්වින්දිට ඇමතුම් ලබා ගත්තේය. එය තුහංසගේ අංකයක් බව පසක් කර ගත් සස්වින්දි හඬ නොනැගෙන ලෙස දුරකථනය සකසා ගෙන ඇමතුම අවසන් වන තුරු ඒවාට සම්බන්ධ නොවී ඔහේ බලා සිටියාය. තුහංසද නොනවත්වාම ඇයව ඇමතුවේය.

තුහංසගේ නොනවතින අමතුම් වලට කෝප වූ සස්වින්දි ඇමතුම ලබාගෙන එය විකාශනය වන රූපවාහිණිය ඉදිරියේ තැබුවාය.

ඇයට හොඳ හැටි බැන වදින්නෙමියි සිතා ඇමතුමට සම්බන්ධ වූ තුහංසට ඇසුණේ රූපවාහිණී යන්ත්‍රයේ හඬ මිස ඇයගේ හඬ නොවේ. කෝපගත් ඔහු දුරකථනය මෙන්ම අතට හසුවන සෑම දෙයක්ම පොළවේ ගැසුවේය.

"බැල්ලී... මම උඹව තියන්නේ නැහැ... උඹ හැප්පෙන්නේ වැරදි මිනිහා එක්ක... මේවට උඹට විඳවන්න වෙයි... බොහෝම විඳවන්න වෙයි" ඔහු කෑගැසුවේය.

කෝපය නිසාම තුහංස හැකි ඉක්මනින්ම තමා සොයා පැමිණෙන බව සස්වින්දි දැන සිටියාය. එනිසාවෙන් ඇය සෑම මොහොතකම විමසිලිමත් වූවාය. ඇය හිතා මතාම බෝඩිමටම වී සිටියාය.

පරිසණක පන්තියට ගියද කෑගල්ලේ නැන්දාගේ නිවස සෝදිසි කළද තුහංසට සස්වින්දිව සොයා ගත නොහැකි විය.

"මතක තියාගනින් හංසී... උඹට හැමදාම හැංගිලා ඉන්න බැහැ කියලා... හම්බ වුණ දවසට මම කරනදේ උඹට හිතා

ගන්නවත් බැරි වෙයි... සල්ලි බල්ලට දාලා මම උඹ
දානවා දැන ගනින්... තුහංස සස්වින්දිට පණිවිඩයක් එව්

"ඔහේට ගිය රට කියලා හිතුවද... අසත්
මදාවියා... ආය මම තමුසෙට අහුවෙයි කියලා හිතු
පිළිතුරක් එව්වාය.

"එහෙමද හිතන් ඉන්නේ... ඉන්න තැනක පරි
හිටපන්... මට අහුවෙන කල්"

"හිතුවද මම බය වෙයි කියලා... මම බය නැහැ"

"ඔය බයිසිකල්කාරයා ඉන්නේ තව සතියයි නේද
බය නොවී හිටපන්... ඊට පස්සේ මම අල්ල ගෘ
වෙයන්"

සමන් දෙයියනේ... මම සුදු අයියා එක්ක යනවා එ
හොයා ගන්න ඇති... සතියකින් යනවා කියලත්
එයාට කරදරයක් කරයිද... ඒ දුරකථන පණිවිඩය දුටු
ඇවිලී ගියාය.

ආය නම් මම සුදු අයියා එක්ක කොහෙවත් යන්
සස්වින්දි සිතා ගත්තාය.

තුහංස පරිඝණක පන්තිය දන්නා නිසාවෙන් ඔ
පැමිණේ යැයි සිතා සිටි සස්වින්දි පන්ති දිනය
ගැනීමට සිතුවද එයට අවස්ථාවක් උදා වූයේ නැත.

එදා පන්තිය නිම වූ පසු තියුමි සමඟ පිටතට
සස්වින්දි රහල් තමා හමුවීමට එනවා යැයි පැවසූ නිස
තුරු කාලය තිබෙන නිසා පන්තියේම රැඳී සිටින්නට

ඇයගේ සිතුවිල්ලට පණ පොවමින් පරිඝණක
පැමිණි තුහංස සස්වින්දි එනතුරු පසෙකට වී බලා සි

තියුමි සස්වින්දිගේ මිතුරියක් බවත් ඇය සස්වි
පන්ති වලට සහභාගී වන බවත් පැටෝ් සොයාගෙ
තිබිණි. සස්වින්දි වෙනුවට තියුමි පැමිණෙද්දී තු
ඉදිරියට ගියේය.

"කෝ... යාළුවා ආවේ නැද්ද" තුහංස ඇසුවේය.

සස්වින්දිගේම රූපය ගත් ඇය සස්වින්දිට වඩා දඟකාරී යුවතියක් බව ඔහු ඇයගේ බැල්මෙන්ම වටහා ගත්තේය.

මනා කඩවසම් දේහයකට හිමිකම් කියූ තරුණයා පන්තිවලට සහභාගී වන්නෙකු නොවන බව නම් තියුම්ට ස්ථිර විය. අත පුරවා දමා සිටි වෛවාරණ වළලු... කර ලා සිටි නූල්... පොල්කටු මාල නිසාවෙන්ද බාහුවේ ඇඳි ටැටූ රූප නිසාවෙන්ද ඇඳ සිටි ඇඳුම් නිසාවෙන්ද ඇය එය වටහා ගත්තාය.

පිළිතුරු නොදුන් ඇය ඇසපිය නොහෙලා ඔහුගේ කඩවසම් රූපය දෙස බලා සිටියාය.

"හලෝව්..." තුහංස ඇයගේ නෙතු ඉදිරියට සුරතින් හඬක් නිකුත් කළේය. තියුම් තිගැස්සී පියවි සිහියට ආවාය.

"යාළුවා සස්වින්දි... එයා ගැන මම ඇහුව්වේ" සිනහවක් නංවා ගනිමින් තුහංස කීවේය.

"ආ... අපේ අක්කී... ඔයා එයාව දන්නවද"

"දන්නවා... දන්නවා... අපේ අක්කී කිව්වේ... මනෝජ් අංකල්ට දුවලා දෙන්නෙක් නැහැනේ"

"මනෝජ් කියන්නේ මගේ ලොකු තාත්ති... අපේ අම්මිගේ අක්කගේ මහත්තයා"

"අපූර්වා ආන්ටිගේ නංගිගේ දුව"

"හ්ම්... ඔයා එයාලා ඔක්කොමලාම දන්නවද"

"දන්නවා... ඔක්කොමලාම දන්නවා" තුහංස සිනාසෙමින් කීවේය.

"ඒක තමයි එහෙනම් ඔයා අපූර්වා ආන්ටි වගේම ඉන්නේ"

"ආ... මම ඒ වගේයෑ" තියුම් දඟකාරී ලෙස කීවාය.

"එයා වගේ තමයි ඔයා..."

"මම ලොකු අම්මා වගේ වයස නැහැ... මම අක්කී වගේ" තුහංස සිනාසුණේය.

"ඇයි නැද්ද"

"හරි... හරි... ඔයා හරි... එතකොට මම නංගිත් අක්කා වගේ වස බෝතලයක්... බෝම්බයක්... කියලා හිතා ගන්න ඕනිද"

"අනේ... එපා..." ඇය කෝල හඬින් කීවාය.

"අක්කි කෝ"

"අද බෝයි ෆ්‍රෙන්ඩ් හම්බවෙන දවසනේ එයාගේ... කොහෙද ගියා"

"එහෙනම් අද අරූ එක්ක බයිසිකල් සවාරියක් යන්න ඇති... තුහංස කෝපයෙන් සිතුවේය.

"කමක් නැහැ නංගී... ඔයා අක්කිට කියන්න හංස අයියා ආවා කියලා... මට කොල් කරන්න කියන්නකෝ" ඔහු කෝපය සඟවා ගනිමින් කීවේය.

මේකි හංසිගේ අච්චුව වුණාට කඳුළු බෝල දිලිසවන ඒ ලස්සන ඇස් දෙක මේකිට නැහැ... වාහනය පණ නංවා ගනිමින් තුහංස සිතුවේය.

# 06

"ඇයි අක්කි ඔයා රහල් අයියා එක්ක යාළු වුණේ"

තියුමි සස්වින්දිගෙන් ඇසුවේ රාත්‍රී නිදි යහනේදී තුහංසගේ කඩවසම් රූපය සිහිකර ගනිමින්ය. තිගැස්සුණු සස්වින්දි යහනේ වාඩි වී බිත්තියට හේත්තු වී කොට්ටයක් තුරුලට ගෙන සූදානම් වුණේ දිගු කතාවකට මුර පුරන්නට සිතා ගෙනයි. තියුමි කෙසේ හෝ රහල්ට ළං කිරීම ඇයගේ අරමුණ විය.

"ඒක ගොඩාක් යාළුකමකට සමීප සම්බන්ධයක් මිස දුර ගිය එකක් නෙවෙයි නංගා"

"ඒ කිව්වේ"

"මම රහල්ට ආදරේ කරනවා... රහල් මට ආදරේ කරනවා... ඒත් කවදාවත් මට එයාගේ වයිෆ් වෙන්න අදහසක් නැහැ"

"ඒක එයා දන්නවද"

"දන්නවා... ඒත් ඒකට ඉඩ දෙන්න කැමති නැහැ... ගැලපෙන කෙල්ලක් යාළු කර ගන්න කසාද බැඳගන්න කිව්වා කියලා මාත් එක්ක හිත හොඳින් නෙවෙයි ඉන්නේ"

"පුදුම ලව් එකක්නේ... මම ඇහුව්වමයි කෙල්ලක් තමන්ගේ කොල්ලට කියනවා කියලා වෙන කෙල්ලක් බැඳ ගන්න කියලා"

"ආදරේ විවිධයි නංගී... එක එක්කෙනා ආදරේ කරන්නේ එක එක විදිහට"

"මන්දා... මට තේරෙන්නේ නැහැ"

"රහල් හරිම හොඳ කොල්ලෙක්... ඒ වගේ කොල්ලෙක් ලබන කෙනා හරි පින්වන්තයි"

"ඉතින් ඔයාට බැරි ඇයි ඒ පින්වන්ති වෙන්න"

"ඒකට හේතුවක් තියනවා නංගී" සස්වින්දි පැවසුවේ හඬා වැටෙන හදවත පිටතට නොපෙන්වමින්ය.

"හේතුව හංස අයියද" තියුමි අසද්දී කොට්ටය අත හැරිය ඇය සැනින් තියුමිට ළං වූවාය.

"අද හංස අයියා ආවා අක්කිව හම්බ වෙන්න ක්ලාස් එකට"

"කොහොමද ඔයාට හම්බ වුණේ"ඇය ඇසුවේ නැතිගෙනයි.

"එයා මට කතා කළා..."

"මොනවද ඇහුව්වේ" සස්වින්දි ඇසුවේ නොයිවසිල්ලෙනි.

"ආව්... ආව්... මෙයාට ඒක දැන ගන්න තියන හදිස්සියක්... බය වෙන්න එපා... ඒ වගේ හැන්ඩ්සම් කොල්ලෙක් මගේ ලස්සන අක්කට මිසක් මට වහ වැටෙන්නේ නැහැ"

"පිස්සු..."

පුළුවන් නම් මම ඕකාව මරණවා... ඕකට ඕනි ගෑනියක් විතරයි... ලස්සන වැඩක් නැහැ... අඩුම තරමේ වයසවත්... සස්වින්දි හදවතින් පවසා ගත්තේ පෙරදා තුහංස රැගෙන ආවා යැයි කියූ ගැහැණිය සිහිකර ගනිමින්ය.

වෙත මොනවද කිව්වේ" සස්වින්දි ඇසුවාය.

"එහෙමම කියලා මොනවත් ඇහුව්වේ නැහැ... වගේ නිසා මමත් අක්කි වගේ වස බෝතලයක් වෙන්න ඇති කියලා හිතා ගන්නද ඇහුව්වා... අවුලක් වුණානේ"

"ඇයි... මොකද්ද"

"මම කිව්වා ඔයා බොයි ෆ්‍රෙන්ඩ් හම්බ වෙ කියලා... ඒක අවුල් වෙයිද"

"නැහැ... එහෙම කියපු එක හොඳයි"

"පව් අක්කි... ඔයාට එපා නම් මට දෙන්න එයාව

"තියුමි මේ..." සස්වින්දි කෝප වූවාය.

"සොරි අක්කී..." තියුමී පැවසුවේ සෙමින්ය.

"එයා පොඩ්ඩක්වත් පව් නැහැ... හීනෙකින්වා එපා එයා වගේ කෙනෙක් ගැන... යන්නේ නැහැ රස්තියාදු කාරයොන්ට පත් උත්තර සපයන්න"

"රස්තියාදු විදිහට හිටියට හැන්ඩ්සම් ගතිය නි පොඩි ඩීසන්ට් ගතියකුත් පේනවා"

සස්වින්දි එයට කිසිත් නොකීවාය. ඔහුගේ සි ගන්නා සුළු වැදගත් පෙනුමට තමාද වශීවූ දින නැතුව

"ආ... ඔන්න ඔයා කෝල් කරන්න ඉස්සෙල්ලා කරනවා"

තියුමි සස්වින්දිට පැමිණි 'හංස... යැයි නාමාවලි කොට තිබූ දුරකථන අංකයට සම්බන්ධ වූවාය. සස්වි කළේ ඇමතුම ලබා ගැනීමට වුවත් තියුමි නොතැබුවාය.

"අයියේ... මෙන්න ෆෝන් එක උදුරගන්න දඟල බනින්න එපා... මම එයාට කෝල් එකක් ගන්න කිව්වා

වදෙන් පොරෙන් කියා ගත්තාය.

"ආ... නංගි නිසයි එහෙනම් ෆෝන් එකට ආන්සර් කළේ... හරි නංගි එහෙනම් ඔයා ඔහොමම ලවුඩ්ස්පීකර් ඔන් කර ගන්න"

"අයියෝ... මෙයා උදුරනවනෙ" කෑගසමින් කියූ තියුම් කෙසේ හෝ හඬ වැඩි කරගත්තාය.

"හංසී... ෆෝන් එක කට් කරලා මාව කේන්ති කරන්න එපා... මගේ එක්ක සෙල්ලම් කරලා මගේ කට අවුස්ස ගන්න එපා" තුහංසගේ තර්ජනයට ඇය නිහඬ වූයේ කේන්තිය ඔහු කුමක් පවසාවිදැයි සිතා ගත නොහැකි වූ නිසාය.

"හංසී... අනේ... ඔයා අපේ අක්කිට කතා කරන්නේ හංසි කියලද"

"ඔව්... ඔයාගේ අක්කිට දාලා තියෙන්නේ මගේ නමේ ගෑනු නමනේ"

"ඒ නම දාලා තියෙන්නේ ලොකු තාත්තිගේ බොස්නේ... එයා තමයි අක්කිට හංසි කියලා කතා කරන්නේ"

"ඉතින් මම ඒ බොස්ගේ පුතානේ... ඒකයි මමත් හංසි කියලා කතා කරන්නේ"

"රි..යලි... සෝ... ස්වීට් අනේ"

"ඔයාගේ අක්කි නම් නෙවෙයි... මම... ද..."

"හංස අයියා... අනේ ඔයා ෂෝක් අනේ..."

"ෂෝක් නෙවෙයි... මට අක්කි එක්ක කතා කරන්න බැරි වෙයිද දැන්"

"නැහැ... නැහැ... සොරි... එක්ස්ට්‍රීම්ලි සොරි... මම යනවා... කාමරෙන් එළියටම යනවා... ඔයාලා ඕන එකක් කතා කර ගන්න" තියුම් සස්විත්දි දුරකථනය ලබා දී කාමරයෙන් ඉවතට ගියාය.

"හංසී... මොකද්ද මේ නටන නාඩගම"

"මට තමුසේ එක්ක කතා කරන්න දෙයක් නැහැ"

"ඒ වුණාට මට තියනවා... ෆෝන් එක තිබ්බොත් මම ඔතන ඇති"

තියුම් පසු පසින් ඔහු බෝඩිමට පැමිණියාදෝයි සැකයක් සස්වින්දිට විය. ඇය දුරකථනය විසන්ධි නොකළේ ඒ නිසාය.

රත්නපුරේ සිටි තුහංසට සිනහා නැගුනේය. හිතන්න ඇති මම ඉන්න තැන ළඟ ඉන්නේ කියලා... ඔහු සිතුවේය.

"කොල්ලෙක් හොයාගෙන රවුම් ගැහුව්වා නෙවෙයි උඹ එක්ක කරන්න පුළුවන් හැම මගුලම කෙරුවත් මට කමක් නැහැ... ඒත්... සල්ලි ලැබෙන කල් උඹ මගේ එක්ක එන්න ඕනේ හංසී... මේක නියෝගයක්"

"ඒ නියෝග තමුසෙම තියා ගන්නවා... මම තවදුරටත් ඒවට යටත් නැහැ කියලා හොඳට මතක තියා ගන්නවා... මම තමුසෙට බය නැහැ... පුළුවන් දෙයක් කරනවා"

"මට ඕනැති සල්ලියක් නැහැ බලා ගනින්... මම තොපි දෙන්නවම මරණවා" තුහංස කෑගැසුවේය.

"ඒක කැමැත්තක්... කොහොමත් තමුසේ වගේ මිනිහෙක්ගේ අභිසාරිකාවක් වෙලා ජීවත් වෙනවට වඩා මැරෙන එක මට සැපයි... මමත් මේ ජීවත් වෙන්නේ මැරෙන්න බැරි කමට මිසක් ආසාවට නෙවෙයි" කියූ සස්වින්දි දුරකථනය විසන්ධි කළේ තුහංසව කෝපයෙන් වියරු වට්ටවමිනි.

සිතේ වූ නොසන්සුන්කම අසහනය නිසාවෙන්ම තුහංස වාහනයක් නිසාවෙන් සුළු අතපසුවීමකට නොදන්නා පිරිසක් සමඟ ගැටුමක් ඇති කර ගත්තේ බරපතල හේතුවකට නොවේ.

පොලිසිය සමඟත් ගැටුමක් ඇති කර ගත් ඔහුට දින තුනක බන්ධනාගාරයට යන්නට සිදුවූයේ එය සති අන්තයක් වූ නිසායි.

තමාගෙන් පහරලත් අයට වන්දිගෙවා තුහංස උසාවියෙන් නිදහස් වන විට තිමිර විදේශගත වී තිබිණි.

තුහංස පරිඝණක පන්තියට පැමිණ ගිය සතියට පසු සතියේම සස්වින්දිගේ ඉල්ලීමට ඇයගේ පන්ති දිනය වෙනස් කර ගැනීමට ඉඩ ලැබිණි.

සස්වින්දි තමා මඟ හැර කෙසේ හෝ පැන ගන්නා බව දැන

සිටි තුහංස නැන්දාගේ නිවස අසල රුකවලෙක් යොදා සිටියේය.

මනෝජ් නොදැක වැඩි කාලයක් ගත කිරීම අපහසු වූ නිසාම එදා සස්වින්දි තියුමි නැන්දාගේ නිවසට යවා රහසින් උඩ වලවේ ඇයගේ නිවසට පැමිණියාය. නිවසට පැමිණි මොහොතේම පැමිණි ඇමතුමට ඇය ප්‍රතිචාර දැක් වූයේ එය තියුමිගේ දුරකථන අංකය නිසාය.

"ඇයි නංගා"

"නංගි නෙවෙයි හංසි මම" තුහංසගේ හඬට සස්වින්දි වෙව්ලා ගියාය.

"ඔයා ගෙදර එනවා කිව්ව නිසා මම නංගිවත් මේ රත්නපුරේ එක්ක එනවා"

"හ... හං..ස" සස්වින්දි පුටුවෙන් නැගිට්ටුණාය.

"එයා මට කෑගල්ලෙදී හම්බ වුණේ... මෙහෙ එමු කිව්වම හා කියලා මගේ එක්ක ආවා" සස්වින්දිට හඬ අවදිකරවා ගත නොහැකිවිය.

"මම එන ගමන් කලවාන වත්තටත් ගිහින් එන්නේ... ඒක කියන්නයි ගත්තේ" ඔහු කීවේය.

"හංස..." එවර සස්වින්දි කෑගැසුවාය.

"අක්ක වගේ නෙවෙයි නංගි හරි කීකරුයි... නේද නංගා" කියූ තුහංස තවත් වචනයක් හෝ පැවසීමට ඉඩ නොතබා දුරකථනය විසන්ධිකර දැමුවේය. සස්වින්දි එළෙසින්ම බිමට පහත් වූවාය.

'අක්කා වගේ නංගිත් තව ටිකකින් නිතියෙන් කසාද නොබැඳපු බක්මීමල්දෙණිය කෙනෙක් වෙයි... හංසගේ දුරකථනයෙන් ඇයට පැමිණියේ පණිවිඩයකි. සස්වින්දිගේ ගතම පණ නැතිවී ගියාය.

තුහංසව මරා දැමීමට තරම් කෝපයකින් ගත වෙව්ලද්දී සස්වින්දි මොහොතින් මොහොත තුහංසව හා තියුමිව සම්බන්ධ කර ගැනීමට උත්සහ කළද ඵලක් වූයේ නැත. ඒ වන විට තියුමිද තුහංසගේ කීම මත දුරකථනය විසන්ධි කරගෙන තිබුණාය. අවසානයේ සස්වින්දි සීතාට ඇමතුමක් ගත්තාය.

"ඇයි දරුවෝ කලබලයෙන්"

"අනේ නැන්දේ... අනේ... හංස එනවා මගේ නං

අනේ... " සස්වින්දි කෑගැසුවාය.

"අනේ සමන් දෙවියනේ... මෙහෙම අපරාධයක්"

"මගේ නංගිව පරිස්සම් කරලා දෙන්න නැන්දේ

පින් සිද්දවෙයි ඔයාට... මම එනවා... අනේ... මම එ

පැයක්... එයාව පරිස්සම් කරලා දෙන්න නැන්දේ...

විලාප තැබුවේ එකම අදෝනාවකිනි.

"දූලගේ තාත්තත් ගෙදර නැහැ... මම බලන්නම්"

"අනේ බුදු බව අත් වෙයි නැන්දේ"

"නෝනා ඉක්මනටම එන්නකෝ... මම මොන

හරි නෝනගේ නංගිව බේර ගන්නම්"

උන් තැනින් නැගී සිටි සස්වින්දි කාර්යා

මනෝජ්ට හෝ අසල්වාසියෙකුට හෝ නොදන්වා ඇ

මුදලගෙන එළියට බැස්සාය.

හංස... මගේ නංගිට අපරාධයක් කරලා තිබු

උඹව ඉතුරු කරන්නේ නැහැ... මාරාගෙන ම

අපරාධකාරයා... උඹට හොඳක් වෙයිද...

අසත්පුරුෂයා... ඇය මොහොතක් මොහොතක් ගා

සාප කරමින් බැන වැදුනාය.

ඇය කලවාන නිවසට පැමිණෙද්දී සීතා සිටියේ

හඬමින් සිටි ඇය වෙත සස්වින්දි ගියේ හද දැවෙද්දීය.

"අනේ මට සමාවෙන්න නෝනේ... පුංචි මහත්

එළියට දාලා දොර වහ ගත්තා දෙයියනේ"

දෙපා වාරු නොවෙද්දී ඇය ඉස්තෝප්පුව ම

වැටුනාය. සීතා ඇය වෙතට දිව ආවාය.

ඇයගේ වාරුවෙන් නැගී සිටි සස්වින්දි මද

අසිහියෙන් මෙන් බලා සිට දිව ගොස් දොරට ගැසු

හෝ අවධිකර ගැනීමට හැකියාවක් නැතිවයි.

තුහංස දොර හරිද්දී වියරුවෙන් ඔහු දෙස බලා ඔ

පපුවට වැරෙන් පහර කිහිපයක් ගැසූ ඇය තරහව වාවා ගත නොහැකි කම නිසාවෙන්දෝ තුහංස මතටම කඩා වැටුණාය.

"හංසි..." තුහංස ඇයව දෝතට ගත්තේය.

සීතලට මුහුණට වැටුණු දිය පොදෙන් සිහි එළවාගත් සස්වින්දි යහනින් නැඟී සිටියාය.

"පුංචි නෝනේ..." සීතාගේ හඬ නැසුණු ලෙසින් ඇය තියුම් දෙසත් තුහංස දෙසත් බැලුවාය.

"ඇයි අක්කියෝ... මොකද ඔයාට වුණේ" තියුම් ඇසුවාය.

සීතා එතැනින් ඉවත් වෙද්දී සස්වින්දි බැලුවේ යහන දෙසයි. ඇයව වටහාගත් තුහංස ඔහු දෙස බැලූ ඇය අසලින් ගෑවෙන නොගෑවෙන ලෙසින්ම වාඩි වූයේ කට කොනකට සිනහවක් නගා ගනිමිනි.

ඇය නැඟී සිටීමට සූදානම් වෙද්දී තුහංස ඇයව වැළකුවේය. කෝපයෙන් ඔහුව තල්ලු කළ ඇය වියරුවෙන් මෙන් ඔහුට පහර දීමටත් සීරීමටත් පටන් ගත්තේ ඉකි ගසමිනි.

"අක්කි ඔයාට මේ මොකද වෙලා තියෙන්නේ... ඇයි හංස අයියට ගහන්නේ... නවත්තන්න" තියුම් ඇයව වැළකුවාය.

"ඔයාගේ අක්කා බය වෙලා මම ඔයාව මෙහෙ ගෙනාවට"

"ඇයි බය වෙන්නේ... ඉතින් මම ඔයාට කෝල් කළානේ" තියුම් පැවසුවේ වගක් නැතිවයි.

ඇයගේ සැහැල්ලුව සස්වින්දිට චකිතයක් විය. සීතා එළියට දමා දෙදෙනා දොර වසාගෙන... තුහංස කොතරම් ආවේගශීලී හැඟීම් වලට වහල් වූ පුද්ගලයෙක්ද යන්න සස්වින්දි දනී.

ගෙනා ගැහැණිය මෙන්ම චිතුද මුදා හැරියේ සීතා නිසාවෙන් වන්නට ඇතැයි සස්වින්දි සිතා සිටියාය. තමා ඉදිරියේ වරකට සැනසීමක් ලබා නොගන්නා ඔහු තමාගේ හැඩ රුවම ගත් නැගෙණිය ඉදිරියේ බවුන් වැඩුවේ යැයි කිසිසේත්ම විශ්වාස කළ නොහැකිය.

"ඔ..යා... තියුම්... ඔයා..." ඇයට ගොත ගැසිණි.

"මොකද අක්කි ඔයාට වෙලා තියෙන්නේ"

"එයාට වෙලා තියනදේ මම දන්නවා... මම එයා ගන්නම්... තියුමි... ඔයා යන්න... තැන්ක්ස් ඔයාට"

"මේ... තැන්ක්ස් කරලා හරියන්නේ නැහැ... අක්කි ගෙන්නලා දුන්නට මට මොනවා හරි ඕනි"

"ඕ..කේ... මේ හංස අයියා පොරොන්දු කඩන්නේ නැහැ... ඔයාගේ අක්කි වගේ" තුහංස සස්වින්දි දෙස බලා කීවේය.

සස්වින්දි තවම සිටියේ අන්ද මන්ද ගතියෙන් පහසුවට හඬ නඟා ගැනීමටවත් නොහැකිවයි.

"ඩ්‍රයිවර් එක්ක යන්න... සීතා එයි ඔයාගේ තනියට" තුහංස කීවේය.

"අක්කි... එයා"

"එයාව මම තියා ගෙන පස්සේ එවන්නම්... පේන් නැද්ද අද බයටම කටත් වැහිලා... බලියක් ඇරියම හරි" සස්වින්දි තුහංස දෙස කෝපයෙන් බලා නැඟී සිටියාය.

"ඉන්න... මාත් එනවා" ඇය කීවාය. තියුමි ඉදිරියේම ඇයව තුරුලට ගත් තුහංස ඇයගේ වතට නැඹුරු වූවේය.

"යන්න... හැබැයි ඒ වෙනුවෙට නංගි මගේ එක්ක ඉදියි" ඔහු රහසින් කීවේය. සස්වින්දි දෑස් විසල් කොට ඔහු දෙස බැලුවේය.

"නංගි තවම බේරිලා... එයාව බේර ගන්න ඕනේ නම් අක්කා ඉන්න වෙයි... කැමැත්තක්... අක්කා බලෙන් ගත්තට නංගිව කැමැත්තෙන් ගන්න මට පුලුවන්"

සස්වින්දි තියුමි දෙස බැලුවාය. ඇය සැහැල්ලුවෙන් සිනාසෙමින් ඔවුන් දෙස බලා සිටියේය. ඇයගේ සැහැල්ලුව නිසාවෙන්ම මෙතෙක් වෙලා දෙඩිගියාවෙන් තිබූ සිත එක්තැන් කර ගනිමින් තුහංස සත්‍ය පවසන බව සිතන්නට ඇය පෙළඹුණාය.

"අක්කි... ඔයා ඉන්නවද" තියුමි අසද්දී සස්වින්දි හිස සෙලවූවාය.

"හෙට උදේ එවන්නම්... ගෙදරට මේප් එකක් දාන්න"

" හෙට උ...දේ..." තියුමි දෑස් විසල් කළාය.

"බය වෙන්න එපා... අක්කා මගේ එක්ක ගොඩා දුර ඇවිත් ඉන්නේ මේ වෙන කොට"

තියුමි සස්වින්දි දෙස බැලුවාය. ඇයගේ දෑස් මඟ හැරිය සස්වින්දි තුහංස දෙස බැලුවාය.

"අනේ බැහැ හංස... මට යන්න ඕනේ"

"තියුමි... ඒක මම ඔයාට කොල් කරලා කියන්නම්" තුහංස සස්වින්දිව මායිම් නොකර කීවේය.

"සීමා පන්නන්න එපා හංසී... නංගිටත් අක්ක එක්කම ඉන්න වෙයි" තුහංස රහසින්ම ගිගිරුවේය.

"තියුමි යන්න... මම එන්නම්" සස්වින්දි සෙමින් බිම බලාගෙනම කීවාය. තියුමි සස්වින්දි දෙස බලා සිටියාය.

"අරයව බඳින්න බැහැ කියන්නේ ඒකයි එහෙනම්... කමක් නැහැ... දන්නවනේ... එයාට වඩා මම හංස අයියට කැමතියි" සස්වින්දි කිසිවක් නොකීවාය. රහල්ගේ නම නොකීම ගැන ඇයට දැනුනේ සැනසීමකි.

නිකන් හරි නම කිව්ව නම්... අනේ ඇති යන්නම්... සස්වින්දි සුසුමක් හෙලා ගත්තාය.

"මම ගිහින් එන්නම් අක්කී... අයියේ... බුදු සරණයි"

තුහංස පැමිණ යහනේ සස්වින්දි අසලින් වාඩි වූවේය. ඇය තමාව කෝප කර සිටි ආකාරයට තමා ඇයට කුමක් කරාවිදැයි තමාවත් නොදැන සිටියේය.

එහෙත්... මේ රතු වන කඳුළු ඇස්තම දෑස මානයේ නම් ඇය තම හැඟීම් අවුස්සවා සියල්ල අමතක කර දමන්නේය. තුහංස සස්වින්දිගේ කම්මුලක් සෙමින් සිප ගත්තේය.

"කවුරු ගැනද ඒ කිව්වේ"

"කවුරු ගැන වුණාම තමුසෙට මොකද" ඇය පැවසුවේ කෝපයෙනි. තුහංස වහා සුරතින් ඇයගේ කම්මුල් මිරිකා අල්ලා ගත්තේය.

"මම උඹට බොහොම හොඳින් කියන්නේ... මම මේ කේන්තිය කේන්තිය අමතක කරලා ඉන්න වෙලාවේ උඹ මගේ කේන්තිය අවුස්සලා දඟලන්න එපා... සමහර විට මගෙ අතින් මැරුම් කරයි"

"ඒක හොඳයි" තුහංසගේ අත අපහසුවෙන් ඉවත් කර ගත් සස්වින්දි පැවසුවේ හීන් හඬිනි.

"උඹට මැරෙන්න ඕනේ නම් එදා මැරෙන්න තිබ්බා හංසී... උඹ මගේ එක්ක තියන තරහට පලිගන්නවා... මතක තියා ගන්නවා ඒවට විද වන්න වෙන්නේ උඹටමයි... රිදෙන්නේ උඹටමයි"

"හිතේ තියන වේදනාවට ගතේ වේදනාව මොකද්ද හංස... ඒක මොහොතකට විතරයි... නැති වෙලා යනවා"

"එදා පපුවට තද පාරක් වැදිලා තිබුණද" ඔහු ඇයගේ ළය පිරිමදිමින් ඇසුවේය. සස්වින්දි ඔහුගේ සුරත ඉවත් කළාය.

"ඔය ඉතින් දඟලන්නේ ආපහු නංගිව ගෙන්න ගන්න තමයි"

"ඒපාර නංගියෙක් අල්ල ගත්තද... මුලින් තාත්ති මරණවා කිව්වා... ඊට පස්සේ තාත්තිට කියනවා කියලා බය කළා... දැන් තියුමි අල්ලගෙන"

"ඔව්... එහෙම තමයි මම... තියුමිට දෙන්න ඕනේ එක කෝල් එකයි... ඒකි පට ගාලා ආපහු එයි" සස්වින්දි වහා තුහංස දෙස බැලුවාය.

"ඒකි මට පණ ඇරලා... ආදරෙයි... කැමතියි"

සස්වින්දි සිහි වූයේ පෙරදින තියුමි පැවසූ වදන්ය. තුහංස පවසන්නේ මුසාවක් නොවේ.

"ඒකිට මම ඇඳට නගින්න කිව්ව නම් ඒත් නගියි... පිස්තෝල ඕනේ වෙන්නේ නැහැ" සස්වින්දි නැවතත් දැවී ගියාය.

"බය වෙන්න එපා... ඒකිට මගේ සුසුමක්වත් වැදුනේ නැහැ... මට ගනුදෙනුව තියෙන්නේ තමුසේ එක්ක... ඒකි එක්ක

නෙවෙයි... ඒත් මට ඒකිව ආයුධයක් කර ගන්න බැරි කමක් නැහැ... තමුසෙගේ නංගි නිසා"

"තියන ගණු දෙනුවක් මගේ එක්ක බේර ගන්න හංස... එයා අත ඇරලා"

"මතකනේ තමුසෙ මට දාපු පුස් පාට්... කිව්වේ හම්බුණ දාට බලාගමු කියලා... අද මම තමුසෙට දෙන්න පුළුවන් වද ඔක්කොම දෙනවා"

"මම ඒ ඕනි එකක් විද ගන්නම්... මගේ නංගි වෙනුවෙන් කරන්න බැරි දෙයක් නැහැ" සස්වින්දි දෑසට කඳුළු පුරවාගෙන කීවාය.

"මේ කඳුළු ඇස් දෙක තමයි මාව පිස්සු වට්ටවන්නේ" කියූ තුහංස සස්වින්දිව ඔහු වෙතට ඇද ගත්තේය.

මොහුගේ හැඟීම් ආවේග ගැන හිතන විට ඔහු තියුමි අත ඇරියාද යන්න ගැන පූර්ණ විශ්වාසයක් සස්වින්දි තුල නොවීය.

ඇයට යම් අකරතැබ්බයක් වී ඇය තුහංසට වූ දැඩි ලැදයාව නිසාවෙන් ආසාවට ඇති වූ ලෝභකම නිසාවෙන් නොකියා සිටින්නේද... සස්වින්දි නැවත දැවී යන්නට වූවාය.

"තියුමිට මොනවා හරි වෙලා තිබුණොත් මම තමුසෙවත් මාර ගෙන මැරෙනවා... හැබැයි ඊට කලින් මගේ තාත්ති තමුසෙව මරයි" සස්වින්දි පැවසුවේ දත් කමින්ය.

ඇයගේ කතාවට තුහංස තුල වූ කෝපය දළු ලන්නට විය. ඔහුට පෙරදා මනෝජ් පැවසූ උද්දච්ච වදන් සිහිවිය.

"තමුසෙගේ තාත්තා... ඌද මාව මරන්නේ... ආ... නාකියා එදා මට කියනවා තමුසෙව කපලා ගඟට දැම්මත් මට දෙන්නේ නැහැ කියලා... අද මම තමුසෙට කරන දේ දැක්කම තමුසෙව කපලා ගඟට දාන්න නෙවෙයි... එයාට ගඟට පනින්නයි වෙයි" කෝපයෙන් කියූ තුහංස නැඟිට දුම් වැටියක් දල්වා ගත්තේය.

තමා සමඟ සිටින මොහොතට තුහංස දුම් වැටි දල්වා නොගත්තේ සස්වින්දිගේ ඉල්ලීමට වඩා එය ඇයට අපහසුවක් බව තුහංස වටහාගෙන සිටි නිසයි.

සිටින්නට සිතුවාය.

සිඟරට් දුම අයගේ වතට මුදා හරිද්දී ඇය ඉවස
නිසාවෙනි. ඇයට කැස්සක් ආවද තුහංස හඬින් සින
ඉවසා සිටියාය.

"දැන් කවුද ඉස්සෙල්ලා තියුම් කිව්ව එකා
නෑසුණු කනින් සිටියාය.

"කවුද ඌ... කොහේ එකෙක්ද" ඔහු කෑගැසුවෙ
සස්වින්දි නිහඬව සිටියාය.

"හංසි කියපන් මට... කවුද ඒකා" තුහංස සිඟර
ඇයගේ ළයට ළං කරමින් ඇසුවේය. රස්නය දැනුන
ගත් ඇය නිහඬ වූවාය. තුහංස එය ළයේ තැබුවේ
වේදනාවෙන් කෑගසද්දී සිඟරට්ටුව විසිකර
සස්වින්දිගේ ළයේ පිළිස්සූ තැනට දෙතොල තැබුවේ

මද වේලාවක් දෙතොලින් එතැන පිරිමැදි ඔහු
සස්වින්දිගේ කඳුළු දෑසටද සිපුමක් ලබා දීගෙනය.

සස්වින්දි තුහංස දෙස බලා සිටියේ අරමුණකින
එහෙත් ඔහුව වටහා ගන්නට සස්වින්දි ඒ
අපොහොසත් වූවාය.

"මොනවද කන්න වගේ බලාගෙන ඉන්නේ
ඇසුවේ ඉවත බලාගෙනය.

"පුච්චලා ඉවරද... ඇයි හංවඩු ගහන්න බැරිද"

"තමුසේ මොන කෙල්ලක්ද කියලා මට තේ
බැහැ හංසී"

"තමුසේ තේරුම් ගන්නත් එපා... තමුසෙට තේ
බැරි වෙයි"

"තේරුම් ගන්න බැරිකමක් නැහැ... තමුසෙට
යකෙක් කරන්න... පිස්සෙක් කරන්න... එතකොට ම

"මොනවද"

"කෝටි ගාන අරන් අර කියන මිනිහා එක්ක යන්න"

"ඇයි රිදෙනවද... මම වෙන මනුස්සයෙක් එක්ක යයි කියලා බයද" සස්වින්දි ඔහුගේ වතට එබී ඇසුවාය.

තුහංස මොහොතක් තම වතට අඟලක පරතරයෙන් තිබූ ඒ වත දෙස බලා සිටියේය. කුමක්දෝ නොදන්නා හැඟීමකින් මේ වත ඉදිරියේ තමා පසු බසින බව තුහංස ඒ මොහොතේ වටහා ගත්තේය.

මේකිගේ ලස්සනට මම ආසයි... මේකි මට දෙන සතුටට මම ලෝබයි... ඒකයි මට මොහොතට හැමදේම අමතක වෙන්නේ...

"රිදෙන්නේ මගේ සල්ලි ගැන හිතෙන කොට" ඔහු සුපුරුදු තත්වයට එන්නට උත්සහ දැරුවේය.

"මට මේ කළ අපරාදෙට සතයක්වත් දෙන්න වටින්නේ නැහැ... ඒත්... මම ඔයාගේ ඔය කෝටි ගාන දෙනවා හංස... මටවත් මගේ තාත්තිටවත් අනුන්ගේ දේවල් එපා... ඒ නිසා ඔයා සල්ලි ගැන හිතලා රිදවා ගන්න එපා"

"සල්ලි ටික මට දුන්නට පස්සේ එක මිනිහෙක් බැරි නම් දහයක් එක්ක හරි යනවා... මට කමක් නැහැ"

"මෙහෙම වුණු කෙල්ලන්ට උරුම මහපාර තමයි හංස... සල්ලි වලට මිනිස්සු සතසවන ඇඟ විකුණන අභිසාරිකාවන් වෙන්නේ මෙහෙම අනාත වුණු අය... එයාලට දහ දෙනෙක් නෙවෙයි ඊට වැඩි ගනනක් එක්ක වුණත් යන්න වෙයි ජීවත් වෙන්න" සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"ඒ වුණාට මහ එකාගේ ලොකුකම... මට නොදී කපලා ඟඟට දාන්නලුනේ යන්නේ... තමුසෙට මහපාරේ අර කිව්ව විදහේ කෙනෙක් වෙන්න වුණත් මම තමුසේ දිහා බලන්නෙත් නැහැ"

"හංස... තමුසේ හිතුවද තමුසේ වගේ නොසණ්ඩාල තිරිසනෙකුට අහු වුණා කියලා මම පාරට වැටෙයි කියලා... ආ... තමුසෙගේ දෙපතුල ළඟට ඇවිත් මාව බාර ගන්න කියයි

"රතු මූණ... කඳුළු ඇස්... කෑගහනවා තව
එතකොට මට තව ඉවසන්න බැහැ" තුහංස
තුරුලු කර ගත්තේය.

"මට සනීප නැහැ" සස්වින්දි පැවසුවේ ආවේ
තුහංසටයි.

"එතකොට..." ඔහු ඇයව අත නොහැරම ඇසුවේ

"මන්දන්නේ නැහැ... බය වෙලා දොස්තරල
නටන්න එපා"

"ඔයාට... "

"මන්දා මොනවා වෙයිද කියලා" තුහංස සස්වින
දැම්මේය.

සස්වින්දි හදවතින් සිනාසුනාය. එහෙත් ඒ සිනා
නොපෙන්වා සිටින්නට උත්සහ කළාය.

"මාව කෑගල්ලට දානවද"

සස්වින්දි ඇසුවේ සිය ආවේග හැඟීම් සියල
කරගෙන සස්වින්දි තුරුලේ තබාගෙන සිටි තුහංසගෙ

"එපා... ඉන්න... උදේට මම ඔයාව ගිහින් දාන
වසාගෙන සිටි තුහංස එම ඉරියව්ව වෙනස් නොකර
ඔහුගේ ළයෙන් හිස මදකට ඔසවා ගත් සස්වින්දි 
ඔහු දෙසම බලා සිටියාය.

ඔහු පාලනය වූ ආකාරය... හොරාවකට වැඩි වේල
තුරුලේ තබාගෙන නිහඬව සිටි ආකාරය... ඇයට ය
දුන්නේය.

පෙරදා නිවසට ගෙනා ගැහැණිය මෙන්ම චිතුව
හැර දැම්මේය. තමාගේ හැඩ රුවම ගත් තුහංස ඉඟිය
නම් කැමැත්තෙන්ම එයට යටත් වන නැගෙණියද ඔහු
දැම්මේය.

අද... අද ඔහු හමුවන මොහොතට වතාවක් නොව දෙතුන් වරක් ඔහුව සනසවන තමාව අසතීපයැයි පැවසූ සැනින් අත හැර දැම්මට හැකි වූයේ නම් ඔහුට එදා තමාව අත හැර දැමීමට අවස්ථාව තිබිණි. එහෙත් ඔහු එසේ නොකළේය.

ඔහු තමාට මෙසේ කළේ මුදල් නිසා ඇතිවූ කෝපයට පළිගැනීමට සිතාගෙනමද විතරක්ද නොඑසේ නම් තමාට වූ ආසාවටද... නොඑසේ නම් වෙනත් හැඟීමකටද යන්න නම් ඇයට වටහා ගන්නට අපහසු විය.

පළිගැනීම පමණක් හිතේ වී නම් ඔහු කේන්තියට පුච්චා දමන මොහොතේම එය වළකන්නේ නැත. තමාට අපහසුවක් වන්නේ යැයි හැඟවෙද්දී වැළකෙන්නේ නැත. හැඟීමකින් නොසිටින මෙවන් මොහොතක විටින් විට තමාව සිප ගන්නට වුවමනාවක් නැත.

ඔහුගේ සිතේ තමා කෙරෙහි වූ තරහව වෛරය සමඟ ආදරණීය හැඟීමක්ද ඇතැයි සස්වින්දි සිතිණි. ඒ සිතුවිල්ලත් සමඟ පෙර සිදුවීම් මොහොතකට අමතක කර දැමීමට තරම් සිත යම් තරමකට මෘදු වෙද්දී ඇය තුහංසට තුරුලු වූවාය. තුහංස ඇය දෙස මද වේලාවක් බලා සිටියේය.

"ඇයි හංස..."

"පිච්චුණ තැන රිදෙනවද හංසි"

"වැරදියට වචන පාවිච්චි කරන්න එපා හංස... පිච්චුණ තැන නෙවෙයි පිච්චුව තැන"

"හරි... කොතන හරි... කට කියවලා මාව යකෙක් කරන කොට... මාව අත ඇරියොත් විදවන්න වෙයි කිව්වා මම... එතකොට කිව්වේ බලාගමු කියලා... බලා ගත්තද දැන්... ආ..." තුහංස ඒ බැල්මෙන්ම ඇසුවේය.

"කන්න වගේ මගේ දිහා බලාගෙන ඉන්න කොට මොනවා බලන්නද" සස්වින්දි සිනාසෙමින් ඇසුවාය.

"මගේ දිහා බලන්න... ඇති වෙන එකක් නැහැ... කෙල්ලෝ වශී වෙලා බලන්නේ" තුහංසද ඇයගේ සිනාවට එක් වුණේය.

"තියුම් මොනාද කිව්වේ"

...... හරි සැහැල්ලුවෙන් ඉන්න කෙටවා...
අක්කි ඔයාට කැමති නැත්නම් ඇත්තමයි මම හංස අ
යාළු වෙනවා කිව්වා" එය ඇය පෙරදාකද තමාට
සස්වින්දි සිහිකර ගත්තාය.

"අක්කට කලින් නංගිව දැකලා තිබුණ නම් අක්ක
ගානට මම උස්සන්නේ නංගිව... කොහෙද අක්ක පි
බය වුණානේ... ඔළුවට තිබ්බා විතරයි ඇඳටත් නැංගෙ

"තැන්ක්ස්..." සස්වින්දි තුහංසගේ ළය මෘදුව
කීවාය.

"අප්පා... ආයෙත් කියන්න බලන්න...
නැහැ" තුහංස සිනා සෙමින් සස්වින්දිගේ මුවට
කළේය.

"මම කොහොම ආවද කියලා මම දන්නේ නැ
සීතා නැන්දා එළියේ දකිනකොට මට මොනවද වුෙ
මමවත් දන්නේ නැහැ"

"මේ මදාවියා... නරුමයා... අසත්පුරුෂයා..." තුහ
වචනයක් වචනයක් පාසා සස්වින්දි දෙස බැලුවේය.
හඬින් සිනහා නැඟිණි.

"මට ප්‍රශ්නේ තියෙන්නේ ඔයයි තාත්තියි එක්
හංසී... වෙන අය එක්ක නෙවෙයි... මම තියුම්ව පට
ඔයාව ගෙන්න ගන්න"

"මම හොඳටම බය වුණා"

"මීට පස්සේ එන්න ඕනේ මෙහෙම රැයක් ඉදල
පැය ගානට ඔයාව ගෙන්න ගන්නේ නැහැ ආය මම"

"පිස්සුද හංස... තාත්ති ඉන්නෙත් මේ රත්නපුල
මෙහෙම ආවට"

"තියුමි ෂේප් කරයි හලෝ... බය නැතුව ඉන්නවා

"බැහැ බැහැ... පැය ගානට දෙන වද මම දන්නෙ
පස්සේ රෑ එළිවෙනකල් වද දෙන්න පටන් ගනියි... මං

"ඔයා වදයක් විදිනවද සතුටක් විදිනවද කියලා මම තේරෙනවා... බොරු ඕනි නැහැ... අර තියුමි කිව්ව කොල්ලා දැනගයි කියලා බයද"

"එක්කෙනෙක් නෙවයි හංස... මුළු ලෝකයක් කවදා හරි මේවා දැන ගයි... මොකද අපට හැමදාම රහස් තියාගෙන ඉන්න බැහැනේ"

"කවුද හංසි එයා"

"කවුරු වුණාම මොකද... මම ඔයා එක්ක එනවනම් ඔයාට ඒවා ඕනි නැහැ"

"කියනවකෝ... දැන ගන්න අහන්නේ"

"අර බයිසිකල්කාරයා... ඔයා දන්නවනේ... නැහැ වගේ අහන්නේ"

"ඒ තිමිර... තියුමිගේ අයියා... ඒක මම හොයා ගත්තා... එයා නෙවෙයි... කවුද කියනවා... ඒ කෙනා... නැත්නම් තමුසෙට ආයෙත් බය වෙන්න වෙයි"

"ඇයි... තවත් කවුරු හරි උස්සන්නද ඕනි"

"කෙනෙක් උස්සන් එන්න ඕනේ නම් මම උස්සන් එනවා... උස්සන් ආව කෙනා ළඟට ගන්න ඕනේ නම් පිස්තෝලයක් තියලා හරි ළඟටත් ගන්නවා"

"පුදුමයි එහෙනම් නංගිව අත ඇරිය එක... මට කලින් එයා අහුවුණා නම් කිව්වේ"

"චිතුට විතරක් නෙවෙයි මේකි මේකිගේ නංගිටත් ඊර්ෂ්‍යායිනේ" නැවත වතාවක් සස්වින්දි ළයට තෙරපා ගත් තුහංස

"ඒ කාටවත් මේ රතුවෙන මූණයි කඳුළු දිලිසෙන ඇස් දෙකයි නැහැ" සස්වින්දිව සිප ගනිමින් කීවේය.

"ඔයා නොකීවට මට ඔයා ආදරෙයි හංස... මට ඒක දැනෙනවා... මට පුළුවන්නම් මම ඔයාව හදා ගන්නවා... සස්වින්දි මුමුණා ගත්තාය.

"මම අනිද්දාට ෆ්ලයි කරනවා හංසි"

"කොහෙටද"

"ඉංලන්ඩ්... ටී ඔඩර් එකක් කම්ෆෝම් කර ගන්න... සති දෙකකට කලින් යන්න හිටියේ බැරි වුණානේ"

"ඔව්... දවස් තුනක් කුඩුවේ ලැග්ගනේ නේද"

"මගේ ඒවා මොනවටද හොයන්නේ"

"අනේ හොයන්නේ නම් නැහැ... ඒත් ආරංචි වෙනවා"

"ඕවා තියෙන්නේ අපි වගේ අයට තමා හලෝ... කවුරු හරි ඒවටත් යන්න ඕනේ... නැත්නම් ඒවා නඩත්තු කරන්නේ කොහොමද"

"ඔයා ඒවා නඩත්තු කරන්න පඩි හදන්න ඕනි නැහැ... අර ගෙදර මනුස්සයට සැනසීමෙන් ඉන්න දෙන්න"

"කෙල්ල මේ" තුහංසට කියවිනි. ඔහු සිනහව වළකාගෙන සස්වින්දි දෙස බැලුවේය.

"කොල්ලට ඕවා කියලා වැඩක් නැහැ..." සස්වින්දිද සිනහව වළකාගෙන කීවේය.

"ඔයා ඉතින් සතුටු වෙන්න ඕනෙනේ ඔයාගේ හතුරෙක් වුණ මම නීතියට අහු වෙනවට"

"හතුරෙකුට වුණත් කරදරයක් වෙනවට මම කැමති නැහැ හංස... ඒ මගේ හැටි... ඒත් ඔයා නීතියට අහු වෙනවනම් මම කැමතියි... එතකොට නීතියෙන් හරි හැදෙයි"

"කට වහගෙන යමුද මොනවා හරි කන්න... දැන් හොඳටම රෑවෙලා... බඩගිනිත් එක්ක"

"තාත්තිට කතා කරන්නත් ඕනි... තියුමි මම කොහෙ ඉන්නවා කියලා කිව්වද මන්දා" සස්වින්දි නැගී සිට යහනේ වාඩි වෙමින් කීවේය.

"එයාට ඉස්සෙල්ලා කෝල් කරලා ඉන්න... මනෝජ් අංකල් සැකයක් හිතෙන්න දෙන්න එපා" තුහංසද ඇය හා වාඩි වෙමි කීවේය.

"සීතා නැන්දා ආවද"

"ගොඩ වෙලාවකට කලින් ආවේ මගෙ හිතේ... උයලා ඇති... මොනවා හරි කමු... ඔයා යන්න... මම එන්නම්" තුහංස නැගිට්ටේය.

"හංස..." සස්වින්දි ඔහුගේ පුරතේ වෙලෙමින් නැගී සිටියාය. තුහංස ඇයගේ වතට එබුනේය.

"බොන්න එපා... ප්ලීස්..." ඇය කෙඳිරිල්ලක් ලෙසින් ආයාචනා කළාය.

"බලමු"

"බිව්වොත්... මම සීතා නැන්දා ළඟට යනවා" තුහංස සැනින් ඇයව ළඟට ඇද තෙරපා ගත්තේය.

"පුස් පාට් එපා... දන්නවනේ... බිබී ළඟ තියා ගන්නවා"

"එතකොට..."

"මන්දන්නේ නැහැ"

"ලේ..."

"ගලපුදෙන්... මම බය වෙන්නේ නැහැ" සස්වින්දි හඬින් සිනාසුණාය.

"උඹට මම... දැන්මම..." තුහංස උත්සහ කළේ ඇයව අල්ලා සිප ගන්නයි. එහෙත් ඊට පෙර ඇය ඔහුගෙන් මිදී දිව ගියාය.

රාත්‍රියක් තුහංසගේ තුරුලේ ගෙවූ සස්වින්දි පසුදා අවදි වූයේ ප්‍රබෝධමත් සිතිණි. මත්පැන් උගුරක් තොල නොගා ඇයගේ පහස නොපතා ඔහු ඉතා ආදරණීය අයුරින් ඇයව තුරුලේ තබාගෙන රැය පහන් කළේය.

"පුංචි මහත්තයාව හදන්න පුළුවන් පුංචි නෝනට... ඒක මට විශ්වාසයි" පසුදා උදෑසන කුස්සියට ගිය මොහොතේ සීතා කීවාය.

ඔව් හංස... ඔයා මට ආදරෙයි... මම ඒක දන්නවා... මම ඔයාට අදරේ නැතුව ඇති... මොකද මගේ ආදරේ රහල්... ඒත්...

මගේ ජීවිතේ... ඉරණම... ඔයා... ඒ නිසා මම ඔයා ළඟින් ඉඳලා ඔයාව හදා ගන්නවා... සස්වින්දි සිතුවාය.

කලකට පසුව මුණ ගැසුණු දා සිට නයි මුගටි මෙන් කුලල් කා ගැනීමට සිදුවීම් සිදු වුවද... ඒ අයුරින් කුලල් කා ගත්තද... ඔහු තමා හා ගතින් බැඳෙද්දී ඒ සියල්ල අමතක කළේ ලද සතුට නිසාවෙන් බව සස්වින්දි දැන සිටියාය.

පෙර දින රාත්‍රිය එවැනි බැඳීමකින් තොරවම ඔහු තමා හා සතුටින් ගත කළේය. ඒ අන් කිසිවක් නිසා නොව ආදරය නිසාම බවට සස්වින්දි සිතා ගත්තාය.

මාත් උත්සහ කරන්නම් හංස... මට පුළුවන් උපරිමයෙන් ඔයාට ආදරේ කරන්න... සමුගන්නා මොහොතේ සිපුමකින් සමුදුන් ඇය තුහංසගේ ගමනට ආශිර්වාද ලබා දුන්නේ හදවතිනි.

පසුදා සස්වින්දි සමඟ පැමිණි තුහංස තියුමිව රවනැල්ලෙන් ජීප් රියට නංවා ගෙන ඔවුන් කෑගල්ල ඇරලුවේය.

"සෝරි අක්කී" තුහංස පිටව ගිය මොහොතේම ඇයගේ දෑත් අල්ලාගත් තියුමි කීවාය.

"ඇයි තියුමි"

"අක්කි එක්ක ගොඩාක් දුර ගිහින් තියනවා කිව්වට ඔයාව හංස අයියා එක්ක රැයක් නතර කළා... ඒක කොච්චර බරපතලද කියලා මට හිතුනේ පස්සේ"

"ඒකට කමක් නැහැ තියුමි... මම හංස අයියා එක්ක වුණ මුල් දවස ඊයේ දවස නෙවෙයි"

"එයා හරි හොඳයි අක්කි... ඒකයි මම ඒ ගැන හිතුවේ නැත්තේ"

හොඳ දන්නේ මමනේ... සිතින් කියගත් සස්වින්දි සිනාසී නැගුවාය.

"හංස අයියා ඊයේ මාව එක්ක ගිහින් කාමරේ පෙන්නලා කිව්වා ඇතුළට ගිහින් දොර වහ ගන්න කියලා... ඉතින් මල වෙලා ඇයි ඇහුව්වා"

"මොකද කිව්වේ"

"එයා හිනා වෙලා කිව්වා... එතකොට බයත් නැති වෙයි... විශ්වාසෙත් රැකෙයි කියලා" තියුමි සිනාසෙමින් කීවාය.

"අක්කි නම් හරි වසයි... හිතුවක්කාරයි කිව්වා... ඒ නිසා අක්කිට නම් එයාගෙන් චාන්ස් නැහැ කිව්වා... එයා හරි හොඳයි අක්කී"

"ඔයා එයා ගැන මොනවද දන්නේ තියුමි"

"මට කියන්න තියෙන්නේ මෙච්චරයි... ඔයා හරි ලකී එයා වගේ කෙනෙක්ගේ හිත දිනා ගන්න... ඒ වගේ කෙනෙක්ගේ වයිෆ් වෙන්න"

"තියුමි.. ඔයා මේ ගැන කාටවත්ම කියන්න එපා... හංස අයියා අඳුරනවා නෙවෙයි ඒ වගේ කෙනෙක් දන්නවා කියලවත් කාටවත් කියන්න එපා"

"රහල් අයියා නිසාද අක්කී"

"ඒකත් එක හේතුවක් තමයි තියුමි... රහල් ගැන හිතන කොට මගේ පපුව පිච්චෙන හැටි දන්නේ මම විතරයි" සස්වින්දි දෑසට කඳුළු පුරවා ගනිද්දී තියුමි ඇයගේ සුරතින් අල්ලා ගත්තාය.

"ඔයා ඇයි අක්කි මෙහෙම දෙන්නෙක්ව ඔයාගේ ජීවිතේට පටල ගත්තේ... හංස අයියා නම් හිතුවක්කාරයා නිසා ඔයාව බලෙන්ම අල්ල ගන්න ඇති... ඒත් රහල් අයියා... එයා අහිංසකයිනේ"

"මම හංස අයියට අහු වෙන කොට රහල් අයියා එක්ක යාළුවෙලා හිටියේ... නිදහසේ තනියම හම්බවෙලා නොතිබුණාට අපි ආදරේ කරන්න පටන් අරන් තිබුණේ" සස්වින්දි සුසුමක් හෙලුවාය.

"අපි අපට හරි ආදරෙයි තියුමි... ඒත්... රහල් අයියගේ බිරිඳ වෙලා එයා ළඟ ඉන්න තරම් වාසනාවන්ත වෙන්න මම පින් කරලා නැහැ"

"රහල් අයියව බඳින්න ඔයාගේ අදහසක් නැහැ කියලා දන්නවද"

"මම යන්තමට ඉඟි දීලා එක එක ඒවා කියලා තියෙ ඔයා දන්නවනේ රහල් අයියා මගේ එක්ක මේ දවස්වල නොහොඳින් ඉන්නේ කියලා... බඳින්න බැහැ කියන්නේ කියලා සාධාරණ හේතුවක් දෙන්න මට බැහැ"

"ඔයා මොනවද එයාට කිව්වේ"

"පුංචි කාලේ කතා කරපු මඟුලක් තියනවා කිව්වා.. කියනවා තාත්ති හම්බ වෙන්න එන්නම් කියලා... ඒකට කිව්වම කියනවා හිතුවක්කාර වෙමු කියලා"

"එතකොට... හංස අයියා... එයා මොකද"

"එයා එක්ක මම ගොඩාක් දුර ගියා තියුමි... ගියා යන්න වුණා... කියූ සස්වින්දි වූ සිදුවීම් සියල්ල ඇයට කීවා

"දෙයියනේ මම මොකද කරන්නේ තියුමි... මම මේවා ඔයාටවත් කියා ගන්න බැරුව"

"හංස අයියා ඔයාව අත අරින එකක් නැහැ අක්කී... මොනවා වුණත් ඔයාට හංස අයියව දැන් අත අරි බැහැනේ"

"එයාට මම ගැන ඇත්තේ අවශ්‍යතාවයක් විතරද කවුද දන්නේ"

"අවශ්‍යතාවයට හරි එයාට ඔයාව ඕනිනේ... එදා මාළි ගියෙත් ඔයා නිසානේ"

"එයාට මාව ඕනි සතුටක් ලබා ගන්න විතරයි කියලා මට හිතෙන්නේ... ඒ සතුට එයාට වෙන තැනකින් ලැබු එයා යන්නත් බැරි නැහැ"

"එතකොට ඔයාට එයා ඕනි නැද්ද"

"මම දන්නේ නැහැ තියුමි... හංස මට ආදරෙයි වෙලාවකට මට හිතෙනවා... ඒ වෙලාවට එයාව හදා කියලත් හිතනවා... ඒත්... මට මොනවා කළත් මගේ තාත්

ඔළුවට පිස්තෝලේ තිබ්බා කියලා මට අමතක කරන්න බැරි වෙයි කියලත් නොහිතෙනවා නෙවෙයි"

"මට තේරෙන්නේ නැහැ අක්කී... හංස අයියා ගැන ඔයාට ඔහොම හිතෙනවනම් ඔයා රහල් අයියාට ඇත්ත කියන්න"

"නැහැ තියුමි... කවදාවත් මම ඒක එයාට කියන්නේ නැහැ... එයා මට සමාව දුන්නත් මාව බැන්දත් අඩුවක් ඇතුව මම එයා ගාවට යන්නේ නැහැ"

"එහෙනම්..."

"මට මොනවා වුණත් කමක් නැහැ... මම මම ගැන හිතන්නේ නැහැ... මට ඉවසන්න බැරි රහල් ගැන හිතන කොට" සස්වින්දි පැවසුවේ දෑසේ කඳුළු පිසදාගෙනයි.

"තියුමි... ඔයාට බැරිද මට උදව්වක් කරන්න" සස්වින්දි ඇයගේ දෑතින්ම අල්ලා ගනිමින් ඇසුවාය.

"මට පුළුවන් නම් මම ඔයාට ඕනි උදව්වක් කරන්නම් අක්කී"

"මම ඔයාට කරන්න බැරි දෙයක් කරන්න කියලා කියන්නේ නැහැ තියුමි... ඔයා රහල් අයියට ළං වෙන්න... කවදාහරි එයාව කසාද බඳින්න"

"අක්කී" තියුමි පුදුමයෙන් බැලුවාය.

"ඔව් තියුමි... රහල් තරම් හොඳ කොල්ලෙක් මට මේ ජීවිතේදි හම්බ වෙලා නැහැ... මේ ලෝකේ ඉන්න හොඳම කොල්ලා එයා කිව්වොත් ඒකත් බොරුවක් නෙවෙයි කියලයි මට හිතෙන්නේ"

"එතකොට ඔයා හංස අයියව බඳිනවද"

"එයා මාව බැන්දොත් බඳිනවා... එහෙම නොවුණොත් ජීවිත කාලෙම තනියම ඉන්නවා"

"එහෙම ඉන්න ලොකු තාත්තා ඉඩ දෙයිද"

"තාත්ති හැමදේම දන්නවා තියුමි..."

"ගෝඩ්... ඒ කොහොමද"

"හංසම තමා තාත්තිට කියලා තියෙන්නේ"

"ඉතින්... ලොකු තාත්තා හංස අයියට කියලද අක් බඳින්න කියලා"

"නැහැ තියුමි... එයා කියලා කපලා ගඟට දැම්මත් වගේ කෙනෙකුට මාව දෙන්නේ නැහැ කියලා... හංස අ ඒකට ගොඩාක් තරහෙන් ඉන්නේ"

"අනේ අක්කී... මට ඔයා ගැන දුකයි"

"මම ගැන දුක නම් මම කිව්වදේ කරන්න තියුමි... ඔ පින්"

"බැහැ... මම රහල් අයියට ළං වෙලා ඔයාලාව ෪ කරනවා"

"එපා තියුමි... පව් පුරවා ගන්න එපා... රහල් වගේ ෙ කොල්ලෙකුට මම වගේ අපිරිසිදු වුණ කෙල්ලක් ළං කරල පුරවා ගන්න එපා... එයාට ජීවිතේ විඳවන්න දෙන්න එපා"

"රහල් අයියා ඔයා නැති වුණොත් විඳවයි අක්කී"

"නැහැ තියුමි... ඒක ටික දවසයි... එහෙම නැති වුෙ එයා සදහටම විඳවයි... අනික මම... එයා මට වෙනස්කම් විඳවයි... එහෙම නොකර ආදරේ කළත් විඳවයි... තවත ජීවිතේ මට විඳවන්න බැහැ නංගා"

"එහෙනම් ඔයා කොහොම හරි හංස අයියව බඳින්න"

"අපි එකතු වුණේ වෛරෙන්... පළිගන්න... අද වෙන්නේ ඒ වෛරෙ පිරිමහ ගන්න වෙන්න වෛරක්කාරයෝ දෙන්නෙකුට එකට ඉන්න පුළුවන් හිතනවද" සස්වින්දි ඇසුවේ සිනාසෙමින්ය.

"එහෙම දෙන්නෙකුට එක ඇඳක ඉන්න පුළුවන්ද" ඇසුවේත් සිනාසෙමින්ය.

"මම නම් හිතෙන්නේ ඔයා දෙන්නා අතර ආදරයක්

"ඔව්... සමහර විට... හංස මට ආදරේ ඇති කියලත් ඊ එයා එක්ක හිටිය දවසේ මට හිතුණා... ඒත් තියුමි...

අවශ්‍යතාව දැනුන මිනිහෙක්ට ඕනේ ගැහැනු ශරීරයක් විතරයි... එයා වෛරක්කාරයෙක්ද ආදරය කරණ කෙනෙක්ද කියන එක එයාට වැඩක් නැහැ"

"එහෙම නම් අක්කී එයාට එකම කෙනා ඕනි වෙන්නේ නැහැනේ... ඕනි ගෑනියක්... කවුරු හරි" එයට යමක් පැවසීමට සස්වින්දි වචන තිබුණේ නැත. එය සත්‍යක් බව ඇයට වැටහී ගියාය.

සති තුනකට තුහංස විදේශ ගත වෙද්දී මනෝජ් සස්වින්දි නිවසට ගෙන්වා ගත්තේ තුහංස නැති බව දැන සිටි නිසයි. ඇය සැහැල්ලුවෙන් නිවසේ ගත කළේ මනෝජ්ගේ දෑසට කඳුළු දෙවමිනි.

"අනේ තාත්ති ඔයා ඔහොම අඬන්න ගියාම මම කොහොමද සැනසීමෙන් ඉන්නේ" සස්වින්දි ඔහුට තුරුවෙමින් පැවසුවේ සවස ඔවුන් විවේකීව සිටි මොහොතකයි.

"මට දුක මගේ කෙල්ල හිතේ හැටියට මගේ ළඟ තියා ගන්න නැතිකමට"

"මම දන්නවා තාත්තිට මාව ළඟ තියා ගන්න ඕනි කියලා... ඒත් තාත්ති ඔයා නිසාමයි මම ගියේ"

"කමක් නැහැ... තව පොඩි කාලයයි... හංස බැන්දම මට බය නැතුව දෝණිව මගේ ළඟ තියා ගන්න පුලුවන්" සස්වින්දි ඔහුගේ ළයෙන් හිස ඔසවා ඔහු දෙස බැලුවාය.

"මම සජී මිස්ට කිව්වා හංස මහත්තයාට හොඳ කටයුත්තක් බලන්න කියලා... මට ඕනි මගේ දෝණි ඔය අළුගෝසුවාගෙන් බේර ගන්න" සස්වින්දිගේ හද පතුලෙන්ම දැනුණු වේදනාවක් පපුව පුරවා විසිරී ගියාය.

මට දැන් ඕනි හංසව තාත්තී... ඒත් ඔයා ඔහොම කියද්දී මම කොහොමද ඒක ඔයාට කියන්නේ... ඔයාට පිස්තෝලේ තිබ්බ මිනිහව මට ඕනි කියන්නේ... සස්වින්දි හිතින් තැවුණාය.

"එදාට මම කම්පැනියෙන් අස්වෙනවා... අපි කොහේ හරි දුරකට ගිහින් නිදහසේ ජීවත් වෙමු දෝණී... ඔයාට අවුරුදු විසි තර වුණාට පස්සේ ඇවිත් ඒ සල්ලි අරන් දීලා ඒ වගකීමෙනුත්

"තාත්ති කැමති ඕනි දෙයක්... මගේ තාත්ති මොනවද මම ඒ දේ කරනවා... එක දෙයක් හැර"

"ඒ මොකද්ද රත්තරනේ"

"මට කසාදයක් ඕනි නැහැ තාත්ති"

"ඒක දෝණිගේ කැමැත්ත... මම බල ක නැහැ" මනෝජ් සස්වින්දිගේ හිස අත ගාමින් කීවේය.

"දෝණි දැන් ලොකු ගෑනියක් නිසා මම මේ කිය පිරිමියෙක් කැමති නැහැ ඉඳුල් ගෑනියක් ගන්න... ඇත් ඒක වැරදියි දෝණි... දෝණි විශ්වාස කරනවද මාව... රජ් එක්ක අම්මි ගොඩාක් ළඟින් හිටියේ... මම ඇත්තටම සැක කළා... මම එයාට අපූ බඳින්නම් කිව්වේ කැම නෙවෙයි... බැහැ කියන්න බැරි කමට" ඔහු සුසුමක් හෙ

"ලොකේ මිනිස්සු මොනවා කිව්වත් කළත් ඒ ඇත්ත නෙවෙයි... මිනිස්සුන්ට ඕනේ දෙයක් කියන්න ඒත් ඇත්ත ඊට වඩා ගොඩාක් වෙනස් වෙන්න පුළුවන්"

අතීතය ගැන දොඩමළු වන මනෝජ්ගේ කතාව අසා සිටියේ ආසාවෙනි.

"මම හිතුවා බඳින්න කලින් අපූ මගේ එක්ක එ කතා කරයි කියලා... එහෙම වුණොත් නැගෙන වි එක්ක මට එයා එක්ක හොඳින් ඉන්න පුළුවන් වෙයි කි

"ඉතින් අම්මි ඔයා එක්ක කතා කළේ නැද්ද"

"නැහැ දෝණි... මම හිතුව දේ ගැන එයා ක නැහැ... මම එයාව බැන්දා හිතේ කහටක් එක්ක"

"ඉතින්..."

"ලෝකයා මොන කතා කිව්වත් ඔයාගේ අම්මි හොඳ විදිහට මගේ ළඟට ආවා... එයා මගේ එ නොකළේ එයා හොඳට හිටිය නිසා කියලා හිතෙන මගේ ගැනම ලැජ්ජාවක් ඇති වුණා... එදා මම ඇරිය නම් මට කොච්චර පාඩුවක්ද... රන් කඳක් නැති අ

වෙනවා" මනෝජ් කඳුළු පිසදා ගත්තේය.

"ඒ තරමට හොඳ කෙනෙක් වුණ රජී අංකල්ගේ ලේ වලින් ඔය විදහේ දරුවෙක් හැදුනේ කොහොමද කියලා මට හිතා ගන්නවත් බැහැ"

"මටත් එහෙම හිතෙනවා තාත්ති"

"ඔයත් අම්මි වගේ රන් කඳක් දෝණී... ඔයාව තේරුම් ගත්ත කෙනෙක් ඔයාගේ මේ ඉරණම තේරුම් අරගෙන ඔයාව ළංකර ගන්න කැමති කෙනෙක් ඉන්න පුළුවන්... එහෙම කෙනෙක් හම්බ වුණොත් ඔයා එයාට ළං වෙන්න"

සස්වින්දි සහි වූයේ රහල්වයි. පියා පවසන්නේ එවැන්නකි. යම් හෙයකින් රහල් පැමිණිය හොත් ඔහුට සත්‍ය පවසා තමාව ඔහුට දෙන්නට වුවත් බැරි නැත...

"එහෙම වුණොත් ඒක ඒ කෙනාට කරන අසාධාරණයක් තාත්තී"

"නැහැ පුතේ... නැතිනම් ලෝකේ පිරිමියෙකුට වටිනා ගැහැණියක් නැති වෙයි... ඒක සමාජෙට කරන අසාධාරණයක්... ගැහැණියක්ගෙන් සමාජෙට දරුවෝ බිහි වෙන්න ඕනේ... ඒක සමාජ මෙහෙවරක්"

"වෛරක්කාරයෙක් වුණත් මම හංසට වෙන් වෙලා ඉවරයි නේද තාත්ති"

"ඒ වගේ නරුමයෙක් එක්ක කරුමයක් ගෙවන්න ඔයාට බැහැ දෝණී... වෙන කෙනෙක් බඳින්න බැරි නම් ඔයා තනියම ඉන්න... ඒක කමක් නැහැ" සස්වින්දි මනෝජ්ගේ ළයේ හිස තබා ගත්තාය.

පසු දින පරිඝණක පන්තියට යාමට සස්වින්දි කරවනැල්ලේ තියුමිගේ නිවසට ගියේ ඇයව කැඳවා ගන්නයි. ඇයත් සමඟ බස් නැවතුම් පළට පැමිණි සස්වින්දි බලා සිටියේ බසයක් පැමිණෙන තුරුයි.

"ඒයි... අන්න හංස අයියගේ ජීප් එක" තියුමි කෑගැසුවාය.

"අමු කැවිලද... එයා එන්නේ සති තුනකින්"

"බලන්නකෝ" තියුමි ඔවුන් ඉදිරියේ නතර කළ ජීප් ර
දෙස බලා සිනාසෙමින් කීවාය.

"හංස... ඔයා ආවත් එක්කද"

"ඔව්... ඇයි ඔයාට දුකද... බලන්නකෝ තියුමි"

"දුක නැහැ... සතුටට වෙන්න ඇති කෑගහන්නේ" ති
කීවාය.

"නඟින්න නඟින්න... හොන් ගහනවා" තුහංස පිටු
බලමින් කීවේය.

"මොකද කරන්නේ" තියුමි ඇසුවාය.

"ඔයා ඉස්සරහට ගිහින් නතර කර ගන්න හංස...
එන්නම්" සස්වින්දි තුහංසව ඉදිරියට යවා තියුමි දෙ
හැරුණාය.

"රහල් අපි එනකල් බලාගෙන ඇති"

"ඒක තමයි... මොකද කරන්නේ... හංස අයියා... ශු
බේරුමක් නැති වෙයි... අද එවන එකකුත් නැති වෙයි"

"හ්ම්... ඔයා යන්න තියුමි... රහල් අයියට කියන්න
තාත්ති නිසා නැවතුණා... උදේට ක්ලාස් එකට එන්නම් ද
කියලා"

තියුමි බස් රථයකට ගොඩ කර වූ සස්වින්දි තුහං
රථයට ගොඩ වූවාය. තුහංස දෑස් විසල් කොට සස්වින්දි
බලා සිටියේය.

"මොකද හංස"

"අදහන්න බැහැ"

"ආව එකද"

"හ්ම්..."

"තියුමි ඉස්සරහා පොර අල්ලන්න මම කැමති නැහැ"

"එහෙනම් ඉතින් අල්ල ගන්න ඕනි තියුමි ළඟදී"
සිනාසෙමින් කීවේය.

"හංසී... තියුමි තනියම යනවද"

"මම යන්නේ... ඔයා අහන්නේ නැහැනේ"

"ඒ ළමයා පොඩියි නේද"

"හොඳ පොඩි... මට වඩා මාසයයි බාල" තුහංස හඬින් සිනාසුණේය.

"මොකද හයියෙන් හිනා වුණේ"

"ම්... නැහැ"

"අනේ කියන්නකෝ හංස"

"ඔයා නිකන් ඊර්ෂ්‍යාවෙන් වගේ කතා කළේ... කොහොමටත් තියුමි මට පණ ඇරලා"

"ඉතින්..."

"වෙන කතා නෙවෙයි... අද මාත් එක්ක ඉමු"

"බැහැ බැහැ... උදේ මට ක්ලාස් යන්නත් බැරි වෙයි"

"මම පාන්දර එක්ක යන්නම්"

"ගිය වැඩේ හරිද"

"හ්ම්... ඕඩර් එක ලැබුණා... ඒ වුණාට සල්ලි නැහැ"

"එහෙම කියලා කොහොමද"

"මන්දා හංසී... මට තේරෙන්නේ නැහැ... දැන් ඒ කතා ඕනේ නැහැ... වෙන්නේ මට කේන්ති යන එක... ඔයා විදවන එක" එවර සස්වින්දි සිනාසුණාය.

"මොකද තමුසේ හිනා වෙන්නේ"

"හිනා වෙන්නේ නැහැ... හිනා යනවා"

"හිනා යන්න මම තවම පෙන්නුවේ නැහැ" තුහංස කීවේය. සස්වින්දි වහා ඔහු දෙස බැලුවාය.

"ගිය ගමන් පෙන්වන්නම්... හදිස්සි වෙන්න එපා" තුහංස පවසද්දී සස්වින්දි ඔහුට රවා ඉවත බලා ගත්තේය.

සස්වින්දිව දෝතට ගත්තේය. සස්වින්දි කෑගැසුවාය.

"අනේ හංස සීතා නැන්දත් දකියි"

"කවුරුත් ගෙදර නැහැ... සීතලා දුවගේ ගෙදර ගිහිල්ලා... අද අපි දෙන්නා විතරයි" තුහංස ඇයව සිප ගනිමින් කීවේය.

මිහිරෙන් ගත කළ හෝරා කිහිපය සස්වින්දි ගතකළේ සතුටිනි. රහල් හමුවට ගිය තියුමි ඔහුට ළංවේ යැයි වූ සිතුවිල්ල ඇයට සහනයක් ගෙන ආවාය.

තමා ගෙන යාමට රහල් පැමිණි බවත් ඔහු සමඟ බෝඩිමට ගිය බවත් තියුමි පවසද්දී සස්වින්දි ඒ ඇමතුමෙන්ම රහල්ට කතා කළේ තුහංසට නොදැනෙන ආකාරයටයි.

"බයිට් එකකුත් හදලා දෙන්නකෝ" සස්වින්දි රාත්‍රී ආහාරය පිළියෙල කරද්දී කුස්සියට පැමිණ පිටු පසින් ඇයව වැළඳගත් තුහංස පැවසුවේ ඇයගේ උරයට තිකට තබා ගනිමින්ය.

"හ්ම්... ගඳක් එනවා... බිව්වා නේද"

"චුට්ටක්... දැනෙන්නෙවත් නැහැ"

"එහෙනම් බයිට්"

"තව චුට්ටක් බොන්න ඕනේ"

"මම යනවා... මට බැහැ බේබද්දෝ එක්ක නටන්න"

"එහෙමත් නටලා බලනවා... වෙනසක් වෙලා බීලම එන්න හංස... කියලා කියයිද දන්නේ නැහැ"

"ඇත්තමයි කිව්වේ... එපා හංස"

"අනෙ මේ... කට වහගෙන කිව්ව දේ කරනවා... මම ගොඩාක් බොන්නේ නැහැ... චුට්ටම චුට්ටයි... හැබැයි ඉතින් පාට් දාගෙන ආවොත් නම් බෝතලයක්ම කට තියාගෙන බොනවා... ඊ...ට... පස්...සේ..ඒ...ඒ..." සස්වින්දි ඔහු වෙත රවා බැලුවාය.

"රතු කර ගන්න මූණ... කඳුළු ඇස්... පේන කොට මොනවා වෙයිද මන්දා" ඔහු ඇයව තවත් තෙරපා ගනිමින් කීවේය.

තුහංස ලංකාවට පැමිණියද කාර්යාලයට නොපැමිණීම ගැන චිතුට දැනුනේ වේදනාවකි. වරක් ප්‍රතික්ෂප වුවද නැවත වතාවකට එසේ නොවේ යැයි හැඟීමක් ඇය තුල විය.

තුහංසගේ කාර්යාල කාමරයට ගිය මොහොතක ඔහු සස්වින්දි සමඟ දොඩමළු වනු අසා සිටි ඇය එදා ආපසු සිය අසුනට පැමිණියේ රිදවා ගත් සිතිණි. ඇය නැවත තුහංස හා සබඳ වූවා යනු තමා ප්‍රතික්ෂේප බව ඇය දැන සිටියාය. කෙසේ හෝ ඇයවත් මනෝජ්වත් තුහංස හා පැටලවීම ඇයගේ අරමුණ විය.

තුහංසට ඇමතුමක් ගන්නට කල්යල් බලමින් සිටි චිතුට සවස හේතුවක් ලැබුණෙන් ඇය තුහංස ඇමතුවාය.

තුහංස සිටියේ යහනට වී සස්වින්දි සමඟ මුහුණු පොතේය. 'චිතු... නම සඳහන් ඇමතුමක් තුහංසගේ දුරකථනයට එද්දී සස්වින්දිගේ මුහුණට අඳුරක් එක් වූවාය.

"ඔව් චිතු..."

"සර් ආවද"

"ඔව්... ඇයි"

"නැහැ... ඔෆිස් ආවේ නැති නිසා..."

"මම ඔෆිස් එනවද නැද්ද කියන එක තීරණය කරන්නේ මම චිතු" තුහංස පවසද්දී සස්වින්දි ඔහුගෙන් ඉවත් වී නැඟී සිටියාය.

"යන්න එපා හංසි ඔහොම ළඟ ඉන්න" තුහංසගේ හඬත්

"මම වතුර එකක් බීලා එන්නම් හංස" යි සස්වින්දිගේ හඬත් ඇසෙද්දී චිතු පරලව ගියාය.

"ඉක්මනට එන්න කෙල්ල" තුහංස කීවේ ආදරණීයවයි.

"ඔව් චිතු"

"ස.. ස.. ර්... කොහෙද ඉන්නේ"

"මම ඉන්න තැන තමුසෙට මොකටද"

"ම්... නැ..හැ... කතා කරන්න පුළුවන්ද බලන්න... රාජකාරී කතාවක්"

"කියන්න... මම කලවානේ බංගලාවේ ඉන්නේ" තුහංස කීවේය. ඔහු සස්වින්දි සමඟ කලවානේ... චිතුගේ ගතම දැවී ගියාය.

ඒ දිනය... ඔහු තමා වසඟයට ගෙන සිපුමකට පමණක් සීමා කොට ප්‍රතික්ෂේ කොට ඉවත ගිය අන්දම... සස්වින්දි අගයා ඇයගේ සලකුණ තමාට පෙන්වූ අන්දම චිතුට සිහිවන්නට විය. සිත ඊර්ෂ්‍යාවෙන් වෙලී යද්දී එය සඟවා තුහංස සමඟ කතා කිරීමට චිතුට හැකිවිය.

කාමරය අසලට පැමිණි සස්වින්දි නැවතුනේ තුහංසගේ කෝපාකාරී හඬටයි. ඔහු දුරකථනය පොළවේ ගසා කෝපයෙන් කෑගැසුවේය. චිතු කුමක් හෝ පවසා ඔහුව කෝප කරන්නට ඇත. සස්වින්දි සිතුවාය.

"ඇයි හංස... මොකද වෙලා තියෙන්නේ"

"පලයන් යන්න මගෙන් මැරුම් නොකා... බැල්ලී... උඹේ මහ එකා තමයි මේ සේරම කළේ" ඔහු කෑගැසුවේය.

"අපේ තාත්ති මොනවද කළේ... පැත්තක ඉන්න මගේ තාත්තිට මොනවත් කියන්න එපා" සස්වින්දි ද කෝප ගත්තාය.

"පැත්තක ඉන්න... පැත්තක ඉන්න... ඒකා පැත්තක හිටිය නම් මේ මොනවත් නැහැ... තාත්ති රවටගෙන..." ඔහු දත් කෑවේය.

"අපේ තාත්ති රජී අංකල් රවට්ට ගත්තේ නැහැ හංස... අදටත් ඔය කම්පැනිය තියෙන්නේ මගේ තාත්ති නිසා... එයා දාඩිය හලන්නේ ඒක රැක ගන්න"

"මගේ කෝටි ගානක් දූවගේ පොතට දාගෙන... කම්පැනියටත් කෙල හලනවා"

"හංස..." සස්වින්දි කෑගැසුවාය.

"පලයන් යන්න මගේ ඇහට නොපෙනී... බැල්ලී..."

සස්වින්දි අල්ලාගත් තුහංස ඇයගේ කම්මුල් වලට පහර කිහිපයක් ගැසුවේය. වීරිය ගත් සස්වින්දි ඔහුගෙන් මිදී අසල තිබූ මල් පෝච්චියකින් ඔහුට දමා ගසා දිව ගියාය.

නොනවත්වා නාද වන දුරකථනයට සස්වින්දි සම්බන්ධ වූයේ බංගලාවේ වත්තේ පාර තාර පාරට සම්බන්ධ වන තැනදීය.

"දෝණී කොහෙද ඉන්නේ" මනෝජ්ගේ හඬ කෝපාකාරී විය.

"තාත්ති... තාත්ති..."

"කියනවා... තමුසේ ඉන්නේ හංස එක්කද" සස්වින්දිට කතා කර ගත නොහැකි විය.

"දෝණී කතා කරනවා... තමුසේ ඉන්නේ හංස එක්ක කලවානේ බංගලාවේද"

"තා..ත්ති... මම.."

"ඉන්නවා... මම මේ එතන්ට එන ගමන්"

"මම ඉන්නේ පාරට ඇවිල්ලා තාත්තී... කැටන්දොලට එන්නම්"

"නැහැ ඔතන ඉන්නවා... මම ඉන්නේ ළඟ" සස්වින්දි ඇමතුම විසන්ධි කළාය.

චිතු... මේ සේරම තමුසෙගේ වැඩ... සස්වින්දි කෝපයෙන් මුමුණා ගත්තාය.

පපුවට වැදුණු පිත්තල මල් පෝච්චි පාරට තුහංසගේ පපුව තුවාල වූයේ මල්පෝච්චියේ දාරය නිසාය. තුවාලයත් තැල්මත් වේදනාවත් නිසා තුහංසගේ කෝප දැඩි වූවේය. මත් පැන් බෝතලය කට තබාගෙනම බිවූ ඔහු මොහොතක් ගත කළේය.

"බැල්ලී... මම උඹව මරණවා... කොඳුරාගත් තුහංස වාහනයට නැඟුනේ වෛරී මතිනි.

දුරකථන ඇමතුමක සිටින සස්වින්දිව මැරීමට පහළ වූ සිතට වාහනය ඇය වෙතට හරවා ගත් තුහංස ඇයට අඟල් දෙක තුනක් තබා තිරිංගය තද කර නවතා ගත්තේය.

"ඇයි නැවැත්තුවේ... මරපන් මාව... අසත්පුරුෂයා..." සස්වින්දි කෝපයෙන් කෑගැසුවාය.

"ඊළඟ සැරේ මෙහෙම වෙන්නේ නැති වෙයි... ඒ නිසා පලයන් මැරුම් නොකා" තුහංස කෑගැසුවේය.

"යන්නේ නැහැ මම... ඉවරයක් කරපන් මාව... දැන් මම ඉන්නවට වඩා හොඳයි මැරෙන එක" සස්වින්දි හඬමින් කීවේ නොසෙල්වීය.

"පලයන්..." තුහංස කෑගැසුවේය.

"නැහැ මරපන්..." සස්වින්දි ඒහාම කෑගැසුවාය. තුහංස වාහනය පණ ගන්වා ගත්තේය.

"ඒකිව විතරක් නෙවෙයි මාවත් මරපන් හංස" මනෝජ් පැමිණ සස්වින්දි තුරුලට ගෙන පැවසීය.

වාහනය පසු පසට ගත් තුහංස ඔවුන් දෙස නොබලාම දූවිලි නංවා පිටව ගියේය.

මනෝජ්ගේ ළයේ වැතිරුණු සස්වින්දි හඬා වැටුනාය. ඇයව තුරුලට ගත් මනෝජ් තුහංසට සිතින් සාප කළේය.

"මේකා කලින් එයි කියලා මම හිතුවේ නැහැ... කොහෙදිද දෝණිට හම්බ වුණේ"

"කරවනැල්ලෙදි"

"තියුමිත් හිටියද"

"ඔව්... මම තියුමිව යැව්වා"

"මේකා එක්ක ගියේ මොකටද"

"තියුමි ඉස්සරහා මම රණ්ඩු කර ගයි කියලා මම බය වුණා තාත්ති"

"දැන් මොනවා කරන්නද... මේ සෙල්ලම හොඳටම ඇති... තවත් ඉවසන්න මට බැහැ... මට ඔක්කොටම වඩා ඔයාව වටිනවා"

"තාත්ති මොකද කරන්නේ"

"මම අස් වෙනවා... අපි කොහේ හරි ඈතකට යමු"

"යන්න පුළුවන් වෙයිද"

"බලෙන් හරි යමු"

"මාස දෙකකින් යමු තාත්ති... කම්පියුටර් කෝස් එක අපරාදේ"

"අනේ මන්දා..." මනෝජ් මහා බරක් හිත දාරගෙන කීවේය.

නිවසට ගිය තුහංස යහනට වූවේය. ඔහු අවදි වූයේ පසුදායි. අනෙක් පස සස්වින්දි ඇතැයි සිතූ තුහංස ඇයව තුරුලට ගන්නට අනෙක් පස හැරුණේය. යහන හිස් බව දැනුනෙන් ඔහු දෑස් විවර කළේය. තමා සිටින්නේ බංගලාවේ නොව තම නිවසේ බව වටහාගත් තුහංස වූ සිදුවීම් මතකයට නඟා ගැනීමට උත්සහ කළේය.

තමා සස්වින්දි සමඟ කුස්සියේ සිටි අයුරු ඇය තමාට බයිට් සාදා දුන් අයුරු කුඩා ප්‍රමාණයක් මැන මත් පැන් ලබා දුන් අයුරු මෙන්ම කෙලි දෙලෙන් හුරතලෙන් ඇය තමා සැනසූ අයුරුද ඔහුට සිහි විය.

චිතු තමා අමතා පඩි දෙන්නට මෙන්න තේ කොළ අපනයනයටද මුදල් නැති බව පවසද්දී තමා කෝපගත් අයුරු හොඳින් සිහි තිබුණද තමා සස්වින්දිට පහර ගැසූ අයුරු මෙන්ම ඇය තමාට මල් පෝච්චියෙන් දමා ගසා දිව ගිය අයුරු ඔහුගේ මතකයේ යන්තමට තිබුණද ඇයව තමා මරන්නට ගිය වගක් නම් කෙසේවත් මතකයේ රැඳී තිබුණේ නැත.

කේන්ති ගිය වෙලාවට ඉවසලා අයින් වෙලා ඉන්න කියලා කොච්චර කිව්වත් මේකි අහන්නේ නැහැ... එයත් එනවා මාව මට්ටු කරන්න... කොච්චර ගුටි කෑවද මන්දා... තුහංස කියා ගත්තේය.

සස්වින්දිට ඇමතුමක් ගන්නට සිතුවද ඇය කේන්තියෙන් බව දැන සිටි තුහංස එය පසුවට කල් දැමුවේය. සජීවා කාමරයට පැමිණ වාඩි වෙද්දී තුහංස යහනේ පසෙකට වූවේය.

"පුතා... මොකද කල්පනාව"

"මේ ප්‍රශ්න වලින් ගොඩ එන්නේ කොහොමද අම්මී... මට නම් හිතා ගන්නවත් බැහැ"

පුතා... දැන් මගේ ළඟ කියක්වත් නැහැ"

"ෂිඃ... අර සල්ලි ගන්නත් හංසිට අවුරුදු විසිහතර වෙනකල් ඉන්න ඕනේ... මට තේරෙන්නේ නැහැ අම්මා" තුහංස යහනේ වාඩි වූයේ සජීවා දෙස බලමිනි.

"මම කියලා මොනවා කරන්නද පුතා... සල්ලි තිබුණ නම් දෙන්න තිබුණා"

"එහෙනම් ඉතින් එක දෙයයි කරන්න තියෙන්නේ"

"ඒ මොකක්ද"

"මනෝජ් අංකල්ගේ බෙල්ල මිරිකලා හරි ඉඩමේ සල්ලි ඉල්ල ගන්න ඕනේ"

"මොන ඉඩමේ සල්ලිද"

"මේ ගැන මම අම්මිට කිව්වේ නැහැ වෙන්න ඇති... අපේ තාත්ති උගසක් බේරන්න කම්පැනියෙන් සල්ලි වගයක් අරගෙන... ලක්ෂ ගානක්"

"කොයි කාලෙද"

"ගොඩාක් ඉස්සර... මම චිතුට පරණ එකවුන්ට් චෙක් කරන්න කිව්වා... එතකොට තමා අහුවෙලා තියෙන්නේ"

"කාටද සල්ලි දීලා තියෙන්නේ"

"මනෝජ් අංකල්ට"

"එහෙනම් තාත්තිගේ මොකකට හරි වෙන්න ඇති ගන්න ඇත්තේ"

"නැහැ... ඒක බේරලා ලියලා තියෙන්නේ හංසි නමට"

"මනෝජ් අංකල් අවංක කෙනෙක් පුතා... තාත්ති අපට වඩා එයාව විශ්වාස කළේ ඒකයි"

"මරු විශ්වාසේ රැකලා තියන විදිහ... උගස් කරපු ඉඩම බේරලා දුවට ලියලා දීලා"

"උගස් තියලා තියෙන්නේ අපූර්වා ආන්ටිද"

"හ්ම්..."

"අපූර්වාගේ මහ ගෙදර වෙන්න ඇති නේද"

"එහෙම දන්නේ නැහැ"

"ඔව්... ඒක වෙන්න ඇති... එදා මනෝජ් මට කිව්වා ඔයා ආය එකක් අල්ලගෙන කියලා... ඒකට වෙන්න ඇති එහෙනම් කියන්න ඇත්තේ"

"ඇයි මොකද්ද ඒක"

"ඒක අපූ උගස් තිබ්බේ තාත්තිට සල්ලි වගයක් ඕනේ වෙලා... ඒ සල්ලි ගත්තේ තාත්ති"

"ඇයි අම්මට සල්ලි තිබ්බේ නැද්ද"

"තිබුණා... ඒත් අපේ තාත්ති සල්ලි දෙන්න කැමති වුණේ නැහැ... පස්සේ මට තාත්ති කිව්වා අපූ ආන්ටිට කියලා ඉඩම උකස් කරලා සල්ලි ගත්තා කියලා"

"මනෝජ් අංකල් දන්නවද"

"එයාලා අතරේ කවදාවත් රහසක් තිබ්බේ නැහැ පුතා... මනෝජ් අංකල්ගේ කීමට තමා අපූර්වා ආන්ටි එහෙම කළේ"

තමා එදා ඔහුට අවමන් කළේ දියණිය විනාශ කළ බව පැවසුවේ එනිසාවෙනි. එහෙත් ඔහු ඒ ගැන වචනයක් හෝ පැවසුවේ නැත. තමාගේ කෝපයෙන් බොහෝ විනාශ සිදුවන බව තුහංසට නැවත වතාවක් ඒත්තු ගියේය.

"තව දෙයක් පුතා"

"ඒ මොකද්ද"

"ඔය ඔෆිස් එකේ ගෑනු කරේ එල්ලගෙන නටන්න ලෑස්ති වෙන්න එපා... තාත්ති ඔතන දේවාලයක් වගේ තියා ගත්ත තැනක්"

"කවුද මනෝජ් අංකල්ද කිව්වේ"

"ඒ කියන්නේ මනෝජ් ඒවා දන්නවද... එහෙම දැන ගෙනද නොදන්නවා වගේ කතා කළේ"

"මොනවද"

"අර චිතුද කවුද එකී... ඒකිව අරගෙන බංගලාවට යනවා කියලත් මට ආරංචියි පුතා"

"වෝව්... එක්සලන්ට්... අම්මගේ රහස් ඔත්තු සේවය නම් මරු" තුහංස සිනාසුණේය.

කියන එකා හංසියි චිතුයි මාරු කරගෙන වගේ... තුහංස සිතුවේය.

"මනෝජ් අංකල් මොකද කිව්වේ"

"මනෝ මට මොනවත්ම නොකියා තමයි ඔයාගේ කසාදෙ ගැන කතා කළේ"

"මගේ කසාදේ... ඒකියන්නේ එයා කිව්වද මට හංසිව කසා බඳින්න කියන්න කියලා"

"එයා ඔයාගේ නාඩගම් දන්නවා නම් ඒවා දැන ගෙ එයාගේ දුවව දෙන්න අහයිද"

"එහෙනම් මොනවද එයා මගේ කසාදේ ගැන කතා කළේ

"ඔයාට ගැනු ළමයෙක් හොයලා දෙන්න කිව්වා කම්පැනියට හයියක් වෙන පවුලකින්... ඔයාටත් උදව් ක කම්පැනියේ වැඩ කරන්න පුළුවන් කෙල්ලක් හොයලා බලන කිව්වා"

"එයාගේ දුවටත් ඒවා පුළුවන් කිව්වද... කෝටි ගාන ජ් එයාව බඳින්න කිව්වද"

"පිස්සුද පුතාට... මනෝජ් අංකල් දන්නවා එයා තාත්ති සේවකයෙක් බව... තාත්ති මැරුණ දවසේ එයා මට පොරෙ වුණා එහෙම යෝජනාවක් තාත්ති කළා කියලත් අම කරනවා කියලා"

"එයා හදන්නේ මගෙන් දෝණියන්දැව ගලව ග වෙන්න ඇති... මට කසාදයක් කරලා දුන්නම මම එයාව අරියි කියලා හිතෙන්න ඇති... තුහංස මුමුණා ගත්තේය.

හංසී... ඔය රතු මූණ... කඳුළු ඇස්... මේ තුහංසට නැතුව බැහැ...

සජීවා කාමරයෙන් පිටව ගිය පසු තුහංස සස්වින්දිට ඇමතුමක් ගත්තේය. දුරකථනයට වැඩි කාලයක් නොගෙන සම්බන්ධ වීම ගැන තුහංසට පුදුම සිතිණි.

"හංසී... ඊ ඉන්නම් කියලා ඇවිල්ලා ගුටි කාලා මටත් ගහලා ගියාම හරි කියලා හිතුවද"

"වාහනේට යට කරලා මරලා දැම්මම ඉවරයි කියලා හිතුනද" සස්වින්දිගේ දුරකථනයෙන් මනෝජ්ගේ හඬ ඇසෙද්දී තුහංස මදකට ගොළු වූවේය.

"හංස උඹ මම කවුරු කියලා හිතාගෙනද නටන්නේ"

"මනෝජ් අංකල්..."

"ඔව්... මම ඒකා තමයි... මගේ කෙල්ල විනාශ කළා... මම ඉවසුවා... ඒ නිසාද යකෝ ඒකි අරන් ගහින් වද දීලා මරන්න හදන්නේ"

"මනෝජ් අංකල්... මට හංසිව මරන්න වුවමනාවක් නැහැ"

"එහෙනම් ඇයි ඊයේ එයාව වාහනේට යට කරන්න ගියේ... මම ආවේ නැත්නම්" තුහංසට තරු පෙනිණි.

අසිහියෙන් තමා කුමක් කළේද... ඔහුට සිතා ගත නොහැකි විය.

"ප්ලීස් මනෝජ් අංකල්... හංසිට ෆෝන් එක දෙන්න"

"මීට පස්සේ හංසි කියලා කෙනෙක් හිටියා කියලවත් හිතන්න එපා... හංස මහත්තයා... මීට පස්සේ උඹ මගේ කෙල්ල හොයාගෙන ආවොත් උඹට කලින් මමයි ඒකිව මරන්නේ" මනෝජ් දුරකථනය විසන්ධි කළේය.

බලමු මනෝජ් අංකල්... තමුසේ කොහොමද තමුසෙගේ දුව මරන්නේ කියලා... තුහංස ඒ වෙලාවෙම නැඟී සිටියේය.

"තියුමි... අක්කි කොහෙද" හංසගේ හඬ නොසිතුව ලෙස ඇසෙද්දී තියුමි දුරකථනයට සම්බන්ධ වූයේ දෙගිඩියාවෙනි.

අක්කි මෙහෙ ආවේ නැහැ

"අක්කිට කෝල් එකක් ගන්න විදිහක් නැද්ද"

"ෆෝන් එක ලොකු තාත්ති අරගෙන... මටත් අක්කි ඔයා එක්ක ගිය බව මට කිව්වේ නැහැ කිය

"අක්කි ඉන්නේ ගෙදර කියලා ෂුවර්ද"

"වෙන්න ඇති... නැන්දලාගේ ගෙදර ආ එයි... එයා අද ක්ලාස් ආවේ නැහැ... ලොකු දෙන්න නැතුව ඇති" තුහංස ඇයගෙන් ස දුරකථනය විසන්ධි කළේය.

තුහංසගේ ජීප් රථය නිවස ඉදිරියේ න සස්වින්දි ඇද කාමරයට දමා දොර වැසුවේය.

"මට හංසි එක්ක කතා කරන්න ඕනේ මනෙ

"මෙහෙ ඇති හංසියෙක් නැහැ"

"මම දන්නවා... එයා ගෙදර ඉන්නවා" ඇතුළු වූවේය.

"කරුණා කරලා යනව හංස... මේක මගේ

"මෙතන නෙවෙයි අංකල් මට මේ කොතනත් එකයි" කෝපයෙන් කියූ තුහංස

"හංසී... මට කතා කරන්න ඕනේ" හඬින් ඝ

එළියේ කලබලයට හිස පොවන්නට සස් තිබුණේ නැත. කාමරයට දමා එළියෙන් දොර ඇයට එළියට ඒමට හැකියාවක් නොතිබිණි.

ඊයේ දින සිට මනෝජ් සිටින්නේ දැඩි නිසාවෙන් ඔහු තුහංස සමඟ පැටලී නපුරක් ෙ වූවාය. කිසිවක් කර ගත නොහැකි වූ ඇය හැඬුවාය.

"හංස මම උඹව මරනවා... පලයන්

"ඊට කලින් උඹ මගෙන් මැරම්කයි මනෝජ් අංකල්... මගේ ඉවසීමේ සීමාව පන්නන්න එපා"

"හංස... මම මෙහේ... අනේ..." සස්වින්දි ඉවසා බැරිම තැන කෑගැසුවාය.

"ඇය සිටි කාමරයේ දොරට පයින් පාරක් ගැසූ තුහංස ඇය වෙත ගියේය.

"අනේ හංස... මගේ තාත්තිට මොනවත් කරන්න එපා හංස ප්ලීස්... අපෙනේ වැරැද්ද" ඇය හංසගේ ළයට බරව ඉකිබින්දාය.

"සස්වින්දී..." මනෝජ් කෑගැසුවේය. සස්වින්දි වහා තුහංසගෙන් ඉවත් වූවාය.

"මම උඹට එදා තේරුම් ඇතුව කිව්වා මේ මිනිහා ගැන... මේ වගේ එකෙක් එක්ක ගිහින් විඳවන්න උඹට බැහැ දෝණී... ඊයේ මේකා මරන්න ගිය බව දවසට අමතක වුණාද" සස්වින්දි තුහංස දෙස බැලුවාය.

මට ඕනි ඔයාට ප්‍රශ්නයක් ඇති නොකරන්න තාත්තී... මට සමාවෙන්න... සස්වින්දි හිතෙන් කීවාය.

"මේ මනෝජ් කවදාවත් පොරොන්දු කඩන මිනිහෙක් නෙවෙයි... මම සජී මිස්ට පොරොන්දු වුණා රජී මහත්තයා කළ ඉල්ලීම මම අමතක කරනවා කියලා... ඒ වගේම මම තමුන්ට කිව්වා මගේ දෝණිව මම තමුන් වගේ මිනිහෙකුට දෙන්නේ නැහැ කියලා මැරුවත්"

"මම මේ ආවේ ඔහේගේ දූ සිඟිත්ත ගෙනියන්න නෙවෙයි මනෝජ් අංකල්... ඔහේ පොරොන්දු රකිනවද බලන්න... අද ඔයා ඔයාගේ දුව මට දෙන්නේ නැතුව කපලා ගඟට දානවද බලන්න"

"හංස... උඹ මහා නරුමයෙක්... පලයන් යන්න මෙතනින්"

"මම යන්නේ නැහැ මනෝජ් අංකල්... මම හංසිව ගෙනියනවා"

"උඹට දෙන්න ගැනු මෙහෙ නැහැ"

"දෙන්න නැති වුණාට මට ගෙනියන්න ඉන්නවා" සස්වින්දි ගේ බාහුවෙන් අල්ලා ගත්තේය.

"අනේ හංස... ප්ලීස්... යන්න... මෙතන වෙයි" සස්වින්දි බැගෑපත් වූවේය.

"කටවහනවා..." ඔහු ගුගුලේය.

"මේ වගේ මිනිහෙක් එක්ක ගිහින් විඳවනවා බලන උඹව මරලා දාන එක හොඳයි දෝණී... මට සළ රත්තරනේ" කියූ මනොජ් සස්වින්දිගේ බෙල්ලෙන ගත්තේය.

ඔහු දෑත් තද කරන්නට තනද්දී තුහංස ඔහුව ඈ දැමුවේය.

"තමුසෙට පිස්සුද මිනිහෝ..." ඔහු කෑගැසුවේය.

දෑතින්ම බෙල්ල අල්ලා ගත් සස්වින්දි හොඳි ගැනීමට උත්සහ කළාය.

"ඔව්... මට පිස්සු... මගේ පණ උඹ විනාශ කළ රත්තරන් කෙල්ල අපායකට දැම්මා... ඒකිට යන එන කළා... මනෝජ් විලාප තබමින් හඬා වැටුණේය.

"අඬපන්... හයියෙන් අඬපන්... දැන් මම යනව තියා ගනින් මනොජ් අංකල්... මේ හංස කවදාවැ ඕනෙදේ අත අරින මිනිහෙක් නෙවෙයි... මම ඔහේ අරින්නෙත් නැහැ... ගෙනියන්නෙත් නැහැ... අද කිව් මතක තියාගන්නවා"

මනෝජ්ට කෝපයෙන් කියූ හංස සස්වින්දි දෙස පිටව ගියේය. මනෝජ් අසල වාඩි වී ඔහුව වැළඳගැ හඬින් ඉකි ගැසුවාය.

"මට සමාවෙන්න මයෙ රත්තරන්... මට කරු දෙයක් තිබුණේ නැහැ වස්තුවේ..." ඇයට ඇසුෙ කෙඳිරියයි.

සජීවා විසින් කතා කළ ඉල්ලීමකට සජීවාගේ මිැ දියණියක් වූ අයිෂාදි දන්තනායක බැලීමට තුහංස ගිෙ

ත්තයකයි. ව්‍යාපාරික පවුලක දියණියක් වූ ඇය මේ වන විට දේශ විශ්ව විද්‍යාලයක ඉගෙණුම ලබමින් සිටියාය. මිතුරියන් ර වූ දැඩි බැඳීම නිසාවෙන් කටයුත්ත ඉක්මනින්ම තීන්දු විය.

තුහංස ඒ කටයුත්තට කැමැත්ත ලබා දුන්නේ සජීවාගේ වත් ඉල්ලීමට වඩා මනෝජ්ව මට්ටු කිරීමට සිතාගෙනයි. සිල් දන්තනායක සමාගමේ කොටස් කරුවෙකු වීමත් ඔහු ඒ වනුවෙන් මුදල් යෙදවීමට දැක් වූ කැමැත්තත් තුහංස එම යෝජනාවට කැමති වීමට තවත් එක් හේතුවක් විය.

සස්වින්දිගේ අවශ්‍යතාවය දැනුණද ඇයව විවාහ කර ගෙන ග තබා ගැනීමේ අරමුණක් තුහංස තුල නොවීය. හැබවින්ම හුට විවාහ බැම්මකින් දිනෙක තමා බැඳිය යුතුය යන හැඟීමද නාවීය.

මනෝජ් අංකල්ගේ දැඩි විරෝධය මැද සිය මවගේ කමැත්ත මත බොහෝ විට හිතුවක්කාර මොහොතකට අවනත ැමදා තමාට වෛර කරන විටෙක තමා සමඟ සෙනෙහසින් ිටින සස්වින්දි වැන්නියක් තම බිරිඳ විය යුතුම යන හැඟීමක් මා තුල නැති බව තුහංස සිතා සිටියේය.

ඒ රතු වතේ කඳුළු දෑසේ අවශ්‍යතාව දැනුනද තමා ඇයගෙන් මිහිරක් වින්දද ඇය නීතියකින් බැඳ තමා සතු කර ැනීමේ අදහසක් තමා තුල නැති බව තුහංස වටහාගෙන සිටියේය. තමා ඇයට ආදරය කරනවාද වෛර කරනවාද යන්නවත් ඔහු දැන සිටියේ නැත.

උගත් රූමත් විශාල බූදලයකට හිමිකම් කියූ අයිෂාදි වැනි තරුණියක් අත හැර දමන්නට ඔහුට නොසිතුනේ ඒ නිසා වන්නට ඇත.

මාස දෙකක් වැනි සුළු කාලයක් තුල මේ සියල්ල සිදුවෙද්දී තුහංස සස්වින්දිව මෙන්ම සස්වින්දි තුහංසද අමතක කර දැමුවේය.

අයිෂාදි කෙලිලොල් තරුණියක් වූ නිසාවේ
ඇයගේ ඇසුර ප්‍රිය විය. තුහංසටද ඇයගේ ඇසුර ප්‍රි
ඔහු එහි යාමට පැකිලුනේ නැත. ඇයගේ ඉල්ලීමත්
යම් යම් කටයුතු සඳහා එහි යන්නට සිදු වූ නිසා
නිතර නිතර අයිෂාදිගේ නිවසට ගියේය.

දුටු පමණින් සිත් ඇදගන්නා කඩවසම් තරුණයෙ
වන්නට කිසිදු හේතුවක් අයිෂාදිට නොතිබිණි. එනිස
දුටු මොහොතේම ඔහුට කැමැත්ත දුන්නාය. එමෙ
ගුප්ත බව නිසාවෙන්ම ඇය ඔහු ගැන සොයන්නට ඒ

එකම පාසලේ ඉගෙණුම ලැබූ සස්වින්දි හා අයි
ශිෂ්‍යනායක කණ්ඩායමේ සමාජිකාවෝ වූහ. සස්වි
ප්‍රධාන ශිෂ්‍යනායිකාව වෙද්දී අයිෂාදි ඒ
ශිෂ්‍යනායිකාවක් වූවාය.

ඒ මිතුදම නිසාවෙන් අයිෂාදි ඇමතුවේ සස්
මොහොතේ ඇය සිටියේ නිවසේය.

"සස්වි නංගි... මම අයිෂාදි අක්කා"

"අනේ... කොහොමද අක්කී... කොහොමද
නම්බර් එක හොයා ගත්තේ"

"ඔයාගේ යාළුවෝ කීප දෙනෙකුට අර ගෙන
ගත්තේ"

"අක්කි රෂියා ගියා කියලා ආරංචියක් ආවා"

"ඔව් නංගා... මේ වැකේෂන්... ආය යන්න ඕනෙ

"බලන්න ආසයි ඔයාව"

"මටත්... නංගි උඩවලවේ ගෙදරද ඉන්නේ"

"ඔව් අක්කි... මට කැම්පස් යන්න මදි වුණානෙ

"ඔයාට තිබ්බ වැඩ වල හැටියට ඔහොම පාස් වුණා කියන එකත් පුදුමයක්... මේ සැරේ ෂුවර්... පාඩම් කරනවද"

"පාඩම් නම් කරනවා... බලමු නේද... කොහොමද ඔයාගේ විස්තර"

"මේ සැරේ ආවට පස්සේ ගෙදරින් මට මඟුලක් තීන්දු කළානේ"

"ෂා... හොඳයිනේ... කොහේ කෙනෙක්ද"

"මම නංගිට කතා කළෙත් ඒකයි... එයා වැඩිය කතා නැහැ... ටිකක් සැරයි වගේ... ඒ නිසා එයා කියන ඒවා අහගෙන ඉන්නවා මිසක් මම එයා එක්ක වැඩිය කතා කරන්නේ නැහැ" සස්වින්දි සිනාසුනාය.

"එයා රත්නපුරේ එක්කෙනෙක් නංගී... බිස්නස්මන් කෙනෙක්"

"ජෙම්ද"

"නැහැ... ටී... බක්මීමල්දෙණිය ටී එක්ස්පෝට් කම්පැනි... ඔයා අහලා තියනවද" සස්වින්දි මොහොතකට ඇවිලී ගියාය.

"නංගී... සස්වී" ඇයට කතා කර ගත නොහැකි විය.

"නංගී... නංගී... මේකට මොකද ඒපාර වුණේ... සිග්නල්වත් නැති වුණාද... සස්වී... නංගී..." ඇය ඇමතුම විසන්ධි කරද්දී සස්වින්දි නිහඬවම සිටියාය. දුරකථනය තිවා දැමූ ඇය මිදුලේ ගසක් යට වාඩි වූවාය.

කොච්චර ගහ බැන ගත්තත් මරා ගත්තත් අපි අතර අමතක කරන්න බැරි ශාරීරික බැඳීමක් තිබුණා හංස... ඔයා ආවේ මාව ගෙනියන්න කියලා මම හිතනවා... ඒත්... වුණේ මොකද්ද... තාත්ති ළඟ ඔයා ළඟ මම අසරණ වුණා...

ඔයා මට ආදරේ කළා වගේම මමත් ඔයාට ආදරේ කරන්න ඇති... මේ දැනෙන වේදනාව ඒ බැඳීම නිසා ඇති වුණ දෙයක් වෙන්න ඇති... සස්වින්දි මුමුණා ගත්තාය.

අයිෂාදි අක්කි ලස්සනයි... මට වඩා ගොඩාක් ලස්සනයි එයා... කිසිම අඩුවක් නැති කෙනෙක්...

හංස ආය කවදාවත් මගේ ළඟට එන්නේ නැහැ කියලා
දන්නවා... කොහොමත් අපි දෙන්නට එකට ඉන්නත්
වෙයි... සස්වින්දි සිතුවාය.

හෝරා ගනනාවකින් ඇය දුරකථනය සක්‍රීය කර
ඇයට පැමිණ තිබුණේ පණිවිඩයකි.

නංගී... එයා තුහංස බක්මීමල්දෙණිය... බක්මීමල්දෙණි
එක්ස්පෝට් කම්පැනි එකේ අයිතිකාරයා... පුළුවන්නම්
විස්තර හොයලා කොල් එකක් දෙන්න...

එයා ගැන තොරතුරු දෙන්න මට වැඩිය කෙනෙක්
නැති වෙයි අක්කී... අයිෂාදිගෙන් පැමිණි පණිවිඩයට
සස්වින්දි මුමුණා ගත්තාය.

කාලය ගත වෙද්දී ගතට දැනුණු නුහුර සස්වින්දි ස
ගෙන ආවාය. තමාට එදා අහඹු ලෙස තුහංස හමුවෙද්
සිටියේ උපත් පාලන පෙති අතහැර දමාය. පෙරදා තුහංස
ඇති වූ රණ්ඩුවෙන් පසු ඇය ඒවා පාවිච්චිය අත හැර දැමූ

තුහංස තියුම් රැගෙන ගොස් තමාව ගෙන්වා ගත්
ඔහු සමඟ සබඳකමක් නොපැවැත් වූයෙන් එදින ගැ
නොවීය. තුහංස විදේශ ගත වන බව දන්වා සිටි නිසාවෙ
නැවත පෙති ලබා ගැනීමට උනන්දු නොවූවාය. ඔහුට
හමු වූයේ නොසිතූ මොහොතක නොසිතූ අයුරිනි.

දරුවෙකු පිළිසිඳ ඇත්නම් එයට කුමක් කරන්නේ දැ
සිතා ගැනීමට නොහැකි විය. තුහංසගෙන් එයට සැ
නොලැබෙන බව ස්ථිර වුවත් ඔහුට හැර අන් කෙනෙ
පැවසීමට නොහැකි බව ඇය දැන සිටියාය.

"හංස..." සස්වින්දිගෙන් ඇමතුමක් පැමිණෙද්දී
දැනුනේ පුදුමයකි.

'රතු වත... කඳුළු දැස් අමතක කර දැමුවා යැයි සිද
තම හද තුළ සුරැකී තිබෙන බව ඒ මොහොතේදීත් හං
නොගත්තේය.

"මොකද මාව මතක් වෙලා... ඉන්න බැරිද... මැරු
ඕනිද"

"කැමති නම් මරන්න... තරහා වෙන්නේ නැහැ... කොහොමත් කරදර ඉවරකරගන්න හිතෙනවා ඇතිනේ නේද"

"හංසී... අපි හම්බ වෙමුද"

"මටත් ඔයාව හම්බ වෙන්න ඕනේ හංස... මෙහෙ නම් බැහැ"

"මනෝජ් ලොක්කා සීමා පනවලා නේද... එහෙනම් කෑගල්ලට එනවද"

"හ්ම්..." කවද්ද කොහොමද යැයි අසාගත් සස්වින්දි ඇමතුම විසන්ධි කර ගත්තේ මද සහනයකිනි.

ඔයා ගැන ඔයාගෙ තාත්ති එක්ක කතා කරනවා ඇරෙන්න වෙන කා එක්ක කතා කරන්නද පුතේ... සස්වින්දි කුසට අත තබා ගනිමින් මුමුණා ගත්තාය.

අයිෂාදි හමුවීමට නුවර පැමිණි තුහංස ඇතිවූ සිතුවිල්ලක් හේතුවෙන් සස්වින්දිගේ පරිසණක පන්තිය අසලින් වාහනය ගෙන ගියේය. අහඹු ලෙස පන්තිය නිමවා පැමිණෙන සස්වින්දි දුටු ඔහු වාහනය නතර කළේය.

"අක්කී... හංස අයියා ඇවිල්ල" ඔහු දුටු තියුමි රහසින් කීවාය.

"අම්මේ... වෙලාවට රහල් අද නැහැ" සස්වින්දි පැවසුවේ සැනසීමකිනි.

"අනේ මන්දා"

"මොනවා කරන්නද තියුමි... මගේ ජීවිතය තීරණය වෙලා තියෙන්නේ මේ විදිහටනම්... මම මේවා විඳින්නම ඕනේ"

"අක්කී... මේක තේරුමක් නැති ගමනක් නම්... ඇයි ඔයා යන්නේ... අනික ලොකු තාත්තා යකා වෙලා ඉන්න වෙලාවේ"

"අද මේ ගමන ඉරණම් ගමනක් වෙන්නත් පුළුවන් තියුමි"

"ඔයා තවත් අමාරුවේ වැටෙයි මගෙ අක්කියෝ"

"තවත් මොන අමාරුවක වැටෙන්නද තියුමි මම... අද මම අමාරුවේ වැටිලා නෙවෙයි අසරණත් වෙලා ඉන්නේ" සස්වින්දි

දෑසට කඳුළු නඟා ගත්තාය. තුහංස නලාව හැඩ වූවේය.

"යන්නම් තියුමී... දන්නවනේ හැටි" කියූ සස්වි
තුහංසගේ රථය වෙතට ගියාය.

"අද ඇයි මේ... කොහොමද මම ඉන්නවා කියලා දන්නෙ

"නුවර ආව එකේ නිකමට බලලා යන්න හිතුණා"

ආවේ අයිෂාදි හම්බවෙන්න වෙන්න ඇති... සස්වින්දි
මිස කීවේ නැත.

"බයයිද මගේ එක්ක යන්න"

"ඇයි... මගේ මොනවා නැති වෙන්නද... නැති වුණෙ
ජීවිතේ විතරයි"

"ඒකට හානියක් කරන්නේ නැහැ මම"

"මොකද නැත්තේ... ඇයි එදා වාහනේට යට
ගියේ"

"ඇත්තටමද කියන්නේ... එදා මනෝජ් අ
කිව්වා" සස්වින්දි තුහංස දෙස බැලුවාය. ඔහුද ඇය දෙ
සිටියේය.

"ඇත්තටම මතක නැද්ද" තුහංස හිස සෙලවූවේය.

"බොරු කියන්න එපා හංස... ඔයා හිතලමයි මාව
ගියේ... ඇත්තටම යන්න බයයි තමයි... කවුද දන්නෙ
මරන්න ගෙනියනවද කියලා"

"මටත් ඒ බය දැනෙනවා හංසි" සස්වින්දි
බැලුවාය.

"කවුද දන්නේ ඔයත් මේ කවදාවත් නැතුව මාව
කිව්වේ ඇයි කියලා... ඒකයි මම දවස මාරු කරලා ආවෙ
දන්නේ මොනවා කරන්න හිතාගෙන ඉන්නවද කියලා"

"විකාර කියවනවද" සස්වින්දි තරහෙන් ඇසුවාය.

"ඔයා මට මල් පෝච්චියෙන් දමලා ග

ඉවරයි... ඔයා මාව දාලා දිව්වත් එක්කනේ"

"අනේ හංස..." සස්වින්දි කඳුළු පුරවා ගනිමින් තුහංසට තුරුලු වූවාය.

"පාර කෙල්ලේ... අපි දෙන්නම මැරෙයි" ඇය තුහංසගෙන් ඉවත් වූවාය. ඔහු ඇයට ඉවත් වීමට දුන්නේ සිපුමක් දීමෙන් අනතුරුවයි.

"ඇයි ඇත්තට අද ආවේ"

"අමාරුවට... වෙන මොකටද"

"හොඳ වෙයි හෙට අනිද්දට"

"ඒ කොහොමද"

"නැහැ... ගෙදරම ඉන්නකොට ලේසියිනේ"

"ඇයි ඔයාට අපේ ගෙදර නවතින්න අදහසක්වත් ආවද"

"විකාර කතා නවත්වමු හංස... මම මේ ගිණි පත්තුවෙලා ඉන්නේ"

"ඇයි"

"එදා අපි හම්බ වුණේ නොහිතුව විදිහටනේ... ඒ වෙන කොට මම ටැබ්ලට් නවත්තලා තිබුණේ... මට දැන් සැකයි හංස" සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"එහෙම දෙයක් නම්..." තුහංස නොඇසුණු ලෙසින් වාහනය ගෙන ගියේ අසල තිබූ මත් පැන් බෝතලයක් ගෙන කට තබා ගනිමිනි.

"හංස... අනේ මම මොකද කරන්නේ... මට මැරෙන්න තමයි වෙන්නේ"

"ඉතින් මැරෙනවා... තමුසෙගේ මහ එකා මම එක්ක යනවා කියන කොට බෙල්ල මිරිකලා මරන්න ගියේ"

"අනේ හංස..." සස්වින්දි හංසගේ සුරත දෝතින්ම අල්ලා ගත්තාය.

"ඇයි මට කියන්නේ"

"ඔයාට නොකියා මම කාටද කියන්නේ... මට දරුවෙක් නම්... ඒ දරුවා ඔයාගේ... ඔයාගේ ලේ" සස්වින්දි කෑගැසුවාය.

"මම කලින්ම කිව්වා ඔහොම දෙයක් වුණොත් මට කියන්න එපා කියලා... ඒවට මම ප්‍රතිකර්මත් යෙදුවා... තමුසෙගේ නොසැලකිල්ලට මට කරන්න දෙයක් නැහැ... ළමයෙක් නම් හදාගන්නවනම් එහෙමයි... නැතිකර ගන්නවනම් එහෙමයි... මාව ගාව ගන්න එපා... මහ ලොකු තාත්තිට කියනවා... එයා මොනවා හරි කරයි" සස්වින්දි තවත් වචනයක් හෝ පැවසුවේ නැත. ඔහු සමග නිහඬව කාමරයට ගියාය.

"මම රස්තියාදුකාරයා... මැරයා... සල්ලාලයා... එයාගේ දූ වගේ වටිනා වස්තුව මට දෙන්නේ කොහොමද කියලයි ඇහුව්වේ" සස්වින්දි කඳුළු සලමින් යහනේ වාඩි වූවාය.

"ඒ නිසා හංසි ඔයා ගිහින් ඕක ඔයාගේ තාත්තිට කියන්න" තුහංස නැවත මත් පැන් බොතලය අතට ගත්තේය.

"අනික හංසි මට දැන් මඟුලක් තීන්දු වෙලා තියෙන්නේ මම ලබන මාසේ එයාව බඳිනවා"

"මම දන්නවා"

"දන්නවා..." තුහංස පුදුමයෙන් ඇසුවේය.

"ඔව්... දන්නවා"

"එහෙනම් ඒකයි මේ" තුහංස සිනාසුණේය. සස්වින්දි දෙස බැලුවේ ඔහු සිනා සෙන්නේ ඇයි යන්න වටහා නොහැකිවයි.

"බොරුවට දරුවෙක් ලැබෙන්න ඉන්නවා කිව්වම මඟුල කඩාගෙන ඇවිත් තමුසෙව බඳියි කියලා හිතුවද... එ... මේ හංසව රවටන්න බැහැ හංසි"

"හංස... මොනවද කියන්නේ"

"තමුසෙලාගේ ප්ලෑන් මම දන්නේ නැහැ කියලා හිත... තාත්තා කපටියා... බොරුවට ලොකුකම දානවා දූව ... බැහැ වගේ... දූව එවනවා බඩේ ළමයෙක් කියලා මම බඳියිද බලන්න" සස්වින්දි ඉකි ගැසුවාය.

තුහංස ඇය අසලින් ඇයගේ ඇඟේ ගෑවෙන නොගෑවෙන තරමට ළංව වාඩි වූයේ ඇය දෙසම බලාගෙනය. ඔහුට පවසා කම් නැත... ඔහු හා දබර කරගෙන එලක් නැත. සස්වින්දි නිහඬ වන්නෙමියි සිතාගෙන අරමුණකින් තොරව ඔහු දෙස බලා සිටියාය.

රතු වත... කඳුළු දෑස... තුහංසට තවත් බලා සිටිය නොහැකි විය.

තාත්ති මෙච්චර දේවල් හංසට කියලා තියෙද්දී මම හංසට ඒ ගැන කිව්වේ අපරාදේ... බබෙක් කියලා මම හොඳටම දන්නවා... ඒත්... ඒක හංසට නොකියා ඉන්න තිබුණේ... සස්වින්දි තුහංසට නිහඬව නතු වෙමින් සිතුවාය.

"අයිෂාදි කියන්නේ රූප රාජිණියක් තරමට ලස්සන කෙල්ලක්... ලොකු ඉස්කෝලෙක ඉගෙන ගත්ත කෙනෙක්... ශිෂ්‍ය නායිකාවක්... දැන් රුසියාවේ ලුබුම්බා විශ්ව විද්‍යාලයේ" සස්වින්දි ඒවා දන්න බවක් නොහඟවා නිහඬව සිටියාය.

"ලොකු බූදලයක් තියනවා එයාට... ඒ අය මට පණ වගේ... ගිහින් කියනවා තමුසෙගේ මහ ලොකු තාත්තට එයාගේ දුව ඒ කෙල්ලගේ පයට පෑගෙන දූවිල්ලක් තරම්වත් වටින්නේ නැහැ කියලා" සස්වින්දි ඉවත බලා ගත්තාය.

"කෑගල්ලේ ඉස්කෝලෙකට නේද ගියේ නැන්දලාගේ ගෙදර ඉඳලා... ඊයේ පෙරේදා නුවර කම්පියුටර් ක්ලාස් එකකට දාලා ලොකු දෙයක් කරනවා කියලා හිතාගෙන ලොකු වෙන්න හිතුවට... එයා ළඟට යන්න තව ගොඩාක් දුර යන්න වෙයි තමුසෙට"

කරන අපහස තමාට විඳින්නට කිසිදු වුවමනාවක් නැත. ඔහු නොදත්තාට තමා ගියේ එම පාසලටමයි... ඇය ශිෂ්‍ය නායිකාවක් වෙද්දී තමා ප්‍රධාන ශිෂ්‍ය නායිකාවයි... කැම්පස් නොගියාට ඇයට වඩා තමාගේ උසස් පෙළ ප්‍රතිඵල ඇත්තේ ඉහළ මට්ටමකයි...

වයසින් තමාට ඉදිරියෙන් සිටියද සෑම අවස්ථාවකම තමාට පසු පසින් සිටි ඇය ක්‍රියා කරන්නට සිදුවූයේ තමාගේ උපදෙස්

වලට අනුවයි... හංස... ඒක ඔයා දන්නවනම්... මේ කතා කියපු ඔයාට මොනවා හිතෙයිද... සස්වින්දි සිතුවාය.

තව තවත් මත් පැන් බිබී සස්වින්දිට අපහාස කළ තුහංස කියව කියවාම නින්දට වැටුණේය. ඔහුව කෝප කරගෙන තවත් විනාසයක් කර ගන්නට නොසිතූ සස්වින්දි ඔහු අසලින්ම නින්දට වැටුණාය.

නින්දෙන් අවදි වූ සස්වින්දි මොහොතක් තුහංස දෙස බලා සිටියාය. තමාට කොතරම් කල් ගත වුවද ඔහුව වටහා ගැනීමට නොහැකි වූ බව ඇය වටහා ගත්තාය. අයිෂාදි පැවසූවාක් මෙන් තුහංස ගුප්තය. මොහොතින් මොහොත වෙනස් වන ඔහු කරන්නේ කුමක්ද කියන්නේ මොනවාද යන්න වටහා ගැ නොහැකිය. ඔහුගේ අරමුණ කුමක්ද යන්න ඔහුවත් දන්නෙ නැතුව ඇතැයි සස්වින්දිට සිතිණි.

කොරම් අවමන් කළද තමාට පීඩා කළද මේ සිටින්නෙ තමන්ගේ දරුවාගේ පියායි. මිහිරෙන් සතුටින් ගත කළ දිනයේ ඇති වූ බැඳීමේ ප්‍රතිඵලයක් වූ මේ කලලයේ පූර් අයිතිය ඔහුයි. තුහංස කෙරෙහි දැනුණු හැඟීමකට සස්වින් ඔහුගේ නලල සිප ගත්තාය. ඒ උණුහුමටදෝ තුහංස අ වූවේය. මොහොතක් ඇය දෙස බලා සිටි ඔහු ඇයව තුරු ගෙන නොනවත්වා සිප ගත්තේය.

"වෙරි හිදිලද... කියන්න හිතේ තිබුණ ඒවා ඔක්කො කියලා ඉවරද"

"මොනවද"

"ඇයි මතක නැද්ද වෙරි මරගාතේ දොඩවපුවා"

"හැමදේම මතක නැති වුණාට බොහෝ දේ අම වෙන්නේ නැහැ"

"ඒක ඇත්ත... මාත් ඒක පිළිගන්නවා"

"මොනවද"

"මීප මිනිහා ම...

"අල්ලපු ගෙදරට පුරුද්දට රිංගන එකා ඇරෙන්න අනෙත් එවුන් නේද" තුහංස නැවත ඇයගේ වතට එබුණේය.

"මට යන්න ඕනේ හංස"

"අද ඉඳලා යමු"

"අනේ බැහැ..."

"අන්තිම දවස කියලා හිතලා"

"හිතලා නෙවෙයි... අන්තිම දවස තමයි"

"ඇයි..."

"ඔයා අයිෂාදි අක්කිව බඳිනවනම් එයාට වරදක් කරන්න එපා හංස... තමන්ගේ සැමියගේ ආදරේ තරම් වටින දෙයක් බිරිඳකට නැහැ... මොනදේ හම්බවුණත් ඒ දේ නැත්නම් වැඩක් නැහැ" තුහංස නිහඬව ඇය දෙස බලා සිටියේ ඇයව පුදුම කරවමිනි.

"ඇ... ඇයි හංස"

"ඔයා කොහොමද දන්නේ මම බඳින කෙනා අයිෂාදි කියලා" සස්වින්දි වැරැද්දක් වූ බව වැටහිණි.

"ඇයි ඔයා වෙරි මරගාතේ එයාගේ වග දෙඩෙව්වේ" තුහංස එය පිළිගත්තා යැයි හැඟෙද්දී සස්වින්දි සැනසුම් සුසුමක් හෙලුවාය.

"දැන් දරුවෙක් බඩේ ඉන්නවා කිව්වේ ඒක නතර කරන්න නේද... ඒකරලා මොකද පුවුල් ජීවිතේ ගැන මට උපදෙස් දෙන්නේ"

"දරුවෙක් ලැබෙන්න ඉන්නවා කියලා මම කිව්වේ නැහැ හංස... සැකේට එහෙම වුණොත් කියලා කිව්වා මිසක්" සස්වින්දි මුසාවක් කීවාය.

"තාත්තලා දුවලා තමුසෙලා නම් මාර බඩු... කතා කරන්නේ දේවත්වයෙන්... ඒ වුණාට කපටිකම"

"මොනවද ... මොනවද... කපටිකම්" සස්වින්දි කෝප වූවාය.

"අද මේ අහම්බෙන් හම්බුණ දවසේ මගේ එක්ක රණ්ඩුවෙලා ගුටිකාලා මට ගහලා යන්නේ නැතුව කට වහ ගන්නවා" කියූ ඔහු දෙතොලින්ම ඇයගේ කට වසා දැමුවේය.

අයිෂාදිගේ පියා වූ සුසිල් දන්තනායක සමාගමට මුදල් යොදා එහි අඩ අයිතියක් ලබා ගත්තේය.

එහි කටයුතු සිදුකිරීමට පෙර සජීවා කාර්යාලයට පැමිණි මනෝජ් හමුවී සියල්ල පැවසුවාය. පූර්ණ අයිතිය ලබා ගැනීමට සිතා සිටි සුසිල් දන්තනායකට අඩ අයිතියක් ගැනීමට සිදුවූයේ මනෝජ්ගේ උපදෙස් මතය.

සුසිල් කාර්යාලයට එද්දී මනෝජ් ඉවත්වීමේ ලිපිය සැකසුවේය.

එදා වූ සිද්ධියෙන් පසු තුහංසව මුහුණට මුහුණ හමුවුව පිළිකුලෙන් ඉවත බලාගත් මනෝජ් අස්වීමේ ලිපියගෙන තුහං වෙත යන්නේ කෙසේදැයි සිතුවේය.

අවසානයේ ඔහු එය ගෙන සජීවා හමුවට යාමට සි ගත්තේය. නොසිතූ මොහොතක පැමිණි මනෝජ්ව සජී පිළිගත්තේ සුහදවයි. තම සැමියා තමාට තම පුතුට වැ විශ්වාසයක් තබාගෙන සිටි මේ පුද්ගලයා සැබෑම විශ්ව වන්තයෙක් බව සජීවාට සිතුණේ තුහංසට ඔහු කටයුත්තක් ද දෙන ලෙස දැන් වූ දිනයේයි.

එදා තම පුතුගේ අකටයුතු දැන සිටියද ඒවා නොකියා ඔහුට කසාදයක් කර දෙන ලෙස පමණක් කීවේය. තම දියණි ගැන යෝජනාවක් ගෙන ගොස් තිබියදී ඒවා අමතක කෙ දැම්මේය.

මනෝජ් රජීට වගේම මටයි පුතාටයිත් වරදක් කෙ කෙනෙක් නෙවෙයි... සජීවා සිතුවාය.

"මනෝ... එන්න... එන්න... කිව්වේවත් නැහැනේ එ කියලා" සජීවා ඔහුව පිළිගත්තේ සුහදවයි.

"මම සජී මිස්ට මේක දෙන්නයි ආවේ"

"මොකද්ද මනෝ" සජීවා මනෝජ් දුන් ලිපිය දිග හැ ඇසුවාය. මනෝජ් කිසිත් නොකීවේය.

"ඇයි මනෝ... ඇයි මේ..." ඇය ඇසුවේ කලබලෙනි. ඔහු මෙතරම් ඉක්මනින් මෙවැනි තීරණයක් ගනී යැයි ඇය නොසිතුවාය.

"මම සජී මිස්ට කියලනේ තිබුණේ මේ ගැන"

"ඒ වුණාට මනෝ... ඔයා ඉන්නකොට මම හිටියේ හරි සැහැල්ලුවෙන්... ඒ විශ්වාසේ ඉදිරියට නැති වුණාම"

"එහෙම වෙන එකක් නැහැ... හෙට අනිද්දා හංස මහත්තයා නැසාද බැන්දම සුසිල් මහත්තයා හංස මහත්තයාගේ මාමණ්ඩිනේ... එයා ඉතින් එයාගේ දරුවන්ට අකටයුත්තක් කරන එකක් නැහැ"

"මනෝ ඇයි මේ ලියුම පුතාට නොදී මට දෙන්න ආවේ"

පුතා මට කරලා තියෙන විනාසෙට වෙන එකෙක් නම් මරලා වළලපු තැන්වල ගසුත් පැලවෙලා... ඒත් රජී මහත්තයා නිසා මට මොනවත් කර ගන්න බැහැ... මනෝජ් සිතින් කියා ගත්තේය.

"කමක් නැහැ... මනෝගේ ගණු දෙනු ඉතින් මගේ පුක්කනේ... හංසි කොහොමද"

"හොඳින් ඉන්නවා" හිතේ හැඟීම් සඟවාගෙන මනෝජ් පහසුවෙන් කීවේය.

වෙලා තියනදේ කිව්වොත් කෙල්ල ඇගේ ගහන්න කියනවා කියලා හිතයි... කොහොමත් හංස වගේ කෙනෙකුට දීලා මගේ හිංසකී අපායට දාන්න බැහැ... මනෝජ් සිතුවේය.

"තවත් කාරණයක් කියන්න තියනවා සජී මිස්"

"ඒ මොකද්ද"

"මමයි දෝණියි සමහර විට මෙහෙ ඉන්නේ නැති වෙයි... මි මෙහෙන් ගියත් දෝණිට විසි හතර වුණාම ඇවිත් ඒ සල්ලි රන් දෙන්නම්"

"මනෝ විශ්වාස කරලනේ රජී මේ දේ කරන්න ඇත්තේ"

"ඔව්... ඒ විශ්වාසේ මම කවදාවත් බිඳින්නේ නැහැ... මහත්තයා බයේ දැඟලුවට මගේ දෝණිට ඒවා අරන් බැහැ... ඒ මුදල ගන්න නම් රජී මහත්තයාගේ ලෝයර් යන්න ඕනේ... මම දන්න තරමට"

"ඒවා ඒ කාලෙට බලාගමු මනෝ... පුතා ඉතින් කෑගහනවා එයාට සල්ලි නැති වෙන කොට... මනෝජ් ගනන් ගන්නේ නැහැ කියලා මම දන්නවා" මනෝජ් කිසිවක් පැවසුවේ නැත.

වේලාසන නිවසට පැමිණි තුහංස ගේට්ටුවෙන් ඇතුලට දමද්දී මනොජ්ගේ රථය ගේට්ටුවෙන් පිටව ගියේ

"මනෝජ් අංකල් මෙහෙ ආවද"

"ඔව්... අස්වීම දීලා යන්න ආවා"

"අස්වීම..." ඔහු පුදුමයෙන් ඇසුවේය.

"ඔව්... ඇයි පුතාට කිව්වේ නැද්ද"

"අම්මා ඉතින් ඒකට ඉඩ දුන්නද" එයට පිළිතුරු තුහංස ඇසුවේය.

"බැහැ කියන්නත් බැහැනේ පුතා... සුසිල් අංකල් ආව නිසා මනෝජ් අංකල් ඉන්න කැමති නැතුව ඇති නිහඬ විය.

"මනෝජ් අංකල් මෙහෙන් යනවත් කිව්වා"

" කොහෙටද" තිගැස්සුණු තුහංස ඇසුවේය.

"කිව්වේ නැහැ... හංසිටත් ඒ සල්ලි නිකන් ගන් කිව්වා... තාත්තිගේ ලෝයර් හම්බ වෙන්න ඕනෙලු... ඒ වෙන්න එපා කියලා ඔයාට කියන්න කිව්වා"

"ඒවා බයිලා"

"පුතා... මනෝජ් අංකලුයි ඔයයි අතර මො ප්‍රශ්නයක් තියනවද"

"ඇයි අම්මා එහෙම අහන්නේ... එයා මොනවා හ

"නැහැ... මොනවත් කිව්වේ නැහැ... ඒත් මට එහෙම දෙයක් තේරුණා"

"නැහැ මේ සල්ලි නිසා පොඩි ප්‍රශ්නයක් වුණා"

"පුතා... මම හැම වෙලේම කියනවා... තාත්තයි මනෝජ් අංකලුයි ඔයාට දෙන්නෙක් නෙවෙයි"

"ඒ හංසිට... එයාටනේ අපේ තාත්තියි මනෝජ් අංකලුයි දෙන්නෙක් නෙවෙයි වෙන්නේ" තුහංස තවත් එතන රැඳී සිටියේ නැත.

කාමරයට ගිය සැනින් තුහංස මනෝජ්ව ඇමතුවේය. ඒ මොහොතේ සස්වින්දිද නිවසේ විය.

"මූණ නොබැලුවට කමක් නැහැ... මගේ එක්ක කතා කරන්න... දැන් මූණ පේන්නේ නැහැනේ" තුහංස කීවේය.

"තවත් කතා ඇති කියලා මම හිතන්නේ නැහැ... මම සජී මිස්ට හැමදේම කියලා ආවේ"

"හරි... ඒ කියපු කතාවක් අහන්න තමා මම මේ ගත්තේ"

"මොකද්ද"

"මනෝජ් අංකල්ට බැහැ හංසිව අරන් මෙහෙන් යන්න"

"ඇයි බැරි... ඒ මගේ දුව"

"ඔව්... ඒත් ඒ මගේ ගෑනි"

"නීතියෙන් නෙවෙයිනේ"

"මනෝජ් අංකල් මේ... මට ඔයාගේ දුව ගෑනි විදිහට තියා ගන්න ඕනේ නැහැ... මට කසාද බඳින්න කෙල්ලක් ඉන්නවා... ඒත්... කෝටි ගානක් තියාගෙන තමුසෙලාට කොහෙවත් යන්න බැහැ"

"කියන්න තියන ඒවා මම සජී මිස්ට කියලා තියෙන්නේ... මම මගේ තීරණ වෙනස් කරන්නේ නැහැ... සල්ලි වෙලාවට ලැබෙයි" කිසිත් නොකී තුහංස දුරකථනය විසන්ධි කළේය.

නිසාවෙන් කෑම ගැන සැලකිලිමත් නොවූ සඳ
දුර්වල වූවාය. පරිසණක පන්තියේ විභාග නිසා
වල සිටියේ බෝඩිමේය.

"මොකද කෙල්ලේ මේ... මොනාද
තියෙන්නේ" ඇයව පන්තියෙන් රැගෙන යා
ඇසීය.

"ඇගට හරි නැහැ රහල්... හරි යයි... නිදි

"යමුද බෙහෙතක් ගන්න"

"අනේ ඕනි නැහැ"

"ඕනේ නැහැ නෙවෙයි... කියනදේ අහන්

"බැහැ රහල්... බැහැ... හවසට අම
කියන්නම්"

"පුදුම විදිහට ඔයා වෙනස් වෙලා ඇ
කලකිරෙනවා ගෑනු සංහතිය ගැනම" රහ
කීවේය. සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"ඔයා මට නොකියන මොනව
තියනවා" සස්වින්දි ඉකි ගැසිණි.

"සස්වී... පාර ළමයෝ... අඬන්න එපා.
ගිහින් කතා කරමු"

"බැහැ රහල්... ඕනේ නැහැ"

එහෙත් රහල් ඇය නොතකා ඇය
මිතුරෙකුගේ නිවසටයි. ඔහුගේ පියා වෛ
දුවන්නට නොහැකි කමින් සස්වින්දි අ
තෙමසක ගැබිණියක් බව ඔහු පවසද්දී
පෙණුම තමාට කිසිදා අමතක නොවන බව

"රහල් පුතා... ඉගෙන ගත්ත ළමයෙක් විදිහට ඔයාගෙන් මේ වගේ දේවල් සමාජය බලාපොරොත්තු වෙන්නේ නැහැ දරුවෝ..." මිතුරාගේ පියා පැවසුවේ අමනාපයෙනි. රහල් ඔහුට කිසිත් නොකීවේය.

සස්වින්දි බිම බලාගෙනම සිටියේ රහල්ගේ මුහුණ බැලීමට වූ අපහසුව නිසයි. ඇයගේ සුරතින් අල්ලාගත් රහල් මිතුරාගේ නිවසින් එළියට බසින තුරු හඬ අවදි නොකළේය.

"තාත්ති දන්නවද" සස්වින්දි හිස සොලවා නැතැයි කීවාය.

"තියුමි"

"දන්නවා" ඇය පැවසුවේ හීන් හඬිනි.

"මම දන්න කෙනෙක්ද"

"නැහැ රහල්... අනේ... ඕවා අහන්න එපා... මාව මරලා දාන්න"

"ආදරේ කරන හිතකින් ආදරේ කරන කෙනෙක් මොන වරදක් කළත් මරන්න බැහැ සස්වී"

සස්වින්දි සිහි වූයේ තුහංස පෙරදා තමාව වාහනයට යට කරන්නට ගිය අයුරුයි. ආදරේ කියලා මම හිතාගෙන හිටියට ඒක මිරිඟුවක්... තුහංසට තියෙන්නේ මම ගැන ආසාවක් විතරයි... සස්වින්දි සිතිණි.

"එයා දන්නවද මේ ගැන"

"මම කිව්වා"

"කසාද බඳින්න ඉක්මනට... ඔයාට ඕනේ උදව්වක් තියනවනම් මට කියන්න" තවත් දරා සිටිය නොහැකි වූ සස්වින්දි රහල්ගේ උරමතට කඩා වැටුනේ විලාපයක් සමඟයි.

මිතුරාගේ නිවසේ ගේට්ටුවෙන් පිටතට ඔහු ඇයව කැඳවාගෙන පැමිණියේ අවසන් වතාවට ආදරයෙන් ඒ නලල සිප ගැනීමෙන් අනතුරුවයි. මහා බරක් බිම තිබ්බා වැනි හැඟීමක් ඇයට දැනිණි.

බෝඩිමේ නිවසට ගොඩ වූ සස්වින්දි තියුමිව ඇදගෙන කාමරයට ගියාය. යහනේ ඇය අසලින්ම වාඩි ගත් තියුමි සස්වින්දි දෙස බැලුවේ කුහලිනි.

"රහල් අයියා දැන ගත්තා" තියුමි දෑස් විසල් කළාය.

"කිව්වද"

"නැහැ තියුමි" කී සස්වින්දි වූ සිදුවීම කීවාය.

"ඉතින් එයා මොකද කිව්වේ"

"එයා... එයා... " කියූ සස්වින්දි හඬා වැටෙමින් රහල් දැ... වූ ප්‍රතිචාර කීවාය.

"මාර කෙනෙක්නේ එයා... අදහන්න වටින ඉවසීමක්"

"ඒකනේ තියුමි මම කිව්වේ ඒ වගේ කෙනෙක් මේ ලෝ... ඉන්නවනම් ඒ රහල් විතරයි කියලා"

"හ්ම්..."

"රහල් ඔයාගෙන් මේ ගැන අහයි"

"හංස අයියා ගැන"

"ඔව්"

"ඉතින්... මොනවද කියන්න ඕනේ"

"හංස අයියා කවුද කොහොමද කියලා මොනවත... කියන්න එපා ඔයා... මට ගෙදරින් කතා කරලා තියන කෙ... තමයි ඒ කියලා විතරක් කියන්න... විස්තර ඔයා දන්නේ නැ... කියන්න"

සවස රහල් පැමිණ සස්වින්දි අවශ්‍ය බෙහෙත් ලබා දුන්... තියුමිගෙන් ඒ සම්බන්ධයෙන් කිසිවක් විමසුවේ නැත.

"ලොකු තාත්තට කියලා එයාව ගෙදර යවන්න තියුමි" කීවේය.

"අක්කිගේ විභාගේ"

"එයා හොඳින් හිටියම විභාග එකට දෙකක් කරපු... පුළුවන් තියුමි... මේ වෙලාවේ අක්කිට ඕනේ විවේකය"

"රහල් අයියා තරහෙන්ද"

"අනේ නැහැ"

"එහෙනම් ඒ ගැන මොනවත් අහන්නේ නැත්තේ"

"කිව්වේ නැති යමක් අහන්න මට වුවමනාවක් නැහැ"

"අපේ අක්කි පව්... එයා අසරණයි... වැරදියට හිතන්න එපා එයා ගැන... එයා මේ ප්‍රශ්නේ නිසා තමයි රහල් අයියව මග ඇරියේ"

"එයාට මම පිට කෙනෙක් නෙවෙයි තියුමි... ඕනිම දෙයක් එයාට කියන්න පුළුවන්කම තිබුණා මගේ එක්ක... අපේ බැඳීම ඒ වගේ බැඳීමක්... ඒත්..." තියුමි රහල්ගේ දෑසට එබුණාය.

"ඒ මගේ පැත්තෙන් විතරයි කියලා මට දැන් තේරෙනවා"

"නැහැ අයියේ... ප්‍රශ්න ගොඩාක් එතන... අක්කි කැමති වුණේ නැහැ ඔයාට වේදනාවක් දෙන්න... එයා හිතුවේ ඔයා ගැන... ඔයා ගැන විතරයි"

"එයා මම ගැන හිතුවනම් මෙච්චර දුර ගමනක් යයිද නංගී" රහල් තවත් කිසිවක් පැවසීමට තියුමිට ඉඩ නොතබා පිටව ගියේය.

පසුදා සස්වින්දිව රෝහලකට ගෙන යාමට තරම් ඇයගේ අපහසුව දැඩි වූවාය. රහල්ගේ උදව්වෙන් තියුමි සමග ඇයව රෝහලට ඇරලූ හිමිකාරිය සස්වින්දිව රොහලේ නවතා මනෝජ්ට දන්වන ලෙස තියුමිට කීවාය.

"ලොකු තාත්ති... අක්කිට සනීප නැහැ"

"ඇයි"

"එන්නකෝ... එයා හොස්පිට්ල් එකේ"

මනෝජ් රෝහලට එන විට රහල් තියුමි සමඟ සස්වින්දි අසල රැඳී සිටියේය. සස්වින්දි අසලට ගිය මනොජ් ඇයගේ හිස අත ගෑවේ දෑසට කඳුළු පුරවා ගනිමිනි. සේලයින් දියරයෙන් පණ පොවා ගත් සස්වින්දි ඒ වන විට සිටියේ තද නින්දකය.

"ඇයි අක්කට" මනෝජ් තියුමිගෙන් ඇසුවේය.

"වමනයක් ලොකු තාත්තා"

ඇමතුම ලබා දෙද්දී රෝගය තියුමි නොකී නිසාවෙන් මනෝජ් යමක් සිතා ගත්තේය. අසනීපය පවසද්දී ඔහු එය තහවුරු කර ගත්තේය.

අපරාදකාරයා... උඹ මැරුවට හිත් වදින්නේ නැහැ... මගේ කෙල්ලට කළ අපරාදයක්... ඔහු සිතින් මුමුණා ගත්තේය.

"අක්කි කෑවේ නැහැ නේද" ඔහු ඇසුවේය.

"නැහැ... දවස් ගානක්" තියුමි කීවාය. දිග සුසුමක් හෙලූ මනෝජ් හොඳින් රහල් දෙස බැලුවේය.

"ලොකු තාත්තා මේ රහල් අයියා... අක්කි කියලා ඇති නේද"

"ඔව්... අර ත්‍රීවිල් එක තියෙන්නේ"

"ඔව්"

"පුතා කැම්පස් නේද"

"ඔව් අංකල්"

මේ වගේ කොල්ලෙකුට දෙන්න නේද මම දුක් විඳලා මේ කෙල්ලට උගන්නලා මෙච්චර ලස්සනට හැදුවේ... මනෝජ් සිහි කළේ ශෝකයෙනි.

"මම දෝණිව එක්ක යන්නම්... පුතාට එන්න කියලා" තියුමි තිගැස්සුණේ පුතා කවුදැයි වටහා ගත නොහැකිවයි.

"තියුමි තනියම... තියුමි කියන්නේ මගේ පොඩි දෝණි පුතා... මගේ දෝණිව වගේම මෙයාවත් ඔයා බලා ගන්න" රහල් යනු කවුදැයි වටහාගත් මනෝජ් පැවසුවේය.

මගේ දෝණි ඔයා එක්ක සම්බන්ධයක් තිබුණා කියලා මට හිතෙනවා පුතා... ඒ නැතත් ඔයා එයා ගැන බලාපොරොත්තු තියාගෙන ඉන්නවා කියලා මට දැනෙනවා... කාගෙවත් පව් වලට ඔයා වගේ වටිනා කොල්ලෙක් ලවා වන්දි ගෙවා ගන්න මම සූදානම් නැහැ... මනෝජ් සිතින් කියා ගත්තේය.

"රහල් අයියා... ලොකු තාත්තිට කිව්වද" තියුමි ඇසුවේ රහසිනි.

"නැහැ... එයා හිතා ගන්න ඇති" රහල් පැවසුවේ බිඳුණු හඬකිනි.

මේක මෙච්චර දුර යනකල් ඔයා මට හැංගුවේ ඇයි සස්වී... රහල් මුමුණා ගත්තේය.

කාමරයට වී තුහංස සිටියේ බර කල්පනාවකය. ඔහු මේ වන විට තීරණයක් ගෙන තිබුණේය. ඒ දේ ඇර මට වෙන කරන්න දෙයක් නැහැ... ඔහු මුමුණා ගත්තේය.

"තියුමි... අක්කි කොහෙද"

"අක්කි ගෙදර හංස අයියා... එයාට සනීප නැතුව ලොකු තාත්ති එක්ක ආවා"

"ඇයි එයාට මොකද"

"ලොකු අසනීපයක් නෙවෙයි... දවස් ගානක් කන්නේ නැතුව හිටියේ... කිව්වට අහන්නේ නැහැනේ... සේලයින් හිටන් දුන්නා" තුහංස තවත් ඇමතුමේ රැඳුනේ නැත. වාහනයේ යතුර අතට ගත් ඔහු නැඟී සිටියේය.

"හංස... උඹට මම ආය කියන්නේ නැහැ" තුහංස ගෙට ඇතුළුවීමට සූදානම් වෙද්දී මනෝජ් දොර හරස් කරමින් කීවේය.

"ආය කිව්වත් එච්චර තමයි මනෝජ් අංකල්" කියූ තුහංස මනෝජ් ඔසවා පසෙක තබා ගෙට ඇතුළුවිය.

"මම පොලිසියට කතා කරනවා"

"කතා කරන්න... වැඩක් වෙයි කියලා මම හිතන්නේ නැහැ මනෝජ් අංකල්... පොලිසිය එන කොට මම ගිහිල්ලා" තුහංස පුරුදුකරුවෙකු මෙන් සස්වින්දිගේ කාමරයට ඇතුළු වූවේය. කුමක් කරන්නදැයි නොදැන සිටි මනෝජ් මිදුලට බැස්සේය.

"තද නින්දක සිටි සස්වින්දි අවදි වූයේ වතට දැනුණු උණුසුමට තිගැස්සීගෙනය.

"හංස..." ඇය නැඟී සිටියාය. තුහංස ඇය හාම ඇය අසලින් වාඩි වූවේය.

"තා..ත්.ති.." සස්වින්දි මිමිණුවේ බියෙනි.

"එළියට ගියා"

"රණ්ඩු වුණාද"

"නැහැ... මම හීමීට උස්සලා පැත්තකින් තියලා ගෙට ආවා"

"ඇයි..."

"තියුමි කිව්වා ඔයාට අසනීපයි කියලා"

"මැරෙන ලෙඩක් නෙවෙයි හංස... මම මැරෙන්නේ නැහැ... බය වෙන්න එපා"

"බය නොවී කොහොමද... මුදල කෝටි ගානක්"

"මැරුණත් හම්බවෙයි"

"එළියට යමුද"

"විකාරද"

"එහෙනම් මෙතන..." තුහංස ඇයගේ වතට එබුණේය.

"හංස මේ..." සස්වින්දි වහා නැඟී සිටියාය.

"වාඩි වෙනවා... මම එළියට යමු කිව්වේ මඟුලකට නෙවෙයි" තුහංස ඇයගේ සුරතින් ඇද වාඩි කරවා ගත්තේය.

"එහෙනම්"

"කන්න මොනවා හරි අරන් දෙන්න"

"ඒ මොකටද... ඇයි... තියුමි මොනාද කිව්වේ" සස්වින්දි ඇසුවේ කලබලෙනි.

තියුමි තමා ගැබිණියක බව ඔහුට පැවසුවාදැයි බියක් ඇයගේ සිතට දැනිණි.

"මොනවත් කිව්වේ නැහැ... ඔයා දවස් ගානක් නොකා ඉඳලා සේලයින් දුන්නා කිව්වා"

"ඉතින්... නොකා හිටියේ මම... ඔයාට තියන අමාරුව මොකද්ද"

"තමුසේ දැක්කම මට තියන අමාරුව මොකද්ද කියලා තමුසෙට මම කියන්න ඕනේ නැහැනේ... නොකා හිටියේ ඇයි කියනවා"

"ඒක මගේ කැමැත්ත... ඒකෙන් කාටවත් වැඩක් නැහැ"

"බොරුවට දරුවෙක් ලැබෙන්න ඉන්නේ කියලා බයිලාවක් ගහන්නද"

"ඇයි එහෙම බයිලාවක් ගහලා තමුසෙව බැඳගන්නද... හීනෙන්වත් හිතන්න එපා" සස්වින්දි කෝප ගත්තාය.

"මම යනවා... අනිද්දට එනවා කියලා පොරොන්දු වුණානේ... ඒක මතක් කරන්න ආවේ" තුහංස නැඟී සිටියේය.

"හංස..." ඔහු නැවතුණේය.

"ආය අපි හම්බවෙන්නේ නැහැ"

"ඒක මගේ තීරණයක් හංසී"

"දෙයියනේ... මගේ ජීවිතේ තේරුම මොකද්ද... ඔයා අද හෙට කසාද බඳිනවා... එතකොට මම ඔයාගේ කවුද... ඇත්තමයි හංස... ඉවස ගන්න බැරි වුණොත් මම ගඟට පනිනවා"

"මේ අහනවා හංසී... මම කසාද බඳිනවා කිව්වට තව බැඳලා නැහැනේ... එතකල් මම කියන දේ කරනවා"

කමක් නැහැ... තව ටික දවසයි... මායි තාත්තියි මෙහෙන් ගියාම ඔයාට අපි ඉන්න තැන හොයා ගන්න බැරි වෙයි... සස්වින්දි සිතුවාය.

යන්නට ගිය ගමන නවතා ආපසු සස්වින්දි වෙත පැමිණි තුහංස ඇය දෙස මොහොතක් බලා සිට ඇයව ගතට තෙරපා ගත්තේය. හාදු වරුසාවක් වතේ තැබූ ඔහු කිසිවක් නොකියාම පිටව ගියේය.

අනේ හංස... මේ ආදරේද... නැත්නම් ආසාවද... සස්වින්දි මුමුණා ගත්තාය.

"ගියාද" දොරකඩට වී තුහංස පිටව යනු බලා සිටි සස්වින්දිගත් මනෝජ් ඇසුවේය.

"ඔව් තාත්ති"

"දන්නවද එයා මේ ගැන"

"නැහැ... මම එදා කිව්වා... ගනන් ගත්තේ නැහැ... මම එයාගේ කසාදේ නවත්වන්න බොරුවක් කරනවා කියලා මට චෝදනා කළා"

"ඇයි කියන්න ගියේ"

"ඊට පස්සේ මම කිව්වේ නැහැ... සැකයක් තිබුණා ඒක හරි කියලා නිකා හිටියා"

"ඒක හොඳයි... එයාට කියන්න එපා දෝණී... එයා ඔය දඟලන්නේ ඔයාට තියන ආසාවට... ආදරේට ලැදියාවට නෙවෙයි... ඒ වගේ මනුස්සයෙක් එක්ක ගිහින් සැනසීමේ ඉන්න බැහැ... අමතක කරන්න එයාව... එයා කසාද බැන්දම එයාට ඔයාව අමතක වෙයි" සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"මගේ... දරුවා..." සස්වින්දි මිමිණුවාය.

"එයාව අපි හදාගමු"

"එයාට තාත්තෙක්..."

"මම එයාගේ තාත්තා... ඔයා එයාගේ අම්මා... මගෙ දෝණී... නීතියෙන් චම්මයි බාප්පයි එයාට උප්පැන්නේ දෙයි. එතකොට හරි" සස්වින්දි හිස සෙල වූවාය.

සස්වින්දි තුහංස හමුවීමට ඒමට පොරොන්දු වූ දින උදෑසන තුහංස සස්වින්දිව ඇමතුවේය.

"කෑගල්ලේ ටවුමට ඇවිත් ඉන්න මම ගන්නම්"

"හ්ම්..."

"තියුමිත් එක්ක එන්න"

"ඒ මොකටද" සස්වින්දි ඇසුවේ තරමක කේන්තියකිනි.

"ඒකිව ගන්න නෙවෙයි... තමුසේ අසනීපෙන් හිටිය නිසා... තනියම එන්න ඕනේ නැහැ"

"කොහොමටත් අද තියුමිට ක්ලාස්... නුවර යන්නම ඕනේ" සස්වින්දි කීවාය.

සස්වින්දි තුහංසගේ වාහනයට ගොඩ වූයේ කියූ පරිදි තියුම් සමඟයි. තුහංසට දරුවා ගැන කිසිවක් නොකියන්නට සස්වින්දි නැන්දාගේ නිවසේදීම ඇයව පොරොන්දුකර ගත්තාය.

"ඇයි හංස... අපි මේ කොහෙද යන්නේ" සස්වින්දි ඇසුවේ තුහංස කච්චේරියට ඇතුළු වෙද්දීය.

"යන්නේ කච්චේරියට... පේනවනේ"

"ඔව්... ඒත් ඇයි"

"කසාද බඳින්න"

"කසාද බඳින්න... ක.. කවු...ද"

"මම... තමුසෙව" සස්වින්දි විසල් කර ගත් දෑසින් මුව අයා ඔහු දෙස බලා සිටියාය.

"කට වහගන්නවා... මැස්සෝ යියි" තුහංස ඇයගේ කනට කර කීවේය.

"එතකොට අයිෂාදි"

"එයාවත් බඳිනවා... ඒ දිනේට"

"හංස ඔයාට පිස්සුද... කරන අනිත් වැඩ වගේ කියලා හිතුවද මේ වැඩේ"

"මම කරන දේ මම කරන්නම්... තමුසේ කට වහගෙන ඉන්නවා"

"කසාද දෙකක්..."

"බඳින්නේ මමනේ... තමුසේ එකයිනේ"

"අහු වුණොත් අවුරුදු හතක සිර දඬුවමක්"

"එතන මම නොගිය තැනක් නෙවෙයිනේ... තියුමි අත්සන් කරනවද සාක්ෂියට" මේ දෙබස් අදහනු බැරිව කට අයාගෙන බලා සිටින තියුමිගෙන් තුහංස ඇසුවේය.

"ඒපාර නංගිත් කට ඇරගෙන... කියන දේ ඇහුණේ නැද්ද"

"ම්.. ආ.. හා..." ඇය අන්දමන්දව කීවාය.

"හංස... මේක සෙල්ලමක් නෙවෙයි... නීතිය එක්ක සෙල්ලම් කරන්න එපා"

"කට වහගෙන එනවා... මම ඉස්සරෝම බඳින්නේ තමුසෙවනේ... තමුසෙට ප්‍රශ්නයක් නැහැ"

"ඇයි මාව බඳින්නේ... හංස... මම ඔයාට මාව බඳින්න කියලා කියලා නැහැ... අනික අපේ තාත්තිත් මාව ඔයාට දෙන්න කැමති නැහැ"

"අපේ අම්මත් තමුසෙව ලේලි කර ගන්න කැමති නැහැ... ඒකනේ එයා තමුසෙගේ තාත්තට ඒ ගැන කියලා පොරොන්දු කරන් තියෙන්නේ... දන්නවද ඒක"

"ඔව්... දන්නවා... ඒකයි මම ඇහුවේ ඇයි ඔයා එහෙම කරන්නේ කියලා... ඔයාගේ කැමැත්තට මාව බඳින්නේ නැහැ කියලා මම හොඳටම දන්නවා... වාහනේට හප්පන්න ගිය ගෑනිව කරේ එල්ලගයිද"

"ඇත්ත තේරෙනවා... ලොකු දෙයක්... ඇත්තටම මට තමුසෙව ඕනේ නැහැ... තමුසේ එක්ක පැහිලා දරු මල්ලෙ හදාගෙන කැදැල්ලේ සුව විඳින්න මට ඕනේ නැහැ. ඒත්..." සස්වින්දි රවාගෙන තුහංස දෙස බැලුවාය.

"රතු වෙන මූණ... කඳුළු ඇස් දෙක විඳින්න මට ඕනේ..."

"ආසාවට... අමාරුවට" සස්වින්දි කීවේ කෝපයෙනි.

"ඔව්... ඒකට තමුසෙගේ තාත්තා මට බාධා කරනවා... ම කාගෙවත් ගැස්සිලි පිම්බිලි බලන්න කැමති මිනිහෙ නෙවෙයි... ඒකයි මම තමුසෙව කසාද බඳින්නෙ අනික..." තුහංස එවර ඇයගේ වතට එබුණේය.

"කෝටි ගාන සුරක්ෂිත වෙන්න ඕනේ... තමුසෙගේ හස්බන්ඩ් හැටියට මටත් එතකොට ඒකට අයිතියක් එනවා... ඒ අයිතිය වෙන කාටවත් යන්න බැහැ... ඒක තමයි මම තමුසෙව කසාද බඳින අනිත් කාරනේ"

කුමන කාරණයකට හෝ ඔහු කරන්නේ නීත්‍යානුකූල කසාදයකි. පසුව කවුරු බැන්දද නීතියෙන් වෙන් නොවුණොත් ඔහුගේ නීත්‍යානුකූල අයිතිය තමා සතුය. මේ කසාදය නිසාවෙන් තම දරුවාට පියෙක් ලැබෙන්නේය. සස්වින්දි තියුම් දෙස බැලුවාය. ඇයගේ සිතුවිල්ල අනුමත කළාක් මෙන් සිනහවකින් තියුම් ඇය දෙස බැලුවාය.

"හංසයා... මම පරක්කු වුණාද"

පුරුදු හඬ නොසිතූ මොහොතක ඇසෙද්දී සස්වින්දි මෙන්ම තියුම්ද තිගැස්සුණෝය.

"නැහැ රහලා... ඉස්සර වගේම උඹ ටයිම් නම් ටයිම්" තුහංස ඔහුව වැළඳගනිමින් කීවේය.

"ඇයි ඩෝ... උඹේ මේ වැඩේට වෙන එකෙක් හිටියේම නැද්ද"

"හිටියා මචං... ඒත් මගේ බොක්ක උඹ කියලා උඹ දන්නවනේ" කියූ තුහංස සස්වින්දි හා තියුම් දෙස බැලුවේය. ඔවුන් සිටියේ තවමත් ගල් ගැසීගෙනයි. තුහංස හාම සස්වින්දි හා තියුම් දෙසට හැරුණු රහල්ද ගල් ගැසිණි.

"හංසි මේ රහල්... මගේ ඉස්කෝලේ හොඳම යාළුවා" තුහංස ඔහුව හඳුන්වා දුන්නේය.

තුහංස රහල්ගේ පාසලේ ඉගෙණුම ලැබූ බව සස්වින්දි දැන සිටියේ නැත. පියා පැවසූ ආකාරයට රහල් අධ්‍යාපනය ලැබුවේ කොළඹ උසස් පාසලකයි.

ඔහුගේ පෙරත්තට උසස් පෙළට මහනුවර පාසලකට ඇතුළත් කළ වග මනෝජ් දැන සිටියද සස්වින්දි දැන සිටියේ නැත.

"දැන් කවුද මේ දෙන්නගෙන් උඹේ හංසි" රහල් සිය හැඟීම් ආයාසයෙන් යටපත් කරගෙන මුල් වතාවට ඔවුන් දුටු ලෙසින්

ඔවුන් දෙස බලා ඇසුවේය. සස්වින්දිත
මොහොතේත් සිටියේ ගල් ගැසීගෙනයි.

"මෙයා... මෙයා... අරයා එයාගේ නංගී තියුමි

"ආ... " රහල් ඔවුන්ට සිනාසුණේය.

දෙයියනේ රහල් අයියා... ඔයා නම් පුදුම ෙ
සස්වින්දිගේ සිතුවිල්ලේම සිටියාය.

"මෙයාට අපේ තාත්තියි අම්මයි කියන්නේ
නිසා තමයි මමත් මෙයාට හංසි කියන්නේ...
හැමෝම කියන්නේ සස්වී කියලා... මෙය
නෙවෙයිනේ" තුහංස සිනාසෙමින් ඇසුවේය.
ගියාය.

එකිනෙකා ගැන මේ තරම් දන්නා සම්
මැද හිටිය මම නොදැන... සස්වින්දි සිතුවාය.

"අපෝ නැහැ මචං... එයා සස්විස
කිව්වට" රහල් රහසින් සස්වින්දි දෙස බලා කීෙ

තියුමිත් රහලුත් සාක්ෂියට දමා විවාහය
කටයුතු අවසන් කළ මොහොතේම රහල්ට
වුවමනා විය.

"රහලා... අඩුම තරමේ මොනවත් බීලවත්

"ඕනේ නැහැ... බිව්වා වගේ තම
එන්නම්කෝ දවසක... එතකොට දාමු පාටි
උඹට සුබම සුබ අනාගතයක් මචං"
වැළඳගත්තේය.

"ඔන්න උඹ සස්විව බඳින දවසට උඹේ
ගහන්නේ මම"

"බඳින්න හිතුනොත් මම උඹට කියන්නම්

"අඩෝ... බඳින්නේ නැහැ කිව්ව මම බඳි
කිය කියා හිටිය එකා හිතනවා"

"මම එදා කිව්වා වගේ අදත් කියන
කරන්න කසාද බඳින්නම ඕනේ නැහැ... ඒක

ඔවුන් දෙස බලා ඇසුවේය. සස්වින්දිත් තියුමිත් ඒ මොහොතේත් සිටියේ ගල් ගැසීගෙනයි.

"මෙයා... මෙයා... අරයා එයාගේ නංගී තියුමි"

"ආ... " රහල් ඔවුන්ට සිනාසුණේය.

දෙයියනේ රහල් අයියා... ඔයා නම් පුදුම කෙනෙක්... තියුමි සස්වින්දිගේ සිතුවිල්ලේම සිටියාය.

"මෙයාට අපේ තාත්තියි අම්මයි කියන්නේ හංසි කියලා... ඒ නිසා තමයි මමත් මෙයාට හංසි කියන්නේ... නම සස්වින්දි... හැමෝම කියන්නේ සස්වී කියලා... මෙයා උඹේ සස්වී නෙවෙයිනේ" තුහංස සිනාසෙමින් ඇසුවේය. සස්වින්දි වෙව්ලා ගියාය.

එකිනෙකා ගැන මේ තරම් දන්නා සම්බන්ධයක්... අතර මැද හිටිය මම නොදැන... සස්වින්දි සිතුවාය.

"අපෝ නැහැ මචං... එයා සස්විකා... මම සස්වී කිව්වට" රහල් රහසින් සස්වින්දි දෙස බලා කීවේය.

තියුමිත් රහලුත් සාක්ෂියට දමා විවාහය ලියාපදිංචි කිරීමේ කටයුතු අවසන් කළ මොහොතේම රහල්ට පිටව යන්නට වුවමනා විය.

"රහලා... අඩුම තරමේ මොනවත් බීලවත් යමු මචං"

"ඕනේ නැහැ... බිව්වා වගේ තමයි... මම ගෙදර එන්නම්කෝ දවසක... එතකොට දාමු පාටියක්... එහෙනම්. උඹට සුභම සුභ අනාගතයක් මචං" රහල් තුහංසව වැළඳගත්තේය.

"ඔන්න උඹ සස්විව බඳින දවසට උඹේ කසාදෙට අත්සන ගහන්නේ මම"

"බඳින්න හිතුනොත් මම උඹට කියන්නම්"

"අඩෝ... බඳින්නේ නැහැ කිව්ව මම බඳින කොට... බඳින කිය කියා හිටිය එකා හිතනවා"

"මම එදා කිව්වා වගේ අදත් කියනවා මචං... ආදර කරන්න කසාද බඳින්නම ඕනේ නැහැ... ඒක උඹ ආදරේ ලබෑ

කොට තේරෙයි" සස්වින්දි දවාලමින් රහල් කීවේය.

"බලමුකෝ..." තුහංස සිනාසුණේය.

"මොනවා වුණත් උඹ උස්සලා තියෙන්නේ නියම කෙල්ලක් හංසයා... උඹ මේ කරපු දේ ගැන මට සතුටුයි මචං" සස්වින්දිට සුරත දෙන ගමන් රහල් කීවේය.

පපුව පැලී යාමට තරම් වේදනාවකින් රහල්ගේ සුරතේ උණුසුමට සමු දුන් සස්වින්දි දෑසේ කඳුළු සඟවා ගැනීමට නිශ්ඵල උත්සහයක් දැරුවාය.

මම දැන් දන්නවා රත්තරන්... ඔයාට මොකද වුණේ කියලා... හිතේ තිබුණ කේන්තිය නැත්තටම නැති වුණා... මගේ කෙල්ල එච්චර වේදනාවක් හිතේ තියාගෙන විදෙව්වා කියලා මම දැනගෙන හිටියේ නැහැ... මේ රහල්ට ඔය දේ ඔයා කිව්ව නම් මගේ දුක කෙසේ වෙතත් ඔයා විදවන්නේ නැහැ කෙල්ලේ... රහල් ඒ දෑස දෙස බලාගෙන සිතෙන් මිමිණුවේය.

මම කොච්චර ආදරේද... තුරුල් කර ගත්තේ ඔය මූණ සිප ගත්තේ පිවිතුරු හැඟීමකින්... පපුවේ හිර වෙලා තිබුණ ආදරෙන්... අයිති නැති බව නොදැන... නොදැන කළ වරදට සමාව දෙන්න කෙල්ලේ... ආදරෙයි... ඒ විදිහටම ඔයාට මම... හැමදාමත්...

මට සමාවෙන්න රහල්... සිය දහස් වාරයක් සමාවෙන්න... ඔයාට මම කළේ කොච්චර වරදක්ද... එදා මම අම්ම කෙනෙක් වෙන්න යනවා කියන කොට ඔයාට මොනවා හිතෙන්න ඇද්ද... අද මම... ඔයාගේ පණ වගේ යාළුවාගේ බිරිඳ වෙන කොට ඔයා අපේ සාක්ෂිකාරයා වෙන කොට ඔයාට මොනවා හිතෙන්න ඇද්ද... මේ එකක්වත් මම හිතලා කළ දේවල් නෙවෙයි දෙවියනේ... ඉරණම ඇයි මෙහෙම කළේ... සස්වින්දි මුමුණා ගත්තාය.

ඔයාට තුරුල් වෙලා ඔයාගේ උණුසුම විදගෙන පෙම්බස් දොඩවන කොට මම වෙන කෙනෙක් වෙනුවෙන් කැප වෙලා ඉවරයි... එයාට වටිනාකමම දීලා ඉවරයි... ඔයාට අයිති නැති වස්තුවක් වෙලා ඉවරයි... මට සමාවෙන්න රහල්... මම අසරණයි...

"තියුමි ක්ලාස් යන්න ඕනේ නේද" සස්වින්දි ඇසු
රහල් සමඟ යැවීමට සිතාගෙනයි.

"තියුමි එහෙනම් මේ අයියා එක්ක යන්න... මචං ෙ
නංගිව දාගෙන පලයන්" රහල් හිස සෙල වූවේය. තියුමි ඖ
පසුපස වැටුණාය. සස්වින්දි සැනසුම් සිතින් ඔවුන් දෙස බ
සිටියාය.

මගේ අඩුව අද ඉදලා තියුමි පුරවයි රහල්... සස්වින්දි මුමු
ගත්තාය.

අතට දැනුණු රළු සුරත් පහසට තුහංස දෙස බැලූ සස්වි
ඔහුගේ දෑසේ ඉඟියට ඔහු හා පෙළට වැටුණාය.

මංගල පෝරු රන් මාල තැලි පිළි නොමැතිව ආ
කරුණාව සෙනහස පමණක් නොව සැමියෙක
පිළිගැනීමකුත් නොමැතිව ඔහුගේ උරුමයක් පමණක්
දරාගෙන පතිනියක් වූ සස්වින්දි තුහංස සමඟ පා තැබුවේ
බලාපොරොත්තුවක් කර පින්නාගෙන නොවේ. එ
දරුවාගේ උරුමය අනන්‍යතාවය ගැන වූ තුටු සිතිණි.

"දන්නවද හංසි" ජීප් රියට නැඟි තුහංස පැවසුවේ
දෙස බලාගෙනයි. සස්වින්දි නිහඬව ඔහු දෙස බැලුවාය.

"මගේ යාළුවා රහල්... ඌ හරි හොඳ කොල්ලෙක්...
කැම්පස්" සස්වින්දි නිහඬවම සිටියාය.

"ඔයා නිකමටවත් ඒ කොල්ලා දිහා ඔලුව උස්ස
බැලුවේ නැහැ... කතා කළෙත් නැහැ... ඔයාගෙ
ආඩම්බරකමට මම කැමතියි" තුහංස රථය පණ
ගත්තේය.

"රහලයා හිතන්න ඇති... ඔයා අහිංසක සූකිරි ෙ
කියලා... ඒකනේ අරෙහෙම කිව්වේ... මමනේ දන්නේ තර

"එයා මම ගැන දන්නවද"

"හ්ම්... මම ඔයාගේ කම්පියුටර් ක්ලාස් ආව දවෙ
ඌව හම්බ වෙන්න... අවුරුදු ගානකින්... එදා තමයි එය
මම උස්සපු බව දන්නේ"

"ඒ කියන්නේ ඊට කලිනුත් එයා මාව දන්නවද"

"දන්නවා... මම පෙරලගෙන කිස් කරපු වස බෝතලේ කියලා" තුහංස සිනාසෙමින් කීවේය.

රහල් මම ගැන මොනවා හිතනවා ඇද්ද... ඇයට සිතිණි.

සස්වින්දි තුහංස සමඟ නිවසට යන විට මනෝජ් නිවසේ සිටියේ නැත. සස්වින්දි ඒ ගැන සතුටු වූවාය.

පියාගේ අකමැත්තෙන් තුහංස සමඟ රැදෙන්නට ඇය කැමති වූයේ නැත. එයින් ඔහු බොහෝ හිත රිදවා ගන්නා බව ඇය දැන සිටියාය. එහෙත් තුහංසගේ හිතුවක්කාරකම් වලට ඇය සිටියේ අසරණවයි.

තුහංස ඇය සමඟ ඇයගේ කාමරයටම ආවේය.

"තාත්ති එයි හංස" තුහංස ඇයව තුරුලු කර ගනිද්දී ඇය කෙඳිරුවාය.

"ඉතින්... ආවදෙන්"

"දැක්කම"

"මම ඉන්නේ මගේ වයිෆ් එක්ක... අද රෑට මම මෙහෙ නවතිනවා"

"ඔයා ඇයි මගෙන් පළිගත්තා මදිවටද මගේ තාත්තිගෙනුත් පළිගන්නේ"

"සතුටට... සැනසීමට..." සස්වින්දි කිසිත් නොකියා නිහඬ වූවාය.

"ආප්පේ වගේ මූණ... එල්ලගෙන ඉන්න තාලෙට මොනවත් කරන්න තියා මූණවත් බලන්න හිතෙන්නේ නැහැ" තුහංස ඇයව අත හැර දැම්මේය.

"ඔයා ලැජ්ජා නැති මිනිහෙක් වුණාට මම එහෙම ගෑනියක් නෙවෙයි හංස... කසාද බැන්දා නෙවෙයි ළමයි හම්බ වෙලා දෙමාපියෝ වෙලා හිටියත් මගේ තාත්ති ගෙදර ඉන්නකොට මට ඔයා එක්ක මෙහෙම කාමරේකට වෙලා ඉන්න බැහැ... ලැජ්ජයි"

"දැන් එයා ගෙදර නැහැනේ"

"ළඟට ගියාද කවුද දන්නේ" තුහංස මුහුණ
නැඟී සිටියේය. ඔහුගේ අවනතභාවය ගැන සස්වි
සතුටකි.

"ඔයාව මට හදාගන්න පුලුවන් වෙයි හංස
මගේ හස්බන්ඩ්... දරුවාගේ තාත්තා... ඉතින් ම
ඔයාව අත අරින්නේ... සස්වින්දි සිතුවාය.

"රජී අංකල් දිහා බලනකොට මෙහෙම පුල
කියලාවත් හිතන්න බැහැ... ඉස්පිරිතාලෙන් මා
දන්නේ නැහැ"සස්වින්දි පැවසුවේ සිනාසෙමිනි.

"තාත්තිගේ නෙවෙයිද දන්නෙත් නැහැනේ"

"පච් රැස්කර ගන්න එපා හංස" සස්වින්
සෙමින් පහරක් ගැසුවාය.

"කිස් එකක්වත් දීලා යන්න එනවකෝ...
කොහාට හරි ගෙනියනවා" තුහංස සස්වින්දි ඇල

"ඉවසන්න පුරුදු වෙන්න හංස... ඉව
හොඳයි"

"මට පිහිටලා නැති දෙවල් ගැන කියව
ඔයාට ඕනි ඒවා පිහිටලා තියනවනේ මට...
හිතලා හිත හදා ගන්න"

"මොනවද මට ඕනි ඒවා... මම හොයන
ගෑවිලාවත් නැහැ"

"මම කතා කළේ ඒ මගුලක් ගැන නෙවෙ

"එහෙනම්..."

"ශරීර අංග ගැන" තොල සපාගත් තුහ
සිනහාවක් නගා ගනිමින් කාමරයෙන් ඉවතට
ඔහු පසු පසින්ම ආවාය.

"මිනිහා වෙලා ඉස්සරෝම ගෙදරට
දෙන්න ලැස්තියක් තිබ්බයත්... ඒකත් න

"ඉන්න එහෙනම්... තේ එකක් හදලා දෙන්න... තේ බොන මිනිහෙක්ද තේ හදලා දෙන්න"

"ඒක දැන දැන බයිට් එකක් හදලා නොදෙන්නේ ඇයි"

"ඒක නම් කරන්නේ නැහැ"

"ඒක විතරක නෙවෙයි... අනිත් ඒවත් නැහැනේ... මොකටද මම ඉන්නේ... මම යනවා යන්න" තුහංස සස්වින්දි සිප ගනිමින් කීවේය.

මනෝජ් නිවසට ඇතුළු වෙද්දී තුහංස සිටියේ සස්වින්දිව සිප ගනිමිනි. පෙරදා ඔහු චිතු තුරුලේ තබා ගෙන සිටි අයුරු සිහි වී ඔහුට දැනුනේ කේන්තියකි.

"හංස... " ඔහු කෑගැසුවේය.

"මම ආවේ හංසිව බලන්න... ඔයා ඒකට අකමැති වුණත් මට කරන්න දෙයක් නැහැ... මම එනවා"

"මම මගේ දෝණිව උඹට දෙන්නේ නැහැ"

"දැන් නොදී ඉන්නේ කොහොමද අංකල්... හංසි දැන් මගේ වයිෆ්" ගල් ගැසුණු මනෝජ් සස්වින්දි දෙස බැලුවේය.

"මට සමාවෙන්න තාත්තී..." සස්වින්දි විලාප තබමින් මනෝජ්ගේ ළයට බර වූවාය.

"මට සජී මිස් ගෙන් දොස් අහන්න වෙයි දෝණී... ඇයි ඔයා මෙහෙම කසාදයක් කර ගත්තේ... ඔයාට දුක් විඳින්න වෙයි මගේ වස්තුව... මේ මිනිහා ඔයාට ආදරේ නැහැ... ආසාවට වහ වැටිලා ඉන්නේ" සස්වින්දි සිප ගනිමින් කියූ මනෝජ් සිය කාමරයට ගියේ තුහංස දෙස ඇස් කොණටවත් නොබලමිනි. ඔහුගේ වදනට තුහංස කෝප ගත්තේය.

"ඔව්... ආදරයක් නැහැ තමයි... වෛර කරන හිතකින් ආදරේ කරන්නත් බැහැ... තමුසේ කියපු කතාව ඇත්ත මනෝජ් අංකල්... මම ඔහේගේ දුවට වහ වැටිලා ඉන්නේ අසාවට තමයි... මම එයාව බැන්දේත් ඒකයි... මට ඕනි වෙලාවට එන්න යන්න... අනික මගේ කෝටි ගානක මුදලේ

කීවේය. ඇයගේ දෑසට කඳුළු පිරුණාය.

"ඊට වඩා යමක් මගෙන් බලාපොරොත්

කසාදේ තව අවුරුදු තුනකට සීමා වෙයි"
පයින් ගැසූ තුහංස

"උඹත් ඒක දැන ගනින්" සස්වින්දිගේ
කියා නිවසින් පිටවූවේය.

මොහොතකට කලින් කෙලිදෙලෙන් තම
විනාඩි ගනනකට මෙවන් වෙනස්ම
කෙසේදැයි සස්වින්දි සිතුවාය.

මගේත් එක්ක එකට වෙලිලා සතුටක්
යන්න කලින් මාව මරන්න ගිය මිනිහා මෙ
එක පුදුමයක් නෙවෙයි... සස්වින්දි මුමුණා ය

තුහංස පිටව ගිය පසු මනොජ්
පැමිණියේය. සස්වින්දිගේ හිස අතගෑ ඔහු
වූවේය.

"මට සමාවෙන්න දෝණි"

"ඇයි තාත්තී"

"කැමැත්තට අකමැත්තට හරි මොක
කසාද බැන්දා... දැන් එයා ඔයාගේ මහත්ත

"එහෙම හිතන්න එපා තාත්ති... ඔයා ළ

"ඔව් රත්තරන්... එයා ඔයාව තුරුල්
එදා එයා චිතු තුරුල් කරන් හිටිය හැටි මට
මට තරහා ගියේ"

එදා තමා ඉදිරියේ චිතුගේ ළය පළ
කොතරම් ඉවසුවේද යන්න සස්වින්දිට සිහි

"ඔයාලා අතරට මම ආව එක වැරදියි

"මාත් වැරදියි තාත්තී... ඔයා ඔච්චර
බැන්දා... මම හිතුවේ මම ගැන නෙ
අනන්‍යතාවය ගැන"

"ඔයා හරි දෝණී"

"තාත්තී... නාමිකව හරි එයාට දැන් තාත්තෙක් ඉන්නවා... මට පුළුවන් නේද එතකොට ඒ දරුවට නීතියෙන් අම්මා වෙන්න"

"ඔව් රත්තරන්... ඔයාට පුලුවන්... ඉදිරියට මොන දේ සිද්ධ වුණත් අපි ඉවසමු"

එදින රාත්‍රියේ බීමතින් නිවසට පැමිණි තුහංස නිවසේ බඩු පොළවේ ගසා මනෝජ්ට හා සස්වින්දිට බැන වදිමින් සිට පිටව ගියේය. සස්වින්දි සමග කාමරයට වූ මනෝජ් ඔහු පිටව යන තුරුම එලෙසින්ම සිටියේය.

සස්වින්දි ඇතුළට වී සිටියේ මනෝජ්ගේ බලකිරීමට මිස හිතකින් නම් නොවේ. ඇය සිටියේ දැඩි කෝපයකිනි.

සුසිල් දන්තනායක පසුදා මනෝජ් ඇමතුවේ කාර්යාලයේ කටයුත්තක් වෙනුවෙනි.

"මිස්ට පළිඟුආරච්චි... මම සුසිල්... සුසිල් දන්තනායක"

"ඔව් මිස්ට දන්තනායක"

"අනිද්දා බෝඩ් මීටින් එක... මට ක්ලියර් කර ගන්න කාරණා කිහිපයක් තියනවා... හංස පුතා කියනවා මිස්ට පළිඟුආරච්චි එක්ක කතා කරන්න කියලා"

"මොනවද මගෙන් වෙන්න ඕනේ"

"මම අද හංස පුතත් එක්ක එන්නද ගෙදරට... කරදරයක් නොවේ නම්"

"අනේ නැහැ... කිසිම කරදරයක් නැහැ මිස්ටර් දන්තනායක... එන්න"

"දෝණී... හංසලා එනවලු... පොඩ්ඩක් මේවා අස්කරලා දාමුද" දුරකථනය පසෙක තැබූ මනෝජ් කීවේය.

"හංස කෝල් කළාද" සස්වින්දි ඇසුවේ පුදුමයෙනි.

"නැහැ... මිස්ටර් දන්තනායක තමා කතා කළේ... හංස එක්ක එනවා කිව්වේ"

"එන්න කියන්නකෝ"

"දෝණි මේ... පිට මනුස්සයෙක් එක්ක එන්නේ... ඒක හිතේ තියා ගන්න" මනෝජ් අවවාදාත්මකව පැවසුවේය.

මනෝජ්ගේ කීම නොතකා සස්වින්දි ඉස්තෝප්පුවේ පුටු සියල්ල ඉවත් කර එක පුටුවක් පමණක් තැබුවාය. සුසිල් එහි ඉඳගනිද්දී සස්වින්දි වහා කැඩුණු පුටුවක් ගෙන ගොස් තුහංස ළඟින් තැබුවේ ඔහු දෙස නොබලාය.

"ඉඳගන්න හංස මහත්තයා..." තුහංසට කියූ ඇය

"ඊයේ වෙන ගෙදරක බල්ලෙක් ඇවිත් සාලේ පුරා නටලා... ගෙදර බඩු කඩලා... බඩු එළියට දැම්මා ගේ හෝදන්න කියලා... නේද තාත්ති" යැයි ඇගට නොදැනී කීවේ රහසින් තුහංස දෙස බලමිනි. දැස් ගැටෙන මොහොතට ඉවත බලා ගත් තුහංස

"මනෝජ් අංකල් වාඩි වෙන්න" යැයි මනෝජ්ට පුටුව ලබා දී මේසය මතින් පට්ටලව වාඩි වූවේය.

"ඔහොම ඉන්න තාත්ති... කැඩිච්ච පුටුවක් මම වැරදිලා ගෙනල්ලා තියෙන්නේ" කියමින් සස්වින්දි පුටුව මාරු කර දුන්නාය. මනෝජ් එහි වාඩි වී සුසිල් දුන් ලිපිගොණුවට එබෙද්දී සස්වින්දි තුහංස දෙස බැලුවාය.

"බල්ලා මේසෙටත් නැංගද දන්නේ නැහැ නේද... නටන්න ගියාම සමහර බල්ලෝ මේසවලටත් නඟිනවා" තුහංස පැවසුවේ රහසින් සුසිල් දෙස බලමිනි. ඒ මොහොතේ මනෝජ් සමඟ සාකච්ජාවක සිටි සුසිල්ට එය ඇසුණේ නැත.

"ඔෆිස් කාමරයක් නෙවෙයිනේ..." සස්වින්දි සෙමින් කීවාය.

"ඔෆිස් කාමරයට වුණා නම් දනී... කෙල්ල මාරු වුණාට මට අවුලක් නැහැ... කොකත් එකයි ඒ වෙලාවට"

"ඔතෙන්ට වෙලා ඔටුවා වගේ ඉන්නේ නැතුව පොඩ්ඩක් බලනවා වැඩ ගැන... දැන් තාත්තිත් නැහැනේ... හැමදේම තමුන් අතට අරගෙන හොයලා බලනවා" සස්වින්දි එය නොඇසුන ලෙසින් කීවාය.

"අනේ මේ කට වහගෙන ඉන්නවා... මගුල් කියවලා මාව යකා නොකර"

"හ්ම්... කට වගහන්නම් මම... ප්‍රතිඵල තියෙයි ඉස්සරහට"

"මේ මගේ මාමණ්ඩි... එයාගේ දුව මට දෙන්න ඉන්නේ... අනිත් එක ඔෆිස් එකෙත් මම කෙල්ලක් තියලා ඉන්නේ" සස්වින්දි එයද නොඇසුණු ලෙසින් නිහඬව එතනින් ඉවතට ගියාය.

"අද රෑට මම නවතින්න එනවා" ඇය එතනින් ඉවත් වීමට පෙර ඔහු පැවසුවේ රහසිනි.

"දුව නම් හොඳට දැකලා පුරුදුයි මට... ආ වෙලේ ඉඳලා මම කල්පනා කළේ කොහෙදිද කියලා" පිටව යෑමට සූදානම් වූ සුසිල් පැවසුවේ සස්වින්දි තිගස්සවමිනි. ඔහු තමා අඳුරගනී දැයි බියක් ඇයට දැනිණි.

"දුව ඉස්කෝලේ ගියේ නුවරද"

"නැහැ... කෑගල්ලේ" මනෝජ් කට ඇරීමට පෙර සස්වින්දි කීවාය.

"මට දැන් මතක් වුණේ... අපේ දුවලගේ හෙඩ් රිෆෙට් දුව වගේමයි... ඇරපු අතක් නැහැ" සස්වින්දි වහා තුහංස දෙස බැලුවාය.

සමච්ජල් සිනහවක් කටකොනකට නගා ගෙන ඔහු බලා සිටියේ කුමන අරමුණකින්ද යන්න ඇය වටහා ගත්තාය.

ඇත්ත මොකද්ද කියලා දන්නවනම් හංස ඔයාට කණ්නාඩියක් ඉස්සරහා ඉදගෙන ඔය හිනාව පාලා මූණ බලා ගන්න තමා වෙන්නේ... ඇය මුමුණා ගත්තාය.

එදින රාත්‍රියේද තුහංස නිවසට බීමතින් පැමිණියේය. සස්වින්දිව කාමරයට ඇමීමට පෙර තුහංස ඇය වෙතට ආවෙන් සස්වින්දි නිහඬව ඔහු අසලට ගියාය.

"හංසි... මට බයිට් එකක් හදලා දීපන් කෙල්ලේ... ඕ... සොරි... කෙල්ල නෙවෙයි... කෙල්ල නෙවෙයි... මම තම දන්නවා... හංසි... සස්වි... " තුහංස ඇයගේ කරට අත දමා

ගනිමින් කීවේය. මනෝජ් නිහඬව නිවස තුලට ගියේය.

"මනෝජ් අංකල්... තෑන්කස්... මට කෙල්ල දුන්නට... තව අවුරුදු තුනකට... ඔව්... අවුරුදු තුනකට..." මත් පැන් බොතලයක් සාක්කුවෙන් ගත් ඔහු බීබී ඔහේ කියෙව්වේය.

"ආ... කට්ටිය... මගේ සහෝදරයෝ... පැටෝ... ෂයි... හංසී... මගෙ කෙල්ල... උඹ උන්ටත් එක්ක බයිට් හදාපන්..." සස්වින්දි කෝපයෙන් තුහංසගේ අත ගසා දැම්මාය.

"මනෝජ් අංකල්... මගේ මාමණ්ඩි..." තුහංස හඬින් සිනාසුණේය.

"එයාටත්... එයාටත්... මේ අපි එක්ක බොන්න පුළුවන්... මේ හංස මහත්තයා එක්ක..." තුහංස නැවත සස්වින්දි ඇද ළංකර ගත්තේය.

"යන්න හංස මට ගඳයි"

"ගඳයි... මේ හංස උඹට ගඳයි... ගඳ නම් උඹ ඉවසපන්"

"හංසී... මම කෙලින් මිනිහෙක්... හිතුනොත් දෙයක් කරනවා... ඔව්... මට හිතුනා... මම උඹව ගත්තා... මට උඹව දුන්නෑ... මම උඹ කසාද බැන්දා... ඔව්... මට හිතුනා... මම උඹව අත ඇරියා... ඔව්... මම එහෙම මිනිහෙක්... කෙලින් මිනිහෙක්..."

"හරහට ඇඳට වැටුණම... කෙලින්" සස්වින්දි මුමුණා ගත්තාය.

තව තව කියවමින් බිබී සිටි තුහංස සැටියට වැටෙද්දී සස්වින්දි මනෝජ්ගේ උදව්වෙන් ඔහුව කාමරයට දැම්මාය.

"කරුමක්කාරයෝ... අපටත් විඳින්න වෙලා" මනෝජ් කීවේය.

"සොරි තාත්තී... මම හිතුවේ දරුවා ගැන" සස්වින්දි මිමිණුවාය.

"ඔය ඇඳේ ඉන්න බැරි නම් මගේ කාමරේට එන්න... මම ඉස්ටෝරු කාමරේට යන්නම්" එයට කිසිත් නොකී මනෝජ් කීවේය.

"නැහැ තාත්තී... මම මෙතන ඉන්නම්"

"තමා නිසාවෙන් තම පියා ඉස්ටෝරු කාමරයට දිනකට හෝ නිදා ගැනීමට යැවිය නොහැක. එනිසාවෙන් ඇය තුහංස සිටි තම කාමරයටම ගියාය. වෙරි මතින් ඔහු තමාට වද දීමටද පෙළඹුනොත් යැයි බිය වූ සස්වින්දි දරුවාට හානියක් වේ යැයි සිතා අපහසුවක් වුවත් බිම නිදා ගත්තාය.

උදෑසන අවදි වුණු තුහංස සිටින්නේ තම යහනේ නොවන බව වටහාගෙන නැඟී සිටියේය. ඇඳ පාමුල රෙදි කෑල්ලක් එළාගෙන සස්වින්දි සිටියේ තද නින්දකයි. තුහංස ඇයව දෝතට ගෙන යහනේ තැබුවේය. සස්වින්දි දෑස් විවර කළාය.

"ඇයි බිම නිදියව්වේ... මම නිසාද" තුහංස ඇයව සිප ගනිමින් ඇසුවේය. සස්වින්දි ඉවත බලා ගත්තාය.

"සණකම... " කියූ තුහංස ඇයව අත හැර දමා උඩුකුරු වූවේය.

"තේ එකක් හදාගෙන එන්නද"

"ඕනි නැහැ... මම යන්න ඕනේ"

"තේ එකක්වත් නොබී" තුහංස කිසිත් නොකියා නැඟී සිටියේය.

"හංස... මෙහෙ මේ විදිහට එන එක නතර කරන්න... ඔයා බැඳලා කියලා කවුරුවත් දන්නේ නැහැ... සජී ආන්ටි දැන ගත්තොත් තාත්තිටත් දොස් අහන්න වෙයි"

"ඔයාව මතක් වෙනකොට එන්න හිතෙනවා හංසි... ඔයා දන්නවනේ මට දෙයක් හිතුනම මම ඒ දේ කරනවා කියලා... පේන්න ඉන්න කොට අත අරින්න බැහැ"

"නොපෙනී හිටියොත් අත අරින්න පුළුවන්... එහෙමද කියන්නේ"

"ඔව් ඉතින්... එතකොට බෝතලේ ආතල් එකෙන් විතරක් සැනසෙන්න පුළුවන් වෙයි"

"එහෙම නම් මම ගියාට කමක් නැද්ද"

"තමුසෙගේ තාත්තා මට කිව්වනේ තමුසෙව අරගෙන යනවා කියලා... ඉතින් අරගෙන යන්න කියනවා... මම තමුසෙව බැන්දෙත් කොහෙට හරි අරන් යයි කියලා තමයි... කොහේ ගියත් කසාදේ නැති කරන්න බැහැනේ" සස්වින්දි තුහංස දෙස බලා සිටියාය.

"මොනවද බලාගෙන ඉන්නේ"

"මිනිස්සු වෙනස් වෙන විදිහ ගැන හංස"

"එහෙම තමයි... මිනිස්සුන්ට එකම විදිහටම ඉන්න බැහැනේ"

"දැන් චුට්ටකට ඉස්සෙල්ලා බිම නිදි කියලා මාව අරන් ඉඹලා ඇඳේ තියපු ඔයාද මේ මෙහෙම කතා කරන්නේ කියලා හිතෙනවා... පුදුමයි"

"පුදුම වෙන්න එපා... ආසා දෙයක් ඉඹින්නේ ආශ්වාදෙට... දැන් ඔය ලස්සන පූස් පැටියෙක් බලු පැටියෙක් දැක්කම ඉඹින්නේ... කසාද බැඳලා ගෑනි කර ගන්නද නැහැනේ... හිතන්න එපා" සස්වින්දිගේ හිතට බොහෝ කලකිරීමක් මෙන්ම වේදනාවක්ද දැනුනාය.

"එතකොට මට කවදා හරි මොකද වෙන්නේ හංස"

"මම ඩිවෝස් එක දුන්නම ඔයා කැමති දෙයක් කර ගන්න... මට ප්‍රශ්නයක් නැහැ"

"ඩිවෝස් එක... එතකොට... එතකොට... ඔයා... මාව..." සස්වින්දිට ගොත ගැසිණි.

"ඔයා හිතුවද මම ඔයාව කසාද බැන්දේ දිගටම තියා ගන්න කියලා... නැහැ හංසී... මම ඔයාව බැන්දේ මනෝජ් අංකල් මාව මේ ගෙදරින් එලෙව්ව නිසා තරහට... ඔයා ළඟ තියන සල්ලි ටිකේ ආරක්ෂාවට"

"හංස... ඔයා ඔය ඇත්තමද කියන්නේ" සස්වින්දි ඇසුවේ තැතිගෙනයි.

"ඔව්... ඇත්තමයි... මම බීලත් නැහැ... මට තරහා ගිහිල්ලත් නැහැ"

"එතකොට... එතකොට... දෙයියනේ... ඔයා මට පොඩ්ඩක්වත් ආදරේ කළේ නැද්ද" තුහංස හඬින් සිනාසුණේය.

"පිස්සු කියවනවද... එදා ඉදලම ඔයා මගේ හැමදේම ගත්තා හංසී... ඉස්සරෝම මගේ තාත්තිගේ ආදරේ... එයා මටයි ඔයාටයි දෙන්නටම එකම විදිහට ආදරේ කළා... සමහර අවස්ථා වලදී මටත් වඩා ඔයාට ආදරේ කළා... ඒ හින්දා මම ඔයාට කොච්චර ඊර්ෂ්‍යා කළාද" සස්වින්දි දෑසට කඳුළු පිරුණාය.

"ඊට පස්සේ... ඔයාගේ තාත්තා... මගේ තාත්තිව රවටගෙන කෝටි ගානක් ඔයාගේ නමට දා ගත්තා"

"කවදාවත් නැහැ හංස... මගේ තාත්ති එහෙම මිනිහෙක් නෙවෙයි"

"බයිලා නවත්වනවා... ඒවා දැන දැන තමුසේ මට තියන්නේ තමුසෙට ආදරේ කරන්න කියලද... ආ..." තුහංස ඇසුවේ ආවේගයෙනි.

"පළිගන්න හිතෙන හිතකින් ආදරයක් ගොඩ නැගෙන්නේ නැහැ... තමුසේ වගේම තමුසෙගේ තාත්තා විඳවනවනම් ඒ තරම් සතුටක් මට තවත් නැහැ" සස්වින්දි ඉකි ගැසුවාය.

"මෙහෙ ඉන්නකොටනේ එන්න හිතෙන්නේ... යනවා... නොපෙනෙන්නම යනවා... අවුරුදු තුනකින් එනවා... සල්ලි අරගෙන මම ඩිවෝස් එක දෙන්නම්... වන්දියකුත් දෙන්නම් තමුසෙට මම"

"හඃ... වන්දියක්... වන්දිය ගිහින් දෙනවා තමුසෙගේ..." සස්වින්දි කෑගැසුවාය. තුහංස නැඟී සිටියේ කෝපයෙනි.

"මම එක සතයක්වත් තමුසෙට අරන් දෙන්නෙත් නැහැ... දික්කසාදේ දෙන්නෙත් නැහැ" සස්වින්දි කීවේ කෝපයෙන් වෙව්ලමින්ය.

"එහෙම නම් මම තමුසෙට එක මොහොතක් ජීවත් වෙන්න ඉඩ තියන්නෙත් නැහැ" තුහංස සස්වින්දිගේ කෙස් වැටියෙන් අල්ලා ගත්තේය. සස්වින්දි ඔහුගේ අත සපා කෑවාය. ඔවුන් වෙතට ආ මනොජ් ඔවුන්ගේ පොරය වළකාලූයේය.

"හංස මහත්තයා... අනේ... යන්න මෙතනින්" ඔහු බැගෑපත් වූවේය.

"ඇයි තාත්ති එයාට පිණ්සෙන්ඩු වෙන්නේ"

"සස්වින්දි... කට වහගෙන යනවා පැත්තකට" මනෝජ් ඇයව තල්ලු කර දමා තුහංස වෙතට හරුණේය.

"මනෝජ් අංකල්... ඔය කට මට හදන්න බැරි කමක් නැහැ... හැබැයි ආය කතා කරන්න බැරි වෙයි"

"අනේ රත්තරන්... පින් සිද්ධ වෙයි" මනොජ් තුහංසට බැගෑපත් වූවේය.

"මේකි මගෙන් මැරුම් කන්න ඉස්සර අරන් තොලොන්චි වෙලා යන එකයි ඇත්තේ... මම ආය කියන්නේ නැහැ"

සස්වින්දි එයට යමක් කීමට කට ඇරියද මනෝජ් වහා ඇයගේ කට වසා ඇයව වළකා දැමුවේය.

සස්වින්දි සිටියේ මනෝජ්ගේ ඇකයේ හිස තබාගෙන හඬා වැලපී හෙම්බත් වීගෙනයි. මනෝජ් ඇයගේ හිස අතගාමින් සිටියේය.

"මම හිතුවා මොන වරද කළත් මට එයා ආදරෙයි කියලා... මගේ තාත්තිගේ ඔළුවට පිස්තෝලේ තිබ්බා කියන එක මම අමතක කළා... ගුණ මකු දුවෙක් වගේ... මට ගැහුව්වා... මාව පිච්චුවා... මාව මරන්න ගියා... ඒත් තාත්ති ඒ හැමදේම මම අමතක කළා" සස්වින්දි ඉකි ගැසුවාය.

"කසාද බැන්දම මම හිතුවා මට මොනවා කිව්වත් කළත් මම ගත්ත තීරණේ හරි... එයාට මාව ඕනේ කියලා... ඒකයි මම තාත්තිට හිතුවක්කාර වුණේ... ඔයා එපා කියද්දී මම එයාව ප්‍රතික්ෂේප නොකළේ"

"පරන දේවල් අමතක කරන්න දෝණී"

"මම කොහොමද තාත්ති ඒවා අමතක කරන්නේ... මම රැවටුණා... මාව රැවැට්ටුවා... හොඳින්නම් ඉන්න දෙන්නේ නැහැ එයාට"

"දෝණී... දරුවෙක් බඩේ තියාගෙන එහෙම කේන්ති ගන්න එපා... බලන්න ඔයා හංසව කේන්ති කළා... එයා දන්නේ නැහැ එයාට කේන්ති ගිය වෙලාවට එයා මොනවද කරන්නේ කියලා... මරන්නත් ගියා නේද සැරයක්" සස්වින්දි හිස සෙලවූවාය.

"මම මැද්දට පැන්නේ ඒකයි... පුදුමයි හංස ඔහොම ගියා... හිතන්න... ඔයාට ගැහුව්වනම්... ඉන්න තත්වේ අමතක වුණාද"

දරුවෙකු කුස දරාගෙන ඔහුත් කෝප කරගෙන තමාත් කෝපවී කළේ වරදක් බව සස්වින්දිට වැහිණි. දරුවාට කුමක් හෝ සිදුවිණි නම්... සස්වින්දි වෙව්ලා ගියාය.

"හංසත් කිව්වා ඔයා අරගෙන යන්න කියලා... අපි යමු පුතේ... එතකොට ඔයාට... දරුවට... හංසට... අපි හැමෝටම හොඳක් වෙයි" මනෝජ් සස්වින්දිගේ හිස අතගාමින් කීවාය.

"තාත්ති... යන්න ඉස්සෙල්ලා එක සැරයක් මට හංස හම්බ වෙන්න දෙනවද"

"ඇයි පුතේ..."

"තාත්ති... එයා... එයා... කිව්වේ ඇත්තමද" සස්වින්දි දෑසට කඳුළු පුරවා ගත්තාය.

"මොනවද"

"මට ආදරේ නැහැ කියලා... වෛර කරනවා කියලා" මනොජ් ඇයගේ හිස අත ගෑවේය.

"එයා ඕවා කියන්නේ බොරුවට... හැමදේම කරන්නේ මාව කේන්ති කරන්න... එයා එහෙමයි තාත්ති... එයා එහෙම හිතුවක්කාරයෙක්" මනෝජ්ගේ දෑසටද කඳුළු පිරුණේය.

"තාත්ති දන්නවද... මම එන්න බැහැ කිව්වම ගෑනියෙක් ගෙන්න ගත්තා... මම එනවා කිව්වම එයාව එලෙව්වා... එතකොට අර චිතු... එයාව මගේ ඉස්සරහා තියාගෙන විකාරයක් කළා... ගෙදරටත් එක්ක ගිහින් අත ඇරලා දැම්මා" මනෝජ් දියණිය දෙස අනුකම්පාවෙන් බලා සිටියේය. ඇය විකාරෙන් දොඩන්නේදැයි ඔහුට නොසිතුනා නොවේ.

"ඒකරලා දන්නවද... එයා තියුම් ඉස්සුවා... තියුම්ව මම එනකල් පරිස්සමට තියා ගත්තා... තාත්තී... හංසට ඕනේ මම විතරයි... එයා මට ආදරෙයි... එයා බොරු කියන්නේ"

"වෙන්න ඇති දෝණී... එයා ඔයාට ආදරේ ඇති... ඒකනේ ඔයාව බැන්දේ"

"ඔව්... සල්ලි හින්දා කියන්නේ බොරුවට" සස්වින්දි මද සිනහවකින් කීවාය.

"මම යන්නම් හංසව හම්බවෙන්න... එයා මාව හොයයි... එයා එහෙමනේ... මට ගහලා රිදෙනවද අහනවා... යටකරලා මරනවා කියලා වාහනේ නතර කර ගන්නවා " සස්වින්දිගේ විකාර කියවිල්ලට මනෝජ්ට බියක් දැනිණි.

"එයා මට ආදරෙයි තාත්තී... මම හංස ගාවට ගිහින් අහනවා... ඔන්න බලන්න එයා කියයි... රතු කරගත්ත මූණ... කඳුළු ඇස්... එයාට ඕනි කියලා" සස්වින්දි නැඟී සිටියාය.

"දොණී... අපි ගිහින් බබා අරගෙනම හංස ළඟට එමු"

"එයා මට ආදරෙයිද කියලා අහලා යමු තාත්තී... එහෙම නැහැ කිව්වොත් මම හිතා හදාගන්නම් තාත්ති... එහෙම වුණොත් අපි එහෙම ඉමු"

"එපා දෝණී... එහෙම අහන්න ඕනේ නැහැ... අපි බලමු එයා ආදරේද කියලා... එයා ඔයාට ආදරෙයි... මම දන්නවා..."

"ඒ නැතත් මම එයාට ආදරෙයි"

"ඒකනේ... ඒ ආදරේ ඇති දෙන්නටම"

"ඔව්... එයා හම්බවෙලා ආය හිත රිදව ගන්න ඕනේ නැහැ... උදේ එයා කිව්වේ බොරුවක් කියලා හිතලා... හැමදේම අමතක කරලා අපි යමු තාත්තී... හංස මට ආදරෙයි කියලා මට විශ්වාසයි... ඒ විශ්වාසෙ හිතේ තියාගෙන මම මේ දරුවව බිහි කරනවා... අවුරුදු තුනකින් එන කොට ඒ ආදරේ මාව පිළිගන්න බලාගෙන ඉදියි කියලා මම හිතනවා" මනෝජ් සස්වින්දිගේ හිස අත ගෑවේය. දියණියගේ දිරිය අධිෂ්ඨානය බලාපොරොත්තුව ගැන ඔහු බොහෝ සතුටු වූවේය.

අපූර්වා සමඟින් ගොඩ නඟාගත් කැදැල්ලට සමු දී මනෝජ් සස්වින්දි සමඟින් පිට වූවේය. ඔහුට දැනුණු ශෝකය ඔහු සස්වින්දි ගැන සිතා වළකාගත්තේය.

අපි දෙන්නා අත් දෙක අල්ලගෙන මේ ගෙට ඇතුල් වුණේ රජී මහත්තයා හිනා වෙවී බලාගෙන ඉද්දී නේද අප්පූ... රජී මහත්තයා එදා කිව්වා... මනෝ... අවසන් ගමන ඇරෙන්න ඔය දෙන්නට මේ ගෙදරින් යන්න බැහැ... එයාට පාලුයි කියලා...

කෙල්ල ගෙනාව දවසේ කිව්වා... මේ කෙල්ලව මේ ගෙදරින් මගේ ගෙදරට ඇරෙන්න වෙන ගෙදරකට දෙන්න බැහැ කියලා... නිවසේ දොර වසා දමමින් මනෝජ් සිතුවේය.

මේ ගෙදරින් ඉස්සරෝම අපිව අඬවලා ඔයා ගියා අප්පූ... ඊළඟට මේ ගෙදරින් කෙල්ලව ගෙනියන්න හිටපු රජී මහත්තයත් ගියා... ඔහු දෑසේ කඳුළු පිසදා ගත්තේය.

අද... ඒ රජී මහත්තයගේ පුතා හින්දා මමයි මගේ කෙල්ලයි මේ ගෙදරින් යනවා... සමහර විට සදහටම වෙන්නත් පුළුවන්... මට සමාවෙන්න රජී මහත්තයා... මේ තාත්තා කිසිම තාත්තෙක් ඉවසන්නේ නැති තරමට ඉවසුවා ඔයා නිසා... මට තියන වටිනාම වස්තුව විනාශ වෙද්දී බලාගෙන හිටියා... ඔයා නිසා... මින් ඉදිරියට මට මොනවත් කරන්න බැහැ... මට සමාවෙන්න...

"තාත්ති... අපි යමු" සස්වින්දිගේ සුරතේ උණුසුම බාහුවට දැනෙද්දී මනෝජ් සිතුවිලි ලෝකයෙන් මිදුනේය.

"මට සමාවෙන්න... මේ හැමදේම මම නිසා"

"නැහැ රත්තරන්... මට මගේ දෝණිව ඕනේ නිසා"

"හිතට දිරි ගත්තා මම... ආය වැටෙන්නේ නැහැ"

"උදේ වගේ විකාරෙන් කියවන්නෙත් නැති වෙයි නේද"

"ඔව්... නැති වෙයි" හිතේ ගිනි හිතට සීමා කරමින් සස්වින්දි සිනාසුණාය.

කෝපයෙන් නිවසට ගිය තුහංස කාමරයට යන අතර තුර වූ බඩු මුට්ටු සියල්ලටම පයින් ගැසුවේය.

"බැල්ලී... සස්වින්දි බැන වදිමින් ඔහු මත් පැන් බෝ...
කට තබා ගත්තේය.

දිගු නින්දකින් අවදි වූ තුහංස සූදානම් වූයේ සස්වින්...
නිවසට යාමටයි. එහෙත් තමා උදෑසන ඇයට පැවසූ සි...
තුහංසට සිහි විය.

තමා ඒවා පැවසුවේ හොඳ සිහියකිනි. කෝපයෙ...
නොවේ. ඇයගේ නිවසේ රාත්‍රිය ගත කිරීම පිළිබඳව ද්‍...
පුංචිකම නිසාවෙන් ඔහු සියල්ල කියා දැමුවේය.

සස්වින්දි සැමදා ලෙසින් අදත් කෝප ගෙන තමාවද ...
කළේය. අද තමා ඇයට පහර නුදුන්නේ මනෝජ් ...
නිසාවෙනි. ඉවසා පිටව ආවේ එය තමාගේ තැන
නිසාවෙනි.

මේ කෙල්ලගේ කේන්තියයි මාගේ කේන්තියයි එකතු...
දවසක මගේ අතින් මැරුම්කයි... තුහංස මුමුණා ගත්තේය.

සස්වින්දිට ඇමතුමක් ගැනීමට සිතුවද එම සිතුවිල්...
හළ තුහංස එහි යන්නට සිතුවේය. බැහැ... හංසි කිව්වා
ඒක ප්‍රශ්නයක්වෙයි... සුසිල් අංකල්ට මේ ආරංචිය යන්...
නැහැ... තුහංස සිතුවේය.

ආය මම හංසිව පරණ විදිහටම ඉද හිට බං...
ගෙනියනවා... තුහංස මුමුණා ගත්තේය.

එහෙත් තුහංසට එසේ සිටිය හැකි වූයේ දිනක් පමණි...
ඔහු උදෑසන සිටම සස්වින්දි ඇමතීමට උත්සහ කළේය.
ඇයගේ දුරකථනය අක්‍රිය කොට තිබිණි. ඔහු තියුම්ව ඇ...
ඇයගේ දුරකථනයද ක්‍රියා විරහිත කොට තිබිණි.

හවස ගන්නවා... සිතූ තුහංස නිහඬ වූවේය.

සවස් වන තුරු උත්සහ කළද එය එලක් නොවූයෙ...
කෝපගත්තේය. කෝපය නිසාම ඔහු නිවසට
නොසිතුවේය.

මේකිගේ ලොකුකම... ෆෝන් එකට ඕෆ් කරගෙන...
කියලම තමයි... තුහංස කෝපයෙන් මුමුණා ගත්තේය.

ඔහුට මේ අයුරින් නිහඬව දවස් දෙකක් ගත කළේ...
සවස ඔහු සස්වින්දිගේ නිවසට ගියේ පැටෝ හා ෂයි ස...

වෛරී මතිනි. වසා ඇති නිවස තුහංසට කෝපයක් ගෙන ආවේය. වාහනයේ සිට හඬ නඟා නිවසට බැන වැඳුණු ඔහු ආපසු නිවසට පැමිණියේ සිය සගයින්ගේ කරමතිනි.

"දැන් සතියක් විතරලු ගේ වහලා ගිහින්... රට ගියා කියලා තමයි කියන්නේ" සස්වින්දිලා පිළිබඳ සොයා බලන්නට යැයි අණදුන් තුහංසට පැටෝ කීවේය.

"රට ගිහින්..."

"ඔව් බොස්... ගෙදරට කට්ටියක් එනවලු ලබන සතියේ" තුහංස වහා තියුමි ඇමතුවේය.

"තියුමි..."

"සොරි හංස අයියා... මම ඔයා එක්ක කතා කරන්න කැමති නැහැ"

"ඔහොම ඉන්න තියුමි"

"ඇයි ඔයා මගේ අක්කිට ඔහොම කළේ"

"අක්කි කෝ"

"මමයි ඔයාගෙන් අහන්න ඕනි... ඔයයි එයාගේ හස්බන්ඩ්" තුහංස නිහඬ විය.

"ඒ ඇස්වලින් ගිය කඳුළු මට කවදාවත් අමතක කරන්න බැරිවෙයි හංස අයියා... ලෝකයක් වටින ආදරයකට පයින් ගහලා එයා ඔයාගේ අතකොලුවක් වුණා... ඔයා කියන කියන තාලෙට කියන කියන තැනට ආවා... ලොකු තාත්ති බනිද්දී එයාට හොරෙනුත් එයා ඔයා ළඟට ආවා"

"තියුමි මම ඔයාට කෝල් එක ගත්තේ ඔයාගෙන් බන අහන්න නෙවෙයි... අක්කි ඉන්න තැන කියනවා"

"මගෙන් අහන්නේ ඇයි... පුළුවන් නම් හොයා ගන්නවා... ඒත්... වැඩක් වෙන්නේ නැති වෙයි... මගේ අක්කි ගියේ ඔයාව සදහටම අත ඇරලා... එයා දැන් මේ රටෙත් නැහැ" තියුමි කෝපයෙන් ඇමතුම විසන්ධි කළාය.

අක්කි කිව්වා හරි... එයා කවදාවත් හැදෙන මිනිහෙක් නෙවෙයි...

තුහංස කෝපයෙන් දුරකථනය පොළොවේ ගැසුවේය.

## 0

දින ගනනක් එක දිගට මත් පැණින් පමණක් කුස පුරවා ගත් තුහංස හමුවීමට සුසිල් නිවසට පැමිණියේ බලා සිට බැරිම තැනයි. වෙරි මත බොහෝ දුරට සිඳී ගියද තුහංස සිටියේ තරමක මත් ගතියකිනි.

"ඇයි පුතා... ඔයාට සනීප නැද්ද" සුසිල් ඇසුවේ තුහංසගේ යහන මතට වී ගෙනය. තුහංසද යහනේ වාඩි වූවේය.

"දවස් ගානකින් ඔෆිස් ආවේ නැහැ... අම්මා ඇහුව්වම කියනවා කාමරේ නිදි කියලා... පුතාට මොකක් හරි ප්‍රශ්නයක තියනවද"

"ප්‍රශ්නයක් නැහැ අංකල්... මම ඔෆිස් එන්නම් යන්න"

"මට ඔයාට ටිකක් කතා කරන්න ඕනේ"

"මටත් කතා කරන්න ඕනේ... හැබැයි දැන් නෙවෙයි, පඩුවේ ඉන්න දීලා යනවා... හවස කතා කරමු" තුහං කෝපයෙන් කීවේය. සුසිල් නැගිට්ටේය.

"අනේ අයියේ... පුතාගේ හැටි ඔය... කේන්ති ගියාම ඉවසු නැහැ" සජීවා බියෙන් පැවසුවේ තුහංසගේ මේ හැසිරීම නි ඔවුන් මේ කටයුත්තට අකමැති වේ යැයි වූ බිය නිසාමය.

එවන් රූබර තරුණියක්... උගත් ඥානවත් විශාල බුදලය හිමි ඇය වැන්නියක් තම පුතාට හමුවේ යැයි සිතිය නොහැකි සජීවා බිය වූයේ ඒ නිසාය.

"ඔහොම තමයි කොල්ලෝ... අපිත් ඒ වගේනේ ඒ කාලෙ මම හවස එන්නම්" සුසිල් කීවේය.

මුදල් වෙනුවෙන් ඕනේ කැපකිරීමක් කරන සුසිල් දන්තනායක තුහංස නොව ඔහුට හිමි සාගරයක් බඳු බූදලය නම් අත හරින්නට නොසිතුවේය.

සුසිල් පැමිණ නොබෝ වේලාවකින් සැහැල්ලුවට සැරසුණු තුහංස ඔහු ඉදිරියේ වාඩි වූවේ සජීවා අසලිනි.

"දිනත් ළඟයි... අපි කට්ටියට කියලා සූදානම් වෙමු නේද... දුවත් තව මාස දෙකකින් යන්න ඕනේ" සුසිල් කීවේය.

"ඔව් එහෙම හොඳයි... නේද පුතා" සජීවා තුහංසගෙන් ඇසුවේය.

"අංකල්... මම මේ කියන්නමයි හිටියේ... මම මේ කසාදේ කරන්න අකමැති නැහැ... මම කියන දේ අහලා තීරණේ අංකල් ගන්න"

"මොකද්ද පුතා... මොන තීරණේද"

"අයිෂාදිව මට දෙන්න කැමතියිද කියන තීරණේ"

"ඒක ඉතින් ආය කියන්න දෙයක් නෙවෙයිනේ... නේද නංගී"

"අනේද කියන්නේ... අපි මේ ඔක්කොම ලෑස්ති කරන්... මෙයා මේ කැමැත්ත අහනවා... තාම වෙරිද" සජීවා සිනාසෙමින් තුහංසගේ හිස අත ගෑවාය.

"මම මේ වෙන කොට කසාද බැඳලා ඉන්නේ"සජීවා නැඟිට්ටාය.

"කා..කා..වද" ඇය තතනමින් ඇසුවාය.

"හංසිව..."

"එතකොට මනෝජ් තාත්තිව වගේම ඔයත් රවට්ටලාද... දෝෂියන්දැව කරේ එල්ලුවද" සජීවා ඇසුවේ කෝපයෙනි.

"නැහැ... මනෝජ් අංකල් මේ කසාදෙට කොහොමවත් කැමති වුණේ නැහැ... මම හංසිව ගේන්න යනකොට එයා බෙල්ල මිරිකලා හංසිව මරන්නත් ගියා"

"මනෝජ් කියන්නේ කම්පැනියේ..."

"ඔව් සුසිල් අංකල්... හංසි කියන්නේ එයාගේ දුව"

"අර එදා හිටිය ගෑනු ළමයා" සුසිල් සස්වින්දි සිහිග
ගනිමින් ඇසුවේය.

"ඔව්..." තුහංසට එදා සස්වින්දි තමාට පුටුවක් නොදී ළ
කර ගන්නට ගත් උත්සහය සිහිවිය.

'හංසිගේ නෙවෙයි මේවා මනෝජ් අංකල්ගේ කපටි ව
ඔහු සිතුවේය.

"ඔය දෙන්නගේ කැමැත්තටද මේවා වුණේ... දෙයියගෙ
ඒ කෙල්ලව ඔයාට පේන්න බැරුව නේද හිටියේ" සඳ
ඇසුවාය.

"අපි දෙන්නගේ කැමැත්තට නෙවෙයි අම්මා... ළ
කැමැත්තට තමයි මේ කසාදේ වුණේ"

"කෝ දැන් හංසී"

"රට ගිහිල්ලා... මනෝජ් අංකල් හොරෙන්ම හංසිව අරගෙ
ගිහිල්ලා... මම දැන ගත්තේ ගිහින් සතියකට විතර පස්සේ"

"එහෙනම් ඒකයි ඔයා මේ බෝතලේ එක්ක හිටිගෙ
කෙල්ල රටේ නැත්නම් ආය කොහේ හොයන්නද...
හදාගෙන ඩිවෝස් කේස් එකක් ෆයිල් කරමු" සුසිල් කීවේය.

"තව අවුරුදු තුනක් යනකල් ඒ කසාදේ මට කඩා ගන්න

"පුතා ඇයි හංසිව බැන්දේ... සල්ලි වලටද"

"ඔව් අම්මා... මනෝජ් අංකල් කොහොමත් හංසි අරන්
පනින්න ඉන්න ඇති... නැත්නම් මෙච්චර ඉක්මනට එයා
යන්න බැහැ... හොඳ වෙලාවට මම බැන්දේ"

"සල්ලි වලට බැන්දා කියන්නේ ඒ කෙල්ලට ලෙ
ඩවුරියක් තියනවද"

"නැහැ සුසිල් අයියේ... අපේ රජී ඒ කෙල්ලට
ආදරෙයි... එයාගේ හිතේ තිබුණා හංසිව හංසට බන්දවන්න
මමයි අකමැති වුණේ"

"පුතා එහෙනම් තාත්තගේ කැමැත්තට වැඩ කරලා තියෙන්නේ" සුසිල් සිනාසුණේය.

කසාදය නිසාවෙන් දුව දෙනු නැතැයි සිතා සිටියදී සුසිල්ගේ සැහැල්ලු හිනාව සජීවාට සැනසීමක් ගෙන ආවේය.

"අපේ කම්පැනියේ ලාභයෙන් කෙටසක් අර යන්නේ එකවුන්ට් එකකට... අර අංකල්ට මම කිව්වේ"

"ඔව්... හංස එහෙම දෙයක් කිව්වා කියලා මතකයි"

"ඒ එකවුන්ට් එක කෝටි ගානක්... තියෙන්නේ හංසි නමට"

"මො..ක...ක්" සුසිල් කෙල පොදක් ගිල ගත්තේය.

"ඒ සල්ලි නිසා තමයි මම හංසිව බැන්දේ"

"උඹ අදහන්න වටින පොරක් හංස පුතා... උඹ සල්ලි ටික ගත්තද"

"ඒක ගන්න හංසිට විසිහතර වෙන්න ඕනේ" සජීවා කීවාය.

"එහෙනම් ඒකයි කසාදේ තව අවුරුදු තුනක් තියා ගත්තේ" සුසිල් හඬින් සිනාසුණේය.

"උඹ නම්...මාර පොරක්..." සුසිල් තුහංසගේ පිටට ගැසුවේය.

"මනෝ හංසි අරගෙන ලංකාවට ඇවිත් සල්ලි අරන් දෙයි"

"මිනිහා එහෙම කරයිද නංගී"

"ඔව් සුසිල් අයියා මනෝ ඒවගේ කෙනෙක්... රජී මටයි පුතාටයි වඩා විශ්වාස කළා මනෝජ්ව... රජී නැති වුණාට පස්සේ මනෝජ් මට පොරොන්දු වුණා එයා රජී කළ යෝජනාව අමතක කරනවා කියලා... කසාද බැන්දත් හංසිව එයා අරන් යන්න ඇත්තේ ඒ පොරොන්දුවට"

"කෝටි ගාන දුන්නම දුවත් තියලා යයිද දන්නේ නැහැ"

"මම නම් හිතන්නේ නැහැ... හංසිව ඩිවෝස් කළොත් සුසිල් අයියා කැමතිද අයිෂාදිව පුතාට දෙන්න"

චාන්ස් එක... සුසිල් හිතින් කියා ගත්තේය.

"ඇයි නංගි එහෙම ඇහුව්වේ"

"නැහැ ඉතින් කසාද බැඳපු මනුස්සයෙකුට..."

"ඒක මොකද්ද... අනික ඒ මනුස්සයා ගිහින් තියෙන්‍ෙ කෙල්ලත් අරන්නේ" තුහංසට සස්වින්දි සිහිවිය.

රතු වත... කඳුළු දෑස් කම්මුල්... තමා කොතරම් දෙතොලින් තෙරපුවාද...

"ඒ නැතත් ඔය වයසට කොල්ලෝ නොකරන වැඩ නැහැ" සුසිල් සිනාසෙමින් කීවේය.

"වැරදියට වටහා ගන්න එපා අංකල්... ෂොට් එකක් ද පොරයක් අල්ලගෙන කල් ගෙව්වට ඒ කෙල්ල ඇරෙන්න වෙන කාවවත් මම ඇඳකට අරගෙන නැහැ" තුහංස න සිටිමින් කීවේය.

හංසි සමඟ ඔහු දුර ගොස් ඇත්නම්... මපෙ නොදන්නේද... සජීවා තිගැස්සිණි.

හංසිට වරදක් වෙන්න ඉඩ දුන්නොත් රජී වලෙන් නැඟිටි ඒ තරමට එයා ඒ කෙල්ලට ආදරෙයි... මටත් සැනසීමෙන් ඉ ලැබෙන එකක් නැහැ... සජීවා සිතුවේය.

"හංසිලා ආවදෙන්කෝ... ඊට පස්සේ අපි වෙන දෙ බලමු සුසිල් අයියා... ඒ දුවත් උපාධිය අරෙ ආවදෙන්කෝ" සජීවා පැවසුවේ හිතේ යමක් තබාගෙනය.

යහනට ගිය තුහංසට සස්වින්දි මොහොතක් මොහෙ ගානේ සිහිවිය. සජීවා පැමිණ යහනේ වාඩි වෙද්දී තු නැඟිට යහනේ වාඩි වූවේය.

"ඇයි පුතා මට මේ කිසිදෙයක් නොකීවේ" තුහංස නි සිටියේය.

"මනෝජ්වත් මට මොනවත් කිව්වේ නැහැනේ... මෙ අංකල් දන්නවද ඔයා හංසිව කසාද බැඳපු බව"

"හ්ම්..."

"ඒ මනුස්සයා කෑ ගහන්න ඇති"

"මට බැන්නා... හංසිව මරන්නත් ගියා... කපලා ගඟට දානවා මට දෙන්නේ නැහැ කිව්වා"

"ඒ කියද්දීත් ඇයි පුතා... ඒ කෙල්ල විහාගේ කරා විතරයි... මේ සැරෙත් කරනවද කොහෙදෝ... මනෝජ් අංකල් දන්නවද ඒ ගැන"

"හ්ම්... මට දවසක් තරහ ගිහින් මමම කිව්වා... එතකොට තමා මනෝජ් අංකල් කපලා ගඟට දානවා මට දෙන්නේ නැහැ කිව්වේ... මම හංසිව බැන්දේ ඒ තරහටමයි"

"පුතා... බංගලාවට අරන් ගියේ හංසිවද"

"ඔව්... කවුද අම්මට කිව්වේ... සීතාද"

"ඔව්... ඒක කිව්වා කියලා ඒ ගෑනිව මරන් කන්න යන්න එපා"

"සීතා හංසිට හරි ආදරෙයි"

"මට කිව්වා... එක පුංචි නෝනා කෙනෙක් එනවා ඒ පුංචි නෝනට නම් පුංචි මහත්තයා ටිකක් අවනතයි කියලා... මම හිතුවේ ඒ චිත්‍ර කියලා"

"ඒකී... බැල්ලී..." තුහංස මිමිණීය.

තමා එදා හංසිව මරන්න ගොස් තිබුණේ මේ ප්‍රශ්න දුර ගියේ ඇය නිසාවෙනි.

"මනෝජ් මම අකමැති නිසා දොස් කියයි කියලා එහෙම කියන්න කරන්න ඇත්තේ... හංසිට වරදක් වුණොත් තාත්ති වලෙන් නැගිටියි"

"ඔව් එයාගේ පණ එතනනේ... ඒකනේ කෝටි ගානක් ඒකිට දුන්නේ මාව අමතක කරලා"

"තරහා හිතේ තියාගෙන ඒ කෙල්ලට බැන බැනද ඔය ඒ කෙල්ල බංගලාවටත් ගෙනියන්නේ"

කෝපයෙන් පුපුර පුපුර තමාට බැන වදිමින් සිටින සස්වින්දි තමා නතුකරගන්නා ආකාරය සිහි වෙද්දී තුහංසට සිනහා

නැඟිණි.

"මනෝජ් අංකල් අම්මට කතා කළොත් හංසිවත් අරන් එන්න කියන්න" කියූ තුහංස දෑස් පියා ගත්තේ සස්වින්දි තවත් වතාවකට හිතේ මවා ගනිමිනි.

ගෙවී ගිය වසර තුනකට බොහෝ දේ වෙනස් විය.

ගම්වාසීන්ට නෑදෑ හිතවතුන් සැමට රට යන බව පවසා සස්වින්දි මනෝජ් හා ඔහුගේ සොයුරිය සමඟ හැටන් ප්‍රදේශයට කිලෝමීටර් විස්සක් දුරින් පිහිටි ෆෝඩයිස් ප්‍රදේශයට ගියේ සොයුරියගේ මිය ගිය සැමියාගේ නිවසටයි.

වූ සියල්ල අමතක කර දමා ආදරයෙන් කරුණාවෙන් හිත පුරවා ගන්නට පිනට දහමටම ලැදිව කටයුතු කළ සස්වින්දි නිරවුල් මනසින් සතුටු සිතින් කායිකව මානසිකව දරුවා පෝෂණය කර මාස හයක් ඇවෑමෙන් පිරිමි දරුවෙකු ප්‍රසූත කළාය.

තුහංසගේ හැඩ රුවින්ම අනූන ඔහු දුටු සස්වින්දිගේ සිතේ තුහංස කෙරෙහි ආදරණීය හැඟීමක් මිස වෛරයක් නම් ඇති නොවීය.

ගිය දා සිටම ඇය තුහංස තමාට වෛර නොකර ආදරය කළ බවට හැඟීම් සිතේ පුරවා ගත්තාය. වසර තුනකින් තමාට ආදරය කරන තුහංස කෙනෙකු වෙත යන්නට ඇය සිහින මැව්වාය.

වඩා පරිපූර්ණ නිරෝගී දරුවෙකු වූ තුහස් සස්දෙව් බක්මීමල්දෙණිය මෙලොවට බිහිකර ගන්නට ඇයට හැකි වූයේ ඒ සිතුවිලි නිසාවෙන් වන්නට ඇත.

මගේ පුතු පැටියට අවුරුදු දෙකක් වෙද්දී මම පුතුගේ තාත්ති ළඟට යනවා... ගිහින් පුතු පැටියා ගැන කියනවා... තුහස්... මම දන්නවා... තාත්ති වෙනස් වෙලා හිටියොත් කියන පමාවට මගේ පුතාව හොයාගෙන එයි... ඒ දවස එනකල් අපි බලාගෙන ඉමු... පුතාගේ තාත්ති හොඳ කෙනෙක් වෙලා ඉන්න කියලා ප්‍රාර්ථනා කරමු... සස්වින්දි නිතර නිතර කුඩා තුහස්ට කීවාය.

මනෝජ්ට තාත්තී කියමින් නැන්දාට ආචම්මා කියමින් කුඩා තුහස් හැදී වැඩුනේ ආචම්මාගේත් සස්වින්දිගේත් තුරුලේය.

කුඩා තුහස්ට මාසයක් වෙද්දී බාහිර උපාධියට ලියා පදිංචි වූ සස්වින්දි අසල නිවසක තරුණියක් වූ ළයනි සමඟ එක්වී ඇයගේ සටහන් වලින් හැදෑරීම් කළාය.

ඔවුන්ගේ මිතුරුකම හර්දයාංගම බැදීමක් වෙද්දී දෙදෙනාට දෙදෙනා නැතුවම බැරි විය. ඇය සේවය කළ ආකරපතන වතුයායේ කාර්යාලයේ ගිණුම් තැබීමේ කාර්යයට සස්වින්දි තුහස්ට වසරක් වෙද්දී එක් වූයේ ළයනිගේ බලවත් පෙරත්තටයි.

සස්වින්දි කරන කිසි දෙයකට කිසිත් නොකී මනෝජ් මෙතැනදීත් නිහඬ වූයේ ඇය මුහුණ පෑ කටුක අත්දැකීම් සිහි කොට ඇයගේ සතුට ගැනම සිතායි.

තියුමි රහල් සමඟ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ හැදෑරීම් කටයුතු වලට ගියේ ඒ බෝඩිමේම නැවතීගෙනයි. අක්කාගේ කීමට ඉල්ලීමට රහල්ට ළං වූ ඇය රහල්ගේ හිත සුවපත් කරන්නට ඔහුට ආදරය කරන්නට පටන් ගත්තේ රහසිනි.

රහල් සස්වින්දිට මෙන්ම තියුමිට ආරක්ෂාව සැලසුවත් ඇයට මෙන්ම ලැදියවක් දැක් වූවත් දෙදෙනාගේ සබඳකම ආදර සබඳකමක් තරමටම දැඩි වුවත් ඔහු  අනාගතය ගැන විවාහය ගැන කිසි දිනෙකත් තියුමි  සමඟ කතා නොකළේය.

සස්වින්දි කෙරෙහි හිතේ වූ කහට තුහංස දුටු මොහොතේම නැතිකර ගත් රහල් තුහංස ඇයට දක්වන ආදරය ගැන තිබූ අවිශ්වාසය නිසාවෙන් සස්වින්දි ගැන දුක් වූවේය. එහෙත් දරුවාගේ පියා වූ ඔහු පියෙකු වූ පසුව සස්වින්දිට සස්වින්දිගේ ආදරණීය බවට මෙල්ලවේ යැයි හැඟීමක් රහල් තුල විය.

තියුමිගෙන් සත්‍ය තොරතුරු දැනගත් රහල් විටින් විට සස්වින්දි අමතා ඇයගේ සිත සතුටින් තැබීමට උත්සහ කළේය.

ඇයට දිරි දුන් ඔහු මුල් කාලයේ තුහංස ගැන අනාගත බලාපොරොත්තු ගොන්නකින් සස්වින්දිගේ සිත පිරවූයේ ඇයට නිරෝගි දරුවෙකු බිහිකරන්නට රුකුල් ලබාදෙමිණි.

මට නොලැබුණත් මගේ නොවුණත් මම ඔයාට එදා වගේම අදත් සැබෑවටම ආදරෙයි සස්වී... ඔයාගේ සතුට තමා මගේ සතුට... ඔයාගේ ජීවිතේ සතුටින් පුරවන්න මේ රහල් මොහොතක් මොහොතක් ගානේ උත්සහ කරනවා... මේ අවුරුදු

තුන ගෙවිලා ගියාම ඔයාටයි ඔයාගේ පුංචි පැටියටයි ලෝක
හදලා දෙන්න මේ රහල්ට පුළුවන් වෙයි... රහල් සිතුවේය.

එසේම තියුම් මෙන්ම රහල්ද සස්වින්දි ගැන වූ රහස
ලෙසින්ම රැක්කේය. තුහංස හමුවූවද ඔහු සස්සවින්දි
කිසිවක් ඔහුගෙන් අසන්නට ගියේ නැත. එසේම දරුවෙක් සි
බව හෝ සස්වින්දිට තමා කතා කරන බව හෝ පැවසුවේ නා

තුහංසගේ වෙනස සිදු වූයේ අයහපත් අතටය. තිබූ දු
ඔහු දෙගුණ තෙගුණ කර ගත්තේය.

ඔහු පෙරදා මෙන් නොව දිනපතා බීවේය. කතා කරන
සමඟ හෝ ආරවුලක් ඇති කර ගන්නා ඔහු සමහර අව
වලදී සති ගනන් කූඩුවේ හිඳි අවස්ථාද විය. ඒ දින චර්
නිසාවෙන් ඔහු ළඳුන් සොයා යාමෙන් නම් වැලකිණි.

ඔහු කාර්යාලයට ගියේ මසකට වතාවක් පමණි. ඒ ද සුදු
අත්සනක් ලබා ගැනීමට සිදු වූ විට පමණි.

තමන්ට ඕනේ ආකාරයෙන් සමාගම ගෙන ගිය දු
රහසින් චිතු සමඟද සබඳකමක් ඇති කර ගත්තේය. තු
නිසාවෙන් හිත රිදවාගෙන සිටි චිතු තුහංස වැට්ට වීමට මෙ
රිදවීමටද සිතා සුසිල් සමඟ එක්වූවාය. ඇය ඔහු සමඟ
සමාගමේ මුදල්ද ලක්ෂ ගණනින් වංචා කළාය.

කායිකව මානසිකව හැම අතින්ම අසරණව සිටි ස
නිතර නිතර රෝගී වූවාය. මුදල්ද හිඟ පාඩු වූයෙන් කල
වත්තද විකුණා දැමූ ඇය සීතා නිවසට ගෙන්වා ගත්තාය.

අර පුංචි නෝනා හිටිය නම් පුංචි මහත්තයාට වි
නෙවෙයි සජී නෝනටත් වරදක් වෙන්නේ නැහැ... හැම
වෙලා තියෙන්නේ අවාසනාවට... ඒ රත්තරන් නෝනගේ
පුංචි පුංචි මහත්තයාට නොදැනුනේ කළ කරුමයකට... නි
පැමිණි දිනම සීතා මුමුණා ගත්තාය.

"ඇයි බං සතියකට දෙකකට යනවනම් අස්වීම දුන්නේ

හිමිකරුවාට අස්වීමේ ලිපිය ලබාදී සියල්ලන්ගෙන් සමු
පැමිණි සස්වින් ගෙන් ළයනි ඇසුවාය.

"යන ගමන සතියක්ද දෙකක්ද මාසයක්ද අවුරු
කියලා මම දන්නේ නැහැ ළයනි... සමහර විට ආය නොඑ

යනවා වෙන්නත් පුළුවන්"

"සර් කොහොමත් වෙන එකවුන්ටත් කෙනෙක් ගන්නේ නැහැ කිව්වා... සර් හිතාගෙන ඉන්නේ උඹ එයි කියලා"

"බලමුකෝ... එන්න වෙයිද කියන්නත් බැහැ"

"උඹ වගේ වයිෆ් කෙනෙක්ව හස්බන්ඩ් කෙනෙක් එවයි කියලා හිතන්න නම් බැහැ"

"ඕනි නැති නිසානේ බං ආවේ... ආයෙත් ඕනි වෙයි කියලා මම හිතන්නේ නැහැ... බය තියෙන්නේ ආය එකෙක් හදලා එවයි කියලා" සස්වින්දි සිනාසෙමින් කීවාය.

"කොහොම හරි සෙට්ල් වෙන්න බලපන් සස්වී... මැරයෝ මැරයෝ විදහටම හැමදාම ඉන්නේ නැහැනේ"

"මන්දා ළයනි... එයා මේ වෙන කොට මැරි කරලද කියන්නත් බැහැනේ"

"කසාද දෙකක් බඳින්න බැහැ බං මිනිහෙකුට... නීතියක් තියනවා"

"එයා නීතියට ගරු කරන මිනිහෙක්වත් නීතියට බය මිනිහෙක්වත් නෙවෙයි ළයනි... ඔයාට එයා ගැන හිතා ගන්නවත් බැරි වෙයි"

"මෙච්චර කාලයක් වුණාට හංස කියලා කියනවා විතරයි කවුද කියලවත් කියන්නේ නැහැනේ"

"එයා කවුද කියලා ඔයා දැන ගන්න ඕනේ නැහැ... දැන ගත්තොත් මේ යාළුකමත් නැති වෙයි"

"එයා බැඳලනම් ඔයා මොකද කරන්නේ"

"සල්ලි ටික අරන් දීලා ඩිවෝස් එකත් දීලා එනවා"

"පුළුවන්ද උඹට ඒක කරන්න... බවුන් වඩපු මහා උපාසිකාවක් වගේ"

"පුළුවන් වෙයි... ආදරේ නාමයෙන්... හංසට ආදරේ නොකළට මම පුතාගේ තාත්තිට ආදරේ කරනවා... එයාගේ සතුට තමා මගේ සතුට... ඒක තමා සැබෑ ආදරේ"

"අම්මට සිරි... කවුද බං උඹට ඔය දාර්ශනික ආදරයක් ගැන කියලා දුන්නේ"

"මගේ ආදරේ..."

"උඹේ ආදරේ..."

"ඔව්... රහල්... එයා ගැන මම උඹට කියලා නැහැ ළයනි... පස්සේ දවසක කියන්නම්"

"නැහැ නැහැ... දැම්මම කියපන්" සස්වින්දි ළයනි සමඟ රහල් පිළිබඳ සියළු තතු පැවසුවාය. ළයනි අසා සිටියේ පුදුමයෙනි.

"මම හිතුවා උඹේ ජීවිත කතාව කියෙන්නේ නවල් එකක් කියලා... දැන් බලාගෙන යන කොට සස්වී... උඹේ ආදර කතාවත් නවල් එකක්නේ... එහෙම හස්බන්ඩ්ලා නැහැ වගේම එහෙම පෙම්වන්තයෝත් නැහැ බං"

"වෙන්න ඇති... මොකද මම වගේ ගෑනියෙකුත් නැතුව ඇති" සස්වින්දි කීවාය.

"උඹ දැන් හංසට අදරෙයි කියලා හැමදේම දීලා එන්න යනවා... හංස ඊට කලින් උඹට අනතුරක් කළොත්... උඹට බය නැද්ද"

"සල්ලි මගේ ළඟ තියෙද්දී මට අනතුරක් නොකළ එයා මගේ ළඟ සතයක්වත් නැති වුණාම අනතුරක් කරන එකක් නැහැ... ලොකු ආදරයක් නැති වුණාට වෛර කරනවා කිව්වට මම වෙනුවෙන් එයාගේ හිතේ පොඩි ආදරයක් හරි තියනවා කියලා මම දන්නවා ළයනි... මම විශ්වාස කරනවා" සස්වින්දි පැවසුවේ අතීතය සිහිපත් කරගනිමිනි.

තුහංස සමහර අවස්ථාවලදී තමාට ආදරයෙන් සැලකූ අවස්ථා තමා ගැන සොයා බැලූ අවස්ථා නැතුවා නොවේ. ලේ බිඳුවකට බයේ තමාට හානි වේ යැයි සිතා හැඟීම් සඟවා ගත් දිනයද ඇයට සිහි විය.

"මම මගේ කොල්ලව කුසේ දරාගෙන හැමදෙයක්ම අමතක කරලා හිටියේ... එයාව මේ ලෝකෙට බිහිකළේ ඒ විශ්වාසේ හිතේ තියාගෙන... අවුරුදු තුනක කාලයක් දුකක් හිතේ

තියාගෙන නොහිටියේ ඒ විශ්වාසේ නිසා" සස්වින්දි දුර බලාගෙන කීවාය.

"ඉස්සරහට හංස මගේ ළඟ හිටියත් නැතත් මගේ ජීවිත කාලෙම ගෙවන්න ඒ පුංචිම පුංචි ආදරෙයි... ඒ පුංචි ආදරේ ප්‍රතිඵලයක් වුණ මගේ කොලු පැටියයි හොඳටම ඇති"

"ඇත්තමයි සස්වී... උඹ කිව්වා හරි... උඹ ඉන්නෙත් නවල් එකක විතරයි" ළයනි සිනාසෙමින් කීවාය.

තුහස් නැන්දා සමග නතර කළ සස්වින්දි මනෝජ් සමඟ රත්නපුරයට ආවාය. ඔවුන් එදා නතර වුණේ තියුමිගේ නිවසේයි. නිවස සකසාගෙන පසුදා ඔවුන් නිවසට ගියේ මුදල් රැගෙන දීමට පැමිණි බවත් පසුදා අදාල නීතිඥයා ඉදිරිපිටදී හමුවීමට සිතා සිටින බවත් සජීවාට ඇමතුමකින් දන්වාය.

"මනෝ ගෙදරද දැන් ඉන්නේ" ඇමතුම දුන් මනෝජ්ගෙන් සජීවා ඇසුවාය.

"ඔව් සජී මිස්"

"හංසිත් ඉන්නවද"

"ඔව් සජී මිස් ඇයි"

"නැහැ... නිකමට ඇහුව්වේ"

"අපි හෙට උදේ ඔෆිස් එකට එන්නම් සජී මිස්... හංස මහත්තයාටත් එන්න කියන්න" මනෝජ් ඇමතුම විසන්ධි කළේය.

"සීතා... ලෑස්ති වෙන්න ගමනක් යන්න" කලබලෙන් කී සජීවා සතුටින් සිනාසුණාය.

"ලොකු නෝනා ලොකු සතුටකින්... අපි කොහෙද යන්නෙ"

"ලෑස්ති වෙයන්නකෝ... ගියාම බලා ගනින්"

වසර ගනනාවකින් නිවසට පැමිණි සස්වින්දි මිදුල පුරා ඇවිද්දාය. තුහංස මෙහි ආ දින කළබල කර ගිය දින ඇය සිහි කළාය.

"දෝණී මොකද ගේ වටේ ඇවිදින්නේ"

"මටත් එහෙමයි... කොල්ලා නැතුව සාංකාව"

"පුදුම දඟයක්නේ"

"අප්පා වගේ නැතැයි... කොච්චර ඇඟෑලුකමෙන් ද

කොල්ලා ගැන හංසට කියන්න එපා"

"තාත්ති..."

"ඔව්... කියන්න ඕනෙද නැද්ද කියලා

කියන්නම්" සස්වින්දි නිහඬ වූවාය.

ඔබ වැනි පුතෙක් ඔබේ ලෙයින් සිටින බව

කියන්නට මවත් බලා සිටින්නේ පෙරුම් පුරාගෙනයි...

දෙකක් ගියද සස්වින්දිට තවම ඒ අවස්ථාව උදාවී නැත.

"දරුවා තමන්ගේ බව දැන දැනම දරුවෙක් ලැ

ඉන්නවා කිව්වම බොරුවක් කරනවා කියලා කියපු මි

අවුරුදු තුනකට පස්සේ දරුවෙක් ඉන්නවා

පිළිගයිද" මනෝජ් කීවේය. පියා පවසන්නේ සත්‍යය

සස්වින්දිට සිතිණි. එතකොට මේ ජීවිත කාලෙටම

පුතෙක් ඉන්නවා කියලා හංසට කියන්න මට බැරි ෙ

සස්වින්දි ශෝකයෙන් මුමුණා ගත්තාය.

"සජී මිස්... නොකියම" තමා අසලටම පැමිණි සජීව

මනෝජ් පුදුමයෙන් කීවේය. සස්වින්දි සජීවා දෙස බැලුවාය

"ඔයා ඔයාගේ නැන්දම්මාට තුරුල් වෙන්නේ

හංසී" සජීවා පවසද්දී සස්වින්දි බැලුවේ මනෝජ් දෙසයි.

"මම දන්නවා මනෝ හැමදේම... බැන්ද බව මට

කිව්වා" කියූ සජීවා සස්වින්දිව වැළඳගෙන සිප ගත්තාය.

"වුණදේ මට සීතා කීව්වා" සජීවා සීතා දෙස බලා කීෙ

"සීතා නැන්දේ" සස්වින්දි සජීවා ලෙසින්ම සීතාවද

ගත්තාය.

"පුංචි නෝනේ... රන් පිළිමයක් වගේ පිරිලා හැඩ වෙ

"අනේ ඔව්... අපූගේ කපාපු පළුව මනෝ"

"එන්න සජී මිස් ගෙට යමු අපි"

සස්වින්දි බැලුවේ සජීවා පැමිණි වාහනය දෙසයි. රියදුරු අසුනේ සිටින නන්නාඳුනනා මිනිසා දුටු සස්වින්දිගේ වත මැලවී යනු සජීවා දුටුවාය.

"ගෙදර ඉන්නවා... හොඳටම ගසලා නිදි... ඔයා ආව බවවත් මම මෙහෙ ආව බවවත් දන්නේ නැහැ... අපි නොකියම යමු ගෙදර" සජීවා කීවාය. සස්වින්දි දෑස් විසල් කරමින් මනෝජ් දෙස බැලුවේය.

"ඔව් මනෝ... මම ආවේ මගේ ලේලිව ඔයාගෙන් ඉල්ලගෙන යන්න... මම දන්නවා රජී හිටියනම් මේ දේවල් මෙහෙම වෙන්නේ නැහැ... වැරැද්ද මගේ... මමයි මනෝට හරස් වුණේ"

"පරන දේවල්... පරණ කතා... අමතක කරමු සජී මිස්... අපේ හිත් රිදෙනවා විතරයි"

"මගේ හිතේ ආය රිදෙන්න තැනක් නැහැ මනෝ" සජීවා දෑසට කඳුළු පුරවා ගත්තාය.

"අපි කාගේ කාගේත් හිත් රිදෙනවා තමා සජී මිස්... හැමදාම සතුට විතරක් තියෙන්නේත් නැහැ... දුක විතරක් තියෙන්නෙත් නැහැ"

"මගේ හිතට නම් සතුට ගොඩක් දුරයි මනෝ"

"එහෙම කියන්න එපා සජී මිස්... ඉරණමේ හැටියට අපට ඒවා ලැබෙයි"

"මේ කෙල්ල මගේ ගෙදරට ගෙනියන්න මනෝ මට ඉඩ දෙනවා නේද මනෝ"

"මීට අවුරුදු ගානකට ඉස්සර දවසක මම රජී මහත්තයාට පොරොන්දු වුණා සජී මිස් ඇවිල්ලා මගේ දෝණිව ඉල්ලුවොත් ඒ දවසට මම මගේ දෝණිව දෙනවා කියලා... ඒ පොරොන්දුව මට කඩන්න බැරිවෙයි සජී මිස්... ඒත්... ඇත්ත නම් මගේ කෙල්ල දුක් විඳියි"

කෙල්ලව මම අත ඇරලා දැම්මොත්... ...
දෙන්නේ නැතිවෙයි මනෝ... ඒකයි මම මේ කෙල්ලව ඉල්...
ආවේ... මම මගේ ළග හරි මේ කෙල්ලව තියා ගන්නම්"

"රජී මහත්තයා කිව්වා දවසක සජී මිස්ට මගෙ...
ඉල්ලන්න එන්නම වෙයි කියලා... දිවැස් තිබුණද මන්දා"

"එයාට හිතෙන්න ඇති මනෝ" සජීවාගේ දැඩි ...
නිසාම සස්වින්දි සජීවා සමඟ යැවූවද මනෝජිට සැනසීම...
නොවීය.

"මට විටින් විට කොල් කරන්න දෝණී" ඔහු මගින්...
කීවේය.

"මම කොල් කරන්නම් තාත්තී... ඔයා බය...
එපා" සස්වින්දි ඔහුව සිප ගනිමින් කීවාය.

බොහෝ කුඩා කල දුව පැන නටා සෙල්ලම් කළ...
වුවද මතකයක් ඡායාවක් හිත කොණකවත් නොතිබූ ඒ...
මන්දිරයට කෝඩුකාරියක් ලෙසින් සස්වින්දි ඇතුළු වූවාය...

ඇයගේ සිතේ තිබුණේ තම ආදරයේ නොව තම සැ...
නොව තම දරුවාගේ පියාගේ නිවසට ආවෙමි...
චේතනාවයි.

මංගල පෝරු සළු පිළි පාවඩ නොමැතිව නීතියේ ...
නොමැතිව ගැහැණියක් වූ ඇය පතිණියක්ද නොවී මව...
ආදරයක් සෙනෙහසක් නොව මෘදු වදනක උරුමය...
සැමියාගෙන් නොවිදි ඇයට මලක් දැමූ වතුර වීදුරුවක්...
වූයේ පුංචිම පුංචි වාසනා ගුණයකට උරුමකම් ලද ...
හැකිය. සජීවා පෙවූ වතුර වීදුරුවෙන් උගුරක් වී...
නිවසට පා තැබුවාය.

සස්වින්දි නිවසට යද්දී තුහංස සිටියේ වෙරි මතින්...
ඔහුගේ කාමරයට ඇතුළු වූ ඇය වසර ගනාවකින් ...
දෙස බලා සිටියාය.

උරුම කඩවසම් බවට බිඳක් හෝ හානි සිදුවී ...
හිමිව තිබූ හැඩි දැඩි නාරි දේහයේ වෙනසක් සිදුවී ඇ...

පැහැ ගැන්වුණු තොලපට සිඟරට් මත්පැන් කොපමණ කය තුලට යන්නට ඇතැයිද කියා පෙන්නුම් කළේය.

දෑඟිළි ඔහුගේ කෙහෙරැලි අතරින් යැවූ සස්වින්දි පහත් වී ඔහුගේ නලලත සිප ගත්තාය. ඇයට ඉකි ගැසිණි. පසෙකට වී මේ දසුන බලා සිටි සජීවා දෑසට කඳුළු පිරෙද්දී ඉවත ගියාය.

"දැන් ආය නෝනට අඬන්න වෙන එකක් නැහැ නෝනේ" සීතා කීවාය.

සුපුරුදු උණුසුමක් නුපුරුදු ලෙස දැනෙද්දී තුහංස දෑස් විවර කළේය. අදහා ගත නොහැකිව ඇය දෙස බලා සිටි තුහංස

"හංස..." සස්වින්දිගේ ඇමතුමට නැඟී සිටියේය. තමාට නොකියා තමා දමා ගොස් ඇය තමාට කළ මදි පුංචිකම තුහංසට කෝපයක් ගෙන ආවේය.

"මොකටද තමුසේ ආවේ... කවුද තමුසෙට එන්න කිව්වේ... පලයන් මගේ දෑහැට නොපෙනී" තුහංස කෑගැසුවේය. සස්වින්දි කඳුළු පිර දෑසින් ඔහු දෙස බලා සිටියාය.

අවුරුදු ගානක්... මූණ පේන්නේ නැතුව... හඬක් අහන්නේ නැතුව... හිතෙන් මොහොතකටවත් අයින් නොකර තියා ගත්තේ අද මේ දවසට බලාපොරොත්තු ගොන්නක් ඔළුවේ තියාගෙන.... දැක්ක ගමන් හැමදේම අමතක කරලා ' හංසී... කියලා මොහොතට මාව බදාගයි කියලා හංස... ඒත් ඔයා... පොඩ්ඩක්වත් වෙනස් වෙලා නැහැ...

අවුරුදු තුනක් මිනිහට නොකියා මිනිහා දාලා ගිය ගෑනියක්ව ආය වැද්ද ගන්න මම මොකෙක් කියලා හිතුවද... ආ..." සස්වින්දි එලෙසින්ම ඔහු දෙස බලා සිටියාය.

"උඹේ මහ ලොකු තාත්ත අරන් ගිහින් හංගල තියා ගත්තේ... තව මිනිහෙකුට දීලද... කවුද දන්නේ... මැරුම් නොකා පලයන්"

තවත් මොහොතක් හෝ එතැන නොරැඳි සස්වින්දි පිටතට දිව ගියාය. ඒ මොහොතේ තුහංසගේ කාමරයට යමින් සිටි සුසිල් දිව යන සස්වින්දි දෙස බලාම කාමරයට ඇතුළු වූවේය.

"එන්න අංකල්" තුහංසගේ හඬට ඇය නැවතිණි. අනුන්ගේ කතා ඇසීම කළ යුත්තක් නොවේ. එහෙත් මේ කතාව තමාට

වැදගත්ය. සස්වින්දි නැවතිණි.

"මොකද කියන්නේ... ඩිවෝස් එක දෙනවා කිව්වද"

"මොනවත් ඇහුව්වේ නැහැ අංකල්... දැක්කම මට මල පැන්නා... රෝන්දේ ගිහින් එනවා මෙතන... එළව ගත්තා මම" තුහංසගේ කෝපාකාරී හඬ මැකී යද්දී සුසිල්ගේ සිනා හඬ ඇසිණි.

"දුවත් එනවා කිව්වා හෙට අනිද්දා"

"මටත් කතා කළා"

"මේවා පිළියෙලක් කරගමු"

තුහංසගේ හඬක් නැසිණි. එසේ නම් සුසිල් දන්තනායකගේ අරමුණ තමාගේ විවාහය අවලංගුකොට ඔහුගේ දියණිය තුහංසට ලබාදීමයි. බලමුකෝ... තුහංසගේ ප්‍රතිචාරය මොකද්ද කියලා... එයා මොනවත් කිව්වේ නැහැනේ... සස්වින්දි සිතුවාය.

තුහංසගේ හඬට ඒ දෙසට එමින් සිටි සජීවා ඇයව වැළඳ ගත්තාය.

"අඬන්න එපා පුතේ... යමු මගේ කාමරේට"

"හංස වෙනස් වෙලා නැහැ ආන්ටී... මම හිතුවා මෙච්චර කාලයක් ගිය නිසා වෙනස් වෙලා ඇති කියලා" සස්වින්දි පැවසුවේ කඩවුණු බලාපොරොත්තුවකිනි.

"අපි එයාව වෙනස් කර ගමු පුතේ"

"එයා වෙනස් කරන්න කවදාවත් බැරි වෙයි ආන්ටි... අයිෂාදිව බන්දන්න නේද එයාගේ තාත්තා බලාගෙන ඉන්නේ"

"එහෙම නම් තමයි... ඒත් පුතා හරි උත්තරයක් දීලා නැහැ පුතේ..."

"තේරුමක් නැහැ ආන්ටි මම ඉන්න එක... හංස එයාව බඳියි"

"මම හිතන්නේ නැහැ පුතා ඒ ගැන හිතනවා කියලා... අපි බලමුකෝ... අනික මම ඉඩ දෙන්නේ නැහැ ඒ වගේ දේකට"

"තරහා වෙන්න එපා ආන්ටි... මම ආපහු යන්නම්"

"අනේ එපා මගේ පුතේ... මගේ පුතාගෙන් ඔච්චර වරදක් ඔයාට වෙලා තියෙද්දී ඔයාට එහෙම යන්න දෙන්න බැහැ දරුවෝ... රජී මට සාප කරයි"

"පුංචි මහත්තයාව වෙනස් කර ගන්න උත්සහයක්වත් ගමු පුංචි නෝනේ" සීතාද කීවාය.

"තව ගියේ නැද්ද මෙයා" තුහංස එතැනට පැමිණ ඇසුවේය.

"අනේ පුතේ... එයාව එක්ක ආවේ මම... මගේ එක්කවත් ඉන්න දෙන්න පුතේ" සජීවා පැවසුවේ බොහෝ යටහත්වය.

"මේ... අම්මේ... මෙතන වෙන්න ඕනේ මට ඕනේ දේ... එයා මේ ගෙදර ඉන්න බැහැ"

"අනේ පුතේ" ඇය බැගෑපත් වූවාය.

"ආන්ටී... ඔයා බය වෙන්න එපා... කවුරු කිව්වත් අද මම යන්නේ නැහැ... මේ ගෙදර ඉන්නවා" සස්වින්දි කීවාය. තුහංස රවා ඇය දෙස බැලුවේය.

"මේ මගේ මහත්තයාගේ ගෙදර... ඉතින් එයාටවත් බැහැ මාව එහෙම එළියට දාන්න"

"කසාදේ තියනවද මහත්තයා වෙන්න" තුහංස ඇසුවේය.

"තියෙන්න ඕනි... මොකද මම කටු ගෑවේ නැහැනේ"

"රවුම් ගහලා ඇවිල්ලා කියාගෙනත් එනවද... හංසි ආව දවසෙම උඹ මගෙන් කන්න එපා "

"රවුම් ගැහුව්වනම් මෙතෙන්ට එන්න ඕනේ නැහැ හංස... රවුමෙම යන්න තිබුණා... සීතා නැන්දේ... මේ කියන උපාසකයා ගෑනු කීදෙනෙක් ගෙනාවද මම නැති අතරේ බංගලාවට" සීතා මුවට නැඟුණු සිනහව ආයාසයෙන් වළකා ගත්තාය.

සජීවා සීතා අඬගසාගෙන ඉවතට යද්දී තුහංස ඇයට ළං වූවේය. නොදැකි වසර තුනට ඇය බෙහෙවින් පරිපූර්ණව ලස්සන වී සිටියාය. රතු වත මේ මොහොතටත් කෝපයට රතුව ඇත. කඳුළු දැසේ කඳුළු නොතිබුණද දිලිසෙයි. තුහංස ඇය දෙස මොහොතක් බලා සිටියේය.

"හෙට සල්ලි ටික දීලා ගනුදෙනුව ඉවර
කසාදෙත් ඉවරයිනේ... ඉතින් මට මොකද"

"දැන් හෙට කෝටි ගානම දෙනවද"

"ඒක දෙන්න තමා ආවේ"

"දික්කසාදේ"

"ඒකත් ඕනෙනම් දෙනවා... කෝටි ගානට වඩා ඒ
ඇතිනේ"

"ඔව්... අයිෂාදි බලාගෙන ඉන්නවා" සස්වින්දියෙ
වැටුනාය.

ජීවිතේ ලොකුම පැරදුම මෙය නොවේද... තවත්
ගත යුතු නොවේ... තමා ආපසු පැමිණියේ බලා
ගොඩාක් හිත පුරවාගෙයි...

නොදැකි වසර ගනනට හිත තිබූ පුංචිම පුංචි ආද
තමා අවශ්‍යවේ යැයූ සිතාය... හංසට තමාව වුවම
මෙතුවක් කාලයක් තමා කෝප නොගත්තාය... එහෙ
මොහොතට තමා වෙනස් වූයේ කෙසේද... යා යුතු
අත හැර යා යුතුය...

පව් සජී ආන්ටි... ඒත්... සොරි ආන්ටි... මට ස
සස්වින්දි තුහංස දෙස නොබලාම එතැනින් ඉවත් වූ
සමච්චල් සිනහවෙන්ම ඇය දෙස බලා සිටියේය.

ඔයා වෙනස් වෙලා නැහැ කෙල්ලේ... තාම ඉ
කේන්තියෙන් පුපුරනවා... තුහංස සිතුවේය.

කෑම මේසයේ වාඩි වුණු තුහංස සෙමින් සෙ
ගත්තේ සස්වින්දි එනු ඇතැයි සිතාය. එහෙත්
ආහාරගෙන අවසන් වෙනතුරුද නාවාය.

"ලොකු නෝනා කන්නේ නැද්ද සීතා" තුහ
සස්වින්දි ගැන අයුරුවක් ලැබේ යැයි සිතාය.

"කන්න බැහැ කියලා ගියා" සීතා කීවාය.

"පුංචි නෝනා..." ඇසීමට සිතුනද ඔහු එය නෑසුවේය. තමා පැවසූ වදන් වලට ඇය පලිදරනවා ඇත.

ලොකු කමට තාත්තා එක්ක එකතු වෙලා මට නොකියා ගිය හැටි... විඳවන්න ඕනේ එයා ඒවට... ගෑනියක් මොන දුක විඳලා හරි ඉන්න ඕනේ මිනිහා එක්ක... තුහංස සිතුවේය.

කාමරයට ගිය තුහංස නිදිවරා බලා සිටියේ සස්වින්දි කොයි මොහොතේ හෝ තම කාමරයට පැමිණේ යැයි සිතාය. ඔහු ඉවසා බැරිම තැන නැඟී සිටියේය.

"නෝනව ගෙදරටම ඇරලුවද සමීර... මනෝජ් සර් හිටියා නේද" මවගේ හඬ ඇසෙද්දී තිගැස්සුණු තුහංස මොහොතක් නිසොල්මනේ සිටියේය.

එහෙනම් මට නොකියම ගිහිල්ලා... මෙයා මෙහෙ ඉන්න නෙවෙයිද එතකොට ඇවිත් තියෙන්නේ... තුහංස මුමුණා ගත්තේය.

නින්දට යාමට තම කාමරයට පැමිණි සීතාව සජීවා ඇමතුවේ යහනේ සිටයි.

"සීතා..."

"නෝනා... ඔච්චර වෙලා කිසි සද්දක් තිබුණේ නැහැ... දැන් ඕන්න බොතල් සද්දේ"

"මොනවා කරන්නද සීතා... මනෝජ් මහත්තයා පුංචි නෝනව මෙහෙ තියන්න කැමති නැහැනේ... ඇත්ත තමා... කොයි තාත්තද කැමති තමන්ගේ දුව දුක්විඳිනවා බලන්න"

"ඒ මහත්තයා පුංචි නෝනාව එව්වේ මඟින් මඟට කියලා... නොඑවා බැරිකමට"

"ඔව් සීතා... ඒ නිසා බලෙන් තියා ගන්නත් බැහැ... මනෝජ් සල්ලි අරන් දීලා හංසිව අරන් ආපහු යයි"

"බැල්ලී... රවුමේ ගිහින් ආවා මෙතන... පෙනිලා යන්න... මම ඕකිට... තුහංසගේ පැටලලි හඬ ඇසෙද්දී සීතා නින්දට යන්නට දෑස් පියා ගත්තාය. සජීවාගේ දිග සුසුම් හඬ ඇයගේ සවනතට තදින් ඇසිණි.

නීතිඥ නෝබට් සමරදිවාකර මහතා ඉදිරියේ මනෝ
තුහංස හා සජීවාද අනෙක් පසින් සස්වින්දි හා මනෝ
සිටියේය.

"මම හිතන්නේ මේ ගනුදෙනුවේ විස්ත
බක්මීමල්දෙණියට දැනටමත් දන්නවා"

"අනේ නැහැ ප්‍රොක්ටර්... මහත්තයා මේ
විස්තරයක් මට කියලා තිබුණේ නැහැ... මම මේ එ
ගැන දැන ගත්තෙත් අවුරුදු තුනකට කලින්... මනෝ
නැහැ කිව්වා නේද"

"නැහැ... මිස්ටර් පළිඟුආරච්චි දන්නේ මේ එ
එයාගේ දුවගේ නමින් තියනවා කියලා විතරයි... ඊට
එයාට නොකියන්න මිස්ටර් බක්මීමල්දෙණිය
පොරොන්දු ගත්තා... මේක ගැන කිව්වෙත් එකවුන්
අවුරුද්දකට පස්සේ... එහෙම නේද"

"හ්ම්..." මනෝජ් හිස සෙල වූවේය. සස්වි
තුහංස දෙසයි. ඔහු තම පියාට මේ ගිණුම හිතා ම
බවට කොතරම් චෝදනා කළාද...

"මිසිස් බක්මීමල්දෙණියට මම හංසගේ
උපන්දිනේ දවසේ ලියුමක් දුන්නා... මතකද"

"එහෙම මතකයක් නම් නැහැ... රජීගේ එ
විස්තරයි ඔප්පුයි තියන ෆයිල් එකක් දුන්නා නම් ම

"ආන්න ඒ ෆියිල් එක ඇතුලේ තමයි ඒ ලි
ඒක වැදගත් ලියුමක්... රජී මහත්තයා එයාගේ ජීවි
වුණොත් විතරක් ඒක දෙන්න කියලා තමයි මට දු

"එහෙනම් ඒක ඒ ෆියිල් එකේ ඇති... මම බල
කීවාය.

"දැන් ඉතින් බලලා වැඩක් නැහැ... හංස
නැහැනේ... බඳින්න කෙනෙක් එහෙම ඉන්නවද"

"ඇයි ප්‍රොක්ටර් එහෙම ඇහුව්වේ" තුහංස අ

"එහෙම නම් ඔයාට මේ මුදලෙන් පහෙන් එකයි හම්බ වෙන්නේ"

"ඉතුරුවා"

"පහෙන් එකක් මිස් පළිඟුආරච්චිට... පහෙන් එකක් අනාථ නිවසෙකට... අනෙක්වා මිස්ටර් බක්මීමල්දෙණියගේ ළමයින්ටයි මිස් පළිඟුආරච්චිගේ ළමයින්ටයි බාගේ බාගේ බෙදෙනවා... ඒකියන්නේ පහෙන් එක එක"

"කසාදය මේකට බලපාන්නේ කොහොමද"

"නොබැඳ ඉන්න කියලා දැනුවත් කරන්න තමයි අර ලියුම ලියලා තියෙන්නේ"

"ඒක මම බැලුවේ නැහැනේ... දැන් කරන්න දෙයක් නැහැ"

"බැඳලා නැත්නම්"

"සම්පූර්ණ මුදලම හම්බ වෙනවා... එක කොන්දේසියකට"

"කාටද... මටද මෙයාටද" තුහංස සස්විත්දි පෙන්වමින් ඇසුවේය.

"දෙන්නටම... දැනට කෝටි පහක් තියනවා මේ එකවුන්ට්

"මෙයා බැඳලනම්"

"ඒත් බෙදෙන්නේ අර විදිහට... අනාථ නිවසෙකට කෝටියක් යනවා"

"කොන්දේසිය මොකද්ද"

"අර ලියුමේ තියනවා ඒ ගැන... මෙන්න ඒකේ පිටපතක් තියනවා මම ගාව" නීතීඥවරයා එය සජීවා අතට දුන්නාය.

රජීවගේ අත් අකුරු දුටු සජීවා හැඬීණි. ඇය හඬමින් ලිපිය කියවූවාය.

"මම දවසක දුව ඉල්ලන් එයි කියලා රජී මනෝට කියලා තියෙන්නේ නිකන් නෙවෙයි" සජීවා මනෝජ් දෙස බලමින් කීවේය.

"රජී මාව හංසිව ඉල්ලන් යන තත්වෙට පත් කරලා"

"ඒ කිව්වේ" තුහංස ඇසුවේය.

"මේ සල්ලි ගන්න පුළුවන් හංස හංසිව බැන්දොත් වි
මේ ලියුමෙන් කියලා තියෙන්නේ පුතාට වෙන කසාදයක්
දෙන්න එපා කියලා... මනෝජ්ටත් දුව කාටවත් දෙන්
කියලා කියන්න කියලා"

"ඇයි රජී මහත්තයා මට ඔය වගක් නොකීවේ..
තරමේ දෝණිව කාටවත් බන්දවන්න එපා කියලවත්"

"මේ ලියුමේ තැනක තියනවා... මනෝ ක
පොරොන්දු කඩන්නේ නැහැ කියලා... ඒ නිසා හංසිව
දෙන එකක් නැහැ කියලා... කෝකටත් මේ ගැන මතක්
කියලා"

"පිස්තෝල පෙන්නලා අරන් ගිහින් හරි සල්ලි ටික
වැඩේ කරලා තියනවා" මනෝජ් රහසින් තුහංස දෙ
කීවේය. ඔහුට සිනහවක් නැගිණි.

"ඒ කියන්නේ දැන් මේ වෙන කොට මේ
කෙරිලද" නීතීඥවරයා ඇසුවේය.

"ඒක වෙලා දැන් අවුරුදු තුනකුත් ඉවරයි" තුහංස කී

"බබාලා ඉන්නවද" සස්වින්දි රහසින් මනෝජ්
බැලුවාය.

"මට නම් නැහැ... මෙයාට ඉන්නවද දන්නේ නැහැ"

"පුතා... " සජීවා තරවටු කළාය.

"ඉන්නවනම් මේවා ඒ අයටත් බෙදෙනවා"

තාත්ති වෙලාවට තුහස් ගැන නොකියන්න
කිව්වනම් සමහර විට තුහංසට කේන්ති යන්නත් පුළුවැ
අල්ල ගෙන තුහස් ගැන කිය කියා වද දෙන්නත් බැරි
සස්වින්දි සිතුවාය.

"කසාද බැඳලා නිසා අද කෝටියක් ගන්න පුළුව
ගෙදරට ගියාට දෙන්නට වෙන වෙනම එකවුන්
යන්නේ" සස්වින්දි තුහංසගේ මුහුණ බැලුවාය. තුහං
බලා ගත්තේය.

"තව මාස හයකින් අනෙක් කෝටි දෙක ගන්න පුළුවන්... හැබැයි මට තහවුරු වෙන්න ඕනේ දෙන්නා එක ගෙදර එකට ඉන්නවා කියලා... ඉතුරු ඒවා ළමයින්ට ලැබෙයි" එවර නම් තුහංස සස්වින්දිදෙස බැලුවේ සමච්චල් සිනහවකිනි.

ලොකුකමට ගියා ඊයේ ගෙදර... දැන් හිටපන්කෝ මාස හයක් මගේ එක්ක... තුහංස මුමුණා ගත්තේය.

මාස හයක් මේ යකා එක්ක කොහොම ඉන්නද මන්දා... සස්වින්දි සිතුවාය.

"සජී මිස්... කෝටි ගාන කෙසේ වෙතත් මාස හය ගෙවෙන කොට අත පය නැතුව කෙල්ල ගෙනියන්න වෙයිද මට" මනෝජ් රහසින් ඇසුවේය.

"මනෝට ඕනි කෙල්ලව ගෙනියන්නමයි නේද"

"එහෙම නැහැ සජී මිස්... ඔය ජෝඩුව තනිමතේට බැඳගත්තට මොකද කුලල් කකා ඉන්න විදිහ බලන්නකෝ... ජීවිත ඉතුරු වුණොත් ඇති"

"ආන්ටි මම ගෙදර ගිහින් දවස් දෙක තුනකින් එන්නම්" සස්වින්දි පැවසුවේ බැංකුවෙන් පිටව එද්දීය.

"අනේ පුතේ... ඇයි... මට බයයි ඔයා ආය නැවිත් ඉදියිද කියලා" සජීවා කීවාය.

"බය වෙන්න එපා ආන්ටි... මම මේ කරුමෙන් නිදහස් වෙන්න ඕනි දුකක් විදිනවා" සජීවා නිහඬ වූවාය.

"මේ හැමදේකටම අහක හිටිය මාව රජී අංකල්ට පටලවගන්න හිතෙන්න මම මහා කරුමයක් කරලා තියෙන්න ඇති... මේ ආත්මෙන් ඒ පව් අවසන් කර ගන්න ඕනි ආන්ටි... ඊළඟ ආත්මෙටත් ඉතුරු කර ගන්න බැහැ"

"අම්මා... මට වෙලා යනවා" තුහංස කෑගැසුවේය.

"ආන්ටි යන්න" දමා යන්නට අකමැත්තෙන් දඟලන සජීවාට සස්වින්දි කීවාය.

"මනෝජ් අංකල් නගින්න... මම ගිහින් දාන්නම්" තුහංස පවසද්දී මනෝජ් සස්වින්දි දෙස බැලුවාය.

"තාත්ති යන්න මම එන්නම්" සස්වින්දි කීවාය.

"නඟිනවා... ඇඳලා වාහනේට දාගන්න ඉස්සෙල්ලා"

"දැන් ඇඳලා දාගෙන මගේ මොනවා ගන්නද හංස"

"දෝණී... කට වහ ගන්නවා... යමු" මනෝජ් ඉස්සර වූවේය.

සස්වින්දිගේ නිවසට සජීවා පැමිණියද තුහංස පැමිණියේ නැත. ඔහු වාහනයට වී සිටියේය. රහසින් ඔහු දෙස පසෙකට වී බලා සිටි සස්වින්දි ඔහු මත්පැන් බෝතලය කට තබා ගනිද්දී එතැනට පැමිණ එය උදුරා ගත්තාය.

"හංසී..." ඔහු ගිගිරුවේය.

"මම හංසි තමයි... තමුසෙගේ වයිෆ්"

"දෙනවා ඕක... දැන්ද වයිෆ් කෙනෙක් කියලා මතක් වුණේ"

"අමතක වුණේ තමුසෙටනේ"

"හංසී... ඕක දෙනවා"

"බැහැ..."

"දෙනවා... මගේ ඉවසීම නැති වෙයි... තමුසෙට මොනවා වෙයිද දන්නේ නැහැ" තුහංස රථයේ දොර හැර බැස ගත්තේය.

ඒ ඇසිල්ලට බෝතලය පොළොවේ ගැසූ සස්වින්දි කුඩු වූ බෝතල් කටුවක් ගෙන ඇයගේ අත කපා ගත්තාය.

"හංසී... පිස්සුද තමුසෙට" කෑගැසූ තුහංස ඇය වැළකුවේය.

"මට පිස්සු නැහැ හංස... ඔයා කරන්න ගියදේ මම ක[illegible] ගත්තා එච්චරයි" මනෝජ් සමඟ සජීවා දිව ආවේ තුහංසගේ කෑගැසීමටයි.

"මේ මොකද... හංස"

"නැහැ තාත්ති... හංස නෙවෙයි මමයි අත කපා ගත්තේ"

"ඒ මොකටද"

"නැහැ... හංස ඒ දේ කරන්න ඉස්සෙල්ලා මම ඒක ක[illegible] ගත්තා... එතකොට එයාට පව් සිද්ධ වෙන්නේ නැහැනේ"

"දෙයියනේ... ලේ එනවා" සිය ලේන්සුව ගත් තුහංස ඇයගේ අත තදින් ගැට ගැසුවේය.

"ඔහොම යමු හංස... ඔයාට මම මීට පස්සේ කරන දේවල් ඔයාට හිතා ගන්නවත් බැරිවෙයි... සස්වින්දි සිතුවාය.

ඇයව වාහනයට තල්ලු කළ තුහංස රථය පණ ගන්වා ගත්තේය. සජීවා දෙස බැලූ ඔහු ඉඟි කළේ ඇයට වාහනයට නගින ලෙසයි.

"අපි මෙහෙමම යනවා මනෝජ් අංකල්" තුහංස කීවේය.

"බැහැ... මට තාත්ති එක්ක කතා කරන්න තියනවා" සස්වින්දි බැස ගත්තාය.

"කතා කරගෙන එනවා... අපි ඉන්නම්... හැබැයි පරක්කු නොවී... අතට බෙහෙත් ගන්න ඕනේ" සස්වින්දි ඔහුට රවා මනෝජ් වෙත ගියාය.

"මනෝජ් අංකල්... තව මාස හයක් මේ කසාදේ ගෙනියන්න ඕනෙනේ... මෙයාට කියන්න මේ කරන වැඩ නවත්තලා මාව යකෙක් නොකර ඉන්න කියලා" තුහංස හඬින් කීවේය.

"මට මාස හයක් නෙවෙයි එක දවසක්වත් මේ කසාදේ ගෙනියන්න ඕනි නැහැ"

"ඒ වුණාට මට ඕනේ... කෝටියක් අනාථ නිවාසයකට දෙන්න මට බැහැ"

"හරි දෙන්නගේ වාදේ නවත්වනවා..." හඬින් කියූ මනෝජ්

"මොකද දෝණි පොඩි එකෙක් වගේ හැසිරෙන්නේ" යි සස්වින්දිට කීවේය.

"මට කළ හැමදේටම එයාට අනිත් පැත්තට දෙන්න ඕනේ" සස්වින්දි කීවාය.

"පළිගන්න නෙවෙයි හදා ගන්න බලන්න"

"මට එයාව හදා ගන්න ඕනේ නැහැ... මේ මාස හය ඉදලා අපි යමු... කොච්චර සතුටින් අපි හිටියද... මට මිනිහෙක් ඕනි නැහැ"

"ඔයාම නේද පොඩි එකාට තාත්තෙක් ඕනේ කිව්වේ"

"තාත්තෙක් නැතුව අවුරුදු දෙකක් හැදුනේ... ඉතුරු ටිකත් මම හදා ගන්නම්"

"අනේ මන්දා... මට තේරෙන්නේ නැහැ... ළඟ නැතුව ඉද්දී හංස... හංස... කියලා දැගලුවා... දැන් ළඟට ලැබුණම හදා ගන්න බලන්නේ නැතුව..."

"තාත්තී... ලක්ෂ පණහක් හම්බ වුණාම ඔයාට බෑනා හොඳ වුණාද"

"ඔන්න කිව්වා කතාවක්... මේ කසාදේ එපා නම් ඒ සල්ලිත් ඔයාට ඕනේ නැහැ... ඩිවෝස් වෙන දවසට හංසටම දීලා දාන්න"

"තාත්ති මෝඩයෙක් වගේ කතා කරන්න එපා... මම එයාට සතයක්වත් දෙන්නෙත් නැහැ... ඩිවෝස් එක දෙන්නෙත් නැහැ මට කරපු අපරාදෙට... මගේ ජීවිතේ වටිනාකම ලක්ෂ පණහයිද"

"හංස ඔයාව ඩිවෝස් කරන්නේ නැහැ මම දන්නවා... එයාව හදා ගන්න පුළුවන්"

"මට ඕනි නැහැ... මෙච්චර කාලයක් ගිහිල්ලා හැදුනේ නැති කෙනා තවත් හැදෙන්නේ නැහැ... මට එපා වුණා... තුහස් ගැන සජී ආන්ටිට කියන්න එපාද..."

"එපා... මම කියන්න කියලා හිටියේ... තුහස්ගේ තාත්තා හංස නිසා එයාට කෝටි ගානක දේපල හිමියි... ඒකෙන් දරුවට කරදරයක් බලපෑමක් වෙන්න පුළුවන්... ඒ නිසා තුහස් රහසක් කර ගන්න"

"හ්ම්... ඒක අහන්න මම ආවේ... මම යනවා"

"දෝණි..." මඟක් ගිය සස්වින්දි නැවතුනාය.

"හංසව කෝප කර ගන්න එපා... පුදුමයි මනුස්සයා ඉස්සෙල්ලා ඉවසපු එක"

එයා මගේ ලේ වලට බයයි කියලා මම දන්නවා... සස්වින්දි හදවතින් සිනාසුණාය.

නිවසට ගිය සස්වින්දි ගියේ සජීවාගේ කාමරයට යාබද කාමරයටයි. ඇය නිවසින් යා යැයි බිය වූ සජීවා එයට කිසිත් නොකීවාය.

"ගෞරී දායිද දන්නේ නැහැ ඔයා මේකට ආවා කියලා"

"අරක්කු ගඳ නහය තියාගෙන ඉන්න බැහැ... ඒකේ හිටියොත් සිගරට් අළුගොඩේ බුදියගෙන මටත් සිගරට් බොන්න තමා වෙන්නේ" කාමරය අසලින් යන තුහංසට ඇසෙන්නට සස්වින්දි කීවාය. ඔහු නොඇසුණු ලෙසින් එතනින් ගියේය.

සස්වින්දි ඒ කාමරය තෝරා ගනු ලැබුයේ එහි දොරට අගුල් තිබුණු නිසාය. රාත්‍රියේ කාමරයට පැමිණි සස්වින්දි එහි අගුලක් නැති බව දැක පුදුම වූවාය.

මෙය තුහංසගේ වැඩක් විය යුතුයැයි අනුමාන කළ ඇය සූදානම් වූයේ සජීවාගේ කාමරයට යාමටයි. එයට පෙර ඉස්සර වූ තුහංස ඇයගේ කට වසාගෙන ඇයව සිය කාමරයට ගෙන ගොස් යහනට දැම්මේය.

"රවුමේ ගිය ගෑනියක් කාමරේට ගන්න පිස්සුද" ඇය ඇසුවේ කෝපයෙන් යහනෙන් නැගිටිමිනි.

"රවුමේ ගිහින් ආවත් දැක්කම මට ඉන්න බැහැ පිස්සු" තුහංස ඇය වළකමින් කීවේය.

"හංස මේ... මම ආවේ මාස හයක් කසාදේ තියා ගන්න ඕනි හින්දා"

"මාත් මේ ඇඳට ගත්තේ කසාදේ රකින්න ඕනේ හින්දා" තුහංස ඇයව සිප ගනිමින් කීවේය. ඔහුගේ සිපුමෙන් සස්වින්දි හැපින්නියක මෙන් කෝප ගත්තාය.

"අයිෂාදි එයිනේ... එතකල් ඉන්නවා... යන්න දෙනවා මට" සස්වින්දි ඔහුව තල්ලු කර දැමීමට වෙහෙසුනාය.

"අයිෂාදි නැති නිසයි කාමරේට ගත්තේ... එයා එනකල් ඉන්න වෙයි තමුසෙට" තුහංස සිනාසෙමින් ඇයව තුරුලට ගත්තේය.

"හංස... අත අරින්න... නැත්නම් අත පාර ගන්න මම" කියූ සස්වින්දි අද විට්ටමේ තුවාලය වදින ලෙස ඇ ගසා ගත්තාය. තුවාලය පැරී ලේ බිඳු වැටෙද්දී තුහංස ඇය තුරුලට ගෙනම නැඟී සිටියේය.

"දෙයියනේ... ඇයි මේ තරම් මුරණ්ඩු" ඔහුගේ වද නොඇසෙන ලෙසට ඇය සිහිසුන්ව ගියාය.

ඇයගේ අතේ ලේ නවතා බෙහෙත් දැමූ තුහංස ඇය දෝතටම ගෙන මුල් කාමරයේ ගෙන ගොස් තැබුවේ වදන හෝ නොපවසාය. දොර වසාගෙනම ඔහු කාමරයෙන් පිට ගියේය.

ඔයාට ඕනේ ඕනේ විදිහට තව දුරටත් මම නටන්න දෙන්නේ නැහැ හංස... සස්වින්දි මුමුණා ගත්තාය.

අවශ්‍යම වදනක් පමණක් පමණක් වේගයෙන් හඬ හුවමාරු කර ගැනීම ඇරෙන්නට ඔවුන් අතර සුහද කතා ඇ නොවීය. මත් පැන් බී සස්වින්දිට බැන වදිමින් තුහංස සි කාමරයේ නිදා ගනිද්දී සස්වින්දි අනෙක් කාමරයේ නි ගත්තාය.

සස්වින්දිගෙන් මෙවැනි ප්‍රතික්ෂේපවීම් ලැබෙද්දී තුහංස ඇයව ඈත් කර සුපුරුදු දිවියට ළං වූවේය. ඇය වෙත ළං සුහද බවක් ඇතිකර ගන්නට හෝ නොසිතුවේය.

තවත් මාස හයක කාලයක් දික්කසාදය ගැනීමට බ සිටින්නට වූ නිසාවෙන් සුසිල් අයිෂාදිගේ පැමිණීම පමා කළේ තුහංස කාර්යාලයට නොගිය දවසක ඔහු නිවසට පැමිණ ලිපිගොණුවක් තබා ගියේ තුහංසගේ අත්සනක් එයට ලබාගැ යුතු වූ නිසාවෙනි.

කාර්යයක් නොතිබූ නිසාවෙන් සස්වින්දි එය කියව බැලුවේ නිකමටයි. එහි වූ මුදල් සමතුලිත වී නොතිබුණෙ සස්වින්දි එය ගනනය කර බැලුවාය.

"පුතා... සුසිල් අංකල් ෆයිල් එකක් තිබ්බා අත්සනක් ඕනෙ කියලා" සජීවා කීවාය.

"කෝ"

"හංසි ඒක බලනවා" සජීවා මේසය පෙන් වූවාය. තුහංස ඇය වෙත ගොස් ඇයගෙන් එය උදුරා ගත්තේය.

"තමුසේ මොකටද ඔෆිස් එකේ ඒවට හොට දාන්නේ... දන්නවද බලන්න" ඔහු කෑගැසුවේය.

"කෝ දෙන්න හංස... ඕක බැලන්ස් නැහැ... ලක්ෂගානක අඩුවක් තියනවා"

"අනෙ මේ... යනවා යන්න" තුහංස එයට අත්සනක් යෙදීමට සූදානම් වූවේය.

"එපා හංස... කියනදේ අහන්න... අත්සන් කරන්න එපා... ඕක වැරදියි"

"හංසි මේ... තමුසේ මගේ වැඩ වලට අත ගහන එක නවත්තනවද"

"හංස මට වැඩක් නැහැ තමයි... ඒත් ඔතන ලක්ෂ ගානක අඩුවක් තියනවා... ඔයාගේ සල්ලි"

"මගේ සල්ලි මම බලා ගන්නම්... මගේ සල්ලි වලට කතා කරන්න තමුසේ කවුද"

"අමතක වුණාද මම කවුද කියලා"

"මතකයි මාස හයකට කසාද ගෑනි කියලා... හංසි මේ... මගේ ඒවා මම බලාගන්නම්... පාඩුවක් වුණත් ඒක මට... මට සුසිල් අංකල් විශ්වාසයි... එයා එයාගේ දුවට පාඩු කරන්නේ නැහැ"

සස්වින්දි සජීවා දෙස බැලුවාය. නිහඬව සියල්ල අසා සිටි ඇය සුසුමක් හෙලා සිය කාමරයට ගියාය. අත තිබූ පෑන පොළවේ ගැසූ සස්වින්දි ද ඇයගේ කාමරයට ගියාය.

කසාදයක් තියෙද්දිම ඒකි ගෑනි කරගෙන... මාමාණ්ඩි කොරයි... සස්වින්දි මුමුණා ගත්තාය.

"අර ගත්ත ලක්ෂගානත් කම්පැනියට දාන්නනලු යන්නේ පුතේ... මම දන්නේ නැහැ... මට තේරෙන්නේ නැහැ" සස්වින්දිගේ කාමරයට පැමිණි සජීවා පැවසුවේ සස්වින්දි

යහනේ පසෙකින් වාඩි වෙමිනි.

"කියලා වැඩක් නැහැ ආන්ටී... මෙතන ලක්ෂ ගානක් අඩුයි... අත්සන ගැහුව්වා... අද දැක්ක නිසා මේක... නව කොච්චර ඔහොම වංචා කරනවා ඇද්ද"

"මනෝ නැති එක තමා මේවට මුල... වටේ එවුන් වටෙන් සල්ලි ගත්තට මනෝජ් එකවුන්ට් පැත්ත බැලුවා... ඒවා වංචා වුණේ නැහැ"

"ඒ වුණාට හංස කොච්චර ජාති කිව්වද... අපහාස කළාද අපේ තාත්තිට"

"ඒ නිසා තමයි මනෝට මට කතා කරන්න බැරි... නැත්නම් මනෝ දවසක් දෙකක් ගියා නම් ඇති ඔෆිස් එකට... අනේ කියන්නකෝ පුතේ... ඔයාටත් මේවා අයිතියිනේ"

"මගේ අයිතිය... ඒක ගැන හංස මට කියලා ගියේ... මම නම් ආය කම්පැනිය එයාලා ලියා ගත්තත් කතා කරන්නේ නැහැ ආන්ටි"

"කසාද අයිතියක් තියනවනම් තමුසේ මගේ කවුද කියලා හිතෙනවනම් ඒක හිතේ තියාගෙන වැඩ කරනවා... එතකොට මටත් මතක් වෙයි තමුසේ මගේ කසාද ගෑනි කියලා" සස්වින්දිගේ කාමරයට පැමිණ සස්වින්දිගේ ගෑවෙන නොගෑවෙන තරමට ළංව සිට ගත් තුහංස සස්වින්දිට කීවේය.

"හා... මම එහෙම වැඩ කරන්නම්... කසාද ගෑනි ගෙද ඉන්නවා කියලාත් මතක් කරලා දෙන්නම්" සස්වින් නොසෙල්වීම කීවාය.

රතු වත කඳුළු දැස තම හැඟීම් අවදි කරද ඒවා සතපා ගැනීමට නොසිතෙයි... එය දුටු තමාට දැනෙන්නේ කෝපයකි පිටව යමින් තුහංස සිතුවේය.

මනෝජ් සතියකින් ආපසු ගියේ තුහස් නිසාවෙනි. ම දෙකක් තුහස් නොදැක සස්වින්දි සිටියේ ඉවසාගත නොහ ශෝකයකිනි. නුවර හදිසි වැඩකට යන්නට සජීවාගෙන් අව ගත් ඇය තුහංසට එය නොපැවසුවාය. ඇය නුවර ගියේ රෑ හා තියුම්ව දැක ගන්නට සිතාගෙනයි.

රහල් නොසිටියෙන් ඇය තියුම්ව හමුවී එදින සවස ෆෝඩයිස් බලා ගියාය. මාස ගනනාවකින් සිය පුතු දුටු සස්වින්දි මොහොතක් හෝ ඔහුව අත නොහැර ඔහු අසලම සිටියාය.

"තව මාස හතරයි... හැමදේකින්ම නිදහස් වෙලා මම එනවා" සස්වින්දි මනෝජ්ට කීවාය.

"මම නම හිතන්නේ නැහැ හංස ඔයාට එන්න දෙයි කියලා"

"එයා හැදිලා නැහැ... එයා අයිෂාදිව බඳින්න හිතාගෙන ඉන්නේ"

"අකමැති නම් මට කමක් නැහැ... මම කිව්වේ මේ පොඩි එකා ගැන හිතලා... මට හිතෙනවා ඔයාගේ දරදඬුකම අඩු කළොත් හංස හැදෙයි කියලා"

"මට එයාව හදා ගන්න ඕනේ නැහැ... මට එයාවත් ඕනේ නැහැ" සස්වින්දි හිතුවක්කාර ලෙස කීවාය.

"එහෙනම් මට මොකද" මනෝජ් ඉවත බලාගනිමින් කීවේය.

ඇතිකරගත් දබරයක් නිසාවෙන් තුහංස කූඩුවට දමද්දී සස්වින්දි සිටියේ ෆෝඩයිස් වලයි. ඇය ආපසු එද්දී තුහංසව බන්ධනාගාරයට යවා තිබුණේය.

"අනේ පුතේ... මම මේ ඔයා එනකල්ම තමා හිටියේ" සස්වින්දි නිවසට ඇතුළු වෙද්දී සජීවා කීවාය.

"ඇයි ආන්ටි"

"වෙනදට පුතා මොනා හරි ගෝරියක් කරගෙන උසාවියට දැම්මම ෂයි හරි පැටෝ හරි බේරගෙන එනවා"

"ඇයි හංස ගෝරියක් දාගෙනද"

"අනේ ඔව් පුතේ... අරුන් දෙන්නත් ඇතුළේ... ඇප දෙන්න මට හෙට උසාවි එන්න කිව්වා"

"ආන්ටි යන්න එපා"

"එතකොට..."

"එයාගේ මාමණ්ඩි බේරගයි"

"සුසිල් අයියා නුවර ගිහින්"

"එයිනේ... එනකල් හිටපු දෙන්" සජීවා කිසිත් නොකීවාය.

සස්වින්දි හිතුවක්කාරය. තම පුතාට දඬුවම් දෙන්නේ හිතුවක්කාර ලෙසය. එයින් ඔහු හැදෙන්නේද නැත. ඇයගේත් ඔහුගේත් මේ විරසක නිසා සිදුවන්නේ එකිනෙකා ඈත්වීම පමණී.... සජීවා ශෝකයෙන් සිතුවාය.

සුසිල් පැමිණීමට දිනක් තිබියදී උසාවියට ගිය සස්වින්දි තුහංසට පමණක් ඇප ලබා දී ආපසු පැමිණියේ තුහංස දෙසවත් නොබලා ඇය ගිය රථයෙනි. තුහංස නිවසට පැමිණියේ කෝපයෙන් කෑගසාගෙනයි.

"අම්මා... " ඔහු නිවස දෙදරවන්නට කෑගැසුවේය.

"මම සඳුදා එන්න කිව්වේ... අද සිකුරාදා" සජීවා සස්වින්දි දෙස බැලුවාය.

"මමයි අම්මට යන්න එපා කිව්වේ"

"ඇයි..."

"කසාද ගෑනි ඉද්දී අම්මා මොකටද යන්නේ"

"එහෙමද... එහෙනම් සඳුදා නාවේ... අද සිකුරාදා"

"ගෙදර හිටියා කියලත් කරන්නේ බිබී නිදියන එකනේ... කූඩුවේ ඉන්නකොට ඒකවත් අඩුවෙයි"

"මේ ගෑනියේ" තුහංස ඇය වෙතට පැන්නේය.

"හංස මේ... ඇය ළග තිබූ මල්පෝච්චියක් අතට ගත්තාය.

"ගහපන්... බැල්ලී... අම්මා දන්නවද... අරුන් දෙන්නට ඇප දෙන්න මම සඳුදට යන්න ඕනේ... මෙකි අන්තිම මොහොතේ ඇප දුන්නේ මට විතරයි"

"උන්ට ඇප දෙන්න උන් මගෙ මිතිහෝ නෙවෙයිනේ" සස්වින්දි කෝපයෙන් කීවේය.

ඇය වෙත පැන්න තුහංස ඇයට පහර කිහිපයක් ගැසුවේය. එය නොසිතුවක් නිසාවෙන් ඇයට කිසිවක් කර ගත නොහැකි විය. සජීවා කෑගැසුවද ඇයටද කිසිවක් කර ගත නොහැකි වූවාය.

රිදුම් දෙන කම්මුල් දෑතින් පිරිමැද ගනිමින් සස්වින්දි හඬා වැටුණේ වේදනාවට වඩා කෝපයටයි. ඉකිලමින් සුසුම් හෙලමින් ඇය නින්දට වැටුණාය.

තුහංසටත් රාත්‍රියේ නින්දක් නොවීය. මදක් මත්පැන් බී ඔහු සස්වින්දි කාමරයට ගියේ ඇයව බැලීමටයි.

යහනේ වාඩි වූ ඔහු ඇය දෙස මොහොතක් බලා සිටියේය. මේ වත සිප ගන්නට මේ ගතේ පහස විදින්ට තමා දැමූ දඟ කොතෙක්දැයි ඔහුට සිතිණි. අද ඇය තමාගේ නීතිමය අයිතියකි. එහෙත් අද ඇය තමාව ප්‍රතික්ෂප කරන්නේ කෲර ලෙසිනි. සස්වින්දි වෙතට නැමුණු ඔහු ඇයගේ වත මෘදුව කිහිප වතාවක් සිප ගෙන ඇයගේ පොරවනය සකසා සිය කාමරයට ගියේය.

මත් පැන් සැරෙන් කවුදැයි හඳුනාගත් සස්වින්දි දෑස් වසාගෙනම ඔහු පිටවී යන තුරු බලා සිටියාය.

එදා එලෙසින් සිප ගියද පසුදා සිට මත්පැණින් සප්පායම් වී සඟයින්ගේ කරෙන් නිවසට පැමිණි තුහංස සස්වින්දිට බැන වදින්නට වූවේය. සස්වින්දි එය ඉවසුවේ දින දෙක තුනක් පමණි.

පසුදා සිහිසුන්ව සඟයින්ගේ කරෙන් නිවසට ආ තුහංසව නිවසට ඇතුළු කර ගැනීමට සස්වින්දි ඉඩ නොදුන්නේය. ඇය දොර අසල සිට එය වැළකුවාය.

"අනේ පුතේ... සිහිය ආවම අපිට ඉන්න දෙයිද... කාමරේට අරන් ගියදෙන්" සජීවා කීවාය.

"ආන්ටි... එහෙනම් මම ගෙදර යන්නම්... කනක් ඇහිලා නිදියන්න නැහැ... වෙරිමතේ කියවනවා... මෙයාව දාන්න ගරාජ් එකේ ඇඳට" සස්වින්දි පැටෝට කීවාය.

ඇයට යමක් පවසා එලක් නොවන බව මේ වන විට දැන සිටි සජීවා නිහඬ වූවාය. පසු දින කුමක් සිදුවේ යැයි ඇය බිය වූවාය.

තුහංසව ගරාජයට දමන්නට යැයි පවසා නිවසට පැමිණියද ඇයට නින්දක් නම් නොවීය. රත්‍රියේ ඇද හැලුණු තද වර්ෂාව නිසාවෙන් ඇයගේ ඉවසීමද බිඳ වැටිණි. මහ වැස්සේ කළුවරේම ඇය තුහංස සොයා ගරාජයට ගියාය.

ඒ වන විටත් වෙරි මතින් නින්දේ සිටි තුහංස යහනේ සීතලට ගුලිවී සිටියේ කුඩාවෙකු විලසිනි. ඔහුගේ ඉරියව්ව දුටු සස්වින්දිට සිහි වූයේ තුහස්වයි. සැමියා නොව දරුවේ පියා වූ ඔහු ගැන දැනුණු හැඟීම කුමක් දැයි ඇය නොදත්තාය.

පෙර දිනයක තමාට පහරදී තමා සොයා ඔහු තම කාමරයට පැමිණ තමාව සිප ගියේ මෙවැනි හැඟීමකින් වන්නට ඇතැයි ඇයට සිතිණි.

"හංස... හංස..." කිහිප විටක් කතා කළද ඔහු සිටියේ තද නින්දකයි.

කාමරයට ගොස් පොරවනය රැගෙන පැමිණි ඇය තුහංසට එය පොරවා ඒ මොහොතට ඇති වූ හැඟීමක් නිසාවෙන් ඔහුට තුරුළුව ඔහු අසලින් වැතිරුණාය.

"ඔහොම ඉන්න" පාන්දර තුහංස අසලින් නැගි සිටි සස්වින්දිගේ සුරත අල්ලාගෙන තුහංස කීවේය.

"මෙහෙම ඉන්න බැහැනේ එළිය වැටෙන කොට"

"මටත් මෙහෙම ඉන්න බැහැනේ"

"ඔයත් එන්න එහෙනම්" සස්වින්දි කීවාය.

"කවුද මාව මෙතෙන්ට දැම්මේ... ගරාජ් එකට"

"මම... කනක් ඇහෙන්න නැහැනේ මට... බීගෙන ඇවිත් බනින කොට"

"බැණුම් නාහන්න මෙතෙන්ට දාලා මෙතෙන්ටම ආවේ ළඟටම බැණුම් අහ ගන්නද"

"වහින කොට පව් කියලා හිතුණා... ඒකයි ආවේ... සීතලේ වකුටුවෙලා ඉන්න තාලේ දැක්කම... ඇය නතර කළාය.

තුහස් මතක් වුණා... කිය වෙන්නට ගිය වදන ඇය ගිල ගත්තාය.

"ඔව්... සීතලේ වකුටුවෙලා ඉන්න තාලේ දැක්කම... "

"රෙද්දක් පොරවන්න හිතුණා"

"රෙද්ද පොරවන කොට... මොනාද හිතුණේ" තුහංස සිනාසෙමින් ඇසුවේය. සස්වින්දි රතු වූවාය.

"ඔයාට නින්ද ගිහින්නේ හිටියේ හංස"

"ඔව්... එහෙම තමයි... ඒත් අවයව සංවේදීයි... පටස් ගාලා ප්‍රතිචාර දක්වනවා"

"චීයා... පුරුද්දට වෙන්න ඇති"

"හ්ම්... උපාසකයා බංගලාවට අරන් ගිය ගෑනු ගණන සීතා කියන්න ඇතිනේ" සස්වින්දි සිනාසුණාය.

"යමු... එළිවෙන්න ඉස්සර"

"මම හොර ගෑනියක් වගේනේ"

"ඔයානේ එහෙම කර ගත්තේ"

"ඔයා මාව රිද්දනවා කේන්ති කරනවා හංස"

"ඔයා නැද්ද"

"මා...ත්... එහෙම තමයි..."

"එහෙනම් කට වහගෙන ඉන්න"

"එන්න මගේ කාමරේට" සස්වින්දි ඇයගේ කාමරයට යාමට සූදානම් වෙද්දී තුහංස කීවේය.

"බැහැ... ආන්ටි හිතයි මම ඔයාගේ කාමරේට ගියා කියලා... ඒ නිසා එන්න ඔයා මගේ කාමරේට"

"එතකොට අම්මා හිතයි මම ඔයාගේ කාමරේට රිංගුවා කියලා... තමුසේ ඕකට යනවා... මම මේකට යන්නම්"

"ආ... ඒක හොඳයි" සස්වින්දි කාමරයට ගොස් දොර වසා ගැනීමට සූදානම් වූවාය.

"උදේටම යනවා..." තුහංස එය වළකා කාමරයට ආවේය. සස්වින්ටදි සිනහා නැගිණි.

"වැඩ වරද්ද ගත්තනම් කරනවා ..." "මගේ හැටි" කියූ තුහංසද සිනාසෙමින් දොර වසා දැමුවේ

හැල හැප්පීම් නැතිව ගෙවී ගියේ දින කිහිපයක් තුහංස සස්වින්දිගේ කාමරයේ රාත්‍රිය ගත කරන බව රහසක් නොවීය. ඇයට දැනුණු සතුට අපමණය.

"ඉක්මනට දරුවෙක් හදා ගන්න පුතේ... මේ ඔක්කෝටම විසඳුම ඒක වෙයි" ඇය කීවාය.

හංසටයි මටයි දරුවෙක් දැනටමත් ඉන්නවා කිය ඔයාට කියන්න හිතෙනවා... හංස වගේම හැඩරුව තිය දැක්කම ඔයාට මොනවා හිතෙයිද... හංසගේ පුංචි පින්තූරේ දකින දකින සැරේට මගේ කොල්ලා මට ම- ආන්ටී... සස්වින්දි මුමුණා ගත්තාය.

හංස ගැන මට තවම විශ්වාසයක් නැහැ... දවසක් ළං වෙලා හිටියට එයා එක මොහොතට වෙනස් කියන්න මම දන්නවා... ඒ නිසා මට තුහස් ගැන එයාට බයයි... සස්වින්දි සිතුවාය.

දිනක් සුසිල් තුහංස හොයාගෙන ඔහුගේ කාමරයට පුරුද්දට යද්දී තුහංස එහි නොසිටියේය. නිදා සිටි නැඟිට පැමිණියේ සස්වින්දිගේ කාමරයේ සිටයි.

සුසිල් එයින් බොහෝ තැති ගත්තේ ඔවුන් අත සම්බන්ධයක් ගොඩ නැගුණ හොත් දික්කසාදය සිහින දැන සිටි නිසයි. ඔහු පසුදාම අයිෂාදි ලංකාවට ගැනීමට කටයුතු සැලැස්සුවේය.

"ඔන්න අපේ දුවත් හදිස්සියේම ලංකාවට ආව" නිවසට පැමිණි දිනෙක කීවේය. සස්වින්දි බැලුවේ දෙසයි. ඔහු කෑම කමින් සිටියේය.

"පුතාට කතා කළා කිව්වා නේද"

"ඔව් අංකල්... අංකල්ට කිව්වේ නැද්ද මමයි එයාව එකෙන් ගත්තේ" සස්වින්දිට තවත් බත් කටක් ග ගැනීමට නොහැකිවිය.

"ආ... මම ඒත් බැලුවා මට කතා නොකළේ ඇයි කියලා... ගෙදරට ඇවිත් තමා කිව්වේ මම ගෙදර කියලා... බනියි කියලා හිතාගෙන වෙන්න ඇති" තම සැලසුම් සියල්ල සඟවාගෙන ඔහු කීවේය. තුහංසට කතා කොට තමා නිවසට ඇරලන ලෙස කියන්නට අයිෂාදි පෙළඹුවේ ඔහුයි.

"ඇයි... බනින්නේ" සජීවා ඇසුවාය.

"හදිස්සියේම එන කොට... තව එක්සෑම් ඉවර නැහැනේ"

"එහෙනම් ආවේ"

"අනේ මන්දා... එන්නම ඕනේ කිව්වා... හංසි මෙහෙ ඉන්නේ කියලා දන්න නිසා ඒ ගැන බය වෙන්න ඇති"

"ඇයි මම ගැන එයා බය වෙන්නේ" සස්වින්දි ඇසුවාය.

" නැහැ ඉතින්... ඔයාව ඩිවෝස් කරලා එයාව බඳිනවා කියලනේ හංස ඔයාව බැන්දේ... තවත් මාස හයක් කෙල්ල ඉවසුවා... දැන් මාස හයත් ඉවර වෙන්න ළඟයිනේ" සස්වින්දි බැලුවේ තුහංස දෙසයි. ඔහු කිසිත් නොකියා කෑම මේසයෙන් නැඟිට්ටේය.

"සුසිල් අයියා... තවත් මේ කාසදේ ගැන හිතන්න එපා... හංස හංසිව අත අරියි කියලා මම හිතන්නේ නැහැ" සස්වින්දි කෑම මේසයෙන් නැඟී සිටිද්දී සජීවා කීවාය.

"එහෙම කියලා බැහැ සජීවා... මගේ සල්ලි කෝටි ගානක් මේ කම්පැනියට මම යට කළේ මේ කසාදේ නිසා"

"ඒවා හිමීට බේරුමක් කර ගමු" සජීවා පවසනවා ඉවත යන සස්වින්දි ඇසිණි.

"හංස..." සස්වින්දි හංසගේ කාමරයට ගියාය.

"දැන් ආවද ඒ කසාදේ ගැන අහගෙන... එහෙම නැත්නම් බබෙක් හම්බ වෙන්න ඉන්නේ කියාගෙන" සස්වින්දි පුදුමයෙන් ඔහු දෙස බැලුවාය.

ඇත්තේම ඇගේ වූ වෙනස කුමක්ද යන්න සස්වින්දි අත්දැකීමෙන් දනී. සජීවා පැවසූ දේ හිතට ගත් සස්වින්දි තුහස්

ගැන තුහංසගේ හැඟීමත් වටහා ගැනීමට දරුවෙකු සිටියේ නම් හැකිවේයැයි සිතුවාය. එනිසා ඇය පරිස්සම ගැන නොසිතුවාය.

"ඒ කියන්නේ ඔයාට තේරුණාද මට බබෙක් හම්බ වෙන්න ඉන්නවා කියලා"

"එහෙම මඟුලක් මම දන්නේ නැහැ... ඔයාගේ සෙල්ලම් ගැන මම හොඳට දන්නවා... ඒකයි කිව්වේ"

"සෙල්ලම්... මොනවද"

"ඇයි කලින් සැරේ මම බඳිනවා කියද්දී ප්‍රෙග්නන්ට් කියාගෙන නැටුවේ... මේ සැරේට ඒ පොයින්ට් එක හරි නැහැ... වෙන එකක් ගේනවා" සස්වින්දි නිහඬ වූවාය.

එසේ නම් සිදු වූයේ තමා තවත් වතාවකට අමාරුවේ වැටීම පමණක්ද... දෙයියනේ... ආයෙත් දරුවෙක් හදාගෙන මම තාත්ති ළඟට යන්නේ කොහොමද... සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"මතක තියා ගන්නවා... නිකන් ආවට ගියාට දරුවෝ ගැන කියන්න එන්න එපා... මගේ හංස පැටියෙක් කෝටි ගානක් වටිනවා" තුහංස සස්වින්දි ඔහු වෙතට ඇද ගනිමින් කීවේය.

"ඒ හංස පැටියා ඇවිල්ලා හංස" සස්වින්දි ඔහුගේ ළයේ හිස තබා ගනිමින් කීවාය.

"විකාර කියවන්න එපා හංසී... ඔයා ඒකට උත්සහ කරන්නත් එපා... මේ ඒකට වෙලාව නෙවෙයි... අමාරුවේ වැටෙන්නේ ඔයාමයි" ඔහු ඇයව ඉවත් කරමින් කීවේය.

"ඇ..ඇයි හංස... ඇයි ඔයා එහෙම කියන්නේ"

"මේ කාසදේ දිගටම තියා ගන්නවද නැද්ද කියලා මම තවම තීරණය කරලා නැහැ... අනික මතක තියා ගන්න... මම හිතා මතාම බොහොම පරිස්සම් වුණා"

"මො...ක..ක්"

"ඔව්... එහෙම නොවෙන්න"

"අනෙ මේ... සිහියෙන්නේ ළඟට එන්නේ... කණාමදයා වගේ බීගෙන අසිහියෙන් නටන ඔයාගේ පරිස්සම" සස්වින්දි පවසුවේ කෝපයෙනි.

"මාසෙකට සැරයක් මට නොකියා නුවර පැත්තේ රවුම් ගහලා එනවා කියන්න මම නොදන්නවා කියලා හිතන්න එපා" තුහංස පවසද්දී සස්වින්දි ගොළු වූවාය. තමා කෙසේ හෝ මසකට වතාවක් සජීවාට දන්වා ෆෝඩයිස් ගියේ තුහස් නොබලා සිටීමට නොහැකි වූ නිසායි.

"අනික හංසී... රහල්ගේ කෙල්ලගේ නම 'සස්වී... ඇහුව්වේ නැති වුණාට මට එහෙම සැකේකුත් තියනවා... තියුමි රහල් ළඟට ගියේ කොහොමද... කෝ ඒ සස්වී..."

"හං...ස... තියුමි කියන්නෙ දැන් රහල්ගේ ගර්ල්... සස්වී කෙනෙක් මම දන්නේ නැහැ" සස්වින්දි කෑගැසුවාය.

"කට වහ ගන්නවා... තමුසේ ඇයි කෑ ගහන්නේ... තියුමි එක්ක රහල්ගේ සම්බන්ධයක් නැහැ කියලා මම හොඳටම දන්නවා... රහලා මගේ පුංචි කාලේ ඉඳලා ෆ්‍රෙන්ඩා... ඌ ගැන මම විතර කවුද දන්නේ"

"අපරාධ කරනවා මදිවට අපරාධ කතාත් කියනවා"

"තමුසේ ගැන රහලා හරි හරියට දැන් මට උපදෙස් දෙනවා... මෙච්චර කාලයක් නැති කැක්කුමක් ඌට ආවේ කොහොමද" සස්වින්දිට තවත් ඉවසා සිටිය නොහැකි විය.

"තමුසේ මහ අසික්කිත මිනිහෙක් හංස... ඒ ගැන දන්න එයාට... මම ගැන කැක්කුමයි තමයි... අදත් එයා මම ගැන හිතලා විඳවනවා... මගේ පව්කාර කමට දුක් වෙනවා" තුහංස වහා සස්වින්දිගේ බාහුවලින් තද කර අල්ලා ගත්තේය.

"එතකොට... ඒ සස්වී තමුසේ..."

"ඔව්... මම තමයි... මමයි රහලුයි යාළු වෙලා හිටියේ... තමුසේ මාව ඉස්සුවා... මට රහල්ව නැති වුණා" සස්වින්දි ඉකිබින්දාය.

"දෙයියෙක් වගේ මනුස්සයෙක් එයා..."

"තමුසේ දැන් ඒ දෙයියා හොයාගෙන යනවා

"කට තිබුණ පළියට පච් කතා කියන්න එපා හංස"

"ඒ කතා පච් කතාද කොහොම කතාද කියලා මම උඹව හම්බවෙලාම දැන ගන්නම්"

"අනේ දෙයියිනේ... ඒ මනුස්සයා මම නිසා විඳවන තරම ඇති... තවත් කරදර දෙන්න එපා... ප්ලීස් හංස"

"හරි... එහෙනම් තමුසෙත්... මමයි අයිෂාදියි ගැන කතා කරන්න එපා" තුහංස ඇයගේ බාහු අත හැර දැම්මේය. එය රිදුම් දෙද්දී ඇය ඒවා පිරිමැද ගත්තාය.

"තවත් එකක්... පරිස්සම් වෙනවා... ආය මම කියන්නේ නැහැ ඒ ගැන" ඔහු දබරඟිල්ල ලෙලවා කීවේය.

දැන් පරිස්සම ඇලියාවට ගිහින් හංස... දැන් ඒ ගැන කියලා අර රත්තරන් මනුස්සයාට තවත් අපහාස දෙන්න බැහැ... සස්වින්දි මුමුණා ගත්තේ හදවතිනි.

ගත වූයේ සුළු කාලයකි. සස්වින්දි තමා ගැබිණියක් බව සියල්ලගෙන් හැංගුවාය. තුහංස සමඟ එකට සිටියද ඇය ඔහු සමඟ කෝප ගත්තේ හෝ දබර කර ගත්තේ නැත.

තියුමි සස්වින්දි ඇමතුවේ ඇය නිවසේ සිටින මොහොතකයි.

"ඇයි තියුමි"

"අක්කී... පුලුවන් නම් ඔයා අද නුවර එන්න"

"හංස අයියගෙන් මට ප්‍රශ්න තියුමී... එයාට මාව සැකයි... ඒ නිසා මම කොහෙවත් නොයන්න හිතුවා... ඇයි හදිස්සියේ"

"මේ අහලා ඔයා කලබල වෙන්න එපා"

"අනේ... ඇයි"

"ඔය ඉතින්..."

"කියන්න තියුමි ඇයි"

"හංස අයියයි රහල් අයියයි අද ගහ ගත්තා"

"මොනවා..."

"ඔව් අක්කී... ඔයා නිසා"

"අනේ සමන් දෙවියනේ..." සස්වින්දි වැළපුනාය.

"හංස අයියා උදේ ආවා කැම්පස් එකට... මාත් හිටියා... ඔයා ගැන අහලා කියව ගත්තා... ඔයාට එයා බනින කොට රහල් අයියට තරහා ගියා"

"ඔයාට නවත්ත ගන්න බැරි වුණාද"

"බැරි වුණා අක්කී... රහල් අයියා කිව්වා... ඒකි මගේ පණ... උඹ ඒකි ගත්තා... යාළුවා නිසා ඉවසුවා කියලා... ඒකට හංස අයියට තවත් තරහා ගියා... හංස අයියා කිව්වා මම ඕකිව මරණවා කියලා" සස්වින්දි සුසුමක් හෙලුවාය.

"රහල් අයියා නිකා හිටියේ නැහැ... මට ඒකි වෙනුවෙන් මගේ පණත් දෙන්න පුළුවන්... ඒකිව මරන්න මම උඹව තියන්නේ නැහැ කියලා රහල් අයියා හංස අයියට ගැහුව්වා... දෙන්නා හොඳටම ගහ ගත්තා... නතර කරන්න කාටවත් බැරු වුණා"

"අනේ..."

"ට්‍රැෆික් පොලිසියේ දෙන්නෙක් ඇවිත් බොහොම අමාරුවෙන් තමයි දෙන්නව වෙන් කළේ... දෙන්නම ඉස්පිරිතාලේ... මම ඉන්නේ රහල් අයියා ළඟ... එයාට අමාරුයි"

"හංස අයියා... එයාට කොහොමද"

"මම දන්නේ නැහැ... මම බැලුවේ නැහැ"

"අනේ තියුමි... යන්න ඔයා... ගිහින් බලන්න හංස අයියව... එයාටත් අමාරු ඇති" සස්වින්දි හඬමින් කීවාය.

"මට කියන්න එපා... මට තරහයි එයා එක්ක"

"අනේ... තියුමි ප්ලීස්... යන්න... ගිහින් එයාව බලන්න"

"ඔයාට පිස්සුද... ඔයාට මෙච්චර දේවල් කළ මිනිහව... අනික ඔයා මරණවා කිව්ව මිනිහව... එයාවද බලන්න යන්න කියන්නේ"

"ඔව්... එයා ගාව කවුරුවත් නැතුව ඇති... යන්න තියුමි ප්ලීස්" තියුමි නිහඬ විය.

"හංස අයියා මාව මරණවා කිව්වා විතරක් නෙවෙයි නංගා... මාව මරන්නත් ගියා... ඒ මොනවා වුණත් හංස අයියා කියන්නේ මගේ මහත්තයා... දරුවාගේ තාත්තා"

"නල්ල මලේ තාත්තා... එයා දන්නවද එයාට දරුවෙක් ඉන්නව කියලවත්"

"ඒකට කමක් නැහැ... ඒ දරුවගේ ඇගේ දුවන ලේ අයිති එයාට... ඒක වෙනස් වෙන්නේ නැහැ... වෙනස් කරන්නත් බැහැ... තියුමි... මම දැන් එනවා... එනකල් ඔයා ගිහින් එයාව බලලා එන්න"

සස්වින්දි වහා සජීවාවද සූදානම් කර ගෙන පිටත් වූවාය. අඩ හෝරාවකට පසු නැවතත් තියුමි කතා කළාය.

"තියුමි ගියාද හංස අයියා බලන්න" ඇය දුරකථනයට සම්බන්ධ වූ මොහොතේම සස්වින්දි ඇසුවාය.

"ඔයා නටාගෙන එන්න ඕනේ නැහැ එයාව බලන්න... මට බල කළ නිසා ගියේ කවුරුවත් නැහැ කියලා... නැන්දම්මලා වෙන්ට වයිෆ්ලා ඔක්කොම වටකර ගෙන සලකන්නේ... එයාට අඩුවක් නැහැ" තියුමි කෝපයෙන් පවසා දුරකථනය වසා දැමුවාය. කවුරු කොහොම සැලකුවත් මගේ දරුවන්ගේ තාත්තව බලන්න මම එනවා හංස... සස්වින්දි මුමුණා ගත්තාය.

සස්වින්දි තුහංස බැලීමට ගිය මොහොතේ අයිෂාදි එතැන රැඳී සිටියේ නැත. ඇයගේ සොයුරියක් හා මව පමණක් සිටියෝය. තුහංස සස්වින්දි දුටු මොහොතේම ඇය දෙස නොබලා ඉවත බලා ගත්තේය. සස්වින්දි ඇයගේ යුතුකම් සියල්ල නොපිරිහෙලා ඉටු කළේ නිහඬවයි.

"අපි මෙයාව ප්‍රයිවට් ඉස්පිරිතාලෙකට ගෙනියමු නේද... මෙතන තියන්නේ කොහොමද" අයිෂාදිගේ සොයුරිය සජීවාගෙන් ඇසුවාය.

"එයා මෙතන හිටපුදෙන්" සජීවා පිළිතුරක් දීමට පෙරම සස්වින්දි වහා කීවාය.

"නංගී... මෙතන පහසුකම් අඩුයිනේ... අනික හිතෙන වෙලාවට බලන්නත් බැහැ" එවර අයිෂාදිගේ මව සජීවාට කීවාය.

"පුතේ... එහෙම හොඳයි නේද" සජීවා සස්වින්දිගෙන් ඇසුවාය.

"ආන්ටි මේ... හංස මගේ මහත්තයා මිසක් ලොකේ එවුන්ගේ නෙවෙයි... එයා මෙතන ඉදියි... ඒක මගේ තීරණයක්" සස්වින්දි පැවසුවේ කෝපයෙනි.

"අපි හංස පුතා ඇහැරුණාම එයාගෙන් අහමු" අයිෂාදිගේ මව සෙමින් කීවත් එය සස්වින්දිට ඇසිණි. තුහංස ඒ වන විට සිටියේ නින්දකයි.

"හලෝව්... මේ... ඔයාගේ දුව හංසට දුන්න දවසට බැනව ගෙනියලා ප්‍රයිවට් හොස්පිට්ල් නෙවෙයි අහසේ තියා ගත්තත් මට කමක් නැහැ... එතකල් සෙල්ලම් බැහැ... කරුණා කරලා යනවා යන්න... මම පොලිසිය ගේන්න ඉස්සෙල්ලා" සස්වින්දිගේ හඬ වේගවත් විය.

"නංගී..." අයිෂාදිගේ මව සජීවා දෙස බැලුවාය.

"හංසි කියන දෙයක් තමයි අක්කේ... සොරි" දියණියගේ සුරතින් අල්ලාගත් අයිෂාදිගේ මව මොහොතක්වත් එතැන නොරැඳී ඉවත ගියේ සස්වින්දිට බැන වදිමිණි.

ආපසු එන ගමනේදී සජීවා සමඟ සස්වින්දි රහල්ද බැලීමට ගියාය. සස්වින්දි හඬා වැටෙමින් රහල්ගෙන් ඉල්ලා සිටියේ තුහංස සමඟ පැටලීමට නොයන ලෙසයි.

"අවුරුදු ගානක් මම ඔයා එක්ක යාළු වෙලා හිටියා රහල්... මේ අවුරුදු ගානටම මම ඔයාගෙන් කිසිම දෙයක් මම වෙනුවෙන් ඉල්ලලා නැහැ" සස්වින්දි රහල්ගේ සුරත මත අත තබමින් කීවාය. රහල් ඔහුගේ අත ඇයගේ සුරත මත තැබුවාය.

"මට ආදරේ නම්... මම ගැන හිතනවනම්... ඔයා මගෙන් ඈතට යන්න රහල්... මම මැරුනා කියලා හිතාගෙන ඉන්න" සස්වින්දි ඉකි ගැසුවාය. රහල් ඇයගේ හිස අත ගෑවේය. සජීවා අරමුණකින් තොරව ඔවුන් දෙස බලා සිටියාය.

ඔයාගෙන් අයින් වුණේ හංස මාව ...
ඉදලා මම තියුම්ව ඔයාගේ හෙවනැල්ල...
ලොකු සැනසීමක් දැනුණා... ඒ සැනසීම ...
රහල්... ප්ලීස්... මට ආදරේ නම් ඒ සැනසී...
ජීවත් වෙන්න පුළුවන්" සස්වින්දි ඉකිබිඳිමි...

"අඬන්න එපා සස්වී... සොරි... මට ...
හංසයට ගැහුව්වේ... එයාට කොහොමද"

"ඉන්නවා... තැලුම් පාරවල් ටිකක් තිය...

"ඔයාගේ මහත්තයට මම ගැහුව්වා ...
අමනාප වෙන්න එපා... මම ගැහුව්වේ ...
ඔයාගේ මහත්තයට නෙවෙයි" සස්වින්දි කි...

"ආන්ටි... සස්විව පරිස්සමට එක්ක ය...
ඒත්... මගේ ජීවිතේ" රහල් දෑසට කඳුළු පුරා...

"මගේ පුතාව හදා ගන්න මට බැරි වු...
හැමදේටම හේතුව"

"ඒක අපි කාටවත් හංසයාව හදා ...
යාළුවන්ට ගුරුවරුන්ට... ඒත් මම දන්න...
එයාට දැනුන දවසට... එයා ආදරේ අඳු...
හැදෙයි" රහල් සස්වින්දි දෙසම බලාගෙන...

"සමහරවිට ඒ වෙන කොට සස්වී ...
ගිහින් ඉදියි... එදාට එයාට පසු තැවිල්ල ...
පුළුවන් නම් ඒක එයාට තේරුම් කරලා ...
ආන්ටී... ඇත්තටම හංසයා මගේ හොඳ...
ආදරෙයි" රහල් කීවේය.

ඔයා මොන කෙනෙක්ද රහල්... මම...
දේවල් කරලත් ඔයා හිතන්නේ අපි ගැන...
මුමුණා ගත්තාය. එන ගමනේදී සස්වින්දි
ගැන සියල්ල සජීවාට කීවාය.

පසුදා තුහංසව බැලීමට ගිය
සස්වින්දිගේ ඇඟට කඩා පැන්නේ සිටින්...

අමතක කර දමායි.

"මොනවද තමුසේ ඊයේ කළේ"

"මොනවද"

"අර මිනිස්සුන්ට බැනලා එලවා ගත්තේ... සුසිල් අංකල් මට කෝල් කළා... අම්මත් බලාගෙන හිටියලු"

"ඔව්... ආන්ටි බලාගෙන ඉන්නවා ඇරෙන්න මොනවා කරන්නද... තීරණ මගේනේ"

"තමුසේ කොහොමද එහෙම තීරණ ගන්නේ"

"තමුසේ කොහොමද එහෙම කියන්නේ... මතක තියා ගන්නවා හංස... මම තාම තමුන්ගේ වයිෆ්... ඒක නැති වුණ දවසට තමුසේ ඕනේ දෙයක් කර ගන්නවා"

"ඉක්මනටම ඒක නැති වෙයි"

"ඒක නැති වෙයිද ඇති වෙයිද කියලා තීරණේ තියෙන්නේ මගේ අතේ... අනික මතක තියා ගන්නවා... කෝටිය තියෙන්නෙත් මගේ අතේ... ඒක අමතක නොකර තමුසෙයි තමුසෙගේ වෙන්ට ඉන්න ගෑනියි නටනවා"

"හංසී..." තුහංස කෑගසද්දී අවට සිටියවුණුත් බැලුවෝය. සස්වින්දි බිම බලාගෙන එතැනින් ඉවත් වූයේ ලැජ්ජාවටයි.

# 09

මාස හය ඉක්ම වූ තැන මුදල් ගිණුම් ගත කර ගෙන සස්වින්දි ආපසු තුහංසගේ නිවසට ආවේ ඇයගේ දේවල් රැගෙන යාමටයි.

ඇඳුම් කිහියක් සමඟ තුහංසගේ පින්තූරයක්ද සස්වින්දි බෑගයේ දමා ගනු තුහංස බලා සිටියේය. ඇය පැමිණ සජීවාගේ සීතාගේ දෙපා වැන්දාය. සජීවාත් සීතාත් හඬින් හඬා වැටුණෝය.

ගැහුවාය. ඇයගේ බාහුවලින් අල්ලා ඇයව නැගිට්වූ
හංස ඇයව සිප ගත්තේය.

"ඩිවෝස් එක එනකල් ඔයාට මේ ගෙදර අයිතිය තියෙන... හංසි... මම ඔයාට යන්න කිව්වේ නැහැ... අනික මම ඔය... ඩිවෝස් කරනවා කිව්වෙත් නැහැ"

"අද නොකීවට ඒ කතාව ඔයා මට හැමදාම කියන කත... නේද හංස... ගුටි කාලා ලොකේ හිනස්සවලා තියන මෙව... තවත් වැඩි කරගෙන අපි වෙන් වෙනවට වඩා මේ ... හොඳයි නේද"

"ඔයාගේ කැමැත්තක්... මම සිතාසි එවන්නම්... ඔයා ළ... එන්න"

"මම මෙහෙ ගෙදර ඉන්නවා ඩිවෝස් එක එනක... ගියොත් යන්නේ ඊට පස්සේ"

"ඉන්න මම ඇරලවන්න" සස්වින්දි හිස සෙලවූවාය.

"අනේ ඇයි දෙවියනේ ඔය දෙන්නට ඔය විදිහට හැම... ඉන්න බැරි" සජීවා හඬා වැටුණාය.

"දෙන්නෙක් එකතු වෙන්න ඒ දෙන්නා අතර බැඳීමක්... කර ගන්න ගැනියෙකුටයි මිනිහෙකුටයි පුළුවන් ආත්ථි... ඒ... බැඳීම රඳා පවත්ව ගන්න ආදරේ ඕනි... ආදරේ හඳුනා... නැති ආදරේ කරන්න දන්නේ නැති දෙන්නෙක් අතර බැ... ඇති වුණාට ඒ බැඳීම පවත්වාගෙන යන්න බැහැ" තු... නිහඬව ඉවත බලා සිටියේය.

"මම ආදරේ කළේ රහල්ට... ඒක ආත්මීය බැඳීමක්... මගේ ජීවිතේට ආ දාම මම හැමදේම අමතක ... මොහොතක් මොහොතක් ගානේ උත්සහ කළා හංසට ... කරන්න... ඒ වගේම මම එයාට ආදරේ කළා" සස්වින්දි හු... හෙලුවාය.

"මම ආය මෙහෙට ආවේ හංස ගැන තිබුණ තරහව අ... කරලා එයා ගැන ඇති වුණ ආදරණීය හැඟීමකින්... ඒ... හිතේ මගේ ගැන පුංචිම පුංචි ආදරයක් හරි ඇති කියලා හි...

ඒ පුංචිම පුංචි ආදරේ වෙනුවෙන් " සස්වින්දි තුහංස දෙස බැලුවාය. දෑස් ගැටෙද්දී තුහංස ඉවත බලා ගත්තාය.

"ඒත් මම දූවලා තියෙන්නේ මිරිගුවක් පස්සේ කියන එක ඇවිල්ලා පැය ගානක් යන්න ඉස්සරම මම දැන ගත්තා... මගේ ආදරේට පුංචි හරි රැකුලක් තිබුන නම් මට ඒ ආදරේ ගොඩ නගා ගන්න තිබුණා ආන්ටි"

"යනවනම් යමුද මට වෙලා යනවා" තුහංසගේ ඇසුරුද කෝපය නැගී ආවේය.

"ආන්ටි තවත් මට කියන්නේ ඉන්න කියලද"

"ගිහින් එන්න රත්තරන්... බුදු සරණයි... පුළුවන් කමක් තියනවනම් මේ අසරණිව බලන්න එන්න රජී අංකල් වෙනුවෙන්"

"මම එනවා ආන්ටි... අනිවාර්යෙයෙන් එනවා"

"මතෝ මට සාප කරයි..."

"අනේ නැහැ... මම මේ තීරණේ ගත්තේ තාත්තිගෙන් අහලා... එයා කිව්ව විදිහට"

සස්වින්දි නිවසින් පිටව යාමට පය තබද්දී ඇයගේ කකුල පැටලී ඇයව වැටෙන්නට ගියාය. තුහංස වහා ඇයව ලයට තුරුළු කර ගත්තේය. තුහංසගේ කමිස බොත්තමේ කෙහෙ රැළි පැටලී පැටලුම් අරින්නට බොහෝ වේලාවක් ගත විය.

"අනේ රිදෙනවා හංස"

"ඉන්නව දඟලන්නේ නැතුව... දඟලනකොට තවත් පැටලෙනවා"

"මොනවද" සස්වින්දි සිනහවකින් ඇසුවාය. තුහංස ඇය දෙස බැලුවේය. ඔහුගේ දෙතොල ඇයගේ වතේ තැබෙද්දී ඇසුනේ සුසිල්ගේ හඬයි.

"ඇයි පුතා"

"මේ... කොණ්ඩෙ පැටලිලා ෂර්ට බොත්තමේ... දැන් හරි" තුහංස සස්වින්දිගෙන් ඉවත් වූවේය.

"පුතා කොහේ හරි යන්නද" සුසිල් ඇසුවේය.

"මම හංසිව ගෙදරට දාන්න"

"යමු... මාත් එන්නම්" සුසිල් පෙරමුණ ගත්තේය. ඔහු රථයේ ඉදිරිපසට ගොඩ වෙද්දී සස්වින්දි පසු පසට ගොඩ වූවාය. දෛවය තවත් එක්වන්නට තිබූ අවස්ථාවක් මග හැරිය බව සස්වින්දිවත් තුහංසවත් දැන සිටියේ නැත.

සුසිල් පසුදා සිටම තුහංස පසු පසම විය. බොහෝ මවා පෑම් කරමින් ඔහු තුහංස කාර්ය බහුල කළේ සස්වින්දි අමතක කරවා දැමීමටයි. උසාවි තීන්දුව ලැබෙන තුරු ඔහු තුහංසව අත හැරියේ නැත.

මාස ගානක කෙටි කාලයකදී සස්වින්දිටත් තුහංසටත් විවාහ අවලංගු කිරීමේ තීන්දුව ලැබිණි. තීන්දුව ගෙන අධිකරණ ශාලාවෙන් පිටව එද්දී ඇය ඉදිරියට පැමිණියේ අයිෂාදියි.

"සස්වි නංගී... ඔයා" ඇය පුදුමයෙන් සස්වින්දිගේ දෑතින්ම අල්ලා ගත්තාය.

"ඔයා මටත් මම ඔයාටත් කළේ වරදක් කියලා මම හිතන්නේ නැහැ අයිෂාදි අක්කේ... මගේ හංස අද ඉඳලා ඔයාට බාරයි... ඔයා එයාව හදා ගන්න... ආදරෙන් බලා ගන්න" ඇයට වචනයක් හෝ පැවසීමට ඉඩ නොතැබූ සස්වින්දි මොහොතක් හෝ එතැන නොරැඳී දිව ගියාය. දෑස් විසල් කළ අයිෂාදි පුදුමයෙන් සජීවා සුසිල් මෙන්ම තුහංස දෙසද බැලුවාය.

"ඔයා එයාව දන්නවද දුව" සුසිල් ඇසුවේය.

"ඔව්... ඇයි අප්පච්චිට මතක නැද්ද... ඒ අපේ හෙඩ් රිෆෙට්"

"හංසි... ඔයාලගේ හෙඩ් රිෆෙට්..." තුහංස පුදුමයෙන් ඇසුවේය.

"හංසි..." අයිෂාදි දෑස් කුඩා කළාය.

"නැහැ... නැහැ... සස්වි... සස්වින්දි" තුහංස කීවේය.

"ඔව්... තර්ටීන් ක්ලාස් එකේ අපි හතර පස් දෙනෙක්ම රිෆෙට් බෝඩ් එකේ ඉද්දී ට්වුවෙල් ක්ලාස් එකේ හිටපු එයාටයි

හෙඩ් රිගෙට්කම හම්බ වුණේ... මාර බ්‍රයිට් ගර්ල් කෙනෙක් එයා... ෂුවර් කැම්පස් යන්න ඇති " තුහංස ඇවිලී ගියේය.

"ඒක තමයි මම එදා එයාව දැක්ක දවසෙම දැකලා පුරුදුයි කිව්වේ"

"අප්පච්චිට ඉතින් උදේ දවල් පේන්න අපේ ගෙදර පින්තූරයක් තියනවනේ" අයිෂාදි කීවාය.

"හංසි කෑගල්ලේ නේද ඉස්සකෝලේ ගියේ"

"නැහැ... ඒ නංගී හයේ ඉදලා අපේ ඉස්කෝලේ හොස්ටල් එකේ හිටියේ... ඒ ලෙවල් වලට බූවැලිකඩ බෝඩිමක ඉදලා ආවේ"

රහල්ගේ නිවස... ඔහුගේ නැන්දනියගේ බෝඩිම... එසේ නම් රහල්ගේත් ඇයගේත් පෙම බොහෝ පැරැණි්නක් විය යුතුය. තුහංසට සිතිණි.

"ඒත් එයා ඇයි මගේ හංසව බලා ගන්න කිව්වේ... හදාගන්න කිව්වේ" අයිෂාදි තුහංසගෙන් ඇසුවාය. වරක් ඇය දෙස බැලූ තුහංස ඉවත ගියේ නිහඬවයි.

"අපේ පුතා බැදලා හිටියේ එයාව තමයි" සජීවා පවසනවා ඉවත යන තුහංසට ඇසුණේය.

"ඒ නිසා තමයි සස්වි නංගිගෙන් හංස ගැන අහනකොට එයා මට මොනවත්ම නොකියා හිටියේ... ෆෝන් එක ඕෆ් කළා වෙන්න ඇති... මගේ මැසේජ් එකට උත්තර එව්වේත් නැහැ"

ඔයා අයිෂාදි අක්කිව බඳිනවනම් එයාට වරදක් කරන්න එපා හංස... තමන්ගේ සැමියගේ ආදරේ තරම් වටින දෙයක් බිරිඳකට නැහැ... එදා ඇය පැවසුවේ සියල්ල දැන ගෙන අයිෂාදිට මොනවත් නොකියා නේද... මගේ හංස අද ඉදලා ඔයාට බාරයි... ඔයා එයාව හදා ගන්න... ආදරෙන් බලා ගන්න සස්වින්දි කියූ අයුරු තුහංසට සිහි විය.

අද ඇය එලෙසින් පැවසුවේ තමාට ඇති ආදරය නිසා නේද... තුහංසගේ හිතට පළමු වතාවට මහා වේදනාවක් දැනුනේය.

සස්වින්දි මගේ පණ ඔහුට රහල්ගේ වදන් සිහිවිය. ඔහු ඒ තරමට ආදරය කළ කෙල්ල... මම ඒ කෙල්ලගේ ජීවිතේම විනාශ කළා නේද... කැම්පස් ගියානම්... රහල්ගේ වුණා නම්... තමා ඇයට ආදරය කළා නම්... ඇය මෙලෙසින් දික්කසාද ගැහැනියක් ලෙසින් පිටව නොයන්නීය.

නිවසට පැමිණෙන තෙක් නිහඬව පැමිණි තුහංස සියළු දෙනා නිවසට දමා සස්වින්දිගේ නිවසට ගියේය.

කොතරම් හිත තද කරගෙන තීන්දු තීරණ ගත්තද අවසන් මොහොතේ තීන්දුව දෙද්දී වාවා ගෙන සිටි සස්වින්දිගේ සිත අයිෂාදි දකිද්දී බිඳී ගියාය.

ඇයට වදන් පවසා මනෝජ් වෙතට දිව ගොස් නිවසට ගිය සස්වින්දි මොහොතක්වත් එතැන නොරැඳී නිවසින් පිටත් වූයේ හිතේ වූ වේදනාවටයි.

තුහංස නිවසට එද්දී සස්වින්දි දෙහිඔවිටද පාස් කර තිබිණි. නොනවත්වා නද දෙන දුරකථනය වසා දැමූ සස්වින්දි ආවේගයෙන් සිම්පත ගළවා හපා විසිකර දැම්මාය. සස්වින්දිගේ ආවේගය වටහාගත් මනෝජ් නිහඬ මුවින් සියල්ල බලා සිටියේය.

ආය මට කතා කරන්න එපා හංස... එපා... සස්වින්දි මුමුණා ගත්තාය.

තුහංස කෝපයෙන් දුරකථනය පොළවේ ගැසුවේය. වාහනය අසල නවතා ගත් ඔහු මත්පැන් බෝතලයම කට තබා එක හුස්මට බී අවසන් කළේය.

සතියෙන් සතිය මාසෙන් මාසය සස්වින්දි සොයමින් රට පුරා ඇවිද ගිය තුහංස ඇය නැවත රට හැර ගියා යැයි ලැබුණු ආරංචියට නොනවත්වා බී විනාශ වෙද්දී සුසිල් සමාගම සතු සියළු අයිතිවාසිකම් තුහංසගේ අත්සනකින් ලබා ගත්තේය.

ඔහු එය අතකොලුවක් කර ගනිමින් ඔහු දෙවනුව අයිෂාදිගේත් තුහංසගේත් විවාහයට කටයුතු සැලැස්සුවේය.

තුහංස අයිෂාදි විවාහ කර ගත් බවට ආරංචියක් එද්දී ඒ තරහට තියුම් සස්වින්දි සොයා තුහංස ආ මොහොතේ ඇය විවාහවී රට ගිය බව පැවසුවාය.

පවුලේ සියළු දෙනාගෙන්ම සස්වින්දිට දොස් අහන්නට සිදුවෙද්දී මනෝජ් සියළු නෑ සබඳකම් බිඳලා සස්වින්දිව තනිකර ගත්තේය.

අක්මාව දියවීමේ රෝගයට තුහංස රත්නපුර රෝහලට ඇතුළත් කරද්දී සස්වින්දි දෙවන දරු ප්‍රසූතියට හැටන් රෝහලට ඇතුලත් කරන ලදී. ඇය කුඩා දියණියක් බිහි කරද්දී අවවාද අනුශාසනා බොහෝ ලබාගෙන තුහංස නිවසට ආවේය.

නිවසට පැමිණ දින කිහිපයකින් රිය අනතුරකට මුහුණ දුන් තුහංස එකතැන් වෙද්දී ඉදහිට නිවසට පැමිණ ගිය අයිෂාදිව සුසිල් තුහංසගේ නිවසේම පදිංචිකාරියක් කරවූවේය.

සහස්වි තුල්මාට වසරක් සපිරෙද්දී සස්වින්දි නැවතත් සිය රැකියාවට ගියාය. පෙරදා ඇය රැකියාවෙන් ඉවත් වෙද්දී ඇය ආපසු පැමිණේ නම් නැවත රැකියාව ලබාදිය හැකි බව පවසා තිබුණෙන් ඇයට නැවත රැකියාව ලබා ගැනීමට අපහසු වූයේ නැත.

ඇය එහි සේවයට ගොස් වසරක් ගත වෙද්දී එම වතුයාය අළුත් හිමිකරුවෙකු සතු වූවේය. ඔහු කාර්යාලයට පැමිණීමට නියමිත දිනයේ පිළිගැනීමේ කටයුතු භාරව තිබුණේ සස්වින්දිටයි.

"සස්වින්දි මිස්... අළුත් බොස්ව අපි පෙරහැරකින් අරන් එමු" එක් තරුණයෙක් යෝජනා කළේය.

"ඇයි අළුත් බොස් දියවඩන නිළමේ වගේ කියලා හිතුවද" සියල්ලන් සිනා සෙද්දී ඔහු ලැජ්ජාවෙන් බිම බලා ගත්තේය.

"නැහැ මම විහිලුවට කිව්වේ... ඔයා ඒක ලෑස්ති කරන්න... කොහොමටත් අපි අපේ අළුත් බොස්ව උපරිම ගෞරවයෙන් පිළිගන්න ඕනේ" සස්වින්දි කීවාය.

"පෙරහැරේ උඹ නටපන් දැන්" කාර්යාලය නිම වී නිවසට පැමිණෙද්දී ළයනි කීවාය.

"උඹලා වගේ කෙල්ලෝ ඉද්දී දරු දෙන්නෙක්ගේ අම්මා කෙනෙක් වුණ මම නටන්නේ මොකටද" සස්වින්දි සිනාසෙමින් ඇසුවාය.

"කොහෙද උඹේ ගහලා තියෙන්නේ දරුවෝ දෙන්නෙක් ඉන්නවා කියලා... පුදුමයි සස්වී උඹේ හංස උඹව ඩිවෝස් කළා කිව්වම"

"මම කිව්වේ... මතකද මම කිව්වා යනකොට දරුවෙක් එක්ක ආපහු එන්න වෙයි කියලා... හංස කවුද කියලා මම දැනගෙන හිටියේ... ඒත්... මම හිතුවේ එයා වෙනස් වෙලා ඉදියි කියලා"

"දැන් පරණ දේවල් කතා නොකර ඉමු... මමත් මේ උඹේ හිත රිදවනවා"

"නැහැ බං... මම ඇත්තටම සතුටින්... මට හංස මගේ නොවන දුක විතරයි... හංස වගේම කොළු පැටියෙක් මට ඉන්නවා"

"මදාවියා..." පැවසූ ළයනි සිනාසුණාය.

"දෙවන වතාවට මම ආපහු හංස ගාවට ගිය එක ගැනත් මම කවදාවත් පසු තැවෙන්නේ නැහැ ළයනී... ඒ නිසා මට මම වගේම කෙලි පැටික්කියෙකුත් ලැබුණා" සස්වින්දි පැවසුවේ බොහෝ සතුටිනි.

වතුයායේ නව හිමිකරු පිළිගැනීමේ උත්සවය ඉහළින්ම සූදානම් කිරීමට සස්වින්දිට හැකිවිය. පෙරහැරෙන් පැමිණෙන හිමිකරුවා බුලත් අතක් දී පිළිගන්නට බලා සිටියේ සස්වින්දියි. වෙනත් කටයුතු සොයා බලමින් අවසාන මොහොත දක්වාම සිටි සස්වින්දි පෙරහැරේ පැමිණෙන්නා නුදුටුවාය. ඇය ඔහුගේ මුහුණ බැලුවේ බුලත් අත පිරිනමද්දීය.

අත වූ බුලත් හුරුල්ල විසිරී යද්දී රහල් එය දෑතින් අල්ලා ගත්තේ සස්වින්දිට එය පිරිනැමීමට ඉඩ නොතබාය.

"ර..හ..ල්.." සස්වින්දි මිමිණුවේ හිතිණි.

"මේ අපේ එකවුන්ටන් මිස්..."

"නුහංසි සස්වින්දි පළිගුආරච්චි... නේද මිස්ටර් කළුපහන" රහල් එය සම්පූර්ණ කළේය.

"සර් දන්නවද"

"ඔව්... අපි දෙන්නා හොඳ යාළුවෝ නේද සස්වී"

"ඔව් සර්" සස්වින්දි බිම බලාගෙන කීවාය.

"සර්... මම සර්ද ආ... මෙයා මේ වැදගත් විදිහටත් කතා කරන්න ඉගෙන ගෙනනේ" රහල් සියල්ලෝම හිනැස්සුවේය.

"ඔයා තියුමිව දාලා ගිහින් එයාගේ හිත විතරක් නෙවෙයි මගේ හිතත් ගොඩාක් රිද්දුවා රහල්" සස්වින්දි තේ පානය කරන මොහොතේ ලද ඇසිල්ලකදී කීවාය.

"මම ඔයාගේ... හංසගේ... ජීවිතේ ගැන එදා ඔයා මට කිව්වට පස්සේ මම හොයලා බැලුවේ නැහැනේ... අද වෙනකල් කතා කළෙත් නැහැනේ... ඉතින් ඔයත් මම ගැන හොයන්න එපා... වෙන දෙයක් කතා කරමු... ඉතින්... කොහොමද පැටවු"

"හොඳින් රහල්"

තුහංස ගැන ඔවුන්ගේ පවුල් ජීවිතේ ගැන වෙන්වීම ගැන කිසිවක් නොදෙඩූ රහල් වෙනත් පොදු කටයුතු ගැන බොහෝ වේලා කතා කර පිටව ගියේ සස්වින්දිගේ සිත ව්‍යාකූල කර දමමිනි. රහල් කවරදාවත් විවාහ බැම්මකින් නොබැඳේ යැයි බියක් සස්වින්දි තුල විය.

ඔයාටයි තියුමිටයි ලස්සන ලෝකයක් හදා ගන්න පුළුවන්කම තියෙද්දී... ඇයි මේ රහල්... සස්වින්දි දුක් වූවාය.

"ආදරෙයි එයා" සස්වින්දි සමඟ දිවා ආහාරය ගනිමින් සිටි ළයනි කීවාය.

"කොහොමද කියන්නේ"

"එක බැල්මෙන් කියන්න පුළුවන්"

"හ්ම්... ඇත්ත"

"බැඳපන් එයාව"

"හීනෙකින්වත් හිතන්නේ නැහැ... ආදරෙයි මමත් එයාට"

"ඉතින් ගොනියේ... ඒක නිසා තමයි කියන්නේ"

"ආදරේ කියන්නේ හිමි කර ගැනීම නෙවෙයි... ඒක රහල

මට කියලා තියනවා කියලා මම දවසක් උඹට කිව්වා නේද"

"වෙන්න පුළුවන්... ඒත්... ලස්සනට ඉදියි"

"කාගෙවත් දරු දෙන්නෙක් එක්ක"

"ආදරේට මොනවද බං කරන්න බැරි... උඹට ආදරේට කැක්කුමට ඒ මනුස්සයා යස අගේට දරුවන්ට තාත්ත කෙනෙක් වෙයි"

"ඔව්... වෙන්නත් පුළුවන්... ඒ වගේම නොවෙන්නත් පුලුවන්... පරාර්ථකාමී හොඳ මනුස්සයෙක් හැටියට රහල්ට පුලුවන් වෙයි මගේ දරුවන්ට හොඳ තාත්තා කෙනෙක් වෙන්න කියලා මම විශ්වාස කරනවා"

"එහෙනම් තවත් මොනවද"

"ඒත් ළයනි උඹ අමතක කරන්න එපා තමන්ගේ ලේ සණකම වැඩියි කියලා... පාරමී පුරන්න දරුවන් දුන්නා සිදුහත් බෝසතානෝ... ඒත් මේ කාමලෝකයේ පාරමී පුරන මිනිස්සු බොහොම අඩුයි... ඕනිම මිනිහෙක්ට ගෑනියෙක්ට තමන්ගේ දරුවෝ තරම් වටින දේවල් තියෙන්න බැහැ"

"අනේ මන්දා බං උඹේ බන... මදැයි මම අහගත්තා" සස්වින්දි හඬින් සිනාසුණාය. ළයනි දෑස් කුඩා කර සස්වින්දි දෙස බැලුවාය.

"මම හයියෙන් හිනා වෙන්න තරම් දෙයක් උඹට කිව්වද" ඇය ඇසුවේ අමනාපයෙනි. සස්වින්දි හිස සෙලවූවාය.

"මට හංස මතක් වුණා... එයාටත් කවුරු හරි එක වචනයක් විරුද්දව කතා කළොත් ඇති... මාරයා එනවා"

"පුදුමයි..."

"ඇයි..."

"එයා ගැන කතා කළා... උඹ කවදාවත් මට එයා ගැන හරියට කියන්නේ නැහැනේ"

"කිව්වා කියලා වැඩක් නැහැ... අද රහල් ආව නිසා මට හංසව මතක් වුණා"

"නැත්නම් මතක් වෙන්නේ නැහැ"

"උදේ හවස දකින්න එයා වගේම රූපයක් මගේ ඇස් දෙක ළඟ තියෙද්දී මට එයාව අමතක වෙන්නේ කොහොමද ළයනි"

"තුහස්... මදාවියා" ළයනි සිනාසෙමින් කීවාය.

"හ්ම්... තාත්තා වගේම" සස්වින්දි සිනාසුණාය.

සස්වී... අපේ අළුත් බොස්... රහල්... එයා ඔයාගේ හංස ගැන දන්නේ නැද්ද" ළයනි හිස් කෑම කොළය ඔතාගනිමින් ඇසුවාය.

"ගහගෙන ඉස්පිරිතාලේ හිටියා සති ගානක් දෙන්නා... දැක්කත් ආය මූණවත් බලයි කියලා මම හිතන්නේ නැහැ... අනික... හංස මට මෙහෙම කළාට එයා මාව ඩිවෝස් කළාට රහල් තරහෙන් ඉන්නේ... මේ ගැන තියුමි කියන කොට එයා වචනයක්වත් නොකියා තරහෙන් හිටියා කියලා තියුමි මට කිව්වා"

"රහල් තියුමිව බඳින්නත් බැහැ කියලද"

"හ්ම්... එදා එයා කිසිම දෙයක් නොකියා සොරි තියුමි... කියලා ගියා ගියාමයි ආය ආරංචියක්වත් තිබුණේ නැහැලු... මාසෙකට සැරයක් තියුමිට කතා කරලා එයා ගැන විස්තර විතරක් අහනවා මිසක් එයා ගැන කිව්වේ නැහැලු... තියුමිත් මොනවත් අහන්න ගිහින් නැහැ කෝල් කරන එක නවත්වයි කියන බයට"

"මාර මනුස්සයෙක්"

"ඒකනේ..." සස්වින්දි ඔතාගත් කෑම කොළය ගෙන නැගී සිටියාය.

නිවසට ගිය සස්වින්දි රහල් හමුවූ බව හෝ ඒ වතු යායේ නව හිමිකරු රහල් බව හෝ මනෝජ්ට නොකීවාය. ඔහු යටතේ ඔහුගේ සේවිකාවක් ලෙසින් සේවය කිරීමට හෝ හැකිවීම ගැන සස්වින්දිට සතුටක් දැනිණි.

මම කරන්නේ සේවයක් තමයි... මම පඩියක් ගන්නවා... ඒත්... අවංකව උපරිමයෙන් මගේ සේවය ලබා දීලා ඔයාට

රුපියලක් හරි වැඩියෙන් උපයා දෙන්න මම අද ඉඳලා උත්සහ කරනවා රහල්... එහෙම දෙයක් හරි ඔයා වෙනුවෙන් මට කරන්න ලැබෙනව නම් ඒක මට සැනසීමක්... සස්වින්දි සිතුවාය.

"උඹ ඇප්ලයි කරපු ලෝන් ඇප්ලිකේෂන් එක අද බොසාට ගෙනියනවා කියලා ආන් අද නාකි මනමාලයා කිව්වා" සස්වින්දි වෙත පැමිණි ළයනි කීවාය.

ඔවුන් නාකි මනමාලයා ලෙසින් හැඳින් වූයේ ඔවුන් බාරව කටයුතු කළ කළුපහනටයි. වයස අවුරුදු පණහක් වූ ඔහු සස්වින්දිට බැල්ම හෙලාගෙන සිටියේය.

"එහෙනම් එයි අලගිය මුලගිය තැන් හොයන්න" සස්වින්දි අමනාපයෙන් කීවාය.

"හ්ම්... මගෙන් ඇහුව්වා සස්වින්දි මිස්ට දවසකටවත් හවස් වෙනකල් ඉන්න බැරි වෙයිද කියලා"

"ඉතින්..."

"මම කිව්වා බබා පොඩියි... කිරි දෙන නිසා එන්න බැහැනෙ කියලා"

"මිනිහා මොකද කිව්වෙ... විශ්වාස කළාද"

"නැහැ... අනෙ මෙ ළයනි මිස් බොරු කියන්න එපා සස්වින්දි මිස් බැඳලත් නැතුව ඇති කිව්වා"

"ඉතින්"

"මම කිව්වා මිස්ට කළුපහන විශ්වාස කරනවනම් විශ්වාස කරන්න නැතත් කමක් නැහැ කියලා"

"හොඳ වැඩේ" සස්වින්දි සිනාසුණාය.

"හොඳම වැඩේ කිව්වේ නැහැනේ"

"ඒ මොකද්ද"

"ඊට පස්සේ මිනිහා මට කිව්වා අද ලොන් ෆයිල් ටික අළුත් බොස්ට දානවා... සස්වින්දි මිස් ලෝන් එකක් ගන්නේ ඇයි කියලා"

"ඒක උඹට වැඩක්ද"

"අහපන්කෝ... මම කිව්වා එයාගේ හස්බන්ඩ්ගේ උවමානාවකට ගන්නේ කියලා... මිනිහගේ මූණ කජු ලෙල්ලක් වුණා"

"අනේ පව්..."

"මිනිහා මූණ ආප්පේ කරන් මගෙන් අහනවා සස්වින්දි මිස්ට හඩ්බන්ඩ් කෙනෙක් ඉන්නවද කියලා... මම ඇහුව්වා හස්බන්ඩ් කෙනෙක් නැතුව පොල් පිත්තකට ළමයි ඉදියිද මිස්ට කළුපහන කියලා"දෙදෙනාම හඩින් සිනාසුණෝය.

තම සමඟගමේ නුවරඑළිය ශාඛාවේ සිටි තුහංස තමා ඉදිරියේ සිටින සේවකයා තමා වෙත ලබා දුන් ලිපි ගොණු පරීක්ෂා කරමින් සිටියේය.

සස්වින්දිගේ ණය අයදුම් පත දුටු තුහංස වෙව්ලා ගියේය. ඔහු තමා ඉදිරියේ සිටි කළුපහන දෙස බැලුවේය.

"ආ... ඔක සස්වින්දි මිස්ගේ සර්... අවුරුදු ගානක් අපේ ඔෆිස් එකේ වැඩ කළ කෙනෙක්... අස්වෙලා ගිහින් ඉඳලා ආපහු ඇවිත් අවුරුදු දෙකක් විතර ඇති"

එසේ නම් ඇය රටින් පිටව ගොස් නැත... තුහංසට සිතිණි.

"කොහෙද ඉන්නේ"

"ෆෝඩයිස් වල... ඔය ඇඩ්‍රස් එක තියෙන්නේ... සර්රුත් අඳුරනවද සස්වින්දි මිස්ව"

"ඇයි මිස්ට කළුපහන එහෙම ඇහුව්වේ"

"නැහැ... එදා බොස් වෙනුවට ආව මහත්තයාව මේ මිස්ව අඳුරනවා" එසේ නම් රහල්ට සස්වින්දිව හමුවී ඇත. ඔහු තමාට එය නොකීවේය.

"ආ... ඔව්... ඇයි දන්නේ නැහැ නේද මේ මිස් ලොන් එකක් ඇප්ලයි කළේ" සස්වින්දි ළඟ කෝටි ගානක මුදල් ඇත. ඇයට මෙවැනි සුළු ණය මුදලක් අවශ්‍ය නැත.

"හස්බන්ඩ්ගේ වුවමනාවකට කියලා තමයි කිව්වේ" එසේ නම් සස්වින්දි විවාහක යැයි තියුම් පැවසූ කතාව සත්‍යකි. ඇය විවාහවී සැමියා සමඟ මෙහි පදිංචියට එන්නට ඇත.

"මේ මිස්ගේ වැඩ කොහොමද... කැපවීමෙන් වැඩ කරනවද"

"කරන්න පුළුවන් උපරිමයෙන් වැඩ කරනවා සර්... ඕ ටී එහෙම නම් කරනවා අඩුයි... මිස්ට පොඩි බබෙක් ඉන්නවලු"

එසේ නම් ඇයට දරුවෙකුත් සිටී. ඔහුට පෙරදා දෙවතාවක්ම ඇය ගැබිණි බව කියා තමා රැවටූ අයුරු සිහි විය. එදා සිට ඇයගේ සිතේ වූ මවක වීමේ සිහිනය ඇය අද සැමියෙකු සොයාගෙන සැබෑ කරගෙන ඇත...

අතට ලැබුණ දේ කටේ දාගන්න මට පින නැති වුණා... තුහංස දිග සුසුමක් හෙලුවේය.

"මේ ලෝන් එකට ඇප්රූව් එක දෙනවද සර්"

"මට ඔය අය මුණ ගැහෙන්න ඕනේ මිස්ට කළුපහන... ඊට පස්සේ මම තීරණය කරන්නම්" තුහංස කීවේය.

කළුපහන කාර්යාලයෙන් ගිය සැනින් තුහංස රහල්ව ඇමතීය. රහල් සිටියේ තුහංසගේ කාර්යාලයට එමින්ය.

"හිටපන්... මේ මම එන ගමන්... ළඟ" තුහංස දුරකථනය පසෙක තබා මද වේලාවකින් රහල් පැමිණ ඔහු ඉදිරියේ වාඩි වූවේය.

"වලත්තයා... බල්ලා... තෝ මට නොකියා ඒකිව ගන්න හිතුවද" තුහංස කෝපයෙන් ඇසුවේය.

"ගත්තත් උඹට මොකද" රහල්ද ඒ හඬින්ම ඇසුවේය.

"ගයි... තියුමි කිව්වේ ඇත්ත... ඒකි බැඳලා" තුහංස ශෝකයෙන් කීවේය.

"ඉතින්..."

"ඒකිට බබෙකුත් ඉන්නවලු රහලා"

"බැන්දම බබාලා ඉන්නවා තමයි... හැම එකාම තෝවගේ ආතල් ගන්න කසාද බඳින්නේ නැහැනේ"

"උඹ ඇයි මට හංසි හම්බ වුණා කියලා නොකීවේ"

"කියලා මම තොගෙන් ගුටි කන්නද තොට ගහන්නද" තුහංස එයට කිසිත් නොකීවේය.

"හංසයා මම උඹට කියලා තියෙන්නේ සස්වි කියන නමවත් අපි දෙන්නා ඉදිරියට එන්න බැහැ කියලා... ඒක පොරොන්දුවක්... එහෙම කියලා තමයි මම උඹේ මේ බිස්නස් වැඩ වලට සම්බන්ධ වුණේ"

"හරි... මචං සොරි" තුහංස පැරදුම් හඬින් කීවේය. තුහංසගේ පිටට තට්ටුවක් දැමූ රහල් මේසය මත තිබූ ලිපිගොණුවක් දිග හැර ගත්තේය.

"අපි දෙන්නා යමුද... හංසි බලන්න" තුහංස හීන් හඬින් කීවේය.

"ඇයි ඒකිගේ මිනිහා කුදලගෙන ඇවිත් තඩි බාන්නද"

"මට ඒකි කොහොමද ඉන්නේ කියලා බලන්න ආසයි... ඒකිගේ පොඩි එකා"

"ඇයි... උඹට ඉන්නේ හුරතල් කරන්න දෙන්නෙක්... ඒකිගේ එවුන් මොකටද"

"මොකෙක්ද දන්නේ නැහැ නේද ඉන්නේ"

"මොකෙක්වත් වෙන්නේ කොහොමද... මිනිස් රූපයක් ඇති... ගෑනු හෝ පිරිමි"

"නැත්නම් ඉතින් තෝ වගේ අමන..." තුහංස කෝපයෙන් කීවේය.

"හෝ... හෝ... යාළුවා... මගේ නෙවෙයි... මම වගේ අමන රූපයක් එන්න"

"උඹේවත් වුණා නම් රහලා... මට සැනසීමක් දැනෙයි"

"පල ....... යන්න" රහල් පැවසුවේ කුණුහරුපයකි.

"ඔය නමත් මට හොඳ වැඩියි රහලා... ඇත්තටම අපි යමුද ඒකිව බලන්න... මගේ ළඟ ඇඩ්‍රස් එක තියනවා"

ණය පෝරමයේ තිබූ සස්වින්දිගේ ලිපිනය ඔහු මොහොතේම කට පාඩම් කර ගත්තේ කළුපහනට රහසිනි. ර තුහංසට රළු බැල්මක් හෙලුවේය.

"සොරි... බලන්න ආසා හිතුණා මචං... ඉවසීමක් න වුණා"

"දැක්කම... ඉවසීමට මොනවා වෙයිද... ආපහු ඒ උස්සලා කුණුහරුප කරන්න හිතෙයි උඹට... ඒකටනේ ඒකිව එදා ඉදලම ඕනේ වුණේ" තුහංස නිහඬ විය.

දැන් හංසිගෙන් මට එහෙම දෙයක් ඕනේ නැහැ කියලා හොඳටම දන්නවා... ඒ රතුවෙන මූණට කඳුළු ඇස් වලට අ නෙවෙයි... දැන් මම ආදරෙයි... ඇත්තම නම්... උඹ වඩා දැන් හංසිට ආදරෙයි රහලා... ඒකි මගේ ජීවිතේ... මගේ ජ වික කියලා මම උඹට කියන්නේ කොහොමද... උඹ විශ් කරයිද... තුහංස ශෝකයෙන් සිතුවේය.

"මම හිතුවා හංසයා... උඹ දැන්වත් සස්විට ආද කියලා... දැන්වත් ඒකි ගැන වෛරයෙන් නොහිතයි කියලා"

"නැහැ මචං... මම ඒකිට වෛර කරන්නේ තවදුරටත්... මට එහෙම කරන්න බැහැ... දෙයක දැනෙන්නම් ඒ දේ අපට නැති වෙන්න ඕනේ... හංසිගේ මට දැනුනේ එයා මම නැතිකර ගත්ත දවසේ... සල්ලි බිස්නස් එකේ අගේ දැනුනේ සුසිල් අංකල් කට්ටෙ තියලා හැමදේම ගත්ත දවසේ"

"පරණ දේ ඕනේ නැහැ හංසයා... උඹ දැන් මිනි වෙලා හොඳින් ඉන්නවනේ... උඹට ජීවිතයක් තියනවනේ"

"ඔව් මචං... ඒත්... ජීවිතේ අඩුවක් නැති වුණාට තියන අඩුව මැරෙනකල් පිරෙන්නේ නැති වෙයි" රහල් පිටට තට්ටුවක් දැම්මේය.

"හංසයා... මටත් උඹ යුතුකමක් ඉෂ්ට කරන්න ඕනේ"

"මොකද්ද රහලා... උඹ වෙනුවෙන් මම ඕනේ කරනවා"

"මම ගිහින් තියුමි හොයාගෙන යනවා... බඳින්න දින දාගෙන උඹට කියන්නම්... උඹ වරෙන් සයින් කරන්න" තුහංස රහල් දෙස බලා සිටියේය.

"මට වත්තට යන්න වෙයි... සස්වි මූණ ගැහෙයි... නිකමට හරි උඹ හිතුවොත්"

"සොරි රහලා... මේ බල්ලා කරපු බලු වැඩ ආයෙත් කරන්නේ නැහැ... ඇත්තමයි හංසි නොබැඳ හිටියනම් උඹ කැමති නම් මම ඒකිට උඹව දෙනවා... ඒකි ඉඳුලක් බව ඇත්ත මචං... ඒත් ඒකි සම්පතක්... වටිනාකම කියලා නිම කරන්න බැරි" රහල් කිසිත් නොකීවේය.

"උඹ තියුමි අත ඇරලා අවුරුදු ගානක්... උඹ හිතනවද ඒකි උඹ වෙනුවෙන් ඉන්නවා ඇති කියලා"

"අනිවා මචං... ඉන්නවා... අමතක කරන්න එපා... ඒකි සස්විගේ නංගී කියලා"

"අක්කා හිටියේ නැහැ කියලා අමතක වුණාද... අක්කා බැඳලා"

"උඹ තරහෙන් වෛරයෙන්ද කියන්නේ"

"නැහැ රහලා නැහැ... මම කොහොමද ඒකි එක්ක තරහා ගන්නේ... මම වැරදි කරලා... ඒකිටත් ජීවිතයක් ඕනේ... මම විනාශ කරපු ජීවිතේ ඒකි ගොඩ නඟා ගත්තා... ඒක ගැන මට සතුටුයි... හංසි සතුටින් නම් මගේ සතුට ඒක" රහල් හඬින් සිනාසුණේය.

"හිනා වෙන්න එපා බල්ලෝ" තුහංස කෝපයෙන් කෑගැසුවේය.

"හිනා යන්නේ නැද්ද හංසයා"

"උඹ ඒ කාලේ ආදරේ ගැන මහා වදන් කියන කොට තේරුම් ගන්න මම ආදරේ අඳුනගෙන හිටියේ නැහැ මචං... ඒත් අද මම ආදරේ අඳුරනවා... ඒ නිසා තේරෙනවා... ආදරේ කියන්නේ ලබා ගැනීමම නෙවෙයි කියලා උඹ කියන කතාව

ඇත්ත... එයාගේ සතුට තමා තමන්ගේ සතුට කියලා මම අද පිළි ගන්නවා" රහල් නිහඬ වූවේය.

"උඹ හරි මචං... හංසිගේ ජීවිතේට ආය මම එබෙන්න ගියොත් ඒක අවුල් වෙයි... ඒකිගේ සතුට තමා මගේ සතුට... මම ඒකිට ආදරෙයි රහලා... අපි නොගිහින් ඉමු" තුහංස කීවේය.

"උඹ ජීවිතේ පහු වෙලා හරි ඔතෙන්ට ආව එක ගැන මට සතුටුයි හංසයා... රහල් මුමුණා ගත්තේය.

"සස්වින්දි මිස්ට බොස් කතා කරනවා" ලැබුණු පණිවිඩයකට සස්වින්දි නැඟී සිටියාය.

"ඇයි දන්නේ නැහැ"

"ලෝන් ඇප්ලයි කරපු හැමෝම ගියා"

"ආ... ඒකට වෙන්න ඇති... මම යන්නම්"

සස්වින්දි හිමිකරුගේ කාමරයට ගියේ රහල්ව බලාපොරොත්තුවෙනි. ආසනයේ සිටින රුව දුටු ඇයගේ දෙපා ගැහෙන්නට විය. ඒ කඩවසම් බවේ... නාරි දේහයේ... වැඩියක් නොව බිඳක හෝ අඩුවක් නොවීය.

"වාඩි වෙන්න මිස්" තුහංස කීවේ ඇයගෙන් දෑස් ඉවතට නොගෙනයි.

මේ වතේ මේ ගතේ තමාගෙන් සිපුම් නොළද තැනක් නැත්තේය. එහෙත් මේ සිතේ බිඳක හෝ ඉඩක් ගන්නට තමා අසමත් වූවා නොවේද... තුහංස සිතුවේය.

"මේ ලෝන් එක මිස් ඇප්ලයි කළේ..." තුහංස ඇසුවේය.

"මගේ හස්බන්ඩ්ගේ වුවමනාවකට... දරුවාගේ වැඩකට" සස්වින්දි බිම බලාගෙන කීවේය.

"එකස්කියුස්මී මිස්ටර් කළුපහන... මට මේ මිස් එක්ක විනාඩියක පුද්ගලික කතාවක් තියනවා"

"සොරි සර්" කියූ කළුපහන නැගිට්ටේය. තුහංස බැලුවේ ඒ පුද්ගලික ලේකම් වරිය දෙසයි. ඇයද නැගිට්ටාය.

"මිස් දුලංගි... ඔයා ඉන්න..." සස්වින්දි වහා කීවාය. ඇය බැලුවේ තුහංස දෙසයි ඔහු හිස සෙලවූවෙන් ඇය වාඩි වූවාය.

වස බෝතලේ වස නම් අඩු වෙලා නැහැ බිඳුවක්වත්... තුහංස සිතුවේය.

"මොනවද මිස්ටර් බකමීමල්දෙණියට මගේ එක්ක පුද්ගලිකව කතා කරන්න තියෙන්නේ... මම හිතන්නේ නැහැ එහෙම දෙයක් තියනවා කියලා... අනික් අය එක්ක එහෙම කතා කරන්න නැතුව ඇතිනේ"

"ඔව්... අනිත් අය එක්ක නම් එහෙම කතා කළේ නැහැ"

"එහෙනම්..."

"දරුවෙක්ගේ වැඩකට කිව්වනේ නේද සල්ලි වුවමනා"

"ඔව්..."

"මම හිතන්නේ නැහැ මිස් සස්වින්දිට ණයක් ගන්න තරම් මුදල් හිඟයක් තියනවා කියලා"

"මේක මගේ පුද්ගලික දෙයක් මිස්ටර් බක්මීමල්දෙණිය... ඔයාට ලෝන් එක ඇප්රූව් කරන්න බැරි නම් කියන්න... මම වෙන විකල්පයක් ගන්නම්"

"කේන්ති ගැනීමේ නම් කිසිම අඩුවක් පේන්න නැහැ... මම කිව්වේ... දරුවෙක්ගේ දෙයක් නම් ප්‍රොක්ටර් ගාවට ගියා නම් එතන මුදල් ඇති... මම කියන්නම්"

"තැන්ක්යූ මිස්ටර් බක්මීමල්දෙණිය... දරුවාගේ තාත්තා ඒ දේවල් කරයි"

"දුලංගි මිස්... මිස්ටර් කළුපහනට කියන්න මේ මිස්ගේ ලෝන් එක මම ඇප්රූව් කළා කියලා" තුහංස එහි අත්සන තබා එය අනුමත කළේය.

සස්වින්දි නැගී සිටියාය. සස්වින්දි පිටව යන දෙස තුහංස බලා සිටියේය. ඇයගේ හැඩකාර කම... පුළුලුකුල තවත් පුළුල්ව ඇත. තමා මැයගෙන් කොතරම් සතුටක් වින්දේද... මේ පුළුලුකුලේ පහස පතා තමා ඇයට කොරම් පීඩා දුන්නේද...

ඇයගේ ජීවිතයම විනාශ කොට අපා...
වෙනුවෙන් නොවේද... තමා කොතරම් නරුමයෙක්
තුහංසට සිතිණි.

මදාවියා... අසත්පුරුෂයා... නරුමයා... තමුසෙට නම් ජෙ
වෙන්නේ නැහැ... පිටව යන සස්වින්දි දෙස බලා සිටි
සස්වින්දිගේ හඬ හිතේ දෝංකාර දෙද්දී සිනහවක් නැඟුෙ
ඔහු වෙතට පැමිණීමට නැඟී සිටි දුලංගි පුදුමයෙන් ඔහු
බැලුවාය.

"මිස්ටර් කළුපහනට දැන්මම කියන්න දුලංගි... නැ
අමතක වෙයි" තුහංස කීවේය.

සස්වින්දි තම පුටුවට ආපසු පැමිණියේ සිහියකින් නො
රහල් තමාට කිසිවක් පැවසුවේ නැත. ඔහු පෙරදා හිමි
ලෙසින් මෙහි පැමිණියේය. අද හංස හිමිකරු ලෙසින්
පැමිණ ඇත. එසේ නම් මෙහි හිමිකාරිත්වය දෙදෙ
සතුවන්නට පුළුවන... තමා නිසා ගහගන්නට ගිය ඔවුන්
මිතුරන් වී ඇත. විය යුත්තේ එයයි. සස්වින්දි සතුටින් සිතුවා

තමාට තුහංස හා කේන්ති ගන්නට එකටෙක කියප
අදහසක් සිතක කොණකවත් නොතිබුණාය. එහෙත් ඔහු
තමා... ඔහුගේ ආදරය පැතූ තමා... එය නොලැබී
තිබියදී... ඔහුට ආදරය කරමින් ඔහුගේ ලෙය පෝෂණය ස
තමා ඔහු ඉදිරියේ බවුන් වඩන මෙහෙණියක් වන්නේ කෙ

එදා ඉඳලම හංස එක්ක මම කේන්ති ගත්තා... එයා කෙ
ගන්න වෙලාවටත් එයාව කේන්තිය අවුස්සන්න මොනවා
කළා... මට හංස නැති වුණේ ඒකයි... අදත් මම කරන්නේ
නේද...

අද මට හංස ළංකර ගන්න බැහැ... එයාට අයිතිකා
ඉන්නවා... ඒත්... එයා දිහා බලලා සැනසෙන්න හරි මට පුළ
නේද... එයාගේ සතුට මගේ සතුට කරගෙන එයාට පැ
ඉඳලා ආදරේ කරන්න වුණත් පුළුවන් නේද... සස්වින්දි සිතු

ඔව් හංස... ආයෙ මම ඔයා එක්ක ගැටුම් ඇති කර ගෙ
නැහැ... සස්වින්දි මුමුණා ගත්තාය.

"අද ආව අළුත් බොසා සස්වි එක්ක පුද්ගලික කතා බහකට කාලය ඉල්ලුවා කියලා කතාවක් ඔෆිස් එක පුරවටම යනවා" සවස තේ පානය වෙලේ ළයනි සස්වින්දි සමඟ කීවාය.

"වනසන්න ඇති... නාකි මනමාලයාද කිව්වේ"

"නැතුව ඉතින්... ඒකා විතර ගෑනියක් මේ ඔෆිස් එකේ ඉන්නවද... අද ආව බොසා රහල් බොසාගේ පණිවිඩයක් කිව්වද"

"විකාර... ලොන් එක ගැනයි ඇහුව්වේ... නේද දුලංගි මිස්... මම දුලංගි මිස්ට යන්න එපා කියලා තියා ගත්තා" සස්වින්දි එතැනින් වාඩි වුණු දුලංගි දෙස බලමින් කීවාය.

"හ්ම්... මටත් ඉතින් කතා ටික ටික ඇහුණා... නැත්තේ නැහැ... අදනේ මම දන්නේ සස්වින්දි මිස් කොච්චි කරලක් කියලා" දුලංගි සිනාසෙමින් කීවාය.

"ආව සර් රහල් සර්ගේ යාළුවෙක්ද" ළයනි ඇසුවාය.

"හ්ම්..."

"සස්වින්දි මිස් දාපු සද්දෙට දන්න කෙනෙක් කියලා හිතුණා... පව්... අනේ ඒ සර් හරි හොඳයි... සස්වින්දි මිස් ගියාට පස්සේ තනියම හිතා වුණා" දුලංගි කීවාය.

අනේ එයාගේ හොඳේ... මම විතර කවුද දන්නේ... සස්වින්දි සිතුවාය.

"එතකොට මේකේ බොසා රහල් සර්ද... ඒ සර්ද... නැත්නම් දෙන්නමද"

"උඹට මොකටද ළයනි ඒ වගක්"

"නැහැ මේ මම නිකමට ඇහුව්වේ... අපි වැඩකරන්නේ උඹේ ඒ කාලේ බෝයි ෆ්‍රෙන්ඩ්ටද නැත්නම් එයාගේ යාළුවටද නැත්නම් දෙන්නටමද කියලා හොයා ගන්න එක වැදගත්"

"ආ... ඒ කියන්නේ රහල් සර් ඒ කාලේ සස්වින්දි මිස්ගේ බෝයි ෆ්‍රෙන්ඩ්ද"

"හදපල්ලා කතාවක්... අර නාකි මනමාලයාම
කොණකින් තිබ්බත් ඇති ගිනි තියන්න... උඹේ කටනම්
කිව්ව මගේ කටයි තලා ගන්න ඕනේ"

"අනේ මම ගැන බය වෙන්න එපා මම
හොල්ලන්නේ නැහැ"

"ඒක තමයි මම දූලංගි මිස් ඉස්සරහා බය නැතුව කි
වෙන කවුරු හරි හිටිය නම් කියන්නේ නැහැ" ළයනි කීවා

"ඇත්තටම මේක අරන් තියෙන්නේ කවුද
නැහැ" සස්වින්දි ඇසුවාය.

"අද ආව සර්..." දූලංගි කීවාය.

"නම මොකද්ද" ළයනි ඇසුවාය.

"සස්වින්ද කියලා තමයි මට කිව්වේ... සස්වින්
සර්නේම් එක නේද කිව්වේ"

"හ්ම්..."

"එකම නම් කෑලි දෙකක් තියන හින්දද කොහෙදෝ
එහෙනම් සස්විට පුද්ගලික කතාවකට ආරාධනා
ඇත්තේ" ළයනි සස්වින්දිගෙන් පිටට පහරක් කෑවාය.

ඔයාලා දන්නවනම් අපේ නම් වල එක කෑල්ලක්
කෑලි ඔක්කොම එකයි කියලා... සස්වින්දි සිතුවාය.

"එයත් හංසව දන්නවද" දූලංගි ගිය පසු ළයනි ඇසු

"නැහැ..." සස්වින්දි කීවාය. ළයනි ඉන් පසු යමක්
නැත.

ළයනි කාර්යාලයේදී තුහංසව ප්‍රථම වතාව
මොහොතේම කලබලයෙන් සස්වින්දි සොයා ආවාය.

"සස්වී"

"මොකද බං"

"අපේ අළුත් බොසා දැක්කා"

"මම කියන්න යනදේට උඹ මට බනියි"

"ඇයි උඹට බනින්නේ... බැණුම් අහන්න හරි කියපන්කෝ"

"තුහස්"

"හ්ම්..... මගේ කොල්ලා"

"සස්වි... ඔයාගේ හංස පෙණුමෙන් අපේ මේ අළුත් බොස් වගේද"

"ඇයි එහෙම අහන්නේ"

"තුහස් එයා වගේමයි" සස්වින්දි මොහොතකට ගල් ගැසී ගියාය.

"උඹ මගේ රස්සාව විතරක් නෙවෙයි ළයනි... සැනසීමත් නැති කරන්න වගේ යන්නේ" සස්වින්දි මුල් සිහිය ගන්නට උත්සහ කරමින් කීවාය.

"උඹට කියන්න... ඇයි මන්දා... මට සර්ගේ හැමදේම තුහස් වගේ කියල පේන්නේ "

"විකාර කියවනවද" කෝපයක් මවාගත් සස්වින්දි කතාව මග හැරීමට සිතුවාය.

ඔයා නොදන්නවට හංස... ඔයාගේ අච්චුව මගේ ගෙදර... ඔයාගේ ලේ ඔයාවගේ නොවෙන්නේ කොහොමද...

තුහංස කාර්යාලයට ඉද හිට පැමිණ ගියද සස්වින්දි කිසිම මොහොතක කතා කළේ නැත. එනිසාවෙන් කතාව එසේම යටපත් වී ගියේය. රහල්ද ඉන් පසු කාර්යාලයට නාවෙන් සස්වින්දිට රහල්ට තුහංස හමුවූ හැටි... ඔහුගේ දැන් විස්තර... ලබා ගැනීමට හැකියාවක් නොවීය. රහල් ඇමතීමට ඇය නොසිතුවේ තවත් ගැටළු වලට මැදිවීමට නොසිතූ නිසයි.

"අනේ... අපේ අළුත් බොස්ට ඉන්නවා චබී බබාලා දෙන්නෙක්... ටුවින්ස්ලා" කාර්යාලයේ සේවිකාවක් කියනු සස්වින්දි ඇසිණි. ඇය වැඩය නවතා එය අසා සිටියාය.

"මම ගියා කැන්ඩි නර්සින් හෝම් එකට එතනදී හම්බ වුණේ"

"සර් කතා කළාද" තව කෙනෙක් ඇසුවාය.

"අනේ ඔව්... වතුරේ නටලා හෙම්බරිස්සාව හදාගෙන කියලා සර් බැන බැන හිටියේ... නහයවල් ජම්බු වගේ රතුවෙලා... හොටු ගලනවා... පිහිදන්න දෙන්නේ නැතුව දුවනවා... දුව අල්ලන කොට පුතා දුවලා... පුතා පිහිදන කොට දුවගේ හොටු" ඇය හා සැම සිනාසුණද සස්වින්දිට සිනහා විය නොහැකි විය.

තුහස් පසු පස තුහංස දුවනු ඔහුගේ නාසය පිහිදනු සස්වින්දිට මැවී පෙනෙන්නට විය. ඇය දෑසේ කඳුළු සැමට රහසේ පිසදා ගත්තාය.

"වයිෆ් ලස්සනද"

"ලස්සන නැතෑ... බොසා නළුවා වගේ ඉන්නකොට... දැක්කම පිස්සු හැදෙනවා"

"චික්... කට... සර්ගේ වයිෆ් හිටියද හිමා"

"නැහැ... අම්මා එක්ක වෙන්න ඇති ඇවිත් හිටියේ" ඇය අයිෂාදිගේ මව විය යුතුයැයි සස්වින්දි සිතුවාය.

"සර් නුවරද පදිංචිය"

"හ්ම්... එහෙම තමා කිව්වේ"

එසේ නම් ඔහු අයිෂාදිගේ නිවසේ නතර වන්නට ඇත. ඇය ඔහු හදා ගන්නට ඇත. පෙරදා සිටි මැරයා අද නැත. බීමතින් රතු වූ ලොවි ඇස්වල සලකුණු පැමිණෙන දිනට දක්නට නැත. ඇය සිය දරුවන්ගේ කටයුතු ඔහු ලවා කරවා ගැනීමට තරම් ඔහුව හික්මවාගෙන ඇත.

මම කර ගන්න උත්සහ නොකළදේ අයිෂාදි කරගෙන... හංසව මට ඕනි වුණා කියලා හිතුවට මම එයා මට ඕනි කියලා හිතලා වැඩ කළේ නැහැ... හැම වෙලේම කේන්ති කළා... කම්මුලට ගැහුව්වා... තුවාල වෙන්න පපුවට ගැහුව්වා... හිරේ තිබ්බා... ගරාජ් එකට දැම්මා... මම කොච්චර වැරදිද... සස්වින්දි ශෝකයෙන් සිතුවාය.

මම එයාට ආදරේ කරලා... ආදරෙන් දෙයක් කියලා ඉවසීමෙන් හිටියනම් මට හංසව හදා ගන්න ඕනේ තරම්

අවස්ථාව තිබුණා... එයා මම ගැන නොහිතුවමම නෙවෙයි... මොන දේ කළත්... එයා මම ගැන හිතුවා... මමයි වැරදි... ඒකයි මට හංස නැති වුණේ... සස්වින්දි මුමුණා ගත්තාය.

"ඇයි සස්වින්දි මිස්" ඇය කාර්යාල මේසයේ හිස තබාගෙන සිටියදී අයෙක් ඇසුවෝය.

"ඔළුව රිදෙනවා හිමාෂා මිස්"

"පෙති දෙකක් බීලා ඔළුව තියා ගන්න මිස් මම පෙති එවන්නම්"

"බොස් ගැන කියද්දිද දන්නේ නැහැ ඔළුවේ කැක්කුම හැදුනේ" එකෙක් රහසින් කීවෝය.

"පව්... එහෙම කියන්න එපා... ඔය නාකි මනමාලයාගේ බේගල්... සස්වින්දි මිස්ට පැණි හල හලනේ හිටියේ එයාගේ වයස ගැනවත් නොහිතා"

"හ්ම්... ඒක ඇත්ත... මිස්ටර් කළුපහනව එළියට දැම්මට දුලංගි මිස් ඇතුලේ හිටියලු"

"සර් ඔෆිස් එකට කොච්චර ඇවිත් යනවද... අද වෙනකල් සස්වින්දි මිස් සර් එක්කවත් සර් සස්වින්දි මිස් එක්කවත් කතා කරනවා දැකලා නැහැ... සර්ගේ ඔක්කොම කන්ටැක්ස් මිස්ටර් කළුපහන එක්ක විතරනේ"

"එහෙම නොවුණ නම් මේ ඔෆිස් එකේ කී දෙනෙක් සර් එක්ක කන්ටැක්ස් තියා ගන්න යයිද" ඔවුන් සිනාසෙද්දී ඔවුන් අසල සිට රහසින් සියල්ල අසා සිටි ළයනිද රහසින් ඔවුන්ගේ සිනහවට එක් වූවාය.

ඇයට එම කතාව සස්වින්දිට පැවසීමට හැකි වූයේ පසුදායි. ඇයි සිනාසෙමින් සියල්ල කීවාය.

"ඇති... මම බයේ හිටියේ කතාවක් මේ ඔෆිස් එකේ යයි කියලා" සස්වින්දි සැනසීමෙන් කීවාය.

අඩ හෝරාවකට වැඩි කාලයක් බසය එන තුරු ළයනි සමඟ බලා සිටි සස්වින්දි නැවත වතාවක් වේලාව බැලුවාය.

"අද බස් එක නැහැ වගේ... වෙන එකක් දාන පාටකුත් නැහැ"

ආකරපතනේ සිට හැටන් බලා එන කාර්යාල බස් රථයේ පමාවට සස්වින්දි සිටියේ කලබලෙනි.

උදේ නිවසින් පිටවන විට නැන්දා පැවසුවේ සහස්විගේ ඇඟ රත්කර ඇති බවයි. විටින් විට තමා ඇය අමතන විට සුව බව කීවද සස්වින්දි සිටියේ සැනසීමෙන් නොවේ.

"පොඩි එකී පව් සස්වී"

"ඒක තමයි මට උහුලන්න බැරි... ටවුමට පයින්වත් යමුද" සස්වින්දි ළයනිට කීවාය.

"යමු එහෙනම්"

සස්වින්දිත් ළයනිත් ඉක්මන් ගමනින් ඉදිරියට යද්දී ආ තුහංසගේ වෑන් රථයට ළයනි අත දැමුවාය.

"පිස්සුද උඹට... කතාවක් අහ ගන්නද" සස්වින්දි ඇසුවේ කේන්තියෙනි.

"දරුවා ගැන බලන්න... කියන එකෙක් ඕනි එකක් කියපුදෙන්" තුහංස වෑන් රථය නවතද්දී ළයනි ඔහු අසලට ගියාය.

"ඇයි අද බස් එක නැද්ද" තුහංස ඇයගෙන් ඇසුවේය.

"නැහැ සර්... එකක් දායි... ටිකක් වෙලා යයි"

"ආ..." කියූ තුහංස සස්වින්දි දෙස බැලුවාය. සස්වින්දි බිම බලා ගත්තාය.

"සර් අපිව ටවුමට දානවද... සස්වින්දි මිස්ට පොඩි බබෙක් ඉන්නවා... වෙලා යයි"

"නගින්න... මම ගිහින් දාන්නම්" තුහංස කීවෙන් ළයනි සස්වින්දි වෙතට ගියාය.

"සස්වී... සර් එක්ක යමු" සස්වින්දි රැවුවාය.

"පස්සෙ රවපන්... සර්ට තරහා යයි... මමයි කතා කරලා ඇහුව්වේ" ළයනි කීවාය.

"ඉස්සරහින් නගින්න... ඔය සීට් එකේ බඩු වගයක් තියනවා" තුහංස වෑන් රථයේ ඉදිරි දොර ඇර දුන්නේය.

ළයනි පළමුවන් සස්වින්දි දෙවනුවත් වෑන් රථයට ගොඩ වූවේය. සස්වින්දි දෙස මොහොතක් බලා සිටි තුහංස රථය ඉදිරියට ගත්තේය. සස්වින්දි ඉවත බලා ගත්තාය.

"මිස් ඉන්නේ"

"ෆෝඩයිස් වල සර්... අපි දෙන්නම එක ළඟ ඉන්නේ"

"වවුමට ගියත් යන්න වෙලා යයි... මම ගිහින් දාන්නම්" තුහංස සස්වින්දි දෙස බලා කීවේය. දෑස් ගැටී මොහොතක් ගත විය.

"සර්ට කරදරයක්"

"මමනේ කියන්නේ" තුහංස සැරෙන් කීවේය. ළයනි නිහඬ වූවාය. ළයනි සස්වින්දි දෙස බැලුවාය. ඇයගේ බැල්මද මග හැරිය සස්වින්දි ඉවත බලා ගත්තාය.

ළයනිගෙන් පාර අසාගත් තුහංස ළයනි පැවසූ තැන රථය නතර කළේය. නිවස අසල රථය නවතන තෙක්ම සස්වින්දි සිටියේ නිහඬවයි.

"මේකද ගෙදර" තුහංස ඇසුවේය.

"ඕක සස්විගේ ගෙදර... අරක අපේ ගෙදර" ළයනි පෙන්වීය.

කුමකට හෝ එළියට පැමිණි තුහස් සස්වින්දි වෑන් රථයේ සිටිනු දුටුවේය.

"තාත්තී... අම්මි ඇවිල්ලා... වෑන් එකකම ඇවිල්ලා" තුහස් ඔවුන් වෙත පැමිණියේ කෑගසමිනි. සස්වින්දි ඇවිලී ගියාය.

වසර ගනනක් පුරාවට රැක ගත් රහසක්... අද එළිවේද... ඇයට දැනුනේ බියකි.

"නැහැ... මේ මගේ මහත්තයාගේ කලින් කසාදේ ළමයා... අවුලක් වුණොත් මම එහෙමයි කියන්නේ... සස්වින්දි සිතුවාය. ඒත්... මේ ඔයාගේ තාත්ති කියලා මට තුහස්ට කියන්න ඇත්නම්... සස්වින්දි ශෝකයෙන් මුමුණා ගත්තාය.

"අම්මී... නංගි අඬලා අඬලා නිදා ගත්තා" සස්වින්දි වෙතට පැමිණ කියූ තුහස් වැන් එක අත ගාමින් වටයක් කැරකී නැවත නිවස වෙතට දිව ගියේය.

දුටු මොහොතේ පටන් ඇස පිය නොහෙලා තුහස් දෙස බලා සිටි තුහංස ඔහු නිවසට දිව යන ඇසිල්ලේ සස්වින්දි දෙස බැලුවාය. ඔහුට මුහුණ නොදුන් සස්වින්දි සූදානම් වූයේ රථයෙන් බැස යන්නයි. තුහංස වහා සස්වින්දිගේ සුරතින් අල්ලා ගත්තේය. ළයනි තම ඇකයේ පැටලී ඇති ඔහුගේ ඇයගේත් දෑත් දෙස විසල් නෙතින් බලා ඔවුන් දෙසද මාරුවෙන් මාරුවට බැලුවාය.

"හැම අයිතිවාසිකමක්ම මනුස්සයෙකුට නැති වෙන්න පුළුවන්... ඒත් ලේ වල අයිතිය නැති වෙන්නේ නැහැ" තුහංස පැවසුවේ ආවේගයෙනි.

"විශ්වාස නම් විතරක්" සස්වින්දි පැවසුවේ සෙමින්ය.

"විශ්වාසයි... ඉරහඳ වගේ වගේ විශ්වාසයි... බකමීමල්දෙණිය ලේ මට අඳුරන්න පුළුවන්" තුහංස හඬින් කීවේය.

"නැති වෙන්නේ නැති අයිතියක් හිතුවත් නැති කරන්න බැහැ කියලා මම දන්නවා" සස්වින්දි තුහංසගෙන් අත මුදා ගනිමින් කීවාය.

"හංසී..." තුහංසගේ ආමන්ත්‍රණයට ළයනි නැවතත් දෑස් විසල් කළාය.

"මනුස්සයෙක්ගේ ඔළුවට පිස්තෝලයක් තියන්න මගේ තාත්තිට හයියක් නැති වෙයි හංස... බය වෙන්න එපා" එවර ළයනි සැනින් සස්වින්දි දෙස බැලුවාය.

හංස... එසේ නම් සර් සස්විගේ හිටපු සැමියාය... දරුවන්ගේ පියාය... තුහස් ඒ හැඩ රුව ගත්තේ ඒ නිසාය.... ළයනිට වැටහිණි.

"මනෝජ් අංකල් අද මගේ ඔළුවට පිස්තෝලේ තිබ්බොත් විතරක් නෙවෙයි කොකා ගැස්සුවත් මට මොනවත් කියන්න බැහැ හංසී... ඒත්... තවත් ඔයාට ප්‍රශ්න ඇති කරන්න මම කැමති

නැහැ"

අයිෂාදි හෝ සුසිල් තමාට යම් කරදරයක් කරනු ඇතැයි තුහංස සිතන්නට ඇතැයි සස්වින්දි සිතුවාය. එහෙත් තුහංස සිතුවේ ඇයගේ සැමියාගෙන් ඇයට ප්‍රශ්නයක් ඇතිවේ යැයි සිතාය.

"එහෙනම් ඔයා ළයනිලාගේ ගෙදරට යන්න... මම එන්නම්" සස්වින්දි වාහනයෙන් බැස ගත්තාය. තුහංස නිහඬව වෑන් රථය ළයනිලාගේ නිවසට ගෙන ගියේය. එය නවතා ඔහු බැස ගත්තේය.

"එන්න සර් ගෙට... ගෙදර කවුරුවත් නැතුව ඇති"

"කමක් නැහැ... ළයනි නේද නම කිව්වේ"

"ඔව් සර්"

"මම අර ලී බංකුවේ ඉන්නම් ළයනි... එතන හොඳයි" තුහංස ලීබංකුව වෙතට ගියේය.

තුහංසගේ හදවත තවම ගැහෙන්නේ වේගයෙන් බව ඔහුට දැනිණි. මේ තරම් විශාල රහසක්... එසේ නම්... අනෙක් දරුවාද තමාගේය. ඇය තමාට දෙවතාවක් ගැබිණියක් බව කීවාය. එය නොසලකා මුසාවක් බව පවසා අත හැර දැම්මේ තමායි.

එසේ නම් ඇය රට ගියා යැයි පවසා තමාව මුලා කර ඇත. කළුපහන පැවසුවේ ඇය වසර ගනනාවක් මේ ආයතනයේ සේවය කළ බවයි. එසේ නම් ඇය ආපසු තමා වෙතට එන්නට ඇත්තේ මෙහි සිටයි.

එසේ නම් ඇයගේ සැමියා... එය පෙර විවාහයක්ද... පසු විවාහයක්ද... දරුවා... ඒ රුව... තමාගේ රුවයි... තමාගේ පෙර පාසලේදී ගත් පින්තූරයේත් ඔහුගේත් වෙනසක් නැත... දෙවැනි දරුවා... තමාගේද... ඔහුගේද... නැත... තමාගේම විය යුතුය.

කොතරම් අවලාද කීවද... අපහාස කළද... ඇය තමාට විශ්වාසය... ඇය තරම් විශ්වාසවන්ත ගැහැණියක් මෙලොව තමන්ට නැත්තේය.

ඔහුට තමා සස්වින්දි ගැන තියුම්ගෙන් ඇසූ මොහොතක ඇය පැවසූ යමක් සිහිවිය.

"තමුසේ අපේ අක්කිව දික්කසාද කරලා දැම්මට අපේ අක්කිව බාර ගන්න කැමති හොඳ කෙනෙක් ලොකු තාත්තට හම්බ වෙලා... එයා අපේ අක්කිව බැන්දා... ආය එයා ගැන හොයන්න එපා"

"මම දන්නවා හංසි ආය බඳින්නේ නැහැ කියලා" තමා එදා කෑගසා කීවේය.

"ඔව්... එයා මේ වෙනකල් ඔයා වෙනුවෙන් හිටියා... තවත් එහෙම ඉන්න ලොකු තාත්තා එයාට ඉඩ දෙන්නේ නැති වෙයි..."

තියුම් එසේ පවසා හරියට වසර දෙකයි මාස තුනකි. ඇය එසේ පැවසුවේ දික්කසාදයෙන් මසකට පසුවයි. සස්වින්දිගේ දරුවාට වසර දෙක ලැබුවේ ගිය මස බව ළයනි මොහොතකට පෙර පැවසුවාය. එසේ නම් ඒ දියණියද තමාගේය... තුහංස සිතුවේය.

මාගේ ලෙයින් හංසිගේ කුසින් දරුවන් දෙදෙනෙක්... තුහංසට කෑගසා එය සැමට ඇසෙන්නට කියන්නට සිතිණි.

සස්වින්දි තමා වෙතට එන්නට පෙරම සස්වින්දි වෙත ගිය තුහංස සහස්වී දෝතටම ගත්තේය. ඔහු ඇයව උඩ දමමින් සිප ගනිමින් සිනහා ගන්වද්දී සස්වින්දි පුදුමයෙන් ඔහු දෙස බලා සිටියාය.

මේ තමාගේ හංස නොවේ... තමාගේ සැමියා වූ ඒ මදාවියා නොවේ... දරුවෙකු කුසේ සිටින බව පවසද්දී දෙවතාවක්ම විශ්වාස නොකළ දෙවන වතාවේදී තමාට අවමන් කොට එය අමතක කර දැමූ ඔහු මොහු නොවේ... ඔහුට මෙලෙසින් දරුවෙකු සිප ගන්නට හුරතල් කරන්නට හැකියාවක් තිබුණේ නැත

"හොඳට පුරුදුයි නේද ළමයි හුරතල් කරලා"

"හ්ම්... ගෙදර දෙකක්ම ඉන්නවනේ"

සස්වින්දි පෙරදා කාර්යාලයේදී හිමාෂා පැවසූ නිවුන් දරු කතාව සිහි විය. කවුරුන් හෝ පවසද්දී එය අසා දරා සිටියද... ඔහුගේ කටින්ම එය ඇසෙද්දී සස්වින්දි ඉවසුම් නොදෙන්නට වූවාය. එහෙත් ඇය ආයාසයෙන් එය දරා ගත්තාය.

"හංසි... මේකි නම් ඔයා වගේමයි... දශමයක්වත් වෙනස් නැහැ" තුහංස කීවේය.

"අයිෂාදිට ඉන්නේ තිවුන්නුද" ඇය එය නොඇසුණු ලෙසින් ඇසුවාය.

"හ්ම්... අපේ අම්මා බලන්නේ" පිටවන වදනක් වදනක් පාසා හිත පිච්චී යන්නේ යැයි සස්වින්දි සිතිණි.

"සර්ට තේ එකක් හදන්නද සස්වි" ළයනි ඈත සිටම ඇසුවාය.

"සර් තේ බොන්නේ නැහැ ළයනි... නැත්නම් මම හදන්න කියනවා... සර් බොන ඒවා අපට දෙන්න බැහැ" සස්වින්දි කීවාය.

"මම දැන් ඒවා බොන්නේ නැහැ හංසී... තේ බොනවා" සස්වින්දි බැලුවේ අදහාගත නොහැකිවයි.

"පු..දු..ම...යි" ඇය සෙමින් මිමිණුවාය.

"ඒත්... ඇත්තයි" ඔහු සිනාසුණේය.

"සර්ට තැඹිලි ගෙඩියක් කපාගෙන එන්නද" ළයනි ඈත සිටම ඇසුවාය. දෑස් හමු වූයේ මොහොතටය.

"කඩේකට ගිහින්ද" සස්වින්දිට සිනහා නැඟිණි.

"නැහැ ගෙදර තියනවා"

"එහෙනම් ගේන්න" තුහංස පවසද්දී සස්වින්දි ගොස් ලී බංකුවේ වාඩි වූවාය.

"ඔයා ගොඩාක් වෙනස් වෙලා හංස... අදහන්නත් බැහැ"

"වෙලාවකට මටත් මාව අදහන්න බැහැ හංසී... හිතන කොට... ඒත් මිනිහෙකුට බලාපොරොත්තුවක් ඇති වුණාම ඒ බලාපොරොත්තුව වෙනුවෙන් කරන්න බැරි දෙයක් නැහැ" තුහංස පැවසුවේ ලී බංකුවට කකුලක් තබා සස්වින්දි මැදිවන සේ සිට සහස්වි ඇයගේ ඇකයේ තබමිනි.

අඟලක් දෙකක් පරතරයෙන් වූ ඒ වත... රතු කම්මුල් කඳුළ දෑස්... සිප ගන්නට තුහංසට නොසිතුනා නොවේ...

එහෙත් හිතුවක්කාරවී ඇයව අපහසුවේ දැමිය නොහැක. මේ තමාට හිමි වස්තුවක් නොවේ... එම හිමි කම නැති කර ගත්තේ තමාමයි... තුහංසට තමා ගැනම කෝපයක් දැනුනේය.

"ඔයාගේ අයාලේ ජීවිතේට බලාපොරොත්තුවක් ඇති කර ගත්ත එකත් ලොකු දෙයක් හංස"

"ඒ බලාපොරොත්තුව ඉටු කර ගන්න ඕනේ නිසා ටික කාලයක් හරි ජීවත් වෙන්න හිතාගෙන මම අක්මාව පරිස්සම් කර ගන්න හිතුවා"

"ටික කාලයක්..." සස්වින්දි වෙව්ලා ගියත් කෙඳිරිල්ලක් ලෙසින් ඇසුවාය.

"මට සිරෝසිස් හැඳුනා හංසී" සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"බීපු බීමේ හැටියට අක්මාවක් තිබුණද කියන එකත් පුදුමයක්" සහස්වි නැවතත් තුහංස අතට පතින්නට උත්සහ කළාය.

"මගේ කෙල්ල... බට්ටිච්චී..." තුහංස ඇයව ගෙන සිප ගත්තේය.

"බලාපොරොත්තුවක් නිසා හරි ඔයා එහෙම හිතලා පරිස්සම් වෙන එක ලොකු දෙයක් හංස"

"කවුරු කියනදේ නැහැවුවත් මම බලාපොරොත්තු ඇති කරපු කෙනා කියනදේ අහන්න එපැයි" තුහංස සහස්විව නැවත සිනහා ගැන් වූවේය.

"මට හරි සතුටුයි හංස... ඔයා ගැන හිතන කොට"

"ඇයි මම ගැන සතුටු ඔයාට"

"ළමයි ගැන හරි ඔයා හිතනවනේ දැන්"

"නොහිතා කොහොමද මගේම දරුවෝ ඉන්නකොට"

"ඔයාට ළමයි කී දෙනෙක් ඉන්නවද"

"දෙන්නයි" තුහංස තුහස් හා සහස්වි හිත තබාගෙන කීවේය.

"ෂොක්..." සහස්වි නැවතත් හඬ නගා සිනාසුණාය.

"ඒ දෙන්නා වෙනුවෙන් හරි ඔයා වෙනස් වෙන්න හිතුව එක ලොකු දෙයක්"

"මම වෙනස් වුණේ එයාලා නිසා නෙවෙයි හංසී... එයාලගේ අම්මා නිසා"

තුහංස පැවසුවේ සස්වින්දිගේ දෑස දෙසම බලාගෙනය. ඒ ඔයා කියා නොකියායි... සස්වින්දි එය වටහා ගත්තේ වැරදියටයි. ඒ අයිෂාදි කියායි. සස්වින්දි දෑසට කඳුළු වුණද්දී එය වළකා ගන්නට උත්සහ කළාය.

ඒ කාලේ අයිෂාදි අක්කි හැම දේම මගෙන් අහලා කර ගත්තේ... එයාට බැරි වුණ හැමදේම කරලා දුන්නේ මම... ඒත් අද... මට කරන්න බැරි වුණ දෙයක් එයා කරලා... සස්වින්දි සිතුවාය.

"මගේ හැමදේම නැති වුණා හංසී... ඔයා අරන් දුන්න කෝටි එකහාමාර පවා... සුසිල් අංකල් ඒවත් ඔක්කොම අරගෙන කම්පැනියත් ලියාගෙන අයිෂාදිව ගෙනල්ලා අපේ ගෙදර දාලා චිතු අරගෙන යන්න ගියා"

"මොනවා... චිතු"

"ඔව්... මම ජීවිතේ පටන් ගත්තේ අයන්නේ ඉදලා... අම්මා මට දුන්නා කෝටි එකහා මාරක්... එයා ගාව තිබුණා කියලා ඒකෙන්"

මනෝජ්ගේ කීමට සජීවාගේ ගිණුමට සස්වින්දි බලහත් කාරයෙන් ඇයට ලැබූ කෝටි එකහාමාර බැර කළේ දික්කසාද දිනයේයි. ඇය එය තුහංසට දෙන්නට ඇතැයි සස්වින්දි සිතුවාය.

"මම අළුත් කම්පැනියක් පටන් ගත්තා නුවර... බ්‍රාන්ච් එකක් ඇරියා නුවරඑළියේ... මේ වත්ත ගත්තා... රහල් මගේ දකුණු අත වගේ ළං වෙලා හිටියා"

"ඔයාට කොහොමද රහල් හම්බ වුණේ"

"ෆෝන් නම්බර් එක හොයාගෙන මම ගියා එයාව හම්බ වෙන්න"

ළයනි තැඹිලි කපාගෙන ආවාය. ඒ මොහොතේ සස්වින්දි සහස්වි ගන්න උත්සහ කළද ඇය සස්වින්දි අතට නාවාය.

"මෙයා බලන්නකෝ" ළයනි ඇය දෙස බලා කීවාය.

"ඒක තමා... නටන හැටි... අතට එන්නෙත් නැහැ" සස්වින්දි බලෙන්ම ඇයව ගත්තාය. ඒ මොහොතේ ළයනි දුටුවේ ඔවුන් වෙතට එන තුහස්වයි.

"සස්වී ආන් හොයාගෙන එනවා"

"හ්ම්..."

"ඒයි... මෙහෙ මොකද... පාර වැරදිලාද මෙහෙ එන්නේ" ළයනි තුහස්ගෙන් ඇසුවේය.

"තාත්ති ටවුමට ගියා... ඒකයි ආවේ... ළයනි නැන්දා මේ... එන්න එපා... මම ආවේ මගේ අම්මිව බලන්න"

"ඉතින් මේක මගේ ගෙදර... එන කොට අහන්න මට බැරිද"

"ඕනේ කෙනෙක්ගෙන් අහ ගන්න... මගෙන් අහන්න එන්න එපා දන්නවද... බෙල්ල ගලවලා අතේ තියා ගන්න තමයි"

"කෙරුමා මෙයා" තුහස්ට සිනාසෙමින් කී ළයනි

"මම තව තැඹිලි ගෙඩියක් ගේන්නම්" එතැනින් ඉවත ගියාය.

තුහස් පැමිණ සස්වින්දිට තුරුලු වෙද්දී තුහංස ඔහුව තුරුලට ගෙන කිහිප වරක් සිප ගත්තේය.

"ඔයා කවුද" තුහස් තුහංසගෙන් ඇසුවේය. තුහංස වහා සස්වින්දි දෙස බැලුවේය.

"පණ්ඩිතයා වගේ ප්‍රශ්න අහනවා මෙතන වැඩිහිටියන්ගෙන්... මම කියලා තියනවා ඔයාට" සස්වින්දි තුහස්ට සැරයක් දැමුවේ වූ අපහසුව මඟ හරවා ගැනීමටයි.

සිටින්නේ පියා වුවත් එය පැවසීමට තමාට හැකිද... තුහංස කුමන ප්‍රතිචාරයක් දක්වයිද... ඇයට සිතිණි.

"බනින්න එපා දරුවට... මම තුහංස සස්වින්ද බක්මීමල්දෙණිය..." තුහස් දෑස් විසල් කොට තුහංස දෙස බලා සිටියේය.

"ඔයා කවුද" දරුවාගේ සිතුවිල්ල බිඳ හෙළීමට සිතා තුහංස ඔහුගෙන් ඇසුවේය.

"තුහස් සස්දෙව් බක්මීමල්දෙණිය..." සෙමින් ඔහු දෙස බලා කියූ ඔහු යමක් සිහි වූවාක් මෙන් තිගැස්සී

"ඔයා මගේ තාත්තිද" හඬින් ඇසුවේය. සස්වින්දි තිගැස්සිණි. ඔහු මෙවෙනි පැණයක් අසාවියැයි ඇය සිහිනෙකින්වත් නොසිතුවාය.

"තාත්ති හැම වෙලාවෙම කියනවා මම එයාට තාත්ති කිව්වට එයා මගේ තාත්ති නෙවෙයි කියලා... ඔයා නේද මගේ තාත්තී..." තුහංසට තවත් ඉවසා සිටිය නොහැකිවිය. ඔහු තුහස් ඔසවා ළයට තබා තද කරගෙන ආවේගයෙන් සිප ගත්තේය. සස්වින්දි දෑසේ කඳුළු පිසදා ගත්තාය.

"මෙන්න... මදාවියාටත් තැඹිලි ගෙඩියක් ගෙනාවා මම" ළයනි තැඹිලි ගෙඩිය සස්වින්දි අසල තබමින් කීවාය.

"ළයනි නැන්දි මේ... එන්න එපා මට මදාවියා කියන්න... මගේ තාත්තිත් ඉන්නවා" තුහස් කෝපයෙන් කීවේය.

"අපි බය වෙයි... මෙයාගේ තාත්තිට"

"ආ... බය නොවී ඉන්න වෙයි... අම්මි හැමවෙලේම කියනවා නේද... තාත්තා වගේම මදාවියා කියලා මට... එතකොට මගේ තාත්තී... කවුද කියලා ඔයාට පේයි... පරිස්සමින්"

තුහස් වැඩිහිටියෙකු පරිද්දෙන් කීවේ සැම සිනා ගස්සවමින්ය. සිනහවක් නැඟුණද සස්වින්දිගේ සිනහව මොහොතකින් වියැකී ගියාය.

තමා දරුවා සෑදුවේ හිතුමතේටයි. පියා ඔහු වුවද නම දුන්නේ ඔහු නොදැනවත්වයි. බක්මීමල්දෙණිය ලේ කෝටිපති හිමිකාරයෝය. තුහස් තුහංස තම පියා ලෙසින් පිළිගැනීමෙන් තුහංස කෝප ගනී යැයි ඇය බිය වූවාය.

"එන්න යන්න මේක බීලා පලලා කමු අපි දෙන්න" ළයනි තුහස් අඬගසා ගත්තාය. ඔවුන් නොපෙනී යන තුරු ඔහු දෙස

බලා සිටි තුහංස සස්වින්දි ගේ වතට එබුණේය. සස්වින්දි ඔහු දෙස බැලුවේ බියෙනි.

"එයත් එහෙනම් එයාගේ තාත්ති වගේම මදාවියෙක්... එහෙමද හංසී" ඔහු ඇසුවේ ඇය දෙසම බලාගෙනයි.

"සො..සො..රි හංස... එයා.. එයා... එදා ඉඳලම එයාගේ තාත්තිව හොයනවා...ඒකයි එයා ඔයා..." සස්වින්දිට ඉකි ගැසිණි.

"හංසී..." කියූ තුහංස ඇයගේ කරවටා අත දමාගෙන ඇය අසලින් වාඩි වූවේය.

"ඔයාට ප්‍රශ්නයක් නැත්නම් හංසී... එයාට විතරක් නෙවෙයි මම මේ මුළු ලෝකෙටම කියන්න කැමතියි... මම එයාගේ තාත්තා කියලා" සස්වින්දි අදහා ගත නොහැකිව බලා සිටියාය.

"ඔයා දන්නවද... අද දවස තමයි මගේ ජීවිතේ සතුටුම දවස... හංසී... තාත්තා කෙනෙක් කියන හැඟීම... ආඩම්බරයක්... ලොකු ආඩම්බරයක්..." තුහංස තවත් තදින් සස්වින්දිව ඔහුට තෙරපා ගත්තේය.

"ඔයා දන්නවද... තුහස් දකින කොට මට අදහන්න බැරි වුණා... එයා මගේ කියන්න... මගේ ලේ කියන්න... මට කිසිම සාක්ෂියක් ඕනේ නැහැ හංසී... අර ගෙදර තියන මගේ මොන්ටිසෝරි පින්තූරේ... ඒ ඉන්නේ තුහස් නේද"

"මම ඔයාලගේ ගෙදර ඉන්න කාලේ ඒ පින්තූරේ දිහා බලලා තමයි සැනසීමක් ගත්තේ... මට කොල්ලා දැක්කා හා සමාන වුණා ඒ පින්තූරේ දැක්කම"

"ඔයා මට මෙච්චර දෙයක් හැංගුවා හංසී... ඒත් මට බැහැ ඔයාට ඒකට දොස් කියන්න"

"ඔයා මාවයි රහල්වයි සැක කළාට මම ආවේ නුවර රහල් හම්බ වෙන්න නෙවෙයි... තුහස්ව බලලා යන්න" තුහංස එයට කිසිත් නොකියා සස්වින්දිගේ උරය තෙරපුවේ ආවේගය මැඩපවත්වා ගැනීමටයි.

සහස්වි හඬමින් සස්වින්දිගේ ත නයට පොර කෑවෙන් සස්වින්දි ඇයගේ මුවට තනය තබද්දී තුහංස අත මුදාගෙන සහස්වි දෙස බැලුවේය.

"මේ කෙලි පැටික්කී... එයා කවුද" තුහංස ඇසුවේය.

"සහස්වි තුල්මා" සස්වින්දි බක්මීමල්දෙණිය යන්න නොකීවාය.

ඇයට නම දුන්නේ තුහංසට කසාද අයිතියක් නැතිවයි. තමා විවාහ වී සිටින බවත් ඔහු සිතාගෙන සිටී. තුහස් පිළිගත්තද ඔහු සහස්වි පිළිගනී යැයි විශ්වාසයක් සස්වින්දි තුල නොවීය.

"ඔයා මට ඉඩ දෙනවනම් මම බොහොම ආඩම්බරයෙන් කියන්න කැමතියි ඒ මගේ පුතා... මේ මගේ දුව කියලා" තුහංස සහස්වි සිපගනිමින් කීවේය.

ඔහුගේ කීමට සස්වින්දි දැනුනේ සැනසීමක් වුවත් ඔහුගේ සුසුමෙන් ළයට දැනුණු උණුසුමත් රැවුල් කොට ඇනීමෙන් දැනුණු කිතියත් සස්වින්දිව නොසන්සුන් කළාය.

ඔහු ගැන ආගන්තුක හැඟීමක් දැනෙද්දී ඔහු ගැන දැඩි ලෝභකමකින් මෙන්ම ශෝකයකින් හද පිරී ගියාය. ඇය වහා ළය වසා ගත්තාය.

එලෙසින්ම ඇයගේ අහිමිවීම මෙන්ම ඇයට තවදුරටත් හිමිකම් කීමට නොහැකි බව වැටහෙද්දී තුහංසගේ හදවතටද දැනුනේ දරාගත නොහැකි වේදනාවකි.

ඔයා මගේ නොවුණත් මේ විදිහට හරි මගේ ඉස්සරහා ඉන්නවනම් ඔයා ඉන්නේ සතුටින්නම් මට ජීවත් වෙන්න හිතෙයි... මගේ හිතට සැනසීමක් දැනෙයි හංසී... තුහංස ශෝකයෙන් මුමුණා ගත්තේය.

"දුවට මම දන්නේ නැහැ... ඒත් පුතාට මම කියන්නම් මම එයාගේ තාත්ති කියලා"

"ඔයාට ප්‍රශ්නයක් නොවෙයි නම්..."

"මගේ දරුවෝ මගේ කියන එක මට ප්‍රශ්නයක් නෙවෙයි හංසී"

"එහෙනම් දවසක සහස්වි තුල්මා බක්මීමල්දෙණියත් එයාගේ අයියා වගේ ඔයාගෙන් තාත්තිද කියලා අහනකොට ඔයාට ඔව් කියන්න පුළුවන් වෙයි"

"තැන්කස් හංසී... තැන්ක්යූ වෙරි මච්... ඔයා මට මගේ අයිතිය දුන්නට" තුහංස සස්වින්දිගේ අත දෑතින්ම අල්වාගෙන එය සිප ගනිමින් කීවේය.

"දැන් එයාලගේ තාත්ති ඒකට ප්‍රශ්නයක් ඇති කරලා ඔයාට කරදර කරයිද හංසී"

"නැහැ හංස... ඔයා ඒ ගැන බය වෙන්න එපා... එයාලා තාත්ති කියන තාත්තා හැමදේම දන්නවා" සස්වින්දි සිය පියා සිහිගන්වා ගනිමින් කීවාය. තුහංස හිතේ දුක සුසුමකින් දරා ගැනීමට උත්සහ කළේය.

"මට මේ දෙන්නා බලන්න එන්න ඕනේ හංසී... මම මෙහාට එන්නද"

"මෙහෙට එන්න එපා හංස... මම ඉද හිටලා කොහොට හරි මෙයාලාව අරගෙන එන්නම්"

"තුහස්ව අනිද්දා ඔෆිස් එක්කන් එන්නකෝ... මම අනිද්දා ආය මෙහෙට එනවා"

"හොඳට තියෙයි... තුහස් තාත්ති කිය කිය නටන්න ගත්තම... තාත්තා වගේම තමා පුතත්... මහ හිතුවක්කාර මදාවියෙක්"

"ලොකු වෙනකොට සෙවිල්ලෙන් ඉන්න වෙයි එහෙනම්... පරිස්සමට"

"ඔව්... තාත්ති වගේ කෙල්ලෝ උස්සලා පිස්තෝලේ තියලා ඇඳට නංව ගයිද කියන්නත් බැහැ තමා" සස්වින්දි සිනාසෙමින් කීවාය. තුහංස එයට හඬින් සිනාසුණද මොහොතකින් එය වියකා ගත්තේය. සස්වින්දි ඔහු දෙස බැලුවාය.

"මම ඔයා විනාශ කළා කෙල්ලේ... ගොඩාක් දුක් දුන්නා... අද මම ගොඩාක් පසු තැවෙනවා ඒ ගැන"

"හිතන්න එපා හංස... වෙන්න තියන දේවල්... මාත් පසු තැවෙනවා ඔයා ගැන... මම ඔයාව නැතිකර ගත්ත එක ගැන "

"මම ගැන... මේ මම ගැන... ඔයාට වෛරකරපු මම ගැන" තුහංස පුදුමයෙන් ඇසුවේය.

"ඔව් හංස... ඔයා විතරක් නෙවෙයි මාත් වැරදියි... අපි අපිට වෛර කළා... ආදරේ කරන්න හදවතින් ළං වෙන්න අපි උත්සහ කළේ නැහැ... ඔයාටවත් මටවත් ඕන කමක් තිබුණේත් නැහැ... ඒ නිසා තමයි අපි අපිට නැති වුණේ" සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"අපි දැන් පරක්කුයි රත්තරන්..." තුහංසද දෑසට කඳුළු පුරවාගෙන සස්වින්දිගේ හිස අත ගෑවේය. හඬා වැටුණු සස්වින්දි නිදා සිටි සහස්විද තුරුලට ගෙන ඔහුට ළං වූවාය.

"මම මේ වෙනකල් ඔයාට කළේ වැරදි වැඩ රත්තරන්... තවදුරටත් මම එහෙම කරන්නේ නැහැ"

"මම ඔයාට වෛර කරද්දී මගේ ලේ විනාශ නොකොට ලේ වලට වැරැද්දක් නොකර මගේ දරු පැටව් දෙන්නෙක් හදා ගත්තා... මගේ අයිතිය නැති නොකර ඒ අයිතියත් දුන්නා... මම ණය ගැතියි හංසී... ජීවිතේටම මම ඔයාට ණය ගැතියි" සහස්වී සිප අනතුරුව සස්වින්දිගේ නළලද සිප ගත් තුහංස ඇය දෙස මොහොතක් බලා සිට සමු ගත්තේය.

"ගිහින් එන්නම් හංසී"

"බුදුසරණයි හංස"

දරු පැටව් දෙන්නා තුරුල් කර ගෙන ඔයා එක්ක එක කැඳැල්ලක ඉන්න මට පිනක් නැති වුණා හංසී... මට එහෙම ඉන්න තිබුණ නම්... තුහංස කොඳුරා ගත්තේය.

ඔයා වෙනස් වෙලා හංස... හොඳටම වෙනස් වෙලා... ඔයා එක්ක දරු පැටව් දෙන්නත් තියාගෙන එකම කැඳැල්ලක ඉන්න මට තිබුණනම්... මගේ ජීවිතේ අඩුවක් නැති වෙයි... සස්වින්දිද සිතා ගත්තාය.

"තාත්ති මොනවද මගේ පුතාට එනකොට ගේන්න ඕනේ" තුහස්ව වඩා ගනිමින් තුහංස ඇසුවේය.

"ඔයා ආය එනවද"

"මම පුතා බලන්න එන්නම්"

"හා..." තුහස්ගේ වතම සිනහවකින් පිරිණි.

තුහස්ව නොනවත්වා සිප ගෙන තුහංස ඔහුව අත හැර දැමුවේ දැඩි ලෝභ කමෙනි. ඔහු රථයට නැගෙද්දී තුහස්ද ඔහුගේ සුරතේ එල්ලී රථයට නැගුණේය.

"යමුද මාත් එක්ක "

"හා" තුහංසට කියූ ඔහු

"අම්මී... මම මගෙ තාත්ති එක්ක යනවා" සස්වින්දි හඬින් කීවේය. සස්වින්දි එතැනට දිව ආවේ මොහොතටයි. තුහංස ඔහුව ගෙන යා යැයි ඇය බිය වූවාය.

"අම්මි දුවගෙන ආවේ බයෙන් පැටියෝ... අන්න නංගිත් අඬනවා... මම ඔයාව වෙන දවසක එක්ක යන්නම්"

"බැහැ... මට යන්න ඕනේ"

"රත්තරනේ... බහින්නකෝ"

"බැහැ... මට බැහැ... තාත්තී... අපි යමු"

"හරි... එහෙනම් හොඳ පැටියා වගේ ගේ ළඟ බහින්න... තාත්ති එන්නම් ඔයාව දිග... රවුමක් ගෙනියන්න"

"කවද්ද"

"ම... අම්මි කියයි" තුහංස සස්වින්දි දෙස බලා කීවේය.

"කවද්ද අම්මී" ඔහු සස්වින්දි ගෙන් ඇසුවේය.

"බහින්නකෝ කියන්න" සස්වින්දි සූදානම් වූයේ ඒ ඇසිල්ලේ ඔහුව බස්සවා ගන්නයි"

"අතෙන්ට යමුකෝ" ගේට්ටුව පෙන් වූ ඔහු එතැන බැස සස්වින්දි වෙතට දිව ආවේය.

"කවද්ද යන්නේ... අම්මී... කියන්නකෝ"

"හරි... මම කල්පනා කරලා බලලා කියන්නම්... එතකල් හොඳ පුතාවගේ අතෙන්ට ගිහින් බලන්න තාත්ති යනවා පේනවද කියලා"

"තුහස් දිව යද්දී එතැනට පැමිණි ළයනි සස්වින්දි අත වූ සහස්විව අතට ගත්තාය.

"මූණවත් බලන්න වටින ගෑනියක් නෙවෙයි උඹ" ළයනි කීවාය.

"බැනපන්... ඇති වෙනකල් බැනපන්... මම තරහා නැහැ"

"මම අහුවිචා රහල් සර්ගේ යාළුවෙක්ද කියලත්"

"ඉතින් මම කිව්වනේ යාළුවෙක් කියලා" සස්වින්දි මදක් සිනාසෙමින් කීවාය.

"ඒත් ඒ උඹේ හංස කියලා කිව්වේ නැහැනේ... එදා එහෙනම් ඒකයි මෙයා දූලංගිව තියාගෙන පුද්ගලික කතා බහ කරලා තියෙන්නේ"

"මම උඹට කිව්වනම් ඒ හංස කියලා උඹ පිළිගයිද"

"උඹ ඉතින් මට කිව්වේ ටැටූ ගහපු මාල බැන්ඩ් දාපු මැර පාට මදාවියෙක් කියලනේ"

"හ්ම්... ඒ හංස තමා අද ඔය ඔහොම ඉන්නේ... අදහන්නත් බැහැ"

"මිනිස්සු වෙනස් වෙනවා"

"ඔව්... ඒත් හංසගේ මේ වෙනස් වීම... ඉස්සරෝම දකින කොට මම වෙනසක් දැක්කා... ඒත් මෙහෙම වෙනසක් මම හීනෙකින්වත් හිතුවේ නැහැ" සස්වින්දි දෑසට කඳුළු පුරවා ගනිමින් කීවාය. ළයනි ළංව ඇයගේ සුරත අල්වා ගත්තාය.

"උඹට දුකද"

"නැද්ද බං... ඒ මගේ දරුවන්ගේ තාත්තා... මගේ මහත්තයා... මට අයිති නැහැ... වෙනත් ගෑනියෙකුට සැමියා වෙලා... ඒ දරුවන්ට තාත්තා වෙලා" සස්වින්දි කඳුළු පිසදා ගත්තාය.

"මම එයාව ආදරෙන් හදා ගන්න කවදාවත් උත්සහ කළේ නැහැ... දඬුවම් දුන්නා විතරයි... මම එයාට අදරේ කරලා එයාට ළං වෙලා එයාව හදා ගන්න උත්සහ කළා නම් අද හංස මගේ... මගේ ළඟ ළයනි" සස්වින්දි මහා විලාපයක් නගමින් ළයනිගේ කර මතට කඩා වැටුණාය.

ඇයගේ හඬට බිය වූ සහස්වි විලාප තැබුවාය. ඇයව දෑතට ගත් සස්වින්දි ඇයව සිප ළය මත තබා ගත්තාය.

"ආය මට මගේ දරුවෝ ගැන දුක නැහැ ළයනි... හංස එයාලව පිළි ගත්තා කියන්නේ අත අරින එකක් නැහැ... මට මැරෙන්න වුණත් බය නැහැ දැන්" සස්වින්දි පැවසුවේ සැනසීමෙනි.

තුහස් දමා පිටව ආවද ආපසු ගොස් සස්වින්දි හා දරු දෙදෙනා නිවසට ගෙන ඒමට තුහංසට නොසිතුණා නොවේ. ඔහු ආයාසයෙන් එම හැඟීම යටපත් කර ගත්තේය. ඔහු රහල්ට ඇමතුමක් ලබා ගත්තේ වාහනය පසෙකට කර නවතා ඇන්ජිමත් නිවා දමායි.

"හලෝව්"

"මචං රහලා"

"මොකද බං තදියමෙන්"

"රහලා... උඹ දන්නවද... උඹ දන්නවද මචං මට ළමයි දෙන්නෙක් ඉන්නවා කියලා... මගේ... මගේ ලේ වලින්"

"උඹට හරියටම කියන්න පුළුවන්ද"

"ඔව් මචං... හංසී... ඒකි මගේ... දැන් නැති වුණාට... කොල්ලයි කෙල්ලයි... කොල්ලට පහයි... මමමයි... එතකොට සහස්වි... මගේ කෙල්ල... ඒකිට දෙකයි... හංසිමයි මචං" තුහංස නොයිවසිල්ලෙන් කියවාගෙන ගියේය.

"ආ... හංසිට දෙකයිද... මම හිතන්නේ උඹේ ෂෝට් කට් තව ඇති බං... ඔය වගේ ඉස්සරහට හම්බ වෙයි"

"වලත්ත.... " තුහංස පැවසුවේ කුණුහරුපයකි.

"මට ඔය නම කිව්වට උඹ නටපු නැටුම් මතක් කරපන්... අර උඹේ බංගලාවට ගෙනියපු ගෑනු මතක් කරපන්... මේ උඹ මට කියපුවා විතරයි"

"මම ගෑනු ගෙනියව්වා කිව්වට හංසි ඇරෙන්න වෙන එක ...නියක් එක්ක හිටියා කියලා කියලා තියනවද"

"කිව්වේ නැති වුණාට හිටියාද කවුද දන්නේ"

"උඹට මම..." රහල් අමතුම විසන්ධි කළේය.

ඔහොම යමු යාළුවා... මටත් ඕනේ කම තිබුණේ උඹව ඔතෙන්ට ගේන්න තමා මචං... රහල් සිතුවේය.

තුහංස නොනවත්වා දුරකථනය නාද කළේය. ඔහු දරුවන් නිසාවෙන් සිටින්නේ අපමණ සතුටකින් බව රහල් වටහා ගත්තේය. ඔහු සතුට සිතහව වළකාගෙන ඇමතුමට සම්බන්ධ වූවේය.

"උඹට ඔය ගෑනු දරුවෝ ගැන කියවන්න වෙලා තිබුණට මට අහන්න වෙලා නැහැ" ඔහු කෝපාකාරී හඬක් මවාගෙන කීවේය.

"තොට ඊෂ්‍යාව... හංසි මගෙනේ... ඒකි මගේ දරුවන්ගේ අම්මා... දෙන්නෙක්ගේ... එකෙකක්ගේ නෙවෙයි"

"ඒ කාලේ ගෑනි වුණාට දැන් හංසි උඹේ ගෑනි නෙවෙයිනේ"

"ඒ වුණාට මගේ දරුවන්ගේ අම්මා කියන එක වෙනස් කරන්න බැහැනේ"

"ඒක හරි... ඕඩර් එක දුන්නද... උස්සගෙන වරෙන් කියලා... ඒකි පිණි ජම්බුව වගේ ඉන්න කොට තොට ඉවසන්න බැරි වෙන්න ඇතිනේ"

"ඒ හංස මැරුණා මචං"

"නැහැ... මැරිල නම් ඒකි හොයාගෙන යන්නේ නැහැ කියලා මට කියලා... හොයාගෙන යයිද"

"රහලා... අහපන් මචං"

"හංසයා... උඹ හැදිලා නැහැ... උඹ හංසි ගැන තාමත් හිතන්නේ නැහැ"

"හිතනවා මචං... හිතනවා... උඹ කිව්වේ ඇත්ත... ඒකි පිණි ජම්බුව වගේ තවත් ලස්සන වෙලා... මට ඉවසන්න බැහැ තමයි... ඒත් ඉවසුවා මගේ නෙවෙයි නිසා... කෙල්ලක් උස්සපු

මට ගෑනියක් කජ්ජක් නෙවෙයි මචං" රහල්ට ඇ...
සිතහව වළකා ගත්තේය.

"කොල්ලා... උඹ දන්නවද මගේ එක්ක ගෙදර එන්න ආවා... කෙල්ල... හිනා වෙවී මගේ අතට එන්න පොරේ"

"උඹ කොහොමද එහෙ ගියේ... හංසි උඹට එන්න දුන්නද"

තුහංස වූ සිදුවීම අකුරක් නෑර රහල්ට කීවේය.

"එහෙනම් උඹ නලියන්නේ නැතුව හංසි උඹට දරුවෝ ගෙනත් දෙනකල් හිටපන්"

"අමාරුම දේ ඒක... ඒත් ඉවසන්නම්"

"තොට අමාරුම දේ ඒක නෙවෙයි වෙන එකක් කියලා මම දන්නවා... ඒකටත් උඹ ඉක්මනට පාරක් කපා ගයි කියලා මට හිතෙනවා"

"නැහැ මචං... හංසි හදා ගත්ත ජීවිතේ මම අවුල් කරන්නේ නැහැ... ඒකිට ඒ මිනිහා ආදරේ නම් සලකනවනම්... ඒ සැනසීම මට ඇති"

"අප්පට හුඩු... කවදාද බං උඹේ ශබ්ද කෝෂයට ඔය වගේ වචන ආවේ"

"......... මම කියන්නේ නැහැ" තුහංස කෝපයෙන් දුරකථනය තැබුවේය.

අයිෂාදිගේ නිවුන් දරුවන්ට ගත් මිදි ඇපල් මල්ලට තවත් මල්ලක් එක්කර ගත නොහැකි කමට ඔහු පසුතැවිල්ලක් වූවේය.

රාත්‍රියේ සස්වින්දිව ඇමතූ ඔහු ඇයට තමාගේ පැමිණීමෙන් ගැටලුවක් ඇති වූයේ දැයි විමසුවේය.

එහෙම ගැලුවක් නම් වුණේ නැහැ හංස... මම හැමදේම කිව්වා"

"මනෝජ් අංකල් මට බනින්න ඇති"

"ම්... නැහැ... තුහස් දඟලපු දැඟලිල්ලට එයා මොකුත් කිව්වේ නැහැ"

"ඔයාගේ මහත්තයා"

"ඔයා කියන්නකෝ... සජීවා ආන්ටිට බබාලා ගැන කිව්වද"

"නැහැ හංසී... මම අම්මට මොනවත් කිව්වේ නැහැ... ඔයාට ප්‍රශ්නයක්ද බලන්න මම ගත්තේ"

"හංස..."

"කියන්න කෙල්ලේ" ඔහුගේ ආදරණීය ආමන්ත්‍රණයට සස්වින්දිට ශෝකයක් දැනුනාය.

"අපි හිටිය විදිහටම ඉදිරියටත් ඔෆිස් එකේ ඉමු හංස... කලින් ඉස්සර කරපු දේවල් ආය කරන්න උත්සහ කරන්න එපා... තනි මම හැමදේම විඳ ගත්තා... දැන් දරුවෝ ගැන මම හිතන්න ඕනේ"

"නැහැ රත්තරන්... මම දැන් ඔයාට ආදරෙයි මගෙ අම්මී... ඒ නිසා මම ඔයාට දරුවන්ට ප්‍රශ්නයක් වෙන්න ඉඩ තියන්නේ නැහැ" සස්වින්දිගේ හදවතම දවාලමින් තුහංස කීවේය.

"ඔයා මට අදරේ කරන්න මේ තරමට පරක්කු වුණේ ඇයි හංස... ඒ නිසා නේද මට ඔයාව නැති වුණේ..." සස්වින්දි වේදනාවෙන් කීවාය.

"දෙයක් ළඟ තියන කොට ඒකේ වටිනාකම දැනෙන්නේ නැහැ හංසී... ඒක නැති වෙන්න ඕනේ වටිනාකම දැනෙන්න... මට වුණෙත් ඒක"

"දැන් ඕවා කතා කරලා වැඩක් නැහැ... අපේ දුක වැඩි වෙනවා විතරයි හංස"

"හ්ම්... දන්නවද... මම එදා අයිෂාදිට ඔයා කතා කරලා යනකොටම ඔයාගේ පස්සෙන් ආවා... ඔයා හම්බ වුණේ නැහැ... වෙලාව... පොඩ්ඩක් ලයින් එකේ ඉන්න හංසී" තුහංස කීවෙන් සස්වින්දි ඇමතුමේම සිටියාය.

"හංස... පුතාලා කොහෙද" සස්වින්දිට ඇසුණේ අයිෂාදිගේ හඬයි.

"අම්මා ගාව අයිෂාදි... බෙහෙත් පොවලා නැහැ... අමතක නොකර පොවන්න" තුහංස කීවේය.

"හංසී..." ඔහු දුරකථනය නැවත කන තබා ගත්තේය.

"දෝණි අඬනවා... මම තියන්නම් හංස" බොරුවක් කියූ ඇය ඇමතුම විසන්ධි කළාය.

හිතේ ආවේගයට දරුවන්ගේ අසරණකමට තුහංස පියා ලෙසින් හඳුන්වා දීමෙන් තමා කළේ වරදක් යැයි සස්වින්දි සිතුවාය.

ඔහු දරුවන් නිසාවෙන් තමාව හමුවීමට එනු ඇත. තමා ඔහු වෙතට දරුවන් ගෙන යන්නට පොරොන්දු වූවාය. අයිෂාදි එය දැන ගත් දිනයට... නිහඬ නොවනු ඇත.

ඇයගේ පියා පිටව ගියේ යැයි පැවසුවද ඔහු තුහංසගේ වත්කම් දේපොල අත නොහරිනු ඇත. ඒ දරුවන් දෙදෙනා අතර බෙදන්නට තිබූ කෝටි ගානක මුදල තම දරුවන්ටත් බෙදෙද්දී... ඔහු බලා නොසිටිණු ඇත. සස්වින්දිගේ ගතම කිලිපොලා ගියාය. හැඟීම් නිසාවෙන් තමා කරගත්තේ විශාල වරදක් බව සස්වින්දිට දැනිණි.

"හංස..." සස්වින්දි පසුදා තුහංස ඇමතුවේ බොහෝ දේවල් සිතා බැලීමෙන් අනතුරුවයි.

"ඇයි අම්මී..." ඒ ආමන්ත්‍රණයට සංවේදී වූ ඇය මොහොතක් ගොළු වූවාය.

"ඇයි හංසී... මගෙ කෙල්ලේ... ප්‍රශ්නයක්ද ඔයාට"

"ඔව් හංස" ඇය බිඳුණු හඬින් කීවාය.

"හංසී... අඬනවද ඔයා"

"මට ඔයාට කියන්න දෙයක් තියනවා හංස... අපි..."

"හංසී... කෙල්ලේ මම මීටින් එකක ඉන්නේ ඔයා නිසයි ගත්තේ... අපි හෙට කතා කරමු... මම හෙට ආකරපතනේ එනවා"

"ඔෆිස් එකේ කතා කරන්න මට බැහැ හංස... මම ඒකට කැමති නැහැ"

"එහෙනම් අපි කොහෙදි හරි හම්බ වෙමු"

"හම්බවෙමු..."

"බය වෙන්න එපා කෙල්ලේ මේ හංස වෙනස් වෙලා... පරණ හංස හිටිය නම් මේ වෙන කොට ඔයාව උස්සලා ඉවරයි... එහෙනම් තවත් එකක් වෙන්නත් පුළුවන්"

"එන්නම්"

"පුතාවයි දෝණිවයි ගේන්න බැරිද"

"අනේ හංස... ඒ ගැන කතා කරන්න තමයි මම ඔයාව හම්බ වෙන්න එන්නම් කිව්වේ"

"හංසී... ඒ මගේ දරුවෝ... ලේ වල වගේම නම් ගම්වල පවා අයිතිය මට තියනවා... අද මට ඇවිත් අරන් යන්න පුළුවන් මම ඒ දේ නොකළට" තුහංස පැවසුවේ කෝපයෙනි. සස්වින්දි නිහඬව සිටියාය.

"මාව කේන්ති කරන්න එපා කෙල්ලේ... දන්නවද හංසී... ඊයේ ඉඳලා හුස්ම වැටෙන මොහොතක් මොහොතක් ගානේ මට මතක් වෙන්නේ ඒ දෙන්නවයි ඔයාවයි"

"ඔයා වෙනස් වෙලා කියලා මම හිතුවා හංස... ඔයා ඔහොම හිතුවක්කාර විදිහට හැසිරුනොත් මම ආය යනවා යන්න"

"හරි... හරි... හෙට අපි කතා කරමු" සස්වින්දි දුරකථනය විසන්ධි කර ගත්තාය.

තුහංස කාර්යාලයට එද්දී සිනාසුණු ළයනි සස්වින්දිට ඉඟියක් දුන්නාය. අන් දිනවලට බිම බලාගෙන සිය කාමරයට යන තුහංස මෙදින සස්වින්දි දෙසම බලාගෙන කාර්යාල කාමරයට ගියේය.

"වැඩේ නම් අවුල් වෙයි වගේ පුතෝ" ළයනි රහසින් කීවාය.

"මම අද ගිහින් දෙකෙන් එකක් බේර ගන්නම්" සස්වින්දිද කීවේ රහසින්මය.

"අර ගිය සැරේ බේරන් එන්න ගියා වගේ බේරගන්න එහෙම ලෑස්ති වෙන්න එපා"

"එතකොට හංස මගේ ළයනි... දැන් හංස මගේ නෙවෙයි කියන්න මම දන්නවා"

"සස්වින්දි මිස්ට බොස් එන්න කිව්වා" කාර්යාල සේවකයා පැමිණ කීවේය.

සස්වින්දි තුහංසගේ කාමරයට යන විට දුලංගි එහි සිටියේ නැත. සස්වින්දිට බියක් නොදැනුනා නොවේ. ඇය වටපිට බැලුවේ ඒ නිසාය. කතා හදාගෙන තමා මෙහි බව අයිෂාදිට දැන ගන්නට ඉඩ සැලැස්ස විය යුතු නොවේ. තුහංස බලා සිටියේ ඇයගේ මේ කලබලය දෙසයි.

"මොකද හංසි මේ වෙලා තියෙන්නේ... බබෙක් වගේ" ඔහු ඇසුවේ නුරුස්සනා හඬකිනි.

"එදා මිස්ටර් කළුපහන හැම තැනම කියලා ප්‍රයිවට් කතාව ගැන... ඒක නැති වුණේ දුලංගි නිසා... දැන් දුලංගිත් මෙතන නැහැ"

"මම එක එකාට බය මිනිහෙක් නෙවෙයි හංසී"

"දන්නවා යකාටවත් බය නැහැ කියලා... කැලේ මාරු වුණාට සතාගේ පුල්ලි මාරු වෙලා නැහැ" සස්වින්දි කීවේ කෝපයෙනි. තුහංස නිහඬ විය. ඔහු සිය ලාච්චුවෙන් ගත් ලියුම් කවරයක් සස්වින්දිට දුන්නේය.

"මොනවද මේ"

"ඔයා එදා ලොන් එක ඇප්රූව් කරන්න ආව වෙලේ කිව්වෙ මොකද්ද මතක් කරන්න"

"මොකද්ද"

"ළමයිගේ වැඩ එයාලගේ තාත්තා බලා ගයි කියලා"

"ඉතින්..."

"මේකේ තියෙන්නේ බ්ලෑන්ක් චෙක් එකක්... ඔයාට ඕනේ ගාන දාගන්න"

"හංස..."

"හංසී... මොනවත් කියන්න එපා මට"

"ඔයා පොරොන්දු වුණා නේද"

"ඔව්... ඔයාගේ පැත්තෙන්... ඔයාගේ පවුල් ජීවිතේට මම හානියක් කරන්නේ නැහැ... ඒත්... මගේ දරුවන්ගේ පැත්තෙන්..."

"එක්ස්කියුස්මී සර්" පිටතින් දුලංගිගේ හඬ ඇසිණි.

"හෙට මට දෙන්නගේ බර්ත් සර්ටිෆිකේට් දෙක ගෙනල්ලා දෙන්න"

"බැහැ... " සස්වින්දි පැවසුවේ හිතුවක්කාර ලෙසයි.

"සර්ටිෆිකේට් දෙක මම ගත්තොත් ළමයි දෙන්නා මගේ ළඟ ඉදියි... ළමයින්ගේ අම්මටත් කසාදේ කඩාගෙන මගේ ළඟට එන්න වෙයි සමහර විට" කී තුහංස

"එන්න දුලංගී" කීවේය.

"හරි මිස්... එහෙනම් මම කිව්ව විදිහට කරන්න... තව පැය බාගෙකින් යන්න" දුලංගිට නොදැනෙන ලෙස හංසට රැවූ සස්වින්දි නැගී සිටියාය.

ආපහු පටන් ගත්තා මෙයා මාව නටවන්න... මමත් අහු වුණානේ... මගේ දරුවන්ට මොනවා වෙයිද... සස්වින්දි සිතුවාය.

"සස්වින්දි මිස්... මේ ලෙටර් එක... දාලා යන්නේ" තුහංස සස්වින්දි දමා ගිය චෙක්පත ඇමූ ලියුම් කවරය ඇයට දුන්නේය. ඇය එය දුලංගිට නොදැනෙන්න උදුරා ගත්තේ කෝපයෙනි. තුහංස සිනහව සඟවා ඇයට ඇසක් ගැසුවේය.

"වැඩිය දැඟලුවොත් ඉතින් දන්නවනේ" තුහංස සස්වින්දි දෙස බලා පැවසුවේ ඇය ඔහුගේ මෝටර් රථයට ගොඩ වූ මොහොතේයි.

"ඇයි ආයෙත් උස්සන්නද"

"බැරි කමක් නැහැ"

"අයිෂාදි මදිද"

"මදි නම් ඉතින් තව දෙක තුනක් ගත්තා... ප්‍රශ්නයක් නෙවෙයි මට"

"දන්නවා..."

"හංසී... කොහෙද අපි යන්නේ"

"කතා කරන්න මම ආවේ"

"දන්නවා... ඒකයි ඇහුව්වේ"

"පාලු තැනක කාරෙක නවත්ත ගමු... මට බයයි හංස... දැන් මට ප්‍රශ්න ඇති කර ගන්න බැහැ" සස්වින්දි දෑසට කඳුළු පුරවා ගනිමින් කීවාය.

තුහංස හිතුවේ ඇයගේ සැමියා නිසා ඇය එසේ පවසන බවය. තුහංස තදින් ඇයගේ සුරත අල්ලා ගත්තේය.

"බය වෙන්න එපා... මම ප්‍රශ්න ඇති කරන්නේ නැහැ"

"මට නම් කමක් නැහැ... අනේ මගේ දරු පැටව් දෙන්නා"

"ඔයාගේ විතරක් නෙවෙයිනේ හංසී... ඒ මගේත් දරුවෝ... එයාලට මොනවත් වෙන්න මම ඉඩ තියන්නේ නැහැ" තුහංස මෝටර් රථය පණ ගන්වා ගත්තේය.

"හංස... කොහෙද යන්නේ"

"පාරේ ඉන්න එක හොඳ නැහැ... අපි කොහේ හරි ඇතුලකට යමු"

"මිස්ටර් කළුපහන දැක්කොත් ඔක්කොටම හපන්"

"මිනිහා ගෑනි වගේනේ"

"ඒ ඕපා දූප හොයන්න විතරයි... අනෙක් වෙලාවට පිරිමිකම වැඩියි" තුහංස වාහනය නතර කළේය.

"ඇයි... ඔයාට මොකුත් කරදරයක්"

"ඔය ඉතින්... යමු"

"මම එහෙනම් ඕකගේ ගාන්නේ කොච්චි"

"කොහෙද" සස්වින්දි දඟකාරී ලෙස ඇසුවාය.

"උඹට මිනිහෙක් නොහිටියනම් පෙන්වනවා" තුහංස කීවේ ඇයව තවත් සිනහා ගන්වමිනි.

සැහැල්ලුවෙන් කෙලිදෙලෙන් හෝරා කිහිපයක් අවත්හලක ගත කළ දෙදෙනා සමුගත්තේ හිතේ දරාගත නොහැකි පසුතැවිල්ලක් වේදනාවක් කර පිත්තාගෙනයි.

"මම පොඩි එවුන් දෙන්නා අරන් පාක් එකට එන දවසට ඔයා මනෝජ් අංකල් එක්ක දෝණිවයි පුතාවයි පාක් එකට එවන්න... ඒක අපි දෙන්නටම හොඳයි" තුහංස කීවේ හැමදේ ගැනම සිතා බලායි.

# 10

තුහංසගේ ඉල්ලීමට සස්වින්දිට තවත් වතාවක් තුහංස හමුවීමට යාමට සිදු විය. දරුවන්ගේ කටයුත්තකට බව සඳහන් කළ ඔහු දරුවන්ගේ උප්පැන්න සහතික ද රැගෙන එන ලෙසට දැනුම් දුන්නේය.

"අනේ මන්දා ළයනි... මේ හංසගේ වැඩ නිසා මට මහා බයක් දැනෙනවා... මම කර ගත්තේ මෝඩකමක්ද කියලත් හිතෙනවා" තුහංස හමුවට යාමට සූදානම් වී සස්වින්දි කීවාය.

"එහෙම හිතන්න එපා සස්වි... කරන හැම දෙයක්ම දරුවෝ දෙන්නටනේ" ළයනි ඇයගේ හිතේ බිය නැති කරන්නට උත්සහ කළාය.

මෝටර් රථයේ තුහංස ඇතැයි සිතා සස්වින්දි පැමිණ මෝටර් රථයට ගොඩ වූවාය. එහි සිටි පුද්ගලයා දුටු ඇයගේ හිතම විසිරී ගියාය. සියුම් ලැජ්ජාවක්ද ඇයට දැනිණි.

"රහල්..." ඇය කෙඳිරුමක් ලෙසින් ඔහු ඇමතීය.

"හංස කියන්නේ මගේ දරුවන්ගේ තාත්තා කියන එක මට නැති කරන්න බැහැ රහල්"

"ඔයයි මමයි අතරට හංස කෙනෙක් අවශ්‍ය නැහැ සස්වී... අපි ඒක තීරණය කරලා ගොඩ කල් නේද"

"හ්ම... මගෙන් ඔයාට වුණ වැරැද්ද ගැන මම පසු තැවෙනවා රහල්... ඒකට මට සමාවෙන්න... වුණදේ ඔයා

තේරුම් ගන්න ඇති නේද... හංස ඔයාට කියලා ඇති"

"ඔයා මට වැරැද්දක් කළා කියලා මම හිතන්නේ නැහැ හංසී... ඔයාට වුණ දේවල් එක්ක මට ඔයාට දොස් කියන්න බැහැ... ඒවා හිතන්න එපා... එදා විදිහටම මම තවම ඔයාට ආදරෙයි"

"මම දන්නවා රහල්... ඇයි මේ ඔයා... කෝ හංස"

"හංසයා නුවරඑළියේ... ඔයාව එක්ක එන්න කිව්වා"

"එපා රහල්... අපි මෙහෙම ඒ විදිහට යන එක හොඳ නැහැ... මම කැමතිත් නැහැ එහෙම යන්න"

"ඔයාගේ කැමැත්තක්... මම ආවේ හංසයා මට කිව්ව නිසා"

"ඔයා මම ගැන වැරදියට හිතන්න එපා රහල්... එදා වගේම මමත් ඔයාට ආදරෙයි... ඔයාව විශ්වාසයි... ඒත්... නිකමට හරි හංසගෙන් හරි වෙන කාගෙන්වත් හරි ඔයාට වචනයක් කිය වුණොත් මට දරා ගන්න බැරි වෙයි... හංසට කියන්න මම එනවා කියලා" කියූ සස්වින්දි රථයෙන් බැස ගත්තාය. රහල් නිහඬව රථය ඉදිරියට ගත්තේය.

"රහලා... හංසි ආවද" අඩ හෝරාවකට පසු තුහංස රහල් අමතා ඇසුවේය.

"ආවා... මගේ එක්ක එන්න බැහැ කියලා ඔයාට එනවා කියන්න කියලා බැහැලා ගියා"

"ඒ ඇයි"

"ඒක අහපන් ඒකිගෙන්"

"හිතුවක්කාරී..."

"උඹෙ ගෑනි... මගේ කෙල්ල එහෙම හිටියේ නැහැ"

"තනියමද එන්නේ"

"වෙන්න ඇති..."

"කියපන් ඒකිට මිනිහා එක්ක හරි කමක් නැහැ එන්න කියලා"

"උඹම කියපන්"

"ෆෝන් එක ගන්නේ නැහැ... ඒ නිසා උඹ කියපන්... මේකි... හිතුවක්කාරී..." තුහංස කෝපයෙන් ගිගිරුවේය.

මිනිහෙක් නැති ඒකි අල්ලපු ගෙදර මිනිහා අඩ ගහගෙන එන්නද... උඹ දන්නවද ඒවා... රහල් සිනාසෙමින් සිතුවේය. උඹට ඔය විදිහට ඒකි ගැන දැනෙන්න ඕනේ... කැක්කුම... ඒක තමයි මචං ආදරේ... රහල් මුමුණා ගත්තේය.

ඇමතුම් රාශියක් ගෙන සස්වින්දි සම්බන්ධ කරගත් තුහංස ආපසු පැමිණියේ සස්වින්දි වෙනුවෙන්මයි. ඔහු ඇයව මඟ බස් රථයෙන් බැස ගත්තේය.

"මොනවා වෙලාද තමුසෙට... ඇයි කියනදේ කරන්න බැරි" තුහංස කෝපයෙන් ඇසුවේය.

"මම රහල් එක්ක එහෙම එන එක හරි නැහැ නේද හංස"

"ඇයි ඒකා මිනිහා නොවන නිසාද"

"ඇත්තටම ඔව්"

"එතකොට මගේ එක්ක මෙහෙම යන්න හොඳයිද... මම දැන් මිනිහද"

"නැහැ තමයි... ඒත්..." සස්වින්දිගේ දෑසට කඳුළු පිරුණාය.

"සොරි හංසී... මට කේන්ති ගියා" තුහංස මෝටර් රථය පසෙකට කර නවතා දමමින් කීවේය. දෑතින් මුහුණ වසා ගත් සස්වින්දි හඬා වැටුණාය.

"අහන්න කෙල්ලේ... ඔයා තනියම එනව කිව්වම මට තරහා ගියා... මම ඒකයි කිව්වේ හස්බන්ඩ් එක්ක හරි කමක් නැහැ එන්න කියලා"

තුහංස ඇයගේ කරවටා අත දමා ඇයව ළයට තෙරපා ගනිමින් කීවේය. සස්වින්දි ඒ ළයේ හිස තබා ඉකිබින්දාය.

"දැන් නොවුණත් ඔයා මගේ හංසී... මගේ දරුවන්ගේ අම්මා... ඉතින් මම අහපුදේ වැරදියි... මම වැරදියි"

"නැහැ හංස... මමයි වැරදි... ඔයත් මට අයිති නැහැ... රහල් එක්ක නාව මම ඔයා එක්ක ආව එක වැරදියි"

"හිතන්න එපා... මීට වඩා බරපතල වැරැද්දක් වුණත් මට කරන්න හිතෙනවා හංසී... ඒ තරමට දැන් මට ඔයාව ඕනේ" තුහංස සස්වින්දිව සිප ගනිමින් කීවේය.

"එපා හංස... ආයෙත් වැරදිකරන්න හිතන්නවත් එපා" සස්වින්දි කීවාය.

නිතීඥයෙකු හමුවී ඔහුට උප්පැන්න ලබා දී ඔහු සමඟ කුමක් හෝ සාකච්චජා කළ තුහංස සස්වින්දි රැගෙන ගියේ නුවරඑළියේ නිවාඩු නිකේතනයකටයි.

වරක් දෙවරක් තුහංසට අකමැත්ත පළ කළද එලක් නොවී ඔහු කෝප ගනිද්දී සස්වින්දි නිහඬ වූයේ ඔහුගේ හැටි හඳුනාගෙන සිටි නිසයි.

"පැයක් දෙකක් ඉදලා පොඩි රෙස්ට් එකක් අරන් යමු හංසී... මට හරි මහන්සියි" තුහංස කාමරයට ඇතුළුවෙමින් කීවේය.

"කළ වැරදි ඇති හංස... තවත් වැරදි කරන්න එපා"

"නැහැ හංසී... නැහැ... මම තවදුරටත් වැරදි කරන්නේ නැහැ කියලා හිතට ගිවිසගෙන ඉන්න නිසා ඉවසනවා... නැත්නම් මට ඉවසීමක් නැහැ කෙල්ලේ" දෙතොල් මුදාහල තුහංස කීවේය.

එවැනි සිපුමකට පමණක් පෙළඹී සීමා රඳවා ගත් තුහංස සස්වින්දි නැවතත් නිවස අසලට ඇරලා ආපසු ගියේ සස්වින්දි පුදුම කරවමින්ය.

"හංස... ඔයා නම් අදහන්න බැහැ මට... සස්වින්දි මුමුණා ගත්තාය.

තුහස් පාසලකට ඇතුළත් කළ යුතුව තිබුණෙන් ළයනිගේ මිතුරෙකුගේ උදව්වෙන් ඇය මන්ත්‍රීතුමා හමුවීමට ඔහුගේ නිවසට ගියේ ළයනි දැනවත්වයි. එදා තුහංස කාර්යාලයට එන විට සස්වින්දි නිවාඩු ගොස් තිබිණි.

"ඇයි යාළුවට අසනීපද... නැත්නම් බබෙකුටවත්" තුහංස ඇසුවේ ළයනිගෙනි.

"නැහැ සර්... එයා ගියා මන්ත්‍රීතුමා හම්බ වෙන්න"

"මොන... ඇයි.."

"........... මන්ත්‍රී තුමාව හම්බ වෙන්න ගියේ තුහස්ගේ ඉස්කෝලේ වැඩකට"

"එයාගේ මහත්තයා එක්කද ගියේ"

"නැහැ සර්... තනියම යන්න ඇත්තේ"

කිසිත් නොකී තුහංස නැඟී සිටියේය. ඔහු අදාල මන්ත්‍රීවරයා වෙතට යන විට සස්වින්දි එම කාර්යාලයේ වාඩිවී සිටියේ තනිවයි. තුහංසට දැනුණු කෝපයට ඔහු සිටි තැනත් ඔහුට අමතක විය.

"ඇයි... කාමරේට අඬගහනකල්ද බලාගෙන ඉන්නේ" ඔහු අඬුවේ හඬිනි. බිය වූ සස්වින්දි වහා නැඟී සිටියාය.

"එනකල් ඉන්න කිව්වද මිනිහා" තුහංස කෑගැසුවේය.

"අනේ හංස...ෂ්... කෑගහන්න එපා" සස්වින්දි බියෙන් ඔහුගේ සුරතේ වෙලුනාය.

"මහත්තයා මොකද කෑගහන්නේ" කාර්යාල සේවකයා ඇසුවේය.

"ඕනේ නිසා කෑගහන්නේ... ඇයි අහන්නේ"

"අනේ හංස..." ඔහු රණ්ඩුවකට පැටලෙන බව දැන සිටි සස්වින්දි පින්සෙණ්ඩු වූවාය.

"මේ තැන දන්නවද"

"මට තැනක් වැඩක් නැහැ අයිසේ... මම කෑගහන්නේ මගේ ගෑනිට... තමුසෙලාට නෙවෙයි" ඔහු කෝපයෙන් කීවේය.

"හංස... අනේ අපි යමු... " සස්වින්දි කෙඳිරුවාය.

"ප්ලීස්..." ඔහු තවම ඔරවා කාර්යාල සේවකයා දෙස බලා සිටි නිසාවෙන් සස්වින්දි නැවත කීවාය. ඇයගේ අත රිදෙන තරමට තදින් ඒ සුරතට හසුකරගත් තුහංස සස්වින්දි ඇදගෙන විත් මෝටර් රථයට තල්ලු කර දමා දොර වැසුවේය.

"තමුසේ කසාද බැඳලා ඉන්නේ මිනිහෙක්වද... නැත්නම් පොන්නයෙක්වද" රථය පණ ගැන්වීමට පෙර තුහංස කෝපයෙන් ඇසුවේය.

"හං...ස..."

"ගෑනිව මෙහෙම ගමන් තනියම එවන්න ඒකා මම කිව්ව ජාතියේ එකෙක්ම වෙන්න ඕනේ" ඔහු කෝපයෙන් බැන වැදුනේය.

"ඒකට එන්න බැරි නම් තමුසේ මට හරි කියන්න ඕනේ නේද මෙහෙම ගමනක් යන්න තියනවා කියලා" සස්වින්දි නිහඬ විය.

"ඔය මන්ත්‍රියගේ හැටි දන්නේ නැද්ද... වල් බල්ලෙක්... දෙන්න ඕනේ ගිය තමුසෙට... උඹට බැනලා වැඩක් නැහැ" තුහංස දත් කෑවේය.

"අනේ හංස... ඉතින් ඒ දවස් වල ඔයා මගේ එක්ක යන්න ආවද... මම තනියමනේ හැම දේකටම ගියේ... ගෙදර පවා... ඔයා මගෙන් අහන්නෙවත් නැහැ"

"ඔව්... මම එහෙම කළා... ඒක නිසා තමයි මට මෙහෙම වුණේ... තමුසෙව නැති වුණේ... ඒ මිනිහා වගේ පොන්නයෙක්ට තමුසෙව දෙන එක වළකා ගන්න බැරි වුණේ" තුහංස රථය පණ ගන්වා ගත්තේය.

සස්වින්දිව නිවසටම ගෙන ගොස් ඇරලවූ තුහංස මනෝජ් ඉදිරියේ සස්වින්දිගේ සැමියාට බැන වැදී පිටව ගියේ මනෝජ්ටද දොස් තබමිනි. තුහංසගේ හැටි දන්නා මනෝජ් නිහඬව සියල්ල අසා සිටියේය.

එතැනින් නොනැවතුණු ඔහු රහල් අමතා සියල්ල පවසා ඔහු සමගත් සස්වින්දිගේ සැමියාට බැන වැදුනේය. අවසානයේ ඔහු රහල්ට කියා සිටියේ සස්වින්දිට එවැනි දේ නැවත නොකිරීමට අවවාද දෙන ලෙසටයි.

තමාගේ වස්තුව වූ සස්වින්දිට බලහත්කාරකම් කොට ඇයව විනාශ කොට තමාගෙන් ඇයව උදුරා අනාථ කළේ උඹ යැයි පවසා රහල් තුහංසට බැන වැදුනේය. අවසානයේ ඇයව එවැනි

කෙනෙකුට දෙන්නට සිදු වූයේ උඹ නිසා බව කියා ඔහුට චෝදනා කළ ඔහු කියන දෙයක් උඹම කියාපන් යැයි පවසා ඇමතුම විසන්ධි කළේය.

කෝපය තමා වෙතටම එල්ල කරගත් තුහංස තමා සමඟම වූ කෝපයකින් නිහඬ වූවේය.

තුහංස කාර්යාලයේ ලිපිගොණු පරීක්ෂා කරමින් සිටියේය. දුලංගිද ඔහු අසලට වී ඔහුට සහය දෙමින් සිටියේය. සිය කාර්යයක් සඳහා පැමිණ කළුපහනද පැමිණ වාඩි වූවේය.

"සස්වින්දි මිස් කොහෙද දුලංගි" කළුපහන ඇසුවේය. තුහංස අවධානය ඒ හඬ වෙත යොමු කළද එය දැනෙන්නට ඉඩ තැබුවේ නැත.

"සස්වින්දි මිස් හොයාගෙන මහත්තයෙක් ආවා... මට හිතෙන්නේ හස්බන්ඩ් වෙන්න ඇති" තුහංස හිස එසවූවේය.

"මොකද්ද මිස්ට කළුපහන කිව්වේ" තුහංස ඇසුවේ ඔහුට යමක් කියූ බව හැඟවෙන ලෙසයි"

"නැහැ සර්... සර්ට නෙවෙයි... මේ සස්වින්දි මිස්ට"

"ඇයි ඒ මිස්ට මොකද"

"මහත්තයාද කොහෙද හොයාගෙන ඇවිල්ලා"

"ආ... දුලංගි... ඒ මහත්තයාට එන්න කියන්න... අපි සස්වින්දි මිස්ට පණිවිඩේ යවමු හිමීට... එකවුන්ස් වගයක් බලනවා මගෙ හිතේ" තුහංස පැවසුවේ සස්වින්දිගේ සැමියා බලා ගැනීමේ අරමුණ ඇතුවයි.

වසර ගනනාවක් ගත වුවද දුටු පමණින් තිමිර හඳුනා ගැනීමට තුහංසට හැකිවිය.

"තියුමිගේ අයියා... තී..."

"මිර... තිමිර" තුහංසගේ වැකිය තිමිර අවසන් කළේය.

"වාඩි වෙන්න තිමිර..."

"තැන්ක්යූ" තිමිර වාඩි වුණේය.

"හංස ගැන නංගි කියලා ඇති"

"හ්ම්... කියලා තියනවා..."

"මෙහෙ කියලා කිව්වේ නැද්ද"

"නැහැ... මම මෙහෙ එනවා කියලත් දන්නවා" තුහංස සිනාසුණේය.

"ඒවා කියන එකක් නැහැ... තියුමිත් දන්නවා ඇති මම හිතන්නේ... රහල් මෙහෙනේ" තුහංස කීවේය.

"රහල්.... මේ අපේ සස්විගේ"

"ඔව්... බෝයි ෆ්‍රෙන්ඩ්" එවර තිමිර හඬින් සිනාසුණේය.

"දවසක් මාව මස්සිනා කරලා රහල්ව ඇන්දුවා... කවුද දන්නේ හංස නිසා කියලා"

"හංස නිසා නෙවෙයි යාළුවා... හංසට බය නිසා"

"ඇත්ත... ඇත්ත..."

"හරි මිස්ටර් කළුපහන... මේ ටික ඉවරයි" තුහංස ලිපිගොණුව ඔහුට ලබා දෙමින් කීවේය.

"එක්ස්කියුස්මී" පිටතින් ඇසුනේ සස්වින්දිගේ හඬයි"

"එන්න" හඬින් කියූ තුහංස

"පණිවිඩේ කවුරු හරි දෙන්න ඇති" යැයි කීවේය.

"හ්...ම්... ඔ...යා..." ඉහළට ගත්ත හුස්ම පහතට හෙලූ ඇය දිව විත් තිමිරව වැළඳගත්තාය.

කළුපහන පිටව ගියේ රහසින් තුහංස දෙසද බලායි. සස්වින්දිට කැමැත්තෙන් සිටින තුහංසට මේ දසුන රිදුම් දෙන දසුනක් වෙනු ඇතැයි ඔහු සිතුවේය. ඔහු දූලංගිට ඉඟිකළේ ඒ නිසාය.

"යන්න දෙන්නත් එක්ක... කතා කරන දෙයක් කතා කර ගන්න එළියට ගිහිල්ලා" තුහංස කීවේය.

"යමු..." සස්වින්දි තිමිරගේ සුරතින් අල්ලා ගත්තාය.

සස්වින්දි සමඟ අඩ හෝරාවක් ගත කළ තිමිර ආපසු තුහංසගේ කාමරයට ආවේ ඔහුගෙන් සමුගෙන යන්නයි. ඒ මොහොතේ දුලංගි කාමරයේ නොසිටියාය.

"මම යන්න කියලා" තිමිර කීවේය.

"ඇයි ගෙදර යන්නේ නැද්ද" තුහංස ඇසුවේය.

"ලොකු තාත්තා කේස්..."

"ඒ මොකද"

"කසාදෙට... පිටරට කෙල්ලක් බැන්දා කියලා... ඔක්කොම මාව අත ඇරලා... ඒකයි සස්වි හම්බ වෙන්න ආවේ"

"වයිෆ් එක්කද ආවේ"

"ඔව්... දැන් අපරාදේ කියලා හිතෙනවා... මාර බිලක්"

"ඔව් ඉතින් අපේ තැන් බලන්න අපට විස්සයි... එයාට තුන් දාහයි" තුහංස සිනාසෙමින් කීවේය.

"ඒකනේ මචං... කරේ එල්ල ගන්නකොට ඕවා හිතුනේ නැහැ"

"එතකොට හිතෙන්නේ වෙන ඒවා ගැන විතරනේ" දෙදෙනාම සිනාසුණෝය.

"හංසට කියන්න දෙයක් තියනවා... ඒකයි මම ආවේ"

"ඒ මොකද්ද"

"ඇතින් ඉදලා හරි එයා ගැන බලන්න... ලොකු තාත්තා නැති දවසට කවුරුවත් නැහැ... එයා එක්කත් හැමෝම තරහා වෙලා... මමත් ආය ලංකාවට එන්නේ නැහැ"

"ඇයි හැමෝම තරහා වෙලා ඉන්නේ... තියුමිලත්"

"අපේ නංගි නම් මම දන්නේ නැහැ... අනිත් හැමෝම"

"හේතුව..."

"පොඩි එකී... එක පාර නෙවෙයි දෙපාරක් වරද්ද ගත්තා කියලා හැමෝම බනිනවා... කසාද බඳින්නත් බැහැම කිව්වනේ...

ලොකු තාත්තා කැක්කුමට නිහඬව ඉන්නේ" තුහංස කෙලින් වූවේය.

"එතකොට එයා කසාද බැඳලා නැද්ද" ඔහු ඇසුවේ විශ්මයෙනි.

"නැහැ... ඇයි එහෙම කිව්වද"

"මිනිහෙක් ගැන කියන්නේ හැමෝම... තියුමි තමා මට බැන්දා කිව්වේ"

"ආ... ඒ දවස් වල තරහට කිව්ව කතාවක්... ඔයා බැන්දා කියලා ආරංචියක් ආවලුනේ" තුහංසට දැනුනේ කිව නොහැකි තරමේ සතුටකි.

"හ්ම්... ඒකයි එහෙනම් මේ... මට බොරුව දානවා මිනිහෙක් ඉන්නවා වගේ" ඔහු සිනහවෙන්ම කීවේය.

"ඕකිගේ හැටිනේ... ලොකුකම"

"මම දරු දෙන්නා නඩත්තු කරනවටත් පුප්ප පුප්ප ඉන්නේ"

"ආපහු උස්සන්න එහෙම යන්න එපා... ලොකුකම කියලා" තිමිර සිනාසෙමින් කීවේය.

"කෙල්ල උස්සපු එකාට ගෑනියෙක් කජ්ජක් නෙවෙයි... ඒක තමා ලොකුකම බස්සන්න කරන්න තියෙන්නේ"

"සිංගල් නෙවෙයි දැන් ට්‍රිබල්"

"ඕවා ප්‍රශ්නද මට... පොඩි වුන් දෙන්නා ඉස්සුවනම් අම්මා නිකම්ම අතේ" තුහංස සිනාසුණේය.

"තුහස්ට මම යමු කිව්ව නම් නිකම්ම මගේ එක්ක එයි"

"පව්... ඒකිගේ ජීවිතේ දැන් ඔය දරු දෙන්නා... පණ වගේ"

"මම දන්නවා තිමිර... ඔයා බය වෙන්න එපා... එයාට කවුරු නැතත් එයා ළඟ මම ඉන්නවා"

තිමිරගේ දෑත් මත දෑත් තබා තුහංස පැවසුවේ පොරොන්දුවක් ලෙසිනි.

කැමැත්තකින් නොවූවත් සස්වින්දි තුහංස සමඟ නුවර යාමට එකඟ වූයේ ඔහුගේ ගෙරවුමටයි.

"මඟුලක ගෙනියනවා නෙවෙයි... තුහස්ගේ වැඩකට යන්නේ"

"හරි... අයිෂාදි දැන ගත්තොත්"

"එයාව මම ෂේප් කර ගන්නම්... තමුසේ තමුසෙගේ මනුස්සයා ෂේප් කර ගන්නවා" සස්වින්දි නිහඬව තුහංසගේ මෝටර් රථයට ගොඩ විය.

"හංසි..."

"හ්ම්..."

"ඔයාගේ හස්බන්ඩ් ගැන මට ඔයා කියලා නැහැ"

"හංස... මම ඔයාගේ කසාදේ ගැන අහලා නැහැ"

"ඕකේ... ඕකේ... ඔයාට හරියට තරහා යනවනේ... එයා ගැන අහනකොට"

"මම බැහැලා යනවා ඇත්තමයි... නුවරට එන්න ඕනේ තැන කියන්න මම එන්නම්"

"හස්බන්ඩ් එක්කද" සස්වින්දි නිහඬ විය.

තුහංස රහසින් ඇය දෙස බැලුවේය. රතුවත කඳුළු දැස ඔහුට නැවුම් හැඟීම් එක්කරයි. ඇය තනිව බව දැනගත් දිනයේ සිට තුහංස සිටියේ ලොව දිනාගත් අයෙකු ලෙසින්ය.

රහලා... උඹ මට හැමදේම හැංගුවා... හිටපන්... උඹට තරු පෙන්නවනවා දවසක... තුහංස සිතුවේය.

තුංහස පළමුව ගියේ ඔහුගේ පාසලටයි. ආදි ශිෂ්‍ය ලැයිස්තුවෙන් ඔහුව පාසලට ඇතුලත් කිරීමට ඔහු සියළු කටයුතු සම්පාදනය කළේ සස්වින්දිගෙන් කිසිදු අනුදැනුමක් නැතුවය.

"හංස... පුතා මෙහෙට දාලා කොහොමද" පාසලෙන් පිට වූ මොහොතේ ඇය ඇසුවාය.

"එයා ඉදියි... අපේ අම්මා ඉන්නවා... එයා එයාව බලා ගයි"

"අයිෂාදිගේ ළමයි එක්ක මගේ ළමයා මම තියන්නේ නැහැ"

"හරි... හොස්ටල් දාමු"

"අනේ... ඇයි හංස මට මෙහෙම කරන්නේ... මගේ දරුවව මගෙන් වෙන් කරන්නේ"

"දරුවගේ හොඳට... මෙච්චර හොඳ ඉස්කෝලෙකට දරුවා දාන්න පුළුවන්කම තියෙද්දී නොදා ඉන්න මෝඩයා කවුද" සස්වින්දි දෑසේ කඳුළු පිසදා ගත්තාය.

තුහංස දරුවාගේ පියාය. පියා පියාගේ අයිතියට ඔහුගේ පුතාට ඔහුගේ පාසල තෝරා තිබේ.

"මන්ත්‍රී එක්ක යන්න ගියේ එහෙ ඉස්කෝලෙකට දාන්නනේ" තුහංස ඇය දෙස ඇස් කොනට බලා කීවේය.

"පව් කතා කියනවා... එතන කෑගැහුව්වේ හරියට මම ඒ මිනිහා එක්ක ඇඳේ හිටියා දැක්කා වගේ"

"මම එහෙම තමයි"

"ගෙදර ගෑනියක් ඉන්නවනේ... එයාව ආරක්ෂා කරන්න... හංස... මම දැන් ඔයාගේ වයිෆ් නෙවෙයි... මම මේ මෙහෙම එන්නේ දරුවන්ගේ දේවල් නිසා"

"හරි ඉතින් ඩිවෝස් වුණ බව හරි... ඒත් දරුවන්ගේ අම්මනේ"

"ඔව්... දරුවන්ගේ අම්මා විතරයි... වයිෆ් නෙවෙයිනේ"

"හරි ඉතින් මම තමුසෙව මෙතන ගෑනි කරගන්න ගියේ නැහැනේ... කියවන්නේ හරියට..." කියා නවතා දැමූ තුහංස

"එහෙම කරන්න ගියා වගේනේ" ඇයගේ වතට එබී කීවේය. සස්වින්දි නිහඬ විය.

"එදා මම හොටෙල් එකකට එක්ක ගියා... කිස් කළා විතරයිනේ... ඒ ආදරේට... ඕනේ කෙනෙක් ආදරේට කිස් කරනවා" තුහංස ඇය දෙස බලාගෙනම කීවේය.

"මම නැහැ කිව්වේ නැහැ හංස... ඒ විශ්වාසේ නිසා තමයි මම ඔයා එක්ක මෙච්චර දුරක් මෙහෙම ආවේ" ඇය බිඳුණු හඬින් කීවාය.

"අඬන්න දෙයක් මම කිව්වේ නැහැ හංසී" තුහංස ඇයගේ සුරතින් අල්ලා ගත්තේය.

"ඔව්... ඒත් මට ආදරේ කරන්න මෙච්චර පරක්කු කළේ ඇයි හංස"

"අතීතය අමතක කරමු රත්තරන්..." ඔහු ඇයගේ අත පමණක් සිප ගත්තේ වත සිප ගන්නට අවට පරිසරයේ හැකියාවක් නොතිබූ නිසයි.

ඉන් පසු ඔහු ඇයව ගෙන ගියේ ඔහුගේ නිවසටයි. මව නිවසේ සිටින නිසාවෙන්ද ඔහුට ගැටළුවක් නොවන නිසාවෙන්ද ඔහු නිවසට ගෙන යනු ඇතැයි සස්වින්දි සිතුවාය. ඇය එයට විරුද්ධ නොවුණේ ඒ නිසාය.

නිවසේ කිසිවෙකුත් නොමැති බව දැන ගන්නා විට ඇය තුහංස සමඟ නිවස තුලටම ගොස් සිටියාය. ඇයට තුහංසට නතුවන්නට සිදු වූයේ ඒ නිසාය. තුහංස ඉකිබිඳින සස්වින්දිව නැවත වතාවක් සිප ගත්තේය.

"කෙල්ලෙක් විදිහට ආව දවසේවත් ඇඬුවේ නැති ඔයා අද ඇයි හංසී මේ විදිහට අඬන්නේ"

"ඒ එක දවසකවත් මේ දේ වැරැද්දක් වුණා කියලා මම හිතන්නේ නැහැ හංස... ඒත් අද මේ දේ වැරදියි"

"ඇයි..."

"අපි අපේ නෙවෙයි"

"අපි අපේ තමයි හංසී... ඒක ආය කවදාවත් වෙනස් වෙන්නේ නැහැ"

"හංස..."

"ඔයා මගේ හංසී..."

"නැහැ... මම එයාගේ... ඔයා... අයිෂාදිගේ" සස්වින්දි පැවසුවේ ආවේගයෙනි. තුහංසට කෝපයක් දැනුනේය. තවත් හංගනවා... ඔහු සිතුවේය.

"එයාව පැත්තක තියන්න" තුහංස පවසද්දී ඇයට දැනුනේ කේන්තියකි.

"එයාව කොහොමද පැත්තක තියන්නේ... අමතක වුණාද අපි අතර කසාදයක් නැහැ කියලා"

"වස බෝතලේ... කෑ ගහන්නේ ඉස්සර වගේමයි"

"හංස මේ..." සස්වින්දි කෝපයෙන් නැගිට්ටාය.

"පරණ කසාද ජීවිතේ අත්දැකීම් එක්ක මම මල් පෝච්චි බෝතල් එහෙම කාමරේ තියා ගන්නේ නැහැ... කම්මුල ගැනත් හොඳ හෝදිස්සියෙන් ඉන්නේ" තුහංස සස්වින්දිගේ ඇඳුම් ටික අතට ගනිමින් කීවේය.

"ඕවා දෙන්න" ඇය ඒවා උදුර ගන්නට තනද්දී තුහංස ඒවා නාන කාමරයට ගෙන ගොස් වතුර බේසමට දැම්මේ සස්වින්දි කෑගසද්දීය.

"හෙට උදේට වේලෙයි" ඔහු පැවසුවේ හඬා වැටෙන ඇයව සිපගනිමිනි.

"ඔයා කොච්චර අසාධාරණ කොච්චර චීප් මිනිහෙක්ද... මම හිතුවා හැදිලා කියලා... තාත්ති ආය නම් මාව ගෙදරට ගන්න එකක් නැහැ"

"මේ හංස ජීවත් වෙලා ඉන්නකල් ඔයාට බය වෙන්න දෙයක් නැහැ"

"ඇයි හංස තවත් මගෙන් පලිගන්නේ... ඇයි තවත් මාව අසරණ කරන්නේ"

"මම ඔයාව අසරණ කළේ නැහැ හංසී... කරන්නෙත් නැහැ... ඔයා මගේ... "

"ඔයා මේ කරන්නේ පලිගන්න එක හංස... ගෙදර ගෑනියෙකුයි දරු දෙන්නෙකුයි ඉන්නවා... මම දික්කසාද කරපු

ගැනියක්"

"හරි... ගෙදර ගෑනියෙකුයි දරු දෙන්නෙකුයි ඉන්නවා තමයි... අම්මා ගෑනි... අයිෂාදිගේ බබාලා ළමයි..."

"හංස... කට වහ ගන්න මාරයා නොකර"

"අනික අපේ කසාදේ ගැන කිව්වොත්"

"හංස... මම මෙහෙමම යනවා... පාරට... පිස්සියක්වගේ... අවට එවුන් ගල් ගහලාවත් මරන්නේ නැතැයි"

"ගල් ගහලා නෙවෙයි ඔහොම ගියොත් ඔයාට පොරකාලා උන් මැරෙයි" තුහංස ඇයව තුරුල්කර ගත්තේය. ඉකිය නැවතූ සස්වින්දි සුසුමක් හෙලුවාය.

"සුසුම් හෙලන්න එපා... ඔයාවත් මමවත් මේ කරන්නේ වැරැද්දක් නෙවෙයි... ඔයා දවසක දැන ගයි රත්තරන්" තුහංසගේ ආදරණීය හඬ සවන අසලින්ම ඇසුණද ඇය සිටියේ එය නොඇසුණු ලෙසින් කේන්තියෙනි.

පසුදා උදේ යන්නට පිටත් වූ මොහොතේ තුහංස ඇය වෙතට ආවේය. ඔහුගේ මුහුණ නොබැලූ ඇය ඉවත බලා ගත්තාය. තුහංසට සිනහා නැගිණි.

"මේ පොත් දෙක තාත්තට පෙන්වන්න... බබාලගේ සල්ලි පොත් වලට දාන්න රත්නපුරේ ගියා කියන්න... ඊ හිටියේ අපේ අම්මා එක්ක කියන්න... මනෝජ් අංකල් බනින එකක් නැහැ"

තුහංස කෝට්ටිය බැගින් දැමූ පාස් පොත් දෙකක් ඇය අතේ තැබුවේය. ඇයගේ දෑසට කඳුළු පිරුණාය.

දරුවන්ගේ පියා වුවත් ඔහු දැන් තමාට අයිති නැති වස්තුවකි. අද තමා ඔහුව සැනසූ ආගන්තුක ගැහැණියකි. ඒ හැඟීම ඇයගේ සිතට පසු තැවිල්ලක් එක් කළාය.

"මුහුදේ නැව් ගියාට පාරවල් හිටින්නේ නැහැ... ඕක ඔච්චර හිතන්න එපා... හස්බන්ඩ්ට අහුවෙන එකක් නැහැ" තුහංස ඇයගේ වතට එබෙමින් කීවේය. ඇය ඔහුට දැවී යන තරමක බැල්මක් හෙලුවාය.

තමා තවත් වතාවකට තුහංසට හසු වුණා යැයි යන පසු තැවීමක් සස්වින්දිගේ හිතේ විය. යම් හෙයකින් තවත් වතාවකට තමා ගැබිණියක් වුවහොත්... තමා අසම්මතයේ පහත් ගැහැනියක් නොවේදැයි ඇයට ඇය ගැනම සිතද්දී හැගිණි.

පෙරදා ඔහු හා තනිවී හෝරා ගනනාවක් ගත කළද ඔහු තමාව නතු කර ගැනීමට උත්සහ නොකළේය. සස්වින්දි තුහංසගේ නිවසට ගියේ විශ්වාසයෙනි.

කවුරුත් නොසිටි නිවසේ ඔහු තමා නතු කර ගන්නට තනද්දී මුලදී විරුද්ද වුවද පසුව ඔහුට නතු වීමේ ආසාවක් තමාටද දැනිණි. ඔහු පෙරදා ලෙසින් නොව ඉතාම ආදරණීය හැඟීමකින් තමාව සැනසුවේය. පසු තැවිල්ලක් දැනී සත්‍ය සිහිවී හැඩුම් එන විට සියල්ල සිදුවී හමාරය.

හංසට මම ළං වුණ එක හොඳටම වැරදියි... දැන් ඒ වැරැද්දෙන් ගොඩ එන්න මට අමාරුවෙයි... සස්වින්දි සිතුවාය.

දුලංගිට සිනහවකින් සංග්‍රහයක් කරමින් සස්වින්දි තුහංස ඉදිරිපිට වාඩි වුණේ පරීක්ෂා කළ යුතු ලිපි ගොණු කිහිපයක් ඔහු ඉදිරිපිට තබමින්ය.

මේ සැරේ පොඩි එකා ගැන තාත්තිට නෙවෙයි එයාගේ තාත්තිට ඉස්සරෝම කියන්න... මම අම්මිව මලක් වගේ පරිස්සමට රැක ගන්නවා...

තුහංස එසේ ලියූ කොළ කැබැල්ලක් සස්වින්දිගේ පරීක්ෂා කර අවසන් ෆයිල් කවරයට දමා දුන්නේය. එය කියවූ සස්වින්දිගේ දෙපා පණ නැතුව ගියාය.

එසේ නම් ඔහු පරිස්සමක් ගැන නොසිතුවේද... තමා නැවත ගැබ් ගත හොත්... සස්වින්දි ඔහු දෙස බැලුවාය. තුහංස සිටියේ සස්වින්දිගේ තවත් ගිණුම් වාර්තාවක් පිරික්සමින් ඒ පිළිබඳ සිතුවිල්ලකයි.

මේ කඩවසම් පුද්ගලයාට සියල්ලෝම ඇලුම් කරති... කාර්යාලයේ බොහෝ තරුණියන් ඔහු ගැන කතා කරන බව මෙන්ම ඔහුට පිස්සුවෙන් ආදරය කරන බව සස්වින්දි දනී. දැන් ඔහු තමාට ආදරය කරන බවද ඇය දනී. තමාත් ඔහුත් අතර ඇත්තේ ශක්තිමත් කායික බැදීමකි. ඔහු අත හැරිය තමාව නැවත සොයා ආවේද ඒ නිසා වන්නට ඇත.

ඔහු හා එක් වන්නට ඔහුගේ බිරිඳ ලෙසින් පෙනී සිටින්නට... ඔහු දරුවන්ගේ පියා ලෙසින් ලෝකයට හඳුන්වා දෙන්නට සස්වින්දි ඇති වූයේ නොනිමි ආසාවකි. එහෙත් ඔහු තමාගේ නොවේ... තමාට අයිති වස්තුවක් නොවේ... ඇය පසු තැවිල්ලෙන් ඔහු දෙස බලා සිටියාය.

දූලංගි මොහොතකට පිටව ගියේ වෙනත් කාර්යයකටයි. සස්වින්දි වහා තුහංස වෙතට නැමුණාය.

"මේ කොලවල තියන ඒවා කරන්න පුළුවන් වෙයිද" ඇය ඇසුවාය. තුහංස දූලංගිගේ ආසනය දෙස බලා ඇය දෙස බැලුවේය.

"දැන ගත්ත දවසට අයිෂාදි අක්කා මේවා ඉවසයි කියලා හිතෙනවද"

"ඉවසන්න වෙයි... අනික එහෙම දැන ගත්තා කියලා එයාගේ වෙනසක් නැති වෙයි" තුහංසද ඇයගේ මුවට එබී කීවේය.

"මේ විකාර ආය නවත්වන්න හංස... මගේ දරු පැටව් අනතුරේ දාන්න එපා ඔයා"

"රයිට්... අම්මා... එයාව අමාරුවේ දාන්න එපාද... තුන කොල්ලා... හතර කෙල්ල... කොහොමද"

"සුසිල් අංකල්ට මේවා අයිෂාදි කිව්වොත්... එයාගේ හැටි දන්නවා නේද"

"රත්නපුරේ හංස මහත්තයා කියලා ලොකු මැරයෙක් ඉන්නවා නේද"

"අහන්න හංස... ගැනියෙකුට තමන්ගේ මනුස්සයා වෙන ගෑනියෙක් ළඟට යනවා... ආදරේ කරනවා කියලා දැන ගන්නවා තරම් වේදනාවක් නැහැ"

"එහෙනම් ඔයා මම අයිෂාදි ළඟට යනවා එයාට ආදරේ කරනවා කියලා හිතන්න එපා"

"විකාර කරනවා මදිවට විකාර කියවනවා... කුපාඩිකම ඉවවහ ගියාම තමන් දැන් මොකාද කියලත් අමතක වෙනවා"

"ඔයාටත් එහෙමනේ... එක කිස් එකයි... බැඳලද කියලත් අමතක වුණා... ඇඳුම් ටිකත් වතුරට දාන්න කියලා ගලවලා තිබ්බේ ඔයානේ"

"පව් වැඩ කරලා... පව් වැඩ කියවනවා... ජීවිතේට හැදෙන මිනිහෙක් නෙවෙයි ඔයා... මම යනවා මගේ දරුවොත් අරන් හොයා ගන්න බැරි වෙන්න... ඒක මතක තියා ගන්න ඔයා"

"ඊට කලින් තුහස් ගේනවා මගේ ළඟට ඔයාට හොයා ගන්නවත් බැරි වෙන විදිහට... ඔට්ටුවක් අල්ලමුද... දවස් දෙක තුනක් යන කල් ඔයාට දැන ගන්නවත් බැරි වෙයි ඉන්න තැනක්" තුහංස සිනාසෙමින් කීවේය.

"ෂයි පැටෝ් සඟයෝ ටිකතාම අත ඇරගෙන නැහැ මම... ආරක්ෂාවට පැත්තකින් තියාගෙන ඉන්නවා... ඩෝප දලා කියන්න විතරයි තියෙන්නේ... ඔයාවත් ආය උස්සන්න බැරි නැහැ... දෙකක් දූන්නට පිණි ජම්බුව වගේනේ තාමත්... මට හිතුනොත් මම ආයෙත් උස්සනවා"

අත වූ ෆයිල් කවර මිටියෙන් ඔහුට කිහිප වරක් ගැසූ සස්වින්දි ඔහුට හසුවී ඔහුගෙන් මිදුනේ දෙතොලත් රත් පැහැ ගන්වාගෙනයි.

ඇය කාමරයෙන් පිටව එද්දී කාමරය අසල සිට කාමරයට ඒමට සිටි කළුපහනගේ තියුනු දෑසට හසුවුණු සස්වින්දි දින කිහිපයකින්ම කටකතාවක් සාදා ගත්තාය. සස්වින්දි සිටියේ එය තුහංසගේ කන වැටේ යැයි බියවූ සිතුවිල්ලකිනි.

ඉගිබිඟි සිනා හඬ මැද සස්වින්දි කාලය ගෙවා ගත්තේ අපහසුවෙනි. විටෙක ළයනි සියල්ලන්ටම සත්‍ය පවසන ලෙසද පැවසුවාය.

"ප්‍රශ්නේ එන්නේ මට නෙවෙයි ළයනි හංසට... අයිෂාදිට දැන ගත්තොත් මම මෙහෙ කියලා එයාගේ තාත්තා මගේ දරු දෙන්නට අනතුරක් කරයි කියලා මට බයයි"

"එහෙනම් ඉතින් සර්ට කියපන්... ඇත්තටම එයා කාමරේට ඇදගෙන උඹට මඟුල් කරනවද"

"මට මඟුල් කරන්න ඕනේකම තිබ්බනම් මාව දික්කසාද

කරයිද එයා"

"ඒ වුණාට සර් උඹට ආදරෙයි සස්වී... ඒකේ දෙකක් නැහැ"

"දැන් ඒ ආදරෙන් මට වැඩක්ද ළයනි"

"කමක් නැහැ... දරු දෙන්නටවත් වැඩක්වෙයි"

"එහෙම හිතලා තමයි මම මේ ඉවසන්නේ... නැත්නම් මම දරු දෙන්නා අරගෙන ගිහින්... ඒත් මම දන්නවා ගියාට වැඩකුත් නැහැ කියලා"

"ඇයි"

"හංසගෙන් ආය කවදාවත් මට බේරෙන්න බැරි වෙයි... පොඩි වුන්දෙන්නා එයා අත අරින එකක් නැහැ" තමාවත්... යන්න සස්වින්දි නොකීවාය.

කළුපහන ගැන කේන්තියෙන් සිටි සස්වින්දිට අවස්ථාවක් උදා වූයේ අහඹු ලෙසයි. ඔහුගේ ගිණුමක දෝෂයක් පෙන්වා දුන් ඇය

"මිස්ටර් කළුපහන... අනුන්ගේ ඕපාදූප හොය හොයා පතුරවන්නේ නැතුව ඔයාගේ වැඩ ගැන පොඩ්ඩක් අවදානෙන් ඉන්න යැයි" කාර්යාලයේ බොහෝ දෙනෙක් ඉදිරියේ පැවසුවේ හිතේ ඔහු සමඟ වූ කේන්තිය නිසාවෙනි.

ළයනි ඇයගේ සුරත අල්ලා ගත්තේ ඇයව නිහඬ කරවීමට සිතායි. ඇයගේ වදනින් කළුපහන කෝප ගත්තේ ලැජ්ජාවටයි.

"ඉස්සර සර් මට තමයි හැමෝගෙම වැඩ වලටයි පණිවිඩ වලටයි කතා කළේ... ඒ පුරුදු වෙනස් වුණ ඉක්මන... දැන් සමහරුන්ටනේ හැමදේටම කතා කරන්නේ... වැරදි හොයලා කියන්නත් බාර දීලා තියෙන්නේ" ඔහු කීවේ සස්වින්දි දෙස නොබලා ඉවත බලාගෙනයි.

"මිස්ට කළුපහනට කියන්න දෙයක් තියනවනම් මූණටම කියන්න... වහෙන් ඔරෝ කතා වලට මම කැමති නැහැ"

"කියන්නේ මොකද්ද කියලා සස්වින්දි මිස් දන්නවා ඇතිනේ... සර් පවුල් කාරයෙක්... අනුන්ගේ පවුලක් කඩන එක පාපයක්"

"මිස්ටර් කළුපහන... දකින දේයි ඇත්තයි අතරේ ලොකු වෙනසක් තියනවා... මට මෙච්චරයි කියන්න තියෙන්නේ... ඔයා තවම දන්නේ නැහැ සර් කවුද කියන්න... සර්ට තරහා ගියොත් ඒ වගේ නරක මිනිහෙක් ඔයාට හොයාගන්න නැති වෙයි"

"ඔව් ඉතින්... ගෑනියෙකුට කරන්න බැරි දෙයක් නැහැනේ... මට විරුද්දව සර්ව අවුස්සවන්නත් පුළුවන් වෙයි කියලා මට හිතෙනවා... කසාද මනුස්සයෙක් නැතුව ළමයි දෙන්නේක් හදා ගෙන ඉන්න කෙනෙක් ඔයා කියලා අපි දන්නේ නැහැ කියලා හිතුවද" සස්වින්දිව දවාලමින් කළුපහන කීවේය.

ඇයගේ දෑසට පිරුණු කඳුළු ඇයට වළකාගත නොහැකි විය. ඇයට තදින් ඉකියක් පිටවෙද්දී ළයනි ළංවී ඇයගේ අතින් අල්ලා ගත්තාය. අවට සිටි අය සස්වින්දි දෙස බැලුවේ පැහැදීමකින් නොවේ.

"මොකද මෙතන වෙන්නේ" තුහංසගේ හඬට සියල්ලෝම ගල් ගැසිණි. ඔහු බැලුවේ සස්වින්දි දෙසයි. ඇයගේ දෑසේ කඳුළු දුටු ඔහුට ඉවසුම් නොදෙන්නට විය.

"ඇයි මේ... ඇයි ඔයා අඬන්නේ" ඔහු ඇයගේ උරයට සුරත තබා ඇසුවේය. බිය වූයේ සස්වින්දියි. ඔහු මෙතන තමා කවුදැයි පැවසුව හොත් අයිෂාද.... ඇයට බියක් දැනිණි.

"මොකුත් නැහැ... මේ ගෙදර... මගේ පුද්ගලික ප්‍රශ්නයක්" ඇය සෙමින් කීවාය. තවත් තමන්ට සියල්ල හඟවා ඇය බලාපොරොත්තුවන්නේ තමාගෙන් ඈත් වන්නටය. තුහංසට දැනුනේ කෝපයකි.

"මට කියන්න බැරි" ඔහු ඇසුවේ කෝපයෙනි. සස්වින්දි කළුපහන දෙස බැලුවාය. ඇයට කෝපයක් දැනුනේ තුහංස ගැන නොවේ.

"ගෙදර ප්‍රශ්නයක් නම්... එක්කෝ මෙයාගේ නැත්නම් දරුවන්ගේ ප්‍රශ්නයක් වෙන්න ඕනේ... නේද ළයනි..." ඔහු තදින් ඇසුවේ ළයනිගෙනි. ළයනි බිය වූවාය. සස්වින්දි පැවසූ මැරයා තමාගේ හාම්පුතා තුළින් මතුවන බව ඇයට දැනිණි.

"යාළුවගේ බෙගල් වලට උදව් දීලා එයා කියන විදිහට ඉන්නවනම් එයාව මේ ප්‍රශ්න වලිනුත් බේර ගන්න ළයනි"

"අනේ ළයනිට බනින්න එපා... ප්ලීස්..."

"එහෙනම් කට ඇරලා කියන එවුන්ට කියනවා ඇත්ත මොකද්ද කියලා... පවුල් ප්‍රශ්න නැතුව කසාද බැඳපු හැම කෙනාම එකම විදිහට පවුල් කන්නේ නැහැ... තරහා වෙලා වෙන් වෙලා දෙපැත්තේ ඉන්න අයත් ඉන්නවා" තුහංස හඬින් පැවසුවේ සැම දෙනාටම එය ඇසෙන පරිදිය.

සස්වින්දිගේ කතාව ඔහුගේ කනට වැටුණේ අහම්බෙනි. ඔහු සියල්ල පසෙකට වී අසා සිටි බව කවුරුන් හෝ නොදුටුවෝය.

"සස්වින්දි මිස් ගෙදරින් ඇවිල්ලා " කාර්යාල සේවකයෙක්ගේ හඬට සස්වින්දි ඉවතට හැරුණාය.

"තාත්ති..." සස්වින්දි සූදානම් වූයේ ඔහු වෙත යන්නයි. එහෙත් මනෝජ් හිසෙන් අඬගැසුවේ තුහංසටයි.

සස්වින්දි හිටි තැනම නැවතී දෑස් විසල් කොට මනෝජ් දෙස බැලුවේ තමාගේත් ඔහුගේ සබඳකම කන වැටී ඔහු තුහංසව හමුවීමට පැමිණියේද යන සිතුවිල්ලටයි. තුහංසට මොන මොනවද කලබලයෙන් කියූ මනෝජ් තුහංසගේ කීමට හිස සොලවා ඉවත ගියේය. සස්වින්දිට දැනුනේ කුතුහලයකි. ඇය ඔහු පසු පස යන්නට ගියද තුහංස සැම ඉදිරියේ ඇයව නතර කර ගත්තේය.

"ළයනි... චුට්ටක් එළියට යන්න" ළයනි දෙස බැලූ තුහංස පැවසුවේ පරාජිත හඬිනි.

"ඇයි" සස්වින්දි තුහංසගෙන් ඇසුවාය.

"ඔයා ඔයාගේ වැඩක් කර ගන්න"

"ඇයි තාත්ති ආවේ" එයට පිළිතුරක් නොදුන් ඔහු කලබලයෙන් සිය කාර්යාල කාමරයට ගියේ

' මිස්ටර් කළුපහන... යැයි ඔහුව අමතමිනි. සස්වින්දි සූදානම් වූයේ එළියට දුව යන්නයි. ඇය ඉදිරියට පැමිණි ළයනි ඇය අතට සහස්වි දුන්නාය.

"ඇයි මේ..." සස්වින්දි ඇසුවේ ළයනිගේ දෑසේ වූ කඳුළටයි.

"නැන්දට සනීප නැහැ සස්වී... ඒකයි දුව දීලා අංකල් ගියේ"

"අනේ ඇයි නැන්දට" සස්වින්දි ඇසුවේ කලබලෙනි.

"අමාරුවක් නැහැ... වැටිලා" තුහංස එනු දුටු සහස්වී සිනාසෙමින් ඔහුගේ අතට පනින්නට උත්සහ ගත්තත් සස්වින්දි එය වළකා ගත්තේය. තුහංස ඇය දෙස බලා ගෙනම ඉක්මන් පයන් ඉවත යද්දී සහස්විගේ පාදයේ වූ තුවාලය සස්වින්දි අහම්බයෙන් දුටුවාය.

"අනේ ඇයි මේ" සස්වින්දි කලබලයෙන් ඇසුවේ ළයනිගෙනි.

"නැන්දත් එක්ක බබත් වැටිලා"

"අනේ මම නැන්දා බලන්න යන්න ඕනේ"

"සර් කිව්වා සස්වින්දි මිස්ව කොහෙවත් යවන්න එපා කියලා... ඔයාලා පොඩ්ඩක් මිස්වයි බබාලවයි බලා ගන්නකෝ" කළුපහන කීවේය. සස්වින්දිට දැනුනේ කුමක් හෝ යමක් තමාගෙන් හැඟවෙන බවයි.

"අනේ මගේ නැන්දට මොකක් හරි කරදරයක්ද" ඇය ඇසුවේ හඬමිනි.

"මනෝජ් අංකල් එක්ක සර් ගියා... දෙන්නම මෙහාට එනවා කිව්වා... එයාලා එනකල් ඉන්න සස්වී"

හෝරාවකට වැඩි කාලයක් සස්වින්දි එසේ සිටින්නට විය. එකිනෙකාගේ රහස් මෙන්ම බිය රැඳි මුහුණු කුතුහලයක් වුවත් කිසිවෙකුත් ඇයගේ සැනසීමට පිළිතුරක් නොදුන්නෝය.

පොලිසිය පැමිණියේ සස්වින්දි සොයාගෙනයි. ඇය ඉදිරියෙන් වාඩි ගත් පොලිස් නිලධාරීන් දෙදෙනා පළමුව සහස්වී කා අතට හෝ ගන්නා ලෙස අණ කළේය. ළයනි ඇයව ගත්තාය.

"ඇයි සර්"

"මිස් කලබල නොවී අපි අහනදේට උත්තර දෙන්නකෝ" සස්වින්දි අහපුදේට පිළිතුරු නොදුන් පොලිස් නිලධාරියා කීවේය.

"මිස්ගේ සම්පූර්ණ නම"

"පළිඟුආරච්චි මුදියන්සේලාගේ තුහංසි සස්වින්දි පළිඟුආරච්චි"

"වයස"

"විසි හයයි"

"මහත්තයාගේ සම්පූර්ණ නම" ඇය පිළිතුරු දීමට පෙර තුහංස ඔවුන් වෙත ආවේය.

"පැමිණිල්ලක් දැම්මා මෙයාගේ තාත්තා" තුහංස පවසද්දී සස්වින්දි විසල් කර ගත් දෑසින් ඔහු දෙස බැලුවාය. පියා තුහංසට කිසිත් නොකියා නිහඬව සිට ඔහුට විරුද්ධව කුමක් හෝ කළේද... ඇයට දැනුනේ බියකි. තුහංස දැන් පෙර පුද්ගලයා නොවේ.

"මිස්ගෙන් කට උත්තරයක් ගන්න ආවේ" පොලිස් නිලධාරියා පවසද්දී තුහංස අසරණ ලෙස ඇය දෙස බලා සිටියේය. මනෝජ් පැමිණ ඇයට ළංව සිට ගත්තේය.

"තාත්තී... හංස... එයා... ඉස්සර වගේ නෙවෙයි... ප්ලීස්..." ඇය මනෝජ්ට කෙඳිරියක් නැඟුවාය. හිස සෙලවූ මනෝජ් ඇයගේ හිස අත ගෑවේය.

"මිස්ට සැක කරන්න කවුරු හරි ඉන්නවද"

"නැහැ... මම හිතන්නේ නැහැ... එයාගේ තාත්තා කිව්ව දේ ඇරෙන්න වෙන දෙයක් එයාට කියන්න ඇති කියලා ප්ලීස්... මේ වෙලාවේ එයාව ගාව ගන්න එපා" තුහංස කීවේය.

"ඔකේ සර්... අපි පුළුවන් තරමට උත්සහ ගන්නවා දරුවව හොයලා දෙන්න" නිලධාරියාගේ කීමත් සමඟ සස්වින්දි අවුල් විය. තුහස් සිටි දැයි ඇය කලබල වූවාය.

"තුහස්... කා ළඟද... ළයනි" ඇය ඇසුවේ තුහංස දෙස බලාය. ඔහු ඇයගේ දෑස් මඟ හැර ඉවත බලා ගත්තේය.

"දරුවව... ඒ කියන්නේ... තුහස් කෝ... තුහස්... මගේ පුතා"

"පුතා දවල් ඉඳලා ගෙදර නැහැ දෝණී" මනෝජ්ගේ හඬත් සමඟ ඇය කඩා වැටෙද්දී මනෝජ් ඇයව අල්ලා ගත්තේය. මනෝජ්ට වාරු නැති වෙද්දී තුහංස ඇයව දෝතට ගත්තේය. ඔහු ඇයව මේසයේ තැබුවේ පරිස්සමටයි.

"ළයනි... මෙයාව බලා ගන්න... කලබල කරයි... කොහෙවත් යන්න දෙන්න එපා"

"මෙයාලට දෝණිව මෙල්ල කර ගන්න බැරි වෙයි පුතා... දන්නවනේ මෙයා ගැන"

"මම මෙතන හිටියොත් මෙයා තවත් කලබල කරයි නේද මනෝජ් අංකල්"

රහල් තියුමි සමඟ පැමිණියේය. තුහංස කඳුළු වැගුරුවා මිස කිසිත් පැවසුවේ නැත. රහල් ඔහුගේ උරවටා අත යවා ඔහුව සැනසුවේය.

"උඹ හිටපන් තියුමි එක්ක... මම යන්නම්"

"තුහස් මගේ පුතා..." සිහි ආ සැනින් සස්වින්දි නැගී සිටියාය.

"හංස... අනේ මගේ පුතාව හොයලා දෙන්න හංස... මගෙ පණ... හොයලා දෙන්න හංස... අපේ පුතා... හංස... මගේ පුතා" ඇය විලාප නැගුවාය. තුහංස ඇයට නොපෙනෙ ලෙස පසෙකට වී හඬා වැටුණේය. කවුරුත් තුහංස දෙස බැලුවේ පුදුමයෙනි. නැති වූයේ සස්වින්දගේ දරුවා නම්... ඔහුගේ කඳුළු සැමට ප්‍රශ්නයක් විය.

"තියුමී... මගෙ දරුවා..." ඇය රහල් දෙස බැලුවාය.

"අනේ රහල්..."

"අඬන්න එපා සස්වී... පුතා ඉඳියි... ගෙනියපු කෙනා කතා කරයි" රහල් ඇයව තුරුලු කර ගත්තාය.

"හංස... හංස... කෝ" සස්වින්දි රහල්ගෙන් මිදුනාය.

"එයා... එයා ගෙනියන්න ඇති... එයා මට කිව්වා මේ ළඟකදී"

"පිස්සුද සස්වී... හංසයා ගෙනියනවනම් ඔයා ඉස්සරහම ගෙනියයි... ගෙනියව්වනම් නොකියා හොයයිද" රහල් නොරිස්සුමෙන් කීවේය.

"මට එයා විශ්වාස නැහැ"

"ඔය අවිශ්වාසේ තමයි මේ හැමදේටම මුල... තමුසෙලා කවදාවත් හැදෙන්නේ නැහැ" රහල් කෝප ගත්තේය. සස්වින්දි හඬින් හඬා වැටුණාය. ඇයට ළං වූ රහල් ඇයව නැවතත් තුරුලු කර ගෙන ඇයගේ හිස අත ගෑවේය.

"හංසයි දරුවගේ තාත්තා... දරුවගේ තාත්තාට දරුවා පැහැර ගන්න ඕනේ නැහැ... බලන්න එයා අඬන තාලේ... ඒ ඇස් දෙකට කඳුළු ඇවිල්ලා තියනවා ඔයා දැකලා තියනවද දෝණී" මනෝජ් කීවේය.

තවත් ඉවසා සිටිය නොහැකි තැන තුහංස ආවේය. ඇය තමාගේය. දරුවා අපි දෙදෙනාගේය. එතැනට පැමිණි ඔහු ඇයව තදින් වැළඳ ගත්තේය.

"අනේ... හංස... මගේ පුතා" සස්වින්දි සිහිසුන් වූවාය. තුහංස ඇයව අල්ලා ගත්තේය. තුහංසගේ කඳුළු වලට හේතුව සියල්ලෝම වටහා ගත්තෝය.

සිහි ලද සැනින් ඇය පිස්සියක් මෙන් ඔහුගේ ළයේ හැපි හැපී විලාප තබන්නට පටන් ගත්තාය. තුහංසටද ඇයගේ විලාපය ඉවසා සිටිය නොහැකි විය. ඔහුද ඇයව තදින් තෙරපාගෙන ඉකි ගැසුවේය. පසෙක සිටි සියල්ලන්ගේ දෑස් කඳුලින් තෙත් වෙද්දී රහල්ගේ දෑසින්ද කඳුළක් ගිළිහෙනු තියුම් දුටුවාය.

"හංස... සුසිල්... එයා... එයා... මගේ පුතා" තුහංස නව පණක් ලැබුවාසේ දෑසේ කඳුළු පිසදා ගත්තේය.

"සුසිල්... හංසී... ඔයා හරි වෙන්න පුළුවන්... එයා දැන ගන්න ඇති මම තුහස්ට කෝටියක් ගත්ත බව... මනෝජ්

අංකල්... ඒ එකවුන්ට් එකේ ඩීටෙල්ස් ඔෆිස් එකට එනවා නේද" ඔහු කලබලයෙන් ඇසුවේය.

"ඔව්... එකවුන්ට් බැලන්ස් එක එනවා"

"උෟ මගේ කොල්ලා ගෙනියලා තිබුණොත් මම උෟව ඉතුරු කරන්නේ නැහැ" තුහංස කෝපයෙන් කෑගැසුවේ අසල වූ පුටුවකට තදින් පා පහරක් ගසායි. ඔහුගේ කෝපය වටහාගත් සියලු දෙනා බිය වෙද්දී සැම බැලුවේ සස්වින්දි දෙසයි. රහල් හිස සැලුවේය.

"අනේ හංස... මට ඔයත් ඕනේ... මගේ දරුවත් ඕනේ" සස්වින්දි තුහංසගේ සුරතේ වෙලුනාය. ඔහු මොහොතක් ඇය දෙස බලා සිටියේය. ආවේගය දෑත්මිට මොලවා පාලනය කරගත් ඔහු තිහඬව ඇමතුමක් ගත්තේය.

"ඩේවිට්... මම හංස මහත්තයා..." කාර්යාලයට ඇමතුමක් ගත් ඔහු සුසිල්ගේ විස්තර ලබා ගනිද්දී සජීවා සීතා අයිෂාදි හා දරු දෙදෙනාද පැමිණියෝය.

"අනේ සජී මිස්... බලන්නකෝ" මනෝජ් ඇය වෙත ගියේය.

"හංසි... " සජීවා සස්වින්දි වෙතට ආවාය.

"ආන්ටී... මගේ පුතා ආන්ටී..." ඇය දුටු සස්වින්දි කෑගැසුවාය.

"සීතා නැන්දේ... මගේ දරුවා..."

"ඉවසන්න පුංචි නෝනේ... පුංචි මහත්තයා හොයාගයි"

"අපේ අප්පච්චී එහෙම දෙයක් කරල නම් හංසට කලින් එයාව මරන්නේ මම සස්වී" අයිෂාදි කීවාය.

"අනේ අයිෂාදි අක්කේ... මට මොකුත් නොකර ඇයි මගේ අහිසංකයව අල්ලා ගත්තේ" සස්වින්දි විලාප තැබුවාය. සජීවා සහස්වි තුරුලු කර ගෙන සුරතල් කරද්දී සස්වින්දි තවත් විලාප තැබුවාය.

"තොරතුරු හම්බ වුණා... යමු හංසි පොලිසියට" තුහංස

සස්වින්දි වෙතට පැමිණ ඇයගේ බඳ වටා අත දමා ඇයව මේසයෙන් බස්සවා ගත්තේය.

"තාත්තී... මගේ තාත්තී" තුහස්ගේ හඬ තුහංසට ගල් වුණේය. පොලිස් නිළධාරිණිය අත සිටි තුහස් තුහංස අතට පැන්නේය.

"ත්‍රීවිල් එකක පිටි පස්සේ ඉඳලා කෙනෙක් අපට ගෙනත් දුන්නේ" පොලිස් නිළධාරියා කීවේය.

"කොහෙද මගෙ රත්තරන් ගියේ" තුහංස බදා වැළඳගෙන සිප ගනිමින් සිටින තුහස් ගෙන් සස්වින්දි ඇසුවාය.

"නංගිට උස්සගෙන ගියාලු... නංගි වැටුණාලු... ආච්චි අම්මා ගහයි කියලා ගෙදරින් ගිහින් ත්‍රීවිලර් එකේ හැංගුණාලු තාත්තිව හොයාගෙන එන්න... එහෙම තමයි දරුවා අපට කිව්වේ" තුහස් තවත් තුහංසට ගුලි වූවේය.

"එයාගේ නම තුහස් සස්දෙව් බක්මීමල්දෙණිය කියලා තාත්තා තුහංස සස්වින්ද බක්මීමල්දෙණිය... අම්මා තුහංසි සස්වින්දි බක්මීමල්මල්දෙණිය කියලත් කිව්වා... මිස්ටර් බක්මීමල්දෙණියගේ පැමිණිල්ල ගැන බලලා තමයි අපි දරුවව මෙහෙට ගෙනාවේ... මේ එකම නම් තියන කට්ටිය බලාගෙන යන්න අපි ආවේ" පොලිස් නිළධාරිණිය පැවසුවේ සිනාසෙමින්ය.

"තැන්ක්යූ... පොලිස් දෙපාර්තමේන්තුවටයි... ඔයාලා හැමෝටමයි... මගේ පුතා ගෙනත් දුන්නට" තුහංස දෑත් එක්කොට කීවේය.

ඔහුගේ මේ යටහත් බව වෙනස්වීම රහල්ට නොව සජීවාට මනෝජ්ටනම් හිතා ගන්නටවත් නොහැකි කාරණයක් විය.

"අර ගෙනල්ල දුන්න ත්‍රීවිල් එකේ මහත්තයට මම ලක්ෂ දහයක තෑග්ගක් දෙනවා කියලා කියන්න" තුහංස කීවේය.

"ඇයි තුහස්... වෙනදටත් ඔයා නංගි අරන් ගිහින් වැටිලා තියනවනේ... ආච්චි අම්මා ගහනවද" පොලිසිය ගිය සැනින් සස්වින්දි තුහස්ගෙන් ඇසුවාය. ඔහු නිහඬව තුහංසගේ උරයේ සැඟවූවේය.

"තාත්තිට කියන්න මගෙ රත්තරන් පුතා... ඇයි ගියේ කියලා" මනෝජ් ඇසුවේය. එහෙත් ඔහු නිහඬව සිටියේය.

"එහෙනම් මගේ තාත්තිට රහසින් කියන්නකො මගේ පුතා" තුහංස කීවේය.

"නංගි මම අරන් ගියේ හොරෙන් උස්සගෙන" තුහස් කියද්දී තුහංස සස්වින්දි දෙස බැලුවේය. ඇය නැඟී එන සිනහව වළකා ගත්තාය.

"අපි දෙන්නා වැටුණා... නංගිගේ ලේ ආවා තාත්තී... මට බය හිතුණා"

එවර නම් සස්වින්දි තදින් තොල හපා ගත්තේ තුහංස වෙතම දෑස් රඳවාගෙනයි. තුහංස ඇය සිතූ දේ වටහාගෙන ඇයට රැව්වේය.

"බලන් ගියාම බය කියන දේත් පරම් පරාවට යනවාද මන්දා" සීතා කාටත් පොදුවේ කීවාය. සස්වින්දිගේ සිනහව පිට පැන්නේ හඬිනි.

"පිස්සු..." තුහංස වහා එතැනින් ඉවත ගියේ තුහස්ද සමඟින්ය. සිදුවීම වටහාගත් සියල්ලෝම සිනහව හඬින් පිට නොකළේ තුහංස කෝප ගනී යැයි වූ බිය නිසාය.

"දැන් අපි කට්ටයගෙම නම් අහ ගත්තා... මේ පුංචි බෝණික්කිගේ නම මොකද්ද සස්වින්දි මිස්" සජීවා අත වූ දියණිය සුරතල් කරමින් දුලංගි ඇසුවාය.

"සහස්වි තුල්මා බක්මීමල්දෙණිය"

"පවුලෙම නම් එකයි... බබාලගේ නම් මිස්ද දැම්මේ"

"හ්ම්..."

"සර්ගේ නමයි මිස්ගේ නමයි එකම වුණේ කොහොමද"

"මිස්ට නම තිබ්බේ ඔයාලගේ සර්ගේ තාත්තා" මනෝජ් කීවේය.

"ඒකට ඔයාලගේ සර් හරි කේන්තියෙන් හිටියේ" සජීවා සිනාසෙමින් කීවාය.

"ඒ වුණාට මිස්ව උස්සලා ඔයාලගේ සර් නම් දෙකම එකම කර ගත්තා පළිඟුආරච්චි බක්මීකල්දෙණිය කරලා" රහල් පැවසුවේ ඔවුන් වෙත එන තුහංස දෙස බලමිනි.

"උඹ ඒකට අත්සන ගහලා කියවන්න එන්නේ... අත්සන් නොකර ඉන්න තිබුණනේ" තුහංස කීවේය.

"අමාරුවෙන් පස්සෙන් ගිහින් කරේ එල්ලගෙන හිටියට මචං මාත් බල බලා හිටියේ ඒ උගුලෙන් ගැල වෙන්නේ කොහොමද කියලා... ඒකයි පටස් ගාලා අත්සන ගැහුවේ"

"රහල්" සස්වින්දිගේ පහර වළකා ගැනීමට රහල් දිව ගියේය.

"කෝ... මේ මගේ පැටව් දෙන්නා... තරහා වෙලාද" තුහංස නිවුන්නුන් දෑත දෙපසට වඩා ගනිමින් කීවේය.

"එතකොට මේ බබලාගේ නම් මොනවද" කළුපහන ඇසුවේ තවත් විසඳුම් නොලැබුණු පැනයකට විසඳුම් සොයායි. සර්ට නිවුන් දරුවන් සිටින බව කාර්යාලයට ලැබුණු ආරංචියක තිබුණේය.

"දසිත් තල්පේආරච්චි... දස්මිතා තල්පේආරච්චි..." අයිෂාදි කීවාය.

තිගැස්සුනේ සස්වින්දියි. තුහංස වහා එතැනින් ඉවත ගියේය. සැනෙකින් කාටත් රහසින් සස්වින්දි ඔහුව සොයා යනු රහල් තියුම් සමඟ සිනාසෙමින් බලා සිටියාය.

"හංස... ඔයා අයිෂාදිව බැන්දේ නැද්ද"

"මෙච්චර දෙයක් වෙද්දී කෝ ඔයාගේ මහත්තයා" එයට පිළිතුරු නොදුන් තුහංස ඇය වෙතට හැරී ඇසුවේය.

"මම ඔයාට මහත්තයෙක් ගැන කියලා නැහැ" සස්වින්දි ඉවත බලා ගනිමින් කීවාය.

"හරි... ඒ වුණාට මගේ ළමයි තාත්ති කියන තාත්තා ගැන කියලා තියනවා" තුහංස ඇය වටා දෑත් ඔතා ගත්තේය.

"හංස මේ ඔෆිස් එක"

"මගේ ඔෆිස් කාමර වල මේස උඩ මම මීට වඩා දේවල් කරලා තියනවා... අහපු දේට උත්තර දෙනවා"

"හංස... දොර ඇරලා"

"උස්සලා දාගන්නවා මේසේ උඩට මම... ඔයා ඉස්සරහා චිතු කිස් කළ මට ලෝකයා ඉස්සරහා මයෙ ගෑනිව කිස් කරන්න බැරි කමක් නැහැ... වෙන දෙයක් වුණත් කරන්න පුළුවන් කියලත් මතක තියා ගන්නවා... ඇහුව්ව දේට උත්තර දෙනවා" ඔහු ඇයගේ වතට එබුණේය.

"එයාලා තාත්ති කියන්නේ අපේ තාත්තිට"

"එහෙමද... එහෙනම් මොකද තමුසේ එදා මම ගෙදර එක්ක ගිය වෙලේ  අඬ අඬා දැඟලුවේ වෙන මිනිහෙක් නැත්නම්"

"මට මිනිහෙක් නැති වුණාට ඔයාට ගෑනියෙක් හිටියනේ"

"ඔව්... වෙන නම් දූන්නට ඒ ළමයිනුත් මගේ හරිද" ඔහු සස්වින්දි සිප ගනිමින් කීවේය.

"යනවා යන්න එහාට... ඉඹින්න එන්නේ" සස්වින්දි ඔහුව තල්ලු කර දැම්මාය.

"අදම... මේ දැන්ම බබාලත් එක්ක ගෙදර යන්න එන්න ඕනේ" ඔහු ඇයගේ කීම නොතකා ඇදගෙන තුරුලට ගෙන තව තවත් ඇයව සිප ගනිමින් කීවේය.

"අයිෂාදි... බබාලා..."

"එයා හවසට මහත්තයා වැඩ ඇරිලා ආවම එයාගේ ගෙදර යනවා"

"මහත්තයා..."

"ඔව්... එයාගේ මහත්තයා... අර බබාලගේ තාත්තා" තුහංස සස්වින්දිගේ දෙතොලට එබුණේය.

"අනේ හංස... මට හිතා ගන්නත් බැහැ"

"ඔයා බැඳලා නැහැ කියලා තිමිර කියපු දවසේ මටත් එහෙම තමයි... සතුට දරා ගන්න බැරි වුණා"

"ඔව්... ඉවසා ගන්නත් බැරි වුණා"

"හ්ම්... ඒකනේ අරන් ගියේ"

"කසාදේ නැහැ කියලා අමතකද"

"උසාවියෙන් ආවේ අත්සන් නොකර කියලා අමතකද"

"එතකොට..."

"තීන්දුව දුන්නට අපි දෙන්නම අත්සන් කරලා නැහැ හංසී... ඔයා ගියා වගේම මාත් අප්සට් එකට එහෙමම ගියා"

"එතකොට තීන්දුවක් දුන්නේ"

"තීන්දුව දුන්නට විවාහය අවලංගු වෙලා නැහැ... විවාහය නියමානුකූල කරන්න අපි දෙන්නා අත්සන් කරන්න ඕනේ... නැත්නම් තීන්දුව වලංගු නැහැ... නැත්නම් මෝෂන් දාලා තීන්දුව අයින් කර ගන්න ඕනේ"

"ඉතින්..."

"ඔයා බැඳලා නැහැ කියලා දැන ගත්ත දාට පහුවදා මම උසාවි ගිහින් මෝෂන් එකක් දාලා නඩුව ඉල්ලා අස්කර ගත්තා... ඔයාව උස්සගෙන ගෙදර ගියේ ඊට පස්සේ"

"මදාවියා..."

"අසත්පුරුෂයා... නරුමයා... තොට හොඳක් වෙන් නැහැ..." සස්වින්දි ඔහුගේ කට වැසුවාය.

"ආය මගේ ජීවිතේ ඇති තුරාවට එහෙම කියන්නේ නැහැ"

"මේ රතු මූණට... කඳුළු කම්මුල් වලට මම ආදරෙයි රත්තරන්... ඒත්... මම ආය මේ ඇස්වලට කඳුළු දෙන්නේ නැහැ" තුහංස ඇයව නැවතත් සිප ගනිමින් කීවේය.

"ඇත්තටම හංස අයියා අපේ අක්කිට ආදරේ කරන්න ඇති රහල් අයියේ" ඔවුන් දෙස බලා සිටි තියුමි කීවාය.

"ඔව් තියුමි... ඒත් උන් දෙන්නගේ හිතුවක්කාරකම් කේන්තිය ආදරේ යටපත් කරලා තිබුණේ... ඒ නිසා ආදරේ මතු

වෙන්න ඉස්සර කේන්තිය මතු වුණා... වෛරක්කාරයෝ වෙලා කුලල් කා ගත්තේ ඒකයි"

"තේරෙන්න දෙන්නට දෙන්නා නැති වෙනකල් ඉන්න වුණා"

"මමත් මේවා රහස් කර ගමු කිව්වේ දෙන්නටම දැනෙන්න ඕනේ නිසා"

"ඇත්තටම දෙන්නා වෙනස් වෙලා"

"හ්ම්... අද කොහොමද එයා පාලනය වුණ විදිහ... වෙනදා නම්" තුහංස සස්වින්දිගේ කීමට පාලනය වූ අයුරු සිහිකරමින් රහල් කීවේය.

"ආය කවදාවත් දෙන්නා වෙන් වෙන්නේ නැති වෙයි"

"ඒක තමයි වෙන්න ඕනේ... මගේ සැනසීමත් ඒක"

"හඃ... හ්..ම්..." හඬක් නගමින් රහල් තියුම් සමඟ තුහංස සිටි කාමරයට ආවේය.

"ආවට පුරුදු නැති එවුන්ට මේවගේ තැන් වල මේවා බැහැ" තුහංස කීවේ සස්වින්දි අත නොහරිමිනි. සස්වින්දි ඒ මොහොතේ ලැජ්ජාවෙන් රතු වී සිටියාය.

"බලාගෙන බැරි එවුන්ටත් ඉගෙන ගන්න පුළුවන්... වරෙන් කෙල්ලේ" රහල් තියුම්ව ළං කරගෙන සිප ගනිද්දී සස්වින්දිට වඩා තියුම් රතු වූවාය.

"මතක තියා ගනින්... තෝ මට මේවා හංගලා මාව වටේ යැව්වට මම නිකා ඉදියි කියලනම් හිතන්න එපා"

"තියුම්... අපි දැන් ගියොත් ලොකු තාත්තා අපට බකට් දායිද" රහල් එය නොඇසුණු ලෙසින් තියුම්ගෙන් ඇසුවේය.

"නැති වෙයි රහල් අයියේ... අපි යමු" තියුම්ද ඔහු හාම හඬින් පැවසුවේ තුහංස පැවසූ දෙය නොඇසුණ බව හැඟවීමටයි.

තුහංස හා සස්වින්දි රහල් හා තියුම් දෙස බලද්දී ඔවුන්ද ඔවුන් දෙස බැලුවෝය. සිව් දෙනාම සිනාසුණේ එකවරයි.

"මගේ තාත්තී..." තුහස් තුහංස වෙත දිව ආවේය.

"වෙන මොනවත් නම් දැන් ආය බලාගෙන අපට ඉගෙන ගන්න බැරි වෙයි තියුමි... කරපු කෙරුම් වල ප්‍රතිඵල ඇවිල්ලා" තුහංස තුහස් වඩා ගනිද්දී රහල් කීවේය.

නොසිතූ ලෙස සස්වින්දි ඔක්කාරයක් එද්දී තුහංස වහා ඇයව අල්ලා ගත්තේය. රහල් හා තියුමිද ඇයට ළං වූවෝය.

"ඒයේ පෙරේදා කරපු කෙරුම් වල ප්‍රතිඵලත් ඇවිල්ලද හංසයෝ" රහල් අසද්දී තුහංස සස්වින්දි දැස බැලුවේය.

සස්වින්දි ඔහු දෙස බැලුවාය. ඇයගේ වතේ සිනහා රැල්ලක් ඇඳී යද්දී තුහස් රහල්ට දුන් තුහංස වහා සස්වින්දි තුරුලුකර ගෙන සිප ගත්තේය.

"මේ... කට වහගෙන ඉන්නවා හරිද... මනෝජ් අංකල් මාව මරලා හංගයි... මේවා දැන ගත්තොත්... ගෙදර ගිහින් මාසෙකින් විතර ආරංචිය යවමු" තුහංස සස්වින්දිට කීවේ රහසින්ය.

එදා තුහංසට නුවරඑළියේ කාර්යාලයට යාමට සිදු වූ නිසාවෙන් ඔහු සමඟ සස්වින්දිත් පැමිණියේ සජීවා හා මනෝජ්ගේ කීමටයි. ආය කිසිම දිනෙක කිසිම මොහොතක දෙදෙනාට වෙන්ව නොසිටින ලෙසට සජීවා වාරණයක් දැමුවාය.

"ඔව්... ආය කිසිම හේතුවකට දෙන්නට දෙතැනක ඉන්න බැහැ... පුතා යන තැනකට මෙයත් එක්ක යන්න... මායි නංගියි දරුවෝ බලා ගන්නම්" මනෝජ්ද කීවේය.

කාර්යාල වැඩ අවසන් කළ ඔවුන් දෙදෙනා නිවාඩු නිකේතනයකට ගියද තුහංස තුරුලට වී සිටියද සස්වින්දිට නම් සැනසීමක් නොවීය. සිදුවූ සිදුවීම නිසා වූ කැලඹීම හේතුවෙන් සස්වින්දි සිටියේ අන්දමන්දවයි. ඇයට තුහස් නැතිවූ මොහොතේ දැනුණු බිය දැනෙන්නට විය.

"ඇයි කෙල්ලේ"

"හංස..."

"කියන්න රත්තරන්" කථාවෙන් පවා තුහංස වෙනස්වී සිටියේය.

"මට තවත් බයයි"

"මටත් මගේ කොල්ලා මතක් වුණා"

"එහෙනම් යමුද ගෙදර" කියූ සස්වින්දි

"ඔයා කැමතිනම්" ඒ හාම ඇය පැවසුවේ තුහංසට කේන්ති යෑම ගැන වූ සැකයෙනි.

"මට හිතුණා පොඩි එවුන් ළඟ හිටිය නම් කියලා... එයාගේ අම්මව මම බලෙන් හරි ළඟ තියාගෙන ඉදලා තිබුණට එයාලව මම ළඟ තියාගෙන ඉදලා නැහැනේ... අපි ගෙදර යමු" තුහංස කීවේය. සස්වින්දි නැඟී සිටියේ සතුටිනි. ඔහු තුහංසව සිප ගත්තාය.

තුහංස හා සස්වින්දි නිවසට පැමිණෙද්දී මනෝජ් පුදුම වූවේය. එහි නතරව සිටි සජීවා හා සීතාද නැඟිට ආවේ බියෙනි.

"අනේ බය වෙන්න එපා අම්මේ... හංසිටයි මටයි පොඩි දෙන්නා මතක් වුණා... ඒකයි ආවේ" තුහංස කීවේය.

උදෑසන සාලයේ බිම මෙට්ටයක දරු දෙදෙනා දෙපසින් තබාගෙන තුහංස සස්වින්දිවත් තුරුලු කර ගෙන නිදා සිටියේය. පෙරදා බීමතින් වැනී වැනී නිවසට පැමිණි පුත්‍රයා මොහු නොවේ යැයි ඇයට සිතුණාය. ඇය තනිව සිනාසුණේ දරා ගත නොහැකි සතුටකිනි.

"සජී මිස්ට දැනෙන සතුට සැහැල්ලුව මටත් මේ මොහොතේ දැනෙනවා... දෙමාපියන්ට ඒ වගේ සැනසීමක් තවත් නැතුව ඇති"

"ඔව් මනෝ... රජී කොහේ හරි ඉදලා මේවා බලාගෙන සතුටු වෙනවා ඇති කියලා මට හිතෙනවා"

"ඇත්ත සජී මිස්... අපූර්වාත්" මනෝජ් කීවේය.

වතට දැනුණු දෙතොල් පහසට සස්වින්දි අවදි වූයේ තිගැස්සී ගෙනයි. තුහංස සිනාසීගෙන ඇයගේ වතට එබී සිටියේය.

"මම බය වුණා" සස්වින්දි මිමිණුවාය.

"බය වෙන්න එපා... මීට පස්සේ හැම දාම මහත්තයා මේ විදිහට ළඟ ඉන්නවා"

සහස්වි ළය මතට ගත් තුහංස සස්වින්දි ළංකර ගනිමින් කීවේය. තුහංස පැත්තට හැරුණු සස්වින්දි ඔහුගේ ළය හරහා අත දමා තුහස්වද අල්ලා ගත්තාය.

ජීවිතේ පැතුවේ මෙවන් දිවියකි. එය තමාට දැන් ලැබී ඇත. සස්වින්දිගේ සතුටට තිමක් නොවීය. තුහංසගේ උණුසුම විඳිමින් ඇය සිතුවාය.

තුහංසට වතුර වීදුරුවක් බන්දෙසියක තබා තේ කෝප්පයක් සමඟ එය රැගෙන සස්වින්දි ඔහු ළඟට ගියේ අපමණ සතුටකිනි. නැගී සිටි තුහංස කට සෝදා වතුර බී තේ කෝප්පය අතට ගත්තේ ඇයට සිපුමක් ලබා දෙමින්ය.

"මට ජීවත් වෙනවා කියලා දැනෙනවා හංසී... මේ ජීවිතේ ආය නම් මට දවසකටවත් නැති කර ගන්න බැහැ... වරදක් වෙන්න ඉස්සර මාව හදා ගන්න"

"හදා ගන්න... මම... ඔයාව..."

"ඔව්... ඔයා තමා හදා ගත්තේ... මගේ බලාපොරොත්තුව වුණේ ඔයා... අයිෂාදියි විහවයි එකට ඉන්නවා දැක්කම තමයි මට ආදරේ මොකද්ද කියලා දැනුනේ... රහල් ඔයා එයාගේ පණ කිව්වේ ඇයි කියලා මට හිතුනේ... පස්සේ තමයි මම තේරුම් ගත්තේ මම ඔයාට කොච්චර ආදරේද කියලා... ඒ ආදරේ නාමයෙන් තමා මම හැදෙන්න ඕනේ කියලා හිතුවේ"

"එතකොට මම බැඳලා කියලා නේද හිතුවේ"

"මගේ හිත කිව්වා ඔයා බැඳලා නැතුව ඇති කියලා... බැඳලා හිටියත් කමක් නැහැ... මම ඔයා වෙනුවෙන් හැදෙනවා කියලා හිතුවා"

"මම හිතුවේ ඒ අයිෂාදි නිසා කියලා"

"නැහැ... සුසිල් අංකල් චිතු එක්ක යන්න ඉස්සර ලෑස්ති වුණේ අයිෂාදිව මට බන්දවලා දෙන්න... එයා එතකොට විහාෂ් එක්ක යාළු වෙලා ඉඳලා තියෙන්නේ"

"මේක ප්‍රපෝස් කරන කොටත්"

"නැහැ... මගුල තීන්දු කරන් රට ගියාට පස්සේ"

"අපේ ඩිවෝස් එකට අයිෂාදි ගෙන්වන කොට එයා ඇවිත් තිබුණේ විහාෂ් එක්ක"

"ඔයාට කිව්වද එයා ඒ ගැන"

"නැහැ... ඒත් ඒක සුසිල් අංකල් දැනගෙන... ඊට පස්සේ යකා වෙලා අයිෂාදිව ගෙනල්ලා අපේ ගෙදර දැම්මා" සස්වින්දි තුහංස ඇය වටා ඔතා සිටි දෑත් ගලවා දැමුවේය. එය කුමක් නිසාදැයි වටහා ගත් තුහංස හඬින් සිනාසුණේය.

"චික්... මට හිතුණා... මමත් හැඟිම් වලට වහල් වුණා අමතක කරලා" ඇය පිළිකුලෙන් කීවාය.

"එයා ගෙනත් දාන කොට මම ඇක්සිඩන්ට් වෙලා නැඟිටින්නවත් බැරුව ඇදේ... නැත්නම් ඉතින් ගෙදරම හිටිය එකේ..." තුහංස නැවතත් ඇයව තුරුල් කර ගත්තේය.

"අම්මී... නංගි අඬනවා..." ඇසුනේ තුහස්ගේ හඬයි.

"අරන් එන්න පුතේ" සස්වින්දි කීවාය.

"ඉක්මනට පොඩි උන්ටික ලොකු කර ගන්න ඕනේ... එතකොට නිදහසක් ලැබෙයි"

"එකෙක් ටිකක් ලොකු වෙන කොට තව එකෙක් බඩේ... නිදහස ලැබෙයි බලාගෙන ඉන්න"

"තරහෙන්ද කිව්වේ"

එයට කිසිත් නොකී සස්වින්දි සහස්වි වඩා ගෙන ඇයගේ මුවේ තනය තැබුවාය. තුහංස තුහස් වඩා සිපගෙන ඇය අසලින්ම වාඩි වුණේය. තුහස් ඔහුට තුරුල් වූවේය.

"දරුවෝ තමා අපි දෙන්නගේ වටිනාම සම්පත හංස"

"අපේ විතරක් නෙවෙයි හංසී... හැම අම්මා කෙනෙක්ගෙම... හැම තාත්තා කෙනෙක්ගෙම"

"එහෙම නැහැ හංස... දැන් ඉන්න අය හදන්නේ එක

ළමයයි"

"එක ළමයෙක් හදාගෙන අපේ අම්මි කොච්චර පසු තැවුනද... මට මොනවා හරි වුණොත් එයාට කවුද ඉන්නේ කියලා එයා කොච්චර තැවුනද"

"අපේ තාත්තිත් එහෙම තමයි... ඒ නිසා අපි බබාල ගොඩාක් හදමු"

"ඔයා එකඟ නම් ඕනේ වෙලාවක මම ලෑස්තියි"

"මොනවා නැතත් ඕනේ වෙලාවක ඒකට නම් ලෑස්ති වෙලා ඉන්නේ කියලා මම දන්නවා... ඒකනේ මට අයිෂාදි ගැන වුණත් කොච්චර කිව්වත් විශ්වාස කරන්න බැරි"

"එයා අපේ ගෙදර එන කොට ප්‍රෙග්නන්ට්... එයා මට කිව්වා විහාජ් ගැන... මම එයාව බඳින විදිහට මම ඒ දෙන්නව බන්දලා කරබාගෙන හිටියා... ඒක දැන ගත්තට පස්සේ සුසිල් අංකල් මහා වලියක් දාලා රටෙනුත් ගියා"

"ඊට පස්සේ අයිෂාදි හිටියේ ගෙදරද"

"හ්ම්..."

"ඔයාට හොඳ වුණාට පස්සෙත්"

"ඔව් බං... ඒකිගේ මිනිහා කුඩැල්ලා වගේ... ගැලවෙන වෙලාවක් ඇත්තෙම නැහැ... කිස් එකක්වත් දීගන්න අල්ල ගන්න බැරි වුණා... ඒකයි දුක" තුහංස නින්දගොස් තිබූ තුහස් දෙස බලමින් කීවේය.

"එකොට දීලම නැහැ"

"දීලා තියනවා... එයාලගේ ගෙදර ගිය කාලේ... ආන්ටි එහෙ මෙහෙ වෙන කොට"

"මාව මෙහෙ තියාගෙන"

"ඒ ඉතින් කිස්එකට නෙවෙයිනේ... හැමදේකටමනේ" තුහංස සිනාසෙමින් කීවේය. සස්වින්දි තුහංසව කොනිත්තා දමද්දී ඔහු දැඟලුවේය.

"අම්මී..." තුහස් කෑගැසුවේය.

"මාව කියලා කොල්ලවද කෙනිත්තුවේ"

"මාරු වුණාවත්ද... තුහස්..."

"මගෙ තාත්තිව කොනිත්තන්න එපා" ඔහු දෑස් වසාගෙනම කීවේය.

"ඇස් වහගෙනත් වෙනදේ කියවනවද" සස්වින්දි කියද්දී ඔහු දෑස වසාගෙනම සුරතල් සිනාහවක් පෑවේය. තුහංස ඔහුව සිප ගත්තේය.

"තුහස්"

"හ්ම්..."

"අපි රවුමක් ගිහින් එමුද" ඔහු දෑස් විවර කර නැඟී සිටියේය.

"කවුද"

"අම්මියි මමයි... නංගියි ඔයයි"

"අනේ හා..." ඔහු කලබලයෙන් තුහංසගේ ඇකයේ සිට ගත්තේය.

"හා... හා... තාත්තිගේ ඔඩොක්කේ හිට ගෙන නටන්නේ... දැන් නංගිවත් පෑගෙනවා"

"කොහෙද අපි යන්නේ"

"රට වටේම"

"අනේ හා..." තුහස් සතුටින් සිනාසුණේය. සහස්විගේ සිනා හඬට තුහංසත් සස්වින්දි එකවර ඇය දෙස බැලුවෝය. ඇයත් කියූ දේ වැටහුණු අයුරින් සිනාසෙමින් සිටියාය.

"මම සීයා තාත්තිට කියලා එන්නම්" තුහස් දිව ගියේය.

"මෙයා බලන්නකෝ... තේරෙනවා වගේ හිනා වෙන හැටි"

"එයාටත් තේරෙන්න ඇති" තුහංස ඇයව සිප ගනිමින් කීවේය.

"හ්ම්... ළමයා ඉඹිනවනම් ළමයා ඉඹින්න... වෙන තැන් ඉඹින්නේ නැතුව" සස්වින්දි කීවාය.

"එදත් හිතුණා... අමාරුවෙන් ආසාව මැඩ ගත්තේ"

"කවද්ද"

"මම මෙයාලා ඉස්සරෝම දැක්ක දවසේ"

එදා තුහංස මේ ලෙසින් සහස්වි සිප ගනිද්දී තම ළය කිතිකැවී ගිය අයුරුත් තමාට දැනුණු ශෝකානුකූල හැඟීමත් සස්වින්දි සිහිවිය.

"ඔයාව නැති කර ගත්ත එක ගැන ගොඩාක් දුක් වුණා එදා මම"

"ඇත්තද... හොඳ වැඩේ" තුහස් නැවත වතාවක් සහස්වි සිප ඇයගේ ළයද සිප ගත්තේය.

"ඒයි..."

"ඇයි"

"එපා කිව්වා නේද" සහස්වි ඔසවා ගත් තුහංස සස්වින්දි කෑගසද්දී ඇයගේ ළය සපා දමා දිව ගියේය.

ඔයා වෙනස් වුණාට ඔයාගේ දඟ වැඩ නම් වෙනස් වෙලා නැහැ හංස... සස්වින්දි සිනාසෙමින් මුමුණා ගත්තාය.

"යන විදිහට ඔෆිස් එන එකයි ඇත්තේ... ඔය ගෑනු පරාන එල්ලගෙන මට යන්න බැහැ" කාර්යාලයට යාමට සූදානම්වී කණ්නාඩිය ඉදිරිපිට හිස සකසමින් සිටි තුහංස කීවේය.

"අනික අලුතින් ගත්ත කෙල්ලෝ ගොඩේ චීස් කෑල්ලක් වගේ කෙල්ලක් ඉන්නවා... මමමයි තේරුවේ... දූලංගිව ප්‍රමෝට් කරන්නත් මම හිතාගෙන ඉන්නවා" තුහංස කණ්නාඩියෙන්ම පදෙස බලාගෙන කීවේය.

"මමයි ළයනියි මේ වෙන කොට ගිහිල්ලා... පරක්කු වෙලා ඉක්මනට යන්න ඕනේ... උදේශ් මට සීට් එක අල්ලගෙන ඇති" සස්වින්දි තුහංස දෙස නොබලාම කීවාය.

"අළුතෙන් ආව උස කොල්ලෙක් ඉන්නවා... දෙතුන් ගමනක් මම දිහා බලනවා මම දැක්කා... එයාව එකවුන්ට් සෙක්ෂන් එකට දාන්න බැරිද" සස්වින්දි කණ්නාඩිය අසලට විත්

එහි තම පිළිබිඹුව දෙස බලමින් කීවේය.

ඇයව ඔහු වෙතට ඇද ගත් තුහංස ඇයගේ ගෙලේ රතු ලපයක් තැබුවේ ඇය කිසිසේත්ම නොසිතුව ලෙසයි"

"මොනාද හංස... ලැජ්ජාවේ බැහැ... මේක පේනවා" සස්වින්දි කණ්නාඩියෙන් ගෙල දෙස බලමින් පැවසුවේ නෝක්කඩුවෙනි.

"ඔයාගේ සෙක්ෂන් එකට ඒ කෙල්ලා දැම්මම ඉන්දවන පැත්ත බලලා තමයි මම ඕක තිබ්බේ ඌට පේන්න" කියූ තුහංස සස්වින්දිව නැවත ළංකර ගත්තේය.

"ඔයා තරම් වටින දෙයක් මට මේ මිහිපිට තවත් නැහැ රත්තරන්..." තුහංස ඇයව තදින් වැළඳ ගත්තේය.

"හංස..." සස්වින්දි නැගුවේ ආදරණීය කෙඳිරියකි.

සස්වින්දි තුහංසත් කාර්යාලයට ඇතුළු වෙද්දී සැවොම මුව පුරා සිනාසුණෝය. වසරකට ආසන්න කාලයක් රහසක් කළ සබඳකමක් නොසිතූ ලෙස හෙළි වූයේ කාවත් පුදුම කරවමිනි.

"අද හංසයයි හංසියයි එකට... මම බකට් නොදා බස් එකේම ආවා" ළයනි සැමව සිනහා ගැන් වූවාය.

"හංස යුවලගේ හංස පැටව් දෙන්නත් මරු ඇත්තමයි" හිමාෂා කීවාය.

"අනේ ඔව් සස්වින්දි මිස්... ළයනි මිස් මිස්ලා ගැන කියන කොට අපිට අදහන්නත් බැරි වුණා"

"ඔව්... ලොකුම පුදුමේ කියන්නේ... සර්රුයි මිසුයි මේක ඇතුලේ කසාදයක් රහසක් කර ගෙන නොදන්නවා වගේ හිටිය එක" සස්වින්දි සිනාසුණා මිස ඔවුන්ට කිසිවක් කීමට ගියේ නැත.

"හොඳම වැඩේ වුණේ නාකි මනමාලයට... අද පේන්නවත් නැහැ... අස්වෙලාම යයිද දන්නේ නැහැ" ළයනිගේ කතාවට සියල්ලෝම හඬින් සිනාසුණෝය. කළුපහන ඒ වන විටත් පැමිණ නොතිබුණේය.

සස්වින්දි තුහංසගේ කාමරයට ගියේ ලිපිගොණු කිහිපයක්

රැගෙන ඔහුගේ අනුමැතිය ලබා ගැනීමටයි. කා සමඟදෝ දිගු කතාවක සිටි තුහංස එම කතාව අතර තුරම ලිපි ගොණුවක් දිග ගැර ගත්තේය. සස්වින්දි ඔහු දෙස බලා සිටියේය.

ඇයට සිහි වූයේ අතීතයයි. ටැටූ ගසාගෙන මාල වළලු දමාගෙන සඟයින් පිරිවාරා මත් පැන් බොතලය කට තබාගෙන දැඟලූ ඒ මැරයා දිනෙක මෙලෙසින් දැක ගන්නට හැකි වේ යැයි ඇය සිහිනෙකින්වත් නොසිතුවාය.

දුරකථනය පසෙකින් තැබූ තුහංස ලිපිගොණුව සුරතට ගෙන ආසනයට හේත්තු වූයේ එය ගැනම සිහියෙනි. උදෑසන චීස් කෑල්ල ලෙසින් පැවසූ තරුණිය ඔහු අසල සිටගෙන ඔහු දෙස ඇසපිය නොහෙලා බලා සිටියද ඇය ගැන හැඟීමක් තුහංසට නොවීය. ඇය මද වේලාවක් සිටගෙන සිටියාය. සස්වින්දිගේ ඉඟියෙන් ඇය තුහංස ඇමතීය.

"සර්..."

"හඃ... ආ..."

ඇයගේ ලිපිගොණුවට අත්සනක් තැබූ තුහංස නැවත ආසනයට හේත්තු වූයේ ඇය ගැන කිසිදු තැකීමක් නොකරයි. සස්වින්දිට නැඟුණු සිනහව පිටකර ගත නොහැකිව ඇය සිටියේ අපහසුවෙනි.

එම ලිපිගොණුවේ අත්සන තැබූ තුහංස සස්වින්දි දෙස බැලුවේය. සස්වින්දිගේ සමච්චල් සිනහව කුමකටද යන්න තුහංසට ඒ මොහොතේ නොවැටහුනේ පිටව ගිය තරුණිය ගැන අවධානයක් ඔහු නොදැක් වූ නිසයි.

"දුලංගි මිස්ව... සර් ප්‍රමෝට් කරනවා කිව්වා " සස්වින්දි කීවේ තුහංස දෙස බලාගෙනයි.

තමාගෙන් අත්සනක් ලබා ගෙන ගිය තරුණිය එසේ නම් ඒ තරුණිය වන්නට ඇතැයි තුහංසට සිතුණේය. සස්වින්දි සමච්චල් හිනාවක් නැඟුවේ ඒ නිසා බව තුහංසට වැටහිණි.

"මාව..." තුහංස දෙස බලා දුලංගි ඇසුවේ පුදුමයෙනි. තුහංස තව ලිපිගොණුවක් පෙරලා ගත්තේය.

"ඔව්... ඔයාව මෙතනින් අයින් කරලා වෙන කෙනෙක්

ගන්නවා කිව්වා සර්... ප්‍රයිවට් සෙකට්‍රි විදිහට"

"යෝජනාව සස්වින්දි මිස්ගෙද... මිස්ද එතකොට සර්ගේ සෙකට්‍රි" දූලංගි ඇසුවේ සිනාසෙමිනි.

"ම්... නෑ..හෑ... මම නෙමෙ...යි" තුහංසගේ නිහඬ සිනාහවකින් තොර බැල්ම කුමකටද යන්න වටහාගත නොහැකිව සස්වින්දි මිමිණුවාය.

තුහංස නැඟිට පැමිණ සස්වින්දිගේ වතට නැමෙද්දී සස්වින්දි වහා දූලංගි දෙස බැලුවාය. ඇය පරිඝණකය දෙසය හැරුණේ සිනාසෙමිනි.

"දැඟලුවොත් උස්සලා දාගන්නවා මේසේ උඩට... කට පරිස්සම් කර ගෙන ඉන්නවා..." රහසින් කියූ ඔහු ඇයගේ නලලටත් කොපුලටත් සිපුමක් දී නැඟී සිටියේ දූලංගි දෙස බලමිනි. සස්වින්දි රතු වූවාය.

"මිස්ට ඊර්ෂයයිලු... දුකයිලු... දූලංගියි මමයි මෙහෙම කාමරේට වෙලා ඉන්න කොට" තුහංස ආසනයේ වාඩි වෙමින් කීවේය.

"ඒ වුණාට කේලම් අහගන්න... තියා ගන්නත් හිත" තුහංස කීවේය.

"ස..ස..ර්"

"මේකේ ඇතුළේ වෙන ඒවා ඔක්කොම දූලංගි ගිහින් කනේ තියන බව මම දන්නවා... තැන්කස් මේකේ ඇතුළේ කෙල්ලන්ටයි ඔයාටයි වෙන දේවල් විතරක් නොකියනවට" තුහංස ඇය වෙතට නැමුණේය.

"හ්ම්... අරන් ගිහින් තමන්ගේ වැඩක් කර ගන්න" තුහංස ලිපිගොණු ඇයට පාමින් කීවේය. නැඟී සිටි සස්වින්දි එය උදුරා ගත්තේ ඔහුට රවමින්ය.

"ඇයි හංසී... ඔයාගේ බෙල්ලට මොකද වුණේ... ප්ලාස්ටරයක් දාලා තියෙන්නේ" තුහංස ඇසුවේ කිසිත් නොදත්තෙකු ලෙසිනි.

"අනේ මමත් අහන්න හිටියේ... ඇයි සස්වින්දි මිස්"

"පුතා තුවාල කරලා දූලංගි... පොඩි තුවාලයක්"

තුහංස දෙස නොබලා බිම බලාගෙන කියූ සස්වින්දි සැනින් කාමරයෙන් පිට වූවාය. ආසනයට හේත්තුවී දෑස් වසාගත් තුහංස සිතහව සැහැල්ලුවෙන් පිටකර දැමුවේය.

දැන් මගේ ජීවිතේ මෙච්චරටම ලස්සනද කෙල්ලේ... ඔහු මුමුණා ගත්තේය.

විටෙක මනෝජ්ගේ නිවසේත් විටෙක සජීවා සිටින නිවසේත් තුහංස ඔවුන් වෙනුවෙන් ලබා ගත් නුවරඑළියේ නිවසේත් තුහංස සස්වින්දි සමඟින් මාරුවෙන් මාරුවට සිටියේය. මනොජ් සජීවා දරුවන් ඔවුන් ළඟ තබා යන ලෙස කොතරම් පැවසුවද ඔවුන් යන තැනට දරුවන්ද රැගෙන ගියේ ඔවුන්ගේ සතුට එය වූ නිසාය.

අයිෂාදි සිය සැමියා හා දරුදෙදෙනා රැගෙන පිටරට පදිංචිය ගියේ දෙමාපියන් ගැන මෙන්ම සොයුරිය ගැනද කලකිරීමෙනි. බූදලය නිසාවෙන් ඇයව තුහංසගේ නිවසද දමා සුසිල් පලා ගියේ කෝපයෙනි.

මවත් සොයුරියත් පියා සේම ඇයව අත හැර දමද්දී මවක් ලෙසින් ඇයව බලා ගත්තේ සජීවාය. සොයුරෙක් ලෙසින් යුතුකම් ඉෂ්ඨ කළේ තුහංසය. ඔවුන් ඔවුන්ට සදා ණය ගැති බව අයිෂාදි මෙන්ම ඇයගේ සැමියාද කීවෝය. දරු දෙදෙනා පිටව ගියේ සජීවා හඬවමිනි.

"අනේ පුතේ... ඉස්සරෝම ඒ දරු දෙන්නා වඩා ගත්තෙත් මම කැත කුණු අත ගාලා හදා ගත්තෙත් මේ අත් දෙකෙන්" සජීවා සස්වින්දි ඉදිරියේ හඬා වැටුණාය.

"අඬන්න එපා ආන්ටී... පාලුයි දුකයි තමයි" සස්වින්දි ඇයගේ හිස අත ගාමින් කීවාය.

"ආන්ටි පව් හංස... දවස පුරාම ඇඬුවා පොඩි වුන් මතක් කරලා" සස්වින්දි පැවසුවේ රාත්‍රියේ කාමරයේදීය.

"ඉස්සරෝම වඩා ගත්තේ අත් දෙකෙන් කැත කුණු අත ගාලා හැදුවේ එයාලු... මට දුක හිතුණා"

"මෙයා හම්බ වුණාම ඒ විදිහට හදා ගන්න කියන්න" ඔහු

ඇයගේ කුස සිප ගමින් කීවේය.

"තුහස්ව නවත්තලා යමුද"

"දැන් ඉස්කෝලේ යවන්න එවන්න ඕනේනේ... එතකල් අපි දෙන්නා එක්කම හිටපුදෙන්... අම්මට වුණත් දරුවෝ දෙන්න දුකයි"

"එහෙනම් දැන් මෙයා දෙනවා කිව්වේ ඒ විදිහට හදා ගන්න"

"ඒ කියමනට... මෙයා ආවම ඊළඟ එක්කනා දෙනවා කියනවා... දහ වෙනියා විතර හම්බ වෙන්න එන කොට ඔයා මායම් වුණාම දෙන්න හිතෙයි... එතකොට එකෙක් දෙමු" තුහංස ඇය දෙසම බලාගෙන කීවේය.

"දහවෙනියා විතර... හඃ..." සස්වින්දිත් කීවේ ඔහු දෙසම බලාගෙනය.

"හ්ම්... ඉස්සර පවුල් වල ඉතින් දාහතර දොළහා එහෙම හිටියනේ... වාසනාවන්..."

"ආ..."

"ඒ වගේම එක රජෙකුට අන්තඃපුරය ගානෙත් තිබුණනේ... අනේ වාසනාවන්"

"හංස මේ..." සිනාසෙමින් තුහංස සස්වින්දිව දෝතට ගත්තේය.

"එදා ඉඳලාම මට මේක දවසක් තියා ගත්තා කියන්නේ අන්තඃපුරේට ගියා වගේ තමයි" ඔහු ඇයව සිප ගනිමින් කීවේය.

තෙවන දරුවා ලෙසින් සස්වින්දි තවත් පුතෙකු බිහි කළාය. සෙවනැල්ල මෙන් ඇය පසු පසම සිටි තුහංස දරුවා බිහි කරන මොහොතේද නොසෙල්වී ඇය අසලම සිටියේය.

සහස් තුල්දෙව් බක්මීමල්දෙණිය... ඔහුට නම තැබුවේ තුහංසයි. නිවසට ඇයව කැඳවාගෙන ගිය ඔහු සෑම සිටියදී ඇයගේ කාමරයට ආවේය.

"මගෙන් තෑග්ගක්... හැබැයි ඔයාගෙම ඒවා... මගේ මහන්සියෙන්" තුහංස ඇය අත පාස් පොතක් තබමින් කීවේය.

"මොනවද හංස"

"බලන්නකෝ" සස්වින්දි එය දිගහැර බැලුවාය. කෝටි එකහාමාරක මුදලක් ඔහු ඇය වෙනුවෙන් තැම්පත් කර තිබිණි.

"මේ... ඇයි මේ..." සස්වින්දි මනෝජ් දෙසද බලමින් තුහංසගෙන් ඇසුවාය.

"අම්මා මට දුන්නේ ඔයා දුන්න සල්ලි කියලා මට කිව්වා... එදා ඉඳලා මම ඔයා වෙනුවෙන් මේ ගාන එකතු කළා"

"සජී මිස් ඇයි ඒක කියන්න ගියේ" මනෝජ් ඇසුවේය.

"හංසි ලොන් එකක් දැම්මා... එයාට ළඟ සල්ලි නැහැ කියලා පුතා ගෙදර ඇවිත් මට කිව්වා... එදා තමයි මම ඒ ගැන එයාට කිව්වේ මනෝ... එයා දැන ගන්න ඕනේ එයා නැගිට්ටේ හංසි නිසා කියලා... මනෝජ්ගේ කීමට හංසි දුන්නේ එයාගේ සල්ලි... රජී එයාට දුන්න සල්ලි" සජීවා කීවාය.

"හංසි ඒවා දුන්නේ මම එයාගේ වටිනාකම් ඔක්කොම අරන් තියෙද්දී... කසාදේ පවා" තුහංස කීවේ ශෝකයෙනි.

"කමක් නැහැ පුතා... ඒ සිතුවිල්ල ඔයාට පන්නරයක් වුණානේ"

"ඔව් මනොජ් අංකල්... තාත්තිගේ නැති වුණ කම්පැනිය මම ආයෙත් අර ගන්නවා... මනෝජ් අංකල් මට ඒකට උදව් කරන්න ඕනේ"

"අනිවාර්යෙන් පුතා... මම ඒක කරනවා"

තුහංස අළුත් පුතු පැටියා ඇකයේ තබාගෙන ඔහු දෙස ඇසපිය නොහෙලා බලා සිටියේය. සස්වින්දි හිටියේ ඔහුගේ උරයේ හිස තබාගෙන ඔහුගේ ගතට බරවීගෙනය.

දරුවන් දෙදෙනෙකු සිටියද මේ අයුරින් තම දෑතේ ඔවුන් තබා ගන්නට තිබුණ අවස්ථාව තමා මඟ හැර ගත්තා නොවේදැයි ඔහුට සිතිණි.

"දරුවෝ හදලා අතේ තියාගෙන බලාගෙන ඉඳලා හරි යන්නේ නැහැ... එයාගේ සීයගේ සල්ලි දැන් තුනට බෙදෙනවා... අයියගේ ගාන අඩු කරන්න වෙයි" සස්වින්දි කීවාය.

"එහෙම වෙන්නේ නැහැ... එයාගේ සීයා වගේ එයාගේ තාත්තිත් එයාට කෝටියක් මේ වෙන කොට හොයලා තියෙන්නේ" තුහංස සස්වින්දි දෙස බලා කීවේය.

"කෙල්ලක් නමින් එහෙම දාන්න එපා" සස්වින්දි සිනාසෙමින් කීවාය.

"සුසිල් අංකල්ගේ කම්පැනිය අර ගන්න පොටක් මම පාදගෙන ඉන්නේ... සහස්ගේ පොතට සල්ලි දැම්ම නිසා මට කෝටියක් මදි... නැත්නම් මම ඒක මේ වෙන කොට අරගෙන"

"ඉතින් හංස... මට දුන්න සල්ලි ගන්නකෝ... ඒවා ඔයාගෙනේ... තාත්තිගේ සල්ලිත් මම ගාව ඇති"

"එපා රත්තරනේ... ඔයාගේ ඒවා ඔයා තියා ගන්න... මම රෝලක් ගහ ගන්නම්"

"එක අතකින් ඒවා මගේ නමට තියන එක හොඳයි"

"ඇයි"

"එතකොට ඉතින් මදාවියෙක්වත් උස්සගෙන ගිහින් තුවක්කුව පෙන්නලා ඇඳට දාගයිනේ" තුහංස ඇය දෙස බැලුවේය.

"දැන් ඉතින් ඇඳට දාගෙන උඹෙන් ගන්න තියෙන්නේ......" කියූ තුහංස ඇයගේ කර වටා අත දමාගෙන ඇයව ළං කර ගත්තේය.

"එදා ඔයාගෙ වටිනාකම අරගෙන... මම ඔයාව අවලංගු කාසියක් කරලා පැත්තකට දැම්මා... ඒත් අද... ඔයා මට දරු තුන්දෙනෙක් දීලා ඔයාගේ වටිනාකම අසීමිත කර ගත්තා"

ඒ කියන්නේ දැන් ඔයාට මාව අසීමිතව වටිනවද"

"හ්ම්... තවත් එකෙක් දීලා තවත් වටිනාකම වැඩි කරනවා"

"ඇත්ත...ට..."

"ඔව්... ඉක්මනට කෝටි දෙකක් හොයාගෙන ඉන්න ඕනේ"

"කෝටි දෙකක්..."

"හ්ම්... එක කෝටියකින් කම්පැනිය ගත්තා... මනොජ් අංකල්ට දුන්නා"

"තාත්තිගේ පාලුව යන්න හොඳයි"

"අනෙක් කෝටිය හෙච්චද කොල්ලා වැඩේට බැස්සා"

"මොන..."

"මාස දහයයි... වැඩේ ඉවරයි... චැස්... චැස්..." තුහංස රඟපාමින් කීවේය.

"මෙන්න... මේ චැස් එක පටන්ගෙන... දෙන්න ඔය චැස් එක නතර කරලා දෙන්න" සස්වින්දි සෙහස්ව ගෙන තනය ඔහුගේ මුවේ තැබුවාය.

ඔහුත් සමඟ ඇයව තුරුලු කර ගත් තුහංස සෙහස්ගේ වත සිප ගැන සස්වින්දිගේ තනයේ දෙතොල තබා දෑස් පියාගත්තේ ඇයගේ ලේ කිරිවන ළයේ උණුසුම මොහොතකට විඳ ගන්නයි. සස්වින්දි පිරී ඉතිරී යන සෙනෙහසකින් ඔහුගේ හිස සිප ගත්තාය.

තියුම් රහල් සමඟ විවාහ වී නව නිවසක පදිංචියට යන විට කුඩා සහස්ට වසරක් සම්පූරණ වී තිබිණි. එම නිවස තුහංසත් සස්වින්දිත් රහල්ට හා තියුම්ට ලබා දුන් තිළිණයකි.

තුහස් සජීවා සමඟ නුවර නිවසේ සිට පාසැල් ගියේය. සහස්වි ඉඳ හිට මනොජ් හා නැන්දා සමඟ ඔහුගේ නිවසේ ගත කළාය.

රජීවගේ සමාගම නැවත ලබා ගත් තුහංස එය මනෝජ්ට පැවරුවේය. එනිසාවෙන් මනෝජ්ට පාලුවක් නැති විය.

සති අන්තයේ පවුල සම්පූර්ණ කර ගැනීමට කියා තුහංස නොවැරදීම තුහස්ව නිවසට රැගෙන ආවේය.

"ඔයා එක්ක දරුවෝ එක්ක ඉන්න තිබුණ කාලේ මම මඟ ඇර ගත්තා හංසී... ආයේ එක දසකටවත් එක පැයකටවත් මම ඒ අවස්ථාව මඟ ඇර ගන්නේ නැහැ"

තුහංස පැවසුවේ තුහස් ගෙන ඒමට ලහියේ දඟලමින් පාරේ කා සමඟ හෝ දබරයක් කර ගත් වෙලාවක සස්වින්දි ඔහුට

දොස් නැගූ මොහොතකයි.

"මොනවා වෙනස් කර ගත්තත් රණ්ඩු වලට පැටලෙන එක නම් ඔයාට වෙනස් කර ගන්න බැරි වෙලා හංස"

"හැම දේම වෙනස් කර ගන්න බැහැ හංසී මිනිහෙකුට... නැති නොවන පුරුදුත් තියනවා"

"නැති නොවන එක පුරුද්දක් තිබුණොත් ඇති... ගොඩක් ඕනි නැහැ"

"ඒක ඇත්ත... ඒකට නැති කර නොගත්ත පුරුදු දෙකෙන් එකක් නැති කර ගන්න ඕනේ... කෝකද වෙනස් කර ගන්නේ... ඔයාම කියන්න බලන්න"

"මොනාද"

"එක පුරුද්ද වෙනස් කර ගත්තොත් නම් ඉතින්..." තුහංස කට කොනකට සිනහවක් නගා ගත්තේය.

"හංස..."

"නැහැ නැහැ... බය වෙන්න එපා... මේකට අවුරුද්දක් වුණ ගමන් තව එකෙක්... ඒ පුරුද්ද වෙනස් කර ගන්නේ නැහැ" සස්වින්දි අත මිට මොලවා තුහංසට පහරක් ගැසුවේය. තුහස් සිනාසුනෙන් සහස්විද සිනාසුණාය.

"කොල්ලට තේරුනාද මන්දා" ඔවුන් දෙ බැලූ තුහංස සස්වින්දිට කීවේය.

"කට පරිස්සම් කර ගන්න ළමයි ඉස්සරහා"

"කට... කට විතරක් පරිස්සම් කර ගත්තොත් ඇද්ද" තුහංස ඇයගේ කනට කර ඇසුවේය. ඔහු තවත් ඇයගෙන් ගුටි පහරක් කෑවේය.

තුහංස සස්වින්දි සමඟ රහල්ගේ නිවසට ගියේ ඔවුන්ගේ ඉල්ලීම මත දිවා ආහාර වේලකටයි. මනෝජ් නැන්දා සමඟ පිටව ගියේ මුලින්මය. සජීවා සීතා සමඟ පිටව ගියේ තුහංස තුහස් ඇරවලවන බව දැන් වූ නිසාය. දෙපා දෙපසට විහිදා දරු තිදෙනාම ඇකයේ තබාගෙන තුහංස වාඩිවී සිටි තැනට රහල්

[illegible] සමගිනි

"ඔඩොක්කට හරියන ගානක් හදා ගත්තම ඇති හංසයා" ඔහු පැවසුවේ තුහංස අසලින් වාඩි වෙමිනි.

"මේකේ තවත් එකෙක්ට ඉඩක් තියා ගෙන මචං මම ඉන්නේ... කාලේ ගත වෙනකල්" තුහංස කීවේය.

"උඹ උස්සගෙන ගිහින් පිස්තෝලේ තියලා ඇඳට ගත්තට මචං... ඒකි මම ඉස්සරෝම අවුරුදු ගානක් ලව් කරපු කෙල්ල... ඒකි ගැන උඹට වඩා කැක්කුමක් මට තවම තියනවා... කවුද දන්නේ ඔඩොක්කුවේ තියා ගන්න එක එකා හදා ගන්නේ ඒකිගේ කැමැත්තටද කියලා"

"බලපන්කෝ ඇවිත් වෙලවක... එක ඉඟියට නටාගෙන එන හැටි" තුහංස පවසද්දී සිනහව පිට පැන්නේ තියුම්ගේයි.

"ආන්න... සාක්ෂි... නංගි දැකලා ඇති... ආය දෙකක් නැහැ"

"හංස අයියා... ඉන්නවා මම අක්කිට කියනවා"

"උඹ ඕවා අක්කිට කියන්න නෙවෙයි... රහලා එක්ක කරන්න බලපන්... මේවත් උඹලා බලාගෙන ඉගෙන ගන්න ඕනේ වැඩ"

"බය වෙන්න එපා මචං... මේ රහලයත් උඹට පරාද වෙන්නේ නැහැ... උඹ තුනයි නම් මම හතරයි... අපටත් පුළුවන් බලාගෙන ඉගෙන ගන්න"

"හතරක් නෙවෙයි පහක් හදන්න වෙයි උඹට"

"හ්ම්... ඔව්ද කොහෙදෝ... ආන්න අරකි ආයෙත් වමනේ කරනවා දැක්කා" තුහංස වහා දරු තිදෙනා රහල් හා තියුම් අත දී නැගී සිටියේය.

"කෝ හංසී"

"අක්කා අපේ ෆොටෝ දිහා බලාගෙන ඉදලා පොකුණ පැත්තට යනවා මම දැක්කා" තියුම් කීවාය.

"හංසි හැමදාම ආවම අපේ ෆොටෝ දිහා බලාගෙන ඉන්නවා හංසයා... මම උඹට කිව්වේ නැහැ... ඒකිට දුක ඇති මචං... ඒකි ට්‍රයි කළේ කැම්පස් යන්න"

"මම එයාගේ නැති කළ හැමදේම ඇති කරලා දුන්නා රහලා... තවත් ඒ ජීවිතේට අඩුවක් තියනවනම් මම ඒ අඩුව පුරවලා දෙන්න ලෑස්තියි"

සස්වින්දි සිටියේ පොකුණ දෙස බලාගෙන කල්පනාවකිනි.

ජීවිතේ එපා වෙන තරමට තමාට විදින්නට වූ කටුක අත් දැකීම් බොහෝය. ඒවා විදගෙන එඩිතරව තමා නැගී සිටියේ රික්තයක් හදේ පසෙක තිබියදීය.

එහෙත්... නොපැතූ නොසිතූ විදිහට ජීවිතේ තමාට අත් විදින්නට ලැබුණේ දෛවයේ හාස්කමකටයි.

පාසැල් වියේ විශිෂ්ඨ දස්කම් දැක් වූ තමා අභිබවා හැමදෙනාම ඉදිරියෙනි. ඊර්ෂ්‍යාවක් නැතද ශෝකයක් හද තුල ඇති බව සස්වින්දි දනී.

ඉගෙනුමේ කෙලවර කළු කෝටයක් පැළදගෙන තේජසින් සිටින්නට සිහින මවාගෙන සිටි තමාගේ බොඳ වූ එකම සිහිනය එයයි. තමා ළයනි සමඟ බාහිරින් උපාධිය කිරීමට ගත් උත්සහයත් නතර වූයේ මාස හයක් තුහංස සමඟ සිටීමට සිදු වූ නිසාය.

බඳවටා එතුණු දෑත් යුවළත් සුපුරුදු උණුසුමත් ගතට දැනෙද්දී සස්වින්දි දෑස් පිය ගත්තේ ඒ උණුසුම විද ගන්නයි.

"ඇයි රත්තරන් වමනේ ගියේ" ඇයගේ ගෙල දෙතොලින් තෙත් කරමින් තුහංස ඇසුවේය.

"නිකන් හංස... ගඳක් ආවා... අප්පිරියා හිතුණා"

"රහලයා මට කිව්වම මට බය හිතුණා... කොල්ලා පොඩියි... අනික ඔයා පව්"

"ඇයි මම පව්... කොල්ලට තව අවුරුද්දක් ගියාම මම කෙල්ලක් හදලා දෙනවා... ඔයා කෝට්ටිය හොයා ගෙන තියා ගන්න... ඔන්න කිව්වා" සස්වින්දි තුහංස දෙස බලා කීවාය.

"රතු මූණ... කඳුළු ඇස්... තාම ඉවසුමක් දෙන්නේ නැහැ මට" තුහංස ඇයගේ දෑස් සිප ගත්තේය.

"හංසී..."

"හ්ම්..."

"ඔයා සතුටින් නෙවෙයි නේද රත්තරන්" තුහංස ඇයව තවත් තදින් තෙරපා ගත්තේය.

"ඇයි හංස එහෙම කියන්නේ... මගේ ජීවිතේ කිසිම අඩුවක් නැහැ" ඇය පැවසුවේ තුහංසව සනසවන අදිටනිනි. තමා නිසා දැන් ඔහු බොහෝ වෙහෙසෙන බව සස්වින්දි දැන සිටියාය.

"එක අඩුවක් තියනවා හංසී... ඔයා ඒ අඩුව සම්පූර්ණ කර ගන්න ඕනේ"

"ඒ මොකද්ද හංස"

"ඔයාව මට ආය ඉන්ටනල් කැම්පස් යවන්න බැහැ... ඔයාට පුලුවන් එක්සටනල් ඩිග්‍රි එක කරන්න... රහල්ගේ තියුමිගේ වගේ කළු කෝට් එකක් ඇඳගත්ත ඔයාගේ ෆොටෝ එකක් අපේ ගෙදර මේසේ උඩත් තියෙන්න ඕනේ හංසී" සස්වින්දිගේ වතේ නැගුණු සිනහව ඇය කොතෙක් ඒ සිහිනේ සිටියාදැයි තුහංසට පෙන්වා දුන්නාය.

සස්වින්දි ඔහුගෙන් මිදී ඔහු වෙතට හැරුණේ ඒ සිනහාවෙන්මය. තුහංස ඇසයිය නොහෙලා ඇය දෙස බලා සිටියේය.

"තියනවා හංස... අනිවාර්යයෙන්ම මම අපේ මේසේ උඩ ෆෝටෝ එකක් තියනවා..."

"තවත් බබෙක් දීලා මම ඔයාට බාධා කරන්නේ නැහැ හංසි"

"නැහැ හංස... දරුවෝ කියන්නේ සම්පත්... කිසිම දේකට බාධාවල් නෙවෙයි... අපි කතා වුණ විදිහට තව බබෙක් හදමු... ඉගෙන ගන්න කාලයක් ඕනේ නැහැ... හිත තියනවනම් කරන්න බැරි දෙයක් නැහැ"

"ඔයා මට හංස ධේනුවක් හංසී... මගේ හංස ධේනුවට මම ආදරෙයි... ගොඩාක්" තුහංස සස්වින්දිගේ නලල සිප ඇයව තුරුල් කර ගනිමින් කීවේය.

"මමත් මගේ හංසයාට පණ වගේ ආදරෙයි" සස්වී

තුරුලේම සිට මිමිණුවායි.

පසෙකට වී මේ දසුන රහල් බලා සිටි දරු තිං

තුහංස ලෙසින්ම ඇකයේ තබාගෙනයි. පසෙක තිබූ ය

ඇසුණේ සින්දුවකි.

"ඉන්න පුතේ අපි මේ සින්දුව වැඩි කරමු" රහල් ෙ

දෙස බලාගෙන කීවේ සින්දුවේ හඬ දුරස්ථ පාල

වැඩිකරමින්ය.

රණ හංස යුවළ

නිමල නිල් ජලාශේ...

මන නන්දනීය

දසුන් නංවනා... රහල්ගේ හඬින් ගැයෙද්දී

සිහින යහනේ...

දකින සිහිනේ...

රතු රෝසමලක් ළයට ළං වුණා....

පෙමින් බැඳුණො...

සිතින් දකිනා...

ඒ සිහින මහද මියුරු කල්පනා.... සස්වින්දිගේ හඬින් ග

අවසානයි....